

# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සහ මාධ්‍ය භාවිතාව

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයක්

# පුරවැසියා වෙබ් අඩවිය

## පුරවැසි ජනජීවිතයට අදාළ,

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළු සියලුම නීති, අණපනත් සහ රෙගුලාසි
- පුරවැසියාට අදාළ ඉහළ අධිකරණයෙන් විනිශ්චිත නඩු තීන්දු සහ අනෙකුත් වැදගත් නඩු තීන්දු
- රාජ්‍ය හා පොදු ආයතනයන්හි ආකෘති පත්‍ර
- පුරවැසි ක්‍රියාකාරිත්වයේ නවීන තොරතුරු
- මූලික අයිතිවාසිකම්, යුතුකම් හා වගකීම්
- පුරවැසි ක්‍රියාකාරිත්වයෙන් ලබාගත් ජයග්‍රහණ පිළිබඳ විස්තර
- පුරවැසි සභා - පිළිබඳ තොරතුරු

---

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව ත්‍රෛභාෂාවෙන්
පුරවැසියා වෙනුවෙන්ම

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

වෙතින්

**www.citizenslanka.org**

---




# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සහ මාධ්‍ය භාවිතාව

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි

**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සහ මාධ්‍ය භාවිතාව**

ප්‍රථම මුද්‍රණය : **දෙසැම්බර් 2020**

ISBN : 978-955-4746-93-0

සංස්කරණය : **ලයනල් ගුරුගේ**

පරිගණක සැකැස්ම : **වාකයා රූ**

ප්‍රකාශනය : **විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

මෙම ප්‍රකාශය එළිදක්වනු ලබන්නේ ෆෙඩ්රිච් නියුමාන් ස්ටිෆ්ටුංග් *(FNF)* ආයතනය සමග හවුල්කාරිත්වයෙනි. පදනමෙහි වැඩකටයුතු කේන්ද්‍රගත වන්නේ නිදහස සහ වගකිවයුතුබව පිළිබඳ වූ හරයාත්මක ඇගයීම් මත ය. තම ව්‍යාපෘති ඔස්සේ ෆෙඩ්රිච් නියුමාන් ස්ටිෆ්ටුංග් *(FNF)* ආයතනය විසින් සියලු ජනතාවන්ට නිදහසේ මානව ගරුත්වයෙන් යුතුව හා සාමයෙන් ජිවත් විය හැකි ලෝකයක් නිර්මාණය කිරීම සඳහා තම දායකත්වය ලබා දෙයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන, දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

ලිපිනය : 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05.

දුරකථන : 011 2370803 / 4

ෆැක්ස් : 011 2370801 / 2

වෙබ් අඩවිය : www.cpalanka.org

ඊමේල් : info@cpalanka.org

# පටුන

**ලයනල් ගුරුගේ**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සහ මාධ්‍ය භාවිතාව 5

**ජයසිරි ජයසේකර**

තොරතුරු අයිතිය හා ජනමාධ්‍යවල කාර්යභාරය 7

**රාහුල් සමන්ත හෙට්ටිආරච්චි**

99%ක්ම මැතිවරණ රැස්වීම්වල සෞඛ්‍ය නීති කඩලා
කිසිවකුට එරෙහිව නීතිය ක්‍රියාත්මක කර නෑ 13

අලි මිනිස් ගැටුමට විසඳුම් සොයා මිලියන ගණනක මුදල් අහිමි කළ අලි වැට 21

සමෘද්ධි දේශපාලනීකරණය: රුපියල් බිලියන 1.5ක මුදලකට ටී ෂර්ට් කොන්ත්‍රාත් 29

රුපියල් කෝටි තුනක් වැය කර සැකසූ
අම්බලන්තොට වාඳුරුප්ප මාර්ගය නිසි ප්‍රමිතියකට නෑ 35

රටේ වී හිඟයක් නෑ: සහල් මාෆියාව ගැන ඇත්ත කතාව 37

**ලක්මාල් කේ. බදුගේ**

වරායට ලැබිය යුතු ආදායම රහසේ ගිලින බහිරව සමාගම් දෙකක් 43

**තරිඳු ජයවර්ධන**

පරිසරයට වින කටින කුඩා ජල විදුලි බලාගාර 51

සුචි පාසලේ විදුහල්පතිනියගේ මරණයට අධ්‍යාපන බලධාරීනුත් වගකිව යුතුයි 59

ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂවරයා බඳවාගෙන ඇත්තේ සම්මත ක්‍රමවේදයෙන් බැහැරවයි 61

චක්‍රලේඛ උල්ලංඝනය කරමින් ඇමැති රිෂාඩ්ට වැඩිපුර වාහන 7ක් 63

**බිඟුන් මේනක / තරිඳු ජයවර්ධන**

සිංහරාජය හරහා ඉදිවන මාර්ගය 65

බන්ධනාගාර අමාත්‍යාංශයේ දේශපාලන හෙංචයියන්ගේ හොල්මන් 73

**ලසන්ත ද සිල්වා**

මහජන මුදලින් කල්බදු ගෙවා ගජමිතුරන්ට සැප වාහන දුන් අයවැය චක්‍රලේඛය 81

**සී. දොඩාවත්ත**

තොරතුරු අයිතියේ බලයෙන් පාරිභෝගික සටනක් දිනයි
පානීය ජල බෝතලයෙහි මිල ලකුණුවීමේ පිටුපස කතාව 86

**චාමර සම්පත්**

කසළ කළමනාකරණය නාස්තියක් වෙයි 89

**නාමිනී විජේදාස**

ස්ත්‍රීපුරුෂභාවය පිළිබඳ ප්‍රශ්නයේදී දුම්රිය පීලි පනී 93

ලක්විජය බලාගාරයේ පළමු ඒකකය වැඩ කළ කාලයෙන් අඩක්ම ක්‍රියාත්මක වුණේ ධාරිතාවට අඩුවෙන් 95

ප්‍රධාන විධායකගේ වැටුප හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ ශ්‍රී ලන්කන් එයාර් ලයින්ස් ස්ථාවරය තොරතුරු දැනගැනීමේ කොමිසම ඉවත දමයි 98

භූගත ජලය අධික්ෂණයේ විශාල කොන්ත්‍රාත්තුවක් ඕලන්ද සමාගමකට හිමි වෙයි 101

ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම් : භාණ්ඩාගාරය බැංකුවලට රුපියල් බිලියන 22.92ක් ණයයි 104

**සඳුන් ජයවර්ධන**

සෑම වසරකම සිය ගණනක් දෙනා දුම්රිය පීලි මත මියයති 106

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉහළ සිට පහළටම තනතුරුවල පුරප්පාඩු 109

ලංකාවේ සිරගෙවල් දූෂණ ගුහා බව වාර්තාවකින් හෙළි වෙයි 114

**එස්. රුබතීසන්**

නීති විරෝධී මසුන් මැරීම : තොරතුරු දැනගැනීමේ නීතිය ආධාරයෙන් සන්ඩේ ටයිම්ස් පතුලටම ගියේය 118

රුපියල් බිලියනයක් වටිනා ස්වර්ණාභරණ සැබෑ හිමිකරුවනට ළඟාදීම 120

සිරිසේන ජනාධිපතිවරයා ඔහුගේ පොළොන්නරුවට රුපියල් බිලියන 25 කට වඩා පොම්ප කරයි 122

**චාන්දනී කිරින්දේ**

කොළඹ කච්චේරියේ ගින්න : පොලිස් පරීක්ෂකයින් තවමත් කරන්නේ අළු එකතු කිරීමයි 124

2012 නොවැම්බරයේ වැලිකඩ බන්ධනාගාරයේ සමූහ ඝාතනය: විශේෂ කාර්ය සාධක බලකා ප්‍රධානියාගෙන් විශේෂ ඇඟවීමක් 126

**දිලීප් අමුතන්**

ශ්‍රී ලංකා යුද හමුදාව ජනමාධ්‍යවේදීන්ගේ බුද්ධි තොරතුරු රැස් කරන බව තොරතුරු කොමිසමේ අභියාචනයකදී හෙළිදරව් වෙයි 130

**පී. නිරෝෂ්**

කිසිම වියදමක් නොකර 557 වරක් ගුවනේ පියාසර කළ මෛත්‍රී 133

භාර වූ කොටි සාමාජිකයන් ගැන වග කිව යුත්තේ කවුරුන්ද? 135

**කේ. ප්‍රසන්නා**

වතු නිවාස ඉදිකිරීමේ මුදලින් ආහාර බුදින ඇමතිවරයා 138

හැටන් බස් නැවතුම්පළ පොදු වැසිකිළියක් 141

වතු වෘත්තීය සමිතිවල සාමාජික දායක මුදල්වලට සිදුවන්නේ කුමක්ද? 144

**සෙල්වරාජා රාජසේකර්**

වතු වෘත්තීය සමිතිවල සාමාජික මුදල් ගැන තොරතුරු දීම කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතිකෙෂ්ප කරයි 149

තොරතුරු දැනගැනීමේ කොමිසම විසින් ලබාදුන් වැදගත් තීන්දු කීපයක් 153

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත 229



# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සහ මාධ්‍ය භාවිතාව

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ සංවාදය 2016 තෙක් දිවේ. සෑම මනුෂ්‍යයෙකුටම තම ජීවිතය පවත්වාගෙන යෑම සඳහා තොරතුරු අවශ්‍ය වේ. ආණ්ඩුකරණයේ තොරතුරු මහජනතාවට වැදගත්ය. මහජනතාවගේ ඡන්දයෙන් තෝරා පත්කරගනු ලබන පාලකයන්ගේ ක්‍රියාකලාපයද රාජ්‍ය නිලධාරීන්ගේ සේවාවන් ද පෙරළා ප්‍රශ්න කිරීමට ජනතාවට අයිතියක් තිබේ.

ලංකාවේ තොරතුරු පනත, රටේ සියලුම ජනතාව දන්නා විෂයයක් ලෙස අපට පිළිගත නොහැකිය. එසේ නමුත් ක්‍රියාකාරී යම් පිරිසකට මේ පිළිබඳ යම් අවබෝධයක් ඇත. ජනතාවගේ අවශ්‍යතා මත තොරතුරු පනත පිළිබඳව හෙමි හෙමින් ජනතාව තුළ සංවාදයක් ගොඩනැංවෙමින් පවතී. එසේ නමුත් විශාල අවබෝධයක් බොහෝ ප්‍රජාවන් තුළ නැත. වසර කිහිපයක් තිස්සේ සාමාන්‍ය ජනයා, විශ්වවිද්‍යාල සිසුන්, රාජ්‍ය නිලධාරීන්, පළාත් පාලන නියෝජිතයින් ආදි කොටගත් බොහෝ පිරිසක් වෙත මේ අවබෝධය ඇති කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විශාල පරිශ්‍රමයක් දැරීය.

තවදුරටත් මේ සේවාව පවත්වාගෙන යෑම සඳහා අපි කැප වෙමින් සිටිමු. තොරතුරු දැනගැනීම පිළිබඳ කුඩා පොත් පිංච කිහිපයක්ද එසේම අත් පත්‍රිකා බොහොමයක්ද අප විසින් නිර්මාණය කොට ඇත. තොරතුරු පනත සහ තොරතුරු පනතේ ක්‍රියාවලිය විමසීම සඳහා ඇති එකම 'දුරකථනයෙන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙළ' *(Hotline)* ඇත්තේ සිවිල් සමාජ සංවිධානයක් ලෙස අපට පමණි. එමෙන්ම තොරතුරු පනත සම්බන්ධයෙන් ගුවන්විදුලි වැඩසටහන් ගණනාවක් අප විසින් සංවිධානය කර ඇත. තොරතුරු පනතේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පරීක්‍ෂණ වාර්තා ගණනාවක් සමාජගත කොට ඇත. එසේම තොරතුරු ඉල්ලීමේ ක්‍රියාවලිය කොමිසම දක්වා ගෙන යමින් අවස්ථා ගණනාවක දී මහජනතාව වෙනුවෙන් කටයුතු කර ඇත්තෙමු.

තොරතුරු දැනගැනීමේ මාධ්‍ය භාවිතාව පිළිබඳව කතිකාවතට අප ඇතුළත් වන්නේ බොහෝ කලක පටන්ය. මාධ්‍යවේදීන් සැලකිය යුතු පිරිසක් තොරතුරු පනත භාවිත කරමින් ඉතා වැදගත් සමාජ මෙහෙවරක් කරමින් සිටී.

පසුගිය වසර කිහිපයේ එය අපට දිස් විය. එහෙත් බොහෝ පිරිසක් තම මාධ්‍ය භාවිතාවට මෙම පනත උපයෝගී කර ගෙන ඇති බවක් පෙනෙන්නට නැත. එබැවින් අතළොස්සක් වූ මාධ්‍යවේදීන් පිරිසක් ගත් උත්සාහය අගය කරනු වස් මේ කෘතිය නිර්මාණය කිරීම සඳහා අප පෙළඹවීය. මේ සඳහා සහභාගී වූ මාධ්‍යවේදීහු ඉතා කැමැත්තෙන් තම ලිපි ලබාදීමට කටයුතු කිරීම අපි අගය කරමු. එසේම මේ සඳහා පූර්විකාවක් ලියමින් මේ එක්තැන් කිරීමට සහාය දැක් වූ ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාවේදී ජයසිරි ජයසේකර මහතාට අපගේ ස්තුතිය පිරිනමමු.

මේ කෘතිය සඳහා ලිපි සම්පාදනය කළ පුවත්පත් කලාවේදීහු තම විෂය පථය මැනවින් හඳුනාගත් බවක් දක්නට තිබේ. ඇතැම් තොරතුරු හරහා දූෂණයන් හෙළිදරව් කර ඇත. එමෙන්ම සමාජයේ පවත්නා විවිධ ගැටලු පිළිබඳ මහජනතාව හා පාලකයන්ගේ අවධානය යොමු කිරීමට අනේකවිධ උත්සාහයන් ගෙන ඇත. උතුරේ, දකුණේ, වතුකරයේ ඇති විවිධ ප්‍රශ්න ඔවුන් බොහෝ අපූරුවට ඉදිරිපත් කොට ඇත. බොහෝ මාධ්‍යවේදීන් තොරතුරු පනත හරහා විවිධ ප්‍රවෘත්ති ගණනාවකට මූලාශ්‍ර සොයාගෙන ඇත. එම මූලාශ්‍ර පදනම් කරගනිමින් ගවේෂණාත්මකව තොරතුරු ඉදිරිපත් කිරීමට උත්සාහ දරා ඇත. මේ කෘතියේ එක් අරමුණක් වන්නේ අනෙකුත් මාධ්‍යවේදීන්ගේ උද්‍යෝගය හා කැපවීම මත මේ සමාජ කාර්යය ශක්තිමත් කිරීමට ඔවුන් පෙළඹවීමයි. භාෂා ත්‍රිත්වයෙන්ම මෙම කෘතිය පළ කිරීම මඟින් වඩා පුළුල් සංවාදයක් සමාජය තුළ ඇති කිරීම අපගේ අරමුණයි.

මේ කෘතියේ අන්තර්ගතය වඩාත් සාර්ථක වනු පිණිස කොමිසම විසින් ගනු ලැබූ තීන්දු කීපයක්ද, තොරතුරු පනතද ඒ හා බැඳුණු ඉල්ලුම් පත්‍රද ඊට ඇතුළත් කොට ඇත.

මේ සඳහා ලිපි සැපයූ ලේඛකයින්ටත්, ලේඛකයන්ට ශක්තිය ලබාදුන් සියලු මාධ්‍ය ආයතනවලටත්, පරිවර්තකයන්ටත්, නන් අයුරින් සහාය වූ සැමටත් අපගේ ස්තුතිය පිරිනමමු. වඩා පුළුල් මහජන සංවාදයක් හා කතිකාවක් ගොඩනැගීම සඳහා මේ කෘතිය දායක වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

**ලයනල් ගුරුගේ**
ජ්‍යෙෂ්ඨ පර්යේෂක
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය



# තොරතුරු අයිතිය හා ජනමාධ්‍යයේ කාර්යභාරය

නිවැරදි තොරතුරු නොලබන ජාතියක් කෙදිනක හෝ අනුන්ගේ වහලුන් බවට පත් වේ යැයි හැරල්ඩ් ලැස්කි කියා ඇත. එනයින් තොරතුරු අයිතිය යනු වහල්භාවයෙන් අත්මිදීමේ යතුරය. මේ යතුර, මෑතක් වන තුරුම දොරටු සතකින් එපිට කුටියක, මංජුසාවක ලා අගුළු දමා තිබිණි. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මගින් එම යතුර ජනසතු කරන ලදි. දැන් ශ්‍රී ලංකාවේ ඕනෑම පුරවැසියකුට මේ යතුර රැගෙන, මෙතෙක් සාමාන්‍ය ජනයාට අත පෙවීමට තහනම්ව තිබුණු රහස් සේප්පු විවර කොට ඒවායේ තැන්පත් කර තිබෙන්නේ මොනවාදැයි හාරා අවුස්සා බැලිය හැකිය. සැඟවුණු දේවල් සෙවීම වෘත්තිය කොටගත් මාධ්‍යවේදීන්ට මෙය අනගි වරප්‍රසාදයක් බව අමුතුවෙන් කිව යුතු නොවේ.

පනත ක්‍රියාත්මක වීම ආරම්භ වුණු 2017 පෙබරවාරි 03 වැනිදා සිට මේ දක්වා ගත වුණු සිව් වසරකට ආසන්න කාලය මුළුල්ලේ, ලංකාවේ ජනමාධ්‍යවේදීන් එම යතුර භාවිත කළ ආකාරය පිළිබඳ නියැදියක් ලෙස මෙම ලිපි එකතුව සැලකිය හැකිය. සිංහල, දෙමළ හා ඉංග්‍රිසි භාෂාවලින් මාධ්‍යකරණයේ නිරත, මාධ්‍යකරණය සඳහා මෙවලමක් ලෙස *RTI* භාවිතය කෙරෙහි උනන්දුවක් දක්වන මාධ්‍යවේදීන් කිහිපදෙනෙකුගේ තෝරාගත් ලිපි ඊට ඇතුළත් වෙයි. ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන්ගේ *RTI* භාවිතය පිළිබඳ මෙබඳු එකතුවක් පළ කරන ප්‍රථම අවස්ථාව මෙය බවද විශේෂයෙන් සඳහන් කළ යුතුය.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ලෝකයට අලුත් අත්දැකීමක් නොවේ. ආසියානු කලාපය දෙස බැලුවද ලංකාව සිටියේ බොහෝ පසුපසිනි. අසල්වැසි ඉන්දියාව ඒ සම්බන්ධයෙන් ඉදිරිගාමී තැනක සිටියේය. බොහෝ රටවල්වල තොරතුරු අයිතිය දිනාගැනීමේ අවශ්‍යතාව පැන නැඟුණේ පුරවැසියන් අතරිනි. ඉන්දියාවේ තොරතුරු අයිතිය උදෙසා සමාජයේ පහළම ස්ථර අතර දැවැන්ත උද්ඝෝෂණ පැන නැගිණි. ඊට සමාන්තරව සමාජ සංවිධාන, ප්‍රජා නායකයින්, වෘත්තීයවේදීන් හා ජනමාධ්‍ය ආදී ක්ෂේත්‍රවල ඒ සම්බන්ධ ප්‍රබල අරගලයක් විය. ඉන්දියාවේ තොරතුරු අයිතිය ලැබුණේ,

තොරතුරු ඉල්ලමින් කලක පටන් උද්ඝෝෂණය කළ ජනයාටය. තොරතුරු අයිතිය නැතිව පවා ඔවුහු දූෂිත ආයතන වටලා, දින ගණන් වාඩි ලාගෙන උද්ඝෝෂණය කර තොරතුරු ලබාගත්හ.

එහෙත් ලංකාවේ අත්දැකීම මීට වෙනස්ය. තොරතුරු අයිතිය සාමාන්‍ය ජනයා අතර හෝ සිවිල් සංවිධානවල සටන්පාඨයක් වූයේ නැත. එමෙන්ම 1987 ප්‍රාදේශීය සභා පනත වැනි අණ පනත්වලින් රාජ්‍ය පාලනය සඳහා පුරවැසියන්ට මැදිහත්වීමට සලසා ඇති සීමිත අවස්ථාවන් පවා උරගා බලන සංස්කෘතියක් ගොඩනැගුණේද නැත. ඊට පරස්පරව සමූපකාර සමිති වැනි මුළුමනින්ම පුරවැසි පාලනය යටතේ පවතින ආයතන පවා දැඩි ලෙස පක්ෂ දේශපාලනයට නතු වීම සිදු විය. පුරවැසියන්ට තොරතුරු අයිතිවාසිකම නොමැති නමුත් මහජනතාව විසින් පත් කර යවනු ලබන නියෝජිතයන්ට එම අයිතිය තිබිණි. පාර්ලිමේන්තුවේදී අදාළ විෂය භාර ඇමතිවරයාගෙන් පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්න ඉදිරිපත් කිරීම තොරතුරු ලබාගැනීම සඳහා තිබූ ප්‍රබලම මෙවලම වූ නමුත් මන්ත්‍රීවරුන් එය භාවිත කිරීම ඉතා සීමිත විය. ඔවුන් පත් කර යවන පුරවැසියන්ගෙන් හෝ පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ පෙනීසිටින සිවිල් සමාජයෙන් ඒ සඳහා පෙළඹවීමක්ද නොවිණි.

ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කතිකාවත ආරම්භ වන්නේ ජනමාධ්‍ය සමාජය ප්‍රමුඛ, ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳව උනන්දුවක් දක්වන සිවිල් සමාජයෙනි. එයද සංවිධාන කිහිපයක් හා පුද්ගලයන් කිහිපදෙනෙකුගේ මැදිහත් වීමක් බව කීම අල්පෝක්තියක් නොවේ. ජනමාධ්‍ය සමාජය ගත් විට එම කතිකාවත 1998 'මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශනයට' පදනම් වූ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ප්‍රමුඛ සංවිධාන කිහිපයට සීමා වූවකි. තොරතුරු අයිතිය පිළිබඳ ඉල්ලීමක් පළමුවරට ඇතුළත් වූයේ 1994දී චන්ද්‍රිකා කුමාරතුංග ආණ්ඩුවට නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් ඉදිරිපත් කළ මාධ්‍ය ප්‍රතිසංස්කරණ පිළිබඳ යෝජනාවලටය.

ලංකාවේ තොරතුරු අයිතිවාසිකම් පිළිබඳ කෙටුම්පතක් මුල් වරට සකස් කෙරුණේ 2003 වසරේදීය. අගමැති රනිල් වික්‍රමසිංහ විසින් පත් කරන ලද, ජ්‍යෙෂ්ඨ සිවිල් සේවකයින්, නීතිඥවරුන්, පුවත්පත් කතුවරුන්, ක්‍රියාකාරිකයන් හා විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් විසින් සකස් කෙරුණු කෙටුම්පතට කැබිනට් අනුමැතිය හිමි වුවද එය පාර්ලිමේන්තුවේදී සම්මත වූයේ නැත. පසුව කරු ජයසූරිය මන්ත්‍රීවරයා විසින් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස එය ඉදිරිපත් කරනු ලැබූ නමුත් එවරද සම්මත නොවීය. පසුව 2015 වසරේදී වඩාත් දියුණු ආකාරයේ පනතක් සකස් කිරීමට පදනම් වූයේද 2003දී සකස් කෙරුණු එම කෙටුම්පතයි. (මේ පිළිබඳ සවිස්තරාත්මක විවරණයක්, පනත කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට දායක වූ ජ්‍යෙෂ්ඨ නීතිඥ ක්‍රිෂාලි පින්ටෝ ජයවර්ධන විසින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ 25වන සාංවත්සරික ප්‍රකාශනයට ලියා ඇත.) සන්ධාන රජය සිය ප්‍රකාශිත න්‍යායපත්‍රයෙන් පිට පැනීමට පෙර වසරක් ඇතුළත එය සම්මත කරගෙන 2017 පෙබරවාරි 03 වැනිදා වන විට එය ක්‍රියාත්මක තලයට ගෙන ඒමට හැකි වූයේ කල්තියා සකස් වූ එබඳු කෙටුම්පතක් තිබූ නිසාය. එසේ නොමැති වූයේ නම්, සන්ධාන ආණ්ඩුවේ ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට අත් වූ ඉරණමම තොරතුරු පනතටද අත් වීමට ඉඩ තිබිණි.

## ජනමාධ්‍යවල හා සිවිල් සමාජයේ වගකීම

මේ පසුබිම සිහිපත් කිරීම වැදගත් වූයේ, ශ්‍රී ලංකාවේ තොරතුරු අයිතිය අර්ථවත් කිරීම හා එය ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයට විශේෂ වගකීමක් ඇති බව අවධාරණය කරනු පිණිසය. මන්දයත් ඉන්දියාවේදී මෙන් තොරතුරු අයිතිය ඉල්ලා සිටි හා එය තමන් විසින් දැඩි පරිශ්‍රමයකින් යුතුව දිනාගත් අයිතිවාසිකමක් ලෙස සලකන, එයින් වැඩ ගැනීමට හා එය ආරක්ෂා කිරීමට කැප වුණු පුරවැසි සමාජයක් ලංකාවේ නොමැති බැවිනි. පුරවැසි සමාජයට එය ඉල්ලාසිටීමකින් තොරව ලැබුණු වරප්‍රසාදයකි. එහි වටිනාකම පිළිබඳ අවබෝධයක් ඇත්තේ ඉතා සුළු පිරිසකට බව, පසුගිය සිව් වසර තුළ විවිධ ආයතනවලට යොමු වූ තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාත්මකව විමසා බලන විට පැහැදිලි වෙයි. ගුණාත්මකව සැලකුවද ඒ පිළිබඳ ලැබෙන චිත්‍රය සතුටුදායක නැත. එබැවින් තොරතුරු අයිතිය පිළිබඳ ජන සමාජය දැනුවත් කිරීම මෙන්ම, එය අර්ථවත් ලෙස භාවිතයට ගැනීම පිළිබඳව සමාජයට ආදර්ශ සැපයීමද ජනමාධ්‍යවලට හා සිවිල් සමාජ සංවිධානවලට පැවරෙන භාරධූර වගකීමකි.

එමෙන්ම මෙම පාර්ශ්ව දෙකෙහි ක්‍රියාකාරීත්වය තවත් ආකාරයකින් වැදගත්ය. එනම් තොරතුරු දීමට නොව නොදී සිටීමට දීර්ඝ කාලයක් තිස්සේ පුරුදු පුහුණු වූ රාජ්‍ය සේවාව තුළ තොරතුරු දීමේ සංස්කෘතියක් ගොඩනැගීමට දායක වීමයි. ඉතා සරල තොරතුරු ඉල්ලීම්වල සිට වඩාත් සංකීර්ණ හා ලෙහෙසියෙන් ලබාගත නොහැකි තොරතුරු දක්වා පුළුල් පරාසයක ඉල්ලීම් ඉදිරිපත් කිරීමටත්, ආයතන මට්ටමින් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප වන අවස්ථාවලදී අභියාචනා කිරීමේ අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් එම තීරණවලට අභියෝග කිරීමත් එයින් අදහස් වෙයි. තොරතුරු අයිතිය පුරවැසියා සතු බලවත් අයිතියක් ලෙස තහවුරු වන්නේ අදාළ පනතේ වගන්තිවල ශක්තිය මත පමණක් නොවේ. එය භාවිතයට ගැනීම පිළිබඳ ප්‍රබල පූර්වාදර්ශ සැපයීමද ඒ සඳහා වැදගත් වෙයි. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් ක්ෂේත්‍රය වඩාත් පුළුල් හා ශක්තිමත් එකක් බවට පත් කිරීමට, හුදු තනි පුරවැසියන් විසින් එය භාවිතයට ගත් පරිධියෙන් ඔබ්බට යමින් සිවිල් සමාජ සංවිධාන විසින් කරන ලද උරගාබැලීම් හේතු විය. තොරතුරු අයිතිය සම්බන්ධයෙන්ද මාධ්‍ය හා සිවිල් සංවිධාන සතු කාර්යභාරය එවැන්නකි.

තොරතුරු අයිතිය පොදු අධිකාරිවලට සහ නිලධාරීන්ට සතුරු වූවක් නොව ඇගැයීමට හේතු වන්නක් බවට ආකල්ප වෙනසක් ඇති කිරීමටද ඉහත පාර්ශ්ව දෙකට දායක විය හැකිය. විශේෂයෙන් බලපෑම් නොතකා නීතියට අනුකූලව කටයුතු කිරීමට නිලධාරීන්ට ඉන් ශක්තියක් සැපයේ. මන්දයත් තොරතුරු අයිතිය

පුරවැසියන් සතු බැවින් ඕනෑම මොහොතක තම කටයුතු පිළිබඳ සියලු තොරතුරු පුරවැසියන්ගේ පරීක්ෂාවට ලක් විය හැකි බැවිනි. අයුතු බලපෑම් ප්‍රතික්ෂේප කිරීම සඳහා ඔවුන්ට එය සාධාරණ හා බලවත් පිළිතුරක් සම්පාදනය කර දෙයි. එවැනි මැදිහත්වීම් සුලබ කිරීම මගින් එම තත්ත්වය තහවුරු කළ හැකිය. එමෙන්ම ප්‍රගාමී තොරතුරු හෙළි කිරීම දිරිගන්වමින් ඒ සඳහා උනන්දුවක් දක්වන ආයතන හා රාජ්‍ය නිලධාරීන්ට, රාජ්‍ය නොවන සංවිධානවලට මාධ්‍ය ආවරණයක් ලබා දිය හැකිය. මාධ්‍යයට පොදු අධිකාරීන් හා රාජ්‍ය නොවන ක්ෂේත්‍රය සමඟ සුහදශීලී සම්බන්ධයක් පවත්වාගැනීමටද එය ඉවහල් වෙයි.

එසේ වුවද තොරතුරු අයිතිය ආරක්ෂා කිරීම හා ශක්තිමත් කිරීම මාධ්‍ය හා සිවිල් සංවිධානවලට පමණක් කළ හැක්කක් නොවේ. නීතිමය වශයෙන් ජනසතු වී ඇති එම අයිතිය ප්‍රායෝගික වශයෙන් හා ස්ථිරසාර ලෙස ජනසතු කිරීම සඳහා අතරමැදි කාර්යභාරයක්ද ඔවුන් වෙත පැවරේ. තොරතුරු අයිතිය පිළිබඳව පුරවැසියන් දැනුවත් කිරීම, තම පෞද්ගලික ජීවිතයට හා ප්‍රජාවට සම්බන්ධ ගැටලුවලදී තොරතුරු අයිතිය භාවිත කිරීමට ඔවුන් දිරිගැන්වීම හා මඟපෙන්වීම, ඉන් ඔබ්බට ගොස් පුරවැසි මාධ්‍යකරණය සඳහා ඔවුන් පෙළඹවීම, තොරතුරු අයිතිය භාවිත කරමින් පොදු ජනයා විසින් අත් කරගනු ලබන ජයග්‍රහණ සඳහා මාධ්‍යවල වේදිකාවක් සැපයීම, එවැනි පොදු අරමුණු වෙනුවෙන් තොරතුරු අයිතිය යොදාගන්නා පුරවැසි ක්‍රියාකාරිකයන් බලගැන්වීම ආදී බොහෝ කටයුතු ඒ වෙනුවෙන් කළ හැකිය. දැනටමත් සිවිල් සංවිධාන හා මාධ්‍යවලින් මීට සමාන ක්‍රියාකාරකම් සිදු වන නමුත් සමාජයේ අවශ්‍යතාව සමඟ සසඳා බලන විට එම මැදිහත්වීම් ඉතා අල්ප බව පෙනේ.

## කෘතියේ අන්තර්ගතය

දැන්, මෙම පසුබිම මත සිට ඉකුත් සිව් වසරේ තොරතුරු අයිතිය පදනම් කර ගනිමින් ජනමාධ්‍යවේදීන් කළ වෘත්තීය මෙහෙවර දෙස වඩාත් විවෘතව අවධානය යොමු කළ හැකිය. පෙර සඳහන් කළ පරිදිම, මෙම කෘතියට ඇතුළත් වන්නේ තොරතුරු අයිතිය භාවිත කරමින් සිංහල දෙමළ හා ඉංග්‍රිසි භාෂාවලින් මාධ්‍යකරණයේ නිරත වූ මාධ්‍යවේදීන් හා සමාජ ක්‍රියාකාරිකයන්ගේ ලිපි එකතුවකි. කෙටි කාලයක් තුළ ලිපි සපයාගැනීමට සිදු වීමත්, කොවිඩ් වසංගත තත්ත්වය තුළ කාර්යාලවලින් බැහැර සිට කටයුතු කරන ඇතැම් මාධ්‍යවේදීන්ට අදාළ ලිපි හා මූලාශ්‍ර ලිපිගොනු වෙත ප්‍රවේශ වීමට නොහැකි වීමත් වැනි හේතු නිසා ඇතැම් විශේෂ ලිපි මේ සඳහා එක් කිරීමට නොහැකි විය. එම නිසා කල් තියාම කිව හැක්කේ, මෙහි ඇතුළත් වන ලිපි අදාළ ලේඛකයන්ගේ හොඳම ලිපි නොවිය හැකි අතර මෙම ලිපි එකතුව ලංකාවේ *RTI* භාවිතාව සම්බන්ධ හොඳම නිදර්ශන එකතුවද නොවිය හැකි බවයි. මෙහි ඇතුළත් වන්නේ ලිපි ලබාදීමට එකඟතාව පළ කළ ලේඛකයන්ගේ, මේ මොහොතේ රැස් කර ගැනීමට හැකි වූ ලිපි එකතුවකි. එහෙත් ඉකුත් සිව් වසරේ ශ්‍රී ලංකාවේ තොරතුරු අයිතිය භාවිතයෙන් සිදු කළ මාධ්‍යකරණයෙහි ස්වරූපය, එහි විෂය පරාසය හා ප්‍රවණතා ආදිය වටහා ගැනීමට මෙමගින් හැකි වන බව නිරනුමානය.



මාධ්‍යවේදීන්ට මෙන්ම මාධ්‍යකරණය හදාරන හා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන අයටද මෙය විචාරශීලීව විමසා බැලීමටත්, සිය කටයුතු සඳහා ආදර්ශයට ගැනීමටත් අවස්ථාව හිමි වේ.

එක් තොරතුරු දැනගැනීමේ අයදුම්පතක් මගින් එතරම් දුෂ්කර වෑයමකින් තොරව ලබාගත් වාර්තාවක අන්තර්ගතය පාඨකයා හමුවේ හෙළි කරන ලිපිවල සිට දීර්ඝ කාලයක් ගත කොට තොරතුරු අයදුම්පත් සිය ගණනක් විවිධ ආයතනවලට යොමු කරමින්, ඇතැම් විට දිග්ගැසුණු අභියාචනා ක්‍රියාවලියක් ඔස්සේ ලබාගත් තොරතුරු විශ්ලේෂණය කොට ලියන පර්යේෂණාත්මක ලිපි දක්වා පුළුල් පරාසයක විහිදුනු පරිශ්‍රමයන් මෙහි දැකගත හැකිය. ඒ හැම එකක්ම එකිනෙකට ආවේනික වැදගත්කමකින් යුතුය. සමහර ලිපිවල අන්තර්ගතයෙහි කැපී පෙනෙන කොටසක් වන්නේ එම තොරතුරු ලබා ගැනීම පිණිස ලේඛකයා විසින් කළ අරගලයයි. තොරතුරු අයිතියෙහි ප්‍රායෝගික භාවිතය සම්බන්ධ යථා චිත්‍රයක් එමගින් දැකගත හැකි අතර, ආයතනවල හා නිලධාරීන්ගේ ආකල්පද, තොරතුරු කොමිසමේ ශක්තිය සහ සීමාවන්ද අවබෝධ කර ගත හැකිය. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම පිළිබඳ ගැටලුව දෙමළ භාෂාවෙන් කළ තොරතුරු ඉල්ලීම් සම්බන්ධ ප්‍රතිචාරවලින් පෙනේ. එම තොරතුරු ඉල්ලීම් සිංහල හෝ ඉංග්‍රිසි භාෂාවෙන් ඉදිරිපත් කළේ නම් එම යථාර්ථය හෙළිදරව් නොවීමට තිබිණි.

මෙම ලිපි එකතුව පරිශීලනය කරන කෙනෙකුට මාධ්‍යකරණය සඳහා තොරතුරු අයිතිය භාවිත කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබිය හැකිය. තොරතුරු අයිතිය පදනම් කරගත් මාධ්‍යකරණය පිළිබඳ විවිධ පුහුණු වැඩසටහන්වලදී සාකච්ඡාවට ගැනුණු ජාත්‍යන්තර මට්ටමේ පුරෝගාමී මාධ්‍යකරණයන් මාධ්‍යවේදීන් කෙරෙහි සාධනීය ලෙස බලපා ඇති අයුරු මෙහි එන ඇතැම් වෙහෙසකර පරිශ්‍රමයන්ගෙන් පැහැදිලි වෙයි. එමෙන්ම එවැනි දැවැන්ත නිදර්ශන හේතුවෙන්, තොරතුරු අයිතිය මෙවලමක් ලෙස උපයෝගී කරගන්නා වාර්තාකරණය සැම විටම දැවැන්ත එකක් විය යුතුය යන ආකල්පයක් මාධ්‍යවේදීන් තුළ ගොඩනැගී ඇත්ද යන්න ගැන සැක මතු වී තිබිණි. එබැවින් එදිනෙදා වාර්තාකරණයට අදාළව වුවද තොරතුරු අයිතිය භාවිතයට ගත හැකි අයුරු පිළිබඳ මෙහි ඇති නිදර්ශන විශේෂයෙන් ආධුනික මාධ්‍යවේන් දිරිගැන්වීමට හේතු වනු ඇත. තොරතුරු අයිතිය භාවිතයෙන් කරන වාර්තාකරණයේ වටිනාකම තක්සේරු කරන එකම සාධකය ඒ වෙනුවෙන් දරන දුෂ්කර පරිශ්‍රමය නොවේ. ඔබ සොයාගත් දෙය වැදගත් නම්, එය සරල උත්සාහයක ප්‍රතිඵලයක් වුවද වටිනාකම අඩු වන්නේ නැත.

## මාධ්‍යවේදීන් මුහුණදෙන අභියෝග

ලංකාවේ තොරතුරු අයිතිය භාවිත කොට සිදු කරන වාර්තාකරණය පිළිබඳව කැපී පෙනෙන නිරීක්ෂණයක් නම්, එය භාවිතයට ගන්නේ මාධ්‍යවේදීන් ඉතා සුළු පිරිසක් බවයි. එම පිරිසගේ නැඹුරුවටද වඩාත් හේතු වී ඇත්තේ මාධ්‍ය ආයතනවල පැවරුම් හෝ පෙළඹවීම් නොව අදාළ මාධ්‍යවේදීන්ගේ

පෞද්ගලික උනන්දුවයි. ඇතැම් මාධ්‍ය ආයතන එකී උත්සාහයන් පවා දිරිගන්වන ප්‍රතිචාරයක් පළ නොකිරීම කනගාටුදායක තත්ත්වයකි. සිය මාධ්‍යවල පුවත් අන්තර්ගතයෙහි ගුණාත්මකබව ඉහළනැංවීමට උවමනාවක් නැතිකම (මාධ්‍ය ආචාරධර්ම සම්බන්ධ ගැටලුවද ඒ හා බැඳී පවතී) මෙහිදීද කැපී පෙනෙන හේතුවයි. අතින් වියදම් කරගෙන කළ වෙහෙසකර ගවේෂණ සඳහා වුවද ප්‍රමාණවත් සැලකිල්ලක් හා වටිනාකමක් ලබා නොදීම පිළිබඳ කනගාටුදායක උදාහරණද තිබේ. තොරතුරු අයිතිය පිළිබඳ මහජනයා දැනුවත් කිරීමට හා ඒ පිළිබඳව මාධ්‍යවේදීන් පුහුණු කිරීමටත්, තොරතුරු අයිතිය භාවිතයට ගෙන වාර්තාකරණයේ නිරත වීමට ඔවුන් දිරිගැන්වීමටත් විවිධ මාධ්‍ය සංවිධාන හා සිවිල් සමාජ සංවිධාන කටයුතු කරයි. මේ හේතුවෙන් *RTI* යනු රාජ්‍ය නොවන සංවිධානවලින් ආධාරලබන ව්‍යාපෘතියක් ලෙස සලකා මාධ්‍ය ආයතනවලින් වෙනස්කම්වලට ලක් කිරීම පිළිබඳවද ඇතැම් මාධ්‍යවේදීන්ට අත්දැකීම් තිබේ. මෑතකදී දැනගන්නට ලැබුණු තවත් කනගාටුදායක තොරතුරක් නම්, *RTI* යනු පසුගිය ආණ්ඩුවේ ව්‍යාපෘතියක් ලෙස සලකමින් ඇතැම් රාජ්‍ය මාධ්‍ය හා ආණ්ඩු පක්ෂයට සහාය දෙන මාධ්‍ය *RTI* වාර්තාකරණය අධෛර්යමත් කරන බවයි. මේ සියලු අභියෝග පිළිබඳව විවෘතව සංවාදයට ලක් කිරීම, තොරතුරු අයිතිය ආරක්ෂා කිරීමට හා පුරවැසියන් ඒ කෙරෙහි වඩාත් නැඹුරු කිරීමට හේතු වනු ඇත.

**ජයසිරි ජයසේකර**



www.washingtontimes.com

## 99%ක්ම මැතිවරණ රැස්වීම් සෞඛ්‍ය නීති කඩලා

# කිසිවකුට එරෙහිව නීතිය ක්‍රියාත්මක කර නෑ

කොරෝනා ව්‍යාප්ත වීමේ අවදානම නිසා දින නියමයක් නොමැතිව කල් දමා තිබුණු ඉකුත් පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට අවසානයේ තීරණය කෙරුණේ සෞඛ්‍යාරක්ෂාව සඳහා වන නීතිමය රාමුවක් නියම කිරීමෙන් අනතුරුවය. එය සැලකිය යුත්තේ මැතිවරණ කොමිෂන් සභාව හා සෞඛ්‍ය අංශ, මහජනයාගේ ජීවිත ආරක්ෂාව වෙනුවෙන් ගත් බරපතළ වගකීමක් වශයෙනි. එහෙත් ප්‍රායෝගික තලයේදී ඒ වගකීම කොපමණ ප්‍රමාණයකට ඉටු කිරීමට අදාළ බලධාරීන් ප්‍රමුඛ රජය සමත් වීද? ඒ ගැන රජයට හා අදාළ බලධාරීන්ට ඇති තක්සේරුව කුමක්ද?

අවාසනාවකට මෙන්, මැතිවරණය අවසන් වී බොහෝ කල් ගතව ඇතත් මේ පිළිබඳව අදාළ අංශ කිසිදු සොයාබැලීමක් කර නැත. පුරවැසියකු ලෙස, තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ මෙම ලියුම්කරු විසින් දරන ලද

දුෂ්කර වෑයමකදී හෙළිදරව් වූ කරුණු, විශ්වාස කිරීමට නොහැකි තරම් විස්මිතය! සමස්තය කෙටියෙන් පවසතොත්, මැතිවරණයේදී සෞඛ්‍ය නිර්ණායක පිළිපැදීමේ ප්‍රතිශතය සියයට 1කි. වෙනත් ආකාරයකට කිවහොත් එය උල්ලංඝනය කිරීමේ ප්‍රතිශතය සියයට 99කි! එම උල්ලංඝනය කිරීම්වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක වීමේ ප්‍රතිශතය සියයට බින්දුවකි!

මෙම ලිපියේ අරමුණ, එකී භයානක තත්ත්වය පිළිබඳව බලධාරීන්ගේත්, සිවිල් සමාජයේත් සමස්ත පුරවැසියන්ගේත් අවධානය යොමු කරවීමයි. එය අනාගතයේදී මෙබඳු අවාසනාවන්ත තත්ත්වයක් ඇති නොවීම පිණිස වැදගත් වේ.

## අතිවිශේෂ ගැසට් නිවේදනය

පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් **2020.07.20 දින** නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ **2 සහ 3 වගන්ති** යටතේ සැකසූ **අංක 2184/34** යටතේ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කරන ලදි. ඒ අනුව රැස්වීම් පැවැත්වීමේදී අනුගමනය කළ යුතු නිර්ණායක නියම කෙරුණු අතර, වගන්ති නවයක් අතුරින් **1 සිට 07 දක්වාම වූ වගන්ති තුළින්** ප්‍රකාශයට පත් කර ඇත්තේ පූර්ව මැතිවරණ සමයට අදාළ නියෝගයන්ය. සියලුම රැස්වීම් සම්බන්ධයෙන් අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල දැනුවත් කිරීම එහි මූලික කොන්දේසියකි.

මෙම අධ්‍යයනයේදී දිවයිනේ සියලු දිස්ත්‍රික්කයන්හි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල **362ක්** වෙත තොරතුරු දැනගැනීමේ පනතට අනුව අයදුම්පත් යොමු කෙරුණු අතර **දිස්ත්‍රික්ක 14ක** සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී **කාර්යාල 155ක්** මගින් අදාළ තොරතුරු ලබා දෙන ලදි. රැස්වීම් කීයක් සම්බන්ධයෙන් අදාළ කාර්යාල දැනුවත් කර තිබේද යන්න එහිදී විමසා බැලුණු ප්‍රධාන කාරණයයි.

එමෙන්ම මෙහිදී මාතර, ගාල්ල, අනුරාධපුර, පොළොන්නරුව, කොළඹ, කළුතර, පුත්තලම, බදුල්ල, කිලිනොච්චිය, මුලතිව් යන දිස්ත්‍රික්කයන්හි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මගින් තොරතුරු පනතට අනුව තොරතුරු ලබාදීම පැහැර හැර තිබේ.


## නීති කඩ කළ මැතිවරණ රැස්වීම්

කෙසේ නමුත් **දිස්ත්‍රික්ක 14ක** සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මගින් ලබාදුන් එම තොරතුරුවලට අනුව මෙන්ම සිදු කරන ලද වැඩිදුර සොයා බැලීමේදී අනාවරණය වූ පරිදි **2020 ජූලි 20 වන දින සිට අගෝස්තු 02 වන දා දක්වා දින 12ක** පමණ කාලය තුළදී පමණක් අදාළ **දිස්ත්‍රික්ක 14** තුළ පැවැත්වූ රැස්වීම් හා සෞඛ්‍ය නිර්දේශවලට අනුකූලව කටයුතු කිරීම මෙබඳුය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ **රැස්වීම් 50,620ක්** පවත්වා ඇතත් අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල **දැනුවත් කර ඇත්තේ 570ක් පිළිබඳව පමණි. ජාතික ජනබලවේගය 11,100ක්** රැස්වීම පවත්වා ඇතත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල දැනුවත් කර ඇත්තේ **රැස්වීම් 110ක්** ගැන පමණකි. **සමගි ජනබලවේගය රැස්වීම් 33,515ක්** පවත්වා ඇතත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල දැනුවත් කර ඇත්තේ **190ක්** පිළිබඳව පමණකි. **එක්සත් ජාතික පක්ෂය රැස්වීම 21,055ක්** පවත්වා ඇති අතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල දැනුවත් කර ඇත්තේ **95ක්** ගැන පමණි. එමෙන්ම **උතුර නැගෙනහිර ද්‍රවිඩ හා මුස්ලිම් පක්ෂ මෙන්ම ස්වාධීන කණ්ඩායම් මගින් රැස්වීම 7,014ක්** පවත්වා ඇතත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල දැනුවත් කර ඇත්තේ රැස්වීම් **346ක්** ගැන පමණි. එය දකුණට සාපේක්ෂව වැඩි ප්‍රතිශතයකි.

මෙම තොරතුරුවලට අනුව පසුගිය පාර්ලිමේන්තු මැතිවරණ සමයේ **ජූලි 20 සිට අගෝස්තු දෙවන දා දක්වා** කාලය තුළදී දේශපාලන **රැස්වීම් 123,304ක්** පමණ පවත්වා ඇතත් ඒ සම්බන්ධයෙන් **2020.07.20** දින නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනතට අනුව සැකසූ **අංක 2184/34** යටතේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 2වන වගන්තියට අනුව කටයුතු කරමින් රැස්වීම පැවැත්වීමට **පැය 24** කට පමණ පෙර අදාළ රැස්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ලිඛිතව දන්වා රැස්වීම පවත්වා ඇත්තේ රැස්වීම් **1,311ක්** පිළිබඳව පමණක් බව පෙනී යයි. ප්‍රතිශතයක් ලෙස එය සියයට එකකි. එනම් රැස්වීම් සියයක් පවත්වන විට, නීතියට අනුකූල ලෙස සෞඛ්‍යාරක්ෂිත උපදෙස් අනුගමනය කරමින් පවත්වා ඇත්තේ ඉන් එක් රැස්වීමක් පමණි!

මෙහි දී හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පමණක් **2020.07.17 වන දින සිට අගෝස්තු 02 වන දින දක්වා** ප්‍රධාන දේශපාලන පක්ෂවල අපේක්ෂකයින් පමණක් **රැස්වීම් 6,814**කට අධික ප්‍රමාණයක් පවත්වා ඇති අතර, අදාළ ගැසට් පත්‍රයේ 2වන වගන්තියට අනුව කටයුතු කරමින් රැස්වීම් පැවැත්වීමට **පැය 24කට** පමණ පෙර අදාළ රැස්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ලිඛිතව දන්වා රැස්වීම පවත්වා ඇත්තේ **202කට** අඩු රැස්වීම් ප්‍රමාණයක් බව තොරතුරු දැනගැනීමේ පනතට අනුව ලබාගත් තොරතුරු මගින් අනාවරණය වේ.




| | වෙනත් | එක්සත්ජාතික පක්ෂය | ජාතික ජනබලවේගය | සමගි ජනබලවේගය | ශ්‍රී ලංකා පොදුජනපෙරමුණ |
|---|---|---|---|---|---|
| පවත්වන ලද රැස්වීම ප්‍රමාණය | 7014 | 21055 | 11100 | 33515 | 50620 |
| MOH කාර්යාල වෙත දන්වා ඇති ප්‍රමාණය | 346 | 95 | 110 | 190 | 570 |

එමෙන්ම එහි **3.2 වගන්තියට අනුව** රැස්වීමට සහභාගි කරගත හැකි **පුද්ගලයන් ප්‍රමාණය 300කට** සීමා කර තිබුණත් මේ අතරින් **50කට** අධික රැස්වීම් ප්‍රමාණයක් **500කට** වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වා තිබේ. එසේ සහභාගී විය හැකි සීමාව ඉක්මවූ රැස්වීම් සම්බන්ධයෙන් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නැති අතර ඒ වෙනුවට සිදු කර ඇත්තේ ඒවාට පොලිස් ආරක්ෂාව ලබා දීමය.

අදාළ ගැසට් පත්‍රයේ **4වන වගන්තියේ (අ) වගන්තිය** යටතේ රැස්වීමට සහභාගි වන්නන්ගේ තොරතුරු ඇතුළත් ලේඛනයක් අදාළ සංවිධායකයා විසින් පවත්වාගෙන යා යුතු වුවත් මින් රැස්වීම් සංවිධානය කළ බොහොමයක් සංවිධායකවරුන් එම නියමයන් කඩ කර තිබේ. එම වගන්තියේම (ආ) යටතේ රැස්වීමට සහභාගි වන්නන්හට දෑත් සෝදා ගැනීමට ප්‍රමාණවත් පහසුකම් ලබා දිය යුතු වුවත් මේ ආකාරයෙන් පැවැත්වූ රැස්වීම් තුළ එම පහසුකම් ද ප්‍රමාණවත්ව නොතිබූ අතර බොහෝ දෙනෙකු එය භාවිත කිරීමෙන්ද වැළකී සිටි අයුරු දක්නට ලැබුණු දෙයකි.

## මීටරයේ පරතරය නොතැබීම

අදාළ **ගැසට් පත්‍රයේ 4 (ඇ) සිට (ඉ) දක්වා** වූ වගන්ති තුළින් ජනතාව දේශපාලන රැස්වීම් සඳහා ඒකරාශි වීමේදී මීටරයක පරතරයක් තබාගත යුතු බව සඳහන් කර තිබුණත් එය බොහොමයක් අවස්ථාවල සිදු නොවූ අතර අදාළ අපේක්ෂකයා වටා මෙන්ම ආහාර බෙදීම්, සංග්‍රහ වැනි අවස්ථාවන්හිදී ජනතාව පෝලිම් තුළ තෙරපෙමින් සිටින ආකාරයක් මෙන්ම ඒ අතර සිටි බොහොමයක් දෙනා මුඛ ආවරණ පවා පැළඳ නොසිටි බව ද පැහැදිලිව දක්නට ලැබුණි.

මේ ආකාරයෙන් සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ගෙන් තොරව මැතිවරණ රැස්වීම පවත්වා ඇතත් එසේ සෞඛ්‍ය මාර්ගෝදේශයන් අනුගමනය නොකළ කිසිදු පුද්ගලයෙකු මැතිවරණ රැස්වීම තුළදී අත්අඩංගුවට ගෙන නොමැති බව පොලිස් අධිකාරී කාර්යාල මගින් ලබාගත් තොරතුරු මගින් අනාවරණය විය.

කෙසේ නමුත් මේ ආකාරයෙන් නිරෝධායන නීති රීතිවලට අනුව මැතිවරණ ප්‍රචාරක රැලි පැවැත්වීමට නොහැකි වූයේ ඇයිද යන්න සම්බන්ධයෙන් කළ සොයා බැලීමකදී අනාවරණය වූයේ මනාප සටනට යටවීම හේතුවෙන් බොහෝමයක් ඡන්ද අපේක්ෂකයින් දේශපාලන පක්ෂ බේදයකින් තොරව සෞඛ්‍ය මාර්ගෝපදේශයන් නොතකා කටයුතු කර ඇති බවයි.

එමෙන්ම බොහොමයක් කුඩා රැස්වීම් සංවිධානය කර තිබුණේ ග්‍රාමීය මට්ටමින් සිටි කොට්ඨාස සංවිධායකයින් වන අතර ඔවුන් බොහොමයක් දෙනා අදාළ ගැසට් පත්‍රයට අනුව රැස්වීම පැවැත්වීමට **පැය 24 කට** පමණ පෙර අදාළ රැස්වීම සම්බන්ධයෙන් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ලිඛිතව දැන්විය යුතු බවක් නොදැන සිටි බව පක්ෂ කීපයක සංවිධායකයින් කිපදෙනෙකුගෙන් කළ විමසීමකදී හෙළි විය.

**"එහෙම දැනුවත් කරන්න ඕන කියලා අපි දැනගෙන හිටියේ නෑ. නමුත් පුළුවන් හැම අවස්ථාවකදීම නිරෝධායන නීතිවලට අනුව රැස්වීම සංවිධානය කරන්න අපි කටයුතු කළා. නමුත් එන ජනතාව ඒ ගැන වැඩි තැකීමක් කළේ නෑ. පාක්ෂිකයින් තරහ කරගන්න බැරි නිසා අපිත් වැඩිය ඒ ගැන තැකීමක් කළේ නෑ"** යනුවෙන් **සමගි ජනබලවේගයේ** හම්බන්තොට ප්‍රදේශයේ රැස්වීම කීපයක් සංවිධානය කළ **ආර්.පී. ප්‍රියන්ත මහතා** කියා සිටියේය.

**"අපි පොලිසිය දැනුවත් කරලා තමයි රැස්වීම කළේ. නමුත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය දැනුවක් කළේ නැහැ" නම හෙළි කිරීමට අකැමති වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ** සංවිධායක වරයෙක් කියා සිටියේ ය.

එමෙන්ම මේ ආකාරයෙන් නිකුත් කර තිබූ ගැසට් පත්‍රයට අනුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල දැනුවත් නොකරමින් රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් පක්ෂ කීපයක අපේක්ෂකයින් ලෙස ඉදිරිපත්වූ අයගෙන්ද අදහස් විමසුවෙමු.



**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ** අපේක්ෂකයෙකු වූ **අමාත්‍ය මහින්ද අමරවීරඃ**

**"ලිඛිතවම නැති වුවත් අපි යම් ප්‍රමාණයකට දැනුවත්කළා. ඒ වගේම රැස්වීම සංවිධානය කළ අයට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය දැනුවත් කරලා රැස්වීම තියන්න කියලා ඉල්ලීම් කළා. ඒ වගේම සියයට සියයක්ම නැති වුණත් යම් තරමකට සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව තමයි රැස්වීම පැවැත්වුවේ"**

**සමගි ජනබලවේගයේ** අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත්වූ **පාර්ලිමේන්තු මන්ත්‍රී දිලිප් වෙදආරච්චිඃ**

**"අපි මුලින්ම නියම ආකාරයෙන් හොඳට සෞඛ්‍ය නීතිවලට අනුව රැස්වීම් පැවැත්වුවා. නමුත් ආණ්ඩු පක්ෂයේ ගොඩක් ඡන්ද රැස්වීම් කළේ නීති කඩ කරමින්. නමුත්**

**හැකි තැන්වලදී අපි අවසර අරගෙන තමයි කළේ"**

**ජාතික ජනබලවේගයේ** අපේක්ෂකයෙකු වූ **නිහාල් ගලප්පත්ති :**

**"අපි හැම රැස්වීමක් පිළිබඳවම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ලිඛිතව දැනුවත් කිරීම් කරලා නැති වුවත් පුළුවන් උපරිමයෙන් සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව රැස්වීම තියන්න කටයුතු කළා. ආණ්ඩු පක්ෂය සියලු නීති කඩ කරමින් සෙනඟ රැස්කරමින් තමයි රැස්වීම කළේ. ඒත් කිසිම නිලධාරියෙක් ඒ ගැන සොයා බැලුවෙත් නෑ. මම කීප වතාවක්ම නිලධාරීන්ට පැමිණිලි කළත් නිතිය ක්‍රියාත්මක කළේ නෑ"**

කෙසේ නමුත් පැවතුණු තත්ත්වය හමුවේ මෙම මැතිවරණ ප්‍රචාරක රැලි පැවැත්වීමේදී සෞඛ්‍ය අංශයන්හි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂිකා වෛද්‍ය **ඒ.ටී.එම්.ඩී. පටබැඳිගේ** මහත්මියගෙන් කළ විමසීමකදී එතුමිය කියා සිටියේ තම නිලධාරීන් දැනුවත් කරමින් පැවැත්වූ මැතිවරණ ප්‍රචාරක රැලි සඳහා එය පවත්වාගෙන යා යුතු ආකාරය සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සිදු කළ බවයි. **"අපි කළේ ඒ සම්බන්ධයෙන් දැනුවත් කළ රැස්වීම සඳහා සෞඛ්‍ය මාර්ගෝපදේශ ලබා දීම පමණයි. ඒවා අනුගමනය කළේ නැත්නම් හොයන්න ඕන. නීතිය ක්‍රියාත්මක කරන්න තිබුණේ පොලිසියට."** එතුමිය වැඩිදුරටත් පැවසුවාය.

## මැතිවරණ කොමිසමේ හා නිරීක්ෂණ සංවිධානවල වගකීම

මේ සම්බන්ධයෙන් අපි මැතිවරණ නිරීක්ෂණ සංවිධාන කීපයකින්ම අදහස් විමසුවෙමු. එහිදී අදහස් දැක්වූ **පැෆරල් සංවිධානයේ** විධායක අධ්‍යක්ෂක **රෝහණ හෙට්ටිආරච්චි මහතා** මෙසේ පැවසුවේය.

**"මේ කොවිඩ් ප්‍රශ්නය මතු වූ අවස්ථාවේ ඉදලා මේ මැතිවරණය වෙනුවෙන් නීතිරීති පැනවීමට මේ ගැසට් එක පළ කිරීම හිතාමතාම සෑහෙන ප්‍රමාද කළා. මොකද මේකෙන් ඒ අයට ඕන විදියට මැතිවරණය කරගන්න බැරි වෙයි කියලා. පස්සේ ගැසට් එක දැම්මට පස්සෙත් ඒ උපදෙස් අනුව නොවේ තමන්ගේ මැතිවරණ ව්‍යාපාරය ගෙනිච්චේ. වාසනාවකට මේ තරම් සෞඛ්‍ය ප්‍රශ්නයක් එදා තිබුණෙ නෑ. තිබුණානම් ලොකු හානියක් වෙනවා, ඒ හැසුරුණු ආකාරයට"**

එමෙන්ම මේ ආකාරයෙන් නිරෝධායන නීති උල්ලංඝනය කරමින් පැවැත්වූ මැතිවරණ රැලි සම්බන්ධයෙන් පැමිණිලි 600කට අධික ප්‍රමාණයක් තම නිරීක්ෂණ සංවිධානයට ලැබී තිබෙන බවත් මැතිවරණ සමයේ එය ක්‍රියාත්මක නොකර සිට පසුව සාමාන්‍ය ජනතාවට පමණක් නීති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ අංශයන්ගෙන් විමසු බවත් රෝහණ හෙට්ටිආරච්චි මහතා කියා සිටියේය.

එමෙන්ම **මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ** කැඳවුම්කරු **මංජුල ගජනායක මහතාගෙන්** කළ විමසිමකදී ඔහු කියා සිටියේ **මේ ආකාරයෙන් නිරෝධායන නීති උල්ලංඝනය කරමින් පැවැත්වූ මැතිවරණ රැස්වීම් සම්බන්ධයෙන් තම සංවිධානයට නිරන්තරයෙන් වාර්තා වූ අතර ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමිසන් සභාව**





www.thehindu.com

**දැනුවත් කිරීමට කටයුතු කළ බවයි. එමෙන්ම මැතිවරණයෙන් පසුව මැතිවරණ කොමිසන් සභාව මේ සම්බන්ධයෙන් තදින් නොසිටීම සහ තමන්ගේ ක්‍රියා කලාපය පසු විපරම් නොකිරීම අනාගතයේදී මැතිවරණ ක්‍රියාවලිය නිවැරදි මාවතට ගෙන ඒමට බලවත් බාධකයක් බවයි.**

මැතිවරණ කාලසීමාවකදී මැතිවරණයට සම්බන්ධ සියලු කටයුතුවල බලධරයා වන්නේ මැතිවරණ කොමිසමයි. මැතිවරණයට බලපෑම් එල්ල විය හැකි රජයේ ක්‍රියාකාරකම් පාලනය කිරීමේ පුළුල් බලතල එයට පැවරී ඇති අතර එම කාලපරිච්ඡේදය තුළ පොලිසිය පවා ක්‍රියා කළ යුත්තේ කොමිසමේ උපදෙස් අනුවය. සෞඛ්‍ය උපදෙස් අනුගමනය නොකර රැස්වීම් පැවැත්වීමේ ගැටලුව ගැන අපි **මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක** මහතාගෙන් විමසුවෙමු.

**"මැතිවරණයේදී අපගේ දිස්ත්‍රික්ක 25හේ සහකාර කොමසාරිස්වරුන්ට, අත්අඩංගුවට ගැනීමේ සහ නඩු පැවරීමේ බලය දෙන්න කියල අපි අධිකරණ අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කළා. නමුත් එක ලැබුණේ නෑ. කොහොමත් මැතිවරණ නිලධාරීන්ට විතරක් කිසිම පුද්ගලික තැනකට ඇතුළුවීමේ හැකියාවක් නෑ. ඒ නිසා ඒ වගේ පැමිණිල්ලක් අපිට ආවාම අපිට යන්න වුනේ පොලිසිය එක්ක. ඇත්තටම් මේක පොලිසියේ රාජකාරියක්"** මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා කියා සිටියේය.

## පොලිස් බලය ක්‍රියාත්මක කර නෑ

කෙසේ නමුත් ඉහත ආකාරයෙන් සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය නොකරමින් දේශපාලන රැස්වීම පවත්වනු ලැබුවත් එම රැස්වීම තුළදී ඒ ආකාරයෙන් නිරෝධායන නීති උල්ලංඝනය කරන ලද කිසිවෙකු අත්අඩංගුවට ගෙන නොමැතිබව **පොලිස් අධිකාරී කාර්යාල 42ක් වෙත** තොරතුරු අයදුම්පත් යොමුකිරීමෙන් පසු පොලිස් අධිකාරී කාර්යාල 6ක් මගින් ලැබුණු තොරතුරු මගින් අනාවරණය විය. අනෙකුත් පොලිස් අධිකාරී කාර්යාල තොරතුරු පනතට අනුව තොරතුරු ලබාදීම පැහර හැර තිබේ.

කොරෝනා පාලනය සඳහා මැතිවරණයේදී අනුගමනය කළ යුතු කි්‍රයාමාර්ග ඇතුළත් ගැසට්පත්‍රයේ නියෝග ක්‍රියාත්මක කිරීමට පොලිසියට බලය තිබූ බව **නීතිඥ ජගත් ලියනයආරච්චි** මහතා පවසයි.

**"මෙම නියෝගය පනවා තියෙන්නේ නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ දෙවන වගන්තිය යටතේ. එම පනතේ 06 වන වගන්තියට අනුව පනත යටතේ වරදක් කරන පුද්ගලයෙකු**

**වැළැක්වීම සහ රඳවා ගැනීමට පොලිස් නිලධාරියෙකුට සහ පනත යටතේ පත්කරන පරීක්ෂකවරයෙකු හට  බලය තිබෙනවා."**

එමෙන්ම තමන් ඉදිරියේදී නීතිය කඩ කරන විට එය වැළැක්වීමට ක්‍රියා කිරීමට පොලිස් නිලධාරියෙකුට පැමිණිල්ලක් ලැබීම අවශ්‍ය නොවන බවද **නීතිඥ ජගත් ලියනයආරච්චි** මහතා සඳහන් කළේය.

**"මැතිවරණය පැවැත්වීම හැම දේශපාලන පක්ෂයකටම අවශ්‍ය වුණාට මෙම තත්වය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අර්බුදයක් නිසා තමයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කණ්ඩායම එකතුවෙලා මාර්ගෝපදේශ හැදුවෙ සෞඛ්‍ය නීති අනුගමනය කරන්න. නමුත් ඒ මාර්ගෝපදේශවල තිබුණු දේවල් දේශපාලන අවශ්‍යතාව සඳහා වෙනස් වුණා"** නීතිඥ ජගත් ලියනආරච්චි  මහතා අවධාරණය කරයි.

දෙවන රැල්ලක් ලෙසින් පෙරටත් වඩා ශීඝ්‍රයෙන් කොරෝනා රෝගය දිවයින තුළ පැතිරෙමින් තිබේ. ඒ නිසාම ඒ කෙරෙහි නව නීති රීති ද සකස් කිරීමට රජය කටයුතු කර තිබේ. එමෙන්ම එම නීති කඩන පිරිස් අත්අඩංගුවට ගැනීම්ද වාර්තා වේ. නමුත් ඉහත කාරණා සැලකිල්ලට ගැනීමේදී **පසුගිය 2020 පාර්ලිමේන්තු මැතිවරණ සමයේදී** කොරෝනා පාලනය වෙනුවෙන්  පැනවූ නීති රීති මැතිවරණ ප්‍රචාරක රැලි සඳහා අදාළ වී නොමැති බවත් එය දේශපාලන කාරණාවක් වන නිසා නොසලකා හැර තිබෙන බවත් පැහැදිලිය.

මැතිවරණ ප්‍රචාරක රැලි තුළදී නිරෝධායන නීති උල්ලංඝනය කළ පිරිස් අත්අඩංගුවට ගැනීමට කටයුතු නොකිරීම සම්බධයෙන් නියෝජ්‍ය පොලිස්පති පොලිස් මාධ්‍යප්‍රකාශක අජිත් රෝහණ මහතාගෙන් කළ විමසීමකදී ඔහු කියා  සිටියේ මේ සම්බධයෙන් මැතිවරණ කටයුතු භාරව සිටි **ජ්‍යෙෂ්ට නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාගෙන්** විමසන ලෙසයි.

ඒ අනුව ඔහුගෙන් කළ විමසීමකදී ඔහු මෙසේ පැවසුවේය.

**"මැතිවරණ කාලේ දාපු ගැසට් එක මේක වගේ (2020.10.15 ගැසට් එක) තදින් ක්‍රියාත්මක වුණේ නෑ. ඒ වගේම ඒ දවස්වල තිබුණු කොරෝනා තත්ත්වය නොවේ අද තියෙන්නේ. ඉලෙක්ෂන් එක කළා කියලා එකෙන් කොහෙවත් පැතිරීමක් වුණේ නෑ. ඒ නිසා එක ලොකුවට අල්ලගන්න ඕන කාරණාවක් නොවේ. අඩු පාඩුවක් තියෙන්න ඇති, නමුත් ඒක අල්ලාගෙන අපිට ආපස්සට යන්න බෑ. නමුත් අපිත් ඩිවිෂන්ස්වලට (පොලිස් අධිකාරී කාර්යාල) කතා කරලා මොකද මෙහෙම වුණේ කියලා හොයන්නම්"** නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතා කියා සිටියේය.

මේ තොරතුරුවලින් පැහැදිලිව අනාවරණය වන කරුණ නම්, සෞඛ්‍ය නිර්ණායක පනවනු ලැබූ නමුදු ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් තිබී නැති බවයි. එමෙන්ම සියලු බලධාරීන් පොදු එකඟතාවකට පැමිණ සිටි පරිද්දෙන් නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇති බවයි. **එක්ලක්ෂ විසිතුන් දහසකට අධික රැස්වීම් සංඛ්‍යාවකින් 99%ක්ම අදාළ නීති උල්ලංඝනය කර තිබියදී** එකදු වරදකරුවකුට හෝ එරෙහිව නීතිමය පියවරක් නොගැනීම, අදහාගැනීමට අසීරු තරමේ කාරණයකි. මතුවට හෝ ඒ සම්බන්ධයෙන් නීතිමය පියවරක් ගැනීමට අපේක්ෂා නොකරන බව පොලිස් බලධාරීන් ඒ පිළිබඳ දක්වා ඇති ප්‍රතිචාරයෙන් පැහැදිලිය. මෙය ඉතා නරක පූර්වාදර්ශයක් නොවේද?

**රාහුල් සමන්ත හෙට්ටිආරච්චි**

2020.11.19 ''අද'' පුවත්පත






## අලි මිනිස් ගැටුමට විසඳුම් සොයා මිලියන ගණනක මුදල් අහිමි කළ

# අලි වැට

**සිරිලක වෙරළ තීරය දිගේ  ඔබ ඇවිද යන්නේ නම් කිලෝමීටර් 1340ක් දුර තරණය කිරීමට ධෛර්යය අවැසි වේ. ලංකාව වැනි කුඩා කොදෙව්වකට එය විසල් දුරකි. එහෙත් මේ කොදෙව්වේ පරිමිතිය ඉක්මවා යන තරමේ දුරක් අලි වැට ඉදිකර ඇති බව පවසන විට ඔබ පුදුම විය යුතු නැත්තේ ඒවායේ දිගෙහි එකතුව කිලෝමීටර් 4400කට ආසන්න බැවිනි. මේ ප්‍රමාණය රට වටේ වට තුනකි. ලංකාවේ සිට චීනයට වැටක් ගහන්නට තරම් දුරකි.**

දිවයින තුළ මේ වන විට විසඳුම් සෙවිය නොහැකි ගැටලුවක් තරමටම අලි මිනිස් ගැටුම වර්ධනය වී තිබෙන මොහොතක අලි වැටවල් කොතෙකුත් ඉදිකළත් ඉන් බොහොමයක් ප්‍රදේශ තුළ එම අලි වැටවල් සක්‍රිය මට්ටමින් නොමැති වීම හේතුවෙන් වන අලින් ගම් වැදීම සිදුවේ. මෙවැනි  පසුබිමක් තුල ලංකාවේ අලි වැටවල් සම්බන්ධයෙන් වන ජීවී දෙපාර්තමේන්තුවෙන් තොරතුරු දැනගැනීමේ පනත අනුව කළ විමසීමක දී මෙම තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි විය.

දිස්ත්‍රික්ක අනුව සදා ඇති අලි වැටවල් වල දිග




(මූලාශ්‍රය - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තොරතුරු පනත මගින් ලබා ගත් තොරතුරු)


ලංකාවේ අලි මිනිස් ගැටුමේ ආරම්භය කුමන ආකාරයකින් සිදු වුවත් එය උග්‍ර වීමට තුඩු දුන්නේ 70 දශකයේ අග භාගය පමණ වන විට මෙරට ඇති කළ කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරයයි. නියම සැලසුමකින් තොරව ආරම්භ කෙරුණු මෙම සංවර්ධන ක්‍රියාදාමය නිසා සිදු වූ වන විනාශය හේතුවෙන් වන අලින් ඇතුළු සතා සිව්පාවුන්ට ඔවුන්ගේ වාස භූමි අහිමි විය. එමෙන්ම ආහාර හිඟ විය. වන විනාශය නිසා ස්වභාවික දිය කඩිති වියළී යෑම නිසා සතුන්ට අවශ්‍ය පානීය ජලය අහිමි විය. අලිමංකඩ ඇහිරිණි. මේ ආකාරයේ බොහෝ කරුණු නිසා වන අලි ගම් වදින්නට විය. ආහාර සොයා වගාබිම් වෙත පැමිණෙන්නට විය. අද වන විට ලංකාවේ අලි මිනිස් ගැටුම දරුණු ලෙස පවතින්නේ මේ ආකාරයෙන් සංවර්ධනය වූ මහවැලි කලාපවලය.

## අවිධිමත් සංවර්ධන ව්‍යාපෘති හා අලි ගැටලු

මෙසේ වන අලින්ට තම වාසභූමි අහිමි වෙද්දී වන අලි නිරන්තරයෙන් ගම් වදින්ට විය. මෙම තත්වය වර්තමානය වන විට දරුණු ලෙස පවතී. නමුත් වන අලි ගම්වදින බව ඇතැමුන් පැවසුවත් ඒ සම්බන්ධයෙන් සොයා බැලීමේ දී හෙළි වන්නේ වන අලි සිටි ප්‍රදේශවල කැළෑ හෙළි කරමින් මහවැලි හා වෙනත් සංවර්ධන කටයුතු සිදු කළ කලාපයන්හි ඇති කළ ගම්මානවලට වන අලි පිවිසෙන බවය. මෙයින්








පෙනී යන්නේ තමන් සිටි ප්‍රදේශ අතහැර යෑමට වනඅලි තවමත් මැළි වන බවයි. මේ නිසා ඇති වී තිබෙන්නේ අලි මිනිස් ගැටුමකි.

අනවසරයෙන් කැළෑ හෙළි පෙහෙළි කරමින් සිදුවූ ගොවිතැන් කටයුතු නිසා ද තවත් ආකාරයකින් වන අලින්ගේ වාසභූමි ඔවුන්ට අහිමි වී තිබේ. එම ගොවිබිම්වල අලින්ට අවශ්‍ය රසමුසු ආහාරපාන තිබේ. ඒවා පහසුවෙන් ලබාගැනීමට හැකි වීම නිසාම වන අලි එම ගොවිබිම් සඳහා නිරන්තරයෙන් පැමිණෙති. ගස්වල අතු හා පොතු, තණකොළ ආදිය ආහාරයට ගත් අපේ රටේ වන අලින්ට තම වාසභූමි එළි කරමින් වගා කර ඇති නොයෙක් ආකාරයේ රසබොජුන් නිසාම අලි දැන් එම ආහාරවලට පුරුදුවී හමාරය. මේ සියලු සිදුවීම් වන්නේ මිනිසා විසින් සිදු කරන ආත්මාර්ථකාමී ක්‍රියා කලාපය නිසා බව ද පෙන්වා දිය යුතුය.

මේ ආකාරයෙන් අලි මිනිස් ගැටුම බහුල ලෙස පවතින දිස්ත්‍රික්ක මෙන්ම හම්බන්තොට ප්‍රදේශය තුළ ද අලිමිනිස් ගැටුමට බහුල ලෙස බලපා ඇත්තේ මේ ආකාරයෙන් මහවැලි කලාපයේ රක්ෂිත හෙළි කරමින් සිදුකරන මහා පරිමාණ වාණිජ වගාවන් හා සංවර්ධන කටයුතු ය. නිලධාරීන්ගේද ආශිර්වාදය මගින් සිදු කරනු ලබන මෙම වන විනාශය සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ පනත මගින් තොරතුරු කොමිසම දක්වා ගොස් මහවැලි සංවර්ධන අධිකාරිය මගින් ලබා ගත් තොරතුරු වලින් ද අනාවරණය වූයේ ඒ සියලු කැළෑ හෙළි කිරීම් නීති විරෝධී බවයි.

## අලි වැටේ දිග

මේ ආකාරයෙන් අලි මිනිස් ගැටුම වර්ධනය වෙද්දී ඊට පිළියම් සෙවීම සඳහා ශ්‍රී ලංකාවේ ඉදිකළ ප්‍රථම අලි වැට **හම්බන්තොට දිස්ත්‍රික්කයේ** ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය ආශ්‍රිතව **1992 කිලෝ මීටර් විස්සක්(20)** දිගට සාදන ලද රණවරණාව, විදුලි වැටයි.

එතැන් පටන් ලංකාව තුළ අලි මිනිස් ගැටුම පවතින **දිස්ත්‍රික්ක 16ක** ඉදිකර ඇති සියලු **අලි වැටවල්වල දිග වන්නේ කිලෝමීටර් 4349.1 කි.** ඒ අතර වැඩිම අලි වැටවල් සාදා ඇත්තේ **පොළොන්නරුව දිස්ත්‍රික්කයේ** වන අතර එම දිස්ත්‍රික්කයේ පමණක් **අලි වැටවල් 52ක් කිලෝ මීටර් 524 දිගට** ඉදිකර ඇත. එය ද පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා වූ ලංකාවේ දිගට වඩා වැඩි දිගකි.

මේ අතර **ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ** ඉදිකළ ලංකාවේ දිගම අලි වැට ද පසුගිය **2018 සැප්තැම්බර් 19 වනදා** ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත කළ අතර **එහි දිග කිලෝ මීටර් 30කි. රුපියල් ලක්ෂ 193ක්** වැය කරමින් **ගෝමරන්කඩවල සිට මැදවච්චිය දක්වා** එය ඉදිකර තිබේ.

එමෙන්ම මෙම අලි වැටවල් සෑදීම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් යොදවා තිබේ. සාමාන්‍යයෙන් මෑත කාලය වන විට **කිලෝ මීටර් එකක් දිගට අලි වැටක් ඉදිකිරීම සඳහා රුපියල් 1,360,606.37 ක මුදලක්** වැය වේ. එවැනි ආකාරයෙන් අලි වැටවල් ඉදිකිරීම සඳහා **2013 වර්ෂයේ සිට 2017 දක්වා කළ වියදමත්** වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් එම වර්ෂ තුළ සංචාරක ක්ෂේත්‍රය තුළින් උපයන ලද මුදලත් සලකා බැලුවහොත් එම අදායමෙන් **සියයට දහයක් (10%)** පමණ අලි වැටවල් ඉදිකිරීම සදහා පමණක් යෙදවීමට සිදුව තිබේ .

මීට අමතරව ඉහත දත්ත සටහනේ සඳහන් **මුලතිව්, නුවරඑළිය, ත්‍රිකුණාමලය** යන දිස්ත්‍රික්ක තුන හැරුණු කොට **අනෙකුත් දිස්ත්‍රික්ක 13 තුළ 2021 වන විට** විවිධ දිග ප්‍රමාණයේ අලි වැටවල් ඉදි කිරීමට සැලසුම් කර තිබෙන අතර **එම අලි වැටවල්වල සමස්ත දිග ප්‍රමාණය කිලෝ මීටර් 2,256.1ක්** බව ද වනජීවී දෙපාර්තමේන්තුවෙන් තොරතුරු පනත මගින් ලබා ගත් තොරතුරු මගින් හෙළි විය. **ඒ අනුව 2021 වන විට ලංකාවේ සමස්ත අලි වැටවල් වල දිග ප්‍රමාණය දිග කිලෝමීටර් 6,605.2** දක්වා ඉහළ යනු ඇත.

අලි ඇතුන් ගම් වැදීම වැළැක්වීමට අදටත් සාර්ථක ක්‍රමෝපායක් වශයෙන් සලකමින් විශාල මුදලක් වැය කරමින් මේ ආකාරයෙන් වාර්ෂිකව අලි වැටවල් ඉදිකළත් ඉන් සාර්ථක ප්‍රතිපල ලබා ගැනීම සඳහා මේ වන තෙක් නොහැකි වී ඇත්තේ වන අලින්ගේ වාස භූමි දිනෙන් දින හෙළි කරමින් සිදුකරනු ලබන සංවර්ධන කටයුතු නිසාත් අනවසර කෑළෑ හෙළිකිරීම නිසාත්ය. නමුත් වනජීවි නිලධාරින්ගේ කරුණු ඉදිරිපත් කිරීමට අනුව ඇතැම් ප්‍රදේශවල මේ විදුලි වැට හරිහැටි ක්‍රියාත්මක නොවන්නේ ගම්මුන්ගේම වැරදි ක්‍රියා නිසාය. ඒ අතර මිනිසුන් විසින් සිතා මතා විදුලි වැටට හානි සිදු කිරීම, බලශක්ති කුටිවල ඇති භාණ්ඩ සොරා ගැනීම මෙන්ම වන අලින් විදුලි වැටවල් සඳහා හානි පැමිණවීම යන හේතුන් නිසා මේ ආකාරයෙන් විදුලි වැටවල් අක්‍රිය වෙයි.








කෙසේ නමුත් මිලියන ගණනක මුදලක් වැය කර අලි වැට සකස් කරනු ලැබුවත් එම විදුලි වැට නඩත්තු කිරීම සඳහා කිලෝ මීටර් 10 ක් සඳහා යොදවා ඇත්තේ සිවිල් ආරක්ෂක භටයින් තුන් දෙනෙකු පමණක් වන අතර විදුලි වැට දෙපස හෙළි පෙහෙළි කරමින් එය නඩත්තු කිරීම ඔවුන්ගේ වගකීමයි. නමුත් ඒ ආකාරයෙන් සුළු පිරිසකගෙන් නඩත්තු කටයුතු සිදු කිරීම ප්‍රායෝගික කාරණයක් නොවන බවයි සිවිල් ආරක්ෂක නිලධාරීන් කියා සිටින්නේ.

එමෙන්ම විදුලි වැටවල් ඉදිකර තිබුණත් එම විදුලි වැටවල් සඳහා අවශ්‍ය මුරකුටි, විදුලිය හා ජලය, ප්‍රමාණවත් අලි වෙඩි ආදිය නොලැබීම හා මුරකුටි අලුත්වැඩියා නොකිරීම නිසා බොහොමයක් අලි වැටවල් අක්‍රිය වීමට හේතුව වී තිබේ. ඒ ආකාරයෙන් රුහුණ කලාපයේ පමණක් එවැනි අඩුපාඩුකම් සහිත විදුලි වැටවල් 30කට ආසන්න ප්‍රමාණයක් තිබෙන බව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් වනජීවී දෙපාර්තමේන්තුව දැනුවත් කර තිබේ.

## විදුලි වැට අභිභවන වන අලි

වන අලින් ගම් වදින ප්‍රදේශවල ගම්මුන් චෝදනා කරන්නේ, විදුලි වැටේ බිඳ වැටීම් පිළිබඳ ඒ අවස්ථාවලදීම දැනුම් දුන්නත් වන ජීවී නිලධාරීන්ගේ උදාසීනත්වය නිසා යළි පිළිසකර කළ නොහැකි ආකාරයෙන් අලින් විසින් විනාශ කරන බවයි.

ජ්‍යෙෂ්ඨ පරිසරවේදීන් විදුලි වැටට අදාළව හඳුනාගත් තත්ත්වයන් අතර හොඳම විසඳුමක් ලෙසින් විදුලි වැට ක්‍රමය, රජය විසින් අදටත් පිළිගන්නා බව පෙනේ. ඊට රු. මිලියන ගණනින් වැය කිරීම ද සිදු කරමින් ඒවා ඉදිකර

තිබියදීත් ඇතැම් ප්‍රදේශවල වන අලින් විදුලි වැට අභිබවමින් කටයුතු කරන තත්ත්වයක් ද නිර්මාණය වෙමින් පවතී. ඒ සම්බන්ධයෙන් සිදු කරන්නට යෙදුණු නිරීක්ෂණ පෙන්වා දෙන්නේ අලි ඇතුන් මේ විදුලි කම්පනයට ඔරොත්තු දෙන තත්ත්වයක් ගොඩ නඟා ගනිමින් සිටින බවයි. ඒ අනුව විදුලි වැට බාධකයක් කර නොගනිමින් මේ සතුන් ගම් වදින තත්ත්වයක් ඇති වෙමින් තිබේ.

මහජන මුදල් විශාල ප්‍රමාණයක් යොදවමින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ විල්ගම් වෙහෙර ගම්මානය වටා ඉදිකළ විදුලි වැට ද එය සාදා මාස තුනක් ගතවීමටත් පෙර බැටරිය අක්‍රියවීම හා සුදු අලියෙක් බවට පත්වී ඇත. ඒ සම්බන්ධයෙන් බලධාරීන් මුනිවත රකින බව ගම්මුන්ගේ චෝදනාවයි.

**"අපි අවුරුදු ගාණක් කඳවුරුවල ඉඳලා නැවත පදිංචියට ආවට පස්සේ රජයෙන් ඉල්ලුවේ වන අලි ගැටලුවට විසඳුමක් දෙන්න කියලා විතරයි. මොකද අපි එදා ඉඳන් පාරම්පරික ගොවියෝ. අපි කාටවත් අත නොපා ඇඟේ හයි හත්තියෙන් මහ පොළොව එක්ක හැප්පිලා තමයි ජීවත් වුණේ. අපේ ඉල්ලීමට වනජීවී එකෙන් අලි වැටක් ඉදි කරන්න කණුත් ගෙනල්ලා තියෙද්දී තමයි මේ අටමට්ටලේ පංගරාතු වුණේ. මේක හදලා අඩුම තරමින් මාස දෙක තුනක්වත් වැඩ කළා නම් හිතට දුකක් නැහැ."** විල්ගම් වෙහෙර ගම්මානයේ පැරණිතම ගොවි මහතෙකු වන එස්.ඒ.හේමචන්ද්‍ර මහතා කියා සිටී.

ආබාධිතයෙකු වන හේමචන්ද්‍ර මහතා ස්ව ශක්තියෙන් අක්කර තුනක පමණ බිමක බව හෝග අස්වද්දවා ඇතත්, මේ වන විට එහි භුක්තිය වන අලීන් අත්පත් කර ගෙන ඇති බව කියා සිටී. අක්කර දෙකක පමණ භූමි භාගයක පැතිරුණු ගස් ලබු වගාවෙන් හරි අඩකටත් වඩා මේ වන විට වන අලීන් විසින් විනාශ කර දමා ඇති අතර, පොල් හා කෙසෙල් වගාවට ද හිමිව ඇත්තේ ඊට නොදෙවෙනි තත්ත්වයකි.

**විල්ගම් වෙහෙර ග්‍රාමීය විදුලි වැට** සම්බන්ධයෙන් අප තොරතුරු දැන ගැනීමේ පනත හරහා ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කරන ලද විමසීමකට ලැබුණු පිළිතුර අනුව මේ සඳහා වැය කර ඇති **මුළු මුදල රුපියල් 3,711,128 කි. කිලෝ මීටර 11 මීටර් 200** දිගැති මෙම විදුලි වැට මගින් විල්ගම් වෙහෙරේ **පවුල් 109ට ආරක්ෂාව සලසයි.** මනහර ලංකා නැමැති ආයතනය මගින් එහි ඉදි කිරීම් සිදු කර ඇති අතර, වනජීවී දෙපාර්තමේන්තුවේ අවසරය ද ඊට ලැබී තිබේ.

**"දැන් ඔය විදුලි වැටේ කරන්ට් එක තියෙනවද නැද්ද කියලා දැන ගන්න එල් ඊ ඩී බල්බ් හයි කරනවා. මොරවැව එකෙත් එහෙමයි. නමුත් අපේ එකේ එහෙම හයි කරේ නැහැ. අපි අහපුවහම කරන්ට් එක තියෙනවද නැද්ද කියලා දැන ගන්නේ කොහොමද කියලා කොම්පැනිය කිව්වේ, තණ කොළයක් අරගෙන කම්බියට ගාවලා බලන්න කියලා. අනික කොන්ක්‍රීට් කණු නොදා යකඩ බට දැම්මහම හරක් පැන්නත් බට නැමෙනවා. ඒ බට ගන්න තැනක් නැහැ. කම්බි කැඩුණහම ඒ වෙනුවට දා ගන්න අමතර කම්බි තිබුණේ නැහැ. ඒකෙන් මුළු වැටම අක්‍රිය වෙනවා. බැටරියට අවුරුදු පහක් වග කියනවා කියලා කිව්වට මාස තුනෙන් බැටරිය අක්‍රිය වුණා. කොම්පැනිය අපිට කිව්වේ සල්ලි එකතු කරලා බැටරිය දාගන්න කියලා" එවැනි ගැටළු රැසක් තිබුණ බව සංජීවනී මහත්මිය පැවසුවා ය."**

එමෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයේ මදුනාගල ඇතුළු ප්‍රදේශ රාශියක තිබෙන විදුලි වැටවල් ද මේ ආකාරයෙන් අක්‍රිය වී පැවතීම නිසා ගොවිජනතාව දිනෙන් දින දැඩි පීඩාවට



ලක් වන බව මදුනාගල සුමනානන්ද මහතා කියා සිටී.

**"මේ අලි වැට හදල මාසයක් ගියෙත් නෑ. අලි වැට අලි කඩලා විනාශ කරලා දැන් කම්බියක්වත් නෑ. හැමදාම අලි ගම් වදිනවා මිනිස්සුන්ට පහර දෙනවා. වගා හානි කරනවා. අපිට ජීවත්වෙන්න විදියක් නැති වෙලා" සුමානන්ද මහතා කියා සිටියේ ය.**

මේ ආකාරයෙන් මහජන මුදල් විශාල ප්‍රමාණයක් වැය කරමින් අලි වැටවල් සාදනු ලැබුවත් ඒවා නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා එම විදුලි වැටවල් අක්‍රිය වී කැළයට යටවී ඇති අතර වන අලින් ගම් වැදී විශාල වගා හානි මෙන්ම දේපළ, මිනිස් ජීවිත මෙන්ම වන අලින්ගේ ජීවිත ද හානියට පත්වීමේ තත්වයක් උද්ගතවී තිබේ. මේ සඳහා කදිම උදාහරණය සූරියවැව මදුනාගල අලි වැටයි. එය **මීට වසර 05 කට පමණ පෙර රුපියල් ලක්ෂ 75ක** පමණ වියදමින් ඉදිකර ඇති අතර අලි වැට සාදා මාස කීපයක් ගත වන්නට මත්තෙන් අක්‍රිය වී තිබේ. අද එහි දක්නට ඇත්තේ අතරින් පතර කණු කීපයක් පමණි. එම නිසාම එම ප්‍රදේශයේ වගාවන් නිරන්තරයෙන් වන අලින්ගේ ග්‍රහණයට ලක් වී ඇත.

එමෙන්ම හම්බන්තොට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් අගුණුකොළ වැව විදුලි වැට ඉදි කර මාස දෙකක් ගතවීමටත් පෙර එහි තිබූ විදුලි රැහැන් සියල්ල ගැලවී ඇති බවත් එහි සූර්ය බල විදුලි උත්පාදක යන්ත්‍ර සියල්ල මේ වන විට සොරුන් විසින් ගලවා ගෙන ගොස් ඇති බවත් ගම්වාසීහු පවසති.

අගුණුකොළ වැව ග්‍රාම සේවා කොට්ඨාසයේ පමණක් වන අලින්ගෙන් පීඩාවට පත් **පවුල් 110ක්** වෙනුවෙන් වනජීවී දෙපාර්තුමේන්තුවේ ප්‍රතිපාදන යටතේ **රු. ලක්ෂ 30කට** අධික මුදලක් යොදවා **අගුණුකොළ වැව සිට කුමාරගම දක්වා කිලෝමීටර් 12ක දුරක්** මේ අලි වැට ඉදි කරනු ලැබුවේ වන අලි ගැටලුවට විසඳුමක් ලෙසිනි. නමුත් එයින් ද සිදුව ඇත්තේ මුදල් නාස්තියක් පමණක් බවයි ප්‍රදේශයේ ජනතාව පෙන්වා දෙන්නේ.

වනජීවී හා තිරසර සංවර්ධන අමාත්‍ය ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා **2018 ජූලි 08 වන දින** මාතලේ දිස්ත්‍රික්කයේ පවතින අලි මිනිස් ගැටුම සම්බන්ධයෙන් කරුණු අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර චාරිකාවක නියැලීමෙන් අනතුරුව කියා සිටියේ, ශ්‍රී ලංකාවේ ප්‍රමිතියෙන් යුතු කිසිදු අලි වැටක් මෙතෙක් තමන්ට හමු නොවූ බවයි.

එයින් ද තහවුරු වන්නේ මිලියන ගණනක මුදල් වියදම් කර තනා ඇති අලි වැට අලි මිනිස් ගැටුමට ස්ථිර විසඳුමක් නොවන බව හා එය නිසි ප්‍රමිතියකින් යුතුව සකස් කර නොමැති බවයි.

විශේෂයෙන්ම මේ ආකාරයෙන් විදුලි වැටද ආක්‍රමණය කරමින් වන අලින් ගම් වැදීමට කටයුතු කරන්නේ තමන්ගේ වාස භූමි විනාශ වීම තුළ ඔවුන්ට අවශ්‍ය අහාර, ජලය සොයා ගැනීමට ක්‍රමයක් නොමැති වීම තුළ බවයි පරිසරවේදී සජීව චාමිකර මහතා පෙන්වා දෙන්නේ.

## අලි වැට නිවැරදි තැන තිබිය යුතුයි

කෙසේ නමුත් මේ වන විට ලංකාවේ අලි වැටවල් සම්බන්ධව තිබෙන මෙම ප්‍රශ්නකාරී තත්වය සම්බන්ධයෙන් කළ විමසීමක දී **ආචාර්ය විරාජ් ප්‍රනාන්දු** මහතා කියා සිටියේ අලි වැටවල් නිවැරදි ස්ථාන තුළ නොමැති වීම නිසා මෙම තත්වය උග්‍ර වී වන අලින් අලි වැට ආක්‍රමණය කරන තත්වයට පත්වී ඇති බවයි.

**"දැනට වන අලින්ගෙන් වන හානිය වළක්වා ගැනීමට තිබෙන සාර්ථක ක්‍රමවේදයක් තමයි**



අලි වැටවල්. නමුත් මේ වන විට අලි වැටවල් අසාර්ථක වෙලා තියෙන්නේ. ගොඩාක් අලි වැටවල් තියෙන්නේ වැරදි ස්ථානවල. නිදසුන් ලෙස යාල කිරින්දේ සිට පටන්ගත්තොත් වැඩිහිටිකන්ද කතරගම වන තෙක්ම අලි වැට දෙපැත්තේම අලි. මොකද එක පැත්තක් වනජීවී අනෙක් පැත්ත වන සංරක්ෂණ. එවැනි වැටවල් තුළින් අලි මිනිස් ගැටුම නවත්වන්න බෑ.**

**එමෙන්ම ලුණුගම්වෙහෙර සිට ලුණුගම්වෙහෙර ජලාශයේ බැම්ම දක්වාම තිබෙන අලි වැටෙත් දෙපැත්තේම අලි ඉන්නවා. ඒක තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය වන්නේ. මේ අලි ටික කොහාට හරි කොටු කළොත් අලි ටික කන්න නැතිව මැරෙනවා. ඒ නිසා අපි හරි ස්ථානයන්හි අලි වැට පාවිච්චි කරනවානම් ඒක සාර්ථක එකක් වෙනවා." දැනට ඒ ආකාරයෙන් සාර්ථකව තිබෙන අලි වැටවල් අතර තම්මැන්නාවේ සහ වයඹ ඇතුළු වැටවල් 30 ක් පමණක් තිබෙන බවයි ඔහු කියා සිටියේ.**

වන අලින් ඔවුන්ට ආවේණික චර්යාවට අනුව **අඩුම තරමින් දවසකට කි. මී. 5 ත් 8 ත් අතර දුරක් තුළ ආහාර සොයමින් ඇවිදින** අතර, ඒ අනුව අලියා ගොවිපළවලට කඩා වැදීම වැළැක්වීමට නම් ඒ සතුන්ගේ ආහාර ප්‍රශ්නයට විසඳුමක් ලබාදීම අවශ්‍යය. එසේ නොමැතිව දිරච්ච කලිසමට අන්ඩ දමනවාසේ විශාල මුදලක් වැය කරමින් අලි වැටවල් ඉදිකිරීමෙන් පමණක් මෙම ගැටලුවට විසඳුම් සෙවිය නොහැකි ය.

අලි වැටවල් සම්බන්ධයෙන් වන මෙම ගැටලුව පිළිබඳව කළ විමසීමේදී **"අලි වැටවල් සම්බන්ධයෙන් පවතින ගැටලු නිරාකරණය කිරීම සඳහා නව වැඩපිළිවෙළක් සකසා තිබෙන බවත් එය වසරක පමණ කාලයක් තුළ නිම කරන බවත්"** වනජීවී අධ්‍යක්ෂ ජනරාල් එම්.ජී.සී. සූරියබණ්ඩාර මහතා කියා සිටියේය.

කෙසේ නමුත් අලි මිනිස් ගැටුමට විසඳුම් සෙවීම සඳහා දේශපාලනික මැදිහත්වීමට වඩා වැදගත් වන්නේ වන අලින්ගේ චර්යා රටාවන් නිසි අයුරින් අධ්‍යයනය කොට ඒ සඳහා පිළියම් සෙවීමයි. එතෙක් අලි වැටවල් කොතෙක් ඉදි කළත් මෙම ගැටලුවට පිළියම් සෙවිය නොහැකිය.

**රාහුල් සමන්ත හෙට්ටිආරච්චි**

2018.10.26 "රැස" පුවත්පත






## සමෘද්ධි දේශපාලනීකරණය:

# රුපියල් බිලියන 1.5ක මුදලකට ටී ෂර්ට් කොන්ත්‍රාත්

ජයන්ත හේවාමාන්නට සමෘද්ධි ප්‍රතිලාභ ලැබීමට සුදුසු වුවත් ඔහුට එය කිසි විටෙකත් ලැබී නැත. ඔහු වකුගඩු අකර්මණ්‍ය වීම හේතුවෙන් වසර ගණනාවක් හම්බන්තොට මහ රෝහලට නිතර පැමිණෙන අයෙකි. සිව් දරු පියෙක් වූ ඔහු, තැලසීමියා රෝග යෙන් පෙළෙන අවුරුදු එකහමාරක් වයසැති සිය නිවුන් දරුවන් සඳහා මාසිකව රුපියල් අටදහසක් වැය කරයි.

**"මමත් රෝගී තත්වයෙන් පෙළෙන නිසා රස්සාවක්වත් කරන්න බැරිවෙලා ඉන්නේ. ඒ නිසා මම සමෘද්ධි ආධාර ලබා ගන්න හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අදාළ නිලධාරීන්ට ඉල්ලුම්පත් බාර දුන්නා. නමුත් මට එය නොලැබුණු නිසා මිට මාස 4කට පමණ පෙර අභියාචනයකුත් බාර දුන්නා. ඒත් මට තාම සමෘද්ධි ආධාර ලබාදුන්නේ නෑ. නමුත් ඇති හැකි අයට සමෘද්ධි ආධාර ලබා දී තිබෙනවා."** හම්බන්තොට සිරිබෝපුර 12 කොටසේ පදිංචි ජයන්ත හේවාමාන්න (38) කියා සිටි.

හේවාමාන්න වැනි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකිකයන් දහස් ගණනක් සමෘද්ධි ප්‍රතිලාභවලින් බැහැර කර ඇති අතර, සමෘද්ධි

වියදම් සම්බන්ධයෙන් සිදු කළ ගවේෂණයේදී අනාවරණය වුයේ බලධාරීන් විසින් **2019 මුල් මාස නවය තුළ** සමෘද්ධි ආධාර බෙදා දීමේ උත්සව හා ඒ හා සම්බන්ධ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් මෙන්ම උත්සව සදහා පැමිණෙන ප්‍රතිලාභීන්හට ටි ෂර්ට් ලබා දීම සදහා දැනට සිටින ප්‍රතිලාභීන් සියල්ලන්ට මාස තුනක සමෘද්ධි ප්‍රතිලාභ ලබා දීමට තරම් ප්‍රමාණවත් මුදලක් වියදම් කර ඇති බවයි.

පසුගිය රජයේ ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය යටතේ පැවති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් දුප්පත්කම තුරන්කිරීම වෙනුවෙන් යැයි පවසමින් රටේ මහජනතාවට අයත් **රුපියල් එකසිය හැත්තෑනවකෝටි අනු ලක්ෂ දෙදහස් පන්සීය පහළොවක (1,799,002,515.76) මුදලක් 2019 වර්ෂයේ** ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා පමණක් සමෘද්ධි ආධාර ලබා දීම වෙනුවෙන් වැය කර ඇති අතර ඉන් උත්සව සදහා පැමිණෙන ප්‍රතිලාභීන්හට **ටී ෂර්ට් ලබා දීම සදහා රුපියල් එකසිය හතළිස් නව කෝටි දහනව ලක්ෂ අනූහත්දහස් පන්සීයක මුදලක් (1,499,197,500.00) ද රුපියල් විසිනව කෝටි අනු අටලක්ෂ පන්දාහස් දාසයක මුදලක් (299,805,016) උත්සව වෙනුවෙන්ද වැය කර තිබෙන බව** තොරතුරු දැනගැනීමේ පනත මගින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ලබාගත් තොරතුරු මගින් අනාවරණ වේ.

පසුගිය **2018 වර්ෂ තුළ සමෘද්ධි ආධාර ලබා දීමේ උත්සව හා මාධ්‍ය ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් එක්කෝටි හයලක්ෂයකට අධික (10,672,695.5) මුදලක් වැය කර තිබේ.** එමෙන්ම **2017 වර්ෂයේ හා 2016 වර්ෂය තුළ** කිසිදු මුදලක් උත්සව සඳහා වැය නොකර දුප්පත් ජනතාවට අවශ්‍ය සමෘද්ධි ආධාර ලබා දී ඇති බව ද තොරතුරු දැනගැනීමේ පනත මගින් ලබාගත් තොරතුරු මගින් අනාවරණය කර ගැනීමට හැකි විය.

එම මුදල මෙම තෝරාගත් ප්‍රතිලාභීන්හට **මාස 03ක** පමණ කාලයක් සමෘද්ධි ප්‍රතිලාභ ලබා දීමට තරම් ප්‍රමාණවත් මුදලක් වන අතර එය ලබා දුන් සමෘද්ධි සහනාධාර වටිනාකමින් **5% ක** මුදලක්ද වේ. සමෘද්ධි ප්‍රතිලාභ ලෙස රජය **එක් පවුලකට මසකට රුපියල් 1500 සිට 3500 දක්වා වූ මුදලක්** ලබා දෙන අතර එය තීරණය වන්නේ ප්‍රතිලාභී පවුලේ සිටින සාමාජික සංඛ්‍යාව අනුවය.


## ටී ෂර්ට් සම්පාදනය කළ ආයතය අස්ථානගතයි

**2019 වර්ෂයේ** සමෘද්ධි ආධාර ලබා දීමේ උත්සව අවස්ථාවන් වෙනුවෙන් වැඩි මුදලක් වැය කර ඇත්තේ එම උත්සව අවස්ථාවන්ට පැමිණෙන ජනතාවට ටි ෂර්ට් සම්පාදනය කිරීම සඳහාය. එම කොන්ත්‍රාත් ලබා දී ඇත්තේ *comfort International Lanka (Pvt) Ltd* යන පුද්ගලික ආයතනයකට බව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරුවලින් අනාවරණය විය.

කෙසේනමුත් ටි ෂර්ට් සඳහා කොන්ත්‍රාත් ලබා දුන්නා යැයි පවසන රත්මලාන ප්‍රදේශයේ *comfort International Lanka(Pvt) Ltd* යන පුද්ගලික ආයතනය සම්බන්ධයෙන් අප කළ සොයා බැලීමේදී එවැනි ආයතනයක් සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කර ගැනීමට නොහැකි වූ අතර පසුව අන්තර්ජාලයෙන් ලබාගත් තොරතුරු අනුව එහි සඳහන්ව තිබූ දුරකථන අංකයකට ඇමතුවත් එය භාවිතයේ නොමැති හෙයින්








(තොරතරු දැනගැනීමේ පනත මගින් සමෘද්ධි සංවර්ධන දෙපාර්ත මේන්තුවෙන් ලබාගත් තොරතුරු)

මේ සම්බන්ධයෙන් කරුණු අනාවරණය කරගැනීම සදහා අපි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමෙන්තුවේ ගිණුම් අංශයෙන් විමසුවෙමු. එහි සිටි නිලිධරිනියක කියා සිටියේ මෙම ටී ෂර්ට් සම්බන්ධයෙන් හා තවත් කාරණා කීපයක් සම්බන්ධයෙන් විගණනයක් පැවැත්වීම සදහා අදාළ ලේඛන රැගෙන ගොස් ඇති බැවින් එම ආයතනය සම්බන්ධයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතුව තොරතුරු නොමැති බවයි.

**මේ සම්බන්ධයෙන් කළ විමසීමකදී විගනකාධිපති දෙපාර්තමේන්තුවේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව භාරව කටයුතු කරනු ලබන විගණක අධිකාරීවරිය පවසා සිටියේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පසුගිය ආණ්ඩුව සමයේ සිදු කළ ටී ෂර්ට් ලබා දීම ඇතුළු කාරනා කීපයක් සම්බන්ධයෙන් විගණනයක් පවත්වන බවත් ඒ සම්බන්ධයෙන් සිදුකළ විගණන කටයුතු මේ වන විට අවසන් වෙමින් තිබෙන බවත්ය. නමුත් එහි රහස්‍යභාවය සුරැකිය යුතු බැවින් තමන්හට එම තොරතුරු ලබා දීමට නොහැකි බවද විගණක අධිකාරීවරිය පැවසුවාය."**

## ඇමතිවරයාගේ පිළිතුර

කෙසේ නමුත් මේ තරම් මුදලක් සමෘද්ධි ප්‍රතිලාභ ලබා දීමේ උත්සව හා ඒ වෙනුවෙන් සිදු කළ විවිධ කටයුතු සඳහා වැය කිරීම සම්බන්ධයෙන් පසුගිය රජයේ ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීමේ හිටපු අමාත්‍ය දයා ගමගේ මහතාගෙන් කළ විමසීමකදී ඔහු කියා සිටියේ මෙම ටි ෂර්ට් එකක් **රුපියල් 450 ක** පමණ අඩු මුදලකට ලබා ගෙන එය සමෘද්ධි ලාභීන්හටම ලබා දීමට කටයුතු කළ බවයි.



නමුත් හිටපු අමාත්‍යවරයා කියා සිටි පරිදි ටි ෂර්ට් මුද්‍රණය කර ඇත්තේ එක් දිස්ත්‍රික්කයකින් පුද්ගලයින් පන්දහස **(5,000)** බැගින් **දිස්ත්‍රික්ක 25ක සමෘද්ධි ලාබීන් 125,000ක්** දෙනා දැනුවත් කිරීමට ය. **ඔහුට අනුව ඒ සදහා වැය කර ඇත්තේ රුපියල් පන්කෝටි හැට දෙලක්ෂ පනස්දහසක් (56,250,000) පමණකි.** නමුත් ඒ වෙනුවෙන් රුපියල් **කෝටි 149ක් පමණ වැය කිරීම** සම්බධයෙන් තමා දැනුවත් වීමක් නොමැති බවද ඔහු කියා සිටියේ ය.

ටී-ෂර්ට් කොන්ත්‍රාත්කරු, *comfort International Lanka(Pvt) Ltd* යන පුද්ගලික ආයතනය තෝරාගත්තේ කෙසේද සහ ඔවුන්ට ගෙවනු ලැබුවේ කෙසේද යන්න පිළිබඳව තමා නොදන්නා බවද හිටපු අමාත්‍ය දයා ගමගේ පැවසීය. මේ සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීම සදහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ කරගත්තද ඔවුන් මේ සම්බන්ධයෙන් පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන ලදී.

## උත්සව වියදම් වැඩියි ප්‍රතිලාභීන් අඩුයි

එමෙන්ම එම **2019 වර්ෂයේ** අදාළ කාලය තුළදී අනෙකුත් මුදල් වැය කර ඇති ආකාරය පිළිබඳව කරුණු විමසීමේදී සමෘද්ධිලාභීන් හට **සමෘද්ධි ආධාර ලබාදීමේ උත්සව වෙනුවෙන් රුපියල් විසිනව කෝටි දොළොස් ලක්ෂ දසදහස් හාරසිය තිස්හතරක මුදලක් (291,210,434) ද** ඒ වෙනුවෙන් **පෝස්ටර්, කටවුට් ගැසීම සඳහා අසූ එක්ලක්ෂ අනුදාහක (8,190,000.00) මුදලක්ද** වියදම් කර තිබෙන බව අනාවරණය වේ. එමෙන්ම එම උත්සව වෙනුවෙන් **පුවත්පත් දැන්වීම් ඇතුළු මාධ්‍ය දැන්වීම් සඳහා හාර ලක්ෂ හාරදහස් පන්සියයක (404,581.50) මුදලක් ද** වැය කර තිබේ.

මෙවන් විශාල මුදලක් පසුගිය රජය මගින් සමෘද්ධි ප්‍රතිලාබ ලබා දීමේ උත්සව වෙනුවෙන් වැය කරනු ලැබුවත් පෙර වර්ෂවල ප්‍රතිලාභ ලබා දුන් පවුල් සංඛ්‍යාව සම්බන්ධයෙන් හා ඒ වෙනුවෙන් ලබා දුන් මුදල් වටිනාකම් සම්බන්ධයෙන් සලකා බැලූ විට පෙනී යන්නේ පෙර වර්ෂවල සමෘද්ධි ප්‍රතිලාභ ලබා දීම වෙනුවෙන් වැය කර ඇති මුදලට වඩා අඩු මුදලක් මෙම කාලය තුළදී යොදවා ඇති බවයි.

**2018 ට** සාපේක්ෂව මේ වසරේ එක් පවුලකට **සමෘද්ධි ප්‍රතිලාභය 10.6% කින් අඩු වී ඇති බව** නිල දත්ත වාර්තා සඳහන් කරයි. **එහිදී 2018 වසරේදී** සමෘද්ධි ප්‍රතිලාබී එක් පවුලක් සඳහා මසකට සාපේක්ෂ වශයෙන් **රුපියල් 2363ක්** පමණ ලබාදී ඇති අතර **සමෘද්ධි ආධාර මුදල 2019 වර්ෂයේදී 2114 දක්වා අඩු වී තිබේ**.

**2019 වර්ෂයේ** මාස නවයක කාලයකට සාපේක්ෂව පසුගිය **2016 වර්ෂයේ සිට** පිළිවෙළින් **2018 වර්ෂය දක්වා** සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මේ ආකාරයෙන් සමෘද්ධි ආධාර ලබා දීම සිදු කර ඇති අතර නමුත් **2019 වර්ෂයේ** ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා සමෘද්ධි ආධාර ලබා දුන් ජනතාවගේ වැඩි වීමක් තිබුණත් එහිදී ලබා දුන් මුදල අනෙකුත් වර්ෂයන්ට සාපේක්ෂව අඩු මුදලක් වේ.

දුප්පත්කම තුරන් කිරීමේ හා මානව අයිතිය සුරැකීමේ අරමුණින් ක්‍රියාත්මක වන සමෘද්ධි ආධාර ලබා දීමේ ක්‍රියාවලිය තුළ තමන්ගේ බලය ප්‍රවර්ධනය වෙනුවෙන් රටේ ජනතාවගේ බදු මුදල් මේ ආකාරයෙන් විනාශ කිරීමෙන් සිදු වන්නේ රටේ පොදු ජනතාව ම තව දුරටත් ණය බරිත කර දුප්පත් කිරීමකි.

**"තමන්ගේ සල්ලි තමන් වියදම් කිරීම හා අනුන්ගේ සල්ලි වියදම් කිරීම අතර ගැටලුව මෙතුළ තිබෙන දෙයක්, රටක ආණ්ඩුවක ආදායම් වියදම් තත්වයත් සමඟ ගත් විට නාස්තිකාරී සහ ඵලදායි නොවන වියදම් අවම කර ගැනීමේ උත්සහයක් මෙන්ම වියදම් කරන සෑම රුපියලකටම ඒ රුපියලට වඩා වැඩි වටිනාකමක් ලැබෙන විදියට වියදම් සකස් විය යුතුයි. යනුවෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබද මහාචාර්ය සිරිමල් අබේරත්න මහතා කියා සිටි.** නමුත් මේ වියදම් කරන අරමුණු බොහෝ විට ආර්ථික අරමුණුම වන්නේ නැත. එය වෙනත් අරමුණු සඳහාද යොදා ගැනීම තුළ ඕනෑම රටක ආර්ථිකයට ඒ තුළින් බලපෑමක් සිදු විය හැකි ය.

මේ ආකාරයෙන් විශාල මුදලක් වැය කරමින් උත්සව පවත්වමින් සමෘද්ධි ආධාර ලබා දීමේ උත්සව පවත්වනු ලැබුවත් එදිනට එම ආධාර ලබා දීම සිදුකෙරුණේ සංකේතයක් වශයෙන් පමණි. පසුව ප්‍රාදේශීය මට්ටමින් දේශපාලනඥයින් නැවත සමෘද්ධිලාභී ජනතාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ගෙන්වා එම සමෘද්ධි ආධාර ලබා දීම දක්නට ලැබුණි. සමෘද්ධි ප්‍රතිලාභීන්ට ප්‍රධාන උත්සවවලින් පසු මුදල් ලබා ගැනීම සඳහා නැවත නැවත උත්සවවලට සහභාගී විය යුතු බව, සමෘද්ධි ලාභී ජනතාව පවසයි.

## සමෘද්ධි සහනාධාර ලබාදීම

සමෘද්ධි සහනාධාරය යම් අයෙකු විසින් ඉල්ලුම්කරන්නේ නම් ඒ සදහා යම් ක්‍රමවේදයක් පවතී. එහිදී අදාළ ඉල්ලුම්කරු සිය ඉල්ලීම වසම බාරව කටයුතු කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරියාට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හෝ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කළ හැක. ඒ අනුව එකී ඉල්ලීම සම්බන්ධයෙන් කමිටුවක් මගින් විශ්ලේෂණය කොට ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය මත සමෘද්ධි සහනාධාරය ලබා

දීමට කටයුතු කරනු ලැබේ. එහිදී සමෘද්ධි සහනාධාරයක් ලබා දීමට සුදුසුකම් මොනවාද යන්න සම්බන්ධයෙන් සිදු කළ සොයා බැලීමේදී, අවධානය යොමු කළ කරුණු ලෙස පවුලේ සාමාජික සංඛ්‍යාව, කාන්තා මූලික පවුල්, දෙමාපියන් අහිමි වීම, ආපදා තත්වයට නිරන්තරවම ලක් වීම ආදී කරුණු සම්බන්ධයෙන් සමෘද්ධි සංවර්ධන අධිකාරියේ නියමයන්ට මූලික අවධානය කළ යුතු වේ. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම් හෝ බලය පැවරූ නිලධාරියෙකු කමිටු සභාපති, සමෘද්ධි මුලස්ථාන කළමනාකරු, සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සඳහා අධ්‍යක්ෂක ජනරාල් වරයා විසින් නම්කරන ලද සාමාජිකයින් තිදෙනාද සමන්විත ප්‍රාදේශීය කමිටු මගින් මෙන්ම වසම් කමිටු මගින් මෙම තෝරාගැනීම සිදු කරනු ලබන බවයි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු වලින් අනාවරණය වන්නේ.

**නමුත් මේ සම්බන්ධයෙන් සිදු කළ සොයා බැලීමේදී අනාවරණය වුයේ සමෘද්ධි සහනාධාරය ලැබිය යුතු පවුල් සඳහාද එම ආධාර නොලැබී ඇති බවයි. ඒ සඳහා ප්‍රධාන හේතුව වී ඇත්තේ, අදාළ ප්‍රදේශයේ සමෘද්ධිලාභීන් තෝරාගැනීමේදී ආණ්ඩු පක්ෂය නියෝජනය කරන නියෝජිතයින් විසින් සමෘද්ධි සහනාධාර ලබා දීම සඳහා සකස් කරන ලද ලේඛනයක්ද මේ සඳහා ඉදිරිපත් කර ඇති අතර ඉහත කමිටුවල සහ මෙම දේශපාලන නියෝජිතයින් විසින් තෝරා නම් කරන ලද ලැයිස්තු දෙකේම සිටින පුද්ගලයින්හට පමණක් සමෘද්ධි ආධාර ලබා දීමට කටයුතු කිරීමයි.** එහිදී සිදු වන්නේ තම දේශපාලන පක්ෂයට හිතැති පිරිසට පමණක් සමෘද්ධි ආධාරය ලබා දීම ය. මේ සම්බන්ධයෙන් දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක ප්‍රාදේශීය ලේකම්වරුන් කිහිපදෙනෙකු මෙන්ම ග්‍රාම නිලධාරීන් කිහිපදෙනෙකුගෙන් කළ විමසීමේදී කියා සිටියේ ඔවුන් විසින් සකස් කරන ලැයිස්තුවල නොසිටිය පුද්ගලයන්ට සමෘද්ධි ලැබී ඇති බවත් එහි සිටි බොහොමයක් දෙනෙකුට සමෘද්ධි අහිමි වී ඇති බවත්ය.

මෙම කාරනා මුල් කර ගනිමින් සමෘද්ධි සහනාධාරය ලැබිය යුතු පවුල්වල බොහෝ පිරිසක් පසුගිය කාලය තුළදී සමෘද්ධිය නොලැබීම නිසා විවිධ විරෝධතාවයන්ද පවත්වන ලදි.

**"මම සූරියවැව නබඳ ගස්වැව කොට්ඨාසයේ. අපේ පැත්තේ කඹුරු ඉඩකඩම් තියෙන සෑම කෙනකුටම සමෘද්ධි සහනාධාරය දීලා තියෙනවා නමුත් මටත් අපේ ගමේ කීපදෙනකුටත් සමෘද්ධි සහනාධාරය ලැබිලා නෑ"** හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ **ඒ. ප්‍රියන්ති මහත්මිය** පැවසුවාය.

**රාහුල් සමන්ත හෙට්ටිආරච්චි**

සිළුමිණ -2019 දෙසැම්බර් 08





# රුපියල් කෝටි තුනක්

## වැයකර සැකසූ අම්බලන්තොට වාඳුරුප්ප මාර්ගය නිසි ප්‍රමිතියකට නෑ

අම්බලන්තොට වාඳුරුප්ප මාර්ගය සකසා මාස කීපයක් යන්නට මත්තෙන් මාර්ග යේ තැනින් හිලාබසිමින් තැනින් තැන ගැටිති මතුවී ඇති බවත් මාර්ගය නිසි ප්‍රමිතීන්ගෙන් තොරව ඉදිකර ඇති බවත් ප්‍රදේශයේ ජනතාව පෙන්වාදෙති.

**හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් කැඳවීම** හා ප්‍රතිපාදන වෙන් කිරීම මත මෙම මාර්ගය සැකසීම සඳහා **රජය විසින් ඇස්තමේන්තු කළ මුදල රුපියල් 35,775,611.54ක්** වූ අතර නමුත් කොන්ත්‍රාත්කරු විසින් **තක්සේරු කළ මුදල රුපියල් 29,123,711.00 ක් බව** තොරතුරු දැනගැනීමේ පනත මගින් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ලබා ගත් තොරතුරු මගින් අනාවරණය විය.

ඒ අනුව එම මුදල් ප්‍රතිපාදන යටතේ **2017.10.30 වන දින** වැඩ ආරම්භ කරන ලද අම්බලන්තොට **වාදුරුප්ප මාර්ගය කිලෝමීටර් එකකුත් මීටර් 600ක් පළල මීටර් 6, 5, 4 වන ආකාරයෙන්** වන පරිදි මාර්ගය සකසා තිබේ.

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තිස්සමහාරාම ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ අධීක්ෂණය යටතේ ඉදිකර ඇති මෙම මාර්ගය අවිධිමත් ඉදිකිරීමක් බව තහවුරු වන්නේ එලන

ලද කාපට් එකෙහි ඝනකම තැනින් තැනට නියමිත ප්‍රමිතියකට වඩා අඩු වීම, තැනින් තැන ගැටිති ඇති වී තිබීම, මෙන්ම මාර්ගය දෙපස එලන ලද පස් නියමිත ප්‍රමිතීන්ගෙන් තොර වීම මෙන්ම එය නියම ආකාරයෙන් එලා නොතිබීම නිසා එහි ගමන්ගන්නා මගින් අසීරු තත්වයන්ට ලක්වීම යන හේතු නිසාය.

**කෙසේ නමුත් තොරතුරු දැනගැනීමේ පනතට අදාළව දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබා ගත් තොරතුරු අනුව එලන ලද කාපට් තට්ටුව මිලිමීටර් පනහට නොවැඩි හා අවම ඝනකම මිලිමීටර් 33 කට වඩා අඩු නොවිය යුතු බවත් අනාවරණය විය.**

නමුත් මෙම මාර්ගය තනා අවසන් කර දින කිපයක් යන්නට මත්තෙන් මාර්ගය ආරම්භ වන අස්ථානය වන අම්බලන්තොට නගරය අසල ජලසපාදන මණ්ඩලය විසින් ජලනල කාන්දුවක් සැකසීමට මාර්ගය තුළ සිදුකරන ලද කැපුමක් පරික්ෂා කිරීමේදී අනාවරණය වුයේ එම ස්ථානයේ **කාපට් එකෙහි ඝනකම මිලිමීටර් 10 - 12 ක්** අතර ප්‍රමාණයකට සීමා වී ඇති ආකාරයයි. ඒ අනුව පෙනී ගියේ මාර්ග යේ **කාපට් එකෙහි ඝනකම තිබිය යුතු ප්‍රමාණයට වඩා මිලිමීටර් 20 කටත් වඩා අඩුවෙන්** බොහෝ ස්ථානවල පවතින බවයි .

කෙසේ නමුත් **රුපියල් දෙකෝටි අනු එක්ලක්ෂයකට (29,123,711.00)** අධික මුදලක් වැය කර සකසන ලැබූ මාර්ගයේ සාමාන්‍යයෙන් කොන්ත්‍රාත්තුවකින් පසු රජය තබා ගන්නා රැඳවුම් මුදල් හැරුණු කොට අනෙකුත් සියලු මුදල් නිදහස් කර ඇති බවද ලබා ගත් තොරතුරු මගින් හෙළි වේ. එමෙන්ම මෙම මාර්ගය සම්බන්ධයෙන් මෙවැනි අඩුපාඩු තිබියදී ඒ සම්බන්ධයෙන් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ඒ සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් වාර්තා වී නොමැති බවද ලබා ගත් එම තොරතුරු මගින් අනාවරණය විය.

මාර්ගය ඉදිකර අවසන් වූ පසු ප්‍රාදේශීය ඉංජිනේරු වරයාගේ මෙන්ම, දිස්ත්‍රික් ඉංජිනේරු හා රසායනාගාර සහකාර වරයකුගේද තත්ව පරීක්ෂාවක් සදහා මෙම මාර්ගය ලක් වුවත් අදාළ අඩුපාඩු හා දෝෂයන් සම්න්බන්ධයෙන් ඔවුන් හට දැනගන්නට නොලැබීම පුදුමයට කරුණක් බවයි ප්‍රද්ශයේ ජනතාව පවසා සිටින්නේ.

මේ සමබන්ධයෙන් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ හම්බන්තොට දිස්ත්‍රික් ඉන්ජිනේරුවරයාගෙන් විමසු විට ඔහු කියා සිටියේ මේ සම්බන්ධයෙන් තමන්ට ප්‍රකාශයක් දීමට නොහැකි බැවින් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයාගෙන් විමසන ලෙසයි ඒ අනුව දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරි උපාලි ලියනගේ මහතාගෙන් විමසූ විට ඔහු කියා සිටියේ තමන්ට මෙම මාර්ගයේ දෝෂ සම්බන්ධයන් කිසිදු පැමිණිල්ලක් හෝ වාර්තාවක් ලැබී නොමැති බවත් ඉදිරියේ දී ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට කටයුතු කරන බවයි.

**එමෙන්ම මේ ආකාරයෙන් විශාල මුදලක් වැය කරමින් හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සිදු කෙරෙන ව්‍යාපෘති නිසි ප්‍රමිතියකින් යුත්තව තිබේද යන්න සොයාබලන බවත්, එසේ නොවන ව්‍යාපෘති සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට බලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන බව කළ විමසීමක දී අමාත්‍ය මහින්ද අමරවීර මහතා කියා සිටියේය.**

**රාහුල් සමන්ත හෙට්ටිආරච්චි**

2018 අගෝස්තු 09- මවුබිම පුවත්පත





http://staging.globalpressjournal.com/

# රටේ වී හිඟයක් නෑ

## සහල් මාෆියාව ගැන ඇත්ත කතාව

2015 යල කන්නයේ සිට 2019 /2020 මහ කන්නය දක්වා සමස්ත වී නිෂ්පාදනයෙන් රජය මිලදීගෙන ඇත්තේ සියයට 1.88% ක් පමණයි.

කොරෝනා වසංගතය හමුවේ ලෝකයේ බොහෝ රටවල් සේම ලංකාවද දැඩි අසීරු තත්වයක පත්වී සිටින මොහොතක ඒ තුළින් බොහෝ ක්ෂේත්‍රවලට ද දැඩි බලපෑමක් එල්ල වී තිබේ. ඒ අතර වී ගොවිතැන ද එක් ක්ෂේත්‍රයකි.

කෙසේ නමුත් වී ගොවියා මුහුණදෙන තත්වය අද ඊයේ ඇති වූවක් නොවේ. මේ රටේ පැවති බොහෝ රජයයන් මේ සදහා විවිධ වැඩ පිළිවෙළවල් සේම යෝජනා ගෙන එනු ලැබුවත් ඒ සඳහා සැබෑ විසඳුමක් මේ වනතෙක් ලැබී නොමැති පසුබිමක වී මිල සහ

සහල් මිල සම්බන්ධයෙන් තීරණ ගැනීම ඒ ඒ කාලයන්හි පවතින දේශපාලන කාරණාවක් බවට පමණක් සීමා වී තිබේ.

විශේෂයෙන්ම වී මිලදී ගැනීම් සම්බන්ධයෙන් 2020 වසරේ මුල් කාර්තුවේදී දැඩි කතා බහක් ඇති වුවත් එය ද ප්‍රායෝගික නොවූ බව ගොවි සංවිධාන මෙන්ම ගොවීහු ද පෙන්වා දෙති. විශේෂයෙන්ම මෙහිදී රජය විසින් වී මිල දී ගැනීම සඳහා සහතික මිලක් ලෙස රුපියල් 50ක් නියම කර තිබුණත් එහිදී බොහෝ වී මෝල් හිමියන් විසින් වී මිලදී ගැනීම සිදුකරනු ලැබුවේ රුපියල් තිහකට තිස්පහකට පමණ බවද ගොවි සංවිධාන පෙන්වා දෙයි.

**කෙසේ නමුත් දේශපාලන පොරොන්දුවක්ද වූ වී සඳහා සහතික මිලක් ලබාදීම වෙනුවෙන් ක්‍රියාත්මක වූ රජයට, සිය වී තොග අලෙවි කිරීමේ හැකියාවක් නොතිබූ පසු බිමක ඒ සඳහා පිළියමක් ලෙස රජය විසින් වී අලෙවි මණ්ඩලයේ සහායට වී මිල දී ගැනීම් සඳහා යුද හමුදාව යොදවන ලදී. නමුත් මෙහිදී රජය විසින් පනවනලද උපරිම සහතික මිල සදහා මහා පරිමාණ සහල් මෝල් හිමියන් එකඟ නොවීම හේතුවෙන් නැවත රජයට සිදු වූයේ මහා පරිමාණ සහල් මෝල් හිමියන් විසින් පනවන ලද මිල උපරිම සිල්ලර මිල ලෙස පිළිගැනීමටයි.**

**විදෙස් රටවලින් සහල් ගෙන්වීමට රජයට අවශ්‍ය නොවන පරිදි රට තුළ වී නිෂ්පාදනය සිදු වුවත් මේ ආකාරයෙන් රජයට සහල් මිල මෙන්ම වී මිලදී ගැනීමේ මිල පාලනය කිරීමට නොහැකි වී ඇත්තේ වී නිෂ්පාදනයෙන් සියයට 94කට වැඩි ප්‍රමාණයක් මිල දී ගනු ලබන්නේ පුද්ගලික අංශයේ වී මෝල් හිමියන් වීම හේතුවෙනි. මේ ආකාරයෙන් වී අඩුවක් නොවුණත් සහල් මිල මේ තරම් ඉහළ යෑමට ප්‍රධානතම හේතුව වූ කාරණාව වන්නේ වී මිලදී ගැනීමේ බහුතරය රජයේ පාලනයෙන් බැහැර වීමයි. එමගින් රට තුළ දැඩි සහල් මාෆියාවක් නිර්මාණය වී තිබේ.**

රජයට පාලනය කර ගැනීමට නොහැකි මට්ටමට සහල් මිල පවත්වා ගැනීමට හෝ සහල් හිඟයක් ඇති කිරීමට තරම් පුද්ගලික මහා පරිමාණ සහල් හිමියන් ගේ ඒකාධිකාරය බලවත් ය. ශ්‍රී ලංකාවේ වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය තුළ පුද්ගලික අංශය සතුව පවතින බලය තොරතුරු දැනගැනීමේ පනත ඔස්සේ වී අලෙවි මණ්ඩලය මගින් මෙන්ම ගොවිජනසේවා දෙපාර්තමේන්තුව මගින් ලබාගත් පසුගිය වසර කීපයකට අදාළ තොරතුරු මගින් පැහැදිලිවම අනාවරණය වේ.

**පසුගිය 2015 වර්ෂයේ සිට 2020 දක්වා** දිවයිනේ වී නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් කළ සොයා බැලීමට අනුව මේ වන විට දිවයිනේ පවතින **සමස්ත කුඹුරු බිම් ප්‍රමාණය වන අක්කර 1,944,112කි.** මෙම ප්‍රමාණය අඩු වැඩි වශයෙන් වාර්ෂිකව වෙනස් වෙමින් යල සහ මහ කන්න තුළදී වී වගා කිරීම සිදු කෙරේ. ලබා ගත් අස්වනු ප්‍රමාණය 1 වැනි සටහනෙහි දැක්වේ.

## වී සහ සහල් වෙළෙඳ පොළ

මේ ආකාරයෙන් රට තුළ වී නිෂ්පාදනයක් සිදු වුවත් එම වී නිෂ්පාදයෙන් වී අලෙවි මණ්ඩලය මගින් වාර්ෂිකව මිලදීගන්නා වී ප්‍රමාණය ඉතා අවම මට්ටමක පවතී. මහා පරිමාණ වී මෝල් හිමියන් විසින් වෙළඳ පොළ තුළ ඒකාධිකාරියක්ද පවත්වාගෙන යයි.

විශේෂයෙන්ම මෙහිදී සහල් වෙළෙඳ පොළ සඳහා රාජ්‍ය ආයතන, පාරිභෝගිකයන්, වී





| | වගාකළ බිම් ප්‍රමාණය අක්කර | ලබාගත් අස්වැන්න (මෙට්‍රික් ටොන් MT) |
|---|---|---|
| 2015 යල කන්නය | 1,103,861.87 | 1,942,408 |
| 2015/2016 මහ කන්නය | 1,169,137.27 | 2,902,693 |
| 2016 යල කන්නය | 1,268,174.52 | 1,517,392 |
| 2016/2017 මහ කන්නය | 1,394,574.43 | 1,473,832 |
| 2017 යල කන්නය | 676,944.29 | 909,321 |
| 2017/2018 මහ කන්නය | 1,568,684.28 | 2,396,926 |
| 2018 යල කන්නය | 868,029.33 | 1,532,905 |
| 2018/2019 මහ කන්නය | 1,638,013.21 | 3,072,581 |
| 2019 යල කන්නය | 760,830.60 | 1,519,475 |
| 2019/2020 මහ කන්නය | 1,655,256.94 | 3,196,752 |
| | | 19,554,964 |

සටහන 1

(මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් තොරතුරු දැනගැනීමේ පනතට අනුව ලබාගත් තොරතුරු)

ගොවියන්, පෞද්ගලික වී සහල් වෙළෙන්දන්, කුඩා, මධ්‍යම හා මහා පරිමාණ වී මෝල් හිමියන් යන අය ඇතුළත්ය. විශේෂයෙන්ම සහල් සඳහා ඉල්ලුම ඇති වන්නේ සිවිල් පාරිභෝගිකයන්, ත්‍රිවිධ හමුදාව හා රාජ්‍ය ආයතන මඟිනි. **රජය විසින් 6 -8%ක වී ප්‍රමාණයක් පමණක් මිල දී ගනු ලබන අතර කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හා සමූපකාර විසින් 10%ක් පමණ වී මිල දී ගනු ලබයි.** ඉතිරි වී ප්‍රමාණය මහා පරිමාණ වී මෝල් හිමියන් විසින් මිලදී ගනු ලැබේ.

**පහත දත්තවලට අනුව 2015 යල කන්නයේ සිට 2019/2020 මහ කන්නය දක්වා කාලය තුළදී දිවයිනේ සමස්ත වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 19,554,964 (එක් කෝටි අනූපන්ලක්ෂ පනස්හතරදාස් නමසිය හැටහතර) ක් වන අතර රජය මගින් මිලදී ගෙන ඇත්තේ මෙට්‍රික් 369,183.8 (තුන් ලක්ෂ හැට නම දහස් එකසිය අසූ තුන)ක් වේ. එය එම කාලය තුළ සිදුවූ සමස්ත වී නිෂ්පාදනයෙන් 1.88%කි.**

මේ අනුව පෙනී යන්නේ දිවයිනේ සමස්ත වී නිෂ්පාදනයෙන් වැඩි කොටසක් පවතින්නේ පුද්ගලික වෙළඳුන් සතුව බවයි. එමෙන්ම අස්වනු නෙළන අවස්ථාවේ විශාල වී ප්‍රමාණයක් මිල දී ගැනීම් සිදුකරන්නේ මහා පරිමාණ මෝල් හිමියන් විසිනි. ඒ තුළ රටේ බහුතර සහල් තොග

**රජය මිල දී ගෙන ඇති වී ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)**


| | |
|---|---|
| 2015 | 130,529.8 (6.72%) |
| 2016 | 157,429 (3.56% ) |
| 2017 | වී මිල දී ගැනීමක් සිදු කර නොමැත. |
| 2018 | 6,687 (0.23%) |
| 2019 | 48,869 (1.12% ) (දිස්ත්‍රික් ලේකම්වරුන් විසින්) |
| 2019/2020 | මහ කන්නය 25,869 (0.85 %) |
| 2020 යල කන්නය | වී මිල දී ගැනීමක් සිදු කර නොමැත. |
| මුළු ප්‍රමාණය | 36,9183.8 |

පවතින්නේ ද ඔවුන් සතුව බව අමුතුවෙන් කිව යුත්තක් නොවේ.

## සහල් මිල පාලනය කිරීමට ඇති අපහසුතා

වී අලෙවි මණ්ඩලය සතුව දිවයිනේ **දිස්ත්‍රික්ක 21ක් තුළ වී ගබඩා සංකීර්ණ 307ක්** පවතින අතර **එම ගබඩා තුළ සහල් මෙට්‍රික් ටොන් 310,040 (තුන් ලක්ෂ දසදහස් හතළිහ) ක්** ගබඩා කිරීමේ පහසුකම් ඇති මුත් එම ගබඩා පහසුකම් බොහෝ අවස්ථාවන්හි ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වී අලෙවි මණ්ඩලයට වී මිල දී ගැනීම් සීමා කිරීමට සිදු වේ. එමෙන්ම නියමිත කාලයන්හි රජය මගින් මුදල් ලබා නොදීම් හේතුවෙන් වී අලෙවි මණ්ඩලයට සුදුසු කාලයේදී වී මිල දී ගැනීමට අවස්ථාව නොලැබීම නිසාවෙන් තිබෙන වී ගබඩා ද පුරවා ගැනීමට නොහැකි තත්වයක් පවතී.

එමෙන්ම වී අලෙවි මණ්ඩලය වැඩි මිලයට වී ලබාගත්තත් ඔවුන් බලාපොරොත්තු වන තරමේ වියළුණු වී ගොවීන්ට ලබාදීමේ




හැකියාවක් නොමැති පසුබිමක වාසිය ලබා ගන්නා පුද්ගලික සහල් මෝල් හිමියන් ගොවීන්ගෙන් එම වී මිලට ගෙන තමන් සතු වී වියළීමේ යන්ත්‍ර (*Dryer*) විය ලා ගැනීම සිදු කරනු ලබයි. නමුත් එවැනි තාක්ෂණික පහසුකම් නොතිබීමද වී අලෙවි මණ්ඩලයට ප්‍රමාණවත් වී සංචිත නොලැබීමට හේතුවක් වී තිබේ.

**"වැඩි ගාණකට වී අලෙවි මණ්ඩලයට වී විකුණන්න අපි කැමතියි. නමුත් එයාල ඉල්ලන විදියට වී ටික දෙන්න ගියාම ගොවීන් විදියට අපි සෑහෙන අපහසුතාවන්ට ලක්වෙනවා. පුද්ගලික මෝල් හිමියන් ළඟටම ඇවිල්ලා**



www.facebook.com

**වී ටික අරගෙන යනවා ඒක අපට පහසුයි"** හම්බන්තොට බඳගිරිය ප්‍රදේශයේ ගොවි මහතෙකු වන **ප්‍රියන්ත ගමගේ මහතා** කියා සිටී.

මෙයට කදිම නිදසුනක් ලෙස **2020 යල කන්නයේ වී මෙට්‍රික් ටොන් 100,000ක් මිලදී ගැනීම සඳහා රජය මගින් රුපියල් මිලියන 5000ක් වෙන් කර තිබුණත්** ගොවි ජනතාව විසින් වී අලෙවි මණ්ඩලයට ප්‍රමාණවත් වී ලබා නොදීම හේතුවෙන් රජයේ වී සංචිතද අඩු වී තිබේ. එමෙන්ම ගන්නා වී තොග නිසි ලෙස නිකුත් නොකිරීමේ පසුබිමක පසුගිය කාලයේදී විශාල වී තොග ප්‍රමාණයක් සත්ව ආහාර ලෙස ලබාදීමට මෙන්ම විනාශ කිරීමට ද සිදු වීම නිසා රජයට රුපියල් මිලියන ගණනාවක පාඩුවක්ද සිදුවිය.

වී තොග නිකුත් කිරීම සම්බන්ධයෙන්ද වී අලෙවි මණ්ඩලයට විශාල ගැටලුවක් පවතී. මෙහිදී මහ කන්නය සදහා වී මිලදී ගැනීම සිදු වන්නේ මාර්තු සහ මැයි දක්වා ය. එසේ මිලදී ගන්නා වී තොග ජුනි, ජුලි මාසවල නිකුත් කර යල කන්නයේ නැවත වී තොග මිලදී ගැනීමට නිසි වැඩ පිළිවෙලක් වී අලෙවි මණ්ඩලය සකසා නොමැත. සාමාන්‍ය ලෙස ලංකාවේ වෙළඳ පොළ තුළ දෙසැම්බර් සිට ජනවාරි දක්වා කාලය තුළදී වී සඳහා ඉහළ මිලක් පවතී. එම කාලය තුළදී වී අලෙවි මණ්ඩලය සතුව වී තොග තිබෙන්නේ නම් වී අලෙවි මණ්ඩලයට පහසුවෙන් එම වී තොග විකුණා ගැනීමට අවකාශය උදාවනු ඇත. නමුත් වී අලෙවි මණ්ඩලය මගින් හඳුනාගෙන නොමැති මෙම ව්‍යාපාරික අවස්ථාවෙන් ප්‍රයෝජන ගනු ලබන්නේ පුද්ගලික වී මෝල් හිමියන්ය. මහා පරිමාණ වී මෝල් හිමියන් ජාවාරමක් ලෙසද මෙය සිදු කරගෙන යනු ලබයි.

කෙසේ නමුත් මේ තුළ පුද්ගලික මෝල් හිමියන් විශාල ලාබයක් ලැබුවත් එම ලාභය පාරිභෝගිකයාට ලැබෙන්නේ නැත. සහල් මිල වැඩි වීමද සිදු වන්නේ පුද්ගලික මෝල් හිමියන්ගේ ඔනෑ එපාකම් අනුවය. එය මේ වන විට ආණ්ඩුවට පාලනය කළ නොහැකි මට්ටමකට පත්වී තිබේ.

**"මේ වනවිට මහා පරිමාණ වීමෝල් හිමියන් කීපදෙනෙක් හාල් සහ වී වෙළඳ පොළ හසුරවනවා. එය පාලනය කරන්න ආණ්ඩුවේ අදාළ අමාත්‍යංශය මැදිහත් වෙන්නේ නෑ. එයාලත් මේක අස්සේ වෙනම ව්‍යාපාරයක් කරනවා"** යැයි මේ සම්බන්ධයෙන් කළ විමසීමකදී සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ කැඳවුම්කරු නාමල් කරුණාරත්න මහතා කියා සිටියේය.

**"අපිට අවුරුද්දකට අවශ්‍ය වෙන්නේ වී මෙට්‍රික් ටොන් ලක්ෂ 36ක් විතරයි. මාසයකට ගතහොත් වී මෙට්‍රික් ටොන් ලක්ෂ 03යි අවශ්‍ය වෙන්නේ. පසුගිය කාලය තුළදී වී මෙට්‍රික් ටොන් ලක්ෂ 60කට ආසන්න ප්‍රමාණයක් එකතු වුණා. මේ තත්වය තුළ කොහොමවත් හාල් හිඟයක්**

**එන්න විදියක් නෑ. මොකද ලබන අවුරුද්දටත් ඇතිවෙන්න වී තිබුණා. වී මෝල් හිමියන් මේ කන්නයේ ගන්න වී මේ කන්නයේ අඹරන්නේ නෑ. මාස 06ක් විතර පරණ කරනවා. මොකද පරණ කරන කොට තමයි ඉල්ලුමක් හැදෙන්නේ. හැබැයි බහුතරයක් ඒ වී ගත්තේ රුපියල් හතළිස් ගණන් වලට. දැන් ඒ අය කරන්නේ හාල් හිඟයක් කෘත්‍රිමව නිර්මාණය කරලා වී මිල වැඩිකරනවා. එහිදී පාරිභෝගිකයා හිතනවා වී හිඟ නිසා තමයි හාල් මිල වැඩි වෙන්නේ කියලා."**

**"ඒ වගේම හතළිස් ගණන්වලට ගත්ත වී රුපියල් පනස් ගණන්වලට ගත්ත කියලා හැත්තෑ ගණන්වලට විකුණනකොට මේ මහා පරිමාණ වී මෝල් හිමියන් විශාල ලාභයක් ලබන"** බවද නාමල් කරුණාරත්න මහතා පෙන්වා දෙයි.

**එමෙන්ම රටේ හාල් හිඟයක් නොමැති බවත් එය නිර්මාණය කරන ලද එකක් බවත් මේ තත්වය, පැවති සෑම ආණ්ඩුවක් තුළදීම සිදු වන දෙයක් බවද මේ තත්වය නැති කිරීම සඳහා රජය වී නිෂ්පාදනයෙන් සියයට 20ක් වත් ලබාගෙන වී සංචිතයක් ඇති කරගත යුතු බවද** සමස්තලංකා ගොවිජන සම්මේලනයේ කැඳවුම්කරු **නාමල් කරුණාරත්න මහතා** කියා සිටියේය.

මේ සම්බන්ධයෙන් කළ විමසීමකදී අදහස් දැක්වූ **වී අලෙවි මණ්ඩලයේ සභාපති ආචාර්ය ජටාල් මාන්නප්පෙරුම** මහතා :

**"ලබන කන්නයේ සිට පොහොර සහනාධාරය ලබාගන්නා ගොවීන්ගෙන් වී අලෙවි මණ්ඩලයට වී දෙන එක අනිවාර්ය කරන්න යෝජනාවක් තියෙනවා තියෙනවා එහි අපි කුඹුරු හෙට්ටයාර් එකට වැඩි ගොවීන්ගෙන් සහතික මිලට වී කිලෝ 1000ක් හරි 500ක් හරි ලබා ගන්න තමයි යෝජනා කරලා තියෙන්නේ. එමෙන්ම ගොවියෝ තාක්ෂණය යොදවලා වේලලා දෙන වී ගන්න නිසා අපිට අමුතුවෙන් තව තාක්ෂණය දියුණු කරන්න අවශ්‍ය වෙන්නේ නෑ. ඒ වගේම දැනට තියෙන වී ගබඩා ටික පුරවා ගත්තොත් අපිට ඒ ටික ප්‍රමාණවත් වෙනවා වෙළඳපොළ හසුරවා ගන්න."**

එමෙන්ම ඉදිරියේදී පි. එම්. බි. සහල් වෙළඳ පොළට මිට දහගුණයකටත් වඩා වැඩියෙන් වෙළඳ පොළට නිකුත් කිරීමට කටයුතු කරන බවද වී අලෙවි මණ්ඩලයේ සභාපති ජටාල් මාන්නප්පෙරුම මහතා කියා සිටියේය.

### කළ යුත්තේ කුමක්ද?

විශේෂයෙන්ම රජයේ ආධාර උපකාර ඇතිව රජයෙන් ලබා දෙන පොහොර සහනාධාරය පවා ලබා ගනිමින් වී ගොවිතැන් කරන වී ගොවීන්ගේ අස්වැන්නෙන් කොටසක් වී අලෙවි මණ්ඩලය වෙත අනිවාර්යයෙන් ලබා දීමේ ක්‍රමවේදයක් සැකසිය යුතුය. එමෙන්ම පුද්ගලික වී මෝල් හිමියන් ලෙස ගොවි මහතුන් ළඟට ගොස් වී අලෙවි මණ්ඩලය විසින් වී මිලදී ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සැකසිය යුතුය. සම්ප්‍රදායික නොවූ නව ක්‍රම හඳුන්වා දෙමින් වී අලෙවි මණ්ඩලයේ නිලධාරීන්ද එම නවීන ක්‍රම සඳහා හුරු කරමින් එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි නිලධාරීන් ඒ සඳහා යෙදවිය යුතුය. එමෙන්ම රජය වී තොග පවත්වාගෙන යමින් හඳුනාගත් වී මෝල් හරහා ඒවා සහල් බවට පත්කරමින් පී. ඇම්. බී. හාල් (*PMB RICE*) ලෙස වෙළඳ පොලට නිකුත් කළ හැකි වැඩ පිළිවෙළක් රජය ක්‍රියාත්මක කරන තාක් රටේ පවතින සහල් මාෆියාවට තිත තැබිය නොහැකි ය.

**රාහුල් සමන්ත හෙට්ටිආරච්චි**

2020.11.09 ''අද'' පුවත්පත






# වරායට ලැබිය යුතු ආදායම රහසේ ගිලින බහිරව සමාගම් දෙකක්

මෙරට වරායන් සඳහා පැමිණෙන නෞකා විසින් ගෙවිය යුතු 'වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව' වරායට ලැබෙන විවිධ ආදායම් අතර ප්‍රධානතම ආදායමයි. එම ගාස්තුව නැවක ටොන් එකක් සඳහා ඇමරිකානු ඩොලර් භාගයක් වන අතර වරායකට පැමිණෙන ලොකු කුඩා සංචාරක නෞකා, යුධ නෞකා, වෙළඳ නෞකා මෙන්ම ව්‍යාපෘති සඳහා පැමිණෙන නෞකාවන්ද එය අනිවාර්යයෙන්ම ගෙවිය යුතුවේ.

**සෙසු නෞකා මෙම ගාස්තුව ගෙවමින් සිටියදී ත්‍රිකුණාමලය වරාය භාවිත කරන ප්‍රධාන සමාගම් දෙකක් එම සමාගම් සඳහා අමුද්‍රව්‍ය රැගෙන එන නෞකාවන් සඳහා ගෙවිය යුතු වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව නොගෙවා පැහැර හැරීමෙන් වරාය අධිකාරියට වසරකට අහිමිව යන ආදායම දළ වශයෙන් රුපියල් කෝටි 12කි.**

මෙරට පිහිටි වාණිජ වරායන් අතුරින් සුවිශේෂී වැදගත්කමක් හිමි වන ත්‍රිකුණාමලය වරායට ප්‍රවේශ වන සියලු නෞකාවන් හා ඒවා








වරාය පරිශ්‍රයේ සිදු කරන මෙහෙයුම් කටයුතු වෙනුවෙන් අය කරගත යුතු සම්මත වරාය ගාස්තුව වරාය භාවිත කරන ඉන්දියන් තෙල් සමාගම පමණක් ගෙවමින් සිටියදි එකී පහසුකම් භාවිත කරන ටෝකියෝ සිමෙන්ති සමාගම හා ප්‍රීමා ලංකා සමාගම ගෙවිය යුතු වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව 16 වසරක් පුරා නොගෙවා සිටීමෙන් වරාය අධිකාරියට විශාල මුදලක් අහිමිව ඇති බව තොරතුරු දැන ගැනීමේ පනත හරහා කළ විමසීමක දී තහවුරු විය.

**නාවික ගාස්තුව ලෙස ටොන් 30,000 ට වැඩි නැවක ටොන් එකක් සදහා ඩොලර් 32ක් ද වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව ලෙස නැවක ටොන් එකක් සඳහා ඩොලර් භාගයක්ද ගොඩබෑමේ හා භාරදීමේ ගාස්තුව ලෙස ටොන් එකක් සදහා ඩොලර් එකහමාරක්ද නැව් භාණ්ඩ වාහක ගාස්තුව ලෙස ටොන් එකක් සදහා ඩොලර් පහක්ද අය කළ යුතු වේ.**

මේ සියලු ගාස්තු ත්‍රිකුණාමලය වරායට පැමිණෙන සෑම නෞකාවක්ම ගෙවනු ලබන නමුත් ප්‍රීමා සමාගමට හා ටෝකියෝ සමාගමට අමුද්‍රව්‍ය රැගෙන එන නෞකාවන් පමණක් නාවික ගාස්තුව හැර සෙසු සියලු ගාස්තුවලින් පූර්ණකාලිනව නිදහස් කර තිබීම විමතියට කරුණකි.

## වරාය සේවකයන් නගන චෝදනාව

වරායක් සඳහා නැවක් ඇතුළු කිරිමේදී, පිට කිරිමේදී මෙන්ම එකී නැව වරාය තුළ සිට සිදු කරන සියලු මෙහෙයුම් කටයුතුවලදී අය කරන ගාස්තුව සම්මත ගාස්තුවක් වන අතර මෙරට සෑම වරායකදීම එකී ගාස්තුව අය කරනු ලබයි. එය ත්‍රිකුණාමලය වරායටද පොදු කරුණකි. ඒ අනුව වරායට ගෙවිය යුතු නාවික ගාස්තුව, වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව, ගොඩබෑම හා භාරදීමේ ගාස්තුව හා නැව් භාණ්ඩ වාහක





ගාස්තුව යන ගාස්තු සඳහා මුදල් අය කිරිම අනිවාර්ය වේ.

නමුත් ත්‍රිකුණාමලය වරාය භාවිතා කරන ප්‍රීමා සමාගම හා ටෝකියෝ සිමෙන්ති සමාගම නාවික ගාස්තු හැර සෙසු ගාස්තුවලින් පූර්ණකාලිනව නිදහස් කර ඇති බව වරාය සේවක සංගමයේ සභාපති නන්දසිරි රෝහණධිර මහතා පවසයි. ඒ මහතා වැඩිදුරටත් පෙන්වා දෙන්නේ මේ තුළින් රටට අහිමි කර ඇති ආදායම අතිවිශාල බවයි

**"2018 පෙබරවාරි 15 වැනිදා ටෝකියෝ සමාගමට ගෙන ආ මෙට්‍රික් ටොන් 17,500ක එකලස් නොකරන ලද සිමෙන්ති පැටවීම සදහා පැමිණි නෞකාවට අදාළව ඉහත සදහන් ගාස්තු යටතේ රුපියල් 15,161,749ක් අය විය යුතුයි. ඔවුන් එය නොගෙවා සිටිම තුළින් එක් සමාග මක් එක් නැවකින් වරායට අහිමි කළ මුදල විශාලයි" හෙතෙම පවසයි.**

**2018 වසර තුළ පමණක් මෙම සමාගම් පෙර කී සියලු ගාස්තු නොගෙවීම නිසා වරායට අහිමිව ඇති ආදායම දළ වශයෙන් ඇමරිකන් ඩොලර් මිලියන 47කි. 2002 වසරේදී රාවුෆ් හකීම් මහතා වරාය හා නාවික කටයුතු අමාත්‍ය ධුරය දරන සමයේ අතිරේක ලේකම් වරයකු විසින් මෙම සමාගම් සමග අස්සන් තබන ලද ගිවිසුමට අනුව ඔවුන්ට මෙම වරප්‍රසාද හිමිව ඇති බව රෝහණධීර මහතා නගන චෝදනාවයි.**

අතිරේක ලේකම්වරයෙකු විසින් අස්සන් තබන ලද බව කියන ගිවිසුමකින් මෙම සමාගම් වරාය ගාස්තුවලින් පූර්ණකාලීනව නිදහස් කිරිම නිසා වසරකදී රටකට අහිමි වන ආදායම සිතාගත නොහැකි වේදැයි රෝහණධීර මහතා වැඩිදුරටත් පෙන්වා දෙයි.

## ඉහළ මට්ටමේ ස්වභාවික වරායක්

ලොව පිහිටි හොඳම ස්වභාවික වරායන් අතුරින් ප්‍රමුඛස්ථානය හිමි වන අග්නිදිග ආසියාවේ විශාලතම ඉන්ධන පර්යන්තයට හා ප්‍රීමා සමාගමට අයත් විශාලතම පිටි ඇඹරුම් කම්හලට හිමිකම් කියන **ත්‍රිකුණාමලය වරාය 2011 අගෝස්තු 26 වැනි දින අංක 1720/42 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් හෙක්ටයාර් 1630 ක ජල තලයක් හා 1984 සැප්තැම්බර් 12 වැනි දින අංක 314/10 ගැසට් පත්‍රය මගින් හෙක්ටයාර් 2,255 ක ගොඩබිම් තීරුවක් නිත්‍යානුකූලව හිමි කරගෙන තිබේ.**

මෙරට පිහිටි වරායන් අතුරින් ගැඹුරුතම ස්වභාවික වරාය වන **ත්‍රිකුණාමලය වරායේ මධ්‍යයේ ගැඹුර මීටර් 25කි.** වරාය පිවිසුම සහිත **ජල තටාගයේ පළල මීටර් 500 කි.** විශාල ප්‍රමාණයේ නෞකා ගෙන්වා ගෙන ඒවායින් අධික ලෙස ආදායම් ඉපදිය හැකි විශාල ප්‍රමාණයේ **ජැටි පහකින් හා ටොන් 30,000 ක ධාරිතාවකින් යුත් මීටර් 180ක් දිගැති නැව් පහක් එකවර නැංගුරම් ලා තැබිය හැකි ආරක්ෂිත නැංගුරම් පොළකින්ද වරාය සමන්විත වේ.**

**සේවකයන් 470ක්** හා **විධායක ශ්‍රේණියේ නිලධාරීන් හය දෙනෙකු** විසින් මෙහෙයවනු ලබන මෙම වරායේ රාත්‍රී මෙහෙයුම් කටයුතු දශක තුනකට වැඩි කලක් පුරා ඇණහිට තිබුණි. ඒ කොටි ත්‍රස්තවාදී ක්‍රියාවන් හේතුවෙනි.

වරාය කළමනාකරණ හා නවීකරණ ව්‍යාපෘතිය හරහා ජපාන ආධාර යටතේ නැව්වලට මඟ පෙන්වන රාත්‍රී පහන් ආලෝක ධාරා සහිත බෝයා පද්ධතියක් හා **ටොන් 75,000ක ධාරිතාවකින් යුත් මීටර් 230ක් දිගැති විශාල නැව් බැඳ තැබිය හැකි මෝරින් බෝයා දෙකකින්** හා වරායේ පිහිටි පැරණි ප්‍රදීපාගාරයන් ද්විත්වය සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන පහන් ආලෝක ධාරා සහිතව නවීකරණය කිරීමෙන් දිවා රාත්‍රී මෙහෙයුම් කටයුතු සඳහා සුදුසු මට්ටමට ගෙන තිබේ.

වරාය වාණිජ කටයුතු සඳහා උසස් මට්ටමින් සකසා ඇතත් ඉන් උපයන ආදායම සොච්චමක් බව වරාය සේවකයන් නගන චෝදනාවයි. ඊට හේතුව වී ඇත්තේ ත්‍රිකුණාමලය වරාය හා ඊට අයත් ජැටි භාවිත කරමින් සිය නිෂ්පාදන ගොඩබෑම හා භාරදීම ඇතුළු මෙහෙයුම් කරන සමාගම් තුනකින් දෙකක් ගෙවිය යුතු වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව පවා නොගෙවා සිටීමයි.

## ගාස්තු නොගෙවන සමාගම් දෙකක්

**1980 වසරේදී** සිය ආනයන හා අපනයන කටයුතු වරාය තුළ ආරම්භ කළ සිංගප්පූරු සමාගමක් වන ප්‍රීමා ලංකා සමාගම වරාය භාවිත කරන ප්‍රධාන සමාගමයි. **දිනකට මෙට්‍රික් ටොන් 3,650ක තිරිඟු ඇට ඇඹරිය හැකි එමෙන්ම මෙට්‍රික් ටොන් 350,000ක පිටි ගබඩා කර ගත හැකි එම සමාගමට අයත් ලොව පිහිටි විශාලතම පිටි ඇඹරුම් කම්හල මෙය වේ.**

**ප්‍රීමා සමාගම 2018 වසරේදී හසුරුවනු ලැබූ මෙට්‍රික් ටොන් ප්‍රමාණය 948,546කි. වරායට පැමිණෙන නෞකාවන්ගෙන් සියයට 90ක් පමණ ප්‍රීමා සමාගමට භාණ්ඩ ගෙන එන නෞකාවන් වේ. ඒවා කැනඩාව, ඕස්ට්‍රේලියාව, ඇමරිකාව හා රුසියාවට අයත් නෞකාවන් වන අතර මෙම සමාගමේ නිෂ්පාදනයන් බල්ගේරියාව, මැලේසියාව, සිංගප්පූරුව හා බැංකොක් යන රටවලට අපනයනය කරනු ලබයි.**

**එමෙන්ම වරාය භාවිත කරන දෙවන සමාගම ටෝකියෝ ලංකා පුද්ගලික සමාගමයි. 2018 වසර තුළ හසුරුවනු ලැබූ මෙට්‍රික් ටොන් ප්‍රමාණය 1,466,390කි. සිමෙන්ති සෑදීමට අවශ්‍ය ක්ලින්කල් නැමැති අමුද්‍රව්‍ය රැගෙන ඉන්දුනීසියාව, ඉන්දියාව හා එක්සත් අරාබි එමීර් රාජ්‍යට අයත් නැව් ටෝකියෝ සමාගම වෙත පැමිණේ.**

වරායට පිවිසෙන භාණ්ඩ ප්‍රවාහන නෞකා වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව ගෙවීම අනිවාර්ය වුවත් මෙම සමාගම් දෙක ගෙවිය යුතු වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව 2003 වසරේ සිට වරාය අධිකාරියට නොගෙවා සිටියි. **වරාය ආශ්‍රිතව සිදුකරන සිය මෙහෙයුම් කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව නියමිත ලෙස ගෙවා සිය මෙහෙයුම් සිදුකරන වරායේ පිහිටි එකම සමාගම ඉන්දියන් තෙල් සමාගම පමණක්** යැයි වරාය අධිකාරිය පවසයි.

## අහිමි ආදායම ඩොලර් මිලියන 14ක්

කෙසේ වෙතත් ප්‍රීමා ලංකා සමාගම **විසින් 2018 වසර තුළ පමණක් සිදු කළ මෙට්‍රික් ටොන් 948,546ක භාණ්ඩ හැසිරවීම වෙනුවෙන් වරායට ගෙවිය යුතු එහෙත් නොගෙවා ඇති වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව පමණක් ඇමරිකානු ඩොලර් 474,273කි. ටෝකියෝ සිමෙන්ති සමාගමද එම වසරේදී හසුරුවනු ලබූ මෙට්‍රික් ටොන් 1,466,399ක් වෙනුවෙන් ගෙවිය යුතු වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව පමණක් ඇමරිකානු ඩොලර් 733,195කි.** මේ අනුව 2018 වසර තුළ පමණක් ප්‍රීමා සමාගම හා ටෝකියෝ

ඉන්දියන් ඔයිල් සමාගමට අයත් තෙල් ටැංකි



සමාගම විසින් වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව පමණක් නොගෙවා අපට අහිමි කළ ආදායම සිතා ගත හැකි වේ.

**ඒ අනුව ප්‍රීමා සමාගම 2003 වසරේ සිට 2018 වසර දක්වා සිදු කළ වරාය මෙහෙයුම් වෙනුවෙන් නොගෙවා ඇති වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව පමණක් ඇමරිකන් ඩොලර් 6,837,340.73ක් වන අතර ටෝකියෝ සිමෙන්ති සමාගම එම කාලය සදහා ඇමරිකන් ඩොලර් 6,809,135.78ක් නොගෙවා තිබීමෙන් 16 වසරක් පුරා රටට විශාල ආදායමක් අහිමිව ගොස් තිබේ.**

නිල නොවන මූලාශ්‍ර හරහා ලැබෙන තොරතුරු අනුව මෙකී සමාගම් හා ඇති කර ගනු ලැබූ ගිවිසුමක් හේතුවෙන් ඔවුන් වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව ඇතුළු සෙසු වරාය ගාස්තුද නොගෙවා සිටී. කෙසේ වෙතත් මෙකී සමාගම් සඳහා අමුද්‍රව්‍ය රැගෙන එන නෞකාවන් නාවික ගාස්තුව හැර සෙසු ගාස්තුවලින් පූර්ණකාලීනව හා සම්පූර්ණයෙන්ම නිදහස් කර ඇති බව වරාය හා නාවික කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය විසින් 2019. 08. 23 වන දින එවකට පාර්ලිමේන්තු මන්ත්‍රී සුසන්ත පුංචි නිලමේ මන්ත්‍රීවරයා අමතා එවන ලද ලිපියක දැක්වේ.

## චෝදනා මග හරින සමාගම්

ගෙවිය යුතු සියලු ගාස්තු වරායේ කොටසක් භාවිතා කරමින් සිටින ඉන්දියන් තෙල් සමාගම ගෙවමින් සිටියදී එකී වරාය ගාස්තුව නොගෙවා සිටින්නේ මන්දැයි ප්‍රීමා ලංකා සමාගමෙන් කළ විමසුමකදී එම සමාගමේ මානව සම්පත් කළමණාකාරිණී වත්සලා මෙන්ඩිස් මහත්මිය පැවැසුවේ,

**"ගෙවිය යුතු සියලු බදු අප විසින් නීත්‍යානුකූලව ගෙවනවා. නමුත් කුමන හෝ අවබෝධතාවක් රජය සමග තියෙනවාද යන්න කියන්න අමාරුයි කියලා සාමාන්‍යාධිකාරී තුමා කියනවා"** යන්නයි.

වරාය අධිකාරියට නීත්‍යානුකූලව ගාස්තු සියල්ල ගෙවන බව ඇය පැවැසුවත් වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය මගින් සුසන්ත පුංචි නිලමේ මන්ත්‍රීවරයා අමතා එවන ලද ලිපියේ ප්‍රීමා සමාගම වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව 16 වසරක් පුරා නොගෙවා ඇති බවත් ඉන් විශාල ආදායමක් අහිමිව ඇති බවත් ප්‍රීමා සමාගමට විශේෂ වරප්‍රසාද ලබා දී ඇත්තේ කුමන හේතුවක් සදහාද යන්න සොයා ගැනීම සඳහා වන ලිපිගොණු කිසිවක් ත්‍රිකුණාමලය වරාය සතුව නැති බවත් සඳහන් කර තිබේ.

එමෙන්ම වරාය ගාස්තු නොගෙවීම සම්බන්ධව ටෝකියෝ සිමෙන්ති සමාගමටද එල්ල වන චෝදනා පිළිබදව අවස්ථා කිහිපයකදී කළ විමසීම්වලදී ඊට හේතුව පැහැදිලි කිරීමට හෝ දුරකතනයට ප්‍රතිචාර දැක්වීමට වගකිවයුත්තෙකු හෝ ඉදිරිපත් කිරීමට එම සමාගම කටයුතු නොකළේය.

ප්‍රීමා සමාගම හා ටෝකියෝ සිමෙන්ති සමාගම විසින් හසුරුවන භාණ්ඩ වෙනුවෙන් වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව ඇතුළු වරාය ගාස්තු අය නොකිරීම සම්බන්ධව කළ විමසීමකදී අදහස් දැක්වූ ත්‍රිකුණාමලය වරාය **ප්‍රාදේශීය කළමණාකාර ටී. කේ. ජී. එල්. හේමචන්ද්‍ර** මහතා පැවැසුවේ මේ සම්බන්ධව තමාට කිසිවක් ප්‍රකාශ කිරීමට නොහැකි බවයි.



**"තොරතුරු ඉල්ලීම් සියල්ල කොළඹ ප්‍රධාන කාර්යාලය වෙත යවා තියෙනවා. කොළඹින් තොරතුරු ආවාම ඒ ටික ඉක්මණින්ම දෙන්න පුළුවන්. නමුත් ටෝකියෝ සමාගම අප යටතේ පාලනය නොවන නිසා ඒ තොරතුරු දෙන්න විදිහක් නැහැ. වරාය තුළ සමාගම පිහිටා තිබුණත් මම හිතන්නේ ගිවිසුම්වලට අනුව ඔවුන් තමයි පාලනය කරන්නේ "** යැයි හෙතෙම වැඩිදුරටත් පවසයි.

කුමන හෝ ගිවිසුමක් මගින් වරායට ගෙවිය යුතු සෙසු ගාස්තු නොගෙවා සිටීමේ බලය ලබා ගත්තද රජයට අයවිය යුතු වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව ගෙවීම අවහිර කිරීමට කිසිවෙකුටත් කිසිම ආකාරයකින් බලයක් නොමැති බව වරාය සේවකයෝ පෙන්වාදෙති.

කෙසේ වෙතත් මෙම සමාගම් දෙක සඳහා මෙවන් වරප්‍රසාදයක් ලබා දීමට හේතුව වී ඇත්තේ 2002 වසරේදී වරාය සේවකයන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම සඳහා ගෙන ගිය වැඩපිළිවෙළකට අදාළව සේවකයන් සදහා ගෙවිය යුතු මුදල් සොයා ගැනීමට ගත් ක්‍රියා මාර්ගයක ප්‍රතිඵලයක් බවද කියැවේ. **ඒ අනුව ටෝකියෝ සිමෙන්ති සමාගම රුපියල් මිලියන 300ක මුදලක් වරාය අධිකාරියට ගෙවා ඇති අතර එබැවින් වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව ඔවුන්ගෙන් අය කර ගැනීම 2003 වසරේ සිට නවතා තිබේ. ටෝකියෝ සමාගම සිය නිෂ්පාදන පැටවීම හා ගොඩබෑම සඳහා 2003 පෙබරවාරි 20 වන දින සිට වරාය අධිකාරියේ සේවකයන් යොදවා නොගැනීමත් ඔවුන් විසින් මීටර් 160ක් දිගින් යුතු ජැටියක් ඉදි කිරීමත් මත ඊට නෛතික තත්වයක් ලබා දෙමින් වරාය අධිකාරිය එකී සමාගම සමග කිසියම් ගිවිසුමකට එළැඹීම නිසා නාවික ගාස්තුව හැර සෙසු ගාස්තු වලින් පූර්ණකාලිනව නිදහස් විමට ඔවුන්ට හැකියාව ලැබී ඇති බව සේවකයෝ පෙන්වා දෙති.**

## ගිවිසුම් දැක නැති විෂය භාර ඇමති

එමෙන්ම මෙම සමාගම් දෙක සඳහා මෙකී වරප්‍රසාද ලබා දී ඇත්තේ කුමන පදනමක සිටද යන්න සොයා ගැනීමට අදාළ ලිපි ගොණු කිසිවක් නැති බව වරාය අධිකාරිය සුසන්ත පුංචි නිලමේ මන්ත්‍රීවරයා අමතා එවූ ලිපියෙහි දක්වා තිබීමත් ගිවිසුමක් පිළිබඳව වරාය අධිකාරිය හෝ ප්‍රීමා සමාගමද නොදැන සිටීමත් විමතියට කරුණකි. ගිවිසුමක් හෝ වරප්‍රසාද ලබා දීමට අදාළ ලිපි ගොණු හෝ නොමැතිව තිබියදීත් මෙකී සමාගම් දෙකෙන් අය විය යුතු වරාය ටොන් ප්‍රමාණ ගාස්තුව 2003 වසරේ සිට අය නොකර සිටීම නිසා රටට ලැබිය යුතු විශාල ආදායමක් අහිමිව ගොස් තිබේ.

මේ පිළිබද ව වරාය නාවික කටයුතු හා මහා මාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාගෙන් කළ විමසුමකදී ඔහු කියා සිටියේ චන්ද්‍රිකා පාලන සමයේ එළැඹුණ අහිතකර ගිවිසුම් දෙකක් නිසා මෙම තත්වය ඇතිව පවතින බවත් එසේ එළැඹුණ බව කියන ගිවිසුම් මොනවාද යන්න මෙතෙක් තමාද දැක නැති බවයි.

**"මම ලේකම්තුමාට කිව්වා ප්‍රීමා හා ටෝකියෝ සමාගම් සමග අස්සන් කළ බව කියන ගිවිසුම් පිළිබඳව සොයා බලා එම ගිවිසුම්වල පවතින කොන්දේසි පිළිබඳව නිත්‍යානුකූලව ගත හැකි තින්දු තිරණ ගෙන එකි ගිවිසුම් අවසන් කිරීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා මේ ගිවිසුම් නිසා අපිට ලැබිය යුතු රාජ්‍ය භාගය පවා ලැබෙන්නේ නැහැ**

**මේක චන්ද්‍රිකා ආණ්ඩුව කාලේ කොමිස් අරන් ගහපු, විශාල හොරකමක් කළ ගිවිසුමක්. මම හිතන්නෙ නැහැ මේ ගිවිසුමේ අපිට වාසි දායක දේ තියෙයි කියලා ඒ කෙසේ වෙතත් මම මේ ගැන හොයා බලනවා"** යැයි විෂය භාර අමාත්‍යවරයා පවසයි.

අමාත්‍යවරයා පවා ගිවිසුම් පිළිබදව නොදන්නා බව පැවැසීම හේතුවෙන් මෙම සමාගම් වරාය ගාස්තුව නොගෙවා සිටිම පිළිබදව තවදුරටත් කරුණු සොයා බැලීම සඳහා තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලීම් කිහිපයක් වරාය අධිකාරිය වෙත යොමු කළද ඊටද නිසි ප්‍රතිචාරයක් දැක්වීමට වරාය අධිකාරිය අපොහොසත්ව තිබේ.

## තොරතුරු ලබාදිමට ඩොලර් 102 ක් ඉල්ලයි

**යොමු කළ තොරතුරු ඉල්ලීම්වලට අදාළව එවනු ලැබූ පිළිතුරු ලිපියෙහි ඉල්ලා ඇති තොරතුරු ලබා දිමට ඩොලර් 102ක් ගෙවිය යුතු බව පවසයි. ඒ තොරතුරු පිටපත් 51ක් ඇති බැවින් එකි තොරතුරු ලබා දීම සඳහා එක් පිටපතකට ඩොලර් දෙකක මුදලක් ගෙවිය යුතු බවට තොරතුරු නිලධාරී අධ්‍යක්ෂ (සේවා සැපයුම්) උපුල් ජයතිස්ස මහතා දන්වා සිටිම හේතුවෙනි.**

එසේ වුවද ප්‍රිමා සහ ටෝකියෝ සමාගම් ගෙවිය යුතු, වරාය විසින් 16 වසරක් පුරා අය නොකර සිටින ගාස්තු සදහා අදාළව ඔවුන් සමග කිසියම් ගිවිසුමක් තිබේ නම් එහි පිටපතක් ඉල්ලා ඇතත් ඒ පිළිබඳව තොරතුරු නොමැති බවද වරාය අධිකාරිය පවසයි.

අය විය යුතු අනිවාර්ය ගාස්තුව පවා සමාගම් වලින් අය නොකරමින් වසරකට ඩොලර් මිලියන 14ක මුදලක් රටට අහිමි කරමින් සිටින වරාය අධිකාරිය ඒ පිළිබඳව තොරතුරු ඉල්ලා සිටි පුරවැසියෙකුට එකි තොරතුරු ලබා දීමට ඩොලර් 102 ක් ගෙවිය යුතු යැයි පැවැසීම ලොකුම විහිළුව බව කිව යුතුය.

වරාය සේවකයන් පවසන පරිදි අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු විසින් අස්සන් තබන ලද ගිවිසුමකින් මෙම සමාගම් සඳහා යම් බලයක් ලැබී පවතී නම් එය කොතෙක් දුරට නීත්‍යානුකූලද යන්න පිළිබදව විමසා බැලිය යුතුය. එමෙන්ම මෙම සමාගම් දෙක සමග වරාය අධිකාරිය ගිවිසුමක් අත්සන් කළේ නම් එම ගිවිසුම් ත්‍රිකුණාමලය වරාය සතුව නොපැවැතීම පිළිබදව මෙන්ම මෙම සමාගම් සඳහා විශේෂ වරප්‍රසාද ලබා දී ලැබිය යුතු ආදායම 16 වසරක් අහිමි කළ නිලධාරීන් පිළිබදවද පුළුල් විමර්ශණ ඇරඹිය යුතුය.

ඉන්දියානු තෙල් සමාගම පවා වරාය අධිකාරියට ගෙවිය යුතු සියලු ගාස්තු ගෙවමින් සිටියදී රටට මෙවන් විශාල ආදායමක් අහිමි කරවන ගිවිසුමක් අත්සන් කිරීමට අතිරේක ලේකම්වරයෙකුට ඇති නිතිමය බලය කුමක්ද යන්න මෙන්ම මෙම ගිවිසුම අත්සන් කළේ කාගේ නියෝගයකට හා කාගේ වුවමනාවකට දැයි යන්න සොයා බලා එය නිවැරැදි කිරීමද බලධාරීන්ගේ වගකීම වන්නේය.

**ලක්මාල් කේ. බදුගේ**

2020.03.08 - රාවය





# පරිසරයට වින කටින
# කුඩා ජල විදුලි බලාගාර

කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පසුගිය කාලයේ ලොකු ආන්දෝලයක් ඇති විය. විවිධ ප්‍රදේශවල ඉදිකිරීමට ගිය කුඩා ජල විදුලි බලාගාරවලට එරෙහිව උද්ඝෝෂණ වාර්තා විය. කුඩා ජල විදුලි බලාගාර නිසා ලොකු පාරිසරික හානියක් සිදු වන බවට පරිසරවේදීහු චෝදනා කළහ. මේ සොයා බැලීම කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘති ගැනයි.

දිනය 2016 ඔක්තෝබර 21 වැනි දාය. කුඩා ජල විදුලි බලාගාර නිසා දැරණීයගල ප්‍රදේශයට විශාල පාරිසරික හානියක් සිදු වන බවට වාර්තා වීම නිසා එම ප්‍රදේශයට ගිය අපට දැකගත හැකි වූයේ කුඩා ජල පාරක් පමණක් ගලා බසින මාගල් ගඟයි. සිරිපා අඩවියෙන් ආරම්භ වන බව කියන මාගල් ගඟ දැරණීගල හරහා ගලා බසිද්දී එය හැඳින්වෙන්නේ සීතාව ගඟ ලෙසයි. මෙම ගංගාවේ ජලය ඉතාම අඩුවෙන් තිබුණ ද ගංගාවට සමාන්තරව ඉදිකර තිබූ විශාල කොන්ක්‍රීට් කානුවක් දිගේ විශාල ජල කඳක් ගලාගෙන යන අයුරු දැකගත හැකි විය.

කුඩා ජල විදුලි බලාගාර පිළිබඳ ලිපියට, මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසර දී ඇති කුඩා ජල විදුලි බලාගාර ලැයිස්තුව අවශ්‍ය වූ අතර ඒ දිනවල එනම් 2016දී ඒ පිළිබඳ අධිකාරියෙන් විමසීමේදී එම ලැයිස්තුව ලබාදිය නොහැකි බව පැවසීය. 2017 පෙබරවාරි මස 3 වැනි දා සිට තොරතුරු පනත ක්‍රියාත්මක වීමෙන් පසු කුඩා ජල විදුලි බලාගාර පිළිබඳ තොරතුරු ඉල්ලා මධ්‍යම පරිසර අධිකාරිය, විදුලිබල අමාත්‍යංශය, ලංකා විදුලිබල මණ්ඩලය, සුනිත්‍ය බලශක්ති අධිකාරිය, සමාගම් රෙජිස්ටාර් කාර්යාලය සහ මහජන උපයෝගීතා කොමිෂන් සභාවට තොරතුරු ඉල්ලීම් අටක් පමණ ඉදිරිපත් කළ අතර නම් කළ නිලධාරියාට අභියාචනා දෙකක්ද තොරතුරු දැන ගැනීමේ කොමිසන් සභාවට එක් අභියාචනයක් ද ඉදිරිපත් කළෙමු. ඒ අනුව 2016 වසරේ ඔක්තෝබර මාසයේ සිට මේ දක්වා වසර දෙක හමාරක පමණ කාලයක් තිස්සේ ලබාගත් තොරතුරු මෙම ලිපියේ දී උපුටා ගැනෙයි.

## කුඩා ජල විදුලි බලාගාර


කුඩා ජල විදුලි බලාගාර යනු මෙගාවොට් 10ට අඩු ධාරිතාවක් නිපදවන ජල විදුලි බලාගාර ලෙස පොදුවේ හැඳින්වේ. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක්ව පැවැති සමයේ සිට කුඩා ජල විදුලි බලාගාර ඉදිකිරීම ආරම්භ කළ බව කියැවේ. දියඇලි සහ ගංගා හරස් කර වේල්ලක් බැඳ එම ජලය විශාල කොන්ක්‍රීට් කානුවක් දිගේ කිලෝමීටර දෙකක් හෝ තුනක් පමණ රැගෙන ගොස් ටර්බයිනයක් කරකැවීමට සලස්වා විදුලිය නිපදවීම මෙම ව්‍යාපෘතිවලදී වැඩි වශයෙන් සිදු කෙරෙයි. ටර්බයිනය කරකැවීමට සැලැස්වීමෙන් පසු එම ජලය යළිත් වරක් ගංගාවට එකතු කරන අතර ඇතැම් ගංගා ආශ්‍රිතව මෙවැනි කුඩා ජල විදුලි බලාගාර තුන හතරක්ම දක්නට ඇත.

කොන්ක්‍රීට් කාණුවක් දිගේ ජලය රැගෙන යන නිසා වේල්ලේ සිට ටර්බයිනය කරකවන තැන දක්වා කිලෝමීටර දෙක තුනක් දුරට ගංගාවේ ජලය ගලා යන්නේ ඉතාම අඩු වශයෙනි. වැඩි ජලය ප්‍රමාණයක් ගලා යන්නේ කොන්ක්‍රීට් කානුව තුළිනි.

කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකරද්දී ක්‍රියාත්මක විය යුතු ක්‍රමවේදයක් තිබේ. මුලින්ම එම කුඩා ජල විදුලි බලාගාරය ඉදිකරන්නේ කුමන ජල මූලාශ්‍රයක් ආශ්‍රිතව ද යන්න ගැන මධ්‍යම පරිසර අධිකාරිය දැනුම්වත් කර ඒ සඳහා පරිසර අධිකාරයේ අවසරය ලබාගත යුතුය. ඊට සමගාමීව පළාත් පාලන ආයතනවලින්ද අනුමැතිය ලබාගත යුතු අතර පසුව සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අනුමැතිය ලබාගත යුතුව ඇත. ඉන් පසු ලංකා විදුලිබල මණ්ඩලය සමඟ විදුලි මිලදී ගැනීම් පිළිබඳ ගිවිසුම අත්සන් කළ යුතු අතර අවසාන වශයෙන් විදුලි බලාගාරයේ ජනන කටයුතු සඳහා මහජන උපයෝගීතා කොමිසන් සභාවෙන් ජනන බලපත්‍රය ලබා ගත යුතුය.

මහජන උපයෝගීතා කොමිසන් සභාව කුඩා ජල විදුලි බලාගාර සඳහා ජනන බලපත්‍රය ලබා දීමට පෙර ඒ බව ප්‍රසිද්ධ දැන්වීම් මගින් මහජනතාව දැනුම්වත් කර විරෝධතා ඇත්දැයි සොයා බැලිය යුතුය. එසේම පරිසර බලපත්‍රය ආදී අනුමැතිය ලබාගෙන ඇත්දැයි පරීක්ෂා කර බැලිය යුතු බව ද මහජන උපයෝගීතා කොමිසන් සභාවේ ප්‍රකාශකයෙක් පැවසීය.

**ලංකා විදුලිබල මණ්ඩලයේ වෙබ් අඩවියේ සඳහන් සංඛ්‍යාලේඛන අනුව 2016 වසරේ මෙගාවොට් 4,018ක ධාරිතාවක්**



https://electrical-engineering-portal.com/

**විදුලි බලාගාර 232කින් ලබාගෙන ඇති අතර එම ප්‍රමාණයෙන් මෙගාවොට් 342ක් ලබාගෙන ඇත්තේ කුඩා ජල විදුලි බලාගාර 172කිනි.**

**2017 වසරේදී මෙගාවොට් 4,087ක මුළු ධාරිතාව විදුලි බලාගාර 247කින් සපයද්දී කුඩා ජල විදුලි බලාගාර 182 කින් සපයා ඇත්තේ මෙගාවොට් 354කි.**

**තොරතුරු දැන ගැනීමේ පනත අනුව කළ විමසීමේදී ලංකා විදුලිබල මණ්ඩලය ලබා දුන් තොරතුරුවලට අනුව කුඩා ජල විදුලි බලාගාරවලින් 2015 වසරේදී මෙගාවොට් පැය 1073.91ක්ද, 2016 වසරේදී මෙගාවොට් පැය 856.81ක් ද, 2017 වසරේ දී මෙගාවොට් පැය 2109.97ක් ද මිලදී ගෙන තිබේ.**

## පාරිසරික බලපෑම

කුඩා ජල විදුලි බලාගාර ගැන සොයා බැලීමට ගිය ගමනේදී මාගල් ගඟ ඉහළට ගිය විට දැකගන්නට ලැබෙන විශාල ජල කඳ ඊට කිලෝමීටර ගණනක් පහළට ආ විට දැකගන්නට නැත. ගඟ හරස්කර බඳින ලද වේල්ලකින් ගඟේ ජලය වැඩි ප්‍රමාණයක් විශාල කානුවක් දිගේ විදුලි බලාගාරයක් වෙත රැගෙන යාම නිසා වේල්ලේ සිට විදුලි බලාගාර දක්වා කිලෝ මීටර දෙකක හෝ තුනක පමණ දුරක් ගංගාවේ ජලය සිඳී ගොස් තිබිණි.

යළිත් විදුලි බලාගාරයෙන් පසු සුපුරුදු පරිදි ගඟ දිගේ ඇදෙන මහා ජල කඳ තවත් කිලෝමීටර දෙක තුනක් ගිය පසු වේල්ලක් බැඳ කොන්ක්‍රීට් කානුවක් දිගේ ගලා යෑමට සලස්වා ඇත. මාගල් ගඟේ පමණක් කුඩා ජල විදුලි බලාගාර පහකට වඩා ඉදි කර තිබිණි.

කුඩා ජලවිදුලි බලාගාර නිසා සිදු වන විශාලම පරිසර හානියක් ලෙස පරිසරවේදීන් ප්‍රකාශ කරන්නේ ශ්‍රී ලංකාවට ආවේනික මිරිදිය මත්ස්‍යයින් සහ ජලජ ජීවීන් වඳ වී යෑමේ තර්ජනයට මුහුණ දීමයි. ස්වභාවික ජල පහරක් හරස් කර වේලි බැඳ කානුවක් ඔස්සේ ජලය රැගෙන යෑමෙන් මිරිදිය මත්ස්‍යයන්ගේ සහ ජලජ ජීවීන්ගේ ජීවන රටාවට සෘජුවම බාධා පැමිණේ. උදාහරණයක් ලෙස තොල රතු වැලිගොව්වාගේ බෝවීම සිදුවන්නේ දියපහරේ දමන බිත්තර ගඟේ පහළට ගසාගෙන ගොස් කලපු ජලයේදී පැටවුන් බිහිවීමෙනි. එම පැටවුන් යළිත් මව් සතුන්ගේ වාසස්ථාන කරා ගංගාව දිගේ ඉහළට ගමන් කරයි. මෙවැනි කුඩා ජල විදුලි බලාගාර නිසා ඔවුන්ගේ ජීවන රටාවට හානි වී ඔවුන් වඳවී යෑමේ තර්ජනයකට මුහුණ දෙන බව පරිසරවේදීහු කියති.

කොන්ක්‍රීට් කානුවක් දිගේ ජලය රැගෙන යෑමෙන් ගංගාව දිගේ ගලා බසින ජලය අවම වීම නිසා ගඟ දෙපස ශාඛ විනාශ වීම සහ අවට තෙතමනය නැති වී ගොස් වියළි ස්වභාවයක් ඇති වීම සිදු වේ. අවට කෘෂි ආර්ථිකයට ද මෙය තදින්ම බලපායි. ජලය ගෙන යෑමට කොන්ක්‍රීට් කාණු ඉදිකිරීමට ගඟ දෙපස ස්වාරක්ෂිත කලාපය විනශ කිරීම සිදු වන නිසා එයින් ද පරිසරයට දැඩි බලපෑමක් එල්ල කරන බව පරිසරවේදීහු කියති. මේ අනුව පාරිසරික සමතුලිතතාව බිඳ වැටී ජන ජීවිතවලටද විවිධ ආකාරය බලපෑම් ඇති වන බව පරිසරවේදීහු පෙන්වා දෙති.

## විදුලි මාෆියාවට නොදෙවෙනි කුඩා ජලවිදුලි බලාගර මාෆියාව


ලංකාවේ ඇති විදුලි මාෆියාවේ එක් පැතිකඩක් 2018 ඔක්තෝබර 17 වැනි දා බදාදා ලංකාදීපයේ සත්‍ය ගවේෂණ විශේෂාංගයෙන් ඉදිරිපත් කළේය. කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘති අස්සේද එවැනි මාෆියාවක් ඇතැයි පරිසරවේදීන් පවසන අතර එය සත්‍ය බව තහවුරුවන කරුණු කිහිපයක් අප කළ සොයා බැලීමේදී ද අනාවරණය විය.

**මෙම ලිපියේ මීට පෙර සඳහන් කළ පරිදි කුඩා ජල විදුලි බලාගාර ඉදි කිරීමට පෙර පාරිසරික ඇගයීමක් සිදු කර මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික අනුමැතිය ලබා ගත යුතුය. නමුත් ඇතැම් කුඩා ජල විදුලි බලාගාර ඉදි කිරීමේ දී එවැනි අනුමැතියක් ලබා ගෙන ඇත්දැයි සැක හිතෙන ස්ථාන රාශියක් විය.**

ඇතැම් කුඩා ජල විදුලි බලාගාර ඉදි කර තිබුණේ පාරිසරික සංවේදීකම වැඩියෙන් ඇති කලාපවලය. අදාළ ගංගා ආශ්‍රිතව සිටිනා මතස්‍යයන් වර්ග සහ දුර්ලභ ශාඛ වර්ග ගැන විස්තර ඇතැම් කුඩා ජල විදුලිබලාගාර ඉදි කිරීම සඳහා කරන ලද පාරිසරික තක්සේරු වාර්තාවල ඇතුළත් නොවීය. පාරිසරික හානිය නොතකා දුන් අනුමැතියෙන් ඇතැම් ගංගා ආශ්‍රිතව කුඩා ජල විදුලි බලාගාර රැසක් ඉදිකර ඇත.

**කුඩා ජල විදුලි බලාගාර සම්බන්ධයෙන් පරස්පර තොරතුරු ලබාදීම සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම සඳහා වන කොමිෂන් සභාවේ පැවැති අභියාචනා විභාගයේ දී මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රකාශ කළේ මේ ආශ්‍රිත ඇතැම් තොරතුරු තමන් සතුව ලේඛන ගත කර නැති බවයි. තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභා නියෝගයේ ඒ ගැන මෙසේ සඳහන් කර තිබේ. මෙහි පොදු අධිකාරිය ලෙස සඳහන් කර ඇත්තේ මධ්‍යම පරිසර අධිකාරිය ගැනයි.**






http://www.ft.lk/

පොදු අධිකාරිය කරුණු දක්වමින් පවසා සිටියේ මෙවැනි කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘති සඳහා මධ්‍යම පරිසර අධිකාරිය පමණක් අනුමැතිය ලබා නොදෙන බවත් ඒ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ මහවැලි අධිකාරිය විසින්ද අනුමැතිය ලබා දුන් අවස්ථාද විය හැකි බවයි. තවද ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ව්‍යාපෘති ද මෙම ලැයිස්තුවේ අඩංගු නොවන බව පොදු අධිකාරිය පවසා සිටින ලදී. එම අවස්ථාවේ කොමිෂන් සභාව විමසා සිටින ලද්දේ මෙම අනුමැතිය මධ්‍යම පරිසර අධිකාරිය හා සමගාමීව ලබා දෙන අනුමැතියක් ද යන්නයි. පොදු අධිකාරිය එය එසේ බවට ප්‍රතිචාර දක්වා සිටිමුත් එවැනි ව්‍යාපෘතිවල ලැයිස්තුවක් පවත්වාගෙන නොමැති බව ප්‍රකාශ කර සිටින ලදි. කුඩා විදුලි බලාගාර මාෆියාවේ පැතිකඩ ගැන තේරුම් ගැනීමට මධ්‍යම පරිසර අධිකාරියේ මෙම නොහැකියාවම හොඳ උදාහරණයකි. මහජන උපයෝගීතා කොමිෂන් සභාව ප්‍රකාශ කළේ තමන් අනුමැතිය ලබා දෙන්නේ පාරිසරික අනුමැතිය ලබා දීමෙන් පසුව නිසා පරිසර අධිකාරියේ ප්‍රකාශය පිළිගත නොහැකි බවයි.

## පරස්පර වාර්තා

මෙම ලිපියට මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසර දී ඇති කුඩා ජල විදුලි බලාගාර ලැයිස්තුව අවශ්‍ය වූ අතර ඒ දිනවල එම අධිකාරියෙන් විමසීමේදී එම ලැයිස්තුව ලබා දිය නොහැකි බව පරිසර අධිකාරිය ප්‍රකාශ කළේය.

**2017 පෙබරවාරි මස 03 වැනි දා සිට තොරතුරු පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2017 පෙබරවාරි මස 17 වැනි දා මධ්‍යම පරිසර අධිකාරියට තොරතුරු ඉල්ලීමක් යොමු කරමින් 2010 සිට 2017 දක්වා කාලයේ අවසර දී ඇති කුඩා ජල විදුලි බලාගාර ලැයිස්තුව ඉල්ලීමක් කළෙමු. ඊට ප්‍රතිචාර ලෙස 2016 සිට 2017 දක්වා අවසර දුන් කුඩා ජල විදුලි බලාගාර ලැයිස්තුව යන ශීර්ෂයෙන් 131ක ලැයිස්තුවක් මධ්‍යම පරිසර අධිකාරිය ලබා දුන්නේය.**

එම ලැයිස්තුව ලැබුණු පසු මේ ආශ්‍රිත තවත් තොරතුරු ඉල්ලමින් විදුලිබල අමාත්‍යංශය, ලංකා විදුලිබල මණ්ඩලය, සුණිත්‍ය බලශක්ති අධිකාරිය සහ මහජන උපයෝගීතා කොමිෂන් සභාව යන ආයතනවලට තොරතුරු ඉල්ලුම්පත් යොමු කළෙමු.

ඒවායේ තොරතුරු ලැබුණු පසු යළිත් වරක් **2018 ජනවාරි 22** වැනි දා මධ්‍යම පරිසර අධිකාරියට තොරතුරු ඉල්ලීමක් යොමු කරමින් **2015 ජනවාරි පළමු වැනි දා** සිට **2018 ජනවාරි දක්වා** අවසර දුන් කුඩා ජල විදුලි බලාගාර ලැයිස්තුව ඉල්ලා සිටියෙමු. ඊට පිළිතුරු ලෙස තොරතුරු නිලධාරියා **මීට පෙර දුන් 131ක ලැයිස්තුවම** යළිත් වරක් දුන් අතර එහි ශීර්ෂය පමණක් වෙනස් කර තිබිණි. ඔහු විසින් ඉල්ලා ඇති තොරතුරු 2017.03.09 දිනැති ලිපිය මඟින් දැනටමත් ලබා දී ඇති අතර එහි පිටපතක් මේ සමඟ ඉදිරිපත් කරමි. යනුවෙන් **මධ්‍යම පරිසර අධිකාරි පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශයේ වැඩ බලන අධ්‍යක්ෂවරයා** සඳහන් කර තිබිණි.

මෙම පරස්පරතා සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාවට අභියාචනයක් යොමු කළ අතර **2018 දෙසැම්බර හතර වැනි දා** සිට එහි විභාගය ආරම්භ විය. ඒ අතරතුර යළිත් වරක් මධ්‍යම පරිසර අධිකාරියටම තොරතුරු ඉල්ලීමක් යොමු කරමින් **2019 ජනවාරි තෙක්** ඉදි කර ඇති සියලුම කුඩා ජල විදුලිබලාගාර ලැයිස්තුව ඉල්ලා සිටියෙමු. අවස්ථා තුනක දී පරිසර අධිකාරිය ලබා දුන් තොරතුරු එකිනෙකට පරස්පර විය. පරිසර අධිකාරිය සියලු අවස්ථාවල දුන් තොරතුරු විශ්ලේෂණය කර පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.

එරත්න කුඩා ජල විදුලි ව්‍යාපෘතිය



en.wikipedia.org

**2016 සිට 2017 වසර දක්වා** අනුමැතිය ලබා දුන් කුඩා ජල **විදුලි බලාගාර** ගණන මුල් තොරතුරු ඉල්ලීමට අදාළව **131කි.** තුන් වැනි තොරතුරු ඉල්ලීමට අදාළව **09කි. 2010 සිට 2018 දක්වා** කාලයේ අනුමැතිය ලබා දුන් කුඩා ජල **විදුලි බලාගාර** ගණන මුල් තොරතුරු ඉල්ලීමට අදාළව **131කි.** තුන් වැනි තොරතුරු ඉල්ලීමට අදාළව **115කි. 2019 ජනවාරි 01 දක්වා** අනුමැතිය දී ඇති මුළු **කුඩා ජල විදුලි බලාගාර** ගණන **තුන් වැනි ඉල්ලීමට** අනුව **240කි.** එම ඉල්ලීමෙන් පසු කොමිසමේ නියෝගය පරිදි අවසන් වරට දුන් තොරතුරු අනුව **256කි.** මධ්‍යම පරිසර අධිකාරිය විටින් විට මෙවැනි පරස්පර තොරතුරු ලබාදීමෙන් පෙනී යන්නේ මේ සම්බන්ධ නිශ්චිත තොරතුරු වාර්තා තබා ගැනීමක් එම අධිකාරිය සිදු නොකර ඇති බව හෝ සිතා මතා සංඛ්‍යාලේඛන සඟවන බවකි.

මේ සම්බන්ධයෙන් සුනිත්‍ය බලශක්ති අධිකාරියට යොමු කළ තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් ඔවුන් දැනුම් දුන්නේ 2018 **වසරේ අගෝස්තු පළමු වැනි දා වන තෙක් විදුලි ජනනය ආරම්භ වූ කුඩා ජල විදුලි බලාගාර 188ක් ඇති බවයි.** තවත් කුඩා ජල විදුලි **බලාගාර 80කට අනුමැතිය** දී ඇති මුත් මෙතෙක් වැඩ නිම කර නැතැයි එහි සඳහන් වෙයි. ඒ අනුව සුනිත්‍ය බලශක්ති අධිකාරිය **අවසර දුන් කුඩා ජල විදුලි බලාගාර ගණන 268කි.** මධ්‍යම පරිසර අධිකාරියේ තොරතුරු හා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ තොරතුරු අතර පරස්පරයක් පවතී.

පසුගිය අප්‍රේල් මස පළමු වැනි දා රත්නපුර දී ජනමාධ්‍යවේදීන් අමතමින් සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පුනර්ජනන බලශක්ති අධ්‍යක්ෂවරයා කුඩා ජල විදුලි බලාගාර ගැන තොරතුරු ගණනාවක් අනාවරණය කළේය. ඔහු ප්‍රකාශ කළේ **කුඩා ජල විදුලි බලාගාර** ඉදි කිරීම සඳහා අයදුම්පත් **3,500ක්** පමණ ලැබී ඇති නමුත් **2015** වසරෙන් පසු කිසිදු කුඩා පරිමාන ජල විදුලි බලාගාරයකට අවසර දී නැති බවයි. අධ්‍යක්ෂවරයා ජනමාධ්‍යවලට අදහස් දක්වමින් එසේ ප්‍රකාශ කළ ද තොරතුරු පනත යටතේ සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලබා ගත් තොරතුරුවල සඳහන් වන්නේ **2015 ජනවාරි පළමු වැනි දා** සිට **2018 ජනවාරි පළමු වැනි දා** තෙක් **කුඩා ජල විදුලි බලාගාර 26කට** අනුමැතිය ලබා දී ඇති බවයි. ඒවා ඉදිකර ඇත්තේ කුමන ගංගාවක් ආශ්‍රිතවද යන වගද සුනිත්‍ය බලශක්ති අධිකාරිය තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලබා දී තිබේ. ඒ අනුව අධ්‍යක්ෂවරයා මාධ්‍යයට කර ඇත්තේ අසත්‍ය ප්‍රකාශයකි.

ලංකා විදුලිබල මණ්ඩලය තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලබා දුන් තොරතුරු වලට අනුව **2018 අගෝස්තු පළමු වැනි දා** තෙක් ලංකා විදුලිබල මණ්ඩලයෙන් **අනුමැතිය ලබා දුන් කුඩා ජල විදුලි බලාගාර ගණන 190කි.** එමෙන්ම ගිවිසුම් අත්සන් කළත් **අනුමැතිය ලබා නුදුන් කුඩා ජල විදුලි බලාගාර ගණන 67කි.** ඒ අනුව **එකතුව 257කි.**

මහජන උපයෝගීතා කොමිෂන් සභාවෙන් තොරතුරු පනත අනුව ලබා දුන් තොරතුරුවලට අනුව එම කොමිසමෙන් **2010**

**සිට 2019 දක්වා** ජනන බලපත්‍රය ලබා දී ඇති **කුඩා ජල විදුලි බලාගාර ගණන 209කි.**

## "විකල්ප බලශක්ති කරා යායුතුයි"

පරිසරවේදී **ආචාර්ය රවීන්ද්‍ර කාරියවසම්**

**"කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිවෙන්නේ ලංකාවේ ගඟක්, දියඇල්ලක් වගේ ජල මූලාශ්‍රයක් ආශ්‍රිතව. බොහෝ වෙලාවට මේවා වෙන්නේ පරිසර නීතියවත් තැකීමට ලක් නොකර.  දැන් අලුත් ප්‍රවණතාවය තමයි බටහිර රටවල් කුඩා ජල විදුලි බලාගාර අයින් කරගෙන යනවා. ඔවුන් මේ වෙනකොට හඳුනාගන්නේ සුළං බලශක්තිය, සූර්ය බලශක්තිය වගේ ප්‍රභවයන්. ඒවගේ වටපිටාවක තමයි ලංකාවේ කුඩා ජල විදුලි බලාගාර ඉදි කරන්නේ.**

**කුඩා ජලවිදුලි බලාගාර ඉදිකිරීම නිසා ලංකාවේ ඉන්න මත්ස්‍ය විශේෂ විනාශ වෙන්න ඉඩ තිබෙනවා. මොකද ඔවුන්ගේ හැසිරීම් රටාවලට බලපෑම් වෙනවා. බුලත් හපයා, තල් කොස්සා වගේ මාළු විශේෂ ගණනාවක් ලංකාවේ ඉන්නවා. වෙන රටවල මේවා ඉදිකරද්දි මාළු ඉනිමං කියලා දමනවා. වතුර පාර හරවලයි ටර්බයින් එක කරකවන්න කානුවකින් යවන්නේ. ඒක දිගේ යන මාළුන්ට නැවත එන්න විදියක් නෑ. වෙන රටවල්වල ආයෙත් එන්න මාළු ඉනිමං දමනවා. මේවගේ අවම දේවල්වත් බලන්නේ නැතිව තමයි ලංකාවේ කුඩා ජලවිදුලි බලාගාර ඉදිකරන්නේ.**

**මේවා ඉදිකිරීමෙන් ජල පෝෂිත විශාල වශයෙන් විනාශ වෙනවා. අපේ රටට හොඳට ඉර එළිය එනවා. සූර්ය පැනල වහළවල්වල සවි කරලා විදුලිය ජනනය කර ගැනීමේ හැකියාව තිබෙනවා. ඒවා නිවාසවල භාවිතයට අරගෙන අතිරික්තය ප්‍රධාන පද්ධතියට එකතු කරන ක්‍රමයක් අපි හදාගත්තොත් ලංකාවේ බලශක්ති අර්බුදය විසඳගන්න පුළුවන්."**

**තරිඳු ජයවර්ධන**

ලංකාදීප





*http://www.gazzan.net/*

හම්බන්තොට සුචී පාසලේ ඉදිරිපස දර්ශනයක්

# සුචී පාසලේ විදුහල්පතිනියගේ මරණයට අධ්‍යාපන බලධාරීනුත් වගකිව යුතුයි

අධ්‍යාපන අමාත්‍යංශයෙන් ජාතික පාසල් විදුහල්පතිවරුන් සඳහා සංවිධානය කළ ස්වයං හා ආයතනික විනය සහ නායකත්වය පිළිබඳ පුහුණු වැඩමුළුව සඳහා ආයතනයක් තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාදාමයේ සිට සියලු කටයුතු නිසි ලෙස ඉටුවී නැතැයි අධ්‍යාපන අමාත්‍යංශයේ විමර්ශන ශාඛාවෙන් කළ පරීක්ෂණයක දී අනාවරණය වී තිබේ.

හම්බන්තොට සුචී ජාතික පාසලේ විදුහල්පතිනිය ඇද වැටී මරණයට පත්වූයේ මෙම පුහුණු වැඩමුළුව අතරතුරදීය. විදුහල්පතිනියගේ මරණය හදිසි අනතුරක් වුවද  එම පුහුණුව සැලසුම් කිරීමේ සිට මිල ගණන් කැඳවීම, ආයතන තෝරා ගැනීම සහ එම පුහුණුව සංවිධානය කිරීමේදී අදාළ නිලධාරීන්ගේ නොසැලිකිලිමත්කම,

නොදැනුවත්කම සහ වගකීම් විරහිත බව ආදී කරුණු එම විදුහල්පතිවරියගේ මියයෑමට වක්‍රාකාරව බලපා ඇති බව ද විමර්ශන කණ්ඩායම නිගමනය කර තිබේ.

විදුහල්පතිවරිය මියයෑම සම්බන්ධයෙන් විමර්ශනයක් කර අදාළ නිලධාරීන්ට එරෙහිව කටයුතු කළ බවට මීට පෙර අධ්‍යාපන අමාත්‍යංශය ප්‍රකාශ කළ ද විමර්ශනයේ වාර්තාව නිකුත් කර නොතිබිණි. ඒ සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාවේ පැවැති අභියාචන විභාගයකින් පසු එම එම වාර්තාව නිකුත් කිරීමට අධ්‍යාපන අමාත්‍යංශය කටයුතු කළේය.

එම වාර්තාවට අනුව ජාතික පාසල් විදුහල්පතිවරුන් සඳහා පැවැත්වූ නායකත්ව වැඩමුළුවේ සෑම කටයුත්තක්ම පාහේ සිදුවී ඇත්තේ නිසි ක්‍රමවේදයට අනුව නොවේ. පුහුණුව ලබාදීම සඳ0හා ආයතනය තෝරා ගෙන ඇති ක්‍රමවේදයද ගැටලු සහගත බව එම විමර්ශන වාර්තාවේ සඳහන් වේ.

**තරිඳු ජයවර්ධන**
ලංකාදීප





*mapio.net*

ඉසුරුපායේ ඉදිරිපස දර්ශනයක්

# ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂවරයා බඳවාගෙන ඇත්තේ සම්මත ක්‍රමවේදයෙන් බැහැරවයි

අධ්‍යාපන අමාත්‍යංශයේ ශාරීරික අධ්‍යාපන සංවර්ධන හා පුහුණු අධ්‍යක්ෂ තනතුර සඳහා කර්නල් මංජුල කාරියවසම් මහතා බඳවා ගත්තේ සම්මුඛ පරීක්ෂණ සම්බන්ධයෙන් ගැසට්පත්‍රයේ පළ කිරීමෙන් හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කිරීමකින් තොරව බව තොරතුරු දැන ගැනීමේ පනත යටතේ කළ විමසීමකදී අනාවරණය වෙයි. එම තනතුර සඳහා සුදුස්සකු තෝරා පත් කර ගැනීමට අදාළ දැන්වීම ආයතන පහක දැන්වීම් පුවරුවල පමණක් ප්‍රදර්ශනය කිරීමට අධ්‍යාපන අමාත්‍යංශය කටයුතු කළ බව ද, අදාළ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ඇත්තේ කර්නල් මජුල කාරියවසම් මහතා සහ

කේ. ඩබ්ලිව්. මිහාල් සෝමවර්ධන නම් දෙදෙනකු පමණක් බව ද  අධ්‍යාපන අමාත්‍යංශය සඳහන් කරයි.

අධ්‍යාපන අමාත්‍යංශය මේ බව සඳහන් කළේ තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාවේ පැවැති අභියාචනා විභාගයකදීය. අධ්‍යාපන අමාත්‍යංශයේ අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන සංවර්ධන හා පුහුණු) තනතුර සඳහා නිලධාරියකු තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යංශයෙන් ඉල්ලූ තොරතුරු ලබා නොදීම ගැන එම අභියාචනා විභාගය පැවැත්විණි.

එම තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රමවේදය ගැන අධ්‍යාපන අමාත්‍යංශයෙන් සකස් කරන ලද ක්‍රමවේදය **2017 ජුනි 22 වැනි දා** රාජ්‍ය සේවා කොමිෂන් සභාවට එවා ඇති අතර **2017 ජූලි 03 වැනි දා** රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් එය අනුමත කර යළිත් අමාත්‍යංශයට යවා තිබේ. එහි සඳහන් වන්නේ රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීමෙන් හෝ වෙබ් අඩවියේ පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවිය යුතු බවයි.   නමුත් අධ්‍යාපන අමාත්‍යංශය අයදුම් පත් කැඳවා ඇත්තේ අදාළ දැන්වීම ආයතන පහක දැන්වීම් පුවරුවල පළ කිරීමෙන් පමණක් බව තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාවේදී හෙළිදරව් විය.

මෙම තනතුර සඳහා අයදුම්පත් කැඳවීමට අදාළ දැන්වීම් තම ආයතනයේ දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කරන ලෙස **2017 ජූලි 21 වැනි දා** අධ්‍යාපන අමාත්‍යංශයේ අතිරේක ලේකම්වරයකුගේ (පාලන හා මුදල්) අත්සනින් ඉල්ලීමක් කර ඇත්තේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන්, ජනකලා කේන්ද්‍රයේ අධ්‍යක්ෂගෙන්, කඩුවෙල ප්‍රාදේශීය ලේකම්ගෙන්, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම්ගෙන් සහ අධ්‍යාපන අමාත්‍යංශයේ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) යන ආයතන ප්‍රධානීන්ගෙන්ය. තනතුරට දැනට බඳවා ගෙන සිටින පුද්ගලයා මෙම ආයතන එකක්වත් නියෝජනය නොකරන බව ගුරු සංගම් පවසයි.

අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන සංවර්ධන හා පුහුණු) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා කාලය වසර තුනකි.

**තරිඳු ජයවර්ධන**
ලංකාදීප




toyota.com.bh


colombogazette.com

# චක්‍රලේඛ උල්ලංඝනය කරමින් ඇමැති රිෂාඩ්ට
# වැඩිපුර වාහන 7ක්

ජනාධිපති ලේකම්වරයාගේ චක්‍රලේඛ අනුව ඇමැතිවරයකුගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කළ යුතු උපරිම වාහන ගණන තුනක් වුවද කර්මාන්ත හා වාණිජ අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතාට එම චක්‍රලේඛ උල්ලංඝනය කරමින් වැඩිපුර වාහන හතක් ලබා දී ඇතැයි අනාවරණය වේ.

මේ බව අනාවරණය වනුයේ තොරතුරු දැන ගැනීමේ පනත අනුව කර්මාන්ත හා වාණිජ අමාත්‍යංශයෙන්  ලබා ගත් තොරතුරුවලිනි. **කර්මාන්ත හා වාණිජ අමාත්‍යංශයට ජූලි 11 වැනි දින** තොරතුරු ඉල්ලීමක් යොමු කරමින් එම අමාත්‍යංශයේ වාහන පරිහරණය කිරීම සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලා සිටි අතර එහි අතිරේක ලේකම් (පාලන) ටී. ඩී. පී. එස්. පෙරේරා මහතාගේ අත්සනින් එම තොරතුරු මුදා හැර තිබේ.

ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබූ අංක **සීඒ/1/17/1** සහ **2010.05.14 දින දරන රාජ්‍ය විදයම් කළමනාකරණ චක්‍රලේඛයේ** අංක තුන ඡේදයේ ප්‍රතිපාදන අනුව අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කළ හැකි උපරිම නිල

වාහන සංඛ්‍යාව තුනකි. **අංක සීඑස්ඒ/1/5 හා 2016.04.19 දිනැති චක්‍රලේඛය අනුව** එම වාහන සංඛ්‍යාව එලෙසින්ම රාජ්‍ය අමාත්‍යවරුන්ට ද වලංගු බව දන්වා තිබේ.

එසේ තිබියදී කර්මාන්ත හා වාණිජ අමාත්‍යංශයෙන් කර්මාන්ත හා වාණිජ අමාත්‍යවරයාට ලබා දී ඇති **වාහන ගණන 10ක් බව තොරතුරු දැන ගැනීමේ පනතින්** ලබා ගත් තොරතුරුවලින් අනාවරණය වේ. කර්මාන්ත හා වාණිජ අමාත්‍යවරයාට ලබා දී ඇති රියදුරන් ගණන අට දෙනෙකි.

කර්මාන්ත හා වාණිජ අමාත්‍යංශ සංචිතයේ **වාහන 23ක්** ඇති අතර තවත් **වාහන 16ක්** අමාත්‍යංශයේ නිලධාරීන්ට වෙන් කර තිබේ. නිලධාරීන් භාවිත කරන වාහනවලින් දෙකක් මෙහෙයුම් කල්බදු ක්‍රමයට පරිහරණය කරනු ලබන වාහන වේ.

එම අමාත්‍යංශයේ සංචිතයේ ඇති **වාහනවලින් 9ක් සඳහා** රියදුරන් නොමැති අතර නිල වාහන හිමි නිලධාරීන්ට **වෙන් කළ වාහන 16න් දෙකක්** සඳහා යොදාගෙන ඇත්තේ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් රියදුරන් වේ. අමාත්‍යවරයාට අනියුක්ත කළ **වාහන දෙකක්** සඳහා යොදවා ඇති රියදුරන් සහ **ප්‍රාදේශීය රියදුරන් අට දෙනකු ද සමඟ අමාත්‍යංශ රියදුරන් සංඛ්‍යාව 28ක් වේ.**

අමාත්‍යවරයාට ලබා දී ඇති වාහන අතර සී.ඒ.වී, සී.ඒ.ඊ, පීඑෆ්, පී.එච්, කේ.වයි සහ කේ.ජී යන ඉංග්‍රීසි අකුරුවලින් පටන් ගන්නා වහන ද වේ.

රාජ්‍ය විදයම් කළමනාකරණ චක්‍රලේඛය අනුව අමාත්‍යවරයකුගේ නිල වාහනයක් සඳහා ඉන්ධන දීමනාව පහත වගුවේ දැක්වේ.

| | බස්නාහිර පළාතෙන් පිටත | බස්නාහිර පළාත තුළ |
|---|---|---|
| පෙට්‍රල් වාහන එකක් සඳහා | ලීටර් 750 | ලීටර් 600 |
| ඩීසල් වාහන එකක් සඳහා | ලීටර් 600 | ලීටර් 500 |

2015, 2016 සහ 2017 වසරවලදී කර්මාන්ත හා වාණිජ අමාත්‍යංශයේ වාහන සඳහා තෙල් වියදම සහ නඩත්තු වියදම පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | ඉන්ධන වියදම | නඩත්තු වියදම |
|---|---|---|
| 2015 | 25,184,335 | 36,555,039 |
| 2016 | 17,143,901 | 33,861,171 |
| 2017 | 16,723,187 | 37,841,376 |

මේ සම්බන්ධයෙන් විමසීමට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා සම්බන්ධ කර ගැනීට උත්සාහ කළද එය අසාර්ථක විය. අමාත්‍යංශ ලේකම් කේ. ඩී. එන්. ආර්. අසෝක මහතාගෙන් මේ ගැන විමසීමේදී ඔහු කීවේ ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ පාලන අතිරේක ලේකම් බැවින් ඔහුට කතා කරන ලෙසයි.  කෙසේ වෙතත් මෙම තොරතුරු මුදා හැර ඇත්තේ අතිරේක ලේකම් පරිපාලන ටී. ඩී. පී. එස්. පෙරේරා මහතාගේ අත්සනිනි.

**තරිඳු ජයවර්ධන**
ලංකාදීප






මාර්ගය ඉදිරිකිරීම සම්බන්ධයෙන් වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නිරීක්ෂණ චාරිකාවක

# සිංහරාජය හරහා ඉදිවන මාර්ගය

ආණ්ඩු මාරුවත් සමඟ පසුගිය ආණ්ඩු කාලයේ සිදුවීයැයි කියන ඇතැම් දූෂණ වංචා ගැන විමර්ශන ආරම්භ කර තිබේ. මිනිසාට පමණක් නොව සතා සීපාවටද බලපාන පාරිසරික අපරාධ ගැන තවමත් කිසිම විමර්ශනයක් ආරම්භ වී නැත. නකල්ස් ඉඩම් බදු දීමට පිඹුරුපත් සැකසීම, පාරිසරික බලපෑම් ඇගයීමක් සිදු නොකර මහා පරිමාණ ව්‍යාපෘති ආරම්භ කිරීම ආදී සිද්ධි කිහිපයක් සම්බන්ධයෙන් එම කාලවකවානුවේ 'සත්‍ය ගවේෂණ' විශේෂාංගයෙන් කරුණු අනාවරණය කළේය. මෙවර සත්‍ය ගවේෂණ විශේෂාංග යෙන් ඉදිරිපත් කරනුයේද ගිය ආණ්ඩුව සමයේ පිඹුරුපත් සකසා තවමත් කරගෙන එන එවැනිම පාරිසරික 'අපරාධයක්' ගැනයි.

ලෝකයේ වැසි වනාන්තර ඇත්තේ ඉතා සීමිත ප්‍රමාණයකි. වැසි වනාන්තරවල විශේෂත්වය නිතර එම වනාන්තරවලට වැසි

ලැබීම පමණක්ම නොවේ. ලෝකවට වර්ෂාව ඇති කිරීමට බෙහෙවින්ම දායක වන්නේ වැසි වනාන්තරයි. පසුගිය වර්ෂයේ ගිනි ගැනීම් සහ වන විනාශය නිසා ලෝකයේ 40%ක් වැසි වනාන්තර විනාශයට පත් වූ බව අන්තර්ජාතික වාර්තාවල සඳහන් වෙයි.

ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධානම වැසි වනාන්තර සිංහරාජ ලෝක උරුමයයි. ආයතන කිහිපයක වුවමනාවට ලෝක උරුම සිංහරාජය දෙබෑ කරගෙන මාර්ගයක් කැපීමෙන් ඇති විය හැකි මහා පාරිසරික හානිය ගැන ඇතැම් පරිසරවේදීන් හඬ නඟද්දී පැවැති රජය සහ බලධාරීන් එය ප්‍රතික්ෂේප කළේය. ඒ සම්බන්ධයෙන් වසරක් තිස්සේ තොරතුරු පනතින් තොරතුරු එක් රැස් කරීමෙන් පසු පෙනී ගියේ පසුගිය රජයේ සහ බලධාරීන්ගේ කතා සම්පූර්ණයෙන්ම අසත්‍ය බවයි. මෙවර සත්‍ය ගවේෂණය ඒ ගැනයි.

ශ්‍රී ලංකාවේ ඇති විශාලතම ප්‍රාථමික වනාන්තර ලෙස සැලකෙන සිංහරාජයේ මහාපරිමාණයෙන් ගස් කැපීම සිදුවූයේ **1971-1972** වකවානුවේය. එය සිදුවූයේ 'නිල' ආකාරයටය. ඒ තුනීලෑලි සංස්ථාවට අවශ්‍ය දැව ලබා ගැනීම සඳහාය. මහ වනය මැද බිම හෙලන ගස් කඳන් රැගෙන යෑම සඳහා මාර්ගයක්ද ඉදිකෙරිණි. එය තාර හෝ කොන්ක්‍රීට් හෝ ඇතිරූ මාර්ගයක් නොවේ. කෙසේ වෙතත් **1978 වසරේදී සිංහරාජය ජෛවගෝල රක්ෂිතයක් ලෙස යුනෙස්කෝවෙන් ප්‍රකාශයට** පත් කළ අතර පසුව එවකට පැවැති මායිම් මත පදනම්ව **1989 වසරේදී සිංහරාජය ලෝක උරුම වන භූමියක්** ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබීය. **ඊට හෙක්ටයාර 8,864ක් අයත් විය.** ඊට අමතරව ජාතික උරුම භූමි පනත යටතේ **හෙක්ටයාර 11,187ක් සහිතව සිංහරාජය ජාතික උරුම වන භූමියක් ලෙසද 1989 වසරේදී ප්‍රකාශයට පත් කැරිණි.**

තුනී ලෑලි සංස්ථාවවට දැව හෙළීම මෙන්ම ඒ දැව රැගෙන යෑමට මාර්ගයක් සැකසීමද සිදු වූයේ සිංහරාජය ලෝක උරුමයක් පමණක් නොව ජාතික උරුම වන භූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට පෙරය. ඉන් අනතුරුව කාලයත් සමඟ අදාළ මාර්ගයේ ගස් වැඩෙමින් වැසී යමින් තිබුණු පසුබිමක **2004 වසරේ දී මීටර හතරක් පළලට පාලමක් සහ බෝක්කු සහිතව මාර්ගයක් සකස් කරනු ලැබීය.** බලධාරීන් කීවේ එසේ ඉදි කරනුයේ දෙස් විදෙස් සංචාරකයන්ගේ පහසුව සඳහා  බවයි. දෙස් විදෙස් සංචාරකයන්ට ලංකාවේ නැරඹීමට බොහෝ තැන් තිබිය දී ලෝක උරුමයක් වූ සහ ලංකාවේ විශාලතම වැසි වනාන්තරයක් වූ සිංහරාජය සංචාරක පාරාදීසයක් කිරීමෙන් ඇතිවන තත්ත්වය ගැන බලධාරීන් අවධානය යොමු කළේ නැත.

## පිඹුරුපත් සැකසීම

**සිංහරාජයට ප්‍රවේශ වීමට දෙස් විදෙස් සංචාරකයන්ට අවස්ථාව ලබාදීමේ ප්‍රතිඵලයක් ලෙස අපේ රටට ආවේනික මෙන්ම සිංහරාජයටම විශේෂ වූ ඇතැම් ශාඛ හා සත්ව ජාන වෙනත් රටවලට හොරෙන් රැගෙන යෑමේ ජාවාරමුන්ටද පාර කැපිණි. එනම් අන්තර්ජාතික වශයෙන් කරන ජාන මංකොල්ලයේ එක් කේන්ද්‍රස්ථානයක් බවට අපේ රට පත් විය. සිංහරාජයෙන් කොල්ලකෑ ඇතැම් ජාන ප්‍රවර්ධනය කර මිල අධික**





*www.tripadvisor.com*

**නිශ්පාදන සකස් කර ඒවායේ පේටන්ට් අයිතිය ඇතැම් විදේශීය රටවල් හිමි කර ගනිද්දී අපේ රටේ බලධාරීහු සුපුරුදු පරිදි මුණිවත රැකගෙන සිටියහ.**

අවස්ථා කිහිපයකදී සිංහරාජයේ මායිම් පුළුල් කරද්දී එවකට පැවැති පිවිසුම් මාර්ගය ද ලෝක උරුම සිංහරාජයට සහ එහි පරිවාර වනාන්තරයන්ට අයත් විය.

එසේ තිබිය දී යළිත් වරක් **ප්‍රශ්නය මතුවූයේ 2018 වසරේ දී ය.** ඒ ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක වන **පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය මගින් සිංහරාජය උදෙසා රුපියල් කෝටි 6.4ක පමණ ප්‍රතිපාදන වෙන් කිරීමත් සමඟය.** සිංහරාජය විනාශ කරමින් මාර්ග යක් ඉදිකිරීමට යන බව කියමින් ඇතැම් පරිසර සංවිධාන විරෝධය දක්වද්දී පසුගිය රජයේ දේශපාලනඥයන් සහ නිලධාරීන් කීවේ එම මුදලින් සිංහරාජයේ කලින් පැවැති පිවිසුම් මාර්ගය පිළිසකර කිරීම පමණක් සිදු කරන බවයි. එය සාධාරණීකරණය කිරීමට වන සංරක්ෂක දෙපාර්තමේන්තුව යොමු කළ ලිපියක මෙසේ සඳහන් වෙයි.

ඉන් පසු (2004 සිට) මේ දක්වා ගත වූ කාලය පුරා අධික වැසි සහිත කාලයන්හිදී නිරන්තර සෝදා පාළුවට හා නායයෑම්වලට ලක්වූ මෙම පිවිසුම් මාර්ගය භාවිතයට ඉතා අසීරු තත්ත්වයට පත් විය. මෙම තත්ත්වය මත සිංහහරාජ ලෝක උරුම වන භූමිය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්, පාසල් සිසුන් ඇතුළු සියලු පිරිස් ඉතා අසීරු හා අවදානම් තත්ත්වයන් යටතේ මෙම පිවිසුම් මාර්ගය භාවිත කරන ලදී. මෙම අසීරුතාවයන්, අවදානම් තත්ත්වයන්, නිරන්තර සෝදාපාළුවට

හා නායයෑම් නිසා සිදුවන පරිසර හානීන් සියල්ල වැළැක්වීමේ අරමුණින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ඇත. මෙහිදී පවත්නා මාර්ගයේ පළල වැඩි කිරීමක් සිදු නොකරන අතර නැවත පිළිසකර කර ගල් අතුරා (ඉන්ටර් ලොක්) නායයෑම් සිදුවිය හැකි ස්ථානවල එය වැළැක්වීම සඳහා ගල් බැම් යෙදීම සිදු කරනු ලබයි. ඒ අනුව මෙම මාර්ගය පිළිසකර කිරීමේ දී සිදු කරනුයේ අඩි 10ට වැඩි පළලකින් පැවැති මාර්ගය නැවත පිළිසකර කිරීම පමණි. මෙහිදී කිසිසේත්ම මාර්ගයේ පැවැති පළල වැඩි කිරීමක් සිදු නොකෙරේ. මෙම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී පරිසර ආරක්ෂිත ක්‍රමෝපායන් ඇතුළු මාර්ගෝපදේශ අනුගමනය කරන අතර මේ සඳහා ගත යුතු අවම යන්ත්‍ර සූත්‍ර පමණක් යොදා ගැනෙන අතර කිසිදු අමතර ගස් හෙළීමක් ද සිදු කරනු නොලබයි. ඒ අනුව පරිසර සංවිධාන විසින් සිදු කරන ලබන අඩි පාරක් විශාල මාර්ගයක් බවට පුළුල් කිරීම යන චෝදනාව සාවද්‍ය චෝදනාවක් බව සනාථ වේ.

## යුනෙස්කෝ හා ලෝක බැංකුවට පැමිණිලි

**ඉහත ඡේදය උපුටා ගත්තේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන සංරක්ෂක ජනරාල් වෙනුවට පරිසර සංරක්ෂණ හා කළමනාකරණ අංශයේ වන රක්ෂක මහින්ද සෙනෙවිරත්න මහතා 2019 ජනවාරි මස හතර වැනි දා FD/EC&M/Escamp/MISC අංකයෙන් මහවැලි සංවර්ධන අමාත්‍යංශය වෙත යොමු කළ ලිපියකිනි. එම ලිපිය යොමු කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සිදු වූයේ සිංහරාජ වනාන්තරයේ පිවිසුම් මාර්ගය ඉදි කිරීම සම්බන්ධයෙන් සොබාදහම් අධ්‍යයන මධ්‍යස්ථානය යුනෙස්කෝ සංවිධානයට සහ ලෝක බැංකුවට යොමු කළ පැමිණිල්ලක් අනුවය.**

සිංහරාජය මාර්ගයේ වැඩ ආරම්භ වීමත් සමඟ **පරිසර හා සොබාදහම් අධ්‍යයන මධ්‍යස්ථානයේ ජාතික සම්බන්ධීකාරක ආචාර්ය රවීන්ද්‍ර කාරියවසම් මහතා 2018 දෙසැම්බර් මස 26 වැනි දා යුනෙස්කෝවට ලිපියක් යවමින් පැමිණිලි කරන්නේ ලෝක උරුමය වනසමින් නීත්‍යනුකූල නොවන මාර්ගයක් ඉදි කරන බවයි.** මෙම නීති විරෝධී මාර්ගයට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන ලෝක උරුමය ආරක්ෂා කර දෙන ලෙස සොබා දහම් අධ්‍යයන මධ්‍යස්ථානය මෙම පැමිණිල්ලීමක් ඉල්ලීමක් කළේය. **ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාවේ ලේකම් ජනරාල් ප්‍රේමලාල් රත්නවීර මහතා 2018 දෙසැම්බර් 28 වැනි දා එම පැමිණිල්ල මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශයේ ලේකම් අනුර දිසානායක මහතාට යොමු කරමින්** අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුම් දුන්නේය. පරිසර හා සොබාදහම් අධ්‍යයන මධ්‍යස්ථානයට අමතරව ඇක්ට් ඉන් ශ්‍රී ලංකා සංවිධානය, ජාතික පාරිසරික පදනම, සිංහරාජ සුමිතුරෝ සංවිධානය සහ සිංහරාජය උදෙසා ජන පවුර සංවිධානය ඇතුළු පාරිසරික සංවිධාන රැසක් මෙම නීති විරෝධී මාර්ගය ඉදි නොකරන ලෙස ඉල්ලා සිටියේය.

**යුනෙස්කෝවේ ලිපිය අනුව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් කැඳවූ අතර පෙර සඳහන් කළ ඡේදයද සහිත වාර්තාවක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශයට යොමු කළේය. ඒ අනුව 2019 ජනවාරි 21 වැනි දා එම අමාත්‍යංශය ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාවේ ලේකම් ජනරාල් වෙත ලිපියක් යවමින් මාර්ගය පුළුල් නොකරන බව දැනුම් දුන්නේය.**



*ejatlas.org*

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් පැමිණිලි ගලා එන්නට පටන් ගත් අතර පරිසර සංවිධානවලින් දිගින් දිගටම චෝදනා එන්නට පටන් ගත්තේය. පැමිණිලි විභාග කරනවා වෙනුවට බලධාරීන් සිදු කළේ තවත් මුදල් නාස්ති කරමින් ජනමාධ්‍යවේදීන් පිරිසක් සිංහරාජ කුඩව කඳවුරු භූමියට කැඳවාගෙන ගොස් ඔවුන්ගේ පැත්තෙන් දැනුම්වත් කිරීම පමණි. මෙම අවස්ථාවට එවකට පරිසර රාජ්‍ය ඇමැතිවරයා ද සහභාගී වූ බව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලිපිලේඛන පරීක්ෂා කරද්දී පෙනී යයි. මීට අමතරව පරිසර සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් කැඳවා 2019 මැයි 13 වැනි දා සාකච්ඡාවක් පැවැත්වීය.

බලධාරීන්ගේ හෙළුව එළියට ආවේ මෙම ක්‍රියාදාමය ආශ්‍රිත ලිපි ලේඛන තොරතුරු පනත යටතේ ලබා ගැනීමෙන් පසුවය.

පරිසර සංවිධාන මෙම මාර්ගය ගැන චෝදනා නගන්නට පටන් ගත්තේ 2018 ඔක්තෝබර සිටය. එසේ තිබිය දී මාර්ගයේ වැඩ කටයුතු සඳහා **2018 නොවැම්බර් 23 වැනි දා** අත්තිකාරම් මුදලක් ලබා දීමට වන සංරක්ණ දෙපාර්තමේන්තුව කටයුතු කර තිබිණි. **අත්තිකාරම් මුදල රුපියල් එක් කෝටි**



*www.rapidadventures.lk*

**අට ලක්ෂ හැත්තෑ හතර දහස් පන්සිය අනූ පහකි. (රුපියල් 10,874,595.00) විජේසේකර කන්ස්ට්‍රක්ෂන්** පුද්ගලික සමාගම නම් සමාගමකට මෙම මුදල ගෙවීමට ලියැවිලි සකස් කර ඇත්තේ **2018 නොවැම්බර් 12 වැනි දා** වන අතර චෙක්පතින් ගෙවීම අනුමත කර ඇත්තේ **2018 නොවැම්බර් 23** වැනි දා ය. අත්තිකාරම මුළු මුදලින් සියයට 30කි. **කොන්ත්‍රාත් සමාගමට ගෙවීමට සැලසුම් කර ඇති මුළු මුදල රුපියල් තුන් කෝටි හැට දෙලක්ෂ හතළිස් අට දහස් හයසිය පනහකි. (36,248,650.00)** (අත්තිකාරම් මුදල ගෙවූ 53/11 වව්චරයේ පිටපත මෙහි ඇත.)

## මුදල් ගෙවීමට පෙර ඇස්තමේන්තුව අනුමත කිරීම

**මුදල් ගෙවීමට පෙර** මෙම ව්‍යාපෘතියේ වියදම් ඇස්තමේන්තුව **අනුමත කර තිබේ. සබරගමුව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් මෙම වියදම් ඇස්තමේන්තුව අනුමත කර ඇත්තේ 2018 මාර්තු හත් වැනි දා ය.** කිලෝමීටර **1.45ක් දිගින් යුතුව** සිංහරාජ වනාන්තරයේ පිවිසුම් මාර්ගයක් ඉදිකිරීම සහ පිවිසුම් මඟක් අලුත් වැඩියා කිරීම යන හිසින් එම වියදම් ඇස්තමේන්තුව සකස් කර තිබේ. **මාර්ගයේ අවශ්‍ය ඉදිකිරීම් සහ ප්‍රවේශමාර්ගවල පිළිසකර කිරීම් මෙන්ම අනිකුත් වියදම්ද සමඟ ඇස්තමේන්තුව පන් කෝටි විසි එක් ලක්ෂ අනූ නව දහසකි. (52,199,000.00)**

දැනට ඇති ගස් කොළන් නොකපා තියන ආකාරයටම මාර්ගය අලුත්වැඩියා කිරීම පමණක් සිදු කරනා බවට වූ බලධාරීන්ගේ ප්‍රකාශවල සළුපට ගැළවී යනුයේ ව්‍යාපෘතියේ ප්‍රමාණ බිල්පත් (බිල් ඔෆ් කොන්ටිටි) ලේඛන පරීක්ෂා කරද්දීය. සිංහරාජ වනාන්තර පිවිසුමේ සේවා මාර්ගය ඉදි කිරීමේ වියදම් ඇස්තමේන්තුවේ දෙවැනි අයිතමයේ පළමු උප අයිතමයේ වියදම විස්තර කර ඇත්තේ මෙසේය.

- විශාල වශයෙන් වැඩුණු ශාඛ මුලින් උගුල්ලමින් හෝ කපා දමා පසුව මුලින් උගුල්ලමින් හෝ මහා කැළය සුද්ධ කිරීම
- එනම් ගස් කොළන් නොකපන බවට බලධාරීන් පුන පුන සඳහන් කරනුයේ විශාල ගස් කපා මුලින්ම උගුල්ලා දැමීමට පිඹුරුපත් සකස් කර තිබියදීය.
- එපමණක් නොව කානු, පැති බැම් සහ බෝක්කු ඉදිකිරීම මෙන්ම වාහන නවතන ස්ථානයක් අලුත්වැඩියා කිරීම ඇතුළු සියලු අලුත්වැඩියා සහ ඉදිකිරීම් සඳහා අවශ්‍ය ආකාරයට මැෂින් ආධාරයෙන් මාර්ගය කැපීම සහ මට්ටම් කිරීමද, පිපිරුම් මගින් ගල් ඉවත් කිරීමටද, කොන්ක්‍රීට් කිරීම ආදී තවත් රැසකට මුදල් වෙන් කර තිබේ.

## පරිසරවේදීන්ගේ මතය

මේ ආකාරයට සිදුකිරීම මගින් පරිසරයට වන හානිය ගැන පරිසරවේදී ආචාර්ය රවීන්ද්‍ර කාරියවසම් මහතා පැහැදිලි කළේ මෙසේය.

"සිංහරාජ ලෝක උරුමයට පමණක්ම ආවේනික සත්ත්ව හා ශාඛ විශේෂ ගණනාවක් තිබෙනවා. ඒ කියන්නේ ඒවා ලෝකයේ විතරක් නෙමෙයි. අපේ රටෙත් වෙන කොහෙන්වත් වාර්තා වෙලා නෑ. ඒවා තිබෙන්නේ සිංහරාජයේ පමණයි. මේ වනාන්තරය තියන ස්වරූපයෙන් කෘත්‍රිමව යම් යම් වෙනස් කිරීම්වලට ලක් කරද්දී ඒ කියන්නේ පාරවල් කපද්දි, කොන්ක්‍රීට් කරද්දි, පුපුරවද්දි සත්ව විශේෂ සහ ශාඛ විශේෂ විනාශ වෙනවා.

ඒවගේම සංචාරක කර්මාන්තය දියුණු කරන්න කියලා සිංහරාජයට සංචාරකයන්ට යන්න පහසු වෙන්න ඉදිකරන මේ මාර්ගය අන්තිමට නතර කරන්නේ සිංහරාජයේ අනිත් කෙළවරටම මාර්ග කැපීමෙන්. අද කිලෝමීටර දෙකක් හදයි. වරින් වර මේ දිග එන්න එන්නම වැඩි වෙයි. අන්තිමට සිංහරාජය දෙබෑ කරනවා. සිංහරාජය වගේ වැසි වනාන්තර රැක ගන්නවා වෙනුවට බලධාරීන් එය විනාශ කරන්න පිඹුරුපත් සකසමින් ඉන්නවා. සිංහරාජය ඇතුළට සංචාරකයන් ගෙන්වා ගන්න අවශ්‍ය නෑ. සිංහරාජයට යන සංචාරකයන් නිසා ලංකාවේ ජාන මංකොල්ලය වර්ධනය වෙලා තියෙනවා. මේ හදන්නේ අපේ සම්පත් අපිට නැති කරන්නයි. මේ සම්බන්ධයෙන් අපි යුනෙස්කෝවට පැමිණිලි කළා. බලධාරීන් යුනෙස්කෝවටත් බොරු කියලා තිබ්බා. අපි ඒ ප්‍රදේශයට ගිය වෙලාවේ දැක්කා කරන විනාශය. අපි ඡායාරූප සහිතව සවිත්සරාත්මකව යුනෙස්කෝවට සහ ලෝක බැංකුවට මේ විනාශය ගැන ඉදිරිපත් කරලා තියෙනවා. මේ සතියේ ලෝක බැංකුවෙන් අපේ පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්ෂා කරන්න සිංහරාජයට යනවා කියා අපට දැනුම් දීලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා මේ විනාශයේ සියලුම පිඹුරුපත් ඔවුන්ට ඉදිරිපත් කරන්න. විනාශය නතර කළේ නැතිනම් අපි අධිකරණයට යන්නත් බලාපොරොත්තු වෙනවා."

සිංහරාජය සුරැකීමේ ජන පවුර නමින් සංවිධානයක් පිහිටුවා ගත් පරිසරවේදීන් පිරිසක් පසුගිය කාලය පුරාවටම මෙම මාර්ගය ඉදි කිරීම නතර කරන ලෙස ඉල්ලමින් බලපෑම් කළේය. එම සංවිධානයේ කැඳවුම්කරු චමින්ද

ජයසූර්ය මහතා පැවසුවේ මේ ආකාරයට සිංහරාජය වැනසීමේ අවසන් ප්‍රතිඵලය වන්නේ ජනතාවට හුස්ම ගැනීමට අවශ්‍ය ඔක්සිජන් කොළඹ කඩවලින් මිලදී ගන්නා තත්ත්වයක් ඇතිකිරීම විය හැකි බවයි.

සිංහරාජයේ මාර්ගය ඉදි කරන තැන්වලට අපිත් ගියා. මේ සම්බන්ධයෙන් සංවිධානවලට එන්න කියලා මීට සති කිහිපයකට කලින් සාකච්ඡාවක් තිබ්බා. එතනදි බලධාරීන් පිළිගත්තා ඔවුන්ගේ සැලැස්ම වැරදියි කියලා. සැලැස්ම වැරදියි කියලා විරෝධතා නිසා ඒක පොඩ්ඩක් වෙනස් කරලා ආයෙත් මේක පටං ගන්නවා නම් අපි ඊට විරුද්ධයි. දැනට කපලා තියන කොටස පරිසර හානිය අවම වෙන විදියට සංරක්ෂණය කළ යුතුයි. මේ විදියට වරින් වර සිංහරාජය විනාශ කිරීමේ අවසන් ප්‍රතිඵලය තවත් අවුරුදු දහයක් යද්දි මිනිස්සුන්ට හුස්ම ගන්න ඕනා ඔක්ෂිජන් කොළඹ කඩවලින් මිලදී ගන්නා තැනට පත්වීම වෙන්න පුළුවන්. ඒ නිසා මේ විනාශය කඩිනමින් නැවැත්විය යුතුයි.

ලංකාවේ සිදුවන වංචා දූෂණ ආදී අපරාධ සියල්ලම පරයා ඉදිරියෙන් තිබෙනුයේ පාරිසරික අපරාධය. මන්නාරමේ වනාන්තර විනාශ කර ජනතාව පදිංචි කිරීම සිදු විය. වව්නියාවේ වනාන්තර විනාශ කර බෝගස්වැව ඇතුළු ගම්මාන පහක් ඉදි කර ජනතාව පදිංචි කිරීම සිදු විය. රට වටා තවත් වනාන්තර රැසක් විවිධ අරමුණුවලින් විනාශ කර අවසන්ය. ඒවාට එරෙහිව නීතිය ක්‍රියාත්මක වූයේද නැත. පසුගිය ආණ්ඩු කාලයේ නකල්ස් ලෝක උරුමයේ ඉඩම් බදු දීමට සකසා තිබූ පිඹුරුපත් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූයේ ජනමාධ්‍ය සහ පරිසර සංවිධාන ඒ ගැන පෙන්වාදෙමින් කළ බලපෑම් හමුවේය. ඉන් පසු අත ගැසුවේ සිංහරාජයටය. තවමත් එය නතර කර නැත. පාරිසරික අපරාධවලට එරෙහිව ජාති ආගම් බේදයකින් තොරව විරෝධය පළ කළ යුත්තේ මේවා වානාශ වුවහොත් සියලුම ජනවර්ගවල සියලු ජාතිකයන්ට ජීවත්වීමට රටක් ඉතුරු නොවන හෙයිනි.

**බිඟුන් මේනක**
**තරිඳු ජයවර්ධන**

ලංකාදීප






*srilankamirror.com*

# බන්ධනාගාර අමාත්‍යාංශයේ දේශපාලන හෙංචයියන්ගේ හොල්මන්

බන්ධනාගාර නියාමක සම්මුඛ පරීක්ෂණයේදී අක්‍රමිකතා සිදුව ඇති බව කියමින් අවසාන මොහොතේ පත්වීම් ලබාදීම අවලංගු කිරිමන් රටේම අවධානය ගැනීමට බන්ධනාගාර හා පුනරුථාපන ඇමති ස්වාමිනාදන් මහතා කටයුතු කළේ **2016 නොවැම්බරයේ** ය. ඇමතිවරයා එහි දී කියා සිටියේ බන්ධනාගාර නියාමක පත්වීම් අත්හිටුවා ඇති බව හා නියාමක **පුරප්පාඩු 350** සඳහා නැවතක සම්මුඛ පරීක්ණයක් පවත්වන බවයි. පත්වීම් අත්හිටුවීමට හේතුව ලෙස ඔහු දැක්වූයේ පත්වීම් ලබාදීමේදී අල්ලස් ගැනීම් හා වෙනත් අක්‍රමිකතා සිදුව ඇති බවට තමාට කරුණු වාර්තා වීමයි. ඒ වන විට මාධ්‍ය මගින් ඇමතිවරයාද චෝදනාවලට ලක්ව සිටියේය. ඒ නියාමක ලැයිස්තුවට **ඇමතිගේ නම් 150ක් ඇතුළත්** දේශපාලන ලැයිස්තුවක්ද එක්ව ඇති බවටය. ඒ චෝදනාව ගැන කරුණු දැක්වූ ඇමතිවරයා ලැයිස්තුවේ කතාව මුළුමණින් ම ප්‍රතික්ෂේප කළේ නැත. ඔහු කීවේ එම ලැයිස්තුවේ ඇතුළත්ව ඇත්තේ පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ ඉල්ලීම් යැයි කියාය. තවද

මේ සිදුවීම සමග අමාත්‍යාංශ ලේකම්වරයාටද තනතුරු අහිමිව තිබිණ. ලේකම්වරයා ඉවත් කිරීමට එම හේතුවද බලපෑ බව කී ස්වාමිනාදන් ඇමතිවරයා දෙවැනි සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ **6000ට** නැවතත් සම්මුඛ පරීක්ෂණයක් ලබා දී පත්වීම් දෙන බව කීවේය. බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඇති දේශපාලනික මුහුණුවර ගැන කරුණු අනාවරණය කිරීමට **2017 ජුනි 5 වැනි දා** පළ වූ සත්‍ය ගවේෂණ ලිපිය මගින් ලියුම්කරුවෝ කටයුතු කළහ.

## විමර්ශන මණ්ඩලයක්

කෙසේ වෙතත් ඇමැතිවරයාගේ මාධ්‍ය හමුවෙන් පසුව ඔහුගේම නියමයෙන් සිදුවීම ගැන සෙවීමට විමර්ශන මණ්ඩලයක් ද, පත්කෙරුණි. පුනරුථාපන කොමසාරිස් ජනරාල් මේජර් ජනරාල් ආර්.එම්.ජේ.ඒ. රත්නායක මහතාගේ සභාපතිත්වයෙන් යුතුව පත් කෙරුණු විමර්ශන මණ්ඩලයේ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ජේ. එම්. ඒ. ඩග්ලස්, බන්ධනාග ාර ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම් ධම්මිකා වික්‍රමසිංහ හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ නීති නිලධාරී මේජර් නීතිඥ ඩී.පී.පී.කේ. හෙයියන්තුඩුවගේ යන මහත්ම මහත්මීහු සෙසු සාමාජිකයෝ වූහ. **තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ කළ අයැදුමක් මගින් අදාළ වාර්තාව ලබාගැනීමට ලියුම්කරුවන් කටයුතු කළේ ඇමැතිවරයාගේ සැකය තහවුරු වීද යන්නත් වින්දිතයන්ට සාධාරණයක් ඉටු වීද යන්නත් දැනගැනීමටය.** තොරතුරු දැනගැනීමේ අයිතිය මූලික අයිතියක් වුවත් බන්ධනාගාර අමාත්‍යාංශයට එය අදාළ නොවන ආකාරය ගැන අත්දැකීම් ලැබීමට එහිදී අපට හැකි විය. ඒ ගැන මෙහි විස්තර නොකරන්නේ ලිපිය දීර්ඝ වන බැවිනි. විමර්ශන වාර්තාවෙන් අනාවරණය කෙරෙන පරිදි මේ සිදුවීම තනිකරම පරිපාලන අර්බුදයකි. ඊට අනුව **බන්ධනාගාර මූලස්ථානයේ අතිශය ආරක්ෂිතව පැවැතිය යුතු ලිපිගොනු 45ක් අතුරුදහන්ව තිබේ.** සැබැවින්ම කමිටු වාර්තාව කියවන්නෙකුට පුදුම සිතෙන්නේ ලිපිගොනු නැතිවීම ගැන නොවේ. බන්ධනාගාර මූලස්ථානය මේ තත්ත්වයෙන් හෝ මෙතෙක් කල් පැවැතීම ගැනය.

බඳවාගැනීමේ බලධරයා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාය. ඒ වන විට බන්ධනාගාර දෙපාර්තමේන්තුවට **බන්ධනාගාර නියාමකයන් 1098ක්** හා **නියාමකවරියන් 164ක්** ලෙස **පුරප්පාඩු 1262ක්** තිබුණේය. **2015 දී 500ක්, 2016 දී 350ක්** සහ **ඉතිරි පිරිස 2017 දී** බඳවා ගැනීම දෙපාර්තමේන්තුවේ අරමුණ විය. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවද ඊට අනුමැතිය දී තිබුණි. කෙසේ වෙතත් **2016** බඳවා ගැනීමේදී ඇමතිවරයා අනුමැතිය දී තිබුණේ පසුව බව කමිටු වාර්තාවේ සඳහන් වේ. **2016 අගෝස්තු 05 වැනි දා** බන්ධනාගාර නියාමකයන් **305ක් සහ නියාමකවරයන් 45 ක් බඳවා ගැනීමට** අදාළ ගැසට් පත්‍රය පළ කෙරිණි. ඒ අනුව දිවයිනේ පිහිටි සියලු බන්ධනාගාර වෙත **අයැදුම් පත් 20758ක්** ලැබී තිබූ අතර **බන්ධනාගාර නියාමකයන් 305ක්** සහ **නියාමකවරියන් 45ක්** බඳවා ගැනීමට අදාළව මූලික පරීක්ෂණ **2016.10.19 වැනි දින** හා **2016.10.27 වැනි දින** අතර කාලයේදී බන්ධනාගාර මගින් ප්‍රාදේශීයව පැවැත්වීය.






www.alamy.com

එහෙත් මූලික පරීක්ෂණවලට අදාළව මූලික පරීක්ෂණ මණ්ඩල සභාපතිවරුන් හා සාමාජිකයන් සඳහා බන්ධනාගාර මූලස්ථානය මගින් විධිමත්ව පත්වීමේ ලිපි නිකුත් කිරීමක් සිදු කර නොමැත. කෙසේ වෙතත් උපදෙස් ලැබුණේ මූලික පරීක්ෂණය අවසානයේදී ඒ ඒ දිනවල පරීක්ෂණ පැවැත් වූ ප්‍රාදේශීය බන්ධනාගාර මගින් අවසාන සම්මුඛ පරීක්ෂණය සඳහා අවම සුදුසුකම් ලැබූ අයැදුම්කරුවන්ගේ නාම ලේඛනයක් බන්ධනාගාර මූලස්ථානය වෙත විද්‍යුත් තැපෑල මගින් ලබා දෙන ලෙසය. එහෙත් නිසි පරිදි එකී ලැයිස්තු බන්ධනාගාර මූලස්ථානය වෙත ලැබුණා ද යන්න හා නිසි සුදුසුකම් ලැබූ තැනැත්තන් සියලු දෙනාගේම නම් මූලස්ථානය වෙත ලැබුණේද යන්න සනාථ කරගැනීමට නිසි ක්‍රමවේදයක් බන්ධනාගාර මූලස්ථානය වෙතින් අනුගමනය කර නැත.

මඩකලපුව බන්ධනාගාරය වෙතින් **2016 ඔක්තෝබර් 23** වැනි දින පවත්වන ලද මූලික පරීක්ෂණයෙන් අවසන් පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ සියලුම අපේක්ෂකයන්ට අවසාන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපි නිකුත් කිරීම විෂයභාර ලිපිකාරිනිය අතින් මගහැර තිබුණේ මේ නිසාය. එවැන්නක් සිදුව ඇති බව දැනගත්තේද එම අපේක්ෂකයන් බන්ධනාගාර මූලස්ථානයෙන් හා අමාත්‍යංශයෙන් විමසූ පසුය.

මඩකලපුව බන්ධනාගාරය වෙතින් පැවැත්වූ මූලික පරීක්ෂණයේ ප්‍රතිඵල ලේඛන ස්කෑන් කර විද්‍යුත් තැපෑල මගින් බන්ධනාගාර මූලස්ථානය වෙත යොමු කර තිබුණ ද එම ලැයිස්තුවේ ඇතුළත් සුදුසුකම් ලැබූ අයැදුම්කරුවන්ගේ නම් බන්ධනාගාර මූලස්ථානයේ පරිගණකය වෙත ඇතුළත් කිරීම මගහැරී ඇත. අඩුම තරමින් විද්‍යුත් තැපෑල මගින් ලැබුණු ලකුණු ලැයිස්තු

හා මුල් ලේඛන බන්ධනාගාර මුලස්ථානය වෙත ගෙන්වා ගෙන සසඳා බලා සනාථ කරගත්තේ නම් නිවැරැදිව අවසාන සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට හැකියාව තිබිණි. දිවයින තුළ ඕනෑම ස්ථානයක පවත්වන ලද පරීක්ෂණයක ප්‍රතිපල එක් දිනක් තුළ බන්ධනාගාර මුලස්ථානය වෙත ගෙන්වාගැනීමේ හැකියාවක් පවතින බව විමර්ශන කමිටුවද පවසයි. එහෙත් එවැන්නක් සිදුව නැත.

## පරිගණකයට ලකුණු වරදී

මාතර හා තංගල්ල බන්ධනාගාරය මගින් එක් අයෙකු බැගින්ද මහනුවර බන්ධනාගාරය මගින් **6 දෙනෙකු** සඳහා සුදුසුකම් ලබාගෙන තිබුණත් මුල් අවස්ථාවේදී අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා තිබුණේ නැත. එම අපේක්ෂකයන් බන්ධනාගාර මුලස්ථානයෙන් හා අමාත්‍යංශයෙන් විමසන තෙක් එලෙස මගහැර තිබූ බවවත් ඔවුන් දැන සිටියේ නැත. ඊට හේතුවද මූලික පරීක්ෂණ පැවැත් වූ මණ්ඩල විධිමත් ආකාරයෙන් කටයුතු නොකිරීමය. අවසාන සම්මුඛ පරීක්ෂණ බන්ධනාගර මුලස්ථානයේදී **පරීක්ෂණ මණ්ඩල 18ක්** මගින් **2016 නොවැම්බර් මස 03, 04, 08, 10 හා 11 දිනවල** පවත්වන ලද අතර පසුව **නොවැම්බර් 12 වැනි දිනද** සම්මුඛ පරීක්ෂණ මණ්ඩල දෙකක් පවත්වා තිබිණ. සමාන ලකුණු ලබාගැනීමේ හේතුව මත පිරිමි අයැදුම්කරුවන් **287ක්** සහ **අයැදුම්කාරිනියන් 38ක්** පමණක් බන්ධනාගාර නියාමක තනතුරට බඳවාගැනීම සඳහා තෝරාගෙන ගිවිසුම් අත්සන් කිරීම සඳහා කැඳවීමේ ලිපි නිකුත් කර තිබිණ. එහෙත් ඇතැම් අයැදුම්කරුවන්ට ලබා දී තිබූ ලකුණු නිවැරැදි නොවූ අතර කොටින්ම කිවහොත් ලකුණු එකතුව පවා වැරැදිය. එකී අයැදුම්කරුවන්ට අදාළව අවසාන තෝරාගැනීම සඳහා ලකුණු ඇතුළත් කිරීමේදී පරිගණකයට ගියේ එම වැරැදි ලකුණුය.

## නිලධාරීන්ගේ වැඩ පියන්ට බාර දීම

දෙපාර්තමේන්තුවේ තරම කියාපාන තවත් ලේඛනයක් නම් අවසාන සම්මුඛ පරීක්ෂණයේ ලකුණු අඩංගු උපලේඛනය පාලන අංශයේ වගකිව යුතු නිලධාරියෙකු විසින් භාරගනු නොලැබූ ඒවා කිසිදු නිලධාරියකුගේ භාරයේ නොමැතිව පරිපාලන නිලධාරි 11(වැ.බ) ගේ මේසය මත අතැර තිබුණේ කිසිදු වගකීමක් නැතිවය. ඒ අනුව විධිමත් ලෙස සම්පූර්ණ කටයුතු අවසන් වන තෙක් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ එක් ස්ථානයක දී පරිගණක ගත කිරීම් සිදුව නැත. එහි ප්‍රතිඵලය වූයේ අවසාන තෝරාගැනීම සඳහා පරිගණක ගත කරන ලද ලකුණුවල විශ්වසනීයත්වය තහවුරු කළ නොහැකි වීමය. අවසාන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලකුණු පරිගණක ගත කිරීමට සම්බන්ධ වූ එක් තැනැත්තෙකු වූයේ නම් ජේ. කේ. ඒ. ආර්. කුමාර නමැත්තා ය. ඒ අන් කවරෙකුවත් නොව එවකට බන්ධනාගාර අධිකාරි (පාලන) තනතුර දැරූ ප්‍රධානියකුගේ කාර්යාලයේ කාර්ය කාර්ය සහායකයාය.

මෙම ක්‍රියාවලියේ වඩා වැදගත්ම මෙන්ම භයානකම කරුණ හෙළිදරව් වන්නේ මින් පසුය. අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගෙන බඳවාගැනීම සඳහා ලිපි යොමු කර තිබූ අපේක්ෂකයන් 45 දෙනෙකුගේ අවසාන සම්මුඛ පරීශණය පවත්වන අවස්ථාවේ දී ලකුණු ලබා දුන් සහතිකවල, සහතික කරන ලද ඡායා පිටපත් අඩංගු ලිපි ගොනු අතුරුදන් වීමය. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා මේ බව විමර්ශන මණ්ඩලයට ලිඛිතවම දන්වා ඇත. සිරකරුවකු තාප්පයකින් පනින්නා සේ





groundviews.org

ලිපි ගොනුවලට පැන යා නොහැකිය. ඒවාට සිදු වූ දෙයක් තිබිය යුතුය.

'ඔහු පවසන පරදි බන්ධනාගාර මූලස්ථානයේ ඒවා නොමැති නම් ඒවා අස්ථානගත වී ඇති නම් තත්ත්වය සරල නොවේ. මන්දයත් බන්ධනාගාර මුලස්ථානය වනාහි පෙට්ටි කඩයක් නොවන බැවිනි. විමර්ශන මණ්ඩලය සිය නිරීක්ෂණ ඉදිරිපත් කරමින් වැදගත් කරුණු ගණනාවක්ම හෙළිදරව් කර තිබේ. ඒ බන්ධනාගාර මුලස්ථානයේ පරිපාලනය ගැනය. බන්ධනාගාර මුලස්ථානයේ රාජකාරියේ නියුතු පරිපාලන නිලධාරීහු විෂය ලිපිකරුවෝ හා කළමනාකරණ සහකාරවරු ඉතා දීර්ඝ කාලයක් තිස්සේ එකම ස්ථානයේ තනතුරු හොබවමින් සිටිති.

'ඔවුන් සිය ඉහළ නිලධාරීන් සමග මනා සම්බන්ධතාවයෙන් යුතුව රාජකාරිවල නොයෙදෙන බව හා නිලධාරීන්ගේ නිසි උපදෙස් ලබා නොගෙන තමන්ට අභිමත පරිදි කටයුතු කරන බව විමරශන මණ්ඩලය අවධාරණය කරන්නේ නිකරුණේ නොවේ. ප්‍රධාන පරිපාලන නිලධාරි සී. එන්. අමරවික්‍රම මහතා හා පරිපාලන නිලධාරි 11(වැ.බ) පී.ඩබ්ලිව්.යූ. අමරප්‍රේම මහතා විමර්ශන මණ්ඩලය හමුවේ දුන් සාක්ෂි මත හා සාක්ෂි දෙන අවස්ථාවේදී හා අදාළ ලිපිගොනු විමර්ශන මණ්ඩලය භාරයට ගැනීම සඳහා විමර්ශන මණ්ඩලය බන්ධනාගාර මුලස්ථානයට ගිය අවස්ථාවේදී දුටු නිරීක්ෂණවලිනි. එකී තැනැත්තන් තම රාජකාරිමය කටයුතු පිළිබඳ නිසි වගකීමකින් කටයුතු නොකරන බව ඔවුන්ගේ හැසිරීම හා ක්‍රියා කලාපය අනුවම පැහැදිලි වූ බව ඔවුහු පවසති. බන්ධනාගාර මුලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතර ඇති අසමගිය හොඳින්ම පෙන්නුම් කළ අවස්ථාවක් හැටියට මෙම සිදුවීම් දාමය දැක්විය හැකිය.

**මෙය බන්ධනාගාර මූලස්ථානයේ රාජකාරී කටයුතුවලට දැඩි බාධාවකි. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා වන එච්.එම්.එම්.සී. ධනසිංහ මහතා වෙත ආසන්නම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වන මෙම විමර්ශනයට අදාළ කාලය තුළ බන්ධනාගාර කොමසාරිස් (පාලන) තනතුරු දැරූ එම්.වී ගුණවර්ධන මහතා සහ බන්ධනාගාර අධිකාරී (පාලන) තනතුර දැරූ ඊ. ආර්. ළමාහේවගේ මහතා යන අය අතර නිසි සහයෝගයක් සබඳතාවයක් තිබී නැත. බඳවාගැනීමේ කටයුතු බන්ධනාගාර කොමසාරිස් තම සෘජු පාලනය යටතේ කර ඇත්තේ මේ නිසාය. බන්ධනාගාර නියාමකයන් හා නියාමකවරයන් බඳවාගැනීමේ ක්‍රියාවලිය පියවරෙන් පියවර අධීක්ෂණය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් නොතිබූ අතර පාලන අංශයේ බන්ධනාගාර කොමසාරිස් (පාලන), බන්ධනාගාර අධිකාරී (පාලන) ඇතුළු කාර්ය මණ්ඩලය අතර මනා සම්බන්ධතාවයක් ද තිබී නැත.**

'සමස්ත බඳවාගැනීමේ ක්‍රියාවලියේදී එකී කාර්ය නිසි ලෙස සැලසුම් කිරීම *(Planning)* නිසි පරිදි ක්‍රියාත්මක කිරීම *(Implementation)*, නිසි පරිදි කියාත්මකවන්නේ ද *(Monitoring)* යන්න සොයාබැලීම හා ක්‍රියාත්මක කරන ලද කාර්ය පිළිබඳ ඇගයීම *(Evalution)* සිදු කර නොමැති බව ද එම වාර්තාවේ සඳහන් වේ. එසේ නම් අපට අසන්නට තිබෙන්නේ බන්ධනාගාර මූලස්ථානයෙන් කර ඇත්තේ කුමක්ද කියාය. අනෙක් අතට විමර්ශකයන් පවසන්නේ ඇමැතිවරයා මාධ්‍ය හමුවක් පවත්වා පැවසූ පරිදි බඳවාගැනීමේ ක්‍රියාවලියේදී මුදල්, වෙනත් සන්තෝසම් හා අල්ලස් ලබාගත්තාද යන්න පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වී නැති බවකි.

## නිගමන හා නිර්දේශ

- විමර්ශන මණ්ඩලය පවසන පරිදි දැන් බන්ධනාගාර මූලස්ථානයට හෝඩියේ සිට වැඩ පටන්ගන්නට සිදුව ඇත. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා බන්ධනාගාර මූලස්ථානයේ පාලන අංශයේ සියලු නිලධාරීන්/ ලිපිකරුවන්/ කළමනාකරණ සේවය ඇතුළු රාජකාරී කරන සියලු තැනැත්තන් වෙත එකී තැනැත්තන්ගේ රාජකාරී හා වගකීම්වලට අදාළ ලබිත රාජකාරී ලැයිස්තු නැවත භාර දිය යුතු බව මණ්ඩලය නිර්දේශ කර ඇත. තව ද එම තැනැත්තන් සිය රාජකාරී හා වගකීම් ගැන දැනුවත් බවට හා ඒ අනුව කටයුතු කරන බවට ලිඛිත ප්‍රකාශ ද ලබා ගත යුතුය.

- නිලධාරීන්ගේ අක්‍රමිකතා නිසා සිදුවුණේ සියලු සම්මුඛ පරීක්ෂණ හා ඊට අදාළ බඳවාගැනීම් අවලංගු කිරීමට විමර්ශන මණ්ඩලය නිරිදේශ කිරීමය. බන්ධනාගාර කොමසාරිස් පත්වීමේ බලධරයා හැටියට එම නිර්දේශ ක්‍රියාත්මත කළ අතර සුදුස්සන් නැවත තේරීමක් සිදුවුණේ ඒ අනුවය.

- බඳවාගැනීම් කල්යෑම නිසා වයස් සීමා ඉක්මවන තැනැත්තන්ගේ වයස ප්‍රශ්නයක් නොකරගන්නැයි විමරශන මණ්ඩලය උපදෙස් දුන්නද ජීවිතයේ වටිනාම අවධිය වන තරුණ කාලයෙන් වසරකට වඩා උදුරාගැනීම ගැන රජයට මිදෙන්නට බැරිය. අනෙක් අතට **2017**ට අදාළ බඳවාගැනීම් පමා කරන්නට නිරිදේශ නිකුත් කරන්නට සිදුවුණේද **2016** අක්‍රමිකතා නිසාය. නැවත අමාත්‍යාංශ අනුමැතිය ලබාගෙන බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා **2016** වර්ෂයට අදාළව බන්ධනාගාර නියාමකයන් නියාමකවරයන් බඳවාගැනීමේ පරක්ෂණ මණ්ඩල විධිමත් ලෙස නැවත පත්කිරීමට හා බඳවාගැනීමේ ක්‍රියාවලිය විධිමත්ව කිරීමට කටයුතු කළ ද ඊට සැලකිය යුතු කාලයක් ගත විය. රාජ්‍ය සේවකයන් එක තැන අටුවන් බැසීම නිසා හටගන්නා අවකළමනාකරණයත් අකාර්යක්ෂමතාවයත් ගැන ඉහළින්ම කතාවෙන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේය. නිරන්තරයෙන් ගුරුවරුන් ඉලක්ක කරගත්ත ද රාජ්‍ය සේවයේ බොහෝ ක්ෂේත්‍රවලට මෙය පොදු තත්ත්වයකි.

- මෙම වාර්තාව ඊට කදිම සාක්ෂියකි. බන්ධනාගාර මූලස්ථානයේ පරිපාලන නිලධාරීන්, ලිපිකරුවන්, කළමනාකරණ සහකාරවරුන්, කාර්යාල කාර්ය සහායකයින් දීර්ඝ කාලයක් එම ස්ථානයේ තනතුරු හෙබවීම එකී ස්ථානයේ මනා පාලනයට අහිතකර ලෙස බල පා ඇති බව විමර්ශකයෝ පවසති. ඔවුන් නිර්දේශ කර ඇත්තේ එවැනි තැනැත්තන් පියවර දෙකකින් බන්ධනාගාර මූලස්ථාන රාජකාරිවලින් මුදාහැර අදාළ ආයතන සමඟ සම්බන්ධතාවයෙන් යුතුව වෙනත් සුදුසු තැනැත්තන් එකී තනතුරුවලට පත් කිරීමට පියවර ගත යුතු බවය. බන්ධනාගාර මූලස්ථානයේ හා අනෙකුත් බන්ධනාගාරවල පාලනය හා එහි පවතින අඩුපාඩු පිළිබඳව සොයාබැලීමේ වැඩපිළිවෙළක් *(Admin Inspection)* අමාත්‍යවරයාගේ අනුමැතිය මත කියාත්මක කිරීමද, තවත් නිර්දේශයකි.

- ලිපිගොනු අතුරුදන්වීම සම්බන්ධයෙන් විමර්ශන මණ්ඩලයේ නිර්දේශ සෑහීමකට පත්විය හැකි නොවේ. ලිපිගොනු අතුරුදහන්වීම ගැන වගකිවයුත්තන් හැටියට විමර්ශකයන් නම් කර ඇත්තේ කවුද යන්න මුලින් විමසා බැලිය යුතුය. එහිදී සම්මුඛ පරීක්ෂණ පවත්වා මාස දෙකකට වඩා අඩු කාලයකදී **ලිපිගොනු 45ක් අස්ථාන ගතවීම නිසා** බන්ධනාගාර නියාමක තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා, තෝරාගැනීමේ කියාවලිය නිසි පරදි සැලසුම් සහගතව ආරක්ෂාකාරීව හා සංවිධානාත්මකව පැවැත්වීමට අපොහොසත්වීම සම්බන්ධයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ එම්.එන්.සී. ධනසිංහ (බන්ධනාගාර කොමසාරිස් ජනරාල්), එම්.වී. ගුණවර්ධන (අදාළ කාලයේ බන්ධනාගාර කොමසාරිස් (පාලන) තනතුර දරා ඇත) හා ඊ. ආර්. ළමාහේවගේ (අදාළ කාලයේ බන්ධනාගාර අධිකාරී (පාලන) තනතුර දරා ඇත) යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වගකිව යුතු බව විමර්ශන මණ්ඩලය නිගමනය කර ඇත. අමාත්‍යංශ ලේකම් හමුවට කැඳවා ඔවුන්ට අවවාද කළ යුතු බව විමර්ශන වාර්තාවේ සඳහන්ය. තවද සී. එස්. අමරවික්‍රම (පරිපාලන නිලධාරී 1), පී. ඩබ්ලිව්. යූ අමරප්‍රේම (ප්‍ර.ලි සහ පරිපාලන නිලධාරී 11 (වැ.බ)) හා ටී.ඒ.පී.ඩී එදිරිසිංහ මෙනෙවිය (කළමනාකරණ සහකාර 11 ශ්‍රේණිය) යන තිදෙනා බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත කැඳවා තරයේ අවවාද කර එසේ අවවාද කළ බවට ලිපියක් පෞද්ගලික ලිපිගොනුවට පිටපත් සහිතව එකී තැනැත්තන් වෙත බාර දිය යුතු බව විමර්ශන මණ්ඩලය නිර්දේශ කර ඇත.

## විමර්ෂණ වාර්තාවට හසු නොවන කරුණු

- විමරශන මණ්ඩල වාර්තාවේ කේන්ද්‍රීය ඉලක්කය නම් ෆයිල් 45 කතාවය. මන්දයත් බඳවාගැනීම් පමා කරමින් නැවත බඳවාගැනීම් සඳහා බලධාරීන් කල්මරද්දී පත්වීම්ලාභීන්ගෙන් ද එල්ල වූ චෝදනාව නිසාය. ඔවුන් චෝදනා කළේ මෙම ලිපිගොනු කතාව වනාහි නිසියාකාරව සම්මුඛ පරීක්ෂණවලට මුහුණ දුන් පිරිස් කප්පාදු කිරීමට බලධාරීන් ගසන ගැටයක් කියාය. විමර්ශන මණ්ඩල නිර්දේශ දෙස බලද්දී එම චෝදනාව තවත් බලවත් වන සෙයකි. මන්දයත් ෆයිල් 45ක් නැති වීම කජු ඇට කොස් ඇට ගාණට සලකමින් ඒවාට ආරක්ෂාව දිය යුතු පිරිස්වලට අවවාදයක් දී

ලිපියක් ලබාගන්නා තැනට විමර්ශකයන්ගේ නිර්දේශ සුමට වී ඇති නිසාය.

- අනෙක් අතට බඳවාගැනීමේ ක්‍රියාවලියට එල්ල වූ දේශපාලන බලපෑම් ගැන කිසිදු විමර්ශනයක් කෙරී නැත. 2016 නොවැම්බරයේ පැවැත් වූ මාධ්‍ය හමුවේදී ඇමැතිවරයා දේශපාලන ලැයිස්තු චෝදනාව මුළුමණින් ප්‍රතික්ෂේප කළේ නැත. එම ලැයිස්තුවේ ඇතුළත්ව ඇත්තේ පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ ඉල්ලීම් යැයි කියමින් ඇමැතිවරයා කළේ දේශපාලන බලපෑම යන වචනවල බර සැහැල්ලු කිරීම පමණි. එම අවස්ථාවේදී තමන්ට සිදුව ඇති අසාධාරණයට එරෙහිව පත්වීම්ලාභීන්ට බන්ධනාගාර මූලස්ථානය ඉදිරිපිට විරෝධතා පැවැත්වීමටද සිදුවිය.

- තවද, ඔවුහු සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීම් සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවටද පැමිණිලි කළහ. ඒ බොහෝ 'දෙනෙකුගේ චෝදනාවට ලක් වූ එක් තැනැත්තෙකු වූයේ අමාත්‍යවරයාගේ ලේකම්වරයකු හැටියට කටයුතු කළ එක්තරා පුද්ගලයෙකි. ඔහු 2017 ජූලි 5 වැනි දා පළ වූ ගවේෂණ ලිපියට අදහස් දක්වමින් වහසි බස් දෙඩුවේ විරෝධතාකරුවනට පත්වීම් නොදෙන බවටය. ඔහු එම ප්‍රකාශය කරන්නේ මෙම විමර්ශන මණ්ඩල වාර්තාව නිකුත් වී මාස 6කට පසුව ය.

- ඉන් ගම්‍ය වන්නේ කුමක්ද? මෙම විමර්ෂණ වාර්තාවටද හසු නොවන යථාර්ථයක් බන්ධනාගාර අමාත්‍යාංශයේ හොල්මන් කරන බවය. අප දන්නා පරිදි අදටත් මේ දේශපාලන සට්ටැඹියන් ඇමතිවරයාගේ අධිකාරිය අතට ගෙන පරිපාලනයේ හොල්මන් කරන අතර ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අසරණ වන එක් සාධකයක් හැටියටද ඔවුන් දැක්විය හැකි ය.

ඒ නිසා මෙවැනි සිදුවීම්වලදී බන්ධනාගාර කොමසාරිස්වරයා හෝ තවත් නිලධාරීන් කිහිප දෙනෙකු පිට වරද පටවා අත සෝදා ගැනීමට වගකිව යුත්තන්ට නොහැකිය.

- අනෙක් අතට මෙම පරීක්ෂණය නැවත පැවැත්වීමට අදාළ මුදල් හා කාලය ගැන මෙම වාර්තාවේ සඳහන් නොවේ. සිදුවීමේ පරිපාලන අවුල සෙවීමට පමණක් විමර්ශන බලය සීමා වීම ඊට හේතුවක් වන්නට ඇත. එය අපට තේරුම් ගත හැකිය. එහෙත් ජනතාවගේ පැත්තෙන් එය නම් දැනගත යුතුම කරුණකි. මක්නිසාද යත් සම්මුඛ පරීක්ෂණ නැවත සිදු කිරීමට වැය කළ මුදල් වනාහි බන්ධනාගාර නිලධාරීන්ගේ වත්ත පිටියෙන් ඉපැයූ ඒවා නොවන බැවිනි. මේ රටේ පොදු ජනයාගේ බදු මුදල්ම වන බැවිනි. මේ නිසා බන්ධනාගාර අමාත්‍යාංශයට පැහැදිලිවම මූල්‍යමය පාඩුවක් සිදුව ඇත. එහි තරම ප්‍රමාණය හරියටම මැනගත හැක්කේ විගණන පරීක්ෂණයකිනි. අනෙක් අතට නිලධාරින්ගේ වැරැද්කට පරිප්පු කෑමට සිදුවූයේ අපේක්ෂකයන්ටය. හරි නම් එම මුදල් අයකරගත යුත්තේ මෙවැනි තැනකට රාජ්‍ය ආයතන ඇද දමමින් වගකීම් විරහිත ව කටයුතු කළ තැනැත්තන්ගෙනි. එහෙත් විමර්ශන මණ්ඩලය පවා ඒ ගැන කිසිවක් සඳහන් කර නැත. අවසාන විග්‍රහයේ දී බන්ධනාගාර පරිපාලනය ගැන මේ විමර්ෂණයෙන් හෙළිවන තොරතුරු අනුව නම් ෆයිල් 45කට වැඩි දෙයක් වුව ද හෙට දිනයේ බන්ධනාගාර මූලස්ථානයෙන් අතුරුදහන් විය හැකි අතර ඒ ගැන කිසිවෙක් පුදුම විය යුතු නැත.

**තරිඳු ජයවර්ධන**
**බිඟුන් මේනක**






# මහජන මුදලින් කල්බදු ගෙවා ගජමිතුරන්ට සැප වාහන දුන් අයවැය චක්‍රලේඛය

**රාජ්‍ය ආයතනවලට අවශ්‍ය වාහන මෙහෙයුම් කල්බදු ක්‍රමයට ලබාගන්නා ලෙස උපදෙස් දෙමින් ඉකුත් පාලන සමයේ නිකුත් කළ චක්‍රලේඛය ගජ මිතුරන්ට ලක්ෂ ගණනින් අයුතු ලාභ ලැබීම සඳහා ලබාදුන් වරප්‍රසාදයක් බව අනාවරණය වෙයි.**

අදාළ චක්‍රලේඛය වන්නේ **2016 මාර්තු 17** දිනැතිව එකල මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාව සිටි ආර්. එස්. එච්. සමරතුංගගේ අත්සනින් සියලු රාජ්‍ය ආයතන අමතා නිකුත් කර ඇති අංක **01/2016** දරන ජාතික අයවැය චක්‍රලේඛයයි. ඒ මගින් රාජ්‍ය ආයතනවලට උපදෙස් දෙන්නේ, ඒවාට අවශ්‍ය

වාහන, මිලදී ගැනීමට වඩා මෙහෙයුම් කල්බදු ක්‍රමයට ලබා ගැනීම වඩා ප්‍රතිඵලදායක බැවින් අදාළ චක්‍රලේඛය අනුව ක්‍රියාකරමින් ඉදිරියේදී අවශ්‍ය වාහන කල්බදු හෙවත් ලීසිං ක්‍රමයට ලබාගන්නා ලෙසයි. **2016** එවකට පැවති යහපාලන රජය ඉදිරිපත් කළ අයවැය යෝජනාවලට අනුකූලව මුදල් ඇමතිවරයා විසින් ඉදිරිපත් කළ **2016.03.04 දිනැති MF/TIP/03/CM/2016/31** අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අනුමැතිය හිමි වූ අතර ඒ අනුව ඉහත චක්‍රලේඛය නිකුත් කෙරිණි.

අදාළ චක්‍රලේඛයේ සඳහන් වන අන්දමට රාජ්‍ය ආයතනවලට වාහන මිලදී ගැනීමට වඩා මෙහෙයුම් කල්බදු ක්‍රමයට ලබාගැනීම ප්‍රතිඵලදායක වන්නේ හිතවතුන්ට සැලකීම සඳහා කොළේ වසා ගැසීමේ කදිම උපායක් ඉන් නිර්මාණය වන නිසාය. ඒකාබද්ධ අරමුදලෙන් වියදම් දරන රාජ්‍ය ව්‍යාපාර ඇතුළු සියලු රාජ්‍ය ආයතනවලට **අංක 01/2016 අයවැය චක්‍රලේඛය** අනුගමනය කිරීමට දැඩිව උපදෙස් දෙමින් එහි පස්වැනි ඡේදයේ සඳහන් වාහන සම්බන්ධයෙන් වෙනස් පිළිවෙතක් අනුගමනය කිරීමට උපදෙස් දෙන්නේ එහි එන වාහන ගජමිතුරු සැපයට අදාළ නොවන නිසාය.

## ආයතන 65කින් මහජන මුදල් ගිලියි

**අංක 01/2016 අයවැය චක්‍රලේඛය** බරපතළ වංචාවක හවුල්කාර ලියවිල්ලක් බව බැලූ බැල්මට පැහැදිලි වන හෙයින් තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ කළ විමසීමකට පිළිතුරු දෙන අතිරේක අයවැය අධ්‍යක්ෂ ජනරාල් ජී.එම්.ජී.කේ. ගුණවර්ධන අයවැය දෙපාර්තමේන්තුවේ තොරතුරු නිලධාරියා ලෙස පවසන්නේ **අදාළ චක්‍රලේඛයෙන් රාජ්‍ය ආයතන 65කට කල්බදු ක්‍රමයට වාහන මිලදී ගැනීමේ අනුමැතිය ලබා දී ඇති බවයි.** එහෙත් මේ චක්‍රලේඛයද ඇතුළු ඒ හා ඈඳෙන සියලු ලේඛන චෞර ලිපි වන්නේ වාහන මිලදී ගැනීම යනුවෙන් ඒවායෙහි කිහිප තැනකම සඳහන් වුවද කිසිම වාහනයක් මෙකී රාජ්‍ය ආයතන **65** සඳහා සැබෑ වශයෙන් මිලදී ගෙන නොමැති නිසාය. **බැලූ බැල්මට පෙනෙන්නේ එකවර වාහන මිලදී ගැනීමට රජය සතු මූල්‍ය වත්කම් ප්‍රමාණවත් නොවන හෙයින් ලීසිං හෙවත් කල්බදු ක්‍රමයට වාහන මිලදී ගන්නට ඇති බවයි.** සිදුව ඇත්තේ එය නම් වාහනයේ ක්ෂයවීම, රුපියලේ මිලදී ගැනීමේ හැකියාව ආදිය හා සමග බලනවිට එහි එතරම් වරදක් නොපෙනේ.

නමුත් සිදුව ඇත්තේ වරදක් වංචාවක් බව පෙනෙන්නේ සමස්ත ක්‍රියාවලිය අධ්‍යයනය කරන විටය. මේ චක්‍රලේඛයෙන් ලබාදෙන උපදෙස්වලට අනුව මෙහෙයුම් කල්බදු ක්‍රමයට මිලදී ගත හැකි යැයි දැක්වෙන්නේ මෝටර් රථ, වෑන් සහ ඩබල් කැබ් වන අතර ඒවායේ එන්ජින් ධාරිතාව, ඉන්ධන භාවිතය හා ගියර් පද්ධතිය යනාදී වෙනස්කම් මත මිලදී ගැනීමේ සීමාවන්ද දක්වා තිබේ. එසේම මිලදී ගනු ලබන එක් වාහනයක් සඳහා ගෙවිය යුතු මිල ගණන් පිළිබඳවද උපදෙස් ලබා දී තිබේ. එම මිල ගණන් ආයතනවල දෛනික කටයුතු සඳහා වන වාහනවල සිට අමාත්‍යංශ ලේකම්වරු දක්වා පරාසයක නිලධාරීන් සඳහා මිලදී ගැනීමේදී මාසිකව ගෙවිය යුතු **බදු කුලිය රුපියල් ලක්ෂයේ සිට ලක්ෂ 03 දක්වා වේ.** අප අවශේෂ මූලාශ්‍රයකින් ලබාගත් තොරතුරුවලට අනුව **ආයතන 65ක් සඳහා වාහන 350ක් පමණ** මිලදී ගෙන තිබෙන අතර වියදම් මධ්‍ය අගයකට ගෙන එක් වාහනයක් සඳහා රුපියල් **ලක්ෂ 02ක්** වියදම් කර ඇත්නම් **මසකට රුපියල් ලක්ෂ 700ක්ද, වසරකට රුපියල් ලක්ෂ 8,400ක්ද,** වසර පහක් අවසානයේ **රුපියල් ලක්ෂ 42,000ක්ද** කල්බදු ගෙවීම සඳහා මහජන මුදලින් වියදම් කර ඇත. මේ දක්වා ඇති අගයන් උපකල්පන මත එළඹී ප්‍රක්ෂේපන බව සැබෑ නමුත් සැබෑ වියදම මේ අගයට වඩා අඩු විය හැකිවාක් මෙන්ම වැඩි වන්නටද පුළුවන. එය එසේනම් වසර පහක් අවසානයේ රාජ්‍ය **ආයතන 65කට** අත පිසදාගෙන පැත්තකට වන්නට සිදුවෙද්දී අහිංසක මහජනයාට මහත්ම වින්නැහියක් වී හමාරය.

## වත්ත බද්දට දී ඇස්සට දත නියවීම

මේ ගවේෂණයට පාදක වූ තොරතුරු විමර්ශනයේදී එක්තරා රාජ්‍ය මණ්ඩලයකට **වාහන හතරක්** මිලදී ගෙන ඇති බව අනාවරණය වූ අතර නිදසුනක් ලෙස එහි සභාපතිවරයාගේ වාහනය පිළිබඳව පමණක් අවධානය යොමු කරමු. මේ සභාපතිවරයා වෙනුවෙන් මිලදී ගෙන තිබුණේ **ටොයෝටා ෆෝර්චූනර්** වර්ගයේ රථයක් වන අතර වර්තමාන වෙළඳපොළ මිල ගණන් හා සසඳන විට එම වකවානුවේ ෆෝර්චූනර් රථයක මිල **ලක්ෂ 60ක සිට 80 දක්වා** පරාසයක විය. නිෂ්පාදිත වර්ෂය හා අයත් උප කාණ්ඩය මත එම පරාසය තුළ මිල නියම වන අතර අදාළ රථය කල්බදු ක්‍රමයට මිලදී ගැනීමට **වසර 05ක් සඳහා** ගිවිසුම් ගතව තිබුණි. එම ගිවිසුම **2022 නොවැම්බර් මාසය** දක්වා බල පැවැත්වෙන අතර එම කාලයෙහි **මාස 60ක්** සඳහා මසකට **රුපියල් ලක්ෂ 02 බැගින් රුපියල් එක්කෝටි විසිලක්ෂයක් ගෙවීමට එකඟව තිබුණි.** ඒ අනුව වාහනයේ නියමිත මිලට වඩා **වැඩිපුර මිලියන හතරකට** ආසන්න මුදලක් ගෙවීමට සිදුව තිබේ.

**මේ චක්‍රලේඛයෙන් රජයට මුදල් හිඟ නිසා කල්බදු ක්‍රමයට වාහන ගන්නට උපදෙස් දුන්නත් එහි සැබෑ යටි අරමුණ හෙළි වන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දී ඇති**




www.youtube.com

**උපදෙස්වලිනි. චක්‍රලේඛයේ මාතෘකාව යොදා ඇත්තේ කල්බදු ක්‍රමයට වාහන මිලදී ගැනීම වුවත් මෙහිදී සිදුවන්නේ අදාළ ආයතනය ලීසිං කොම්පැනියක් වෙත ගොස් තමන්ට වුවමනා වාහන කල්බදු ක්‍රමයට සෘජුව මිලට ගැනීම නොවේ. භාණ්ඩාගාර ලේකම් සමරතුංග මහතාගේ අත්සනින් කැබිනට් අනුමැතියද ලැබූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ උපදෙස් දෙන චක්‍රලේඛය නියෝග කරන්නේ තුන්වන පාර්ශ්ව මගින් වාහන ලබාගන්නා ලෙසයි. ගජමිතුරු සංග්‍රහ හෙවත් දේශපාලනඥයන්ගේද, ඔවුන්ගේ හිතවතුන්ගේද, ඇතැම් ඉහළ නිලධාරීන්ගේද සැප වාහන අවශ්‍යතාව වසර පහක ඇවෑමෙන් සපුරාලීමට අඩිතාලම දමමින්, මෙතෙක් වාහන මිලදී ගැනීම ගැන උපදෙස් දුන් චක්‍රලේඛය ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහන් ඡේදයේදී මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ භාවිතා කර ආපසු ලබාදීම යන පදනම යටතේ වාහන ලබාගැනීම යනුවෙන් සඳහන් කර බළලාට මල්ලෙන් එළියට පැනීමට ඉඩ සලසා ඇත.**

මේ ක්‍රමය යටතේ පෙර නිදසුනෙහි සඳහන් කළ රාජ්‍ය මණ්ඩලය **සිය ෆෝර්චූනර් රථයට මසකට රුපියල් ලක්ෂ 02 බැගින්** වසර පහකදී **එක්කෝටි විසිලක්ෂයක්ද, කිලෝමීටර් 3000කට** වැඩි වූ සෑම මාසික ධාවනයකදීම වැඩි වන කිලෝමීටරයට **රුපියල් 45ක් බැගින්ද** ගෙවා එය ඇතුළු **වාහන හතරක්ම** දළ වශයෙන් **කෝටි 04ක්** පමණ ගෙවා **2022 නොවැම්බර්** මාසයේදී ඒවා සැපයුම්කරුවන්ට නැවත භාර දී අත පිස දා ගත යුතු වේ. **ඒ අනුව මේ පදනම මත වාහන මිලදී ගත් ආයතන 65කටම 2022 වනවිට අපගේ උපකල්පනය අනුව නැවත ආසන්න වශයෙන් වාහන 350ක හිඟයක් ඇති වේ. ගජමිතුරන්ට සැප වාහන 350ක් නොමිලේම ලැබේ.**

මේ වාහන සැප වාහන වන්නේත් සුර චෞරයින් පිරිසක් තමන්ගේ උන් පිනවීමට කළ කට්ටකමක් යැයි චක්‍රලේඛය හැඳින්විය හැකි වන්නේත් එහිම පස්වැනි වගන්තිය අනුවය. ගිලන් රථ, බැකෝ, ඩෝසර්, ගලි බවුසර්, ලොරි, යතුරුපැදි හා වෙනත් විශේෂ කාර්ය වාහන මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මිලදී ගැනීමට අවශ්‍ය නොවන බව එහි දැක්වේ. සැබෑය. කිසිවෙකුට වසර පහක් සඳහා ආණ්ඩුවට ගලි බවුසරයක් බදු කුලියට ලබා දී නැවත එය තමාගේ කරගැනීමේ වුවමනාවක් නැත. එකවර වාහන මිලට ගැනීමට සල්ලි නැති ආණ්ඩුවට ඒවා මිලට ගත හැකිය. චක්‍රලේඛයේ සුදුසුකම් ඇති සැපයුම්කරුවන්ද යටිකූට්ටු දේශපාලන සබඳතා ඇති දළකාරයන් මිස හුදී ජනයා නොවන බව පැහැදිලිය.

## පුරවැසි වගකීම

**මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා මේ චක්‍රලේඛය නිකුත් කරන්නේ සිය රාජකාරියේ කොටසක් ලෙසය. මේ ක්‍රියාවලියට කැබිනට්ටුවද අනුමැතිය දී ඇත. ජාතික අයවැය යෝජනාවල මේ ප්‍රසම්පාදන යෝජනාව ඇතුළත්ය. දැන් පුරවැසියාගේ වගකීම මේ චෞර ජාලය හඳුනා ගැනීමයි. අයවැය සම්පාදන කාර්යයට මැදිහත් වන නිලධාරීන් හා එවකට සිටි මුදල් ඇමතිවරයාගේ සිට මේ සීතල හොරකමට සම්බන්ධ වූවන් හඳුනා ගැනීම පුරවැසියාගේ කාර්යයයි.** මෙහිලා උපකල්පනය කළ ගණන් ඉලක්කම් එහා මෙහා වීමට හැකි වුවද අතිශය සරළ කාරණා කිහිපයක් ගැන ප්‍රශ්න කළ යුතුය. ආර්ථික අහේනියෙන් හෙම්බත්ව සිටින රටක රජයේ ආයතන සිය වාහන සංචිතය වසර පහෙන් පහට මාරු කරන්නේ නැත. ඇතැම්විට ජපානයේද වසර තුනක්වත් ධාවනය කර මෙරටට ගෙන්වන රීකන්ඩිෂන් වාහන පවා වසර පහළොවක් විස්සක් කිසිම හෙණයක් නැතිව භාවිතා කරන පුරවැසියන් ඉන්නා රටක රාජ්‍ය ආයතනවලට සිය වාහන **අවුරුදු 10ක්** භාවිතා කරන්නට බැරි නැත. එසේ කරන්නට නම් මේ වාහන සෘජුව ඒ ඒ ආයතන මගින් කල්බදු ක්‍රමයට ලබා ගත යුතුව තිබුණි. දැන් මතුවන ගැටලුව එසේ නොකළේ ඇයිද යන්නයි. ප්‍රතිපලය වසර පහකට පසුව නැවතත් වාහන අවශ්‍යතාවයක් මතු වීමයි.






www.nissanlk.com

භාණ්ඩාගාර ලේකම්වරයා සිය චක්‍රලේඛයේ පෙන්වා දී ඇති පරිදි මෙය පිරිවැය අතින් වඩා ප්‍රතිඵලදායක ක්‍රමයක් වන්නේ වාහන සැපයුම්කාර ගජමිතුරන්ට මිස පුරවැසියාට නොවන්නේ එහෙයිනි. මාසික කුලී පදනම මත අදාළ ආයතනවලට වාහන සපයා ගත්තේ නම් මීට වඩා ලාභදායකය. මේ ක්‍රමයේදී රියදුරු රජයෙන් යොදවා වැටුප හා දීමනා ගෙවා ඇති නමුත් වාහන කුලියට ගත්තේ නම් රියදුරාද ලබා දෙයි. රජයට සල්ලි නෑ කියමින් බෑගිරි ගෑ නමුත් මේ යටිකූට්ටු මගඩිය සඳහා ඒකාබද්ධ අරමුදලෙන් අරමුදල් ලබන ආයතනවලට ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇත. වෙනම පුනරාවර්තන වැය විෂයක් ඇති කර ඇති අතර අදාළ වියදම මෙහෙයුම් වියදමක් ලෙස සලකා ඇත්තේ රජයට කිසිම වත්කමක් ඉන් ඇති නොවන නිසා බවද දක්වා ඇත. තොරතුරු දැනගැනීමේ අයිතිය භාවිතා කරමින් අප කළ විමසුමට ප්‍රතිචාර දක්වන අවස්ථාවේද ජාතික අයවැය දෙපාර්තමේන්තුව සඳහන් කරන්නේ මෙම වාහන රාජ්‍ය ආයතනවල වත්කමක් නොවන බැවින් ඒවායේ වටිනාකම ක්ෂයවීම ගැන සොයාබැලීමද අදාළ නොවන බවයි. වසර පහක් අවසානයේ වත්කම් ක්ෂය වීමක් තිබිය හැකි වුවද මේ ක්‍රමයට සිදුව ඇත්තේ ශූන්‍ය වී අහිමි වීමකි.

**ලසන්ත ද සිල්වා**

උපුටා ගැනීම අනිද්දා පුවත්පත
2020.12.21



www.shutterstock.com

## තොරතුරු අයිතියේ බලයෙන් පාරිභෝගික සටනක් දිනයි

# පානීය ජල බෝතලයෙහි මිල ලකුණුවීමේ පිටුපස කතාව

පුරවැසි අයිතීන් දිනාගැනීම සඳහා වන අරගලයෙහි තවත් සුවිශේෂී ජයග්‍රහණයක් සලකුණු කරමින් සමාජ ක්‍රියාකාරිකයකු පසුගිය දා තොරතුරු ලබාගැනීමේ අයිතිය භාවිත කොට පානීය ජලය සම්බන්ධව ප්‍රධාන පාරිභෝගික අයිතියක් දිනාගැනීමට සමත්ව සිටී. පුරවැසි අයිතීන් සඳහා මැදිහත්වීමේ අත්දැකීම් රැසක් ඇති සමාජ ක්‍රියාකාරිකයකු වන සුරේෂ් කුමාර් මේ ජයග්‍රහණය ලබා ඇත්තේ මේ වන විට රටෙහි දැඩි ඉල්ලුමක් වර්ධනය වෙමින් පවතින පානීය ජල බෝතල් අලෙවියට අදාළ ගැටලුවක් සම්බන්ධයෙනි.

**මෑතක සිට රට පුරා වතුර බෝතල් අලෙවිය ශීඝ්‍රයෙන් ඉහළ ගිය නමුත් ඒ සම්බන්ධයෙන් පාරිභෝගික ගැටලු ගණනාවක් නොවිසඳී පැවතුණි. ඒ අතරින් ප්‍රධාන ගැටලුවක්ව තිබුණේ ජලය අලෙවි කිරීමේ දී ඒ සඳහා පිළිගත් පොදු මිලක් සලකුණු කර නොතිබීමයි. එබැවින් එකම ප්‍රමාණයේ වතුර බෝතල් විවිධ මිල ගණන් යටතේ විකිණීම රට පුරා සිදුවිය. පසුගිය කාලය පුරා මේ සම්බන්ධයෙන් පාරිභෝගික පැමිණිලි ගණනාවක් ඉදිරිපත් වූ නමුත් ඒ සම්බන්ධයෙන් කිසිවකුගේ අවධානය යොමු වූයේ නැත.**

මේ තත්ත්වය පිළිබඳ අවධානය යොමු කළ සුරේෂ් කුමාර් මීට අදාළව ගනු ලබූ පළමු පියවර වූයේ පානීය ජල බෝතල් සම්බන්ධයෙන් පවතින නියමිත මිල පිළිබඳව කරුණු විමසමින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත තොරතුරු අයදුම්පතක් ඉදිරිපත් කිරීමයි.

පසුගිය වසරේ නොවැම්බර් මස 21 වැනි දා තමන් පාරිභෝගික අධිකාරිය වෙත යොමු කරන ලද අයදුම්පතට 2017 දෙසැම්බර් මස 12 වැනි දා අධිකාරියෙන් පිළිතුරක් ලැබුණි. එමගින් ප්‍රකාශ කර තිබුණේ පාරිභෝගික අධිකාරි පනතේ 18 වැනි වගන්තිය යටතේ පානීය ජල බෝතල් මිල නියම කළ යුතු භාණ්ඩ ගනයට අයත් නොවන බැවින් ඒ සඳහා උපරිම සිල්ලර මිලක් නියම කොට නොමැති බවයි. එබැවින් පානීය ජල බෝතල් මිල සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් තමන් සතුව නොමැති බව වැඩිදුරටත් පවසා තිබිණි.

එම පිළිතුරෙන් අධෛර්යමත් නොවූ සුරේෂ් තවදුරටත් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලුවේය. ඒ අනුව, ඔහුගේ අවධානය යොමුවූයේ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතටයි. මීට දෙවරසකට පමණ පෙර එනම් 2016 වසර අවසානයේ ඔහු මේ ගැටලුවට මැදිහත් වූයේද සෞඛ්‍ය අමාත්‍යාංශය හරහාය. ඊට හේතුව වතුර නිෂ්පාදනයන් ලියාපදිංචි වූයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ බැවිනි. එහෙත් එකල සෞඛ්‍ය අමාත්‍යාංශය එම තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කර තිබිණි.

**ඉන් පසු ඔහු තොරතුරු අයිතිය නීතියක් බවට පත් වීමෙන් අනතුරුව නැවත සෞඛ්‍ය අමාත්‍යාංශයට එම ගැටලුව යොමු කළේය. ඒ සඳහා ඔහුට පිළිතුරු ලැබුණු අතර, එසේ ලැබුණු පිළිතුරෙහි සඳහන් වූ පරිදි ඒ වන විට වතුර නිෂ්පාදන සමාගම් 121ක් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වතුර නිෂ්පාදකයන් ලෙස ලියාපදිංචි වී සිටි බවයි. ඒ අතරින් සමාගම් දෙකක් වතුර අපනයනය කරන්නෝ වූහ. එහෙත් ඔවුන් යටතේද මිල ගණන් නියාමනයක් සිදු වූයේ නැත. එහෙත් එසේ ලබාගත් තොරතුරු තම අරගලය ඉදිරියට ගෙන යෑම සඳහා සුරේෂ්ට බෙහෙවින් ප්‍රයෝජනවත් විය.**

ඒ අනුව ඔහු ඒ වන විට තමන් සතුව තිබූ සියලු තොරතුරු සමග නැවතත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ඇමතුවේය. මුල්න්ම ඔහු සමග කතා කෙළේ පාරිභෝගික අධිකාරියේ මානව සම්පත් හා පරිපාලන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ එම්. වී. රූපසිංහ මහතාය. ඉන් පසු ඔහු මිල පාලන කටයුතු පිළිබඳ නිලධාරියකු වෙත යොමු කෙරිණි.

එහි දී තරමක දීර්ඝ සාකච්ඡාවක් සිදු වූ අතර සුරේෂ්ගේ ප්‍රධාන තර්කය වූයේ මේ පිළිබඳ අධීක්ෂණය කිරීමේ ප්‍රධාන වගකීම පැවරෙන්නේ පාරිභෝගික අධිකාරියට බවයි.

එහෙත්, මීට අදාළව පාරිභෝගික අධිකාරිය ඒ වන විට අධීක්ෂණය කරමින් සිටියේ කල් ඉකුත්වීමේ දිනය පිළිබඳ ගැටලු සහ ප්ලාස්ටික් බෝතල් අව්වේ තැබීමෙන් ඇති වන ගැටලු ආදිය පිළිබඳව පමණි.

පාලන මිලක් නොමැති බැවින් මිල ගණන් පිළිබඳ පාලනයක් තමන්ට කළ නොහැකි බව

අධිකාරියේ අදහස විය. සුරේෂ්ගේ යෝජනාව බෙහෙවින් අගය කළ අතර, නිලධාරීහු ඒ සම්බන්ධත්‍යන් ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග නොපමාව ගැනීමට කටයුතු යොදන බව ප්‍රකාශ කළහ. එම ප්‍රකාශය සෑහීමට හේතුවක් වූ නමුත් සුරේෂ් එයින් නැවතුණේ නැත. ඒ අනුව ඔහු තවත් ආකාරයකින් මෙරට ජල සම්පත අධීක්ෂණය පිළිබඳ වගකීම පැවරී තිබූ නාගරික සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශයටද ඇමතුවේය. ජල පෝෂක ප්‍රදේශ ආරම්භ කිරීම ඔවුන්ගේ වගකීමක් වූ නමුත් ජලය විකිණීම සම්බන්ධ මිල ගණන් නියාමනය ඔවුන්ගේ වගකීමක් නොවන බව එහි දී ප්‍රකාශ විය.

ජලය මිනිසාගේ මූලික අවශ්‍යතාවක් වන අතරම එය ස්වාභාවික සම්පතක් ලෙස පිළිග නිමින් ඒ මිනිස් අයිතිය වෙනුවෙන් සුරේෂ් තම සටන නොකඩවා ඉදිරියට ගෙන ගියේය.

ගැටලුවට අදාළ සියලු තොරතුරු රැස් කරමින් ඉදිරියට ගිය සුරේෂ්ගේ අවසාන අරමුණ වී තිබුණේ ඒ සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කිරීමය. තොරතුරු අයිතිය යටතේ ලැබී තිබූ ඉඩකඩ ප්‍රයෝජනයට ගනිමින් ඔහු සූදානම් වෙමින් සිටියේ ඒ සඳහාය. නීතිය පිළිබඳ විශාරදයකු නොවුව ද මෙහි අධිකරණ ක්‍රියාමාර්ගයක් ගැනීමට අවශ්‍ය මූලික පදනමක් තිබෙන බව සුරේෂ්ගේ විශ්වාසය විය. ජලය මිනිසාගේ මූලික අවශ්‍යතාවක් හා ස්වභාවික සම්පතක් වන බැවින් ඒ සඳහා මිලක් නියම වන්නේ නම් එය සාධාරණ මිලක් විය යුතු බවත්, එම සාධාරණය ඉටු කිරීම රාජ්‍යයෙහි වගකීමක් බවත් සුරේෂ්ගේ තර්කය විය. මේ තර්කයෙහි බලගතු බව කෙසේ වෙතත් සුරේෂ් නොනැවතී ඒ සඳහා වැඩ කළේය. එහි මූලික පියවර වූයේ අදාළ තොරතුරු රැස් කිරීමය. සුරේෂ් තොරතුරු අයිතිය භාවිත කරමින් එම අරගලයෙහි නිරතව සිටි අතර පසුගිය මස 30 වැනි දා මෙරට රූපවාහිනී නාලිකා ඔස්සේ විකාශය වූ පුවත් මගින් සුරේෂ්ගේ අරගලයට සම්බන්ධ තීරණාත්මක පුවත ප්‍රකාශයට පත් විය.

එනම් 2018 සැප්තැම්බර් මස 28 වන දා පළ වූ ගැසට් නිවේදනය මගින් මෙරට ජලය විකිණීම මිල පාලනයකට යටත් කර ඇති බවයි.

මෙය තම අරගලයෙහි සෘජු ප්‍රතිඵලයක් යැයි සුරේෂ්ට තවමත් ස්ථිරව කිව නොහැකිය. එහෙත් සිදුවීම සිද්ධ වූ දින වගවානු ආශ්‍රිතව බලන විට ඒ ජයග්‍රහණය පිටුපස සිටින තීරණාත්මක මිනිසකු ලෙස සුරේෂ් කුමාර් හඳුනා ගැනීම අපහසු නැත. ඒ අරගලය කළ සුරේෂ් අත රැඳි ප්‍රධාන මෙවලම වූයේ තොරතුරු දැනගැනීමේ අයිතිය බවද ඉතාමත්ම පැහැදිලිය.

**සී. දොඩාවත්ත**

දිනමිණ - පවත - 2018 ඔක්තෝබර් 10





*http://clerkship19gh.blogspot.com/*

# කසළ කළමනාකරණය නාස්තියක් වෙයි

## දේශපාලනඥයන්ගේ සහ නිලධාරීන්ගේ වියදම් අධික විදේශ සංචාර පෞද්ගලික ප්‍රතිලාභ සඳහා මහජන මුදල් ගලා යෑමකි

ශ්‍රී ලංකාවේ කසල බැහැර කිරීම සඳහා ප්‍රයෝගික උපාය මාර්ගයක් නොමැතිව, එම ප්‍රශ්නය ජාතික අර්බුදයක් බවට පත්ව තිබේ. හොඳින් කළමනාකරණය කළ කසළ පොදු සම්පතක් බවට පත්කර ගත හැකි බව විශේෂඥයින් කියතත්, මෙම ලිපියන් පෙන්වා දෙන්නේ, මහජනයා සහ පරිසරය යන දෙක ම අවදානමට  ලක් කරමින් ඇතැම් නිලධාරීන් එය පෞද්ගලික සම්පතක් බවට පත් කරගෙන ඇති ආකාරය යි. ශ්‍රී ලංකාවේ **දිනපතා එකතු වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් 9,800**ක් පමණ වන අතර **වාර්ෂිකව එකතු වන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,531,934**ක් වෙයි. දිනපතා එකතු කරන්නේ මෙයින් තුනෙන් දෙකක් පමණ ප්‍රමාණයක්, එනම්, **මෙට්‍රික් ටොන් 3,700**කි. මෙයට **ප්ලාස්ටික් මෙට්‍රික් ටොන් 400ක්ද** ඇතුළත් වන අතර එම ප්‍රමාණය වැඩි වෙමින් පවතියි. කසළ බැහැර කිරීමේ වගකීම

ආයතන ගණනාවකට ඇතත්, **මූලික බලතල ඇත්තේ පළාත් පාලන ආයතනවලටය. ඊට අමතරව පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය** (*CEA*), **සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය** (*MEPA* ), **වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව** (*CCD*), **නාගරික සංවර්ධන අධිකාරිය** (*UDA*), **සහ ආයෝජන මණ්ඩලය** (*BOI*) **ද , කසළ බැහැර කිරීමට වගකිව යුතු වෙයි.** අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සැකසීමට පරිසර අමාත්‍යාංශය දැන් කටයුතු කරමින් සිටියි.

## විදේශ සංචාර

කසළ බැහැර කිරීමේ ප්‍රශ්නය වර්ධනය වන විට, ඒ සමගම පළාත් පාලන නියෝජිතයන්ට සහ මධ්‍යම ආණ්ඩුවේ සාමාජිකයින්ට හිමි වන විදේශ පුහුණු සහ නිරාවරණ සංඛ්‍යාව ද වැඩි වෙයි. මෙම සංචාර අරමුණු කොට ඇත්තේ, කසළ අර්බුදය සමග සටන් කිරීම සඳහා නිලධාරීන්ට අවශ්‍ය දැනුම සහ තාක්ෂණික සහය ලබා දීමටයි. **පාර්ලිමේන්තු වාර්තා සහ තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතක් මගින් ලබාගත් දත්ත අනුව, 2010 සහ 2019 අතර කාලයේ සම්පූර්ණ වශයෙන් පළාත් පාලන නියෝජිතයින් 355 දෙනෙකු රුපියල් 60,620,351 ක වියදමකින් මෙබඳු විදේශ සංචාර සඳහා සහභාගී වී ඇත.**

පාර්ලිමේන්තු වාර්තාවකට අනුව මධ්‍යම පරිසර අධිකාරියේ, සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ, වෙරළ  සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, ජාතික සත්ව විද්‍යා දෙපාර්තමේන්තුවේ සහ එබඳු වෙනත් දෙපාර්තමේන්තුවල නිලධාරීන්  විදේශ සංචාරවලින් පසුව තමන්ගේ කසළ කළමනාකරණ ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් අදාළ විෂය භාර අමාත්‍යංශයට ඉදිරිපත් කළ යුතු විය. මෙම වාර්තා මත පදනම්ව අමාත්‍යංශ නිලධාරීන් ප්‍රතිපත්ති සහ කළමනාකරණ තීරණ ගත යුතු වන අතර විදේශ සංචාරවලට සහභාගී වූ නිලධාරීන් කලින් කලට කැඳවා ඔවුන්ගේ සැලසුම් ගැන සාකච්ඡා කොට ක්‍රියාත්මක කළ යුත්තේය. එමෙන්ම ඔවුන්, අපද්‍රව්‍ය කළමනාකරණයට වගකිව යුතු ආයතනවල ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීමත්, ඔවුන්ට අවශ්‍ය පියවර සහ මග පෙන්වීම සැපයීමත් කළ යුතු විය.

**2010 සහ 2019 අතර කාලය තුළ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජෙනරාල් සහ වෙනත් ජ්‍යෙෂ්ඨ සහ ප්‍රාදේශීය නිලධාරීන් කසළ කළමනාකරණය අධ්‍යයනය කිරීමට විවිධ රටවල සංචාරය කොට ඇත. ඒ අනුව නිලධාරීන් 84 දෙනෙකු රුපියල් 5,882,241ක වියදමින් සංචාර 84ක යෙදී තිබේ.  එම කාලයේදීම, ජාතික සත්ව විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරියකු රුපියල් 135,240ක වියදමකින් එක්සත් ජනපදයේ සංචාරයකට සහභාගී වී ඇත.** සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ නිලධාරීන් පස් දෙනකු මෙම කාලයේ අවස්ථා පහකදී ඉන්දියාවේ, කෙන්යාවේ, ඉන්දුනීසියාවේ සහ තායිලන්තයේ සංචාරය කොට ඇතත්, එම සංචාර ජාත්‍යන්තර පරිසර සංවිධානයේ අනුග්‍රහයෙන් සිදු වූ නිසා රජයෙන් කිසිදු මුදලක් වැය වී නැත.

## අසාර්ථක ව්‍යාපෘති

තම සාමාජිකයින් විදේශීය පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමෙන් පසුව, කසළ කළමනාකරණ ව්‍යාපෘති ආරම්භ කිරීමට ඇතැම් පළාත් පාලන ආයතන උත්සාහ දැරීය.



**අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් සඳහා වැය කළ මුදල් ප්‍රමාණය (පළාත් අනුව)**

| | වසර | පළාත | වියදම් කළ මුදල |
|---|---|---|---|
| 01 | 2010 | මධ්‍යම | 900,000.00 |
| | | බස්නාහිර | 1,807,000 .00 |
| | | වයඹ | 103,293.00 |
| | | සබරගමුව | 88,000.00 |
| 02. | 2011 | සබරගමුව | 945,000.00 |
| 03. | 2012 | දකුණ | 127,582.00 |
| 04. | 2013 | මධ්‍යම | 403,568.00 |
| | | බස්නාහිර | 7,260,802.17 |
| | | සබරගමුව | 944,135.00 |
| | | ඌව | 368,290.00 |
| 05 | .2014 | මධ්‍යම | 860,000.00 |
| | | බස්නාහිර | 6,166,166,046.38 |
| | | වයඹ | 13,042,944.90 |
| | | දකුණු | 4,100,231.70 |
| | | සබරගමුව | 3,806,354.00 |
| | | ඌව | 550,000.00 |
| 06 | .2015 | මධ්‍යම | 2,278,023.30 |
| | | සබරගමුව | 160,000.00 |
| | | උතුරු මැද | 200,000.00 |
| 07. | 2016 | බස්නාහිර | 80,021.75 |
| | | දකුණ | 53,107.50 |
| 08. | 2018 | වයඹ | 2,113,409.95 |
| | | ඌව | 1,150,601.00 |
| | | සබරගමුව | 1,728,842.11 |
| | | දකුණු | 295,776.60 |
| 09 | 2019 | මධ්‍යම | 588,161.70 |
| | | වයඹ | 121,000.00 |

වැඩමුළු සඳහා සහභාගී වූ පළාත් පාලන ආයතන නියෝජිත සංඛ්‍යාව සහ ඔවුන් සංචාරය කළ රටවල් පහත සඳහන් පරිදිය.

කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘති බොහොමයක් සම්පූර්ණයෙන් අසාර්ථක වී හෝ දුර්වල ක්‍රියාකාරීත්වයකින් යුතු වී හෝ ඇත. බොහෝ අවස්ථාවලදී ව්‍යාපෘති ආරම්භ කොට නැත. විදේශ සංචාර සඳහා මහජන මුදල් විශාල වශයෙන් වැය වී ඇතත්, එයින් මහජනයාට ගණන් ගත හැකි සේවයක් සිදු වී නැති බව මෙයින් පෙනී යයි.

අනෙක් අතට, රටපුරා ප්ලාස්ටික් සහ පොලිතින් භාවිතය වැඩි වී ඇත්තේ, දිනපතා එකතුවන ජීව හායනයෙන් තොර අපද්‍රව්‍යවලට තවත් එකතු කරමිනි. මෙම බරපතළ තත්ත්වය තිබියදී, සාර්ථක කසළ බැහැර කිරීමේ ක්‍රම ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන ආයතනවලට නොහැකි වී ඇත. එමෙන්ම, බොහෝ කතා කළ ව්‍යාපෘති සැලසුම්කරණ අවදියේ සිර වී පවතියි.

**"දිනපතා එකතු කරන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 3700කින්, මෙට්‍රික් ටොන් 400ක් ප්ලාස්ටික්ය"**

"කසළ කළමනාකරණය" මුවාවෙන් පසුගිය වසර දහයක් තිස්සේ වියදම් කළ අතිවිශාල මහජන මුදල් ප්‍රමාණය අපතේ ගොස් ඇති බව පැහැදිලිය. ඊටත් වඩා පැහැදිලි වන්නේ කසළ සම්පතක් වී ඇත්තේ කාටද යන්නයි. මෙම දේශපාලන සහ නිලධාරීවාදී එකතැන පල්වීම දිගටම පවතිද්දී නගරවල සහ ගම්බද ප්‍රදේශවල කසළ කඳු ගොඩ ගැසෙමින් පවතියි. පළාත් පාලන ආයතන කසළ හිතුවක්කාර ලෙස ප්‍රවාහනය කරමින් වගුරු සහ තෙත් බිම්වලට දැමීම නිසා, මෙම ආරක්ෂිත සහ වටිනා පාරිසරික සම්පත අල්ලා ගැනීම්වලට සහ දූෂණයට ලක්වෙයි. හානිකර කසළ බැහැර කිරීම් හේතුවෙන් සිදු වන නොවැළැක්විය හැකි පරිසර විනාශය පිළිබඳව අදාළ බලධාරීන්ගේ ඇස් ඇරීමට කාලය මෙය යි. නිසි පියවර නොගතහොත් සහ මෙම දූෂිත සහ නොසැලකිලිමත් හැසිරීම දිගට පැවතිය හොත්, පරිසරය අපට දඬුවම් කරන දිනය වැඩි ඈතක නොවේ.

**2010 - 2019 කාලය තුළ ජාත්‍යන්තර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණු වැඩ සටහන්වලට සහභාගී වූ පළාත් පාලන ආයතන නියෝජිත සංඛ්‍යාව**

| වසර | නියෝජිත සංඛ්‍යාව |
|---|---|
| 2010 | 06 |
| 2011 | 1 |
| 2012 | 07 |
| 2013 | 55 |
| 2014 | 156 |
| 2015 | 73 |
| 2016 | 03 |
| 2017 | -- |
| 2018 | 15 |
| 2019 | 09 ( මැයි 31 දක්වා ) |

**චාමර සම්පත්**
ඩේලි මිරර්





https://rogueramblers.com/

## ස්ත්‍රීපුරුෂභාවය පිළිබඳ ප්‍රශ්නයේදී

# දුම්රිය පීලි පනී

ශ්‍රී ලංකාවේ වසර **160ක්** පැරණි දුම්රිය දෙපාර්තමේන්තුව තමන්ගේ ඉහළම මට්ටමේ **පුහුණු සහ විධායක තනතුරු සඳහා ඉල්ලුම්පත් ලැබුණද, කාන්තාවන් බඳවා නොගන්නා බවත්, ඔවුන් බඳවාගනු ලබන්නේ පහළ තනතුරු සඳහා පමණක් බවත්,** තොරතුරු දැනගැනීමේ පනත යටතේ ලබාගත් දත්ත මගින් පෙන්නුම් කරයි.

තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ සන්ඩේ ටයිම්ස් පුවත්පත ඉදිරිපත් කළ ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින්, අධ්‍යක්ෂ (සැලසුම්) සහ තොරතුරු නිලධාරී ජේ.ඒ.ඩී.ආර් පුෂ්පකුමාර ප්‍රකාශ කළේ දුම්රිය දෙපාර්තමේන්තුව කාන්තා සේවකයින්ට ඉල්ලුම්පත් නිකුත් නොකරන බවයි. ඉල්ලුම්පත් නිකුත් කළ පහළ තනතුරු සඳහා ඉල්ලුම්පත්

ලැබුණු විට කාන්තාවන් බඳවා ගන්නේ යෝග්‍යතාවය පදනම් කරගෙන බවද ඔහු පැවසුවේය.

**දෙපාර්තමේන්තුවේ 2017 වාර්ෂික කාර්ය සාධන වාර්තාවට** අනුව කියන්නේ එහි **සේවකයින් 15,413 දෙනකු** සිටින බවයි. තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ කළ ඉල්ලීමෙන් හෙළි වූයේ මේ අතරින් **කාන්තාවන් සිටින්නේ 1,202ක් පමණක්** වෙයි. මෙය සමස්ත ශ්‍රම බලකායෙන් **සියයට හතක් පමණකි.** මේ අතරින් **කාන්තාවෝ 148ක්** අනියම් හෝ ආදේශක හෝ කම්කරුවෝ වෙති.

මින් **බහුතරය (276) තාක්ෂණික සහකාර** සහ **දුම්රිය සහකාර සේවිකාවන්** වන අතර ඊළඟ වැඩිම සංඛ්‍යාව **(217) දුම්රිය ලිපිකරු සේවිකාවන්ය.** ඉන් පසුව පිළිවෙළින් **කළමනාකරණ සහායක (185), කාර්යාල සේවක සේවය (178)** සහ **සංවර්ධන නිලධාරීන් (126)** වශයෙනි. මුළු දෙපාර්තමේන්තුව තුළම සිටින්නේ ශ්‍රී ලංකා පරිපාලසේවයෙන් පැමිණි **එක කාන්තා අතිරේක සාමාන්‍යධිකාරී වරියක්** සහ **ඉංජිනේරුවරියන් 17 දෙනකු** පමණකි.

දුම්රිය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ තනතුරු සඳහා දැන්වීම් පළකිරීමේදීද, මෙම ස්ත්‍රී පුරුෂ අසාධාරණය පෙන්නුම් කෙරෙයි. "තුන්වන ශ්‍රේණියේ විධායක සේවා කාණ්ඩයේ සහකාර අධිකාරී (වාණිජ / ප්‍රවාහන) සඳහා විවෘත තරග විභාගයකට මෑතකදී ඉල්ලුම්පත් කැඳවනු ලැබීය. තනතුරු දොළහක් සඳහා බඳවා ගැනීම් කළ යුතු විය.

විභාගයට පෙනී සිටීම සඳහා එක් නිර්නායකයක් වූයේ "ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම සහ පුරුෂ අයදුම්කරුවකු වීම"යි. අනෙක් නිර්ණායක වුයේ හොඳ චරිතයකින් යුක්ත වීම සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් සුදුසු වීමයි.

ඒ අනුව, විධායක ශ්‍රේණිවලට ඇතුළු කර ගැනීම සිදුකරනු ලබන්නේ පුරුෂයින්ට සීමා වූ විභාග තුළිනි. ඉන් පසු, ඉහළ මට්ටමේ තනතුරු සඳහා සුදුසුකම් සීමා වන්නේ එම පුරුෂයන් අතරින් අභ්‍යන්තර උසස්වීම්වලට පමණකි. මේවා සැලකිය යුතු ලෙස ඉහළ වැටුප් සහිත රැකියා ශ්‍රේණි වෙයි.

ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානයේ දැනට කාන්තාවන් කී දෙනෙකු පුහුණුව ලබන්නේද යන්නද තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත මගින් විමසනු ලැබීය. සම්පූර්ණ වාර්ෂික බඳවාගැනීම වන 90ක් අතරින් එහි දැනට ඉගෙනුම ලබන කාන්තාවන් සංඛ්‍යාව 21 දෙනෙකි. එය ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 23කි.

කෙසේ වෙතත්, මෙහි බඳවාගැනීම් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයටම විවෘත වුවද (එහිදී ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ නිර්නායකයක් නැත) එයට ආවේනික වූ සීමා කිරීම් නිසා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව තුළ කාන්තා පුහුණුවන්නන්ට ඇති වෘත්තීය අවස්ථා අඩුය.

**නාමිනි විජේදාස**
*The Sunday Timess - 14 Jul 2019*



# ලක්විජය බලාගාරයේ පළමු ඒකකය වැඩ කළ කාලයෙන් අඩක්ම ක්‍රියාත්මක වුණේ ධාරිතාවට අඩුවෙන්

**සම්පූර්ණ විභවය ලබාගැනීමට තවත් රුපියල් මිලියන 330 ක් අවශ්‍යයි**

**2015 සිට ක්‍රියාත්මක වූ කාලයෙන් අඩකට ආසන්න කාලයක දී ලක්විජය ගල් අඟුරු විදුලි බලාගාරයේ එක ඒකකයක් ක්‍රියාත්මක වී ඇත්තේ එහි ධාරිතාවට වඩා අඩුවෙන් බවත් එහි සම්පූර්ණ විභවය ලබා ගැනීමට රජයට තවත් රුපියල් මිලියන 330ක් වියදම් කිරීමට සිදු වන බවත්, සන්ඩේ ටයිම්ස් පුවත්පතට දකින්නට ලැබුණු දත්ත සහ ලිපි ලේඛන මගින් අනාවරණය වේ.**

මෙම ක්ෂේත්‍රයේ නියාමකයා වන මහජන උපයෝගිත කොමිසන් සභාවෙන් ලබාගත් දත්තවලට අනුව පෙනී යන්නේ චීනය විසින් ඉදිකරන ලද බලාගාරයේ පැරණිම සහ මුලින්ම සවි කළ පළමු ඒකකය ජාතික පද්ධතියට **මෙගාවොට් 270ක්** එකතු කරමින් අවසන් වරට සම්පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක වී ඇත්තේ **2017 අප්‍රේල් මාසයේ දී** බවයි. (ඒකක තුනකින් යුතු බලාගාරයේ සෑම ඒකකයක්ම **මෙගා වොට් 300ක** විදුලියක් ජනනය කළ යුතු වුවත් ඉන් මෙගා වොට්

30ක් පමණ වැය වන්නේ එම යන්ත්‍රයේම ක්‍රියාකාරිත්වය සඳහාය.)

2015 ජනවාරි සහ 2018 අප්‍රේල් (එය මෙගා වොට් 80ක් පමණ අඩුවෙන් ලබාදෙමින් ක්‍රියාත්මක වන) දක්වා කාලයෙන් **සියයට 41කදී පළමු ඒකකය ක්‍රියාත්මකව තිබී නැත.** එය සම්පූර්ණ ධාරිතාවෙන් ක්‍රියාත්මක වී ඇත්තේ **මුළු කාලයෙන් සියයට 27කදී** වන අතර **මෙගා වොට් 190ක** පමණ බලයක් ලබාදෙමින් ක්‍රියාත්මක වී ඇති කාලය **සියයට 24කි.** මෙම කාලය තුළ ප්‍රධාන **ඇනහිටීම් 12ක්**ද සිදු වී තිබේ.

## අර්බුද පිරුණු ලක්විජය ගල් අඟුරු බලාගාරය

තොරතුරු දැනගැනීමේ පනත (*RTI*) යටතේ ලබාගත් වාර්තාවකින් පෙන්නුම් කළේ, **2017 අප්‍රේල් 17 සහ 24** අතර කාලයේ පළමු ඒකකයේ බොයිලේරුවේ පිපුරුම් දෙකක් හටගෙන ඇති බව සහ එයින් 'ජාල බිත්ති නල'වල පැළීම් සිදු වී ඇති බවයි. බොයිලේරුවේ චීන නිෂ්පාදකයින් වන හර්බින් බොයිලේරු සමාගමේ ද්‍රව්‍ය පර්යේෂණ ආයතනයෙන් ලබාදුන් වාර්තාවේ සඳහන් වන්නේ 'බොයිලේරු ජලයේ අඩු ගුණාත්මක තත්ත්වය' නිසා ඇති වූ ක්ෂාරීය විඛාදනය හේතුවෙන් නලවල ඝනකම වෙනස්වීම පැළීම් ඇති වීමට හේතු වූ බවයි.

විදුලි බලාගාරයක අත්‍යවශ්‍ය අංගයක් වන බොයිලේරුව මගින් ජලය හුමාලය බවට පත් කිරීමෙන් ටර්බයින කරකැවීම සිදු කරයි. සැලසුමේ ලබාදෙන පිරිවිතරයන්ට අනුව නියමිත ගුණාත්මකභාවයෙන් යුතු ජලය යෙදීම සහතික කිරීම ගැන බලශක්ති විශේෂඥයකු කීවේ එය බොයිලේරු කළමනාකරණයේ ඉතාම මූලික කරුණක් බවයි. එම ප්‍රමිතිය පවත්වා ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය සමත් වී නැත.

ලබන මාසයේ ප්‍රධාන වැඩි දියුණු කිරීමක් සඳහා පළමු ඒකකය නතර කිරීමට නියමිතය. බොයිලේරුව පරීක්ෂාවට ලක් කිරීමට සිවනු ඇති අතර බොහෝවිට විශාල වියදමක් දරා අලුත් බොයිලේරුවක් සවි කිරීමට සිදු වනු ඇත. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ කළ තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් ලංකා විදුලි බල මණ්ඩලය ප්‍රකාශ කළේ **"ලක්විජය බලාගාරයේ පළමු ඒකකය සම්පූර්ණ ධාරිතාවෙන් ක්‍රියාත්මක වන තත්ත්වයට පුනරුත්ථාපනය කිරීම සඳහා තක්සේරු කොට ඇති වියදම රුපියල් මිලියන 330ක්"** වන බවයි.

පළමු ඒකකයේ විද්‍යුත් ස්ථිතික ප්‍රපාතකාරකය (ESP) සහ නල වායු සල්පහරණකය (*FGD*) දිගින් දිගට අක්‍රිය වීම නිසා පළමු ඒකකයේ ටර්බයින් තටු සහ කන්ඩෙන්සර් නාල සහ තවත් දේ අලුතින් සවිකොට ඇත. කුඩා අංශු පෙරා ඉවත් කරන මෙවලමක් වන *ESP* මගින් මේ අවස්ථාවේ කරන්නේ හමායන වාතයෙන් අළු ඉවත් කිරීමයි. FGD ය මගින් නළ වායුවලින් සල්පර් ඩයොක්සයිඩ් ඉවත් කරයි.

**"පාදක භාර බලාගාරයක් මේ මට්ටමින් ක්‍රියා විරහිත වීම හෝ ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබීම හෝ සීමිත බලාගාර පද්ධතියක් ඇති රටකට ඉතාමත් වියදම් අධිකයි"** යනුවෙන් නම සඳහන් කිරීමට නොකැමැති බල ශක්ති විශේෂඥයෙක් පැවැසීය. ඔහු වැඩිදුරටත් කීවේ **"අප සතුව බලාගාර තිබුණත්, අපට වෙනත් මූලාශ්‍රවලින් - එනම් මූලික වශයෙන් ඩීසල්වලින් විදුලිය නිපදවන්නට සිදුවෙයි"** යනුවෙනි.

වසරකට වැඩි කලක් තිස්සේ මෙගා වොට් 80ක හිඟයක් අපට නිපදවාගන්නට වන්නේ, ධාරිතාව වශයෙන් මෙන්ම ඩීසල්වලින් නිපදවීම යන දෙආකාරයෙන්ම වියදම් අධික ලෙසටය. එය **මසකට බිලියන 10ක්** තරම් වන විශාල වියදමක් නිසා **රුපියල් මිලියන 330ක්** වියදම් කොට ප්‍රශ්නය විසඳීම නොකර සිටීමට හේතුවක් නැති බවද ඔහු වැඩිදුරටත් පැවසීය.

**"පද්ධතිය ක්‍රියාත්මක වන ආකාරය බැලූ විට පෙනෙන්නේ මාස 40ක කාලයක් තුළ වසා දැමීම් 14ක් සිදු ඇති බව"** යයි නිරීක්ෂණය කළ ඔහු කීවේ **"මෙය මස තුනකට සැරයකට වඩා වසා දැමීමක්, පාදක භාර බලාගාර වසරකට දෙවරකට වඩා වහන්නේ නැහැ"** යනුවෙනි.

**"ප්‍රමාණයට වඩා ආරම්භ කිරීම් සහ නැවතීම් සිදු කිරීමෙන් බෝයිලේරුවේ තාප තෙහෙට්ටුවක් ඇති වන බවටත්, එමගින් චක්‍රීය තාප විචලනයන්හිදී බලාපොරොත්තු වන දරාගැනීමේ සීමාවට එහා යෑමට බොහෝ කොටස්වලට සිදු වන බවටත්, එය ජීව කාලය සහ විශ්වසනීයත්වය අඩු වීමට හේතු වන බවටත්"** ඔහු  අනතුරු ඇඟවීය.

ඒ අතර, මේ සතියේ සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවකදී ඇතුළුව, විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේත්, ලංකා විදුලිබල මණ්ඩලයේත් බලගතු බලකිරීම් තිබියදීත්, ලක්විජය ගල් අගුරු බලාගාරයේ ගිය වසරේ කල් ඉකුත් වූ පරිසර ආරක්ෂණ සහතිකය නැවත ලබාදීමට වයඹ පළාත් සභාවේ පරිසර අධිකාරිය තවම කටයුතු කොට නැත.

පරිසර ප්‍රශ්න ගැන සොයා බැලීමට ආයතන ගණනාවක **නියෝජිතයින් 15 දෙනකුට** වැඩි පිරිසකගෙන් සමන්විත අධීක්ෂණ කමිටුවක් මීට පෙර පත්කරනු ලැබීය. පරිසර ආරක්ෂණ සහතිකය නැවත ලබාදිය හැකිදැයි තීරණය කිරීම සඳහා වයඹ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ සභාපතිත්වයෙන් මෙම කමිටුව ලබන සතියේ රැස් 0වීමට නියමිතය.

**"සහතිකය දෙන ලෙස අපෙන් ඉල්ලා තිබෙනවා. තීරණයක් ගැනීමට පෙර, අපගේ පරිසර ප්‍රමිතීන් සියල්ල ලංකා විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක කොට තිබෙනවාද කියා තක්සේරුවකට පැමිණීමට අපට සිදුවෙනවා"** යි වයඹ පළාත් සභාවේ පරිසර අධිකාරියේ ප්‍රධානී **සමන් ලෙනදුව** ප්‍රකාශ කළේය. කුරුණෑගලදී හෝ කල්පිටියේ ගල් අඟුරු බලාගාරයේදී හෝ රැස්වීම කැඳවනු ඇත.

**නාමිනි විජේදාස**

*The Sunday Times - June 17, 2018*



# ප්‍රධාන විධායකගේ වැටුප හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ ශ්‍රී ලන්කන් එයාර් ලයින්ස් ස්ථාවරය

# තොරතුරු දැනගැනීමේ කොමිසම ඉවත දමයි

### ජාතික ගුවන්සේවය දැන් අභියාචනාධිකරණයට යනු ඇත

එය තොරතුරු දැනගැනීමේ පනතේ අධිකරණ බලයට යටත් නොවන කරුණක්ය යන පදනම මත, තම ප්‍රධාන විධායක නිලධාරියාගේ වැටුප් සහ දීමනා ආදී තොරතුරු හෙළිදරව් කිරීමට ශ්‍රී ලන්කන් එයාර් ලයින්ස් සමාගම බැඳී නැති බවට සමාගම ඉදිරිපත් කොට තිබූ විරෝධතාවය තොරතුරු දැනගැනීමේ කොමිසම විසින් ඉවත දමනු ලැබීය.

මාර්තු 23 දාතමෙන් ප්‍රකාශයට පත් කළ කොමිසමේ තීරණයේ සඳහන් වන්නේ ශ්‍රී ලන්කන් ගුවන් සමාගම තොරතුරු දැනගැනීමේ පනතේ විෂය පථයට අයත් වන බවට කිසිදු සැකයක් නැති බවයි. **"ඊට වෙනස් තීරණයකට පැමිණීමෙන් සිදු වන්නේ තොරතුරු දැනගැනීමේ පනතින් අදහස් කරන ආකාරයට ඵලදායි සහ සුමට ක්‍රියාකාරී පද්ධතියක් පැවතීමට හානි කරමින්, අවිනිශ්චිතතාවය,**



**ඝර්ෂණ සහ වියවුල් ඇති වීම**"යයි එම නියෝගයේ සඳහන්ය.

**එහි සඳහන් වන්නේ තොරතුරු දැනගැනීමේ පනත මගින් යෝජනා කොට ඇති "සුවපත් කිරීමේ සහ විසඳුම් දීමේ" ක්‍රියාමාර්ග අපතේ නොහැරිය යුතු බවයි. තොරතුරු දැනගැනීමේ පනත නීතිගත කිරීමේ අරමුණ වූ "රාජ්‍ය බලධාරීන් අතර විනිවිදභාවයේ සහ වගවීමේ සංස්කෘතියක් පවත්වාගැනීම" පරාජය කිරීමට ද ඉඩ නොදිය යුතු බවයි.**

ජාතික ගුවන් සේවය, තොරතුරු දැනගැනීමේ පනතින් අදහස් කරන "පොදු අධිකාරියක්" යන නිර්වචනයට නොගැනෙන බව තීරණය කිරීමේ නියෝගයක් ලබාදීම ශාපයක් විය හැකි බවද ඔවුන්ගේ අදහස ලෙස කොමිසම ප්‍රකාශ කරයි.

**"මෙමගින් වග උත්තරකාර ජාතික ගුවන් සේවය පමණක් නොව, වෙනත් සමාගම් විශාල සංඛ්‍යාවක් ද තමන් තොරතුරු දැනගැනීමේ පනත යටතේ ප්‍රශ්න කළ නොහැකි, එයින් නිදහස් ආයතන ලෙස හිමිකම් කියන තත්ත්වයට පත් විය හැකි වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස එම පනතේ 43 (එ) වගන්තිය නිෂ්ඵල බවට පත්වනු ඇත"** යි එය පෙන්වා දෙයි.

මෙම තීරණයට එරෙහිව අභියාචනාධිකරණයෙන් සහනයක් පැතීමට ශ්‍රී ලන්කන් ගුවන් සේවය දැන් කටයුතු කරනු ඇත. මෙහි ප්‍රතිඵලය වන්නේ, තම ප්‍රධාන විධායක නිලධාරියාගේ, මානව සම්පත් අංශ ප්‍රධානීගේ සහ ප්‍රධාන වාණිජ නිලධාරීගේ වැටුප්, දීමනා සහ වෙනත් ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු, පකිස්ථාන ගුවන් සේවය සමග ගුවන්යානා මිල දී ගැනීමේ ගිවිසුම් පිළිබඳ තොරතුරු, A 350 එයාර් බස් ගනුදෙනුව අවලංගු කිරීම ගැන තොරතුරු, ප්‍රධාන විධායක නිලධාරියාට ශ්‍රී ලන්කන් සමාගමෙන් ලබාදුන් පෞද්ගලික ගුවන් නියමු පුහුණුවට දැරූ වියදමේ තොරතුරු ආදිය ලබා නොදීමට ඉල්ලීම සඳහා දැනටත් අමාරුවේ වැටී ඇති ජාතික ගුවන් සේවයේ මහජන මුදලින් තවත් වියදමක් දරන්නට සිදු වීමයි.

මෙම තොරතුරු සඳහා ඉල්ලුම් පත්‍රය, තොරතුරු දැනගැනීමේ පනත යටතේ **2017 ජුනි මාසයේදී** පළමුවරට ඉදිරිපත් කරන ලද්දේ ශ්‍රී ලංකා ගුවන් සේවා නියමු සංසදය විසිනි. එය ප්‍රතික්ෂේප කළ විට සංසදය එයට එරෙහිව තොරතුරු දැනගැනීමේ කොමිසමට **2017 සැප්තැම්බරයේදී** පැමිණිලි කළේය. අභියාචක ශ්‍රී ලංකා ගුවන් සේවා නියමු සංසදය **2017 දෙසැම්බරයේදීත්** මෙම වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවලදීත් ලිඛිත දේශන ඉදිරිපත් කළේය. වගඋත්තරකාර ශ්‍රී ලන්කන් එයාර් ලයින්ස් සමාගම ඔවුන්ගේ දේශන මේ වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවලදී ඉදිරිපත් කළේය.

විභාගය යන අතරතුර, ශ්‍රී ලන්කන් සමාගම මූලික විරෝධතාවක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කළේ, එය 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද සමාගමක් නොවන බවත්, එම නිසා එය තොරතුරු දැනගැනීමේ පනතේ 43 (එ) වගන්තියේ අර්ථ දක්වා ඇති **"පොදු අධිකාරයක්"** නොවන බවත්ය.

තොරතුරු දැනගැනීමේ පනතේ සමාගමක් අර්ථ දක්වා ඇත්තේ සමාගම් පනත යටතේ පිහිටුවන ලද **"රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ රජය සහ රාජ්‍ය සංස්ථාවක් එක්ව හෝ**

**කොටස් අයිතියෙන් සියයට විසිපහකට වැඩි හිමිකමක් දරන හෝ වෙනත් ආකාරයකින් පාලනය කිරීමේ වුවමනාව ඇති**" ආයතන වශයෙනි.

ශ්‍රී ලන්කන් එයාර් ලයින්ස් සමාගම ඉදිරිපත් කළේ එය සමාගම් ආඥාපනත යටතේ **1979**දී, එයාර් ලංකා ලෙස පිහිටුවනු ලැබූ බවයි. **1999දී** එහි නාමය ශ්‍රී ලන්කන් එයාර් ලයින්ස් ලෙස වෙනස් කරන ලද්දේ **1982** සමාගම් පනත යටතේය. පනත මගින් නියම කොට තිබූ ආකාරයට **2007 අංක 7 දරන සමාගම් පනත යටතේ** එය නැවත ලියාපදිංචි කරනු ලැබීය.

ශ්‍රී ලන්කන් සමාගම ප්‍රකාශ කළේ එය **2007** පනත යටතේ පිහිටුවන ලද්දක් නොවන නිසා සහ පවතින සමාගමක් ලෙස නැවත ලියාපදිංචි කිරීම පමණක් සිදු කළ නිසා, තොරතුරු දැනගැනීමේ පනතේ **43 (එ)** වගන්තිය යටතේ වන නිර්වචනය එයට අදාළ නොවන බවයි.

තම තීන්දුවේදී තොරතුරු දැනගැනීමේ කොමිසම පෙන්වා දී ඇත්තේ, 2007 සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස ශ්‍රී ලන්කන් එයාර් ලයින්ස් සමාගම ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් වන ආකාරයට එය විස්තර කොට ඇත්තේ, පනත යටතේ **"පිහිටුවන ලද ලෙස සැලකෙන"** සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි වූ **"දැනට පවතින සමාගමක්"** වශයෙන් බවයි.

**2007 පනත** යටතේ අලුතින් පිහිටුවන ලද සමාගමක් සහ ඊට පෙර පැවති නීතියක් යටතේ පිහිටුවන ලද සමාගමක් අතර වෙනසක් පවතින්නේ වුවද එය **2007 පනත** යටතේ පාලනය නියාමනය කිරීමේ පහසුව සඳහා එම පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ පැවති තත්ත්වය දැක්වීම සඳහා ඇති කෘත්‍රිම වෙනසක් විනා, සදාකාලිකව පවත්වාගෙන යෑම අරමුණු කොටගත් වෙනසක් නොවේ.

තොරතුරු දැනගැනීමේ පනත තමන්ට බලපාන්නේ නැති බවට ගුවන් සමාගම විරෝධතා ඉදිරිපත් කළේ, ශ්‍රී ලන්කන් එයාර් ලයින්ස් සමාගම එම පනතට අනුගත වෙමින් ඒ අනුව තොරතුරු නිලධාරියකු සහ නම් කළ නිලධාරියකු ද පත්කිරීම ඇතුළු කටයුතු වසරකට වැඩි කලක් කරගෙන යෑමෙන් පසුව බවද කොමිසම පෙන්වා දුන්නේය.

එයට අමතරව, සමාගම තමන්ගේ නීතිමය ලිපි ලේඛනවලදී මෙන්ම ඔවුන්ගේ වෙබ් අඩවියේ පළ කොට ඇති නීතිමය දැන්වීම මගින්ද, ශ්‍රී ලන්කන් එයාර් ලයින්ස් සමාගම **2007 සමාගම් පනත යටතේ** පිහිටුවන ලද්දක් බව නිල වශයෙන් තහවුරු කොට ඇත.

**නාමිනි විජේදාස**
*The Sunday Times - April 01, 2018*



www.solidaridadnetwork.org

# භූගත ජලය අධීක්ෂණයේ විශාල කොන්ත්‍රාත්තුවක් ඕලන්ද සමාගමකට හිමිවෙයි

**නිදන්ගත වකුගඩු රෝගයට ගොදුරුවීමේ වැඩිම අවදානම් සහිත ප්‍රදේශ තුනක් ලෙස හඳුනාගෙන ඇති, මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය භූගත ජල අධීක්ෂණ ජාලයක් ස්ථාපිත කිරීමේ යුරෝ මිලියන ගණනක (රුපියල් බිලියන 4.4ක) නියමු ව්‍යාපෘතියක් ලබා ගැනීමට ඕලන්ද සමාගමක් සමත් වී ඇත.**

භූගත ජල මට්ටම, නයිට්රේට් සාන්ද්‍රණය සහ පී එච් අගය වැනි දත්ත ඒ මොහොතේම ලබාගත හැකි වන උපාංග සවි කිරීම සඳහා **සිදුරු 150ක්** කැණීම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරෙයි. එම දත්ත ජල සම්පත් මණ්ඩලයේ දත්ත කළමනාකරණ මධ්‍යස්ථානයට කෙලින්ම සම්ප්‍රේෂණය කරනු ලබන අතර එහි දී විශ්ලේෂණය කරනු ලබයි. රටේ භූගත ජල තත්ත්වය පිළිබඳව දිනපතා අනාවැකි කීමටද සැලසුම් කරමින් පවතියි.

නෙදර්ලන්තයේ පදනම් වූ එම් / එයිජෙකල්කාම්ප් අර්ත් සාම්පලින් ග්‍රෑප්

(*M / Eijekelkamp Earth Sampling Group*) සමාගම, ඉල්ලීමක් නොකළ යෝජනාවක් 2013 දී පළමුවරට ශ්‍රී ලංකා රජයට ඉදිරිපත් කළේය. වසර දෙකකට පසු, ආණ්ඩුව වෙනස් වීමෙන් පසුව, අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් යුතු වූ, ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව එම යෝජනාව නැවතත් සැලකිල්ලට ගත් බව, තොරතුරු දැනගැනීමේ නීතිය යටතේ ලබාගත් ලේඛන පෙන්නුම් කරයි.

**පළමු යෝජනාව වුයේ යුරෝ මිලියන 32ක පමණ වියදමකින්, මුළු රටම ආවරණය වන සම්පුර්ණ ජාලයක් සඳහා වුවද, යුරෝ මිලියන 23.3ක පමණ (දේශීය බදු ද ඇතුළත්ව) වියදමකින් නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම ආණ්ඩුවේ තෝරාගැනීම වීය.**

කුඩා ආරම්භකත්වය සඳහා වියදම **සම්පුර්ණ ව්‍යාපෘතියේ මුළු වියදමෙන් සියයට 65ක්** තරම් ඉතා විශාල විය. කෙසේ වෙතත්, පළමු ඉල්ලුම ඉදිරිපත් කිරීමේ සිට ගතවුණු කාලය තුළ සිදු වී තිබෙන සියයට නවයක මිල ඉහළ යෑම සමාගම විසින් දරාගනු ලැබීම ඇතුළු පදනම් ගණනාවකින් මිල සාධාරණීකරණය කරනු ලැබීය. ඕලන්දයේ අපනයන ණය සම්පාදන ආයතනය වන අම්ට්‍රාඩියස් ඩී. එස්. බී. (*Amtradius DSB*) සහය ඇතිව නෙදර්ලන්තයේ රබෝබෑන්ක් (*Rabobank Netherlands*) බැංකුව ව්‍යාපෘතියට මුල්‍ය පහසුකම් සපයයි. වසර තුනක සහන කාලයක් සමඟ **ණය ගෙවීමට වසර 15ක් හිවෙයි.**

**ව්‍යාපෘති කමිටු වාර්තාව සඳහන් කරන්නේ, ශ්‍රී ලංකාව පුරා භූගත ජලයේ තත්ත්වය සැලකිය යුතු අයුරින් වෙනස් වන බවයි. ඇතැම් ප්‍රදේශවල නොගැඹුරු ජලධර ඇති අතර ඒවා වැසි සමයන් තුළ හෝ අවට භූමිය මත ජල සම්පත් මගින් හෝ ඉක්මනින් නැවත පිරවීම සිවෙයි. මෙම වර්ගයේ භූගත ජලය සාමාන්‍යයෙන් පමණට වඩා භාවිත වෙයි.**

පුළුල් ලෙස සිදුවන ළිං කැපීම සහ පොම්ප කිරීම, අධි නිස්සාරණයේ සහ භූගත ජලය දුෂණය වීමේ අවදානම වැඩි කරයි. ඒ අතර, දිගු කලක් එක දිගට පවතින වැසි මගින් ජලධර ගංවතුර ඇති කරමින් ජල තලය සාමාන්‍ය මට්ටමට වඩා ඉහළ නංවයි.

**හේතු හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය පවතින වියළි කලාපයෙන් 2011 දී ලබාගත් පානීය ජල නියැදි සියල්ලෙහිම පාහේ ඉහළ ආසනික් සහ රසදිය ප්‍රමාණ අඩංගු බව අනාවරණය වී යයි වාර්තාව පෙන්වා දෙයි. "මෙම ප්‍රදේශ මේ රටේ භූගත 'කිවුල් ජලය' ඇති ප්‍රදේශ සමග සමපාත වන" බව එහි සඳහන් වෙයි. "කිවුල් ජලයේ කැල්සියම් දක්නට ලැබීම අපගේ වියළි කලාපයේ පවතින විශේෂ තත්ත්වයකි. කැල්සියම් ආසනික් සමග ප්‍රබල සම්බන්ධයක් ඇතිකර ගන්නා අතර කිවුල් ජලය. තුළ වෙන් කර ගැනීම අපහසුය.**

ඇතැම් ප්‍රදේශවල නොගැඹුරු ළිං සඳහා සහනාධාර ලබාදෙන බව සහ "ජල සම්පතෙහි ලබාගත හැකි ප්‍රමාණය පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් තොරව ඇතැම් රජයේ, පළාත් මෙන්ම රාජ්‍ය නොවන සංවිධානද, භූගත ජලය උපයෝජනය ක්‍රියාකාරී ලෙස වර්ධනය කරන" බව කියන වාර්තාව වැඩි දුරටත් කියන්නේ " පාලනයකින් සහ කළමනාකරණයකින් තොරව භූගත ජලය සංවර්ධනය බරපතළ ප්‍රතිවිපාක දිය හැකි ක්‍රියාවක් බව ප්‍රතිපත්ති සම්පාදකයින්, ආධාර දෙන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන තේරුම් ගත යුතු" බවයි.



**නිතිපතා දත්ත රැස්කිරීමේ, විග්‍රහ කිරීමේ සහ ගබඩා කිරීමේ ක්‍රම සහිත ඵලදායි භූගත ජල අධීක්ෂණ සහ කළමනාකරණ පද්ධතියක් ඇත්නම් මෙම තත්ත්වයන් බොහොමයක් පාලනය කිරීමේ සහ අවම කිරීමේ හැකියාව ඇත. ජල කළමනාකරණය සඳහා නිවැරදි සහ හොඳින් තොරතුරු දැන තීරණ ගැනීමට එමගින් හැකියාව ලැබෙන බව වාර්තාව කියයි.**

අධීක්ෂණ ක්‍රමයක්, විශේෂයෙන් එය රටේ සෙසු ප්‍රදේශවලට ව්‍යාප්ත වූ විට, ජනතාවට, **වාණිජ සහ කාර්මික භාවිතයට ජල සැපයුම වර්ධනය කිරීමට හැකියාව ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. වාරි මාර්ගවලදී, විශේෂිත ප්‍රදේශවල වත්මන් සහ අනාගත සංවර්ධනය සඳහා ජල මට්ටම සහ තලය පිළිබඳ තොරතුරු සැපයීම; කෘෂිකර්මයේ දී රෝගවලින් වගා ආරක්ෂා වන පරිදි, දූෂිත හෝ භාවිතයට නුසුදුසු ජල මුලාශ්‍ර මග හරිමින්, වඩා හොඳ අස්වැන්නකට සුදුසු නව සහ කල් පවතින ජල මුලාශ්‍ර හඳුනාගැනීම** සහ ලබා ගැනීමත් ; සෞඛ්‍යයේ දී අධික ලෙස පොහොර, කෘමිනාශක, වල්නාශක භාවිතය නිසාත්, අනුචිත ආකාරයෙන් සැලසුම් කළ අපජල බැහැර කිරීමේ ස්ථාන මෙන්ම, ජලගැලීම් සහ නියගයන් නිසාත් භූගත ජල සම්පත් දුෂණය වීම හේතුවෙන් ඇති වන ජලය මුල් කර ගත රෝග තුරන් කිරීමත් කළ හැකි වෙයි.

**නියග, නාය යෑම්, භූමි චලන වැනි ස්වභාවික ව්‍යසන මෙන්ම, තවත් බොහෝ ස්වභාවික ව්‍යසන, භූගත ජලයේ හැසිරීම අධීක්ෂණයෙන් පුරෝකථනය කළ හැකි බව වාර්තාව කියයි. පරිසර ආරක්ෂණය ක්‍රියාත්මක වන ප්‍රදේශවලදී, අධික ලෙස පොහොර භාවිතය හෝ කාර්මික රසායන ද්‍රව්‍ය කාන්දුව නිසා හෝ වැනි දූෂණයන් වළකමින් පරිසරය ආරක්ෂා කර ගැනීමට අධීක්ෂණ ක්‍රමයක් ආධාර විය හැකිය.**

ව්‍යාපෘතියේ ක්ෂේත්‍රය මුළු රටටම පුළුල් කිරීමේ වැදගත්කම අවධාරණය කරන ව්‍යාපෘති කමිටුව කියන්නේ තාක්ෂණය ගලා ඒම යෝජිත නියමු ආරම්භාකත්වයේ වැදගත් අංගයක් බවයි. "නියමු ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසුව යෝජනාකරුගේ (*Eijekelkamp*) සීමිත සම්බන්ධයක් සහිතව මුළු රටම ආවරණය වන පරිදි අධීක්ෂණ ජාලය පුළුල් කිරීම සඳහා අවශ්‍ය සියලු ම කුශලතා සහ විශේෂඥ දැනුම ජල සම්පත් මණ්ඩලය සතු වන බව කමිටුවේ අදහස" යයි එමගින් අවධාරණය කරයි. ව්‍යාපෘතිය සඳහා දේශීය උප කොන්ත්‍රාත්කරුවන් සතර දෙනකු නම් කොට ඇත. එක් අයකු විදේශිකයකු සහ තිදෙනකු දේශීය වන ලෙස ජල විද්‍යාඥ කණ්ඩායමක් වනු ඇත. ව්‍යාපෘතිය ව්‍යාප්ත කරන අවස්ථාව වන විට ඕලන්ද සමාගම උපකරණ සැපයීමට සහ කෙටිකාලීන උපදේශක සේවාවන්ට සීමා වනු ඇති අපේක්ෂා කෙරෙයි.

**නාමිනි විජේදාස**
*The Sunday Times - May 13, 2018*




www.pressreader.com

# ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම් : භාණ්ඩාගාරය බැංකුවලට

# රුපියල් බිලියන 22.92ක් ණයයි

**ආණ්ඩුවේ උපදෙස් මත ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථිර තැන්පතු සඳහා ගෙවන ඉහළ පොලිය පියවීම වෙනුවෙන් භාණ්ඩාගාරය වාණිජ බැංකුවලට රුපියල් බිලියන 22.92 කට වඩා ණය වී ඇති බව තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ලබාගත් දත්ත පෙන්නුම් කරයි. ජ්ෂේඨ පුරවැසියන්ගේ මිලියන එකක් දක්වා වන ස්ථිර තැන්පතු සඳහා සියයට 15 ක විශේෂ පොලී අනුපාතයක් ගෙවන ලෙස 2015 අයවැය මගින් ආණ්ඩුව වාණිජ බැංකුවලට නියම කළේය. මුදල් අමාත්‍යාංශය, 2017 දී, ස්ථිර තැන්පතුවල ඉහළ සීමාව මිලියන 1.5 ක් දක්වා වැඩි කළ නමුත් පොලී අනුපාතය සියයට 15 ක ම තිබෙන්නට හැරියේය.**



විශේෂ පොලී අනුපාතය සහ වාණිජ බැංකු මගින් ගෙවනු ලබන සම්මත වෙළෙඳපොල පොලී අනුපාතය අතර වෙනස භාණ්ඩාගාරය විසින් ගෙවිය යුතු වීය. කෙසේ වෙතත් බැංකුවලට අවසන් ගෙවීම සිදුකොට ඇත්තේ **2016** දී ය. එතැන් සිට, හිඟ මුදල් එකතුවන්නට වූ අතර ප්‍රතිපූරණයක් සිදුවූයේ නැත. උදාහරණයක් ලෙස **2017** දී **බැංකුවලට ගෙවිය යුතු මුදල රුපියල් බිලියන 13,462** ක් වුව ද , ඒ කිසිවක් ගෙවා නැති බව තොරතුරු අමාත්‍යංශයේ දත්ත පෙන්නුම් කරයි. මෙම වසරේ මුල් කාර්තුවේ දී රුපියල් **බිලියන 3,304 ක් ගෙවිය යුතු වීය**. එම මුදල ද ගෙවා නැත.

**2016 දී ද සිදු කොට ඇත්තේ අර්ධ ප්‍රතිපූරණයක් පමණකි. භාණ්ඩාගාරයෙන් ගෙවිය යුතුව තිබු රුපියල් බිලියන 14.518 කින් රුපියල් බිලියන 6,156 ක් ගෙවනු ලැබීය.** ගෙවීමට තිබු මුළු මුදල වන **රුපියල් බිලියන 3.361 ක්** ගෙවන ලද්දේ ,මෙම සැලසුමේ පළමු වසර වූ **2015 දී** පමණකි. කෙසේ වෙතත්, මේ වන විට **2015 සිට** ගෙවන්නට තිබු මුළු මුදල වන **රුපියල් බිලියන 34.646 න් රුපියල් බිලියන 11.723 ක් භාණ්ඩාගාරය බැංකුවලට ගෙවා ඇත.** මෙම ක්‍රමය හඳුන්වාදීමත් සමග ජ්ෂේඨ පුරවැසි ස්ථාවර තැන්පතු ගිණුම් සංඛ්‍යාව වේගයෙන් ඉහළ ගියේය.

**2015** වසරේ මුල තිබු ඉතා අඩු පොලී අනුපාත මත පදනම් වෙමින් මුල්‍ය ආයතන තමන්ට ලැබිය යුතු මුදල ගණනය කරන හෙයින් භාණ්ඩාගාරය ගෙවීම් ප්‍රමාද කරන බවට මහා බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව **2016 දී** ලිපියක් නිකුත් කළ බව වාර්තා වෙයි. ගෙවිය යුතු මුදල ගණන් බලා නියාමකයා වෙත ඉදිරිපත් කිරීම බැංකු විසින් සෑම කර්තුවක ම කළ යුතු බව එමගින් ප්‍රකාශ කොට ඇත.

**එතැන් පටන් ම, ප්‍රශ්නයට කිසිදු විසදුමක් ලැබී නැත. ඒ වෙනුවට එම මුල ධර්මය යටතේ ම ක්‍රියාත්මක වන තවත් යෝජනා ක්‍රම මුදල් අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙනු ලැබ ඇත. මෑතක දී ක්‍රියාත්මක කළ එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය ක්‍රමය යටතේ ණය ක්‍රම ගණනාවක පොලී අනුපාතවලින් සියයට 25 සහ 75 අතර ප්‍රමාණයක් සහනාධාර ලෙස ලබාදීම ආණ්ඩුව භාර ගනියි.**

උදාහරණයක් ලෙස නව 'රිය ශක්ති' ණය යෝජනා ක්‍රමය යටතේ, පාසල් වෑන් හිමියකුට අලුතින් **ආසන 32 ක** බස් රථයක් මිල දී ගත හැකි වන්නේ **සියයට 13.5 ක** පොලී අනුපාතිකයකට වන නමුත් මිල දී ගන්නා ගෙවිය යුතු වන්නේ **සියයට 3.38** ක් පමණක් වන අතර, **සියයට 75** ක සහනාධාරයක් රජයෙන් හිමිවෙයි. කුඩා පරිමාණ ගොවීන්ට සහ ගොවි සංවිධානවලට වගා යාන්ත්‍රීකරණය සඳහා ලබාදෙන "ගොවි නවෝදා " යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ද තත්ත්වය එය ම ය.

**නාමිනි විජේදාස**

*The Sunday Times - September 09, 2018*



*http://archives.sundayobserver.lk/*

## සෑම වසරකම සිය ගණනක් දෙනා

# දුම්රිය පීලි මත මියයති

පසුගිය වසර තුනේදී **718** දෙනෙකු දුම්රිය අනතුරුවලින් ඛේදජනක ලෙස මියගොස් ඇත. කොරෝනා වෛරසය නිසා අගුළු දැමීම ක්‍රියාත්මක වූ මාස ගණනාවක් තිස්සේ දුම්රිය ගමන් සම්පූර්ණයෙන්ම පාහේ නැවතී තිබුණ ද වැඩිම සංඛ්‍යාව මියගොස් ඇත්තේ මෙම වසරේදීය.

දුම්රිය දෙපාර්තමේන්තුව මෙම මරණ බොහොමයක් වර්ගීකරණය කර ඇත්තේ සියදිවි නසාගැනීම් හෝ දුම්රිය මාර්ගවල වැරදිවල ප්‍රතිඵල ලෙස හෝ ඇති වූ අනතුරු වශයෙනි.

තොරතුරු දැනගැනීමේ ඉල්ලුම් පතක් මගින් සන්ඩේ ටයිම්ස් පුවත්පත දත්ත ලබා ගත්තේය.



**දුම්රිය අනතුරු නිසා 2018දී මරණ 230ක් සහ 2019දී මරණ 215ක් සිදු වී තිබේ. 2020 අගෝස්තු 10 දා වන විට 273ක්** ලෙස මරණ සංඛ්‍යාව ඉහළ ගොස් තිබේ. දිවයින පුරා ක්‍රියාත්මක වූ කොවිඩ් 19 අගුළු දැමීම නිසා මාස තුනක් පමණ දුම්රිය සේවා බොහොමයක් අවලංගු කොට තිබියදී මෙම සංඛ්‍යාව වාර්තා වීම කම්පා කරවන සුලුය.

**2018** වසරේ සිදු වූ **දුම්රිය අනතුරු 1,456ක දී, 230 දෙනකු මියගොස් 477ක් තුවාල ලබා ඇති අතර, මරණ 212 ක්** වර්ගීකරණය කොට ඇත්තේ **සියදිවි නසාගැනීම්** හෝ **මාර්ගයේ වැරදි නිසා** හෝ සිදු වූ ලෙසටය. වින්දිතයන්ගෙන් අති බහුතරය **(167)** පිරිමි ය. **2018** දී, හරස් මාර්ගවල අනතුරු මගින් **මරණ 13ක්** සහ තුවාල ලැබීම් 69ක් සිදු වී ඇත. දුම්රියෙන් වැටීම නිසා මියගොස් ඇති සංඛ්‍යාව පස් දෙනෙකි. **2019 දී දුම්රිය අනතුරු 1,385 කින් මරණ 215ක්** සිදු වී ඇති අතර තුවාල ලබා ඇති සංඛ්‍යාව **369කි. 15ක්** හැර අන් සියලු මරණ වර්ගීකරණය කොට ඇත්තේ සියදිවි නසාග නීම්/මාර්ගයේ වැරදි වශයෙනි. **මරණ 10ක් හරස් මාර්ගවල අනතුරු** ලෙස වර්ග කොට ඇති අතර **මරණ 5ක්** සිදු වී ඇත්තේ **මගීන් දුම්රියෙන් වැටීමේ** අවස්ථා **76ක් අතුරිණි.**

**2020දී මරණ 107ක්** දුම්රිය අනතුරු ලෙස වාර්තා කොට ඇති අතර වෙනත් මරණ 166ක් සියදිවි නසාගැනීම් ලෙස වර්ගීකරණය කොට ඇත. එම තොරතුරු තවමත් රැස් කරමින් පවතියි.

දුම්රිය පීලි පැනීම් නිතර සිදු වී ඇතත්, ඒ කිසිවකින් මරණ හෝ තුවාල හෝ සිදු වී නැත. **2018** සහ **2019** වසර දෙකේදීම **දුම්රිය පීලි පැනීම් 112ක්** තරම් සිදු වී ඇත. පසුගිය වසරේ දුම්රිය එකිනෙක ගැටීම් හයක් සිදු වී ඇතත්, ඒ කිසිවකින් මගීන්ට හානි සිදු වී නැත. එසේ වුවද , ඊට පෙර වසරේ එක් දුම්රිය ගැටුමක් සිදු වී එයින් **32 දෙනකු තුවාල ලබා තිබේ.**

අනතුරු අවම කිරීම සඳහා ගේට්ටු නොමැති හරස් මාර්ග සඳහා සීනු සහ ආලෝක අනතුරු ඇඟවීමේ ක්‍රම සවිකිරීමට දෙපර්තමේන්තුව කටයුතු කරමින් සිටින නමුත් දුම්රිය සාමාන්‍යධිකාරී **ඩිලන්ත ප්‍රනාන්දු** කියන්නේ එම කටයුතු **2023** තෙක් අවසන් නොවනු ඇති බව යි.

**"එබඳු ක්‍රමයක් ක්‍රියාත්මක කරන තෙක්, අනතුරු ඇඟවීමේ ක්‍රම නොමැති හරස් මාර්ගවල පොලිසිය යොදවන ලෙස අපි ඉල්ලා තිබෙනවා. සංඥා ක්‍රමය ක්‍රියාත්මක කළ පසුව පොලිසිය ඉවත් කරනු ලබනවා"** යි ඔහු ප්‍රකාශ කළේය.

**"ඒවා ක්‍රියාත්මක කිරීමට සේවකයින් යෙදවීමට සිදු වන නිසා, සැම හරස් මාර්ග යකම ගේට්ටු සවි කිරීමට හැකියාවක් දෙපාර්තමේන්තුවට නැහැ. තනි මාර්ගයක එක් හරස් මාර්ගයක් සඳහා තුන් දෙනකු යෙදවීමට අපට සිදු වනවා. ද්විත්ව මාර්ග යකට නම් හය දෙනෙකු යෙදිය යුතු යි. එක ගේට්ටු කරුවකුගේ වැටුප රුපියල් 50,000යි. අපට එතරම් විශාල පිරිසක් යොදවන්න බැහැ"** ප්‍රනාන්දු මහතා වැඩි දුරටත් පැවසීය.

හරස් මාර්ගවල ඇති සීනු සහ ආලෝක අනතුරු ඇඟවීම්වලට බොහෝ මෝටර් රථ ධාවකයන් සහ පදිකයන් අවනත නොවීමෙන් ඇති වන නොසැලකිල්ල නිසා බොහොමයක් මාර්ග අනතුරු සිදුවන බවට දුම්රිය සාමාන්‍යාධිකාරි වරයා එකඟ විය.

මෑතක දී සිදු වූ බරපතළ අනතුරු බොහොමයකදී තහවුරු වුණේ සීනුව නාදවෙමින් සහ රතු ආලෝකය දැල්වෙමින් තිබිය දී මෝටර් රථ ධාවකයින් හරස් මාර්ගය තුළට ධාවනය කොට ඇති බවයි. විවිධ වූ හරස් මාර්ගවලදී මෝටර් රථකරුවන්ට මුහුණ දීමට සිදුවන්නේ එකිනෙකට වෙනස් ප්‍රශ්නවලට බව ප්‍රනාන්දු මහතා වැඩි දුරටත් කියයි.

**"උදාහරණයක් ලෙස උතුරු මාර්ගය ගතහොත්, මාර්ගය බොහෝදුරට කෙළින් සහ පැහැදිලි නිසා දුම්රියට පැයට කිලෝ මීටර් 100ක් වේගයෙන් යා හැකියි"** ඔහු කීය.

**"මෙම මාර්ගයේ නිතරම පාහේ සිදුවන්නේ, දුම්රිය කොතරම් වේගයෙන් එන්නේද යන්න රියදුරන් වැරදියට තක්සේරු කිරීම හා දුම්රිය එන්නට පෙර මාර්ගය පසු කරන්නට තමන්ට හැකි වෙතැයි ඔවුන් විශ්වාස කිරීමයි. සීනු නාදවෙමින් සහ ආලෝක සඥා දැල්වෙමින් අනතුරු අඟවද්දී, ඔවුහු වහාම මාර්ගයට වාහන දමති. ඔවුන් තමන්ගේ වරද තේරුම් ගන්නා විට ප්‍රමාද වූවා වැඩිය."**

වංගු විශාල සංඛ්‍යාවක් ඇති නිසා මධ්‍යම මාර්ගයේ දී මුහුණ දෙන්නට වන්නේ වෙනත් ආකාරයේ ප්‍රශ්න සමුදායකට ය. **"දුම්රිය මාර්ග ආසන්නව නීති විරෝධී ඉදිකිරීම් සිදුකොට තිබීම නිසා, වාහනකරුවන්ට පමණක් නොව පදිකයන්ටද , දුම්රිය එනවා පෙනෙන්නේ නැත. මෙය අනතුරුවලට හේතුවකි. එබඳු ඉදිකිරීම් ඉවත් කිරීමට පියවර ගැනීම අප ආරම්භ කොට ඇතත්, එය කල් ගතවන ක්‍රියාවලියක්"** ප්‍රනාන්දු මහතා පැවසුවේය.

දුම්රිය මාර්ගයට වැරදි ලෙස ඇතුළු නොවන ලෙස ඔහු මහජනයාගෙන් ඉල්ලා සිටියි. **"එලෙස වැරදි කරන අය අල්ලා දඩ ගැසීමටත් අපි ක්‍රියා කර තිබෙනවා. එහෙත් බොහෝ දෙනා තවමත් එය කරනවා. මෙය ගත යුතු අවධානමක් නොවෙයි. අනතුරු ඇඟවීමේ ක්‍රම තිබිය යුතුවා මෙන්ම, මෙබඳු අනතුරු අවම කිරීමට අපට මහජනයාගේ ආකල්ප වෙනසකුත් අවශ්‍යයි"** දුම්රිය සේවයේ ප්‍රධානියා අවධාරණය කළේය.

**සඳුන් ජයවර්ධන**

*The Sunday Times - Sunday, August 16, 2020*






*srilankamirror.com*

# පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉහළ සිට පහළටම තනතුරුවල පුරප්පාඩු

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එහි ඉහළම තනතුරු බොහොමයක් පුරප්පාඩු වීම නිසා එම දෙපාර්තමේන්තුව බරපතළ කාර්ය මණ්ඩල හිඟයකින් පෙළෙයි. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සෑම මට්ටමක ම පවතින හිඟය දිගට ම පැවතීම රට තුළ පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීමේ සහ සංරක්ෂණයේ තම උත්සාහයට බාධාකාරී වී ඇති බව ජ්‍යෙෂ්ඨ නිලධාරීහු පිළිගත්හ.

පුරප්පාඩු වී ඇති ජ්‍යෙෂ්ඨ තනතුරු පිරවීමට කඩිනම් පියවර ගන්නා ලෙස මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා ජනවාරි මාසයේ දුන් විධානය තිබිය දී තත්ත්වය තවදුරටත් එලෙසම පවතියි. තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ 'සන්ඬේ ටයිම්ස්' පුවත්පත ලබාගත් දත්ත අනුව, දෙපාර්තමේන්තුවේ විවිධ මට්ටම්වල පවතින තනතුරු පරප්පාඩු සංඛ්‍යාව **457කි.** එම තනතුරුවල දැනට සිටින සේවකයින්

විශ්‍රාම ගිය පසු ද්විතියික සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු **12ක්** සඳහා බඳවාගැනීම් සිදු නොවනු ඇත. එබැවින්, එම තනතුරුවල පවතින පුරප්පාඩු නිල වශයෙන් සැලකිල්ලට ගෙන නැත.

ජ්‍යෙෂ්ඨ තනතුරු බහුතරය පුරප්පාඩු වී පවතින නිසා විධායක මට්ටමේදී ප්‍රශ්නය කැපී පෙනෙන තත්ත්වයක පවතියි. තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ කළ ඉල්ලීම අනුව නිදහස් කළ දත්ත පෙන්නුම් කරන ආකාරයට, විධායක ශ්‍රේණියේ **තනතුරු 53ක්** අතුරින්, මෙම වසරේ **මාර්තු 31 දා** වන විට පුරවා තිබුණේ **තනතුරු 13ක්** පමණකි. අධ්‍යක්ෂ තනතුරු නවයකින් අටක්ද තවමත් පුරප්පාඩු වී ඇති තනතුරු අතර වෙයි. ගවේෂණ සහ ලියාපදිංචි, කැණීම්, කෞතුකාගාර, නඩත්තු, ව්‍යාපෘති සැලසුම් සහ අධීක්ෂණ සහ රසායනික සංරක්ෂණ ආදිය එයට ඇතුළත්ය.

මේ අතර නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ප්‍රාදේශීය) **තනතුරු 15ක්** වූ සියල්ලද තවම පුරවා නැත. නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ගවේෂණ සහ ලියාපදිංචි) තනතුරු තුනක් මෙන්ම නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (කැණීම්) තනතුරු දෙකක්ද , නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (නඩත්තු) තනතුරු දෙකක්ද පුරප්පාඩු වී පවතියි. සමස්තයක් ලෙස දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය/ **සහකාර අධ්‍යක්ෂ තනතුරු 27ක්** පුරප්පාඩු වී පවතියි. ප්‍රධාන ඉංජිනේරුවරයකු, අභ්‍යන්තර විගණක වරයකු හෝ නීති නිලධාරියකු ද දෙපාර්තමේන්තුවේ නැත.

## සුදුස්සන් නොමැති වීම

තෘතිය මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලයේ **56 කින් 23ක්** පුරප්පාඩු වී පවතින අතර ද්විතියික මට්ටමේ අනුමත **තනතුරු 812 කින් 217 ක්** පුරප්පාඩු වී පවතියි. ප්‍රාථමික මට්ටමේදී , දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ **179ක හිගයක්** පවතියි.

**තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ප්‍රතිචාර වශයෙන් දෙපාර්තමේන්තුව නිදහස් කළ තොරතුරුවලට අනුව සඳහන් වන්නේ තනතුරු විශාල සංඛ්‍යාවක් සම්බන්ධයෙන් එම තනතුරු පුරවන ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇති බවයි. සුදුසුකම් ඇති අපේක්ෂකයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නිසා, බඳවා ගැනීමේ පටිපාටිය වෙනස් කිරීමට අවසර දෙන ලෙස රාජ්‍ය සේවා කොමිසමෙන් සහ අනෙක් අදාළ ආයතනවලින් ඉල්ලා ඇත. ඒ අතර, දෙපාර්තමේන්තුවේ ඇතැම් සේවකයන් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම් නිසා එම නඩු අවසන් වනතෙක් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවාගැනීම් කළ නොහැකි වී තිබේ.**

මෙම තත්ත්වය ආණ්ඩුවේ ඉහළම මට්ටම්වල අවධානයට ලක් වී ඇත. පුරාවිද්‍යා අඩවි සහ පුරාවස්තු රැකගැනීම සම්බන්ධයෙන් , පසුගිය වසරේ ජනවාරි මාසයේ , ජනාධිපති සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවතී රැස්වීමේදී ද එය සිදු විය. ජනාධිපති මාධ්‍ය අංශය එම අවස්ථාවේ නිකුත් කළ මාධ්‍ය නිවේදනයට අනුව "**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරී තනතුරුවල පුරප්පාඩු පිරවීමට වහාම පියවර ගන්නා ලෙස**" ජනාධිපතිතුමා අදාළ බලධාරීන්ට උපදෙස් දුන්නේය. පුරාවිද්‍යා ප්‍රශ්න සම්බන්ධයෙන් සහ පුරාවිද්‍යා අඩවි ආරක්ෂාව



සම්බන්ධයෙන් ඇති බාධා ඉවත් කිරීමට  මෙම පියවර වහාම ගත යුතු බවද ජනාධිපතිතුමා වැඩි දුරටත් ප්‍රකාශ කළේය.

නම සඳහන් නොකිරීමේ කොන්දේසිය මත කතා කළ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු ජ්‍යෙෂ්ඨ නිලධාරියකු ප්‍රකාශ කළේ, දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් හිඟයේ තේරුම නම්, කනිෂ්ඨ නිලධාරීන්ට ඔවුන්ගේ කටයුතු සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් සහ මග පෙන්වීම ලබාදීමට ප්‍රමාණවත් නිලධාරී පිරිසක් නොමැතිය යන්න බවයි. එබඳු මග පෙන්වීමක් නැති විට , දෙපාර්තමේන්තුවේ ඉතාමත් වැදගත් කාර්යය වන රටේ පුරාවිද්‍යාත්මක වස්තුව ආරක්ෂා කිරීමට, හානි වීම වැළක්වීමට නොහැකි බව ද ඔහු වැඩිදුරටත් පැවසීය.

දශක ගණනාවක් තිස්සේ රට පුරා බෞද්ධ පුරාවිද්‍යා අඩවි පිළිබඳ කළ සහ පසුගිය වසරේ සිරිසේන ජනාධිපතිවරයා සමග සාකච්ඡාවට සහභාගී වූවකු ද වන, ගරු එල්ලාවල මේධානන්ද හිමියෝ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දිගටම පවතින කාර්ය මණ්ඩල හිගය පිළිබඳව දුකට පත් වූහ.

"**පළපුරුදු පුරාවිද්‍යාඥයන්ගේ පවතින හිගය නිසා, පුරාවස්තු හැසිරවීමට අපට සිටින්නේ තරුණ සහ පළපුරුද්ද අඩු පිරිසක්. එයින් ඒවාට හානි සිදුවීමේ අවදානම වැඩි වෙනවා**" එහිමියෝ නිරීක්ෂණය කළහ. උතුරු සහ නැගෙනහිර බෞද්ධ පුරාවිද්‍යා අඩවි විනාශ කිරීමේ සංවිධානාත්මක වැඩ පිළිවෙළට ද මෙම තත්ත්වය දායක වන බව උන් වහන්සේ පවසති. ප්‍රධාන වශයෙන්, ඒවායේ පැවැත්ම තහවුරු කර ගැනීමට සහ ඉන් පසු එම අඩවි ආරක්ෂා කිරීමට අවශ්‍ය පුද්ගලයින්ගේ හිඟය නිසා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පුරාවිද්‍යා අඩවි හඳුනා නොගැනීම නිසා , මෙම සිද්ධීන් බොහොමයක් පොලිසියටද වාර්තා නොවන බව උන්වහන්සේ ප්‍රකාශ කළහ.

## අධ්‍යක්ෂ තනතුරු පිරවීම

**"බඳවා ගැනීම් ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව කාර්ය පටිපාටිමය ප්‍රශ්නයි"** පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජෙනරාල් මහාචාර්ය පී. බී. මණ්ඩාවල අවධාරණය කළේය. පවතින බඳවා ගැනීමේ පටිපාටිය අනුව, අධ්‍යක්ෂ තනතුර සඳහා දෙපාර්තමේන්තුව තුළින් නිලධාරීන්ට උසස්වීම් ලබාදීම සිදු කළ යුතු බව අධ්‍යක්ෂ ජෙනරාල්වරයා සඳහන් කළේය. "**අධ්‍යක්ෂ තනතුරක් පිරවීම සඳහා අපි අපගේ නියෝජ්‍ය/ සහකාර අධාක්ෂවරුන් අතරින් උසස්වීම් ලබාදිය යුතුයි. එසේ වුවත්, අධ්‍යක්ෂ තනතුරක්  දැරීමට ඔවුන් දෙපාර්තමේන්තුව තුළ අවම වශයෙන්  වසර 15ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි. මේ වන විට එලෙස උසස්වීම් ලබාදීමට අවශ්‍ය තරම් පිරිසක් අපට නැහැ**" ඔහු පැහැදිලි කළේය.

මෙම අපහසු තත්ත්වය තුළ, දෙපාර්තමේන්තුව අදාළ බලධාරීන්ගෙන් ලිඛිතව ඉල්ලා සිටියේ, රාජ්‍ය සේවයේ සිටින සුදුසුකම් සහිත ඕනෑම අපේක්ෂකයකුට තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට ඉඩ ලැබෙන පරිදි එක වරකට පමණක් වලංගු අවසරයක් ලබාදෙන ලෙසයි. කෙසේ වෙතත්, මෙයට වැටුප් මණ්ඩලය සහ රාජ්‍ය සේවා කොමිසම ඇතුළු ආයතන ගණනාවකින් අනුමැතිය අවශ්‍ය වෙයි. එම ක්‍රියාවලිය තවමත් අවසන් නැත.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ **තනතුරු 27ක්** සඳහා අපේක්ෂකයින් බඳවා ගැනීමට විවෘත තරග විභාගයක් **2016 අගෝස්තු 26** දා, ශ්‍රී



/archaeologynewsnetwork.blogspot.com

ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දී පැවැත්වීමට නියමිතව තිබිණි. කෙසේ වෙතත්, බඳවා ගැනීමේ ක්‍රියාවලිය අභියෝගයට ලක් කරමින්, දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු උපාධිධාරීන් පිරිසක් මානව හිමිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළේය. ඒ අනුව, නඩු විභාගය අවසන් වන තෙක් තරග විභාගය නවතාලමින් අතුරු තහනම් නියෝගයක් ශ්‍රේෂ්ඨාධිකරණය නිකුත් කළේය. පසුගිය වසරේ ජූනි මාසයේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ධුරයට පත් වූ මහාචාර්ය මණ්ඩාවල ප්‍රකාශ කළේ, උපාධිධාරීන්ට අසාධාරණයක් සිදුවීමට ඉඩ තිබූ බඳවා ගැනීමේ පටිපාටියේ අවශ්‍ය වෙනස්කම් කිරීමට ඔවුන් කටයුතු කළ බව සහ දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති සමගද සාකච්ඡා කළ බවයි. **"සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය අපි දැන් රාජ්‍ය සේවා කොමිසමට යවා තිබෙනවා. එය ලැබුණු විට අපි ශේෂ්ඨාධිකරණයට ගොස් එම විසඳුම ඉදිරිපත් කරනවා"** ඔහු පැවසීය.

**"ද්විතියික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු පිරවීමට උපාධිධාරීන්ම බඳවා ගත යුතුයි."** කී මහාචාර්ය මණ්ඩාවල වැඩි දුරටත් කීවේ **"තමන් දැනටමත් අදාළ බලධාරීන්ගෙන් උපාධිධාරීන් ඉල්ලා ඇති බව යි." "කෙසේ වෙතත්, මෙය විශේෂිත ක්ෂේත්‍රයක් නිසා, අපට අවශ්‍ය වන්නේ පුරාවිද්‍යා උපාධියක් ඇති උපාධිධාරීන්ම බව අපි පැහැදිලිව ඉල්ලා තිබෙනවා"** ඔහු පෙන්වා දුන්නේය.

මහාචාර්ය මණ්ඩාවල වැඩිදුරටත් පැවසුවේ අධ්‍යක්ෂ තනතුර හැරුණු විට අනෙක් තනතුරුවල වැඩ ආවරණය කිරීමට කටයුතු කරමින් සිටින බවයි. උදාහරණයක් ලෙස නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ප්‍රාදේශීය) තනතුරු **15ම** පුරප්පාඩු වී පැවතියද, විවිධ දිස්ත්‍රික්කවල දැනටමත් ස්ථිරව සේවයේ යෙදී සිටින ප්‍රාදේශීය නිලධාරීහු (*ROs*) මෙම වැඩ ආවරණය කරති. **"එසේ වුවද, තීරණ ගැනීමේදී ඔවුන්ගේ අධිකාරී බලය පිළිබඳ ප්‍රශ්න මතුවන අතර, එම නිසා එම ලිපිගොනු බොහොමයක් මගේ මේසයට පැමිණෙයි. මෙම තනතුරු පුරප්පාඩු නිසා සිදු වී ඇත්තේ, සාමාන්‍ය වශයෙන් සහකාර අධ්‍යක්ෂවරයකු අධ්‍යක්ෂවරයකුට යොමු කරන කරුණු බොහොමයක් අධ්‍යක්ෂ ජෙනරාල් වෙත පැමිණීමයි."**

ප්‍රථමික මට්ටමේ දී ප්‍රධාන අභියෝගය වන්නේ පුහුණු මේසන්වරුන් සහ මුරකරුවන් නොමැති වීමයි. දෙපාර්තමේන්තුවේ **මේසන්වරුන් 35ක්** සඳහා පුරප්පාඩු ඇත. පුරාවිද්‍යා අඩවිවල සිදුවෙමින් පවතින ප්‍රතිස්ථාපන වැඩ කටයුතු ප්‍රමාණය අනුව මෙම තනතුර අත්‍යවශ්‍යය. එසේ වුව ද, දිනකට **රුපියල් 3000ක්** උපයා ගත හැකි මෙසන්වරු තමන්ට මාසික වැටුපකින් සෑහීමට පත්වීමට සිදු වන ආණ්ඩුවේ තනතුරකට ඉල්ලුම් කිරීමට මැළිකමක් දක්වති. පුරාවිද්‍යා අඩවිවල ආරක්ෂාව සඳහා දෙපාර්තමේන්තුවට තවත් මුරකරුවන් බොහෝ දෙනකු අවශ්‍ය වෙයි. දැනට අනුමත කාර්ය මණ්ඩලය මුරකරුවන් **1,500ක්** වුව ද, එහි පවා **35ක** හිඟයක් පවතියි. "කෙසේ වෙතත්, යථාර්ථය නම් පුරාවිද්‍යා අඩවි හොඳින් බලා ගැනීමට නම් අපට ස්ථිර **මුරකරුවන් 2,000** ක් වත් අවශ්‍ය වන බවයි. එම නිසා කාර්ය මණ්ඩල සංඛ්‍යාව වැඩි කරන ලෙස අපි ඉල්ලීමක් කළා" ඔහු අවධාරණය කළේය.

එසේ වුව ද, උතුරු නැගෙනහිර පළාත්වල බෞද්ධ පුරාවිද්‍යා අඩවි විනාශ කිරීමේ සංවිධානාත්මක වැඩ පිළිවෙළක් ඇතැයි යන ප්‍රකාශය මහාචාර්ය මණ්ඩාවල තරයේ ප්‍රතික්ෂේප කළේය. ඔහු සඳහන් කළේ පොලිස් වාර්තා අනුව පසුගිය වසරේ පුරාවිද්‍යා අඩවි විනාශ කළ හෝ විනාශ වූ හෝ **අවස්ථා සංඛ්‍යාව 280 ක්** බව යි. ඉන් බහුතරය **අනුරාධපුරය (81), කුරුණෑගල (30) සහ මොනරාගල (28)** දිස්ත්‍රික්ක වලින්ය. එයට ප්‍රතිවිරුද්ධ ලෙස වාර්තා වී ඇත්තේ, මඩකලපුවෙන් තුනක්, කිලිනොච්චියෙන් දෙකක් සහ මුලතිව්වලින් එකක් පමණකි. යාපනයෙන් සහ මඩකලපුවෙන් කිසිදු සිදුවීමක් වාර්තා වී නැති බව ද ඔහු ප්‍රකාශ කළේය.

**සඳුන් ජයවර්ධන**

*The Sunday Times - Sunday, July 29, 2018*




# ලංකාවේ සිරගෙවල්
# දූෂණ ගුහා බව
# වාර්තාවකින් හෙළි වෙයි

**මරා දමන ලද පාතාල නායකයා සිරගත කොට සිටිය දී මුහුණු පොතේ ගිණුමක් පවත්වාගෙන ගිහින්!**

2017 පෙබරවාරි මාසයේ කළුතර දී බන්ධනාගාර බස් රථ දෙකකට එල්ල වූ ප්‍රහාරයේ දී මරා දමනු ලැබූ කුප්‍රකට පාතාල නායකයා සිරගතව සිටිය දී මුහුණු පොතේ පෞද්ගලික ගිණුමක් පවත්වාගෙන ගිය බවත්, ඔහු බන්ධනාගාර නිලධාරීන් සමග සිටින ඡායාරූප එහි පළ කළ බවත්, පරීක්ෂණ කමිටු වාර්තාවක් ප්‍රකාශ කරයි.

ශ්‍රී ලංකාවේ බන්ධනාගාරවල විශාල වශයෙන් දූෂණ පැතිරී ඇති බවත්, ඒවා ඉවත් කිරීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව කිසිවක් නොකරන බවත්, එම වාර්තාවෙන් කියයි. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ඇමති ඩී.එම්. ස්වාමිනාදන් විසින් කමිටුව පත්කරන ලද්දේ ඊතණමඩල ප්‍රහාරය ගැන පරීක්ෂා කිරීම සඳහා ය. එම ප්‍රහාරයෙන් අනුර උදයංග පතිරණ හෙවත් සමයන්, ඔහුගේ සහචරයෝ හතර දෙනෙක් සහ බන්ධනාගාර ආරක්ෂකයියෝ දෙදෙනෙක් මිය ගියහ.

2017 මැයි මාසයේ දී එම කමිටු වාර්තාව භාරදෙනු ලැබූ අතර එහි පිටපතක් ලබාගැනීම සඳහා, සන්ඩේ ටයිම්ස් පුවත්පත තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලුම්පතක් එම අවස්ථාවේදීම ඉදිරිපත් කළේය. අවසන් වශයෙන්, 2017 අගෝස්තු මාසයේ එය ලැබිණි. 2011 සහ 2017 අතර කාලයේ බන්ධනාගාර තුළින් කොපමණ ජංගම දුරකථන ප්‍රමාණයක් සහ මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් සොයාගනු ලැබුවේද සහ විනය ගරුක වූ බන්ධනාගාර නිලධාරීන් කී දෙනකු නොසලකා හැරීමට ලක්ව තිබේ ද යන තොරතුරු ඉල්ලා වෙනම තොරතුරු දැනගැනීමේ අයදුම්පතක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත යොමුකරනු ලැබීය.

**බන්ධනාගාරය තුළ ජංගම දුරකථන භාවිත කිරීම, ජංගම දුරකථන සිරකරුවන්ට භාවිත කිරීමට ඉඩ දීම, සිරකරුවන් ඔවුන්ගේ සගයින් සහ පවුල් අතර සබඳකම් පැවැත්වීමට පහසුකම් සැලසීම සහ ඊසි කෑෂ් සහ වෙනත් ක්‍රම මගින් මුදල් ගනුදෙනු සිදු කිරීම ඇතුළු නීති විරෝධී ක්‍රියා බන්ධනාගාර නිලධාරීහු සිදු කරති.**

පාතාලයට සම්බන්ධ රැඳවියන්ට පිටත සිටින තම සහචරයින් සමග සම්බන්ධතා පැවැත්වීමටත්, සිර ගෙවල් ඇතුළේ සිට අපරාධ සැලසුම් කිරීමට, ආරම්භ කිරීමට සහ මෙහෙයවීමටත්, දූෂණ නිසා ඉඩ ලැබෙන බව වාර්තාවෙන් ප්‍රකාශ කරයි. සිර ගෙවල් ඇතුළේ සිට මත්ද්‍රව්‍ය වෙළෙඳාමද ක්‍රියාත්මක කරති. **"බන්ධනාගාර බලධාරීන් විසින් එබඳු දූෂිත නිලධාරීන් කී දෙනෙකුට දඬුවම් කරනු ලැබ තිබේද?"** යි වාර්තාවෙන් ප්‍රශ්න කරයි.


**"කුමන තරාතිරමක වුවත් මෙම අපරාධවලට වගකිවයුතු නිලධාරීන්ට දැඩි දඬුවම් ලබාදිය යුතු අතර බලධාරීන්ට එසේ කළ නොහැකි වන්නේ නම්, ඔවුන් තම තනතුරු වලින් ඉවත් කරමින් මෙම උවදුර අවසන් කළ යුතුය."**යි කමිටුව නිර්දේශ කොට ඇත. **"මෙහි දී අමාත්‍යාංශයට විශාල කාර්යයක් පැවරෙයි"** යනුවෙන්ද එහි සඳහන්ය.

**"දූෂිත නිලධාරීන් බන්ධනාගාරයේ තත්ත්වය වඩාත් නරක අතට පත්කරන බවට බොහෝ සාක්ෂි ඇත." "ඔවුන්ට එරෙහිව දැඩි පියවර ගත යුතුය. එබඳු නිලධාරීන් පාලනය කිරීම සඳහා බන්ධනාගාර පොලිසියට ප්‍රමාණවත් අධිකාරී බලයක් ලබා දිය යුතු අතර නිවැරදි කිරීමේ නිවසේ හොඳ නම ආරක්ෂා කිරීම සඳහා දූෂණ වැළැක්වීමේ පියවර ගැනීම ඔවුන්ට අනිවාර්ය කළ යුතුය."** යි වාර්තාවේ වැඩිදුරටත් සඳහන් වෙයි.

පතිරණ සහ ඔහුගේ සහචරයින් රැගෙන යෑම පිළිබඳ තොරතුරු ඝාතකයන්ට ලැබුණේ බන්ධනාගාරය තුළින් බව, කළුතර බන්ධනාගාරයේ සහ පොලිසියේ නිලධාරීන් විශ්වාස කරන බව කමිටුව කියයි.

පිටත්වන දිනය සහ වෙලාව, මාර්ගය සහ එහි තත්ත්වය, බස් රථ තුළ රැඳවියන් ස්ථානගත කොට ඇති තැන් සහ ආකාරය, ප්‍රහාරය එල්ල වන ස්ථානයට බස් රථ දෙක පැමිණෙන හරිම වෙලාව ආදී නිවැරදිම තොරතුරු කල් තබාම ප්‍රහාරකයන්ට ලබා නොදුන්නේ නම් මෙම සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නැත. එසේ වුවද, එබඳු තොරතුරු පිටවුණේ කෙසේදැයි යන්න ගැන තොරතුරු සොයාගැනීමේ යාන්ත්‍රණයක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට දැන් නැත.

බස් රථයේ ගමන් මග ඩබල් කැබ් රථයකින් හරස් කොට වම් පැත්තෙන් පැමිණි ප්‍රහාරක කණ්ඩායමක් පළමුව වෙඩිතැබීම ආරම්භ කළ අතර මාර්ගයේ සිට තව පිරිසක් වෙඩි තැබූහ. පොලිසියට සමාන නිල ඇඳුම් ඇඳ



*roar.media/*

සිටි ප්‍රහාරකයෝ පොලිස් නිලධාරීන් ආකාරයෙන් සැරසී සිටියහ. බන්ධනාගාර නිලධාරීන් තත්ත්වයට මුහුණදීමට සූදානමින් නොසිටියහ. ප්‍රහාරකයින් ප්‍රදේශයේ භූ විෂමතා අධ්‍යයනය කොට තිබිණි. ඔවුන් යොදාගෙන තිබුණේ ප්‍රධාන මාර්ග සියල්ලම පාහේ මගහරින මාර්ගයකි.

කළුතර බන්ධනාගාරය තුළින් ජංගම දුරකථන රාශියක් හමු වූ බව නිලධාරීහු කමිටුවට පවසූහ. පතිරණ විසින් ඔහුගේ ප්‍රධාන ප්‍රතිවාදියා වන "අංගොඩ ලොක්කා" ඝාතනය කිරීමට කර තිබූ සැලසුමක් ව්‍යර්ථ කිරීමට මෙම ඇතැම් උපකරණ අල්ලා ගැනීම උපකාර විය. පළමුව ඊ වාට්ටුවේ රඳවා තිබූ පතිරණ පසුව ඒ වාට්ටුවට මාරු කර යවන ලද්දේ ඔහු රහසිගත කටයුතුවල යෙදෙන බවට වූ සැකය නිසාය. බන්ධනාගාරය තුළ දී ඔහු ජංගම දුරකථන නිදහසේ භාවිතා කළ බවට සාක්ෂි ඇත.

ඔහු බන්ධනාගාරයේ සිටියදී, සෑම දිනකම පාහේ තමන් ඔහුට කතා කළ බව පතිරණගේ දෙවන බිරිඳ කමිටුවට ප්‍රකාශ කළාය. ඔහු බලන්නට යන හිතවතුන් සහ ඥාතීන් ඔහුට දුන් ජංගම දුරකථන ඔහු භාවිත කළ බව ඇය පැවසුවාය. අනෙක් අවස්ථාවලදී, ඔහු බන්ධනාගාර නිලධාරීන්ගේ දුරකථන භාවිතා කළේය. බන්ධනාගාරයෙන් පිටත සිටින කාන්තාවන් හා සබඳතා පැවැත්වීමට ඔහු ස්කයිප්, වයිබර් ආදිය භාවිත කළ බවද කියති. "**සරල ලෙස ප්‍රතික්ෂේප කිරීමෙන් තොරව බන්ධනාගාරය තුළ හරියටම සිදුවන්නේ කුමක්ද යන්න සොයාගැනීමට බලධාරීන් මෙය අවස්ථාවක් කරගත යුතුය**"යි කමිටුව අවධාරණය කරයි.

දිගට පවතින්නට ඉඩ හැරියොත් බන්ධනාගාර තුළ නීති විරෝධී ලෙස දුරකථන භාවිතය ආවේණික තත්ත්වයක් බවට පත්විය හැකිය. ඒවා සොයාගැනීමට විශේෂ ඒකක ක්‍රියාත්මක කිරීම සහ වැලිකඩ වටා බාධාකිරීමේ උපකරණ සවිකිරීම අසාර්ථක වී ඇත. අත් පළඳනා සහ මුදු ඇතුළු රන් ආභරණ ගණනාවක් පතිරණ පැළඳ සිටියේය. "**කිසිදු බියකින් හෝ විශේෂ සැලකිල්ලකින් තොරව නීතිය ක්‍රියාත්මක විය යුතු ස්ථානයක ඇතැම් සිරකරුවන් විශේෂ වරප්‍රසාද ලැබීම පුදුමාකාර තත්ත්වයකි**"යි කමිටුව නිරීක්ෂණය කරයි.

හත් දෙනෙකුට මරු කැඳ වූ සිදුවීමට හේතු වූ ආරක්ෂක දුර්වලතා වාර්තාවෙන් පැහැදිලිව පෙන්නුම් කරයි. **2015 සැප්තැම්බරයේ** කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේදී සිදු වූ ඝාතන උත්සාහයකින් පතිරණ දිවි ගලවා ගත්තේය. ඔහුගේ ජීවිතයට බරපතළ තර්ජනයක් තිබුණද, එයට මුහුණදීමේ සූදානමක් නොවීය. සැකකරුවන් පස්දෙනාම සිටියේ එක ම බස් රථයේය. සැලසුම් කළ ප්‍රවාහනයට අඩු තරමින් **පැය 24 කට** පෙර පොලිස් ආරක්ෂාව ඉල්ලා සිටිය යුතු වුවද , එය සිදු කළේ **පැය 18ක්** පමණක් තිබියදීය.

නිලධාරීන්ගේ නිවාඩු වාර්තා අසම්පූර්ණය. නිවාඩු ලබාගැනීමට හේතු පැහැදිලිව සටහන් කොට නැත. නැතහොත් වරදවා සටහන් කොට ඇත. කළුතර බන්ධනාගාරයේ නිලධාරීන් අතරින් **අඩු තරමින් 18 දෙනෙකු** ප්‍රහාරය සිදුවන දිනයේ නොසිටියේය. "**නිවාඩු ලබාගැනීමේ රටාවේ කුමන හෝ වෙනසක් මෙන්ම, නිවාඩු ලබාගැනීමට දුන් හේතුවල යම් සැක කට යුතු යමක් ඇත්නම් ඒවා පරීක්ෂා කළ යුතුය.**" යනුවෙන් වාර්තාව අවධාරණය කරයි.

"**සැකකරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය මේ ආකාරයේ ප්‍රහාරවලට සීමා වී නැති අතර එය උසාවි කරා ගමනේ දිගටම පවතින ප්‍රශ්නයකි.**" යි වාර්තාවේ සඳහන් වෙයි. වැඩිදුරටත් එහි සඳහන් වන්නේ "**බන්ධනාගාර ප්‍රවාහනය සඳහා නියමාකාර සැලැස්මක් නොමැති වූ විට, සාමාන්‍ය පුරවැසියන්, පාසල් සිසුන්, කාර්යාල සේවකයින්, පෞද්ගලික අංශයේ සේවකයින් ආදී තම ජීවිකාව උපයාගැනීමට යන සහ දවසේ වැඩ කටයුතු නිමවා නිවසට එන සියලු දෙනා අනතුරට ලක් වන්නේය.**" යනුවෙනි.

"**මෙය මෙම ආකාරයේ පළමු සිදුවීමයි. මෙය අවසන් සිදුවීම යයි සිතා උදාසීන වීම අපට කළ නොහැකිය. මෙය ආරම්භය විය හැකිය. එබැවින් එය අභියෝගාත්මක සිදුවීමකි. බන්ධනාගාර යනු දුර්වල, අලස, හෝ මන්දගාමී පිරිසක් බව, පාතාලය පරීක්ෂා කොට තේරුම්ගෙන ඇත. එම නිසා අමාත්‍යාංශය ඉදිරි දැක්මකින් යුතුව ක්‍රියාත්මක වීම අවශ්‍යය.**"යි වාර්තාව පෙන්වා දෙයි.

හිටපු මහේස්ත්‍රාත් සහ බන්ධනාගාරයේ හිටපු කොමසාරිස් ජෙනරාල් රූමි මර්ෂුක් කමිටුවේ සභාපතිත්වය දැරීය. අනෙක් සාමාජිකයින් වූයේ ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම් එස්. මහවැව සහ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ගාමිණී නවරත්නයි.

**සඳුන් ජයසේකර**
*The Sunday Times - Sunday, September 10, 2017*



*edition.mv*

# නීති විරෝධී මසුන් මැරීම

## තොරතුරු දැනගැනීමේ නීතිය ආධාරයෙන් සන්ඩේ ටයිම්ස් පතුලට ම ගියේය

යුරෝපා සංගමයෙන් කළ අවවාද නොතකා **2012** සහ **2015** අතර කාලයේ ශ්‍රී ලංකාව විදේශීය ධීවර යාත්‍රාවලට **බලපත්‍ර 641 ක්** තරම් ප්‍රමාණයක් නිකුත් කොට ඇති බවත්, ඔවුන් වැඩි දෙනකු නීති විරෝධී මසුන් මැරීමේ භාවිතයන්හි යෙදෙන බවත්, එය  අවසානයේ ශ්‍රී ලංකාවට අපනයන තහනමකට ලක්වීමට හේතු වූ බවත්, තොරතුරු දැනගැනීමේ නව පනත යටතේ සන්ඩේ ටයිම්ස් පුවත්පත ඉදිරිපත් කළ පළමු අයදුම්පතින් හෙළිදරව් වීය.

අවසානයේ **යුරෝපා සංගමය 2015 දී**, ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයනය තහනම් කිරීම නිසා **යුරෝ මිලයන 75 කට (රුපියල් බිලියන 12ක්)** වැඩි පාඩුවක් රටට සිදුවීය.

ඉල්ලීම් ගණනාවක් කළත් ධීවර දෙපාර්තමේන්තුව මෙම තොරතුරු මෙතෙක් හෙළි කළේ නැත.

**මාළු ඇල්ලීම සඳහා විදේශීය යාත්‍රාවලට නිකුත් කළ බලපත්‍ර පිළිබඳව තොරතුරු හෙළිදරව් කිරීම පසුගිය රජය විසින් දිගින් දිගට ම  ප්‍රතික්ෂේප කළේය. වෙරළේ සිට ශ්‍රී ලංකා මුහුදේ නාවුක හැතැක්ම 12 ක් (කිලෝ මීටර් 22.2 ක්) දුරට විහිදෙන භෞමික සමුද්‍ර තීරයට පිටතින් වන විශේෂිත ආර්ථික කලාපයේ මාළු ඇල්ලීමට බලපත්‍ර ලබා දී තිබේ. ඉන්දුනීසියාවේ , තායිවානයේ සහ මැලේසියාවේ ලියාපදිංචි කළ යාත්‍රා සඳහා බලපත්‍ර ලබා දී තිබිණි. ශ්‍රී ලංකාවට තහනමක් පනවමින් 2015 දී යුරෝපා සංගමය ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා යාත්‍රා හෝ ශ්‍රී ලංකාවේ වරාය භාවිතා කරන විදේශීය යාත්‍රා විසින් හෝ නීති විරෝධී මාළු ඇල්ලීම නතර කිරීමට පියවර ගන්නා  ලෙස ඉල්ලා සිටින බවයි.**

ටුනා වර්ගයේ මාළු යුරෝපා සංගමයේ රටවලට ආනයනය කිරීමේ තහනම ක්‍රියාත්මක කළ **2015 පෙබරවාරි** මාසයේ සිට විදේශ යාත්‍රා සඳහා ශ්‍රී ලංකා වරාය පහසුකම් දීම ප්‍රතික්ෂේප කළ බව ,ධීවර  දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරයි.

විදේශීය ධීවර යාත්‍රා සඳහා **වැඩි ම බලපත්‍ර ප්‍රමාණය වන 257 ක් 2012 දී** නිකුත් කොට ඇති අතර **ඊළඟ වැඩි ප්‍රමාණය වන 256 ක් 2013 දී** නිකුත් කොට ඇත. **ධීවර දෙපාර්තමේන්තුව 2014 දී බලපත්‍ර 159 ක්** නිකුත් කොට ඇති අතර **2015 දී** එම ක්‍රමය නවතා  දමන්නට පෙර බලපත්‍ර නවයක් නිකුත් කොට ඇත.

ශ්‍රී ලංකාවේ නීති විරෝධී, වාර්තා නොකළ සහ පාලනයකින් තොර ,මාළු ඇල්ලීම නැවත්වීමට යුරෝපා සංගමය දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව ක්‍රියා කළ අතර අවසානයේ දී යුරෝපා සංගමයේ රටවලට මාළු  අපනයනයට තිබූ තහනම පසුගිය වසරේ අප්‍රේල්වල දී ඉවත්කරනු ලැබීය.

විදේශීය ධීවර යාත්‍රාවලට මාළු ඇල්ලීමට ඉඩ දී තිබුණේ විශේෂිත  ආර්ථික කලාපයේ පමණක් වුව ද , දේශීය ධීවරයන් දිගට ම පැමිණිලි කළේ තමන්ගේ ධීවර කටයුතුවලට බාධා පමුණුවමින් ඔවුන් දේශීය මුහුදු තීරයේ ද මාළු ඇල්ලීමේ නිරත වන බව යි.

**විදේශ යාත්‍රාවලට බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් දේශීය ධීවරයෝ එවකට සිටි ධීවර ඇමති රාජිත සේනාරත්න මහතාට චෝදනා කරති. ඇමතිවරයා එම චෝදනා ප්‍රතික්ෂේප කළේය.**

**එස්. රුබතීසන්**

*The Sunday Times : February 26, 2017*



www.tamilguardian.com

# රුපියල් බිලියනයක් වටිනා ස්වර්ණාභරණ

## සැබෑ හිමිකරුවනට ළඟදීම

**දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය භාරයේ තිබී සහ ගැටුමේ අවසන් අවස්ථාවල අත්හැර දමන ලද නිවෙස්වල තිබී හමුදාව විසින් අත් අඩංගුවට ගනු ලැබූ රුපියල් බිලියනයක් තරම් වටිනාකමකින් යුතු, රත්රන් සහ වෙනත් වටිනා ආභරණ ආපසු භාර දීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට ආරක්ෂක අමාත්‍යාංශය තීරණය කොට ඇති බව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ප්‍රකාශ කළේය.**

“මේ ගැන සොයා බැලීමට පත් කළ කමිටුව ඔවුන්ගේ නිර්දේශ ජනාධිපතිතුමාට මෑතක දී  භාර දී තිබෙනවා. මේ ගැන ගන්න ඊළඟ පියවර තීරණය කිරීමට, අදාළ සියලු පාර්ශවයන්ගේ රැස්වීමක් ලබන සතියේ පැවැත්වීමට නියමිත යි.” අතිරේක ආරක්ෂක ලේකම් ආර් එම් එස් සරත් කුමාර මහතා සන්ඩේ ටයිම්ස් පුවත්පතට ප්‍රකාශ කළේය.

සන්ඩේ ටයිම්ස් පුවත්පත ඉදිරිපත් කළ තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ප්‍රතිචාර දක්වමින් ශ්‍රී ලංකා මහ බැංකුව හෙළිදරවු කළේ, **රත්රන් කිලෝග්‍රෑම් 37.7 ක් (ග්‍රෑම් 37,708.472ක්)** තමන් භාරයේ ඇති බව යි. මේවා ලැබී ඇත්තේ හමුදාවෙනි. **2010 සැප්තැම්බර් 7 සහ 2012 ජනවාරි 26** අතර කාලයේ, **අවස්ථා 28 ක දී,** රත්රන් ආභරණ අඩංගු බව කී පාර්සල් හමුදාවෙන් තමන් භාරගත් බව මහ බැංකුව කියයි. මෙම සමස්තයේ වටිනාකම රුපියල් බිලියනයකි. **"මෙම භාණ්ඩ ශ්‍රී ලංකා මහ බැංකුවට භාර දීමට පෙර එම භාණ්ඩ සියල්ල ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින්  බර කිරා වටිනාකම තක්සේරු කරනු ලැබුවා. ඒ හැම අවස්ථාවක ම හමුදාවේ නිලධාරීන් සහ මහ බැංකුවේ අභ්‍යන්තර විගණකවරුන් ඉදිරියේ එම  ස්වර්ණාභරණ සියල්ල මහ බැංකුව විසින් කිරා බලා රත්රන් අඩංගු යයි කියන එම පාර්සල් භාරගත් බවට ලිපියක් හමුදාව වෙත නිකුත් කරනු ලැබුවා"** යි තොරතුරු දැනගැනීමේ විමසුමට ප්‍රතිචාර ලෙස මහ බැංකුව ප්‍රකාශ කළේය.

රත්රන් භාණ්ඩ බව කියන **ග්‍රෑම් 6003.132 ක** බරකින් යුතු  තවත් පාර්සලයක්  හමුදාව විසින් පසුගිය වසරේ මහා බැංකුවට භාරදෙනු ලැබූ බවත්, එම භාණ්ඩ මහ බැංකුවට භාර දීමට පෙර ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් කිරා බලා වටිනාකම තක්සේරු නොකළ බවත්, මහ බැංකුව පිළිගත්තේ ය. " **මෙම පාර්සල් භාරගන්නට පෙර මහ බැංකුව ඒවා පරීක්ෂා කළේ නැහැ, රත්රන් අඩංගු බව කියන එම පාර්සල් තවමත් මහ බැංකුව භාරයේ තිබෙනවා"** මහ බැංකුව පවසයි.

අතිරේක ලේකම් කුමාර මහතා කියන්නේ රත්රන් සහ වටිනා ආභරණ විශාල ප්‍රමාණයක් තවමත් හමුදාව භාරයේ ඇති බව යි.

ඒ අතර මහජන බැංකුව ආරක්ෂක අමාත්‍යංශයට දැනුම් දී ඇත්තේ, ඇතැම් රන් භාණ්ඩ බැංකුවට අයිති බව යි. **2014 දී,** පසුගිය රජය ප්‍රකාශ කළේ නීත්‍යානුකූල හිමිකරුවන් පිළිබඳව පරිස්සමින් කළ අධ්‍යයනයකින් පසුව, රත්රන් සහ අනෙක් වටිනා භාණ්ඩ හිමි කරුවන්ට නැවත භාරදීමට පියවර ගත්  බවයි. ගැටුම් පැවතී සමයේ එල් ටී ටී ඊ ය විසින් පවත්වාගෙන යනු ලැබූ බැංකුවලට ඔවුන් විසින් උකස් තබනු ලැබූ භාණ්ඩවල සැබෑ හිමිකරුවන් ලෙස, උතුරු නැගෙනහිර ප්‍රදේශවල **2,377** දෙනකු ආණ්ඩුව විසින් හඳුනාගනු ලැබ ඇත. අරලියගහ මන්දිරයේ පැවති උත්සවයක දී , ඔවුන්ගේ ස්වර්ණාභරණ ආපසු දෙන ලද්දේ ඒ අතරින් 25 දෙනකුට පමණකි. සැබෑ හිමිකරුවන් ලෙස ඉදිරිපත් වූ අනෙක් අයට ඔවුන්ගේ රන්භාණ්ඩ ආපසු දීමට වෙනත් ඉදිරි පියවරක් ගනු නොලැබී ය.

එල් ටී ටී ඊ ය පාලනය කළ ප්‍රදේශවල දශක ගණනාවක් ජීවත් වූ වැසියන් පවසන්නේ “තමිල් ඊළාම් බැංකුව” ට උකස් තැබූ රන් භාණ්ඩවල නීත්‍යනුකූල අයිතිය ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන තමන් සතුව ඇති බවයි.

**එස්. රූබතීසන්**

*The Sunday Times : April 16, 2017*




www.facebook.com



www.dailynews.lk

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පොළොන්නරුවේ සංවර්ධන ව්‍යාපෘතියක් විවෘත කරමින්

## සිරිසේන ජනාධිපතිවරයා ඔහුගේ පොළොන්නරුවට

# රුපියල් බිලියන 25කට වඩා පොම්ප කරයි

මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිවරයාව **සිටි 2015 ජනවාරි 8 දා සිට 2019 නොවැම්බර් 16 දක්වා** කාලය තුළ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති හැරුණු විට, විවිධ රජයේ ආයතන මගින් සෘජු රාජ්‍ය වියදම් ලෙස **රුපියල් බිලියන 25.293 ක්** භාවිතා කොට ඇත.

තොරතුරු දැනගැනීමේ විමසුමක් මගින් සන්ඩේ ටයිම්ස් පුවත්පත මෙම තොරතුරු ලබා ගත්තේය.

ජනාධිපති ලේකම් කාර්යාලය ලබාදුන් තොරතුරුවලට අනුව, හිටපු ජනාධිපතිවරයා **2015 දී** බලයට පත්වීමෙන් කෙටි කලක් තුළ ගත් කැබිනට් තීරණයක් අනුව **පිබිදෙමු පොලොන්නරුව ලෙස මෙම උන්නතිකාමී පස් අවුරුදු සැලැස්ම ක්‍රියාවට නංවා ඇත**.

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ පැසසුමට ලක් වූ හිටපු ජනාධිපති සිරිසේන මහතා, නිතිපතාන් රැස්වීම් පවත්වමින්, ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ට පෞද්ගලිකව ලිපි ලියමින් සහ ඉල්ලීම් කරමින්, කැපවීමෙන් යුතු සංවර්ධන වැඩ සටහනෙහි සමස්ත ක්‍රියාවලිය සෘජු ලෙස අධීක්ෂණය කළේය. ජනාධිපති ලේකම් කාර්යාලයේ **2015 සිට 2017** දක්වා කාර්ය සාධන වාර්තාවේ තෝරාගත් කොටස්වලින් මේ බව තහවුරු වෙයි. තොරතුරු දැනගැනීමේ විමසුමට ප්‍රතිචාර දැක්වීමේ කොටසක් ලෙස එම වාර්තාව ද අප වෙත ලබා දී ඇත.

**2015 දී ව්‍යාපෘති 152 ක් සඳහා රුපියල් බිලියන 4 ක් වැය කොට ඇත. පාසල් සම්බන්ධ සංවර්ධන වැඩ, පාසල්වල සනීපාරක්ෂක පහසුකම්, පිරිවෙන් සහ රෝහල් සංවර්ධනය සහ වන ජීවී, වන සහ මාර්ග සංරක්ෂණය ආදී විවිධ වැඩ සටහන් මෙයට ඇතුළත් ය. 2016 දී, අනුමත කල ව්‍යාපෘති සංඛ්‍යාව 908 කි. එයින් ව්‍යාපෘති 618 ක වැඩ අවසන් කොට ඇත. 2017 දී අනුමත කළ ව්‍යාපෘති 2,338 ක් සම්පූර්ණ කිරීම සඳහා රුපියල් බිලියන 5.63 ක් වෙන් කොට තිබු අතර එයින් ව්‍යාපෘති 1,781 ක් සම්පූර්ණයෙන් වැඩ අවසන් කොට තිබිණි.**

**2018 සහ 2019 වර්ෂවල** අනුමත කොට තිබු රුපියල් **බිලියන 20 කින්,** රුපියල් **බිලියන 15.663 ක්** වියදම් කොට ඇත්තේ, ජනාධිපති ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ අමාත්‍යංශ, පළාත් සභාව සහ පළාත් පාලන ආයතන මගින් **ව්‍යාපෘති 6,765** ක් ක්‍රියාත්මක කිරීම සඳහා ය.

**සිරිසේන ජනාධිපතිවරයාගේ වසර පහකට ආසන්න පාලන කාලය තුළ ඔහුගේ නිල සහ නිල නොවන ගමන් සඳහා වියදම් වූ මුදල් ප්‍රමාණය පිලිබඳ තොරතුරු ජනාධිපති කාර්යාලය සතුව නැති බව, තොරතුරු දැනගැනීමේ විමසුමට එම කාර්යාලයේ ප්‍රතිචාරයේ සඳහන් ය. අදාළ තොරතුරු නොදී සිටීමට ජනාධිපති ලේකම් කාර්යාලය තීරණය කොට ඇති බව අඟවමින් එම ප්‍රතිචාරයේ දැක්වෙන්නේ" ගරු ජනාධිපතිතුමාගේ විදේශ ගමන් සම්බන්ධයෙන් වෙන ම වාර්තාවක් මෙම අධිකාරිය විසින් පවත්වාගෙන ගොස් නැත." යනුවෙනි.**

හිටපු ජනාධිපතිවරයා විසින් කරන ලද වෙනත් නිල ගමන් සම්බන්ධයෙන් කිසියම් හෝ මුදලක් ගෙවීමට ඉතිරිව ඇත්දැයි කළ තවත් විමසුමකට පිළිතුරු ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය ප්‍රකාශ කොට ඇත්තේ, එබඳු ගෙවීමක් කිරීමට ඉතිරිව නැති බව සහ ගෙවීමට ඇති එබඳු මුදලක් ගැන මහා භාණ්ඩාගාරය හෝ වෙනත් ආයතනයක් හෝ දැනුම්දීමක් කොට නැති බවත් ය.

**එස්. රුබතීසන්**

*The Sunday Times : January 26, 2020*



http://www.dailymirror.lk/

# කොළඹ කච්චේරියේ ගින්න

# පොලිස් පරීක්ෂකයින් තවමත් කරන්නේ අළු එකතු කිරීමයි

වටිනා ලිපිලේඛන අහිමි කරමින්, මෙන්ම මිලියන 92කට වැඩි ද්‍රව්‍යමය හානියක් සිදුකරමින්, වේල්ල වීදියේ කොළඹ කච්චේරියේ 2012 හටගත් ගින්න පිළිබඳ පොලිස් පරීක්ෂණ තවමත් නිමා නොවී පවතින්නේ, ගින්න අහම්බයක් ද නැතහොත් හිතාමතා කළ දෙයක් දැයි සොයා ගැනීමට පවා තවමත් නොහැකිවය.

**බස්නාහිර පළාතේ පොලිසියේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයෙන් කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී ඇති අලුත්ම වාර්තාවට අනුව, රජයේ රස පරීක්ෂක වාර්තාවෙහි දැක්වෙන්නේ ගින්න පැතිරුණු වේගය සැලකිල්ලට ගත්විට, ඉක්මණින් ගිනිගන්නා ද්‍රව්‍යයක් නිසා ඉහළම තට්ටුවේ දැව පොළොවේ ඇති වූ ගින්න ඉක්මනින්ම ගොඩනැගිල්ල පුරා පැතිර ගොස් ඇති බවයි. කෙසේ වෙතත්, ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන ඉංජිනේරු (කොළඹ - බටහිර) විසින් ද වාර්තාවක් ඉදිරිපත් කොට ඇති අතර එම වාර්තාවෙහි සඳහන් වන්නේ ගින්න ඇති වූයේ විදුලි කාන්දුවක් නිසා ද යන්න හරියට ම කීමට තමන්ට හැකියාවක් නැති බවයි.**

පරීක්ෂණ නොතකා හැර ඇති ස්වභාවය පළමුවෙන්ම හෙළිදරව් වූයේ,'සන්ඩේ ටයිම්ස්' පුවත්පත තොරතුරු දැනගැනීමේ පනත යටතේ අයදුම්පතක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට ඉදිරිපත් කළ මුල් අවස්ථාවේදීමය. කච්චේරියේ ගින්න පිළිබඳ වාර්තාවක් තමන් සතුව නැති බව අමාත්‍යාංශය එම අවස්ථාවේ ප්‍රකාශ කළේ ය. ඉන්පසු කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ඉදිරිපත් කළ තොරතුරු දැනගැනීමේ අයදුම් පතට ප්‍රතිචාර ලෙස, ගින්න ගැන සොයා බැලීමට පත්කළ ත්‍රිපුද්ගල කමිටුවක පිටු දෙකක වාර්තාවක් 'සන්ඩේ ටයිම්ස්' වෙත ලබා දුන්නේ තනි පිටුවක පොලිස් වාර්තාවක් ද සමගය. එම තොරතුරු හැරුණු විට ලබාගත හැකි වූයේ පරීක්ෂකවරුන්, කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය අතර හුවමාරු වූ ලිපි විශාල ප්‍රමාණයකි.

2017 දෙසැම්බරයේ භාරදුන් පොලිස් වර්තාවක සඳහන් වූයේ, සිද්ධිය සම්බන්ධයෙන් කිසිදු ඇසින් දුටු සක්ෂිකරුවකු හෝ සැකකරුවකු නැති බවත්, කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් සමග දිගින් දිගට කළ සාකච්ඡාවලින්ද ගින්න සම්බන්ධයෙන් වැදගත් තොරතුරක් හෙළිදරව් නො වූ බවත්ය. ගින්නට සැබෑ හේතුව සොයා ගැනීමට තවදුරටත් පරීක්ෂණ කළ යුතු බව එහි සඳහන්ය.

**ත්‍රිපුද්ගල කමිටු වාර්තාවේ සඳහන් වන්නේ, ත්‍රිපුද්ගල තක්සේරු කණ්ඩායම ප්‍රකාශ කරන ආකාරයට, ගින්නෙන් භාණ්ඩ 153ක් විනාශ වූ බව සහ ඒවායේ වටිනාකම ඔවුන්ගේ තක්සේරුව අනුව රුපියල් 16,606,687.93 ක් බවත්, ගොඩනැගිල්ලට වූ හානියේ තක්සේරුව 76,000,000 ක් බවත්, තක්සේරු කළ මුළු හානිය 92,606,687.93 ක් බවත්ය.**

කමිටුව ප්‍රකාශ කළේ, මෙයට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් වගකිවයුතුද, නැතහොත් බාහිර සාධකයක් එයට බලපෑවේද යන්න තීරණය කිරීමට තමන්ට හැකියාවක් නැති බවයි. කමිටුව වැඩි දුරටත් ප්‍රකාශ කළේ සිදු වූ පාඩුව දරා ගැනීමට රජයට සිදුවන බව සහ ගින්නට කිසියම් පුද්ගලයකු හෝ පුද්ගලයින් පිරිසක් වග කිවයුතු බව පොලිස් පරීක්ෂණවලින් සොයාග නු ලැබුවහොත් ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගත යුතු බවයි.

**චාන්දනී කිරින්දේ**

*The Sunday Times : May 20, 2018*



# 2012 නොවැම්බරයේ වැලිකඩ බන්ධනාගාරයේ සමූහ ඝාතනය:

# විශේෂ කාර්ය සාධක බලකා ප්‍රධානියාගෙන් විශේෂ ඇඟවීමක්

බන්ධනාගාරයක් පරීක්ෂා කිරීමේදී අනුගමනය කළ යුතු පිළිගත් ක්‍රමවේද සියල්ලම උල්ලංඝනය කරමින්, 2012 නොවැම්බරයේදී වැලිකඩ බන්ධනාගාරයේ වාට්ටු දෙකක් පරීක්ෂා කිරීම සඳහා විශේෂ කාර්ය බලකායේ සන්නද්ධ භටයන් 798ක් තරම් අති විශාල පිරිසක් යෙදවීම එහි කැරැල්ලක් ඇති වීමට හේතු වූ අතර එයින් රැඳවියන් 27 දෙනකු මිය ගොස් තවත් විශාල පිරිසකට තුවාල සිදු වූ බව, ඒ පිළිබඳ කරුණු සෙවීමේ කමිටු වාර්තාවේ සඳහන් වෙයි.

## වැලිකඩ බන්ධනාගාර සංයුතිය

2012. 11. 9 දින වැලිකඩ බන්ධනාගාරයේ ඇතිවූ සිදුවීම සම්බන්ධයෙන් කරුණු සෙවීම සඳහා සාමාජිකයින් තිදෙනකුගෙන් යුත් කමිටුවක් පත්කරන ලද්දේ හිටපු අධිකරණ ඇමති විජයදාස රාජපක්ෂ මහතා විසිනි. අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විසින් එහි වාර්තාව මෙම වසරේ පෙබරවාරි මාසයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබීය. තොරතුරු දැනගැනීමේ පනත යටතේ එහි පිටපතක් පාර්ලිමේන්තුවෙන් ලබාගැනීම සඳහා ඉල්ලුම්පතක් මේ මස මුල දී 'සන්ඩේ ටයිම්ස්' පුවත්පත විසින් ඉදිරිපත් කරනු ලැබීය.

**කමිටුවේ කම්පනකාරී සොයාගැනීම් අතරින් එකක් වන්නේ, සිද්ධියේ දී ඝාතනයට ලක් වූ රැඳවියන් අතරින් සය දෙනකුගේ සිරුරු හමු වූ ස්ථානයට ටී 56 ස්වයංක්‍රීය ආයුධ දමා ඔවුන් එම ආයුධ භාවිතා කළ බව පෙන්නුම් කිරීමට සහ එමගින් ඔවුන් ඝාතනය කිරීම සාධාරණීකරණය කිරීමට උත්සාහ දරා ඇති බවට වන සාක්ෂියයි. සිදුවීමෙන් සුළු මොහොතකට පසුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිල ඡායාරූප ශිල්පියා ගත් ආයුධ දක්නට නැති ඡායාරූප සහ පැය කිහිපයකට පසුව පරීක්ෂාවක් සඳහා මහේස්ත්‍රාත්වරයා සිද්ධිය වූ ස්ථානයට එන විට සිරුරු අසල ආයුධ පැහැදිලිව පෙනෙන්නට තිබෙනු දැක්වෙන ඡායාරූපත් සාක්ෂි වශයෙන් කොමිසම ඉදිරිපත් කොට ඇත.**

අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ සාක්ෂිය අනුව කමිටුව තීරණය කොට ඇත්තේ රැඳවියන් තිදෙනකු තෝරාගෙන ඝාතනය කොට ඇති බවයි.

**කමිටුව ඉදිරියේ සාක්ෂි දුන් අය අතර හිටපු ආරක්ෂක ලේකම් ගොඨාභය රාජපක්ෂ මෙන්ම බන්ධනාගාර සහ පොලිස් දෙපාර්තමේන්තුවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද වූ නමුත් පරීක්ෂාවක් සඳහා විශේෂ කාර්ය බලකාය යොදා ගැනීමට බලය දුන්නේ කවුරුන්දැයි ප්‍රශ්න කළ විට ඒ හැම දෙනෙකු ම කීවේ තමන් වඩා ඉහළ නිලධාරීන්ගේ උපදෙස් අනුව ක්‍රියා කිරීම පමණක් කළ බව හෝ ඒ සඳහා වූ තීරණයක් ගැන තමන් කිසිවක් නොදන්නා බවයි.**

ඒ අනුව කමිටුව තම වාර්තාවේ සඳහන් කරන්නේ "පුදුමාකාර ලෙස මේ අවස්ථාවේ විශේෂ කාර්ය බලකාය යොදාගැනීමේ වගකීම දරන කිසිවකු නැති බව පෙනීයන බව" යි.

රාජපක්ෂ මහතාද සාක්ෂිකරුවකු වූ අතර, බන්ධනාගාරයක් තුළට ආයුධ හෝ උණ්ඩ රැගෙන යෑමට නීතියෙන් ඉඩ දී නැති බව ප්‍රකාශ කරමින්, පරීක්ෂා කිරීමේ මෙහෙයුම හෝ විශේෂ කාර්ය බලකාය යොදාගැනීම ගැන හෝ කිසිවක් ඔහු නොදන්නා බව ප්‍රකාශ කළේ ය. පරීක්ෂා කිරීමක් සඳහා විශේෂ කාර්ය බලකාය හෝ පොලිස් නිලධාරීන් හෝ ආයුධ සහිතව ඇතුළු වීම වැළැක්වීම බන්ධනාගාර දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ වගකීමක් බව ඔහු වැඩිදුරටත් කමිටුවට ප්‍රකශ කළේ ය.

කෙසේ වෙතත්, කමිටුව හමුවේ සාක්ෂි දුන් අනෙක් නිලධාරීන්ගේ සාක්ෂි හිටපු ආරක්ෂක ලේකම්ගේ සාක්ෂිය සමග පරස්පර වෙයි.

**විශේෂ කාර්ය බලකායේ කොමාන්ඩර් නියෝජ්‍ය පොලිස්පති (විශ්‍රාමික) චන්ද්‍රසිරි රණවන, ඔහුගේ සාක්ෂියෙන් කමිටුවට ප්‍රකාශ කළේ 2012.11.9 දින කළ පරීක්ෂණ මෙහෙයුම විශේෂ කාර්ය බලකාය තමන්ගේම වුවමනාවට කළ දෙයක් නොවන බවත්, එය ආරක්ෂක ලේකම්ගේ උපදෙස් මත නියෝජ්‍ය පොලිස්පති නිමල් වාකිස්ටගේ (2012 කාලයේ රාජ්‍ය බුද්ධි සේවා (*SIS*) අධ්‍යක්ෂ සහ ත්‍රස්තවාදී විමර්ශන අංශයේ (*TID*) හිටපු නියෝජ්‍ය පොලිස්පති) සම්බන්ධීකරණයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග කළ සාකච්ඡා මාලාවකට පසුව ක්‍රියාත්මක කළ ක්‍රියාවක් බවයි.**

නියෝජ්‍ය පොලිස්පති රණවනට අනුව 2013 ආරම්භය දක්වා විශේෂ කාර්ය බලකාය ආරක්ෂක අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වූ අතර ඉන් පසුව පොලිස්පතිවරයාගේ විෂය පථය යටතට පත් විය. කෙසේ වෙතත්,



/srilankabrief.org

පරීක්ෂණ මෙහෙයුම සිදු වන අවස්ථාව වන විට එය පැවතියේ ආරක්ෂක අමාත්‍යංශයේ පරිපාලනය යටතේය.

**එවකට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් පී.ඩබ්ලිව්. කොඩිප්පිලිගේ සාක්ෂියෙන්ද, විශේෂ කාර්ය බලකායේ කොමාන්ඩර්ගේ ස්ථාවරය ශක්තිමත් වන අතර ඒ අනුව විශේෂ කාර්ය බලකායේ භටයන් 798ක් යොදා ගනිමින් පරීක්ෂාවක් සිදුකිරීමේ අවශ්‍යතාව මතුකරන ලද්දේ 2012.07.17 දින ආරක්ෂක අමාත්‍යාංශයේ පැවති, රාජපක්ෂ මහතාද සහභාගී වූ සාකච්ඡාවකදීය.**

එවකට වැලිකඩ බන්ධනාගාරයේ අධිකාරීවරයාව සිටි ගාමිණී ජයසිංහ ඇතුළු අනෙක් කිසිදු බන්ධනාගාර නිලධාරියකුට දැනගන්නට නොලැබෙන ලෙස, ඉතා රහසිගත ආකාරයට පරීක්ෂාව සංවිධානය කරන ලද්දේ තමන්ගේ සෘජු මැදිහත්වීම සහ අධීක්ෂණය යටතේ බව කොඩිප්පිලි මහතා පිළිගත්තේය.

රැඳවියන්, බන්ධනාගාරයේ, පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ නිලධාරීන්, ආරක්ෂක අමාත්‍යංශයේ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ නිලධාරීන් මෙන්ම අධිකරණ වෛද්‍ය නිලධාරී සහ ඇඟිලි සලකුණු නිලධාරී ඇතුළු 90කට ආසන්න පිරිසකට සවන් දුන් කමිටුව තම වාර්තාවෙන් නිරීක්ෂණ සහ නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කරයි.

කොළඹ රිමාන්ඩ්, මැගසින් සහ වැලිකඩ බන්ධනාගාර ආවරණය වන පරිදි ඒකාබද්ධ පරීක්ෂණ මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායේ 300 දෙනකුගේ සහය ඉල්ලා සිද්ධියට මාස තුනකට පෙර කොඩිප්පිලි මහතා පොලිස්පති එන්.කේ. ඉලංගකෝන් මහතාගෙන් කළ ඉල්ලීමක් සොයාගත් බව කමිටුව කියයි. කෙසේ වෙතත්, එයට අයහපත් ලෙස ප්‍රතිචාර දක්වා ඇති පොලිස්පතිවරයා ප්‍රකාශ කොට ඇත්තේ " බන්ධනාගාරයක් තුළ පරීක්ෂණ මෙහෙයුමක් ක්‍රියාත්මක කළ යුත්තේ විධිමත් ක්‍රියාකාරී සැලැස්මකට අනුව විශේෂ කාර්ය බලකා සහ බන්ධනාගාර නිලධාරීන් අතර සංවිධානාත්මක ආකාරයේ සම්බන්ධීකරණයකින් යුතුව පමණක්" බව කියමිනි.

**කෙසේ වෙතත්, 2012.11.9 දින පරීක්ෂණ මෙහෙයුම ක්‍රියාත්මක කරන ලද්දේ පොලිස්පතිවරයා නිල රාජකාරී කටයුත්තක් සඳහා විදේශගතව සිටියදී වන අතර, එම මෙහෙයුමට යොදාගත් විශේෂ කාර්ය බලකායේ භට පිරිස 798ක් දක්වා ඉහළ දමා තිබිණි. එම පිරිස යොදා තිබුණේ වැලිකඩ බන්ධනාගාරයේද වාට්ටු දෙකක් පමණක් පරීක්ෂා කරීම සඳහාය. එනම් එල් වාට්ටුව සහ චැපල් ගොඩනැගිල්ලයි. කමිටුවේ අදහස වන්නේ බන්ධනාගාරය තුළ විශේෂ කාර්ය බලකායේ 798ක අවිගත් පිරිසක් දකින්නට ලැබීමම එහි රැඳවියන් අතර කැලඹිලිකාරී තත්ත්වයක් ඇති කිරීමට හේතු වන බව සහ පුරවැසි ආයතනයක් තුළ පරීක්ෂාවක් කිරීමට අතුරු හමුදාවක් යොදා ගැනීම "තැතිගන්වන සුළු ක්‍රියාවක්" බවයි. ආයුධ සන්නද්ධව වැලිකඩ බන්ධනාගාරයට ඔවුන්ගේ ඇතුළුවීම ම නීතිය සම්පූර්ණයෙන් උල්ලංඝනය කිරීමකි.**

අගුළු දැමූ සිර මැදිරි දෙකකට කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම, රැඳවියන් කුපිත කිරීමට ප්‍රධාන හේතුව ලෙස හඳුනාගෙන ඇති අතර කොමිසම එම ක්‍රියාවද හෙළා දකියි. "කඳුළු ගෑස් දුමාරයේ බලපෑමෙන් මිදීම සඳහා කොටු වූ ප්‍රදේශයෙන් පිටතට යෑමට රැඳවියන්ට ඉඩක් නොතිබූ තත්ත්වයක් තුළ, විශේෂ කාර්ය බලකායේ මෙම ක්‍රියාව සැලකිය හැක්කේ අමානුෂික සැලකීමක් වශයෙනි. කමිටුව ඉදිරියේ හෙළිදරව් වූ සාක්ෂි අනුව තහවුරු වන්නේ, වැලිකඩ බන්ධනාගාරයේ ඇති වූ නොසන්සුන් තත්ත්වය විශේෂ කාර්ය බලකායේ නිර්මාණයක් මිස රැඳවියන්ගේ ක්‍රියාවක් නොවන බවයි.

කමිටුව සමන්විත වූයේ විශ්‍රාමික මහාධිකරණ විනිසුරු විමල් නම්බුවසම් (සභාපති), විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති අශෝක විජයතිලක සහ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යංශයේ විශ්‍රාමික අතිරේක ලේකම් එස්.කේ. ලියනගේ (ශ්‍රී ලංකා පරිපාලන සේවය) යන අයගෙනි.

**චාන්දනී කිරින්දේ**

*The Sunday Times : October 15, 2017*



peoplesworld.org

# ශ්‍රී ලංකා යුද හමුදාව ජනමාධ්‍යවේදීන්ගේ බුද්ධි තොරතුරු රැස් කරන බව

# තොරතුරු දැනගැනීමේ පනතේ අභියාචනයකදී හෙළිදරව් වෙයි

තමන් ජනමාධ්‍යවේදීන්ගේ බුද්ධි තොරතුරු වාර්තා රැස්කරන බව, ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ කොමිසමේ විමසුමකට පිළිතුරු දෙමින් ශ්‍රී ලංකා යුද හමුදාව වක්‍ර ලෙස පිළිගෙන ඇත. යාපනයේ, කස්තුරියර් පාරේ, 361 හි ජී. දිලීප් අමුතන් 2017.09.28 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතක් ඉදිරිපත් කළේ හමුදාවෙන් පවත්වාගෙන යන වෙළෙඳ ව්‍යාපාර පිළිබඳව සහ හයිටියේ යොදවා ඇති ශ්‍රී ලංකා සාම සාධක හමුදා භටයන් 2007දී හයිටි පුරවැසියන්ට ලිංගික අතවර කළ බවට නැගෙන චෝදනා පිළිබඳව තොරතුරු ලබාග ැනීම සඳහාය.

ඉල්ලා සිටි තොරතුරු ලබාදීම වෙනුවට හමුදාව කළේ දිලීප් අමුතන්ගේ ජාතික හඳුනුම්පතේ නිසි බලධාරියකු සහතික කළ පිටපතක් ඉල්ලා සිටීමයි. යුද හමුදාව තවදුරටත් ප්‍රකාශ කළේ ජනමාධ්‍යවේදී දිලීප් අමුතන්ගේ හමුදා බුද්ධි තොරතුරු වාර්තාවක් තමන් සතු බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස තොරතුරු නිදහස් කිරීමට පසුබට වන බවත්ය.

තම තීන්දුවෙන් තොරතුරු දැනගැනීමේ කොමිසම ප්‍රකාශ කළේ "ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද තොරතුරු දැනගැනීමේ පනත යටතේ නීත්‍යනුකූල සහ නීතිමය ක්‍රියා පිළිවෙළක් වන තොරතුරු දැනගනෙමේ ඉල්ලුම්පතක් පිරවීම යන කරණය මතම, පුරවැසියකු සම්බන්ධයෙන් හමුදා බුද්ධි වාර්තා ලබාගැනීමට කුමන හෝ පොදු අධිකාරියක් කටයුතු කරන්නේ නම් එමගින් පනතේ මූලික අරමුණම නිශේධ කරන බව මූලධර්මයක් ලෙස තදින්ම අවධාරණය කළ යුත්තේය." යනුවෙනි.

ආරක්ෂක අමාත්‍යංශයට එරෙහිව දිලීප් අමුතන් කළ අභියාචනාවට තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභා තීන්දුවේ උපුටාගත් සටහන්:

**ඉල්ලුම්කරු සම්බන්ධයෙන් යුද හමුදා බුද්ධි තොරතුරු වාර්තාවක් තමන් සතු බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස තොරතුරු නිදහස් කිරීමට පසුබට වන බවත්, පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුද හමුදාව) ප්‍රකාශ කළේය. පිළිතුරු සපයමින් ඉල්ලුම්කරු ප්‍රකාශ කළේ, තොරතුරු දැනගැනීමේ පනත යටතේ එහි විධිවිධාන අනුව තොරතුරු ඉල්ලුම්පතක් පිරවීම නිසාම පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුද හමුදාව) තමන් ගැන පසුබිම් තොරතුරු පරීක්ෂා කළ බවත්, එය තොරතුරු දැනගැනීමේ පනතේ අරමුණ පරාජය කිරීමක් බවත්ය. ප්‍රති ප්‍රතිචාර දක්වමින් පොදු අධිකාරිය (යුද හමුදාව) ප්‍රකාශ කළේ හමුදා බුද්ධි තොරතුරු වාර්තාව තමන් සතුව තිබෙන්නේ, ඉල්ලුම්කරු තොරතුරු දැනගැනීමේ පනත භාවිත කිරීමට පෙර සිට බවයි.**

ඉල්ලුම්කරුගේ පසුබිම හෝ තොරතුරු ඉල්ලා සිටින අරමුණ හෝ පනත යටතේ තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් නොවේ ය යන කරණයට කොමිසම ශ්‍රී ලංකා යුද හමුදාවේ අවධානය යොමු කළේය. ඉල්ලුම්කරු ජනමාධ්‍යවේදියකු බවත්, හමුදාව මෙබඳු වෙළෙඳ ව්‍යාපාරික ආයතන පවත්වාගෙන යන බව පෙන්වමින් ඔවුන් පිළිබඳව අයහපත් ප්‍රතිරූපයක් ගොඩනැගීමට මෙම තොරතුරු භාවිත කරමින් ඔහු කටයුතු කරනු ඇති බවත් යන කරුණ මත "යම් තොරතුරක් හෙළිදරවු කිරීම රාජ්‍ය ආරක්ෂාවට, හෝ එහි භෞමික අඛණ්ඩතාවයට හෝ ජාතික ආරක්ෂාවට හෝ තර්ජනයක් විය හැකිය" යන්න සඳහන් වන පනතේ 5 (ආ) (ඔ) කොටස තම පදනම ලෙස ශ්‍රී ලංකා යුද හමුදාව ඉදිරිපත් කළේය. ශ්‍රී ලංකා යුද හමුදාව ප්‍රකාශ කළේ මෙය අවසානයේ ශ්‍රී ලංකා යුද හමුදාව සහ උතුරු සහ නැගෙනහිර පළාත්වල ව්‍යාපාරික ප්‍රජාව අතර අනවශ්‍ය ගැටුමක් ඇති කිරීමට හේතුවිය හැකි බවත්, එය ඇත්ත වශයෙන් ම තොරතුරු දැනගැනීමේ පනතේ අදහස් කරන ආකාරයෙන් "රාජ්‍යයේ ආරක්ෂාවට" සහ / හෝ "ජාතික ආරක්ෂාවට" බල පෑමක් සිදු කරන කරුණක් විය හැකි බවයි.

## නියෝගය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද තොරතුරු දැනගැනීමේ පනත යටතේ නීත්‍යනුකූල සහ නීතිමය ක්‍රියා පිළිවෙළක් වන තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතක් පිරවීම යන කරණය මතම, පුරවැසියකු සම්බන්ධයෙන් හමුදා බුද්ධි වාර්තා ලබාගැනීමට කුමන හෝ පොදු අධිකාරියක් කටයුතු කරන්නේ නම් එමගින් පනතේ මූලික



*http://www.chinadaily.com.cn/*

අරමුණම නිශේධ කරන බව මූලධර්මයක් ලෙස තදින්ම අවධාරණය කළ යුත්තේය.

**මෙම සිද්ධියේදී එසේ සිදුවුවාද නැද්ද යන්න පිළිබඳ තක්සේරුවකට එළඹීමට අප ඉදිරියේ ඇති කරුණු අනුව මෙම අවස්ථාවේ දී කොමිසමට හැකියාවක් නැතත්, මූලධර්මයක් ලෙස ප්‍රකාශ කළ යුතු කාරණයක් වන්නේ, කුමන ආකාරයකින් කිසියම්ම බිය වැද්දීමක් සිදුවන්නේ නම් තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්කරුවකු එය ඉතාම බරපතළ කාරණයක් ලෙස සලකා කොමිසමේ විශේෂ මැදිහත්වීමක් ලබාගැනීම සුදුසු බව යි.**

විශේෂයෙන් අප සඳහන් කරන්නේ, ඉල්ලුම්කරුවකුගේ පසුබිම හෝ තොරතුරු ඉල්ලා සිටීමේ අරමුණ හෝ තොරතුරු දැනගැනීමේ පනතේ විධිවිධාන අනුව තොරතුරු දීම ප්‍රතික්ෂේපකිරීමට අදාළව සලකා බලන පදනමක් නොවන බවයි.

පනතේ 24 (5) (ඈ) කොටසේ මෙසේ සඳහන් වෙයි:

"තොරතුරු ඉල්ලා සිටින පුරවැසියකු ... තොරතුරු ඉල්ලා සිටීමට කිසිදු හේතුවක් හෝ ඔහු හෝ ඇය සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය වන තොරතුරක් හැර වෙනත් කිසිදු පෞද්ගලික තොරතුරක් හෝ ලබාදිය යුතු නැත."

**දිලීප් අමුතන්**

*Sri Lanka Brief - 17/07/2018*





*www.alamy.com*

## කිසිම වියදමක් නොකර
## 557 වරක් ගුවනේ පියාසර කළ මෛත්‍රී
# තුන්පාරක් ලෝකෙ වටේ රවුමක් ගහන්න තිබුණා

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඔහුගේ පස් අවුරුදු ධුර කාලයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් හෙලිකොප්ටර් යොදා ගනිමින් **කිලෝ මීටර් 131,277.17ක දුරක් ගමන් කොට ඇත. ඔහු විසින් වසරක් තුළ (2017) මෙසේ හෙලිකොප්ටර් භාවිතා කර ඇති සාමාන්‍ය වාර ගණන 111කි.**

## ලොව වටා තෙවරක් යන්න තිබුණා

තොරතුරු දැනගැනීමේ පනත හරහා, තමිල් මිරර් පුවත්පත, ශ්‍රී ලංකා ගුවන් හමුදා මුලස්ථානයෙන් ලබා ගන්නා ලද තොරතුරු විශ්ලේෂණයේදී ඉහත කරුණ අනාවරණය විය.

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා එම ධුරයේ කටයුතු කළ කාලයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ප්‍රභූවරුන්ට ලබා දෙන අති විශේෂ හෙලිකොප්ටර් එතුමන්ගේ ගමන් සඳහා ලබා දෙන ලදි.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් එම්.අයි. 17 වර්ගයේ **හෙලිකොප්ටර් 535** වරක් ද, **බී - 412 වර්ගයේ හෙලිකොප්ටර් 22 වරක්ද** මෛත්‍රීපාල සිරිසේන මහතා භාවිත කොට ඇත.

ඒ අනුව **සාමාන්‍යයෙන් වසරකට 111 වරක්** හෙලිකොප්ටර් භාවිතා කොට ඇති මෛත්‍රී, **නාවික සැතපුම් 70,884ක දුරක්** එනම්, **කිලෝ මීටර් එක් ලක්ෂ 31 දහස් 277.17ක් ගමන් කර ඇත.**

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා තම පස් අවුරුදු ජනාධිපති ධුර කාලයේ සිදු කළ හෙලිකොප්ටර් ගුවන් **ගමන් වාර 557** සඳහා කිසිදු ගෙවීමක් සිදු කොට නැත. මේ ගමන් සිදුකිරීමේ අරමුණ කුමක්ද යන වග ගුවන් හමුදා මූලස්ථානය ලබා දුන්නේද නැත.

පෘථිවියේ සාමාන්‍ය වටප්‍රමාණය කිලෝ **මීටර් 40,030.17කි.** මෛත්‍රී හෙලිකොප්ටරයෙන් සිදු කළ ගමන්වල දුර සන්සන්දනය කිරීමේදී ඔහුට පෘථිවි මධ්‍ය රේඛාවට සමාන්තර ගුවනේ තෙවරක් ලෝකය වටා යාමට හැකිව තිබුණි.

**පී. නිරෝෂ්**

*Tamil Mirror website*





*www.newsfirst.lk* ගුවන් හමුදා ත්‍රිකෝණමඩු පුනරුත්ථාපන කඳවුරේ දී පුනරුත්ථාපනය වූ එල්ටීටීඊ සාමාජිකයන්

# භාර වූ කොටි සාමාජිකයන් ගැන වග කිව යුත්තේ කවුරුන්ද?

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගෙන් තොරතුරු ලබා ගැනීම පිණිස ඊ තැපැල හරහා යවනු ලබන තොරතුරු දැනගැනීමේ අයදුම්පත්‍ර සඳහා පිළිතුරු ලැබෙන්නේ නැත.

ජනාධිපති කාර්යාලයේ හැසිරීම මේ අයුරින් තිබිය දී රටේ සෙසු රාජ්‍ය ආයතන වෙත ඊ තැපෑල හරහා තොරතුරු දැනගැනීමේ අයදුම්පත්‍රයක් යොමු කොට තොරතුරු ලබා ගැනීම කෙතරම් අසීරුද යන්න අමුතුවෙන් පැහැදිලි කළ යුතු නැත.



http://www.airforce.lk/ පුනරුත්ථාපනය වී පිට වී යන අවසන් එල්ටීටීඊ සාමාජිකයන් පිරිස

එබැවින් මේ අයුරින් ඊ තැපෑල හරහා යවන ලද තොරතුරු දැනගැනීමේ අයදුම්පත්‍ර ඔවුන් වෙත ලැබුණේදැයි කිහිප වරක් විමසා දැනගත යුතු ව ඇත.

මා විසින් යවන ඊ තැපෑල හරහා හමුදාව වෙත යවන ලද තොරතුරු දැනගැනීමේ අයදුම්පත්‍රය ලැබුණේ දැයි දින හතරකට පසුව **(08.04.2019)** දුරකථන ඇමතුමක් ලබා දී විමසීමි.

මේ අවස්ථාවේදී ආර්.ටී.අයි අයදුම ලැබී ඇති බවත්, එය පරිවර්තනය කොට අධ්‍යක්ෂවරයාට යවා ඇති බවත්, එනමුත් එම අයදුම ඔහු බැලුවේද නැද්ද යන වග තමන් නොදන්නා බවත්, කෙසේ වෙතත් ඒ වෙනුවෙන් පිළිතුරු ලැබෙනු ඇති බවත් එහි සිටි නිලධාරියෙක් පැවසීය.

**අප්‍රේල් මාසයේ 18 වැනි දින** දිනැතිව සිංහල බසින් වූ ලිපියක් මා වෙත එවන ලදි. එහි මා විසින් ඉල්ලා සිටි තොතුරු ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින බව සඳහන් කොට තිබුණි.

**2016 වර්ෂයේ අංක 12 දරන** තොරතුරු දැනගැනීමේ පනතේ **07 වැනි වගන්තිය** ප්‍රකාරව ඉල්ලා සිටින ලද තොරතුර අදාළ නිලධරයා විසින් දින **14ක්** ඇතුළත ලබා දිය යුතුය.

එනමුත් මෙම නීතිය නිසි අයුරින් පිළි නොපැදි හමුදාව, මා විසින් යොමු කරන ලද තොරතුරු ලබා ගැනීමේ අයදුමට මසකට අධික කාලයක් තිස්සේ කිසිම පිළිතුරක් ලබා දුන්නේ නැත.



මා විසින් මැයි මාසයේ **05 වැනි දින (08.05.2019)** නැවතත් හමුදා මූලස්ථානයට ඇමතුමක් ලබා ගෙන මේජර් රණසිංහ මහතාගෙන් මා යොමු කළ ආර්.ටී.අයි අයදුමට මසක් සපිරී ඇතත් මේ වන තෙක් පිළිතුරු ලැබී නැති බව දැන්වීමි.

ඉන් අනතුරුව කර්නල් නිර්මලා පෙරෝ සමග සම්බන්ධ වී මේ සම්බන්ධ තොතුරු ලබා ගත හැකි යැයි පැවසුවේ ය. මා යොමු කළ ලිපිය දෙමළ බසින් තිබූ නිසා එය පරිවර්තනය කිරීම සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවට යවා ඇති බවත්, ඔවුන් එය සතියක් ඇතුළත පරිවර්තනය කරන බව පැවසූ බවත් කර්නල් නිර්මලා මා වෙත පැවසුවාය.

මේ සම්බන්ධයෙන් මට ලිපියක් යොමු කොට ඇති බවත් ඇය පැවසුවාය. එනමුත් මැයි මස හයවන දින මා වෙත එවා ඇති ලිපිය මට ලැබුණේ **මැයි මස 16 වනදය. මැයි 16න් පසුව ජූනි 30 දින** කීප වරක් හමුදා මූලස්ථානයට ඇමතුම් ගෙන පිළිතුරු වෙනුවෙන් බලා සිටීමට සිදු විය.

**2016 වර්ෂයේ අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතේ සඳහන් විධි විධාන නිසි ලෙස අනුගමනය නොකළ හමුදාව අවසන් යුද සමයේ දෙමළ ඊළාම් කොටි සංවිධානයේ කිසිදු සාමාජකයෙකු තමන් වෙත භාර නොවූ බවට පිළිතුරු ලබා දී තිබුණි. අවසන් යුද සමයේ කොටි සාමාජිකයන් කිසිවෙකු තමන් වෙත භාර නොවූ බව පවසා ලිස්සා යාමට දරන උත්සහය විමර්ශනයට ලක් කළ යුතු ව ඇත. ශ්‍රී ලංකා යුද හමුදාවේ නිල ඊ තැපෑල වන *dmedia@army.lk, slarmymedia@gmail.com* යන ඒවාට ලබා දුන් අයදුම්පත්‍රවලට හමුදාව එවන් පිළිතුරක් ලබා දී තිබුණි.**

තොරතුරු පිළිබඳ නිලධරයා වූ බ්‍රිගේඩියර් ඩී.එම්.එස්.පී. අතපත්තු යන අය අත්සන් තබන ලදුව මෙකී ලිපිය මට ලැබිණි.

තොරතුරු දැනගැනීමේ පනත යටතේ යවන ලද අයදුම්පත යොමු කොට මාස තුනක් ගත වූ තැන මා වෙත යොමු කළ සිංහල ලිපියේ වැඩිදුරටත් සඳහන් වග නම්,

අවසන් යුද සමයේ දෙමළ ඊළාම් කොටි සමාජිකයන් ශ්‍රී ලංකා යුද හමුදාව වෙත භාර වූයේ නැත. ඔවුන් භාර වූයේ ශ්‍රී ලංකා රජයට බව එහි සඳහන්ය.

තවද, භාර වූ කොටි සාමාජිකයන් පිළිබඳ බලයලත් ආයතන වන, පුනරුත්තාපන කොමසාරිස් කාර්යාලය හරහා අවශ්‍ය තොරතුරු ලබා ගත හැකිය යනුවෙන්ද සඳහන් කොට තිබුණි.

අවසන් යුද සමයේ දෙමළ ඊළාම් කොටි සාමාජිකයන් හමුදාව වෙත භාර වූ බවට පමණ ඉක්මවා සාක්ෂි තිබෙන බව දෙමළ ජනතාවගේ විශ්වාසයයි. එසේ භාර වූ කොටි සාමාජිකයන්ට සිදු වූයේ කුමක්ද? ඔවුන් සම්බන්ධව වග කිව යුත්තෝ කවුරුන්ද යන්න අදටත් ගැටලුවක්ව පවතියි.

**ජී. නිරෝෂ්**

*Tamil Mirror website - 5th July 2019*



*http://www.redcross.lk/*

# වතු නිවාස ඉදිකිරීමේ මුදලින් ආහාර බුදින ඇමතිවරයා

වෙන් වෙන් වූ වතු නිවාස යෝජනා ක්‍රමය තුළින් තමන්ට නිවසක් ලබාගැනීම වතුකරයේ ජනතාවගේ දීර්ඝකාලීන සිහිනයකි. ඊට අදාළ වන ආකාරයෙන් ඉන්දීය රජයෙන් ලැබුණු වතු නිවාස ආධාර මුදලින් පළමු අදියර වශයෙන් **නිවාස 40ක** ඉදිකිරීම් අවසන් වී ඇත. එහි දෙවන අදියර වශයෙන් **වතු නිවාස 10,000ක්** ඉදිකිරීමේ යෝජනා ක්‍රමයද කඩිනමින් ඇරඹීමට කටයුතු කරමින් ඉදිරි ජූලි මාසයේ දී වැඩ පටන්ගන්නා බව අදළ අමාත්‍යාංශය නිවේදනය කර ඇත. අමාත්‍යාංශය හරහා මෙම නිවාස යෝජනාව ඉදිරිපත් කර ඇතත්, එය ක්‍රියාත්මක කෙරෙන්නේ "වැවිලි මානව භාරය" මාගීයෙනි.



එසේ ආරම්භ කරන ලද නිවාස යෝජනා ක්‍රමවල බොහෝ අඩුපාඩු හා අක්‍රමිකතා පිළිබඳව වගකීම් දරන අංශ දැනුවත් කළ නමුත් ඒ ගැන සොයා බලා නිවැරදි කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැත. **වර්ෂ 2016 දී** මස්කෙළිය බ්‍රවුන්ස් වික් වත්තේ ආරම්භ කළ හරිත උයන වතු නිවාස 25ක යෝජනාක්‍රමය පිළිබඳ නොයෙක් තර්ක විතර්ක ඇති විය. විශේෂයෙන් විදුලිය, මංමාවත් ආදිය වෙනුවෙන් එම නිවාසලාභී ජනතාව විසින් වෙන් කරන ලද මුදලටත් වඩා වැඩි මුදලක් දරන ලදි. වතුකරයේ යෝජිත වූ සෑම නිවාස යෝජනා ක්‍රමයක් සඳහාම වෙන්කරන මුදලින්, එම නිවාසවලට අදාළ සියලුම පහසුකම් ලබාදෙන අතර උක්ත නිවාසලාභී ජනතාවගෙන් කිසිදු මුදලක් අය නොකෙරේ.

ඉහත බ්‍රවුන්ස් වික් වත්තේ **නිවාස 25 යෝජනා ක්‍රමයේ** සිදු වී ඇති අක්‍රමිකතා රැසක් පිළිබඳව තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ඉල්ලීම් කර ලබාගත් තොරතුරු අනුව අනාවරණය වෙයි. විදුලිය ලබාගැනීම සඳහා **රු. 704,086.20ක** මුදලක් වෙන් කර, මේ වන විට වියදම් කර ඇති නමුත්, එම නිවාස ලාභී ජනතාවට තවම විදුලිය පහසුකම් ලබා දී නැත. එමෙන්ම එම නිවාස ලාභීන්, **එක් පවුලකට රු. 18,915.16ක්** ආදී වශයෙන් **රු. 18,915.16 × 25 - 472,879.00** ක මුදලක් විදුලිබල මණ්ඩලයටද ගෙවා විදුලි සම්බන්ධතාව ලබාගෙන ඇත. ඒ අයුරින්ම නිවාස අතරින් පාරවල් තැනීම සඳහාද වෙන් කරන ලද **රු. 604,314.98** වන මුදලද මේ වන විට වියදම් කර ඇතත් එම පාරේ වැඩකටයුතු ද අතරමැද ඇනහිට ඇත.

**එම නිවාස යෝජනා ක්‍රමයේ මුදල් අවිධිමත් අයුරින් වියහියදම් කර ඇති බව පෙනෙන්නට ඇත. එමෙන්ම නිවසක් සෑදීමට වැය කිරීමට යෝජිත මුදලට අදාළ යෝජනා හා සම්බන්ධ ප්‍රචාරක වෙළඳ දැන්වීම්, ගුවන් ගමන් වියදම්, ඇමැතිවරයාගේ හා රාජකාරියෙහි යෙදී සිටින නිලධාරීන්ගේ කෑම බීම, අතුරු පස සඳහා වන වියහියදම් ආදිය ඇතුළත් වීම පුදුමයට කාරණාවකි.**

එසේම කඳුරට නව ගම්මාන හා සමාජ සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන වැවිලි මානව භාරයේ පූර්ණ අධීක්ෂණයෙන් යුතුව ක්‍රියාවට නැංවූ යෝජනාක්‍රම පිළිබඳ තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ අප කළ ඉල්ලීම් අනුව **2014, 2019** දක්වා වැවිලි මානව භාරය මගින් ක්‍රියාත්මක කළ යෝජනා ක්‍රමයක් පිළිබඳව සවිස්තර වාර්තාව අඩංගු ලිපියක්, යොමු අංක M/V/N/q/2/8/32/fP /I/2019 යටතේ අප වෙත ලැබිණි.

මෙහිදී **2014 වසරේදී** ගිණුම් වාර්තාවේ, ඉන්දියානු නිවාස යෝජනාවන් සම්බන්ධ සමගාමී ප්‍රචාරක රැස්වීමක් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රන ශාලාවේ සංවිධානය කර, එම කටයුත්ත සඳහා ආහාර, පානාදිය, **ඇමැතිවරයාගේ සහ කාර්ය මණ්ඩලයේ දිවා ආහාර සහ අතුරු පස සඳහා වූ වියදම වශයෙන්, රු. 164,733.94ක් සහ රු. 208,000.00ක්ද, බාහිර ගමන් වියදම් සඳහා (ඉන්ධන/ පෙට්‍රල්) රු. 32,635.00ක්ද, ගුවන් ගමන් (හෙලිකප්ටර්) වියදම් වශයෙන් රු. 75,912.00ක්ද, ආදී වශයෙන් රු. 1,164,494.94ක් වියදම් කර ඇත.** විශේෂිත වූ කාරණයක් නම් මෙම හරිත උයන නිවාස යෝජනාවේ, එක නිවාසයකට වෙන් කරන මුදල මෙන් දෙගුණයක පමණ මුදලක් නිරපරාදේ අනවශ්‍ය වියදම් සඳහා යෙදවීමයි. සමස්ත වතුකරයේ අද වන විට



http://thehowarths.net/

බොහෝ ප්‍රදේශවල වෙන් වෙන්ව නිවාස තැනීමේ යෝජනාක්‍රම ක්‍රියාත්මක වෙයි. එමෙන්ම ජනතාවගේ සුහසිද්ධිය වෙනුවෙන් වෙන් කරන ප්‍රතිපාදන මුදලින් උක්ත ජනතාවට එල ප්‍රයෝජන ලැබෙනවාද යන්න ගැටලුවකි.

**2015.05.10 හි දින ආගරපනත ප්‍රියිමෝර් වත්තේ 7 වන ජනාවාසයේ මුළුමනින්ම දැවී පිළිස්සී ගිය නිවාස 8 හිමි නිවාසලාභීන්ට අද වනතුරු නිවාස ලබාදී නැත. ඔවුන් අද වනතුරු ජීවත්වන්නේ, විකල්පයක් වශයෙන් වැවිලි මානව භාරයේ අනුග්‍රහයෙන් තනා දෙන ලද තාවකාලික කූඩාරම්වලය.**

එමෙන්ම **2018/12/29 දින** හෝටයිස් **අක්කර 30** වතු කොටසේ ගින්නෙන් විනාශ වී ගිය නිවාස වෙනුවට. අද වනතුරු කිසිදු විකල්ප ක්‍රියාමාර්ගයක් හෝ ගෙන නැත.

වතුකරයේ නිවාස ඉදිකිරීම් ආරම්භ කරන අවස්ථාවේදී ස්වාභාවික ආපදා හේතුවෙන් නිවාස අහිමි වන ජනයාට මුල්තැන ලබාදී කටයුතු කළ නමුත්, අද වන විට තම තමන්ගේ ආධාරකරුවන් හා පාක්ෂිකයන් බහුලව ජීවත්වන වතු හා ස්ථාන සොයා නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ සූක්ෂම ක්‍රමවේදයක් අනුගමනය කරමින් පවතින බව නොරහසකි.

එමෙන්ම අමාත්‍යාංශයේ රැස්වීම්, සාකච්ඡා ආදියට දසදහස් ගණනින් ආධාරකරුවන් ගෙන්වා ගැනීම සිදු වේ. එක නිවාස යෝජනාවක් සඳහා වන අනවශ්‍ය වියදම් නතර කළහොත් එයින් තවත් වතු නිවාස දෙකක් සාදා දිය හැකිය.

**වර්තමානයේ දී නුවරඑළිය, බදුල්ල, මහනුවර, රත්නපුර, ගාල්ල, කෑගල්ග, මොණරාගල, මාතලේ, කළුතර, මාතර ඇතුළු දිස්ත්‍රික්කවල සාමාන්‍යයෙන්, 943,298ක් පමණ වතුකර ජනතාව ජීවත්වන බවත්, එම ජනයා වෙනුවෙන්, පවුල් වශයෙන් 186,298ක් පමණ වතු නිවාස සංඛ්‍යාවන් අවශ්‍ය බවත් කඳුරට නව ගම්මාන හා සමාජ සංවර්ධන අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව- 2018 හි සඳහන් වේ. ඒ අනුව මින් ඉදිරියේදීවත් අහිංසක වතුකරයේ ජීවත්වන ජනතාවගේ අභිවෘද්ධිය, අවශ්‍යතා මුල් කරගනිමින් සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාවට නැංවිය යුතු බව අපගේ ඉල්ලීමයි.**

**කේ. ප්‍රසන්නා**

2019 අගෝස්තු 05 - තිනකුරල් පුවත් පතේ අනුග්‍රහයෙනි.





www.alamy.com

# හැටන් බස් නැවතුම්පළ පොදු වැසිකිළියක්

1. නිසි නඩත්තු කිරීමකින් තොර පොදු වැසිකිළි පද්ධතිය
2. පොදු වැසිකිළි භාවිත කරන්නන්ගෙන් අධික ගාස්තු අය කිරීම
3. බද්දට ලබාදීමේදී වැඩි ආදායමක් ලබාග ැනීම

පසුගිය රජයේ කඳුරට නවගම්මාන යටිතල පහසුකම් සහ සමාජ සංවර්ධන අමාත්‍ය ධුරය දැරූ (වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී) දිගම්බරම් ඇමැතිවරයා හැටන් නගරය නවීන අලංකාර නගරයක් වශයෙන් සංවර්ධනය කිරීමේ සංකල්පයෙන් යුතුව වැඩ අරඹන ලදි.

එහි පළමු අදිර වශයෙන් හැටන් දුම්රිය ස්ථානය අලංකාරවත්ව සංවර්ධනය කිරීමේ යටිතල නිර්මාණ කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතිණි. නමුත් නව රජය පත් වීමෙන් පසු මෙම යෝජනා ක්‍රියාවට නැංවීම මන්දගාමී වී ඇත. හැටන් නගරය අලංකාරවත් ලෙස සංවර්ධනය කිරීම වැදගත්ය, ඊටත් වඩා

අත්‍යාවශ්‍ය කරුණක් නම් නගරයේ පොදු වැසිකිළි ජනතාවට පාවිච්චි කිරීමට සුදුසු අයුරින් පිරිසිදුව පවත්වා ගෙන යෑමයි.

නමුත් හැටන් බස් නවතුම්පළේ තත්ත්වය ඉතාම කනගාටුදායකය. මේ වනවිට හැටන් බස් නැවතුම්පළේ බස් නවතා තබන තැන්වල පසුපස, එම බස්රථවලට මුවා වී ජනයාට මුත්‍රා කිරීමේ පහසුකම් සලසන ස්ථානයන් බවට පත්ව ඇත. බස් නැවතුම්පළේ පොදු වැසිකිළි පහසුකම් තිබුණද, මහජනයාගේ තේරීම වී තිබෙන්නේ මෙයයි. වසර ගණනාවක් තිස්සේ මෙලෙස සිදුවෙමින් පවතින නමුත් එය නැවත්වීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැත.

එමෙන්ම හැටන්, තලවාකැලේ වැනි නගරවල බස් නැවතුම්පළවලද පොදු වැසිකිළි භාවිත කරන්නන්ගෙන් අධික ගාස්තු අය කෙරෙන බව මෑතකදී පුවත් මගින් හෙළිව තිබිණි. එම ප්‍රවෘත්තියෙහි සඳහන් වූයේද දහස් ගණන් මගීන් සංඛ්‍යාවක් දෛනිකව එන - යන මෙම නගරවල වැඩිපුර වැසිකිළි ගාස්තු අයකිරීම හේතුවෙන් මහජනතාව අපහසුවට පත් වන බවයි. ඒ අයුරින්ම පාසැල් සිසු - සිසුවියන්ගෙන් වැඩිපුර මුදල් අය කරන බවත්, සමහර වැසිකිළිවල **රු. 20/-**ක් වැනි මුදලක් අයකරන බවද හෙළි විය.

මෙසේම නුවරඑළිය මහ නගර සභාවට අයත් බස් නැවතුම්පළේ පිහිටා තිබෙන පොදු වැසිකිළි පද්ධතිය මහජනයාගේ පාවිච්චියට සුදුසු තත්වයක නොමැති බව මෑතකදී ජනමාධ්‍ය මගින් වාර්තා විය. එසේ වෙතත් වැලිමඩ නගර සභාවට අයත් බස් නැවතුම්පළේ පිහිටා තිබෙන පොදු වැසිකිළි මුළුමනින්ම නොමිලයේ මහජනයාට සේවාව ලබාදෙන බවද පැවසේ.

**මෙම වැසිකිළි පිළිබඳ ගැටලු ගැන තලවකැලේ ලිඳුල නගර සභාවෙන් (අංක *C.P.C/N/TUC/5/1/RTI*) හා හැටන් දික්ඔය නගර සභාවෙන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පදනම් කර ගනිමින් තොරතුරු කිහිපයක් ලබා ගැනීමට හැකි විය. ඒ අනුව තලවාකැලේ - ලිඳුල නගර සභා සීමාව තුළ එකම පොදු වැසිකිළියක් පමණක් පිහිටා තිබෙන බවත් ටෙන්ඩර් මගින් ලබා දී තිබෙන එම පොදු වැසිකිළි පද්ධතිය වෙනුවෙන් මාසිකව රු. 52,170/-ක් ආදායම වශයෙන් ලැබෙන අතර ගාස්තුව වශයෙන් එක් අයකුගෙන් රු. 20/-ක් අය කරන බවද පැවසිණි. වැසිකිළි ගාස්තු වැඩියෙන් අය කරන බවට මේ වන තුරු කිසිදු පැමිල්ලක් තමන්ට නොලැබුණු බවද ප්‍රකාශ කෙරිණි.**

හැටන්-දික්ඔය නගර සභාවට පොදු වැසිකිළි පද්ධති තුනක් ඇති අතර ඉන් දෙකක් හැටන් නගර මධ්‍යයේ ද, අනෙක දික්ඔය නගරයේද පිහිටා ඇත. මෙයින් දික්ඔය පොදු වැසිකිළි පද්ධතිය මුළුමණින්ම නොමිලයේ මහජනයාගේ භාවිතයට ලබාදී ඇත. හැටන් බස්නැවතුම්පළේ පොදු වැසිකළි පද්ධතිය සහ හැටන් STAR චතුරස්‍රයේ පොදු වැසිකිළි පද්ධතිය ආදිය ටෙන්ඩර් මගින් ලබා දී ලක්ෂ ගණනාවක් ආදායමක් වශයෙන් ලබාගනී. එසේ ටෙන්ඩර් ලබා දීමෙන් **වර්ෂ 2016දී වසරට රු. 3,874,643.43ක ආදායමක්ද 2017 වසරට රු.4,845,061.86ක ආදායමක්ද 2018 වසරට රු.4,211,809.92 ක ආදායමක්ද, 2019 වසරට රු. 2,952,108.29 ආදායමක්ද (2019.09.30 දින දක්වා) හැටන්, දික්ඔය නගර සභාව ලබාගෙන ඇති බව වාර්තා වේ.**

සාමාන්‍යයෙන් පොදු වැසිකිළි පාවිච්චි කරන්නන්ට **රු.10/-ක** මුදලක් නියම කර තිබෙන නමුත් **රු. 18/-** කට වඩා මුදලක් අයකරන බවට මහජනතාව පැමිණිලි කරයි. මේ සම්බන්දව තමන්ට පැමිණිලි ලැබී ඇති බවත්, එම පැමිණිලි සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් හැටන්- දික්ඔය නගර සභාව දන්වා ඇත.

මෙසේ ගාස්තු වැඩිපුර අයකිරීම නිසාද, පොදු වැසිකිළි පාවිච්චියට සුදුසු තත්වයේ නොපැවතීම හේතුවෙන් ද වෙනත් විවෘත ස්ථාන සොයා යති. හැටන් බස් නැවතුම්පළේ පිටුපස තිබෙන පදික වේදිකාවේ කානුව එම කාර්ය සඳහා යොදා ගන්නා ස්ථානයකි.

මේ හේතුවෙන් නතර කර තිබෙන බස් රථවල ගමන් කරන්නට බස් රථය තුළ රැඳී සිටින මගීන්ට දැඩි අසීරුතාවන්ට මුහුණපාන්නට සිදු වී ඇත. එම නො ඉවසියහැකි දුර්ගන්ධය ඉමහත් කරදරයක් බවට පත්වී ඇත. පොදු වැසිකිළි මාර්ගයෙන් ලක්ෂ ගණනින් මුදල් උපයන, නගර සභාව මෙම අවාසනාවන්ත තත්ත්වය ගැන දැඩි මන්දගාමී ස්වරූපයෙන් කටයුතු කිරීම හාස්‍යජනකය.

එමෙන්ම බස් නැවතුම්පළ යාබද පිහිටා තිබෙන පොදු වැසිකිළි පද්ධතියද ඉතාමත් අපිරිසිදු තත්වයක පවති. ඒ තුළම එකතු වන කුණු කසළ ද සෞඛ්‍යයට තර්ජනයකි.

මෙතරම් අපිරිසිදු තත්වයන් මධ්‍යයේ තේ කඩ, හෝටල් මෙන්ම පදික වේදිකාවේ ආහාර පානාදිය විකුණන වෙළෙන්දෝද තම වෙළෙඳාම් කටයුතු කරගෙන යති.

නව ජනාධිපතිවරයාගේ සංකල්පයකට අනුව පාර දෙපස ගල් බැම්වල තාප්පවල සිතුවම් ඇඳ වර්ණවත් කර මුළු රටම අලංකාරවත් කිරීමේ වැඩපිළිවෙළක්


livandleetravel.wordpress.com

ක්‍රියාත්මක වෙමින් පවතී. මෙවැනි වර්ණවත් අලංකාර බිතු සිතුවම්වලින් හැටන් නගරයේ බස් නැවතුම්පළේ පවතින අපිරිසිදුබව හා දුර්ගන්ධය නැති කළ නොහැක. එයට පදික වේදිකාවේ කානුවල මුත්‍රා කිරීම, අපිරිසිදු කිරීම නතර කළ යුතුය. තහනම් කළ යුතුයි. වෙන එකක් තබා බස් රියදුරන්, කොන්දොස්තර සහායකයින් පවා මෙම පදිකවේදිකා කානුව අපිරිසිදු කරති. ඔවුන්ට විරුද්ධව නීතිය මගින් දඬුවම් කළ යුතුය.

හැටන් නගරය අලංකාරවත් කිරීමේ ක්‍රියාදාමයට හැටන් පොදු බස් නැවතුම්පලවල්, පෞද්ගලික වාහන නැවතුම්පළවල්, හැටන් දික්ඔය නගරසභාව, හැටන් ඩිපෝව, මධ්‍යම පළාත් ගමනාගමන අධිකාරිය, හැටන් පොලිස් ස්ථානය, සමඟ පොදු මහජනතාව එක්ව ක්‍රියා කළ යුතුය.

**කේ. ප්‍රසන්නා**

*Thinakkural - 03rd January 2020*




*https://mapio.net/*

# වතු වෘත්තීය සමිතිවල සාමාජික දායක මුදල්වලට
# සිදුවන්නේ කුමක්ද?

වතුකම්කරු ජනතාව නියෝජනය කරමින්, ඔවුන්ගේ මාසික වැටුපෙන් නියමිත දායක මුදලක්ද අයකරමින් කටයුතු කරන මහපරිමාණ මෙන්ම සුළු පරිමාණ වෘත්තීය සමිති රැසක් රට තුළ ක්‍රියාත්මකය. කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි මෙන්ම ලියාපදිංචියක් නොමැතිවද මාසිකව දායක මුදලක් එක්රැස් කරමින් කටයුතු කරන වතු වෘත්තිය සමිතිවල විස්තර, "තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම්" පිළිබඳව තිබෙන අනපනත් විධිවිධාන මාර්ග යක් පවා දැනගැනීම නොහැකි තත්වයක් පවතී. ඒ අනුව ඉහත විස්තර ලබාදෙන



ලෙස **2020 පෙබරවාරි** මාසයේදී කම්කරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කළ නමුත් එය ලබාගත හැකි වූයේ කොමිෂන් සභාවටද අභියාචනා ඉදිරිපත් කිරීමෙන් පසුව 2020 ජුනි මාසයේදීය. ඒ අනුව වතු වෘත්තීය සමිති සාමාජික සංඛ්‍යාව පිළිබඳ කළ විමසුමට පිළිතුරක් වශයෙන් පහත සඳහන් තොරතුරු ලැබිණි.

**1. ලංකා කම්කරු කොංග්‍රස් සාමාජික සංඛ්‍යාව - 383,007 (2016-2017)**

**2. ලංකා ජාතික වතු කම්කරු සංගමය සංඛ්‍යාව - 148,242 (2017-2018)**

**3. කම්කරු ජාතික සංගමය සංඛ්‍යාව - 26,172 (2017-2018)**

මීට අමතරව කඳුරට ජනතා පෙරමුණ, පුරවැසි පෙරමුණ, කම්කරු ජාතික පෙරමුණ, ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ ආදී වෘත්තීය සමිතිවල තොරතුරුද ලබාදී ඇති අතර අනෙකුත් වෘත්තීය සමිති සම්බන්ධව තොරතුරු නොලැබිණි. එසේම එක් එක් වෘත්තීය සමිති එක්රැස් කරන දායක මුදල් පිළිබඳ විස්තර ලබාදීම කම්කරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන ලදි. නමුත් මේ සම්බන්ද දෙපාර්ශ්වයකට පමණක් පිළිතුරු ලබාදී ඇත. තවදුරටත් අපට දැනගැනීමට අවශ්‍ය වූයේ වෘත්තීය සමිති මගින් වතු කම්කරුවන්ගේ **මාසික වේතනයෙන් අයකරන රු. 150/-** වන දායක මුදල්වලට කුමක් වන්නේද? යන්නයි. ඒ පිළිබඳව මැතිවරණ කොමසාරිස් කාර්යාලයෙන් තොරතුරු දැනගැනීමේ පනතට අනුව කළ සොයා බැලීමේදී ලියාපදිංචි වෘත්තිය සමිතිවල වාර්ෂික අයවැය වාර්තා **(23/199)** ලබාගැනීමට හැකි විය. මේ මගින්, ලංකා කම්කරු සංගමය, කඳුරට ජනතා පෙරමුණ, ප්‍රජා පෙරමුණ, කම්කරු ජාතික සංගමය, ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පෙරමුණ ආදී පක්ෂවල තොරතුරු ලැබිණි.

මාසිකව කම්කරුවන්ගෙන් **රු. 150/-ක** සාමාජික දායක මුදලක් අයකරනු ලබන අතර එහි මුළු එකතුව කෝටි ගණනකි. මෙම වෘත්තීය සමිති, මෙතරම් විශාල මුදල් ප්‍රමාණයක් කෙසේ පරිහරණය කරනවාද? එම මුදල්වලින් අදාළ කම්කරු ජනතාවට සිදුවන සෙත කුමක්ද? යන කාරණා වැදගත් වන්නේය.

**2015/2016 කාල වකවානුවේදී ලංකා කම්කරු සංගමය සාමාජිකයින් 396,869 දෙනෙකුගෙන් සාමාජික මුදල් වශයෙන් රු. 94,731,687/- ක් අය කරගෙන ඇත. 2016/2017 වසරට අදාළව රු. 77,751,933/- ක්ද, 2017/2018 වසරට අදාළව රු. 77,58,020/-ක්ද අය කරගෙන ඇත.**

**එපරිද්දෙන්ම දේශපාලන අරමුදල් වශයෙන් 2015/2016 වසර තුළ රු. 10,525,743/ක් වශයෙන් ද 2016/2017 වසර තුළ රු. 8,639,104/-ක් වශයෙන්ද 2017/2018 වසරේදී රු. 19,668,944/- වශයෙන්ද ලබාගෙන ඇත.**

**අනෙකුත් අයකර ගැනීම් වශයෙන්, පොලිය, ගෙවල් කුලී, මුදල්මය තැන්පතු, ණය දීමෙන් ලබන පොලිය, රක්ෂණ ඔප්පු යනාදී වශයෙන් 2015/2016 කාල වකවානුවට රු. 20,879,977/-ක් ද 2017/2018 කාල වකවානුවට රු. 19,668,944/-ක් ද ආදායම වශයෙන් ලබාගෙන ඇත. මේ අයුරින් සාමාජික දායක මුදල්, දේශපාල පක්ෂ අරමුදල්, සහ**



**අනෙකුත් ආදායම් වශයෙන් 2015/2016 කාල වකවානුවේදී රු. 12,637,407/-ක් ද, 2016/2017 සඳහා රු.209,767,017/-ක් ද, 2017/2018 වර්ෂය සඳහා රු.97,349,464/ක් ද ආදායමක් වශයෙන් උපයාගෙන ඇත. වතු කම්කරුවන් අවුරුදු 30-40ක් වත්තේ සේවය කොට අවසානයේදී සේවක අර්ථසාධක අරමුදල වශයෙන් ලබා ගන්නේ රුපියල් ලක්ෂ 10-15ක් පමණ මුදලකි. නමුත් වෘත්තීය සමිති වර්ෂයකින් දෙකකින් කෝටි ප්‍රකෝටි මුදලක ආදායමක් ලබයි.**

වතු ක්ෂේත්‍රය මුල් කර ගෙන දැනට **වෘත්තීය සමිති 34ක්** (කම්කරු දෙපාර්තමේන්තුව *RTI*) ක්‍රියාකාරීව පවත්වාගෙන යයි. මේ ආකාරයෙන් රැස් කර ගන්නා කෝටි ගණනක මුදල්වලින් එම කම්කරු පංතියට සෙතක් සිදු කර ඇත්දැයි සොයා බැලුවිට ප්‍රතිඵල හිස්ය. සාමාජිකත්වයෙන් ලබාගන්නා අරමුදල්වලින් ඒ අයගේ පුද්ගලික හා පරිපාලන වියහියදම් වෙනුවෙන් විශාල මුදලක් වැය කරන බව නම් නොරහසකි.

**මෙය සෑම වෘත්තීය සමිතියකම පෙනෙන්නට තිබෙන පොදු ලක්ෂණයකි. උදහරණ ලෙස ලංකා කම්කරු සංගමයේ 2015/2016 වසර තුළ රු. 98,743,604/-ක්ද 2016/2017 වසර තුළ රු. 96,444,643/-ක්ද 2017/2018 වසර සඳහා රු. 67,597,127/- ක්ද වියදම් කර ඇත.**

**මෙම මුදලින් කාර්යමණ්ඩල සේවකයින්ගේ දීමනා ඇතුළු වෙනත් දීමනා ද, අභ්‍යන්තර අවශ්‍යතා සියල්ල ද ගෙවා ඇත. ඒ සමගම වෘත්තීය සමිතිවල දිස්ත්‍රික් මට්ටමින්, වතු මට්ටමින් වෘත්තීය සමිති සම්බන්ධීකරණ කටයුතු මෙහෙයවන දිස්ත්‍රික් කොමිටිවලට 2015/2016 වසර සඳහා රු. 300,200/-ක් ද 2016/17 වසර සඳහා රු. 2,530,000/-ක් ද 2017/2018 වසර සඳහා රු.935,080/-ක මුදලක් ද, වතු ශාඛා සංගම් ක්‍රියාකාරීන් සඳහා 2015/2016 වසර සඳහා රු. 5,149,071/-ක් ද 2016/2017 වසර සඳහා රු. 4,282,765/- ක මුදලක් ද ගෙවා ඇත.**

**ඒ සමඟම වෘත්තීය සමිතිවලටම අදාළ මැයි දිනය වැනි උත්සව සඳහා ලංකා කම්කරු සංගමය 2015/2016 වසර සඳහා රු. 5,007,940/-ක් ද 2016/2017 වසර සඳහා රු. 5,448,872/-ක මුදලක්ද 2017/2018 වසර සඳහා රු. 4,939,560/-ක මුදලක් ද වැය කර ඇති බව පෙනීයයි.** මේ ආදී වශයෙන් සෑම මැයි දින උත්සවයකදීම රු. ලක්ෂ 50ක මුදලක් වැය කර ඇති නමුත් මේ තරම් අතිමහත් වියදමක් දරමින් සමරන්නාවූ මැයිදින උත්සව මාර්ගයෙන් මේ දක්වා සමස්ත කම්කරු පංතියට කර ඇති සේවාව හා ලබාදී ඇති අයිතිවාසිකම් ප්‍රතිලාභ මොනවාදැයි ප්‍රශ්න කළ හැකිය.

**එමෙන්ම කඳුරට ජනතා පෙරමුණ 2015.04.01 සිට 2016.03.31 දක්වා වූ කාල වකවානුවට රු.1,934,000/-ක මුදලක් ලබාගෙන ඇති අතර දීමනා, උත්සව දීමනා ආදිය වෙනුවෙන් රු. 1,920,628.52ක් වැය කර ඇත. 2017.05.01 දින සිට 2018.05.31 දින දක්වා වූ කාලය තුළ රු. 252,647.18ක් අරමුදල් වශයෙන් ලබාගෙන මුළුමනින්ම එම මුදල පරිපාලන වියදම් සඳහා යොදාගෙන ඇත. කම්කරු ජාතික පෙරමුණ 2015/2016 වසර සඳහා රු.1,080,230/-ක් ද 2016/2017 වසරට රු.906,107/-ක් ද අරමුදල් වශයෙන් ලබාගනිමින් ඒ මුළු මුදලම පරිපාලන වියදමට යොදා ගත් බව කියා ඇත. මේ අතර ජේ.සී. රංගාගේ පුරවැසි පෙරමුණ 2016 වසරේදී රු.31,650/-ක් ද 2017 සහ 2018 වසර වන විට ද ඒ හා සමාන මුදලක් ශේෂය වශයෙන් පවත්වාගෙන තිබේ. මනෝ ගනේෂන්ගේ නායකත්වයෙන් යුතු ප්‍රජාතන්ත්‍රවාදී මහජන පෙරමුණ 2018 මාර්තු 31 දින දක්වා රු. 1,400,000/-ක මුදලක් ලබාගෙන ඇති බව වාර්තාවේ සඳහන් වේ.**

තොරතුරු දැනගැනීමේ පනතට අනුකූල වන අයුරින් ඉල්ලුම් කර, මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ඉහත ගිණුම් වාර්තාවන් පමණක් ලබාගැනීමට හැකි විය. එමෙන්ම කම්කරු ජාතික සංගමය මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි කර නොමැති හේතුවෙන් එහි ගිණුම් වාර්තාව ලබාගැනීමට නොහැකි විය. එහෙත් කම්කරු දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව **2016.04.01 සිට 2017.03.31** දක්වා වූ කාල වකවානුව සඳහා **රු. 34,524,328.41 ක** සාමාජික මුදලක් ලබාගෙන ඇති බව දැනගත හැකි විය.

මේ ආකාරයෙන් අහිංසක වතු කම්කරුවන්ගෙන් ලබාගන්නා සාමාජික දායක මුදලින් මේ දක්වා එම ජනතාවට සිදු වූ සෙත කුමක්ද? වරින් වර බලයට පත්වන ආණ්ඩුවලින් ලැබෙන ප්‍රතිපාදනවලින් යම්තරමින් හෝ සිදු කරන සංවර්ධන කටයුතු හැර වෘත්තීය සමිති



http://www.onlanka.net/

අරමුදල්වලින් ඔවුන්ට සැලසුණු සෙතක් නැත. ඒවායේ නායකයෝ තම පක්ෂ කටයුතුවලටත් තමන්ගේ පෞද්ගලික අවශ්‍යතාවයන් වෙනුවෙනුත් එම මුදල් අවභාවිත කරති. ඇතැම් නායකයන්ගේ උපන්දින සැමරුම් උත්සව ද දුප්පත් අහිංසක කම්කරුවන්ගේ මාසික දායක මුදලින් සිදුකරගන්නා අවාසනාවන්ත තත්ත්වයක් පවතී.

එමෙන්ම රජයේ මුදලින් කරන්නාවූ පොදු සංවර්ධන කටයුතුවල තමන්ගේ නම ප්‍රදර්ශනය කරමින් කටවුට් දැමීම කාලයෙන් කාලයට සිදුවන ක්‍රියාවකි. ඒ සඳහාද කම්කරුවන්ගේ අරමුදල් යොදගැනීම කවර සරදමක්ද?

**කේ. ප්‍රසන්නා**

*Thinakkural - 05th August 2019*






*dailynews.lk*

## වතු වෘත්තීය සමිතිවල සාමාජික මුදල් ගැන තොරතුරු දීම

# කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතික්ෂේප කරයි

වතුකරයේ කම්කරු ජනතාව සාමාජිකත්වය ලබා සිටින වතු වෘත්තීය සමිති හයක් (6) සම්බන්ධව, දෙමළ භාෂාවෙන් තොරතුරු ලබාදෙන ලෙස "මාට්ට්‍රම්" මාධ්‍ය සංවිධානය කම්කරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරන ලදි. එමගින් අදාළ වෘත්තීය සමිති පිළිබඳ පහත සඳහන් තොරතුරු විමසා තිබිණි.

- සාමාජික සංඛ්‍යාව පිළිබඳ විස්තර,
- එක් එක් කම්කරුවාගෙන් අයකරන්නාවූ සාමාජික දායක මුදල

- එක් එක් වෘත්තීය සමිති මාසිකව, වාර්ෂිකව ලබාගත් දායක මුදල
- වාර්ෂිකව වෘත්තීය සමිති වියදම් කළ මුදල
- වියදම් කළේ කවර අවශ්‍යතා වෙනුවෙන්ද?
- පසුගිය වසර තුනේ අයවැය ගිණුම් වාර්තා

අදාළ තොරතුරු දැනගැනීමේ ඉල්ලීම "මාට්ට්‍රම්" මාධ්‍ය සංවිධාන මගින් කම්කරු දෙපාර්තමේන්තුවේ මාධ්‍ය කටයුතු බලධාරියා වෙතට (අතින්) සෘජුවම භාරදෙන ලදි.

එහිදී අසන ලද ප්‍රශ්න අතරින් ප්‍රශ්න කීපයකට පමණක් (අපැහැදිලිව) පිළිතුරු ලබා දී ඇති අතර, කිසිදු හේතු දැක්වීමකින් තොරව තවත් ප්‍රශ්න කිහිපයකට පිළිතුරු ලබා දී නැත. එසේ වුව ද වෘත්තීය සමිතිවල වාර්ෂික ගිණුම් ප්‍රකාශන කම්කරු දෙපාර්තමේන්තුව ලබා නොදීමට හේතුව, **"වර්ෂ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 5:1) F වගන්තියේ ප්‍රකාරව තොරතුරු ලබාග ැනීමට නොහැකි බව ඔබතුමාට කාරුණිකව දන්වා සිටින්නෙමි."** යනුවෙන්, අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් සී.එන්. විතානාච්චි මහතාගේ අත්සනින් යුතු පිළිතුරේ සඳහන් කර ඒවා තිබුණි.

"මාට්ට්‍රම්" මාධ්‍ය සංවිධානය මගින් තම පළමු අභියාචනා ඉල්ලුම් ලිපිය 2018 ඔක්තෝබර් මස 12 හි දින භාර දෙන ලදි. එම ලිපියට පිළිතුරු එවීමට කම්කරු දෙපාර්තමේන්තුවට මාස දෙකක් ගතවිය. දෙමළ භාෂාවෙන් ඉල්ලුම් කළ හේතුව නිසා "මාට්ට්‍රම්" මාධ්‍ය සංවිධානයට දැඩි අපහසුතාවයකට මුහුණපාන්නට සිදු විය. දෙමළ භාෂාව නොදන්නා නිසා ඉල්ලුම් ලිපිය භාරගත් බවට රිසිට් පතක් ඒ මොහොතේ ලබා දීමට නොහැකි බව ඉහත තොරතුරු නිලධාරියා විසින් පවසන ලදී. නමුත් **2018 ඔක්තෝබර් මස 25** වන දින ඉල්ලීම් ලිපිය භාරගත් බවට රිසිට් ලිපියක් අපට ලැබුණි. **2018 දෙසැම්බර් මස 12** දින ලැබුණු පිළිතුරු ලිපියේ. "මාට්ට්‍රම්" මාධ්‍ය සංවිධානය ඉල්ලාසිටි ප්‍රශ්න **7න් 3කට** පමණක් පිළිතුරු ලබාදී තිබිණි.

අනෙකුත් ප්‍රශ්න 4කට තමන් සතුව තොරතුරු නොමැති බව සඳහන්කර තිබිණි. මාස දෙකක්ම පිළිතුරු ලැබීම ප්‍රමාද වීම හේතුවෙන්, අවස්ථා කීපයක් දුරකථනයෙන් සම්බන්ධ වීමට උත්සාහ කළ නමුත්, අවසානයේදී එතුමාගේ පිළිතුර වූයේ "මෙහි සේවයේ යෙදී සිටින කිසිදු නිලධාරියෙකු දෙමළ භාෂාව නොදන්නා නිසා ඔබගේ උක්ත ඉල්ලීම් ලිපිය සිංහලට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරගත යුතුව තිබෙනවා. මුළු දෙපාර්තමේන්තුවටම ඉන්නේ එකම එක භාෂා පරිවර්තකයෙකු පමණයි. ඔබගේ ලිපිය අපි දෙන්නේ ඔහුටයි." යනුවෙනි. ප්‍රමාද වීමට හේතුවද එයම බව ඔහු කීවේය.

කම්කරු දෙපාර්තමේන්තුව අපට ලබාදුන් පිළිතුර සම්බන්ධව තෘප්තියට පත් විය නොහැකි නිසා "මාට්ට්‍රම්" මාධ්‍ය සංවිධානය විසින් **2019.01.07** දින නැවත අභියාචනයක් යොමු කරන ලදි. එම අභියාචනා ලිපියටද පිළිතුරු සපයන්නට **මාසයකට** ආසන්න කාලයක් ගත විය.

මේ අතරතුර දී දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තන නිලධාරී මහතා "මාට්ට්‍රම්" සංවිධානය හා සම්බන්ධ වෙමින්, **"මෙහි මම විතරමයි පරිවර්තක වශයෙන් සේවය කරන්නේ. ඔබගේ ඉල්ලීම් ලිපිය ඉංග්‍රීසි භාෂාවෙන් එවා තිබුණා නම් වඩාත් පහසුවන්නට තිබුණා. මන්ද මාහට සිංහල භාෂාව ගැන ඒ තරම් දැනුමක් නැති නිසා."** යනුවෙන් පැවසුවේය

එමෙන්ම වෘත්තීය සමිතිවල නම් දෙමළ භාෂාවෙන් ලබාදී තිබෙන නිසා. සොයා ගැනීම අපහසු බව ද පවසන ලදි. ඒ අයුරින් අපගේ පළමු ඉල්ලීම් ලිපියටත්, දෙවන අභියාචනා ලිපියටත් ලැබුණු ප්‍රතිචාරවල එතරම් වෙනසක් නොවූ බව තේරුම්ගත හැකි විය.

ඒ අනුව වෘත්තීය සමිතිවල සාමාජික විස්තර, එක් එක් සාමාජිකයෙකුගෙන් අයකරන්නාවූ මාසික දායක මුදල, එක් වසරකදී ලබාගත් මුළු අරමුදල ආදී තොරතුරු හා විස්තර "මාට්ට්‍රම්" මාධ්‍ය සංවිධානයට ලබාගැනීමට හැකි විය.

එම නාම ලේකනයේ විස්තර

- C.W.C ලංකා කම්කරු කොංග්‍රසය
- L.J.F.W.V ලංකා ජාතික වතු කම්කරු සංගමය
- N.U.W ජාතික කම්කරු සංගමය
- U.P.F කඳුරට ජනතා පෙරමුණ
- J.P.T.U.C ඒකාබද්ධ කම්කරු සංවිධානය
- S.R.F.U ශ්‍රී ලංකා

වෘත්තීය සමිති තොරතුරු සමඟ අපට එවා තිබූ ලිපිලේඛන අනුව සාමාජිකයින්ගේ විස්තර ඉල්ලා සිටියෙමු. 2017 වර්ෂයට අදාළ වන වාර්තා අනුව දෙපාර්තමේන්තුව "මාට්ට්‍රම්" සංවිධානයට තොරතුරු ලබාදී ඇත. ඒ අනුව ලංකා කම්කරු කොංග්‍රසයට **සාමාජිකයින් ලක්ෂ 4ක්** සිටින බවත් ලංකා ජාතික වතු කම්කරු සංගමයට **සාමාජිකයින් 150,000ක්** සිටින බවත්, කම්කරු ජාතික සංගමය **සාමාජිකයින් 21,280ක්** සිටින බවත් ප්‍රකාශ විය. ඒ අනුව වෘත්තීය සමිති තුනේම සාමාජික සංඛ්‍යාව **ලක්ෂ 5 1/2** ඉක්මවයි. එනමුත් මේ වනවිට වතුකරයේ සේවයේ නිරත කම්කරුවන් සංඛ්‍යාව **150,000ක්** පමණ බව කියයි. අවසන් සංඛ්‍යා ලේඛන නොතකා, පෙර පැවැති සංඛ්‍යා ලේඛන නැවත නැවත වෘත්තීය සමිතීන් විසින් කම්කරු දෙපාර්තමේන්තුවට යවන බවත් කම්කරු කාර්යාල ද එම ව්‍යාකූල ලේඛන නඩත්තු කරන බවත් දැනගත හැකි විය.

ජාතික කම්කරු සංගමය එක් කම්කරුවකුගෙන් මාසිකව **රු. 25/-ක** පමණ මුදලක් සාමාජික ගාස්තුව වශයෙන් ලබන බව කම්කරු කාර්යාලය දැනුම් දුන් නමුත් මූලික වැටුප රු.700/-ක් පමණ වන විට සාමාජික මුදල වශයෙන් මාසිකව **රු. 150/-ක්** අයකර ඇති බව "මාට්ට්‍රම්" විසින් තහවුරු කරන ලදි.

**"සමිති මොන පාටද අපි නොදනිමු" යන සීර්ෂය යටතේ "මාට්ට්‍රම්" සහරාවේ පළ වූ** ලිපියේ "අපට ප්‍රශ්නයක් ඇති වූ විටක ඒ ගැන කථා කර විසඳුමක් ලබා ගැනීම සඳහා මාසිකව **රු. 150/-ක්** සාමාජික මුදල් ගෙවනවා. නමුත් මේ වන තෙක් අපට කිසිදු සෙතක් නොවීය." "අපි ලබාදෙන සාමාජික මුදලින් මොවුන් සුඛෝපබෙභෝගී ලෙස ජීවත්වෙනවා" යනුවෙන් කම්කරුවන් සඳහන් කර තිබුණි. අප ලද තොරතුරු අනුව **2016.04.01-2017.03.31** කාලයේදී ලංකා කම්කරු කොංග්‍රසය **රු.77,751,933/-** ක් වැනි මහ පරිමාණ

මුදලක් කම්කරුවන්ගෙන් ලබාගෙන තිබේ. ලංකා ජාතික වතු කම්කරු සංගමය **රු. 22,437,558.53ක** මුදලක් කම්කරුවන්ගෙන් ලබාගෙන තිබේ.

උක්ත වතු කම්කරු සමිති කම්කරුවන්ගෙන් ලබාගන්නා සාමාජික මුදල්වලින් කරන වියහියදම් මොනවාදැයි කම්කරු දෙපාර්තමේන්තුවෙන් මුල් ඉල්ලුම් ලිපියෙන් ඇසූ විට කිසිදු පිළිතුරක් ලබා නොදීම හේතුවෙන්, ඊළඟ අභියාචනා ඉල්ලුම් ලිපියෙන් ගිණුම් වාර්තාව ලබාදෙන ලෙස ඉල්ලීම් කරන ලදි. එම ඉල්ලුමට පිළිතුරු ලබාදීමට නොහැකි බව කියමින් ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදි.

මීට විරුද්ධ තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව වෙතට පැමිණිලි කරන්නට අදහස් කර ඇත.

**සෙල්වරාජා රාජසේකර්**

උපුටා ගැනීම : මාට්ට්‍රම් වෙබ් අඩවියෙනි



# තොරතුරු දැනගැනීමේ කොමිසම විසින් ලබාදුන් වැදගත් තීන්දු කීපයක්

## <u>*බෂීර් සේගු දාවුද් එ. ජනාධිපති ලේකම් කාර්යාලය*</u>

RTIC Appeal/22/2017 (2017.10.16 දින පැවැත්වූ කොමිෂන් සභා රැස්වීමේ කොටසක් වශයෙන් අභියාචනය අසන ලදී.)

**සභාපති** : මහින්ද ගම්මන්පිල මහතා
**කොමිෂන් සභා සාමාජිකයෝ** : ජ්‍යෝෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ-ජයවර්ධන
ජ්‍යෝෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා
ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් පියතිස්ස රණසිංහ මහතා ද මෙම අවස්ථාවට සහභාගි විය.

**අභියාචක** : බෂීර් සේගු දාවුද් මයා
**නොතීසි නිකුත් කිරීම** : ජනාධිපතිතුමාගේ ලේකම්වරයා (නම් කළ නිලධාරී)
**පෙනී සිටීම/නියෝජනය** : බෂීර් සේගු දාවුද් මයා
ලක්ෂ්මී ජයවික්‍රම මිය, අතිරේක ලේකම්, (නීති) ජනාධිපති ලේකම් කාර්යාලය

| | |
|---|---|
| **තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කළ දිනය** | 2017.02.08 |
| **තොරතුරු නිලධරයා ප්‍රතිචාර දැක්වූ දිනය** | 2017.03.02 සහ 2017.03.20 |
| **නම් කළ නිලධාරී වෙත පළමු අභියාචනය ඉදිරිපත් කළ දිනය** | 2017.03.27 |
| **නම් කළ නිලධාරී ප්‍රතිචාර දැක්වූ දිනය** | 2017.04.25 |
| **කොමිෂන් සභාව වෙත අභියාචනය කළ දිනය** | 2017.05.08 |

### පසුබිම් කරුණු කෙටියෙන්

මෙම සිද්ධියේදී, 2000 වසරේ හෙලිකොප්ටර් කඩා වැටීමකින් මිය ගිය ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නිර්මාතෘ සහ හිටපු නායක එම්.එච්.එම්. අෂ්රොෆ් මහතාගේ මරණයට අදාළ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවක් සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලීමක් ගොනු කර තිබිණි. ජනාධිපතිනී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග (එවකට ජනපතිනිය) විසින් අෂ්රොෆ්ගේ මරණය ආශ්‍රිත කරුණු පරීක්ෂා කර බැලීම පිණිස කොමිෂන් සභාවක් ස්ථාපිත කර තිබිණි.

අභියාචක (එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ) 2001 ජනවාරි මාසයේදී, එබඳු කොමිෂන් සභාවක් එකී අනතුර පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා අවශ්‍ය බවට ඉල්ලා සිටිමින් පාර්ලිමේන්තුවේ කතාවක් පවත්වා තිබේ. අෂ්රොෆ් මහතාගේ මරණය පිළිබඳ සත්‍යය සොයාගැනීම සඳහා රාජ්‍ය බුද්ධි අංශ යොදවන ලෙස ද ඔහු එහිදී ඉල්ලීමක් කළේය. හිටපු ජනපතිනිය විසින් කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීමෙන් අනතුරුව අෂ්රොෆ්ගේ මරණය පිළිබඳ විමර්ශනය සම්බන්ධයෙන් එම කොමිෂන් සභාවේ වාර්තාව ප්‍රසිද්ධ

කරන ලෙස ඉල්ලා සිටිමින් අභියාචක පාර්ලිමේන්තුවේදී ඉල්ලා සිටියේය. කෙසේ නමුත් මෙකී ඉල්ලීම්වලට ප්‍රතිචාරයක් ලැබුණේ නැත.
අභියාචක සඳහන් කළේ ඒ කාලයේ ශ්‍රී ලංකා පුරවැසියන් හට තොරතුරු දැනගැනීමේ අයිතියක් නොතිබුණු බව සහ ඒ අනුව අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කළ සිය ඉල්ලීම ඔස්සේ දිගින් දිගටම කටයුතු කිරීම නිෂ්ඵල වූ බවයි. 2016 අංක 12 දරණ පනත සම්මත වීමෙන් පසු අභියාචක විසින් 2017.02.09 දිනැති තොරතුරු ඉල්ලීමක් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යවමින් අෂ්රොෆ් මහතාගේ මරණය පිළිබඳ පරීක්ෂණ වාර්තාව මුදාහරින ලෙස ඉල්ලා සිටියේය. 2017.03.02 දිනැති ලිපිය මගින් ජනාධිපති ලේකම් කාර්යාලයේ තොරතුරු නිලධරයා සඳහන් කළේ එම වාර්තාවට අදාළ ලිපිගොනුව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව ය.

ඉන් අනතුරුව අභියාචක වෙත පොදු අධිකාරිය විසින් 2017.03.02 දිනැති තවත් ලිපියක් යවමින් සඳහන් කළේ තොරතුර සොයාගත නොහැකි බැවින් ඔහුගේ තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කෙරුණු බවයි. ඉන්පසු අභියාචක, එම පොදු අධිකාරියේ නම් කළ නිලධරයා වූ අතිගරු ජනාධිපතිවරයා වෙත 2017.03.27 දින අභියාචනය කළේය. නම් කළ නිලධාරයා, 2017.04.25 දිනැති ලිපිය මගින්, ඔහු ඉල්ලා සිටින තොරතුර සොයාගත නොහැකි හෙයින් සහ, ඔහුගේ තොරතුරු ඉල්ලීමේ අන්තර්ගතය වසර 12කට වඩා පැරණි හෙයින් ඒ අනුව ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බව නම් කළ නිලධාරියා අභියාචක වෙත දැනුම් දී තිබිණි. ඉන්පසු අභියාචක, 2017.05.08 දින තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය කළේය.

## විභාගය අවස්ථාවේදී උද්ගත වූ කරුණු

පොදු අධිකාරියේ අතිරේක ලේකම් (නීති) ජයවික්‍රම මිය, අතිගරු ජනාධිපතිවරයා වෙනත් කටයුත්තක නිරතව සිටින හෙයින් ඔහු ව නියෝජනය කිරීම සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙන් අවසර ඉල්ලා සිටියාය. එම අවසරය ලබා දෙන ලදී.

අභියාචක සඳහන් කළේ ආණ්ඩුව විසින් එකී වාර්තාව මුදා හරිනු ඇතැයි තමන් බලාපොරොත්තු වන බවයි. තවදුරටත් ඔහු සඳහන් කළේ 2001 ජනවාරි 1 වැනිදා රජයේ ගැසට් නිවේදනය මගින් (හිටපු) විනිසුරු එල්.කේ.ජී. වීරසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් පරීක්ෂණ කොමිෂන් සභාව පත් කළ බව කීවද, සියලු ගැසට් නිවේදන පරීක්ෂා කර බැලූ නමුත් තමන් ට එබඳු පත්කිරීමක් පිළිබඳ කිසිදු සඳහනක් සොයාගත නොහැකි වූ බවයි. තවද එබඳු කොමිෂන් සභාවක් පත්කළ බවට කිසිවක් ඔහුට ජාතික පුස්තකාලයෙන් හෝ ජාතික ලේඛනාරක්ෂණාගාරයෙන් ද සොයාගත නොහැකි වූ බවයි. අභියාචක සඳහන් කළේ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ කටයුතු අවසන් කළ සමයේ එය ජනාධිපතිවරිය වෙත භාරදුන් බවට ප්‍රවෘත්ති වාර්තා බොහෝ තිබූ අතර, තමන් වෙත පොදු අධිකාරිය විසින් ලබාදුන් ප්‍රතිචාරයට අනුව එකී පොදු අධිකාරියේ බුක්තියේ 2007 වසර දක්වා සත්‍ය වශයෙන්ම එම වාර්තාව තිබූ බව පෙනෙන්නට ඇති බවයි.

මේ සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා කැඳවනු ලදුව, ජයවික්‍රම මිය පැහැදිලි කර දුන්නේ එකී පරීක්ෂණ වාර්තාව සොයාගැනීම සඳහා තොරතුරු නිලධාරියා විසින් උත්සාහ දැරූ බවයි. එකී සිද්ධියට අදාළ ලිපිගොනුව තොරතුරු නිලධාරියා විසින් ලේඛනාගාරයෙන් ලබාගෙන පරීක්ෂා කළ නමුත් එම





ලිපිගොනුවේ එම වාර්තාව සොයාගැනීමට නොහැකි විය. අදාළ ලිපිගොනුව 2007.01.12 දින රාජ්‍ය ලේඛනාගාරය වෙත යවනු ලැබූ බවට 'සටහනක්' ('minute') පමණක් එහි විය. වාර්තාව ජනාධිපති ලේකම් කාර්යාලයේ ද නොවීය. මේ අනුව, පොදු අධිකාරිය අභියාචකගේ ඉල්ලීමට අනුකූලව කටයුතු කිරීමට අසමත් වී තිබේ.

එසේම, 2017.08.18 දින පොදු අධිකාරිය විසින් සිදුකළ සහ තොරතුරු කොමිෂන් සභාව ආමන්ත්‍රණය කරමින් සිදුකළ ලිඛිත කරුණු කියාපෑම්වල සඳහන් වූයේ 2016 අංක 12 දරණ තොරතුරු දැනැගනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 7(3) වගන්තියට අනුව වාර්තා ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන්, එම වාර්තා පනත ක්‍රියාත්මක භාවයට පැමිණෙන විට පැවතියේද, ඒවා වසර 10කට නොඅඩු කාලසීමාවක් සඳහා ආරක්ෂා කර ගත යුතු බවයි. මේ අවස්ථාවේදී ඉල්ලා සිටින තොරතුර වසර 16 ක් පැරණි එකකි. ඒ අනුව පොදු අධිකාරිය එය ලබාදීමට අසමත් වී තිබේ.

ජයවික්‍රම මහත්මිය කියා සිටියේ 2001 ජනවාරි 1 වැනිදා ගැසට් පත්‍රය සොයාගත නොහැකි බව අභියාචක සඳහන් කළ ද ඔහු සිය තොරතුරු ඉල්ලීම මගින් එය ඉල්ලා නොමැති බවයි. එම ගැසට් පත්‍රය, මේ වන විට ජාතික ලේඛනාගාරයේ තිබෙන එකී ලිපිගොනුවේ තිබිය යුතු බව ද ඇය සඳහන් කළාය.

## නියෝගය

අප ඉදිරියට පැමිණි කරුණු අනුව, දැන් ජාතික ලේඛනාගාරය භාරයේ තිබෙන අදාළ ලිපිගොනුව අත්‍යාවශ්‍යක බව පෙනී යයි. තවද උද්දේශිත වශයෙන්, දැනට නැති වී තිබෙන එම වාර්තාව තිබෙනු ඇත්තේ එම ලිපිගොනුවේ ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජාතික ලේඛනාගාරය මෙම ගැටළුවේ පාර්ශවයක් බවට පත් කිරීම අත්‍යාවශ්‍ය බවට පත් වී ඇත.
1979 අංක 48 දරණ ජාතික ලේඛනාරක්ෂක (සංශෝධිත) නීතියේ 11 වන වගන්තියේ සඳහන් කරනුයේ,

> *'පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ අමාත්‍යවරයෙකු විසින් පත්කරන ලද වෙනත් ඕනෑම පරීක්ෂණ කොමිෂන් සභාවක හෝ කමිටුවකට අදාළ සියලු වාර්තා, එබඳු කොමිෂන් සභාව හෝ කමිටුව විසින් සිය අවසන් වාර්තාව සකස් කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත ජාතික ලේඛනාරක්ෂණාගායේ තැන්පත් කිරීම එහි ලේකම්වරයාගේ රාජකාරිය විය යුත්තේය'.*

ජාතික ලේඛනාරක්ෂණ නීතියේ 16(ඈ) යටතේ සාදනු ලැබූ රෙගුලාසිවල 2 වන ඡේදයට අනුව මහජන ලේඛනාරක්ෂණාගාරය වෙත මහජනයාගේ ප්‍රවේශයට අදාළ ව 1978 දෙසැම්බර් 5 වැනිදා සිදුකළ ගැසට් නිවේදනයට අනුව,

> *'මෙම නීතියේ 10, 11 හෝ 18 වගන්ති ප්‍රකාරව දෙවන උපලේඛනයෙන් නම් කර තිබෙන ජාතික ලේඛනාගාරයේ ඕනෑම පොදු කාර්යාලයකින් උපචය වන මහජන ලේඛනාගාරය, ඒවා නිර්මිත වී වසර 30 ක කාලයක් ඉක්ම යන තෙක් සඳහා මහජනයාගේ අධීක්ෂණයට සංවෘත විය යුතුය.'*

මෙහි ප්‍රතිඵලයක් ලෙසට ජාතික ලේඛනාරකෂණාගාරය වෙත මීළඟ කොමිෂන් සභා දිනයේදී කොමිසම ඉදිරියේ පෙනී සිටින ලෙසට නොතීසි නිකුත් කරන ලදී. ප්‍රශ්නගත එකී ලිපිගොනුව, මීළඟ කොමිෂන් සභා

දිනයේදී කොමිසම ඉදිරියේ පරීක්ෂා කිරීම පිණිස ගෙන එන ලෙස ද ජාතික ලේඛනාරක්ෂණාගාරය වෙත මාර්ගෝපදේශන ලබාදීම සිදුවිය.

අභියාචනය කල් තබන ලදී.

මීළඟ අභියාචන දිනය, 2017 නොවැම්බර් 20.

…………………………………………………………………………………………………..

**RTIC Appeal//(පුද්ගලික විභාග කිරීම්) 22/2017** (2017.11.20 **දින පැවැත්වූ කොමිෂන් සභා රැස්වීමේ කොටසක් වශයෙන් අභියාචනය අසන ලදී.)**

| | | |
|---|---|---|
| **සභාපති** | : | මහින්ද ගම්මන්පිල මහතා |
| **කොමිෂන් සභා සාමාජිකයෝ** | : | ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ-ජයවර්ධන<br>ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා<br>ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් |
| **අභියාචක** | : | බෂීර් සේගු දාවුද් මයා |
| **නොතීසි නිකුත් කිරීම** | : | ජනාධිපතිතුමාගේ ලේකම්වරයා (නම් කළ නිලධාරී) |
| **පෙනී සිටීම/නියෝජනය** | : | බෂීර් සේගු දාවුද් මයා<br>ලක්ෂ්මී ජයවික්‍රම මිය, අතිරේක ලේකම්, (නීති) ජනාධිපති ලේකම් කාර්යාලය<br>ආචාර්ය එන්.ටී. රූපසිංහ, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව<br>දිලිනි ලියනගේ මිය, සහකාර අධ්‍යක්ෂ, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව |

කොමිෂන් සභාව විසින් නොතීසි නිකුත් කිරීමෙන් අනතුරුව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මෙම විභාගය සඳහා පැමිණ සිටියේය. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය නදීරා රූපසිංහ තොරතුරු කොමිෂන් සභාව වෙත දැනුම් දී සිටියේ කොමිෂන් සභාවේ කියවීම සඳහා තමන් විසින් එම්.එම්.එම්. අෂ්රොෆ් මහතාගේ මරණය පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවට අදාළ ලිපිගොනුව සම්පාදනය කර ඇති බවයි. කොමිෂන් සභා පරීක්ෂණයට අදාළ ලේඛනවලින් සමන්විත ලිපිගොනුව, 1979 ජාතික ලේඛනාරක්ෂක (සංශෝධිත) නීතියේ 11 වන වගන්තිය ප්‍රකාරව, 2002.01.24 දින කොමිෂන් සභාවේ ලේකම් ජී.කේ.ජී. පෙරේරා මහතා විසින් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යවා තිබිණි.

එම පනතේ 11 වැනි වගන්තිය මෙසේ සඳහන් කරයි.





*'පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ අමාත්‍යවරයෙකු විසින් පත්කරන ලද වෙනත් ඕනෑම පරීක්ෂණ කොමිෂන් සභාවක හෝ කමිටුවකට අදාළ සියලු වාර්තා, එබඳු කොමිෂන් සභාව හෝ කමිටුව විසින් සිය අවසන් වාර්තාව සකස් කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත ජාතික ලේඛනාරක්ෂණාගායේ තැන්පත් කිරීම එහි ලේකම්වරයාගේ රාජකාරිය විය යුත්තේය.'*

කෙසේ නමුත් ඉහත කී ලිපි ගොනුවේ අදාළ කොමිෂන් සභා වාර්තාවේ පිටපතක් අන්තර්ගත නොවීය.

මේ හැරුණු විට, හිටපු ජනපතිනී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගගේ සියලු නිල ලේඛන අන්තර්ගත ලිපිගොනුවක් ද (මෙයින් පසු එය 2007 ලිපිගොනුව වශයෙන් හැඳින්වේ) 2007.05.18 දින ජනාධිපති ලේකම් කාර්යාලය වෙතින් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබිණි. වාර්තාවට අදාළ ලේඛන එම ගොනුවට ඇතුළත් වූ නමුත් සත්‍ය වාර්තාව එහි නොවීය. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබුණු ලේඛනවල ලැයිස්තුවක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් අනුබැඳුම් ගොනුවක පවත්වාගෙන ගොස් තිබිණි.

පොදු අධිකාරිය නියෝජනය කරමින් අභියාචනයේදී ලක්ෂ්මී ජයවික්‍රම මිය සඳහන් කළේ කොමිෂන් සභා පරීක්ෂණ වාර්තාවට අදාළ නිශ්චිත ලිපි ගොනුව පොදු අධිකාරිය විසින් 2007.01.02 දින ජාතික ලේඛනාරක්ෂණාගාරය වෙත යැවූ බව වාර්තාවල සටහන් වී තිබෙන බවයි. පොදු අධිකාරිය විසින් එකී ගොනුවේ පිටපත් නොව ගොනු අංකය පමණක් සටහන් කර තබාගෙන තිබිණි.

තොරතුරු දැනගැනීමේ කොමිසම ඉදිරියේ මෙම අභියාචනය විභාගය සඳහා ගොනු කිරීමෙන් අනතුරුව 2007 ගොනුව පරීක්ෂා කිරීමේදී එම ගොනුවේ අන්තර්ගත වන්නේ වාර්තාවේ පිටු 3 ක් (පිටු අංක 69, 70 සහ 71) පමණක් බව ජාතික ලේඛනාරක්ෂනාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පෙන්වා දුන්නේය. එම පිටු, යම් නිශ්චිත පුද්ගලයන් වෙත ගෙවිය යුතු වන්දි සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ අවසානාත්මක නිර්දේශවලට අදාළ ඒවා බව ද ඔහු පෙන්වා දුන්නේය.

හිටපු ජනපතිනියගේ ලේඛනවල කොටසක් වශයෙන් පැවති 2007 ගොනුවේ පහත දැක්වෙන ලේඛන ද අන්තර්ගත විය.

1. පහත වාර්තා දෙක අමුණා ඇති බව පෙන්වා දෙමින් එවකට ගුවන් හමුදාවේ අණ දෙන නිලධාරී වෙත 2002.08.13 දින යවන ලද, එවකට ජනපතිනියගේ අත්සනින් යුත් ලිපියක්:

    (අ) එම්.එච්.එම්. අෂ්රොෆ් මහතාගේ මරණය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව.
    (ආ) නාවික හමුදා කඳවුරට සහ බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළට එල්ල වූ ප්‍රහාරය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව.

2. එවකට ආරක්ෂක ඇමති තිලක් මාරපන මහතා වෙත පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව අමුණමින් සහ එහි සොයාගැනීම්වලට අනුව වැඩිදුර කටයුතු කරන ලෙසට ඔහුගෙන් ඉල්ලා සිටිමින් එවකට ජනපතිනිය විසින් අත්සන් කරනු ලැබූ 2002.08.13 දාතමින් යුත් තවත් ලිපියක්.

ආරක්ෂක අමාත්‍යවරයා වෙත යවනු ලැබූ ලිපියේ එවකට ජනපතිනිය විසින් පෙන්වා දී තිබුණේ වාර පත්‍රිකාවක් වශයෙන් මෙම පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව ප්‍රකාශනය කිරීමට තමන් පියවර ගන්නා බවයි.

මෙම විභාගයේදී, එකී වාර්තාව සම්බන්ධයෙන් 2007 ගොනුව තුළ වූ සැලකිය යුතු සටහනක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ අවධානයට යොමු කරන ලදී. (ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන ගිය) එකී ගොනුවේ 2002.08.12 දින ජනාධිපති ලේකම් කාර්යාලයේ අතිරේක ලේකම්වරයා විසින් යොදනු ලැබූ සටහනක් පහත පරිදි නිරීක්ෂණය විය:

1. ඉහත වාර්තාව 2002.08.01 දින අතිගරු ජනාධිපතිනිය වෙත භාරදෙන ලදී. වාර්තාවේ සොයාගැනීම්වලින් පෙනී යන්නේ යානය කඩාවැටීම කිසිදු චේතනාන්විත ක්‍රියාවක ප්‍රතිඵලයක් නොවන බවයි. තවද එය කිසිදු පිපිරීමක් හෝ කිසිදු පිපිරුම් ආදායකයක් හේතුවෙන් සිදුවූවක් නොවන බවයි. තවද යානා කාර්ය මණ්ඩලයේ සේවා නොසැකිල්ල ගණයෙහිලා ගිණිය හැකි නිසි උද්‍යෝගයේ ඌනතාවය, නොකර හැරීමක් හෝ නොකර හැරීම්වල ප්‍රතිඵලයක් වශයෙන් එම කඩාවැටීම සිදුවූ බවයි. කාර්ය මණ්ඩලය වනුයේ (නම්)..

2. HP වෙත (අපැහැදිලි) අතෙන් භාරදීම පිණිස ලබාදුන් වාර්තාවේ පිටපත මානෙල් අබේරත්න මිය වෙත යවා ඇත. (2002 සැප්තැම්බරයේ යොදන ලද සටහනක්)

3. 69, 70 සහ 71 පිටුවල උධෘතයන් සහ නිශ්චිත පාර්ශවයන් වෙත හානි පූරණය සඳහා රුපියල් මිලියන 8 ක මුදලක් වන්දි වශයෙන් ගෙවිය යුතු බවට වන නිර්දේශය

අධ්‍යක්ෂ ජනරාල්වරයා කියා සිටියේ ප්‍රශ්නගත ලේඛනවල පිටපත් ලබාදීමට ජාතික ලේඛනාරක්ෂක නීතිය යටතේ ජාතික ලේඛනාරක්ෂණාගාරයට බලය නොමැති බවයි.

ජාතික ලේඛනාරක්ෂණාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාව වෙත තවදුරටත් දැනුම් දී සිටියේ 2002.01.24 දින ලේකම්වරයා විසින් දෙපාර්තමේන්තුව වෙත ලේකම්වරයා විසින් භාරදුන් ගොනුවේ ලැයිස්තුගත කර තිබෙන ලේඛන ජාතික ලේඛනාරක්ෂණාගාරයේ පෙට්ටි තුළ තැන්පත් කර තිබෙන බවයි. පිටු 300කට අධික ප්‍රමාණයක් පුරා දිවෙන ලියකියවිලි 64 ක් (විස්තර නොකළ) එකී පෙට්ටිවල තැන්පත් කරනු ලැබ ඇති බවයි.





## නියෝගය

නීතියට අනුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හට පරීක්ෂා කිරීමට බලයක් නැති මෙකී ලේඛන රහසිගත/විශ්වාසනීය ලේඛන බවත් ඒවා පරීක්ෂා කිරීම හෝ ඒවා මහජනයා අතරින් අයෙකුට ලබාදීම සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තුව ජනාධිපති ලේකම් කාර්යාලය සහ පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම්වරයාගෙන් විමසා විධිමත් අවසරය ලබාගත යුතු බවට ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් සිදුකළ කරුණු කියාපෑම වෙතට මෙම කොමිෂන් සභාවේ අවධානය යොමු වෙයි.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 4 වැනි වගන්තිය සඳහන් කරනුයේ,

> *'වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර අනනුකූලතාවයක් හෝ ගැටීමක් ඇති අවස්ථාවක, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය.'*

යනුවෙනි.

මෙහිදී, ජාතික ලේඛනාරක්ෂණ නීතිය සහ එයට අදාළ රහසිගතභාවය ට සම්බන්ධ රෙගුලාසි අභිබවා සහ ඒවාට ඉහළින්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රමුඛ බව පැහැදිලි ය.

මේ ගැටළුව සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව නොමැති වීම, සැලකිය යුතු මහජන සුබසිද්ධියට අදාළ කාරණයක් වීම ද මෙහිදී සලකා බැලීමට උචිත කාරණයකි. තවද, තොරතුරු පනතේ 5 වැනි වගන්තියට අනුව මේ ගැටළුව සම්බන්ධයෙන් අදාළ පොදු අධිකාරිය විසින් තොරතුරු මුදාහැරීම පිළිබඳ තොරතුරු පනතේ 5 වැනි වගන්තිය අනුව නගනු ලැබූ ව්‍යාතිරේඛයක් ද මෙම තොරතුරු කොමිෂන් සභාව වෙත දැනුම් දී නැත. 2017.03.20 දිනැති ලිපිය මගින් මෙන්ම 2017.08.18 දින මෙම කොමිසම වෙත ඉදිරිපත් කළ ලිඛිත කරුණු කියාපෑම් මගින් ද දැක්වෙන පරිදි, ඉල්ලා සිටි තොරතුරු අභියාචක වෙත ලබාදීමට අසමත් වීම සම්බන්ධයෙන් පොදු අධිකාරිය විසින් දක්වන හේතුව, තොරතුර සොයාගත නොහැකි බැවින් එය ලබාදිය නොහැකි බව දැක්වීමට පමණක් සීමා වේ.

මහජන සුබසිද්ධිය ප්‍රමුඛතර වීම සහ මහජන සුබසිද්ධිය තුළ මෙම ගැටළුව අදාළ වන්නේ 1948 අංක 17 දරණ පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධිත) පනත යටතේ පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත පරීක්ෂණ ව්‍යූහයක වාර්තාවකට අදාළ තොරතුරක් සම්බන්ධයෙන් වන අතර, මේ කොමිෂන් සභාව විසින් මෙයින් පසු විස්තර විභාග වශයෙන් දක්වන ලේඛන මුදාහරින ලෙස නියෝග කරනු ලබයි.

අ) ජනාධිපති ලේකම් කාර්යාලයේ අතිරේක ලේකම්වරයා විසින්, මේ සිද්ධියට අදාළ පරීක්ෂණ කොමිෂන් සභාවේ සොයාගැනීම් සාරාංශගත කරමින් 2002.08.12 දින යොදනු ලැබූ, 2007.05.18 දින ජනාධිපති ලේකම් විසින් දෙපාර්තමේන්තුව වෙත යවනු ලැබූ ගොනුව, ලකුණු කර ඇති පරිදි

ආ) ඉහත කී ගොනුවේ අන්තර්ගත, නිශ්චිත තැනැත්තන් වෙත වන්දි වශයෙන් සිදුකළ ගෙවීම්වලට අදාළ නිර්දේශයන් හා සබැඳිව මෙම තොරතුරු ඉල්ලීමට විෂය වන කොමිෂන් සභා වාර්තාවේ පිටු 3 හි පිටපතක්

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, 1948 පනත (සංශෝධිත) යටතේ පිහිටුවනු ලබන කොමිෂන් සභාවන් හි *'සියලු වාර්තා'* වල භාරකරු වේ. එබඳු කොමිෂන් සභාවක වාර්තාවක් එකී නීතිය තුළ හා නීතිය යටතේ මූලික 'වාර්තාව'කින් සමන්විත විය යුතුය. මේ අනුව, කොමිෂන් සභාවක හෝ කමිටුවක වාර්තාව නීතියට අනුව දෙපාර්තමේන්තුව වෙත එවා තිබේද යන්න සාක්ෂාත් කර ගැනීම සඳහා වාර්තා තැන්පත් කිරීමේ ව්‍යුහය හෝ තැනැත්තන් (අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන යටතේ එබඳු කොමිෂන් සභාවක හෝ කමිටුවක ලේකම්වරයා) විධිමත් අයුරින් කැඳවීමට දෙපාර්තමේන්තුවට හැකියාව තිබේ. එබඳු ඉල්ලීමක් සමග අනුගත නොවන්නේ නම් දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳ නිල වශයෙන් සටහන් තැබීම, යම් නිශ්චිත වාර්තාවක් කොතැනක තිබෙන්නේදැයි සවිස්තරාත්මකව පැහැදිලි කර ගැනීමේදී ප්‍රයෝජනවත් වනු ඇත.

හිටපු ජනපතිනිය චන්ද්‍රිකා කුමාරතුංග ගේ අදාළ ලිපිගොනු පොදු අධිකාරිය වූ ජනාධිපති ලේකම් කාර්යාලය විසින් 2007 වසරේදී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යවනු ලැබීම මගින් පොදු අධිකාරිය විසින් සමාන නිසි උද්‍යෝගයක් පෙන්වා තිබීම මෙයට උපකාර වනු ඇත. මෙම කොමිෂන් සභාව ඉදිරියේ සිදුකළ විභාග කටයුතුවලදී පෙනී ගිය අන්දමට නිසැක වශයෙන්ම, රාජ්‍ය ආයතන ද්විත්වය විසින් මෙම ලිපිගොනු යැවූ සහ ඒවා ප්‍රතිග්‍රහණය කළ දිනයන් එකිනෙකට වෙනස් ය. 2007.01.12 දින ගොනුව භාරදුන් බව අප ඉදිරියේ ඇති වාර්තාවල පොදු අධිකාරිය සඳහන් කර තිබෙන විට එකී දෙපාර්තමේන්තුව විසින් එම ගොනුව භාරගෙන තිබෙන්නේ 2007.05.18 දින ය. මේ අනුව මෙම ගැටළුව සම්බන්ධයෙන් පැහැදිලිව තේරුම්ගත හැකි පැහැදිලිභාවයේ ඌනතාවක් තිබේ.

මේ තත්වය අනුව, තමන් විසින් ගොනුවේ සෙසු ලේඛන ද සමග 2002.01.24 දින එකී කොමිසමේ වාර්තාව දෙපාර්තමේන්තුවට භාර දුන්නේදැයි පරීක්ෂණ කොමිෂන් සභා ලේකම්වරයාගෙන් නිශ්චිතව තහවුරු කර ගන්නා ලෙසට දෙපාර්තමේන්තුව වෙත මාර්ගෝපදේශන ලබා දෙයි. තවද අදාළ පෙට්ටිවල මුල්/සත්‍ය ලේඛන අන්තර්ගත ද යන්න සහ, මෙකී ලේඛනවල පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව අන්තර්ගත වේදැයි පරීක්ෂා කරන ලෙසට ද දෙපාර්තමේන්තුව වෙත මාර්ගෝපදේශ ලබා දෙයි.

එකී පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් 2002.01.24 දින ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යවන ලද ගොනුවේ අන්තර්ගත ලේඛනවල ලැයිස්තුවක් මුදා හරින ලෙසට ද වැඩිදුර නියෝගයක් නිකුත් කරන ලදී.

වැඩිදුර විභාගයඃ 2018.01.16

මේ අනුව අභියාචනය කල් තබන ලදී.

..........................................................................................................................................





**RTIC Appeal/(පුද්ගලික විභාග කිරීම්) 22/2017 (2018.01.16 දින පැවැත්වූ කොමිෂන් සභා රැස්වීමේ කොටසක් වශයෙන් අභියාචනය අසන ලදී.)**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය යටතේ කරනු ලබන නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීතීන්හි 28 වන රීතිය යටතේ පවත්වාගෙන යනු ලබන කාර්ය පටිපාටිය (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය) ප්‍රකාරව ය.

| | | |
|---|---|---|
| **සභාපති** | : | මහින්ද ගම්මන්පිල මහතා |
| **කොමිෂන් සභා සාමාජිකයෝ** | : | ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ-ජයවර්ධන<br>ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා<br>ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්<br>විනිසුරු රෝහිණී වල්ගම |
| **සහභාගිත්වය** | : | අධ්‍යක්ෂ ජනරාල් පියතිස්ස රණසිංහ |
| **අභියාචක** | : | බෂීර් සේගු දාවුද් මයා |
| **නොතීසි නිකුත් කිරීම** | : | ජනාධිපතිතුමාගේ ලේකම්වරයා (නම් කළ නිලධාරී) |
| | : | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 15(අ) යටතේ ජාතික ලේඛනාරක්ෂණාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පෙනී සිටිය යුතු විය. |
| **පෙනී සිටීම/නියෝජනය** | : | බෂීර් සේගු දාවුද් |
| | : | ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය එන්.ටී. රූපසිංහ |
| | : | දිලිනි ලියනගේ, ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂිකා |

**විභාගයේදී උද්ගත වූ කරුණු**

ජනාධිපති ලේකම් කාර්යාලයේ අතිරේක ලේකම් (නීති) ලක්ෂ්මී ජයවික්‍රම මිය මෙම දිනයේදී පෙනී සිටීමට නොහැකි බව තොරතුරු කොමිෂන් සභාව වෙත දැනුම් දී තිබූ අතර, කොමිෂන් සභාවේ අභිමතය පරිදි වෙනත් දිනයක් නියම කරන ලෙස ඉල්ලීමක් කර ඇති බව වාර්තා විය. නමුත් මෙදින විභාගය පවත්වනු ලබන්නේ අභාවප්‍රාප්ත මුස්ලිම් කොංග්‍රස් නායක එම්.එච්.එම්. අෂ්රොෆ් මහතාගේ මරණය (2002) සම්බන්ධ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව සොයාගැනීම සම්බන්ධයෙන් ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගනු ලබන පියවර නිශ්චය කර ගැනීම පිණිස වූ හෙයින් මෙකී විභාගය නියමිත පරිදි පැවැත්විණි.

ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය නදීරා රූපසිංහ කොමිෂන් සභාව වෙත දැනුම් දුන්නේ පෙර අවස්ථාවේ (2017.11.20 දින) කොමිෂන් සභාව විසින් ලබාදුන් නියෝගයට අවනත වීමෙන් පසුව එම්.එච්.එම්. අෂ්රොෆ් මහතාගේ මරණය පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම් ජී.කේ.ජී. පෙරේරා මහතා හට 2017.12.08 දින (තොරතුරු කොමිෂන් සභාවට පිටපතක් සහිතව) ලිපියක් යැවූ බවයි. එමගින් එකී වාර්තාව ජාතික ලේඛනාරක්ෂණාගාරය වෙත භාරදීම සම්බන්ධ තොරතුරු ඉල්ලා සිටින ලදී. 2017.12.24 දිනැති ලිපිය මගින්, එම්.එච්.එම්. අෂ්රොෆ් මහතාගේ මරණය පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ එකී ලේකම් ජී.කේ.ජී. පෙරේරා මහතා ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිචාර දක්වා තිබුණේ 2002.01.24 දින තමන් පුද්ගලිකව එම වාර්තාව ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත අතෙන් භාර දුන් බව වෙන් වෙන් වශයෙන් සඳහන් කරමිනි. ඔහු තවදුරටත් සඳහන් කළේ, 1973 අංක 48 දරණ ජාතික ලේඛනාරක්ෂණ නීතියේ 11 වන වගන්තිය පිළිබඳ තමන් දැන සිටි හෙයින් ඉහත සඳහන් කළ වාර්තාව සම්බන්ධයෙන් තමන් එකී නීතිය අනුගමනය කළ බව සහ, සෙසු ලිපි ගොනු 64 ක් සමග තමන් විසින් 2002.01.24 දින කොමිෂන් සභා වාර්තාව ද ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දුන් බවයි. තවද, එය භාරදීම සිදුවී වසර 15 ක් ගත වී ඇති බවත්, එම භාරදීම සිදුකළ බව පෙන්වන ලිපි සහ/හෝ ලේඛන හා ලදුපත් (රිසිට්) තිබිය යුතු බව ද ඔහු එයින් සඳහන් කර තිබිණි. අවසාන කොමිෂන් සභා වාර්තාව, සැසි වාර්තාවල පිටපත් සමග තමන් විසින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාරදුන් බවද, අවසන් පිටු 3 හැර වාර්තාවේ ඉතිරි පිටු ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුවේ නොමැත්තේ මන්ද යන්න තමන් නොදන්නා බවත් ඔහු තවදුරටත් සඳහන් කළේය.

ආචාර්ය රූපසිංහ කොමිෂන් සභාව වෙත දැනුම් දුන්නේ, ලිපියේ කුමක් සඳහන් වුවද, කොමිෂන් සභා ලේකම්වරයා විසින් එම කාලයේ ලබාදුන් ලේඛනවලට අදාළ පරිග්‍රාහී ලේඛන ලැයිස්තුවේ එකී වාර්තාව පිළිබඳ සඳහනක් නොවන බවයි. ලිපියේ පිටපතක් කොමිෂන් සභාව වෙත භාරදුන් අතර, එය වාර්තා කෙරිණි.

කොමිෂන් සභා ලේකම් විසින් භාරදුන්, විස්තර නොකළ පළමු ලිපිගොනු පහ තමන් විසින් කියවා බැලූ බව ද අධ්‍යක්ෂ ජනරාල්වරිය තොරතුරු කොමිෂන් සභාවට දැනුම් දුන්නාය. ඇය සඳහන් කළේ මෙකී ලිපිගොනුවල අන්තර්ගත වූයේ කොමිෂන් සභාව වෙත සාක්ෂි ඉදිරිපත් කළ පුද්ගලයන්ගේ දිවුරුම් ප්‍රකාශවල පිටපත් පමණක් බවයි. එම ලිපිගොනු, පරීක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාව වෙත භාර දෙන ලදී. ලේඛන ලැයිස්තුව දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත්තේ 2002 ජනවාරි මාසය තුළ වන නමුත් වාර්තාව ජනාධිපතිවරයා වෙත භාර දී ඇත්තේ 2002 අගෝස්තු මාසය තුළ වන හෙයින්, බොහෝ විට ජනවාරි මාසයේදී එකී වාර්තාව නොතිබෙන්නට ඇතැයි ජාතික ලේඛනාරක්ෂණාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය සිය මතය දක්වා සිටියාය.





අභියාචක සඳහන් කළේ, මුල් වාර්තාව සොයාගැනීම අනිවාර්යයෙන් කළ යුතු බව සහ, වාර්තාවේ පිටපතක් විශ්වාසනීයත්වයෙන් ඌන බව ය. පැවති තත්වය තුළ එහි වාර්තාව තබා පිටපතක් හෝ සොයාගත හැකිද යන්න සැක සහිත බව ඔහු කියා සිටියේය. පූර්ණ වාර්තාව නොපවතින බවට තීරණයකට එළඹෙන ලෙසට ඔහු කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කළේය. පෙර විභාගයේදී තමන් වෙත සැපයූ පිටු 3, ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යවන ලද ලිපිගොනුවලින් ලබාගත් ඒවා බවත්, වාර්තාවේ පිටු 1 සිට 68 දක්වා නැති වී, 69, 70 සහ 71 පිටු පමණක් තිබීම ප්‍රායෝගිකව සිදුවිය නොහැකි බවත් ඔහු සඳහන් කළේය.

ජාතික ලේඛනාරක්ෂණාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය සඳහන් කළේ තමන් විසින් එම වාර්තාව ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදුන් බව සඳහන් කරන පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ ලිපිය, එකී ලේඛන භාරදීමේදී පවත්වාගෙන යනු ලබන අනුබැඳුම් ලැයිස්තුව සමග සලකා බැලිය යුතු බව සහ, එහි එකී වාර්තාව පිළිබඳ සඳහනක් නොවූ බවයි. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය තවදුරටත් සඳහන් කළේ තමන් ලිපි ගොනු 64ම පරීක්ෂා කර නොබැලූ අතර, අවසන් විභාගයේදී කොමිෂන් සභාව විසින් නියෝග කළ පරිදි ලිපිගොනු පහක් (5) ක් පමණක් පරීක්ෂා කර බැලූ බවයි.

අභියාචක කොමිෂන් සභාවේ අවධානයට තවදුරටත් ලක් කළේ, ජාතික ලේඛනාරක්ෂණාගාරයෙන් සහ පාර්ලිමේන්තු පුස්තකාලයෙන් තමන් සෝදිසි කර බැලූ නමුත්, පරීක්ෂණ කොමිෂන් සභාව පත්කිරීමට අදාළ ගැසට් නිවේදනය තමන්ට සොයාගත නොහැකි වූ බවයි. ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ජනාධිපතිනී කුමාරතුංග ගේ ලිපිගොනුවල කොටසක් වශයෙන් ජාතික ලේඛනාරක්ෂණාගාරය වෙත ලබාදුන් ලිපිගොනුවෙන් පමණක් 2001.08.22 දිනැති ගැසට් නිවේදනය සොයාගත් බව ද ඔහු සඳහන් කළේය. එසේම 2001.09.27 දිනැති ලිපියක් මගින් කොමිෂන් සභා සාමාජික, විනිසුරු එල්.කේ.ජී. වීරසේකර විසින් එවකට ජනාධිපති වෙත, වඩා වැදගත් සාක්ෂිකරුවන් 25 දෙනෙකුගෙන් සාක්ෂි ලබා ගැනීමට අත්‍යාවශ්‍ය හෙයින්, 2001 ඔක්තෝබර් 23 දින පටන් තවත් මාස 3 ක කාලයක් සඳහා කොමිෂන් සභාවේ කාලය දීර්ඝකර දෙන ලෙස ඉල්ලා සිටි ලිපියක් ද සොයාගනු ලැබ තිබිණි.

## නියෝගය:

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවක් අදාළ පොදු අධිකාරීන්ගේ කිසිදු ලිපිගොනුවක අන්තර්ගත නොවීම බරපතළ ලෙස අවධානයට ලක් විය යුතුය. මේ අවස්ථාවේදී ඉල්ලා සිටින වාර්තාව, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රස් නායක එම්.එච්.එම්. අෂ්රෆ් මහතාගේ හදිසි මරණය (2002) සම්බන්ධයෙන් වේ.

අදාළ ලිපි ලේඛන 2002.01.24 වැනි දින කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත, 1973 අංක 48 දරණ ජාතික ලේඛනාරක්ෂක නීතියේ (සංශෝධිත) 11 වගන්තිය ප්‍රකාරව පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවන් හි  අවසන් තැන්පත් කිරීම වශයෙන් භාර දීමේදී, අදාළ බලධාරීන්ගෙන් වාර්තාව ලබාගෙන එය ජාතික ලේඛනාරක්ෂණාගාරයේ භාරය යටතේ

තබාගැනීම සඳහා ජාතික ලේඛනාරක්ෂණාගාරය ව්‍යස්ථාපිත යුතුකමකට යටත් වන බවත්, එය නියත වශයෙන්ම පොදු අධිකාරිය මත යෙදෙන ව්‍යස්ථාපිත රාජකාරියේ විෂය පථය සහ අරමුණ වන බවත් අවිවාදාත්මක ය. එම විධිවිධානය මගින් අදහස් කරන මූලික ලේඛනය ද මෙම වාර්තාව වේ. මේ ආශ්‍රිත කරුණු අනුව සහ විශේෂයෙන්ම දෙපාර්තමේන්තුව විසින් නියත වශයෙන්ම කළ යුතුව තිබූ කාරණයක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් එකී වාර්තාව, දෙපාර්තමේන්තුව වෙත භාර දී නැතැයි කරන කරුණු කියාපෑම විසින් එම දෙපාර්තමේන්තුව සිය ව්‍යස්ථාපිත යුතුකම බරපතළ ලෙස පැහැර හැරීමක් උද්ගත වේ.

මේ ගැටළුව සම්බන්ධයෙන් 2017.11.20 දින කරන ලද නියෝගයෙන් පහත උපුටා දක්වමු.

> ‘‘හිටපු ජනපතිනිය චන්ද්‍රිකා කුමාරතුංග ගේ අදාළ ලිපිගොනු පොදු අධිකාරිය වූ ජනාධිපති ලේකම් කාර්යාලය විසින් 2007 වසරේදී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යවනු ලැබීම මගින් පොදු අධිකාරිය විසින් සමාන නිසි උද්‍යෝගයක් පෙන්වා තිබීම මෙයට උපකාර වනු ඇත. මෙම කොමිෂන් සභාව ඉදිරියේ සිදුකළ විභාග කටයුතුවලදී පෙනී ගිය අන්දමට නිසැක වශයෙන්මල රාජ්‍ය ආයතන ද්විත්වය විසින් මෙම ලිපිගොනු යැවූ සහ ඒවා ප්‍රතිග්‍රහණය කළ දිනයන් එකිනෙකට වෙනස් ය. 2007.01.12 දින ගොනුව භාරදුන් බව අප ඉදිරියේ ඇති වාර්තාවල පොදු අධිකාරිය සඳහන් කර තිබෙන විට එකී දෙපාර්තමේන්තුව විසින් එම ගොනුව භාරගෙන තිබෙන්නේ 2007.05.18 දින ය. මේ අනුව මෙම ගැටළුව සම්බන්ධයෙන් පැහැදිලිව තේරුම්ගත හැකි පැහැදිලිභාවයේ ඌනතාවක් තිබේ.“

අධ්‍යක්ෂ ජනරාල්වරිය මෙහිදී කරුණු පැහැදිලි කළේ ලේඛනාරක්ෂණාගාරය වෙත සැලකිය යුතු ලේඛන භාර දෙන විට, ඒවා භාරදෙන දිනය ඇතැම් අවස්ථාවලදී දෙපාර්ශවය විසින් අධිකාරී පෝර්ම අත්සන් කරන දිනයට වඩා වෙනස් වන බවයි. මෙම අවස්ථාවේදී ලේඛනාරක්ෂණාගාරය වෙත ලිපිගොනු තුන්සියයකට අධික ප්‍රමාණයක් යවා ඇති අතර, ලේඛන එවනු ලබන ආයතනයේ නිළධාරියෙකු ඉදිරියේ ඒවා පරීක්ෂා කර බැලීම සඳහා සති කිහිපයක් ගත වේ. එම ක්‍රියාවලිය සම්පූර්ණ වූ විට, එම ලේඛන ලේඛනාරක්ෂණාගාරය වෙත භාරදුන් බව දක්වමින් දෙපාර්ශවය විසින් අධිකාරී පෝර්මයකට අත්සන් කරනු ලැබේ. මේ අනුව ලේඛන භාරදීම හා තැන්පත් කිරීමට අදාළව, භාරදුන් දිනය සහ අධිකාරී පෝර්මයේ සඳහන් දිනය වෙනස් විය හැකිය. මේ අනුව ලේඛන ලබාගැනීමේ වලංගු දිනය ලෙස සැලකිය යුත්තේ අධිකාරී පෝර්මය අත්සන් කළ දිනය වේ.

මේ තත්වය තිබියදී ද අවධාරණය කළ යුත්තේ ජාතික ලේඛනාරක්ෂණාගාරය එබඳු පරීක්ෂණ කොමිෂන් සභාවන්ගේ වාර්තා අවසාන වශයෙන් සංචය කර ගන්නා ස්ථානය ලෙස නම් කර ඇති බවයි. තමන් විසින් කොමිෂන් සභා වාර්තාව 2002.01.24 දින ජාතික ලේඛනාරක්ෂණාගාරය වෙත භාර දුන් මේ අවස්ථාවේදී එකී ලේකම්වරයා විසින් පුද්ගලිකව සඳහන් කර තිබේ. එකී කොමිෂන් සභාවේ ලේකම්වරයාගෙන් ජාතික ලේඛනාරක්ෂණාගාරය අදාළ ලේඛන සඳහා අනුබැඳුම් ලැයිස්තුව ලබාගන්නා අවස්ථාවේදී එකී වාර්තාව





පිළිබඳ සඳහනක් නොවූ බව සැලකිල්ලට ගන්නා මෙන් මෙම කොමිෂන් සභාවෙන් ජාතික ලේඛනාරක්ෂණාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ඉල්ලීමක් කර ඇත. කෙසේ නමුත් එය සැකයට තුඩු දෙන කාරණයක් වේ.

ඕනෑම අවස්ථාවකදී අප ඉදිරියේ ඇති ගැටළුවක් සම්බන්ධයෙන් එකිනෙක ගැටෙන මත දෙකක් මෙම කොමිෂන් සභාව වෙත තිබේ. ජාතික ලේඛනාරක්ෂණාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය, ජාතික ලේඛනාරක්ෂණාගාරය භාරයේ ඇති ලිපිගොනු 64ම පරීක්ෂා කර බලා නැති බවත්, අවසන් විභාග දිනයේදී සඳහන් කළ ලිපිගොනු 5 පමණක් පරීක්ෂා කර බලා ඇති බවත්, මෙහිදී සැලකිල්ලට ගත යුතුය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස සහ, අප ඉදිරියේ ඇති ගැටළුවේ බරපතළ කම සැලකිල්ලට ගනිමින් පහත පියවර ගන්නා ලෙස නියම කරන්නෙමු.

අ) 2002.01.24 දින කොමිෂන් සභා ලේකම්වරයා විසින් භාරදුන් සියලු ලිපිගොනුවල අන්තර්ගත සියලු ලේඛන, එම වාර්තාව හෝ එහි පිටපතක් තිබේදැයි නිශ්චය කර ගැනීම පිණිස ඉතා සැලකිල්ලෙන් යුතුව පරීක්ෂා කරන ලෙසට ජාතික ලේඛනාරක්ෂණාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය වෙත උපදෙස් දෙනු ලැබේ.

ආ) එම වාර්තාව හෝ එහි පිටපතක් සිය බුක්තියේ නොමැති බව ජාතික ලේඛනාරක්ෂණාගාරය දිගින් දිගටම පවසන්නේ නම්, 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 15(ආ) වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි දිවුරුම හෝ ප්‍රතිඥා දීම මගින් එය තහවුරු කරන ලෙසට ඉල්ලා සිටීම වෙත මෙම මාර්ගෝපදේශනය විෂය වේ.

ඇ) ජනාධිපති ලේකම් කාර්යාලය විසින් 2007.05.18 දින ජාතික ලේඛනාරක්ෂණාගාරය වෙත යවන ලද ලිපිගොනුවේ අන්තර්ගත ලේඛනවල සහතික කළ පිටපත්, අධ්‍යක්ෂ ජනරාල්වරියගේ නිර්දේශය මත මෙම විභාග දිනයෙන් සතියක කාලයක් තුළ, එහි අන්තර්ගතය පරීක්ෂාකර බැලීම පිණිස මෙම කොමිෂන් සභාව ඉදිරියට ගෙන ආ යුතු වන්නේ, එමගින් එකී වාර්තාව තිබෙන ස්ථානය අනාවරණය කර ගැනීමට හැකියාව ලැබීමට ඉඩ ඇති හෙයිනි. මෙය, කොමිෂන් සභාවේ සියුම් පරීක්ෂාවට පමණක් ලක් වනු ඇත.

ඇ) එකී ලිපිගොනුවේ අන්තර්ගතය මත පදනම්ව, එකී වාර්තාවේ පිටපත් යවා ඇති පොදු අධිකාරීන් මොනවාදැයි, අදාළ ලිපිගොනුවල සඳහන් වී ඇති පරිදි නිශ්චය කර ගන්නා ලෙසත් එම වාර්තාව තවමත් සිය සන්තකයේ තිබේදැයි නිශ්චය කර ගන්නා ලෙසත් අදාළ පොදු අධිකාරීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ඉහත සියලු පියවර සම්පූර්ණ කිරීමෙන් පසුවද, වාර්තාව හෝ එහි පිටපතක් තිබෙන්නේ කොහේදැයි තවදුරටත් නිශ්චය කර ගත නොහැකි වන්නේ නම්, 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 15(ඇ) වගන්තිය යටතේ ජාතික ලේඛනාරක්ෂණාගාරය සන්තකයේ ඇති සියලු අදාළ ලිපිගොනු සඳහා අධීක්ෂණයක් නියම කිරීමට සුදුසු බව මෙම කොමිෂන් සභාව විසින් නිශ්චය කරයි. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 15(ඇ) වගන්තිය මගින් සඳහන් කරනුයේ,

> *15. මෙම පනත යටතේ කොමිෂන් සභාවේ කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව වෙත පහත දැක්වෙන බලතල ඇත්තේය.*
>
> *ඇ) ''මෙම පනතේ විධිවිධාන යටතේ වූ යම් පොදු අධිකාරියක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන තොරතුරු ඇතුළුව පොදු අධිකාරියක් විසින් දරනු ලබන තොරතුරු පරීක්ෂා කිරීම.''*

අදාළ රෙගුලාසි ප්‍රකාරව, සාමාන්‍යයෙන් ලිපිගොනු පරීක්ෂාකාරී ලෙස කියවිය හැක්කේ ජනාධිපති ලේකම් කාර්යාලයේ අනුමැතිය ලැබීමෙන් පසු පමණක් බවට ජාතික ලේඛනාරක්ෂණාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් සිදුකළ කරුණු කියාපෑමට ප්‍රතිචාරය දක්වමින් මෙහිදී දැඩි සේ අවධාරණය කරන්නේ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 4 වැනි වගන්තිය මගින්, තොරතුරු පනත වෙනත් ලිඛිත-පටහැණි නීති සියල්ල අභිබවා ප්‍රමුඛතර වන බව වෙන් වෙන් වශයෙන් තහවුරු කරන බව ය. මෙවැන්නකදී, කොමිෂන් සභාව විසින් එවැනි පරීක්ෂා කර බැලීමක් අවශ්‍ය යැයි නිශ්චය කරන්නේ නම් පනතේ 15(ඇ) වගන්තිය ප්‍රකාරව සහ එම වගන්තිය අනුව කිසිදු පොදු අධිකාරියකින් ඒ සඳහා අවසර ගත යුතු බවට අවශ්‍යතාවක් තොරතුරු පනතේ නැත. අධ්‍යක්ෂ ජනරාල්වරිය මෙම කරුණ පෙර විභාගයේදී ද (2017.11.20 දින පැවති) සිහිපත් කර ඇති බව මෙහිදී නිරීක්ෂණය වේ.

එම්.එච්.එම්.අෂ්රොෆ් මහතාගේ මරණය පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම් ජී.කේ.ජී. පෙරේරා මහතා විසින්, තමන් විසින් එම වාර්තාව 2002.01.24 දින ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුවට භාරදුන් බව දැනුම් දෙමින් එම දෙපාර්තමේන්තුව වෙත යවන ලද 2017.12.24 දිනැති ලිපියේ පිටපතක් අභියාචක වෙත ලබාදීම සිදුවිය.

ජාතික ලේඛනාරක්ෂණාගාරය වෙත යවනු ලැබූ, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග හිටපු ජනපතිනියගේ ලිපිගොනු තුළ තිබී හමු වූ, එකී පරීක්ෂණ කොමිෂන් සභාව පත්කිරීමට අදාළ 2001.08.22 දිනැති ගැසට් පත්‍රයේ පිටපතක් අභියාචක වෙත සපයනු ලැබීය. වැදගත් සාක්ෂිකරුවන් තවත් 25 දෙනෙකුගේ සාක්ෂි ලබාගැනීම සඳහා කොමිෂන් සභා සාමාජික එල්.කේ.ජී. වීරසේකර විනිසුරු විසින් කොමිෂන් සභාවේ කාලය දීර්ඝ කරන ලෙස එවකට ජනපතිනිය වෙත යවනු ලැබූ ලිපියක පිටපතක් ද කොමිෂන් සභාවේ නියෝගය මත අභියාචක වෙත ලබාදීම සිදුවිය.

මීළඟ විභාග දිනය :- 2018.02.27





මේ අනුව අභියාචනය කල් තබන ලදී.

..............................................................................................................................................

**RTIC Appeal/(පුද්ගලික විභාග කිරීම්) 22/2017 (2018.02.27 දින පැවැත්වූ කොමිෂන් සභා රැස්වීමේ කොටසක් වශයෙන් අභියාචනය අසන ලදී.)**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය යටතේ කරනු ලබන නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීතීන්හි 28 වන රීතිය යටතේ පවත්වාගෙන යනු ලබන කාර්ය පටිපාටිය (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය) ප්‍රකාරව ය.

| | | |
|---|---|---|
| **සභාපති** | : | මහින්ද ගම්මන්පිල මහතා |
| **කොමිෂන් සභා සාමාජිකයෝ** | : | එස්.ජී. පුංචිහේවා |
| | | කිශාලි පින්ටෝ-ජයවර්ධන |
| | | ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් |
| | | විනිසුරු රෝහිණී වල්ගම |
| **සහභාගිත්වය** | : | අධ්‍යක්ෂ ජනරාල් පියතිස්ස රණසිංහ |
| **අභියාචක** | : | බෂීර් සේගු දාවුද් |
| **නොතීසි නිකුත් කිරීම** | : | ජනාධිපතිතුමාගේ ලේකම්වරයා (නම්කළ නිලධාරී) |
| | : | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 15(අ) යටතේ ජාතික ලේඛනාරක්ෂණාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පෙනී සිටිය යුතු විය. |
| **පෙනී සිටීම/නියෝජනය** | : | බෂීර් සේගු දාවුද් |
| | : | ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය එන්.ටී. රූපසිංහ |
| | : | ලක්ෂ්මී ජයවික්‍රම, අතිරේක ලේකම් (නීති), ජනාධිපති ලේකම් කාර්යාලය |

## විභාගයේදී උද්ගත වූ කරුණු

ජනාධිපති ලේකම් කාර්යාලයේ අතිරේක ලේකම් (නීති) ලක්ෂ්මී ජයවික්‍රම මහත්මිය ආරම්භයේදී කොමිෂන් සභාව වෙත දැනුම් දුන්නේ ජනාධිපති ලේකම් කාර්යාලය විසින්, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නිර්මාතෘ ඒ.එච්.එම්. අෂ්රොෆ් මහතාගේ මරණයට අදාළ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ සහතික කළ පිටපතක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් (CID) ලබාගත් බවයි. එය සිදුකර තිබෙන්නේ පෙර

**ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේදී ය.**

විභාගයේදී තොරතුරු කොමිෂන් සභාව විසින් නියම කළ පරිදි ජයවික්‍රම මහත්මිය විසින් එකී වාර්තාවේ පිටපතක් ඉල්ලා සිටිමින් රජයේ මුද්‍රණාලයෙන් සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලිපියක් මාර්ගයෙන් ඉල්ලා සිටීමෙන් පසුව ය.

2018.02.05 දිනැති ජයවික්‍රම මහත්මියගේ ලිඛිත ඉල්ලීම අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිය බුක්තියේ පැවති එකී වාර්තාවේ පිටපතක් යවා ඇති අතර. එය 2018.02.14 දින ජනාධිපති ලේකම් කාර්යාලය විසින් භාරගෙන තිබිණි. එකී වාර්තාවේ පිටපත ජයවික්‍රම මහත්මිය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. ජනාධිපතිවරයාගේ එවකට ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම්වරයා වූ ඩබ්.ජේ.එස්. කරුණාරත්න විසින් එම වාර්තාව සත්‍ය පිටපතක් බවට 2003.03.36 දින සහතික කර තිබිණි.

ජයවික්‍රම මහත්මිය සඳහන් කළේ, එවකට ජනපතිනී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය විසින් රජයේ මුද්‍රණාලය විසින් එකී වාර පත්‍රිකාව ප්‍රකාශනය නොකළද, එම වාර්තාව වාර පත්‍රිකාවකට ඇතුළත් කර ප්‍රකාශනය කිරීම සඳහා රජයේ මුද්‍රණාලය වෙත යවා තිබූ බවයි.

වාර්තාව මහජනයාගේ දැනගැනීම පිණිස සොයාගැනීමට උපකාරී වීම සම්බන්ධයෙන් අභියාචක, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත සිය කෘතඥතාවය පළ කළේය.

**නියෝගය**

අභියාචක විසින් ඉල්ලා සිටි වාර්තාවේ පිටපතක් මේ වන විට පොදු අධිකාරිය විසින් ලබාගෙන ඇති අතර, එය කොමිෂන් සභාව වෙත ලබාදීම සිදුවිය. අභියාචකට ද 201ව8.03.02 දින තොරතුරු කොමිෂන් සභාවේ කාර්යාලයෙන් එහි පිටපතක් ලබාගත හැකිය.

අභියාචනය මේ අනුව අවසන් කරනු ලැබේ. මෙම ගැටළුවේදී පොදු අධිකාරීන් විසින් ලබාදුන් සහාය අපි අගය කරන්නෙමු.

******



තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදී ය.

**එච්.සී.එස්. ද සොයිසා සිරිවර්ධන එරෙහිව ශ්‍රී ලංකා හමුදාව**

RTIC Appeal/ 89/ 2017 (මෙම අභියාචන විභාගය 2017.11.06 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී)

| | | |
|---|---|---|
| **වැඩ බලන සභාපතිනි** | - | ජ්‍යෝෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන මෙනවිය |
| **සාමාජික** | - | ජ්‍යෝෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා මහතා |
| **සාමාජික** | - | ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍ර මිය |
| **අධ්‍යක්ෂ-ජෙනරාල්** | - | පියතිස්ස රණසිංහ |
| **අභියාචක** | - | කපිතාන් එච්.සී.එස්. ද සොයිසා |
| **නොතීසි ලත් පාර්ශවය** | - | යුද්ධ හමුදාධිපති , ශ්‍රී ලංකා හමුදාව (නම් කල නිලධාරී), මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න (තොරතුරු නිලධාරී) |
| **පෙනී සිටීම** | - | කපිතාන් එච්.සී.එස්. ද සොයිසා (නීති නිලධාරි)<br>මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න (තොරතුරු නිලධාරී),<br>මේජර් ආර්.ඩී.උඩුවිලාරච්චි (නීති නිලධාරි)<br>කපිතාන් ඩබ්ලිව්.එච්.එස්.සොයිසා |

අභියාචක කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටියාය.
පොදු අධිකාරිය මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න (තොරතුරු නිලධාරී), මේජර් ආර්.ඩී.උඩුවිලාරච්චි (නීති නිලධාරි) සහ කපිතාන් ඩබ්ලිව්.එච්.එස්.සොයිසා විසින් නියෝජනය කරන ලදී.
අභියාචක විසින් 2017.05.02 වන දින කරනු ලැබූ තොරතුරු ඉල්ලීමකින්, නීතිඥ මේජර් ජනරාල් ආර්.පී. රාජපතිරණ ආර්.එස්.පී. යූ.එස්.පී. විසින් සිදු කළයැයි කියනු ලැබූ ලිංගික අතවරය සම්බන්දව සිදුවීමට අදාලව මූලික පරීක්ෂණ උසාවිය පිලිබඳ, පහත සඳහන් තොරතුරු විමසා තිබුණේය.

1. ඉහත සඳහන් ලිංගික අතවරය පිළිබඳව සිදුකළ පැමිණිල්ල සම්බන්දයෙන් කරුණු සොයා බැලීමට 2014.08.01 දින පත් කරන ලද මූලික පරීක්‍ෂණඋසාවියේ කැඳවීම් නියෝගයෙහි සහතික කල පිටපතක්
2. අත් අකුරින් සඳහන් කල මූලික පරීක්‍ෂණ උසාවි වාර්තාවෙහි සහතික කල පිටපතක්
3. නිරීක්ෂණ හා නිගමන වල සහතික කල පිටපතක්
4. ඊට අදාල වෙනත් ලේඛන වල සහතික කල පිටපතක්
5. යුද්ධ හමුදාධිපති නිගමනයක් සකස් කර ඇත්නම් එම නිගමනයෙහි සහතික කල පිටපතක්
6. මෙම මූලික පරීක්ෂණ උසාවියේ නීති නිලධාරීන්ද, සාක්ෂිකරුවන්ද වූ බැවින්, යුද්ධ හමුදාධිපති නිගමනයක් නිකුත් කර ඇත්නම් එම නිගමනය කෙටුම්පත් කර සකස්කළ, නිලධාරියා/නිලධාරීන්ගේ තොරතුරු හා වෘත්තීය සුදුසුකම්

අභියාචකගේ තොරතුරු ඉල්ලීමට පිළිතුරු දෙමින්, තොරතුරු නිලධාරී මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න, 2017.05.12 දිනැති ලිපියෙන් අභියාචකට යුද්ධ හමුදා පනතට යටත්ව සේවයේ යෙදී සිටින නිලධාරිනියක් ලෙස, ඉල්ලා ඇති තොරතුරු ලබා ගැනීම පිළිබඳව යුද්ධ හමුදා පනතේ දක්වා ඇති පරිදි අභියාචකගේ අණදෙන නිලධාරී මගින් අනුපිලිවෙලට යුද හමුදාධිපති අමතන මෙන්, දන්වා තිබුණි. එනුව 2017.05.14 දිනැති ලිපියෙන් අභියාචක තමාගේ අණදෙන නිලධාරී හට තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කර ඇත. අණදෙන නිලධාරීගෙන් පිළිතුරක් නොලැබීම හේතුවෙන්, අභියාචක 2017.06.05 දාතමින් නම්කළ නිලධාරී වන යුද හමුදාධිපති හට අභියාචනයක් ගොනු කර ඇත. නම්කළ නිලධාරී විසින් ද පිළිතුරක් නොලැබීම හේතු කොටගෙන, අභියාචක කොමිෂන් සභාවට 2017.08.28 වන දින අභියාචනය ගොනු කර ඇත.

පොදු අධිකාරිය විසින් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරනවාදැයි කොමිෂන් සභාව විමසූ විට, තොරතුරු නිලධාරී ප්‍රකාශ කර සිටියේ, පොදු අධිකාරිය තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප නොකරන බවත්, අභියාචකට සේවයේ යෙදී සිටින නිලධාරිනියක් නිසාවෙන් තොරතුරු ඉල්ලීම පිළිබඳව යුද්ධ හමුදා පනතේ අභ්‍යන්තර ක්‍රියාපටිපාටියන්ට අනුකූලව ක්‍රියා කරන ලෙස හුදෙක් ඉල්ලා සිටින බවත්ය. එවිට අභියාචක තමා විසින් මූලික පරීක්ෂණ විභාගය 2015.07.21 වන දින අවසන් වීම සමඟ යුද හමුදා අභ්‍යන්තර ක්‍රියාපටිපාටියන්ට අනුකූලව කරනු ලැබූ නොයෙකුත් ඉල්ලීම් පිළිබඳව කොමිෂන් සභාවේ අවධානය යොමු කරන ලදී. අභියාචක විසින් රැගෙන ආ තිබූ ලියකියවිලි පරීක්ෂා කරන විට, අභියාචක 2016.01.31, 2016.03.31, 2016.05.18, 27.10.2016 සහ 2017.02.15 වන දිනයන්හි අභ්‍යන්තර ඉල්ලීම් කර ඇති බවත්, ඒවා සියල්ලන්ගෙන්ම තොරතුරු ලබාගැනීමට අපොහොසත් වී ඇති බවත් පෙනී ගියේය.

**නියෝගය**

මෙම අභියාචනයේදී, පොදු අධිකාරිය වන ශ්‍රී ලංකා යුධ හමුදාව,තොරතුරු ඉල්ලීමෙන් විමසා තිබූ තොරතුරු සපයා නොමැති ඇති අතර අභියාචකට තොරතුරු ලබා ගැනීම පිළිබඳව යුද්ධ හමුදා පනතේ දක්වා ඇති අභ්‍යන්තර ක්‍රියාපටිපාටියන්ට අනුකූලව ක්‍රියා කරන ලෙසට දන්වා ඇත. තොරතුරු පනතේ 25 වන වගන්තියේ පැහැදිලි ලෙස දක්වා ඇති පරිදි, තොරතුරු නිලධරයකු විසින්, ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීමට හෝ මේ පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති හේතුවලින් යම් එක් හේතුවක් හෝ ඊට වැඩි ගණනක් මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හෝ තීරණය කළ යුතු අතර, එම තීරණය, ඉල්ලීම කළ පුරවැසියා හට වහාම සන්නිවේදනය කළ යුතු ය.

RTI කොමිෂන් සභාව පනතේ ඇති නීතිය ක්‍රියාත්මක කිරීමට ව්‍යවස්ථාපිත වගකීමකින් බැඳී ඇත. ඒඅනුව පනතේ මූලික මූලධර්මය වන ‘උපරිම තොරතුරු අනාවරණය කිරීම’ යන්නට අනුකූලව තොරතුරු ප්‍රදානය මුක්ත කළ හැක්කේ පනතේ 5 (1) උපවගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති ව්‍යතිරේකයන් පදනම් කරගෙනම පමණි. ශ්‍රී ලංකා යුද හමුදාවද තොරතුරු පනතේ විෂය පථයට අදාළ වන පොදු අධිකාරියක් නිසාවෙන් තොරතුරු පනතේ ඇති විධිවිධාන අනුව කටයුතු කිරීමට ව්‍යවස්ථාපිත වගකීමකින් බැඳී ඇත. එහෙත් අභියාචකගේ 2017.05.02 දාතමින් ඉදිරිපත් කර තොරතුරු ඉල්ලීම සම්බන්දව පොදු අධිකාරිය කටයුතු කර ඇති ආකාරය තොරතුරු පනතේ 25 වගන්තියට හෝ 5 වන වගන්තියට අනුකූල නොවේ.

එබැවින්, අභියාචක විසින් ඉල්ලා ඇති මූලික පරීක්ෂණ කැඳවීම් නියෝග වැනි ඇතැම් තොරතුරු ස්වාභාවික යුක්තියේ මූලධර්මයන්ගෙන් සාධාරීකරණය කල හැකි බවද සඳහන් කරමින්, පොදු අධිකාරියහට අභියාචකගේ 2017.05.02 වන දින තොරතුරු ඉල්ලීම නැවත සළකා බලන ලෙසටත් අනුව පනතේ 25 වන වගන්තියට අනුව ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීමට හෝ මේ පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති හේතුවලින් යම් එක් හේතුවක් හෝ ඊට වැඩි ගණනක් මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හෝ තීරණය කර අභියාචනය විභාග කරනා ඊලඟ සභාවාරයේ, එනම් 2017.11.27 වන දින කොමිෂන් සභාවට දන්වන ලෙස කොමිෂන් සභාව නියෝග කරන ලදී.

එමෙන්ම 2017.05.02 වන දිනම කරනු ලැබූ තවත් තොරතුරු ඉල්ලීමකින් විමසා ඇති අභියාචකට එරෙහිව ඇති අයහපත් වාර්තා හා ඊට අදාළ ඇති ප්‍රතිපත්ති ලිපි පිලිබඳ කාරණාවද එදින, එනම් 2017.11.27 වන දින, විභාග කරනු ඇත.

අභියාචනය මෙලෙස කල් දමන ලදී.

*****

RTIC Appeal/ 89/ 2017 (මෙම අභියාචන විභාගය *2017.11.27* දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී)

| | | |
|---|---|---|
| **සභාපති** | - | මහින්ද ගම්මන්පිල |
| **සාමාජික** | - | ජ්‍යොෂ්ඨ නීතිඥ කිෂාලී පින්ටෝ ජයවර්ධන මෙනවිය |





| | | |
|---|---|---|
| **සාමාජික** | - | ජ්‍යොෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවාමහතා |
| **අධ්‍යක්ෂ-ජෙනරාල්** | - | පියතිස්ස රණසිංහ |
| **අභියාචක** | - | කපිතාන් එච්.සී.එස්. ද සොයිසා |
| **නොතීසි ලත් පාර්ශවය** | - | යුද්ධ හමුදාධිපති , ශ්‍රී ලංකා හමුදාව (නම් කල නිලධාරී), මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න (තොරතුරු නිලධාරී) |
| පෙනී සිටීම | - | කපිතාන් එච්.සී.එස්. ද සොයිසා (නීති නිලධාරිනි)<br>මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න (තොරතුරු නිලධාරී),<br>මේජර් ආර්.ඩී.උඩුවිලාරච්චි (නීති නිලධාරි)<br>මේජර් ඩී.සී.ඩී.ඒ.දිසානායක (නීති නිලධාරිනි)<br>කපිතාන් ඩබ්ලිව්.එච්.එස්.සොයිසා |

අභියාචක කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටියාය.

පොදු අධිකාරිය මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න (තොරතුරු නිලධාරී), මේජර් ආර්.ඩී.උඩුවිලාරච්චි (නීති නිලධාරි), මේජර් ඩී.සී.ඩී.ඒ.දිසානායක (නීති නිලධාරිනි) සහ කපිතාන් ඩබ්ලිව්.එච්.එස්.සොයිසා විසින් නියෝජනය කරන ලදී.

ප්‍රථම අභියාචනා විභාගයේ කොමිෂන් සභාව දුන් නියෝගයට අනුකූල වෙමින්, තොරතුරු ඉල්ලීමේ දෙවැනි හා හතරවැනි අංක යටතේ ඉල්ලා ඇති තොරතුරු, එනම් අත් අකුරින් සඳහන් කල මූලික පරීක්ෂණ උසාවි වාර්තාවෙහි සහතික කල පිටපතක්, ඊට අදාළ ලේඛන වල සහතික කල පිටපතක්, හැරෙන්න තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා තිබූ අන් සියලු තොරතුරු පොදු අධිකාරියේ නියෝජිතයන් ඔවුන් හා රැගෙනවිත් තිබුණි.

තොරතුරු ඉල්ලීමේ දෙවැනි අංකය යටතේ දක්වා ඇති, එනම් අත් අකුරින් සඳහන් කල මූලික පරීක්ෂණ උසාවි වාර්තාවෙහි සහතික කල පිටපතක් සම්බන්දව තොරතුරු ප්‍රදානය මුක්ත කිරීමට පොදු අධිකාරිය තොරතුරු පනතේ 5(1)(අ) වගන්තිය අයැද ඇත. පොදු අධිකාරිය වැඩි දුරටත් කියා සිටියේ අදාළ මූලික පරීක්ෂණ උසාවි වාර්තාවෙහි නොයෙකුත් සාක්ෂිකරුවන් ඉදිරිපත් කල සංවේදී කරුණු අන්තර්ගත වී ඇති බවයි. අභියාචක පොදු අධිකාරියේ තර්කයට විරුද්ධ වෙමින් ප්‍රකාශ කර සිටියේ බෙදා වෙන්කිරීමේ මූලධර්මය අදාළ කර ගනිමින් සංවේදී කරුණු ඇතුලත් තොරතුරු හෙළිදරව් නොකොට වාර්තාවේ සංවේදී කරුණු ඇතුලත් නොවුණු කොටස් නිකුත් කළ හැකි බවයි. එනමුත්, අභියාචකගේ ස්ථාවරයට විරුද්ධ වෙමින් පොදු අධිකාරිය කරුණු දැක්වූයේ අසන ලද හරස් ප්‍රශ්න වලදීද එම සංවේදී කරුණු අදාළ කර ඇති හෙයින් එලෙස වෙන් කොට තොරතුරු නිකුත් කිරීමට නොහැකි බවයි.

තොරතුරු ඉල්ලීමේ 4 වන අංක යටතේ දක්වා ඇති, එනම් ‘ඊට අදාළ වෙනත් ලේඛන වල සහතික කල පිටපත්’, සම්බන්දයෙන් පොදු අධිකාරිය ප්‍රකාශ කර සිටියේ ඉල්ලා ඇති එම තොරතුරු නිශ්චිත නොමැති හෙයින් පැහැදිලි නැති බවයි. අභියාචක එය පිළිගන්නා ලදී.

පොදු අධිකාරියේ නියෝජිතයන් ඔවුන් සමඟ රැගෙනවිත් තුබූ ලියකියවිලි පරීක්ෂා කිරීමේදී තොරතුරු ඉල්ලීමේ 6 වන අංක යටතේ දක්වා ඇති තොරතුර, එනම් ‘මෙම උසාවියේ මූලික පරීක්ෂණයෙන් අනතුරුව යුද්ධ හමුදාධිපති නිගමනයක් නිකුත් කර ඇත්නම්, එම නිගමනය කෙටුම්පත් කර සකස්කළ නිලධාරියා/නිලධාරීන්ගේ තොරතුරු හා වෘතීය සුදුසුකම්’ සම්බන්දයෙන් තහවුරු කරන ලියකියවිල්ලක් නොමැති බව කොමිෂන් සභාවට පෙනී ගියේය. එනිසා, එය සම්බන්දයෙන් කොමිෂන් සභාව පොදු අධිකාරියෙන් ප්‍රශ්න කරනු ලැබූවේය. එම ලියකියවිල්ල, එනම් ‘යුද්ධ හමුදාධිපති නිගමනය’, යුද්ධ හමුදාධිපති විසින් අත්සන් කර ඇති හෙයින් යුද්ධ හමුදාධිපතිම කෙටුම්පත් කර ඇති බවට දර්ශකයක් වන බව පොදු අධිකාරිය ප්‍රකාශ කළේය. පොදු අධිකාරියේ නියෝජිතයන් වැඩි දුරටත් ප්‍රකාශ කලේ යුද්ධ හමුදාවේ නීති අංශයේ අධ්‍යක්ෂක මෙම නඩුවේ සාක්ෂිකරුවෙකු වූ නිසාවෙන් අධ්‍යක්ෂක මෙම නිගමන කෙටුම්පත සඳහා දායක නොවුණු බවයි. පොදු අධිකාරියේ තර්කය සම්බන්දව කොමිෂන් සභාව ප්‍රකාශ කර සිටියේ යුද්ධ හමුදාධිපතිම මේආකාරයේ නෛතික ලේඛනයක් කෙටුම්පත් කළායැයි පිළිගැනීමට අපහසු බවයි.

2017.05.02 වන දිනම කරනු ලැබූ දෙවන තොරතුරු ඉල්ලීමෙන් විමසා ඇති අභියාචකට එරෙහිව ඇති අයහපත් වාර්තා හා අයහපත් වාර්තාවලට අදාළ ඇති ප්‍රතිපත්ති ලිපි පිළිබඳ තොරතුරු ද කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි, පොදු අධිකාරියේ නියෝජිතයන් ඔවුන් සමඟ රැගෙනවිත් තිබුණි.
ඒඅනුව පොදු අධිකාරිය විසින් අභියාචකට එරෙහිව ඇති අයහපත් වාර්තා දෙකක් කොමිෂන් සභාවට භාර දුන් අතර අයහපත් වාර්තාවලට අදාළ ප්‍රතිපත්ති ලිපි ඕනෑම යුද්ධ හමුදා සේවකයෙකුට පහසුවෙන් ලබා ගැනීමට හැකියාව දැනටමත් ඇති බව පවසමින් එම ප්‍රතිපත්ති ලිපි අභියාචක වෙත ලබා දීමට කැමැත්ත පළකළේය. අභියාචක කොමිෂන් සභාවට දැන්වූයේ ඇයට එරෙහි තවත් අයහපත් වාර්තා ඇති බවයි. පොදු අධිකාරිය කොමිෂන් සභාව ඉදිරියේ තහවුරු කොට කියා සිටියේ ඔවුන්ගේ දැනුම අනුව අභියාචකට එරෙහිව ඇත්තේ කොමිෂන් සභාවට භාර දුන් අයහපත් වාර්තා දෙක හැරෙන්නට තවත් අයහපත් වාර්තා නැති බවයි. ඒඅනුව කොමිෂන් සභාව අභියාචකට ඇය දැනුවත්ව ඇයට එරෙහි වෙනත් අයහපත් වාර්තා නම් කර දක්වන ලෙසට ඉල්ලීමක් කරන ලද්දේ පොදු අධිකාරියට එම වාර්තා සොයා ගැනීමට එය රුකුලක් වන බැවිනි. ඒඅනුව, අභියාචක ඇයට එරෙහි තවත් අයහපත් වාර්තා දෙකක නම් කොමිෂන් සභාව ඉදිරියේ හුවා දැක්වීය.

**නියෝගය**

මෙම අභියාචනයේ, 2017.05.02 දිනැති තොරතුරු ඉල්ලීමේ 1, 4 හා 5 වන අංක යටතේ දක්වා ඇති ඉල්ලා සිටි තොරතුරු වලට අදාළව පොදු අධිකාරිය සපයන ලද තොරතුරු සම්බන්දයෙන් අභියාචක සැහීමකට පත් විය.
තොරතුරු ඉල්ලීමේ දෙවැනි අංකය යටතේ දක්වා ඇති, එනම් අත් අකුරින් සඳහන් කල මූලික පරීක්‍ෂණ උසාවි වාර්තාවෙහි සහතික කල පිටපතක් සම්බන්ධව පොදු අධිකාරිය තොරතුරු පනතේ 5(1)(අ) වගන්තිය අයැදමින් තොරතුරු ප්‍රදානය මුක්ත කර ඇත. තොරතුරු පනතේ 5(1)(අ) වගන්තියට අනුව මූලික පරීක්‍ෂණ වාර්තාවේ කුමන කොටස් අනාවරණය කිරීමෙන් එසේ පුද්ගලිකත්වයට ආක්‍රමණයක් සිදුවන්නේද යන්න ලිඛිත දේශනා මඟින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස පොදු අධිකාරියට දන්වනු ලබයි.
අභියාචක විසින් කොමිෂන් සභාව ඉදිරියේ නම් කරන ලද ඇයට එරෙහි අයහපත් වාර්ථා හා ඇයට එරෙහිව ඇති වෙනත් අයහපත් වාර්ථා ඇතිනම් ඒවා සොයා අභියාචක වෙත නිකුත් කරන මෙන් කොමිෂන් සභාව පොදු අධිකාරියට නියෝග කරනු ලබයි. එමෙන්ම අයහපත් වාර්ථා අදාළව ඇති ප්‍රතිපත්ති ලිපි අභියාචක වෙත ලබාදීමට පොදු අධිකාරිය එකගත්වය පළ කරන ලද බවද කොමිෂන් සභාව සටහන් කරනු ලබයි.
2017.05.02 දිනැති ප්‍රථම තොරතුරු ඉල්ලීමේ 6 වන අංක යටතේ දක්වා ඇති තොරතුර, එනම් ‘යුද්ධ හමුදාධිපති නිගමනයක් නිකුත් කර ඇත්නම්, එම නිගමන කෙටුම්පත් කර සකස්කළ නිලධාරියා/නිලධාරීන්ගේ තොරතුරු හා වෘත්තීය සුදුසුකම්’ සම්බන්දව පොදු අධිකාරියේ ස්ථාවරය කොමිෂන් සභාවට දැන්විය යුතුයි. ‘යුද්ධ හමුදාධිපති නිගමනය’ හුදෙක් යුද්ධ හමුදාධිපති විසින් අත්සන් කර ඇති හෙයින් යුද්ධ හමුදාධිපතිම කෙටුම්පත් කර ඇති බවට දර්ශකයක් වන බව නිගමනය කළ නොහැකි බැවින් එම නිගමන කෙටුම්පත් කර සකස්කළ නිලධාරියා/නිලධාරීන්ගේ තොරතුරු හා වෘත්තීය සුදුසුකම් සම්බන්දයෙන් තහවුරු කරන නිල ලේඛනයක් ඊළඟ අභියාචනා විභාගයේදී කොමිෂන් සභාවට භාර දෙන මෙන් පොදු අධිකාරියට නියෝග කරනු ලබයි. තවද තොරතුරු ඉල්ලීමෙහි අංක 3 යටතේ දක්වා ඇති තොරතුර සම්බන්ධ ව කොමිෂන් සභාව වෙත දන්වන ලෙස පොදු අධිකාරියට නියෝග කරනු ලබයි.
ඊළඟ අභියාචනා විභාගය 2018.01.30 වන දින වන අතර ඒ සම්බන්දයෙන් ලිඛිත දේශනා 2018.01.23 වන දිනට ප්‍රථම කොමිෂන් සභාවට භාර දෙන ලෙස දන්වන ලදී.
අභියාචනය මෙලෙස කල් තබන ලදී.

****

RTIC Appeal/ 89/ 2017 (මෙම අභියාචන විභාගය 2018.01.30 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී).
2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.





**සභාපති** - මහින්ද ගම්මම්පිල මහතා
**කොමිෂන් සභා සාමාජික** - ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන මෙනවිය
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම
**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - කපිතාන් එච්.සී.එස්. ද සොයිසා සිරිවර්ධන
**නොතීසි ලත් පාර්ශවය** - යුධ හමුදාධිපති , ශ්‍රී ලංකා යුධ හමුදාව (නම් කළ නිලධරයා),
මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න
(තොරතුරු නිලධරයා)
**පෙනී සිටීම** -
අභියාචක: කපිතාන් එච්.සී.එස්. ද සොයිසා සිරිවර්ධන(නීති නිලධාරි)
පොදු අධිකාරිය: බ්‍රිගඩියර් ඒ. එම්. එස්.බී. අතපත්තු අධ්‍යක්ෂ මාධ්‍ය, ශ්‍රී ලංකා යුධ හමුදාව
මේජර් ඩී.සී.ඩී.ඒ. දිසානායක නීති නිලධාරී, ශ්‍රී ලංකා යුධ හමුදාව
කපිතාන් ඩබ්ලිව්.එච්.එස්.සොයිසා, විෂය නිලධාරී, ශ්‍රී ලංකා යුධ හමුදාව

**අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචනය ආරම්භයේදී, අභියාචක පෙර විභාගයේදී පොදු අධිකාරිය විසින් ලබා දුන් ලියකියවිලි මන්ද යන්න තහවුරු කර සිටින ලදී. ඇය පවසා සිටියේ 1,4, සහ 5 අයිතමයන් තමා වෙත ලබා දී ඇති බවය. එනමුත් පොදු අධිකාරිය විසින් එම ලියකියවිලි සහතික කර ලබා දී නොමැත. පොදු අධිකාරිය එම ලියකියවිලි සහතික කර ලබා දීමට එකඟ විය.
මෙම අවස්ථාව වන විට ප්‍රශ්නගත අයිතමයන් ලෙසට පැවතියේ
2. අත් අකුරින් සඳහන් කල මූලික පරීක්‍ෂණ උසාවි වාර්තාවෙහි සහතික කල පිටපතක්
3. නිරීක්ෂණ හා නිගමන වල සහතික කල පිටපතක්
6.මෙම මූලික පරික්ෂණ උසාවියේ නීති නිලධාරීන්ද, සාක්ෂිකරුවන්ද වූ බැවින්, යුද්ධ හමුදාධිපති නිගමනයක් නිකුත් කර ඇත්නම් එම නිගමනය කෙටුම්පත් කර සකස්කළ, නිලධාරියා/නිලධාරීන්ගේ තොරතුරු හා වෘත්තීය සුදුසුකම්
අභියාචක තවදුරටත්,
1. අභියාචකට එරෙහිව ඇති අයහපත් වාර්තා
2. අයහපත් වාර්තාවලට අදාළ ඇති ප්‍රතිපත්ති ලිපි පිළිබඳ තොරතුරු ඉල්ලා සිටියාය.

2018.01.23 වන දිනට පෙර අභියාචක වෙත ලිඛිත කරුණු කියපෑම් ගොනු කිරීමට නියෝග කර සිටියද එසේ කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වී තිබුණි. තවද අයිතම අංක 2 සම්බන්ධයෙන් (එනම් අත් අකුරින් සඳහන් කල මූලික පරීක්‍ෂණ උසාවි වාර්තාව) , තෙවන පාර්ශවයන්ගේ පෞද්ගලිකත්වයට බලපාන බවට කරන ප්‍රකාශය, පොදු අධිකාරිය විසින් සිදු කරන කියාපෑමක් පමණක් බව පෙනී යයි. පොදු අධිකාරියෙන් විමසීමෙන් අනතුරුව පවසා සිටියේ මෙම විමර්ශනයට පසු වෙනත් කිසිදු විමෂන්යක් නොපැවැත්වූ බවයි.

පෙර විභාග කිරීමේදී අයිතම අංක 3, එනම් නිරීක්ෂණ හා නිගමන වල සහතික කල පිටපත් සම්බන්ධයෙන් හැගී ගියේ, එම තොරතුරු අභියාචක වෙත ලබා දුන් බව වුවත්, අභියාචක පවසා සිටියේ මෙම නිරීක්ෂණ හා නිගමන අයිතම 2හි සඳහන් විමර්ශනය අවසානයේ එළඹුණු නිගමන බවත් එම නිගමන අයිතම 5හි සඳහන් යුධ හමුදාධිපති ගේ නිගමනයට වෙනස් නිගමනයන් බවත්ය.

අයිතම අංක 6 සම්බන්ධයෙන් (එනම් යුද්ධ හමුදාධිපති නිගමනයක් නිකුත් කර ඇත්නම් එම නිගමනය කෙටුම්පත් කර සකස්කළ, නිලධාරියා/නිලධාරීන්ගේ තොරතුරු හා වෘත්තීය සුදුසුකම්) පොදු අධිකාරිය පවසා සිටියේ එම නිගමනයන් යුධ හමුදාපති විසින් අත්සන් කොට ඇති බැවින් එතුමා එහි සම්පූර්ණ වගකීම භාරගන්නා බවයි. පොදු අධිකාරිය මෙම නිගමන කෙටුම්පත් කළ නිලධාරීන් හඳුනාගත්

නොහැකි බවත් කෙටුම්පත් කරන ලද සමහරෙක් නිලධාරීන් විශ්‍රාම ගොස් ඇති බවත් පවසා සිටියේ. තවද, සාමාන්‍ය තත්ත්ව යටතේ මෙවැනි ලියවිලි කෙටුම්පත් කරන අංශයට (එනම් නීති අංශයට), එම අංශයේ නිලධාරියෙකුට එරෙහිව චෝදනා එල්ලවී තිබූ බැවින් මෙයට සහභාගී වීමට නොහැකි විය. එබැවින් යුධ හමුදාපතිගේ මග පෙන්වීමට යටත්ව අනෙකුත් අංශවල නිලධාරීන් විසින් මෙම කටයුත්ත අසිදු කෙරෙන ලදී. පොදු අධිකාරිය තව දිරටත් පවසා සිටියේ නීති අංශයේ නිලධාරියෙකුට කෙටුම්පත් කල නොහැකි අවස්ථාවකදී සම්මත ක්‍රියාමාර්ගය වන්නේ එම නිලධාරියගේ තනතුරට හා ජොෂ්ටත්වයට සරිලන අණ දෙන නිලධාරියෙකු විසින් මෙම කාර්යය සිදු කරන බවයි. මෙම අවස්ථාවේදී II ශ්‍රේණිය හෝ ඊට ඉහල සුදුසුකමක් ඇති නිලධාරියෙකු විසින් කෙටුම්පත් කිරීම සිදු වෙයි. පාබල සේනාංක අවස්ථාවේදී අණදෙන නිලධාරියා I ශ්‍රේණියේ නිලධාරියෙකු බැවින් එම අවස්ථාවේදී තීරණය කෙටුම්පත් කිරීම I ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සිදු කරනු ලැබෙයි.

පාර්ශව විසින් කොමිෂන් සභාව ඉදිරියේ සිදු කරන ලද කියාපෑම් වලින් තවදුරටත් පෙනී ගියේ ශ්‍රී ලංකා මානව අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව ඉදිරියේ අභියාචකගේ විමර්ශනයේ දී සාක්ෂි ලබාදුන් පුද්ගලයකු විසින් පැමිණිල්ලක් ගොනු කර ඇති බව පෙනී ගියේය. එහිදී, අභියාචක සාක්ෂි ලබා දීම සඳහා කැඳවා, ඒ සඳහා පොදු අධිකාරිය ඇයව තම රාජකාරීන් වලින් නිදහස් කරනු ලැබ සිටියද ශ්‍රී ලංකා මානව අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට ඇය අපොහොසත් විය.

පොදු අධිකාරිය අයහපත් වාර්තා හා ඊට අදාළව ඇති ප්‍රතිපත්ති ලිපි කොමිෂන් සභාව වෙත ලබා දෙන ලදී.

**නියෝගය:**

පොදු අධිකාරිය වෙත අයහපත් වාර්තා හා ඊට අදාළ ඇති ප්‍රතිපත්ති ලිපි අභියාචක වෙත ලබා දෙන බවට නියෝග කර සිටිමු.

කොමිෂන් සභාව මුලික් විමර්ශන් වාර්තා හෙළිදරව් කිරීම සම්බන්ධයෙන්, සාමාන්‍යයෙන් ප්‍රවේශම් වන්නේ මන්ද යත්, ඉන් අනතුරුව සිදුකරන විධිමත් පරීක්ෂණ හා අධිකරණ කටයුතුවලදී, අධිකරණයේ අධිකාරි බලය හා අපක්ෂපාතීබව පවත්වාගෙන යාමට අගතියක් සිදු විය හැකි බැවිනි.එනමුත් මෙම අවස්ථාවේ එවැනි ක්‍රියාමාර්ගයක් නොගන්නා බව යුධ හමුදාපතිගේ නිගමන (අයිතම අංක 5- කොමිෂන් සභාව ඉදිරිපිටදී ලබා දී අභියාචක වෙත නිකුත් කරන ලද) මගින් පැහැදිලි වන බැවින් පොදු අධිකාරිය වෙත, එම අත් අකුරින් සඳහන් කල මූලික පරීක්‍ෂණ උසාවි වාර්තාවෙහි පිටපතක් (එහි තොරතුරු ඉල්ලීමෙහි අංක 2 හා 3 අඩංගු වේ), තෙවන පාර්ශවයකට අගතියක් සිදු විය හැකි කොටස් ඉවත් කොට සාධන ලද සාරාංශයක් සමග කොමිෂන් සභාවට පරීක්ෂා කර බැලීම සඳහා ලබා දෙන ලෙසට නියෝග කර සිටිමු. පෙර විභාග කිරීම් වලදී කොමිෂන් සභාව විසින් මූලික පරීක්ෂණ වාර්තාව ලබාදීමට පොදු අධිකාරිය පෑ විරෝධය පිළිගෙන තිබුනද, යුධ හමුදපතිගේ නිගමන සියුම් ලෙස පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව සහ පරීක්ෂනය අවස්ථාවේදී තමාට සිදුවී ඇති බලවත් අසාධාරණය පිළිබඳව කොමිෂන් සභාව ඉදිරියේ අභියාචක විසින් කරන ලද වාචික හා ලිකිත කරුණු කියාපෑම් තුලින් කරන ලද අඛණ්ඩ ආස්ථාපනය හේතුකොටගෙන කොමිෂන් සභාවේ පරීක්ෂාවට පමණක්, මුල් අවස්ථාවේදී, මූලික පරීක්ෂණ වාර්තාව ලබා දීම මගින් පොදු අධිකාරියට අගතියක සිදු වන්නේ නොමැති බව කොමිෂන් සභව අවධාරණය කර සිටියි.

අයිතම අංක 6 සම්බන්ධයෙන් එනම් යුද්ධ හමුදාධිපති විසින් අත්සන් කරන ලද නිගමනය සකස්කළ, නිලධාරියා/නිලධාරීන්ගේ තොරතුරු හා වෘත්තීය සුදුසුකම් සම්බන්ධයෙන්, මෙම විභාග කිරීම අවස්ථාවේදී කරන ලද කරුණු කියාපෑම් ඇතුලත් කොට, ලිඛිත කරුණු කියාපෑම් ගොනු කරන ලෙසට මෙයින් නියෝග කර සිටිමු.

අභියාචනය 2018.02.23 දින නැවත විභාගයට ගනු ලැබේ.

අභියාචනය මෙයින් කල් තැබේ.

*****

RTIC Appeal/ 89/ 2017 (මෙම අභියාචන විභාගය 2018.02.23 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.)





2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.

**සභාපති** - මහින්ද ගම්මම්පිල මහතා

**කොමිෂන් සභා සාමාජික** - ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන මෙනවිය

**කොමිෂන් සභා සාමාජික** - ජොෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා මහතා

**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍ර මිය

**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - කපිතාන් එච්.සී.එස්. ද සොයිසා සිරිවර්ධන

**නොතීසි ලත් පාර්ශවය** - යුධ හමුදාධිපති , ශ්‍රී ලංකා යුධ හමුදාව (නම් කළ නිලධරයා),<br>මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න<br>(තොරතුරු නිලධරයා)

**පෙනී සිටීම** -

අභියාචක: කපිතාන් එච්.සී.එස්. ද සොයිසා සිරිවර්ධන(නීති නිලධාරි)

පොදු අධිකාරිය: බ්‍රිගඩියර් ඒ. එම්. එස්.බී. අතපත්තු අධ්‍යක්ෂ මාධ්‍ය, ශ්‍රී ලංකා යුධ හමුදාව<br>මේජර් ඩී.සී.ඩී.ඒ. දිසානායක නීති නිලධාරී, ශ්‍රී ලංකා යුධ හමුදාව<br>මේජර් ආර්. ඩී. උඩුවිලාරච්චි නීති නිලධාරී, ශ්‍රී ලංකා යුධ හමුදාව<br>කපිතාන් ඩබ්ලිව්.එච්.එස්.සොයිසා, විෂය නිලධාරී, ශ්‍රී ලංකා යුධ හමුදාව

**අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පෙර විභාග කිරීමේදී පොදු අධිකාරිය වෙත අත් අකුරින් සඳහන් කල මූලික පරීක්‍ෂණ උසාවි වාර්තාවෙහි සහතික කල පිටපතක් (එහි තොරතුරු ඉල්ලීමෙහි අයිතම අංක 2 හා 3 අඩංගු වේ) එම වාර්තාවේ තෙවන පාර්ශවයන්ට අගතියක් සිදුවිය හැකි තොරතුරු ඉවත් කර සාධන ලද සාරාංශයක් සමග කොමිෂන් සභාවේ පරීක්ෂනය සඳහා යොමු කරන ලෙසට නියෝග කරන ලදී. පොදු අධිකාරිය යතුරු ලියනය කරන ලද ඉහත සඳහන් විමර්ශන වාර්තාවේ (අයිතම 2 හා 3ට අදාළ) පිටපතක් කොමිෂන් සභාව වෙත ලබා දුන් අතර අත් අකුරින් සඳහන් කල මූලික පරීක්‍ෂණ උසාවි වාර්තාව පිහිටා ඇති කාර්යාලයෙන් ලබා දීම සඳහා කාලය ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී. පොදු අධිකාරිය මෙම අවස්ථාවේදී සඳහන් කර සිටියේ යතුරු ලියනය කරන ලද වාර්තාව සහ අත් අකුරින් ලියන ලද වාර්තාව සර්වසම වන බව පවසා සිටින ලදී. තෙවන පාර්ශවයන්ට අගතියක් සිදුවිය හැකි තොරතුරු ඉවත් කර සාධන ලද සාරාංශයක්ද කොමිෂන් සභාවේ පරීක්ෂාව සඳහා යොමු කරන ලදී. පොදු අධිකාරිය නැවත නැවත පවසා සිටියේ මෙම වාර්තාව සහ සාරාංශය මෙම විභාග කිරීමේදී සාක්ෂි ලබා දුන් නිලධාරීන්ගේ පෞද්ගලිකත්වයට බලපෑම් සිදු කරන බවය.

අභියාචක ඇයට පෙර අවස්ථාවේදී ලබා දුන් ලේඛන සම්බන්ධයෙන් පවසා සිටියේ එය සැහීමකට පත්විය හැකි අයුරින් අත්සන් කොට මුද්‍රා තබා නොමැති බවයි. පොදු අධිකාරිය පවසා සිටියේ මෙම ගැටලුව නිරාකරණය කිරීම සඳහා පියවර ගන්න බවත් තොරාතුරු නිලධරයා තම මුද්‍රාව තබා අත්සන කරන බවටත් සඳහන් කරන ලදී. නිල මුද්‍රාවෙහි යුධ හමුදාවේ එම නිලධරයාගේ ශ්‍රේණිය/තනතුර පමණක් (නම නොමැතිව) සඳහන් වන අතර පොදු අධිකාරිය විසින් නිල මුද්‍රාව නිර්මාණය කර ඇති සම්මත ආකාරය මෙය වේ.

**නියෝගය:**

විමර්ශන වර්තාවේ දළ පරීක්ෂණයකින් පෙනී යන්නේ පොදු අධිකාරිය පිටු 36 කට සාරාංශ ගත කොට ඇත්තේ පිටු 2000ක් ඉක්මවූ විමර්ශන වාර්තාවක් බවයි. තවද පෙනී යන්නේ මෙම කාර්යය සිදු කිරීමේදී බොහෝ කොටස් අඩු කර ඇති බවයි.

2018.03.16 දින පෙ.ව.10.30 ට අත් අකුරින් ලියන ලද වාර්තාව තබා ඇති ස්ථානය නිර්ණය කොට, වාර්තාව ඉදිරිපත් කරන ලෙස පොදු අධිකාරියට නියෝග කර සිටිමු.

තවද අභියාචක වෙත මේ වනතෙක් නිකුත් කර ඇති ලේඛන සහතික කොට / නිවැරදි බව සහතික කොට ලබා දෙන ලෙසට පොදු අධිකාරිය වෙත නියෝග කර සිටිමු.
අභියාචනය මෙයින් කල් තැබේ.
*****

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/89/2017 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -
මෙම අභියාචනා විභාගය 2018.03.16 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

**සභාපති** - මහින්ද ගම්මන්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ එස් ජී පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙලවී තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල්** - පියතිස්තස රණසිංහ

**අභියාචක** - කපිතාන් එච් සී එස් ද සොයිසා සිරිවර්ධන
**නොතීසි ලත් පාර්ශවය** - යුධ හමුදාධිපති , ශ්‍රී ලංකා යුධ හමුදාව (නම් කළ නිලධරයා),
මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න
(තොරතුරු නිලධරයා)

**පෙනීසිටීම**
**අභියාචක** - කපිතාන් එච් සී එස් ද සොයිසා සිරිවර්ධන, නීති නිළධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
**පොදු අධිකාරිය** - මේජර් ඩී සී ඩී ඒ. දිසානායක, නීති නිළධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
බ්‍රිගේඩියර් ඒ එම් එස් බී අතපත්තු, මාධ්‍ය අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
මේජර් ආර් ඩී උඩවිලාරච්චි, නීති නිළධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
**නියෝගය:**
කොමිෂන් සභාව 23.02.2018 දින නියෝග කල පරිදි, පොදු අධිකාරිය අත් අකුරින් ලියන ලද වාර්තාව ඉදිරිපත් කරන ලදී. මෙහිදී ඉදිරිපත් කරන ලද වාර්තාව, සාරාංශගත කරන ලද වාර්තාව හා සැසඳීමෙන් අනතුරුව 03.04.2018 දින අභියාචනය නැවත විභාගයට ගනු ලැබේ.
අභියාචනය කල් තබන ලදී.
මීළඟ කැඳවීම් දිනය: 03.04.2018

---

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/89/2017 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -





මෙම අභියාචනා විභාගය 03.04.2018 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

**සභාපති** - මහින්ද ගම්මන්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ එස් ජී පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙලවී තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - කපිතාන් එච් සී එස් ද සොයිසා සිරිවර්ධන
**නොතීසි ලත් පාර්ශවය** - යුධ හමුදාධිපති , ශ්‍රී ලංකා යුධ හමුදාව (නම් කළ නිලධරයා),
මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න
(තොරතුරු නිලධරයා)

**පෙනීසිටීම**
**අභියාචක** - කපිතාන් එච් සී එස් ද සොයිසා සිරිවර්ධන, නීති නිළධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
**පොදු අධිකාරිය** - මේජර් ඩී සී ඩී ඒ. දිසානායක, නීති නිළධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
කපිතාන් ඩබ්ලිව්. එච්. එස්. සොයිසා, විෂය භාර නිළධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

**අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කාරණා:**
අත් අකුරින් ලියන ලද වාර්තාව, සාරාංශගත කරන ලද වාර්තාව හා සැසඳීමෙන් කොමිෂන් සභාවට පෙනී යන්නේ 23.02.2018 දින පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද සාරාංශගත වාර්තාව සම්පූර්ණ පරීක්ෂණ වාර්තාවේ කරුණු සැහීමකට පත්විය හැකි ආකාරයට ඉදිරිපත් නොකරන බවයි. කොමිෂන් සභාව තවදුරටත් පවසා සිටියේ මෙම සාරාංශගත වාර්තාවේ අභියාචකට වාසිදායක අයුරින් සටහන් කර ඇති තොරතුරු වාර්තා කිරීම සම්පූර්ණයෙන්ම පැහැර හැර ඇති බවත්, සාක්ෂිකරුවන්ගේ සටහන් ඉදිරිපත් කර නොමැති බවයි.
කොමිෂන් සභාව කරුණු දක්වමින් පවසා සිටියේ සාක්ෂිකරුවන්ගේ සටහන් අභියාචාකට වාසිදායක අයුරින් සටහන් වී ඇති නිසා එම තොරතුරු සියල්ල අභියාචකට ලබා දිය යුතු බවත් මෙම තොරතුරු ඉදිරිපත් කිරීමෙන්, එම සාක්ෂිකරුවන්ගේ පෞද්ගලිකත්වයට බාධා වන අයුරු පැහැදිලි නොවන බවයි.
මෙයට ප්‍රතිචාර දක්වමින් අභියාචක පවසා සිටියේ අත් අකුරින් ලියන ලද සම්පූර්ණ වාර්තාව ඇයට ලබා දෙන ලෙසයි.
**නියෝගය:**
අත් අකුරින් ලියන ලද වාර්තාව, සාරාංශගත කරන ලද වාර්තාව හා සැසඳීමෙන් පෙනී යන්නේ සාරාංශගත වාර්තාව සම්පූර්ණ පරීක්ෂණ වාර්තාවේ කරුණු සැහීමකට පත්විය හැකි ආකාරයට ඉදිරිපත් නොකරන බවයි. එම නිසා පරීක්ෂණ වාර්තාවේ සම්පූර්ණ වූ නිරීක්ෂණ හා නිගමන අභියාචකට ලබා දෙන ලෙසට පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටිමු.
තවද, සාරාංශගත වාර්තාවේ අභියාචකට වාසිදායක අයුරින් සටහන් කර ඇති තොරතුරු සම්පූර්ණයෙන්ම පැහැර හැරීමකට ලක්ව ඇති බව මෙහෙදී නිරීක්ෂණය වේ. සාක්ෂිකරුවන්ගේ සටහන් අභියාචාකට වාසිදායක අයුරින් සටහන් වී ඇති නිසා එම තොරතුරු සියල්ල අභියාචකට ලබා දෙන මෙන් පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටිමු. මෙහිදී 5, 12, 16, 17 සහ 18 වන දින සටහන් වූ කරුණු ද ඉදිරිපත් කරන ලෙසට අවධාරණය කර සිටිමු. මෙම තොරතුරු ඉදිරිපත් කිරීමෙන් පෞද්ගලිකත්වයට බාධා සිදු වන සාක්ෂිකරුවන්ගේ ලේඛනයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස පොදු අධිකාරියට තවදුරටත් නියෝග කර සිටිමු.
අභියාචනය කල් තබන ලදී.
මීළඟ කැඳවීම් දිනය: 30.05.2018

---

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදී ය.

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/89/2017 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -
මෙම අභියාචනා විභාගය 30.05.2018 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

**සභාපති** - මහින්ද ගම්මන්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ එස් ජී පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙලවී තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - කපිතාන් එච් සී එස් ද සොයිසා සිරිවර්ධන
**නොතීසි ලත් පාර්ශවය** - යුධ හමුදාධිපති , ශ්‍රී ලංකා යුධ හමුදාව (නම් කළ නිලධරයා),
මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න
(තොරතුරු නිලධරයා)

**පෙනීසිටීම**
**අභියාචක** - පෙනී සිටියේ නැත,
**පොදු අධිකාරිය** - මේජර් ඩී සී ඩී ඒ. දිසානායක, නීති නිළධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
කපිතාන් ඩබ්ලිව්. එච්. එස්. සොයිසා, විෂය භාර නිළධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
මේජර් ඒ. ඩබ්ලිව්. කේ. ඒ. ඩී. අමරතිලක, නීති නිළධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

**අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කාරණා:**
අභියාචක පෙනී සිටියේ නැත.
වාර්තාවේ ඇත පරිදි අභියාචකට පක්ෂව සාක්ෂිකරුවන් දුන් සාක්ෂි හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් විමසන ලද අවස්ථාවේදී, පොදු අධිකාරිය 2018.04.16 දිනැති ලිපියෙහි පනතේ වගන්ති 5(1)(අ) වගන්තිය සඳහන් කරමින් පවසා සිටියේ සාක්ෂිකරුවන් දෙදෙනා විසින් දෙන ලද හා ඔවුන් පිළිබඳ සඳහන් වන සාක්ෂි මගින් ඔවුන්ගේ පෞද්ගලිකත්වයට බාධා සිදු වන බවයි.
මෙම තොරතුරු වල සංවේදී ස්වභාවය කොමිෂන් සභාවේ අවධානයට ලක්කරමින් පොදු අධිකාරිය පවසා සිටියේ මෙම තොරතුරු හෙළිදරව් කිරීම නිලධාරිනියන් දෙදෙනාට අහිතකර ලෙස බලපෑ හැකි බවයි.
**නියෝගය:**
ඉහත සඳහන් කර නිලධාරියන් පෞද්ගලිකතාවය ආරක්ෂා කිරීමේ සඳහා තම සාක්ෂි අභියාචකට ලබා දීමට එකඟ නොවන බව සඳහන් කරමින් එම නිලධාරිනියන්ගේ ලිඛිත ප්‍රකාශයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටිමු.
මෙම සාක්ෂිකරුවන් දෙදෙනාගේ සටහන් හැර පරීක්ෂණ වාර්තාවේ ඉතිරි කොටස් අභියාචකට ලබා දීමට නොහැකි වීමට කිසිදු හේතුවක් නොමැති බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටියි.
අභියාචනය කල් තැබේ.
මීළඟ කැඳවීම් දිනය: 17.07.2018



තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදී ය.

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/89/2017 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -
මෙම අභියාචනා විභාගය 17.07.2018 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

**සභාපති** - මහින්ද ගම්මන්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ එස් ජී පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙලවී තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - කපිතාන් එච් සී එස් ද සොයිසා සිරිවර්ධන
**නොතීසි ලත් පාර්ශවය** - යුධ හමුදාධිපති , ශ්‍රී ලංකා යුධ හමුදාව (නම් කළ නිලධරයා),
මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න
(තොරතුරු නිලධරයා)

**පෙනීසිටීම**
**අභියාචක** - පෙනී සිටියේ නැත,
**පොදු අධිකාරිය** - මේජර් ඩී සී ඩී ඒ. දිසානායක, නීති නිළධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
මේජර් ඒ. ඩබ්ලිව්. කේ. ඒ. ඩී. අමරතිලක, නීති නිළධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

**අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කාරණා:**

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/ 89/ 2017 (මෙම අභියාචන විභාගය 2018.07.17 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී).
2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.

**සභාපති** - මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලී පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ
**අභියාචක** - කපිතාන් එච්.සී.එස්. ද සොයිසා සිරිවර්ධන
**නොතීසි ලත් පාර්ශවය** - යුධ හමුදාධිපති , ශ්‍රී ලංකා යුධ හමුදාව (නම් කළ නිලධරයා),
මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න (තොරතුරු නිලධරයා)

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදී ය.

**පෙනී සිටීම**
අභියාචක: කපිතාන් එච්.සී.එස්. ද සොයිසා සිරිවර්ධන
පොදු අධිකාරිය: මේජර් ඩී.සී.ඩී.ඒ. දිසානායක නීති නිලධාරිනී, ශ්‍රී ලංකා යුධ හමුදාව
මේජර් ඒ ඩබ් කේ ඒ ඩී අමරතිලක නීති නිලධාරී, ශ්‍රී ලංකා යුධ හමුදාව

**අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය පවසා සිටියේ නිල වශයෙන් එක් නිලධාරිනියකගෙන් (පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා නම් හෙළිදරව් නොකෙරේ) තම සාක්ෂි හෙළිදරව් කිරීමට තමා එකඟ නොවන බවට තහවුරු කර ඇති බවය. අනෙකුත් නිලධාරිනිය (පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා නම් හෙළිදරව් නොකෙරේ) ප්‍රසූත නිවාඩු ලබා ගෙන ඇති බවත් මෙම කරුණෙහි ස්වභාවය නිසා අයගේ නිවසට ගොඩ ලිඛිතව තම අකමැත්ත ලබා ගැනීම ප්‍රශ්න සහගත වන බවත් පවසා සිටින ලදී.

මූලික විමර්ශනයේ නිගමනය කෙටුම්පත් කර සකස්කළ, නිලධාරියා/නිලධාරීන්ගේ තොරතුරු හා වෘත්තීය සුදුසුකම් වලට පිළිතුරු සපයමින් පොදු අධිකාරිය පෙර අවස්ථාවේදී එම නිගමනයන් යුධ හමුදාපති විසින් සකස් කර ඇති බවට පවසා සිටියද, මෙතෙක් යුධ හමුදාපතිගේ සුදුසුකම්ද ලබාදී නොමැති බව අභියාචක පවසා සිටියාය.

**නියෝගය:**
මීළඟ විභාග කිරීමේ දින වන විට අනෙකුත් නිලධාරිනිය විසින් තම සාක්ෂි හෙළිදරව් කිරීමට අදාළව ලිඛිත විරුද්ධතාවය ලබා ගන්නා ලෙසටත් , පොදු අධිකාරිය මූලික් විමර්ශනයෙහි නිගමනයන් යුද හමුදාපති විසින්ම කෙටුම්පත් කරන ලද බවට දිගින් දිගටම පවසන්නේ නම් යුද හමුදාපතිගේ සුදුසුකම් නිල වශයෙන් ලබා දීමට කටයුතු කරන ලෙසටත් නියෝග කර සිටිමු.

අභියාචනය මෙයින් කල් තැබේ.
මීළඟ කැඳවීමේ දිනය: 2018.07.31

*****

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/ 89/ 2017 (මෙම අභියාචන විභාගය 2018.07.31 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී).
2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.

**සභාපති** - මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සාමාජික -** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික -** ජොෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික -** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික -** විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ
**අභියාචක** - කපිතාන් එච්.සී.එස්. ද සොයිසා සිරිවර්ධන
**නොතීසි ලත් පාර්ශවය** - යුධ හමුදාධිපති , ශ්‍රී ලංකා යුධ හමුදාව (නම් කළ නිලධරයා),
මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න (තොරතුරු නිලධරයා)





**පෙනී සිටීම**
අභියාචක: කපිතාන් එච්.සී.එස්. ද සොයිසා සිරිවර්ධන
පොදු අධිකාරිය: මේජර් ඩී.සී.ඩී.ඒ. දිසානායක නීති නිලධාරිනී, ශ්‍රී ලංකා යුධ හමුදාව
මේජර් ඒ ඩබ් කේ ඒ ඩී අමරතිලක නීති නිලධාරී, ශ්‍රී ලංකා යුධ හමුදාව

**අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය දෙවැනි නිලධාරිනිය (පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා නම් හෙළිදරව් නොකෙරේ) විසින් තම සාක්ෂි ලබා දීමට විරුද්ධව ලබා දෙන ලද ලිපිය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**නියෝගය:**

මූලික් සාක්ෂි, හරස් ප්‍රශ්න / සාක්ෂි සහ නැවත ප්‍රශ්න/සාක්ෂි ඇතුලු නිලධාරිනියන් දෙදෙනා විසින් ලබා දුන් සාක්ෂි, සහ වෙනත් සාක්ෂිකරුවන් එම නිලධාරිනියන් පිළිබඳව ලබා දුන් පෞද්ගලිකත්වයට බලපෑ හැකි සාක්ෂි, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අනුකූලව සිදු වන්නේදැයි කොමිෂන් සභාවෙහි ඇගයීමට යටත්ව, වෙන් කිරීම සඳහා, පොදු අධිකාරිය විසින් 2018.02.23 දිනැතිව ලබා දෙන ලද මුද්‍රිත වාර්තාව නැවත පොදු අධිකාරියට ලබා දී (අත් අකුරින් ලියන ලද වාර්තාව කොමිෂන් සභා භාරයේ තබා ගනිමින්) සිටිමු.
මීළඟ විභාග කිරීමේ දිනට පෙර වෙන්කරන ලද වාර්තාව කොමිෂන් සභාවට ලබා දීමට කටයුතු කරන ලෙසට නියෝග කර සිටිමු.
අභියාචනය මෙයින් කල් තැබේ.
මීළඟ කැඳවීමේ දිනය: 2018.08.14

*****

**ෆයිසාල් සමත් එ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කායර්ාංශය**

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/201/2017 -2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කායර්පටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කායර් පටිපාටිය- *මෙම අභියාචන විභාගය 2018.02.06 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.*

**සභාපති** - මහින්ද ගම්මම්පිල මහතා

**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන මෙනෙවිය

**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා මහතා

**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්** – පියතිස්ස රණසිංහ මහතා

**අභියාචක** – ෆයිසාල් සමත්

**නොතීසිලත්පාශර්වය** – කේ.ඕ.ඩී.ඩී. ප්‍රනාන්දු, ප්‍රධාන කළමනාකාර, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කායර්ාංශය

**පෙනීසිටීම**

අභියාචක – ෆයිසාල් සමත් මහතා

පොදු අධිකාරිය - ජී.එන්.කේ. පෙරේරා මිය, නීති නිලධාරිණි, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කායර්ාංශය

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය: | 2017.07.03 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | 2017.07.06 |
| නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය: | 2017.07.13 |
| නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | 2017.08.10 |
| RTIC කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය: | 2017.10.17 |

අභියාචක කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටියේය. පොදු අධිකාරිය නියෝජනය කරමින් ජී.එන්.කේ. පෙරේරා මෙනෙවිය, නීති නිලධාරිනී පෙනී සිටියාය.

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක, 2017.07.03 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

> සංක්‍රමණික සේවකයන් සම්බන්ධ ශ්‍රී ලංකා රජය  සහ කටාර්, කුවේට් සහ සෞදි අරාබි රාජ්‍යන් අතර පවතිනු ලබන අවබෝධතා ගිවිසුම් සහ ද්විපාශර්වික ගිවිසුම්

තොරතුරු නිලධාරියා 2017.07.06 දිනැති ලිපිය මගින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ‘පනතේ 5 (ආ) (ii) වන වගන්තිය’ යටතේ තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. ඉක්බිතිව අභියාචක 2017.07.13 දිනැතිව නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත. නම් කළ නිලධාරියා විද්‍යුත් තැපැල් මාගර්යෙන් තොරතුරු නිලධාරියාගේ ප්‍රතිචාරයම දක්වමින් 2017.08.10 දිනැතිව තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. ඒඅනුව, අභියාචක 2017.10.17 දිනැතිව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට අභියාචනයක් යොමු කර ඇත..

**අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය විසින් තොරතුරු ලබා දීමට එරෙහිව විරෝධතා දෙකක් ඉදිරිපත් කරන ලදී. එනම්, තොරතුරු පනතේ 5 (1) (ආ) (ii) සහ 5 (1) (ඇ) (v) යටතේ දක්වා ඇති ව්‍යතිරේකයන්ය.

5(1)(ආ)(ii) වගන්තියේ  පහත පරිදි දැක්වේ:

5. 1)  (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව-
(ආ) එම තොරතුරු හෙළිදරව් කිරීම
(ii) එම තොරතුරු යම් රජයක් හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තජර්ාතික ගිවිසුම් හෝ බැඳීම් විසින්  රහසිගතව ලබා දුන් හෝ රහසිගතව ලබාගත් අවස්ථාවක, එම තොරතුරු හෙළිදරව් කිරීම එම රජය හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තජර්ාතික ගිවිසුම් හෝ බැඳීම් සමග ශ්‍රී ලංකාවේ ඇති සබඳතාවලට අගතිගාමී වන හෝ අගතිගාමී විය හැකි අවස්ථාවක

5(1)(ඇ)(v) වගන්තියේ පහත පරිදි දැක්වේ:

5. 1)  (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව
(ඇ) එම තොරතුරු හෙළිදරව් කිරීම
(v) විදේශ වෙළඳ ගිවිසුම්වලට ඇතුළත් වීමට,





> අදාළ ආණ්ඩුවේ ආථර්ක හෝ මූල්‍යමය ප්‍රතිපත්ති වෙනස් කිරීමට හෝ නොකඩවා පවත්වාගෙන යෑම සම්බන්ධ තීරණ නිසිකලට පෙර හෙළිදරව් වීම මගින් ශ්‍රී ලංකාවේ ආථර්කයට බරපතල අගතියක් සිදුවිය හැකි අවස්ථාවක

තොරතුරු ප්‍රදානය මුක්ත කිරීමට උපුටා දක්වා ඇති අවස්ථා දෙකෙහිම සඳහන් කර ඇති පරිදි, අදාළ තොරතුරු හෙළිදරව් කිරීමෙන් “බරපතල අගතියක්” විය හැක්කේ කෙසේද යන්න කොමිෂන් සභාව පොදු අධිකාරියෙන් විමසා සිටින ලදී. පොදු අධිකාරිය එයට ප්‍රතිචාර ලෙස සඳහන් කරන ලද්දේ අදාළ ගිවිසුම් වල පාශර්වයන්ට අගතිගාමී වන බවත් අදාළ තොරතුරු තුන්වන පාශර්වයන් වෙත බලපාන බවත්ය.
එඅනුව කොමිෂන් සභාව පොදු අධිකාරියට දන්වන ලද්දේ අදාළ ලිපිලේඛන රහසිගත වන්නේ කෙසේද යන්න නිශ්චිතවම සැළකර සිටිය යුතු බවය. මන්ද, සාමාන්‍යයෙන් ගත් කළ නීති, රීති, රෙගුලාසි සහ කම්කරු ගිවිසුම් රහසිගත තොරතුරු ලෙස නොසළකන නිසාවෙනි.
පොදු අධිකාරිය ප්‍රකාශ කරන ලද්දේ මෙම වෙළඳ ගිවිසුම් වලට එළෙඹ ඇත්තේ ශ්‍රී ලංකාව සහ අදාළ වෙනත් රටවල් වල අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ කරුණු අනුව බවය. කොමිෂන් සභාව ඉනික්බිතිව සඳහන් කරන ලද්දේ විමසා ඇති තොරතුරු රහසිගත වන්නේ කෙසේද යන්න පිළිබඳව කාරණය සාධාරණීයකරණය කිරීමට පොදු අධිකාරිය එම අවස්ථාව වන විටද අපොහොසත් වී ඇති බවත්, පොදු අධිකාරිය ඉදිරිපත් කරන තකර්ය පිළිගතහොත් ශ්‍රී ලංකා රජය අනෙකුත් රාජ්‍ය සමඟ එළෙඹී ඇති සියළු ගිවිසුම් රහසිගත වන බවත් එය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිලිබඳ  පනතේ සඳහන් නීතිය සහ හරයට එරෙහිව වන බවත්ය.

පොදු අධිකාරිය වැඩි දුරටත් සඳහන් කළේ විමසා ඇති ඇතැම් ගිවිසුම් 2012 වෂර්යට අදාළ  වන බවත් නවතම ගිවිසුම් 2017 වෂර්යට අදාළ වන බවත් ය.

**නියෝගය**

අභියාචක විසින් විමසා ඇති තොරතුරු රහසිගත වන්නේ කුමන අයුරින්ද සහ කෙසේද යන්න කොමිෂන් සභාවට සතුටුදායක ලෙස කරුණු දැක්වීමට පොදු අධිකාරිය අපොහසත් වී ඇත. විමසා ඇති තොරතුරු සංක්‍රමණික සේවකයන් සම්බන්ධ ශ්‍රී ලංකා රජය  සහ කටාර්, කුවේට් සහ සෞදි අරාබි රාජ්‍යන් අතර පවතිනු ලබන අවබෝධතා ගිවිසුම් සහ ද්විපාශර්වික ගිවිසුම් සම්බන්ධයෙන් වන අතර, ඒඅනුව එම රටවල රැකියාවෙහි නිරත වන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීම වන මහජන සුභ සිද්ධිය අදාළ වේ. තවද, විමසා ඇති තොරතුරු අදාළ වන්නේ සමාප්ත කළ අවබෝධතා ගිවිසුම් වන අතර එළැඹීමට ඇති ගිවිසුම් නොවන නිසාවෙන් ගිවිසුම් වල පාශර්වකරුවන්ට බරපතලව අගතිගාමී විය නොහැක. එමනිසාවෙන්, පොදු අධිකාරිය විසින් දක්වා ඇති 5(1)(ආ)(ii) සහ 5(1)(ඇ)(v) යන වගන්ති යටතේ තොරතුරු ප්‍රදානය ප්‍රතික්ෂේප කර නොහැක.

විමසා ඇති තොරතුරු අභියාචක වෙත ලබාදීමට පොදු අධිකාරියට නියෝග කරනු ලැබේ. නම්කළ නිළධාරියාගේ තීරණය ප්‍රතිවතර්නය කරනු ලැබේ. මෙම නියෝගය පරිදි තොරතුරු නිකුත් කරන ලද්දේද යන්න නීණර්ය කර ගැනීම සඳහා මෙම කාරණය කොමිෂන් සභාව ඉදිරියේ නැවත සඳහන් කරනු ඇත.

ඊළඟ විභාග වාරය : 23.02.2018

---

RTIC Appeal (පෞද්ගලික විභාග කිරිම)/201/2017 -2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කායර්පටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කායර් පටිපාටිය- *මෙම අභියාචන විභාගය 2018.02.23 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.*

**සභාපති** - මහින්ද ගම්මම්පිල මහතා

**කොමිෂන් සභා සාමාජික** - ජ්යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා මහතා

**කොමිෂන් සභා සාමාජික** - ආචායර් සෙල්වි තිරුචන්ද්‍ර මිය

**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්** – පියතිස්ස රණසිංහ මහතා

**අභියාචක** – ෆයිසාල් සමත්

**නොතීසිලත්පාශර්වය** – කේ.ඕ.ඩී.ඩී. ප්‍රනාන්දු, ප්‍රධාන කළමනාකාර, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කායර්ාංශය

**පෙනීසිටීම**

පොදු අධිකාරිය - ජී.එන්.කේ. පෙරේරා මිය, නීති නිලධාරිණී, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කායර්ාංශය

**අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචක කොමිෂන් සභාව ඉදිරියේ පෙනී නොසිටි අතර පොදු අධිකාරිය සඳහන් කළ සිටියේ පොදු අධිකාරිය විසින් අත්සන් කළ ඇති සංක්‍රමණික සේවකයන් සම්බන්ධ ශ්‍රී ලංකා රජය සහ කටාර්, කුවේට් සහ සෞදි අරාබි රාජ්‍යන් අතර පවතිනු ලබන අවබෝධතා ගිවිසුම් සහ ද්විපාශර්වික ගිවිසුම් වල





පිටපත් ලබා දීමට හැකි බවත් විදේශ සේවා අමාත්‍යාංශය විසින් අත්සන් කළ ඇති ගිවිසුම් වල පිටපත් ලබා දීමට නොහැකි බවත් ය.

අමාත්‍යාංශය විසින් අත්සන් කරන ලද ශ්‍රී ලංකා රජය සහ කටාර්, කුවේට් සහ සෞදි අරාබි රාජ්‍යන් අතර අදාළ ගිවිසුම් වල පිටපත් පොදු අධිකාරිය සන්තකයේ තිබෙනවාද යන්න කොමිෂන් සභාව පොදු අධිකාරියෙන් විමසන ලදී. අදාළ පිටපත් තම සන්තකයේ ඇති බව පොදු අධිකාරිය සහතික කරන ලදී.

**නියෝගය**

විදේශ සේවා අමාත්‍යාංශය විසින් අත්සන් කරන ලද ශ්‍රී ලංකා රජය සහ කටාර්, කුවේට් සහ සෞදි අරාබි රාජ්‍යන් අතර අදාළ අවබෝධතා ගිවිසුම් වල පිටපත් තම සන්තකයේ ඇති බව පොදු අධිකාරිය තහවුරු කරන ලදී. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3 (1) වන වගන්තියට අනුව,

> "මේ පනතේ 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පොදු අධිකාරියක සන්තකයේ, භාරයේ හෝ පාලනය ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම සෑම පුරවැසියකුටම තිබිය යුතුය".

පූවර් විභාග වාරයේදී, පොදු අධිකාරිය වෙත පැහැදිලිව දන්වනු ලැබූ පරිදි අභියාචක විසින් විමසා ඇති තොරතුරු ජනසන්තක/ප්‍රසිද්ධ ලේඛන වන නිසාවෙන් තුන්වන පාශර්ව ව්‍යතිරේකය අදාළ නොවේ. ඒඅනුව, විමසා ඇති තොරතුරු අභියාචක වෙත ලබා දෙන ලෙස කොමිෂන් සභාව පොදු අධිකාරියට නියෝග කරනු ලැබේ.

නම්කළ නිලධාරීගේ තීරණය ප්‍රතිවතර්නය කරනු ලැබේ. මෙම නියෝගය පරිදි තොරතුරු ලබා දුන්නේද නීණර්ය කිරීම සඳහා, මෙම කාරණය නැවත කැඳවනු ලැබේ.

ඊළඟ විභාග වාරය : 16.03.2018

**16.03.2018 –**

14.03.2018 දිනැති RTI04 පත්‍රයක් මගින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 25 (1) වගන්තිය යටතේ, විමසා ඇති තොරතුරු අභියාචක වෙත ලබා දෙන බවට පොදු අධිකාරිය අභියාචක වෙත දන්වා ඇති බවට අභියාචක විසින් කොමිෂන් සභාවට දන්වන ලදී.

අභියාචනය මෙලෙස අවසන් කරන ලදී.

****

මහින්ද ගම්මම්පිල මහතා, සභාපති

ජ්යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා මහතා, කොමිෂන් සභා සාමාජික

ජ්යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන මෙනෙවිය, කොමිෂන් සභා සාමාජික

ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍ර මිය, කොමිෂන් සභා සාමාජික

විනිසුරු රෝහිනී වල්ගම, කොමිෂන් සභා සාමාජික





## මාරියෝ ගෝමස් එ. මහජන සවිබලගැන්වීම, සුභ සාධන සහ කන්ද උඩරට උරුමය පිලිබඳ අමාත්‍යාංශය

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/51/2018 -2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය- *මෙම අභියාචන විභාගය 2018.02.27 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.*

**සභාපති** - මහින්ද ගම්මම්පිල මහතා

**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලී පින්ටෝ ජයවර්ධන මෙනෙවිය

**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා මහතා

**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ මහතා

**අභියාචක** - ආචාර්ය මාරියෝ ගෝමස්

**නොතීසිලත්පාර්ශවය** - ශිරානි වීරකෝන්,ලේකම්, මහජන සවිබලගැන්වීම, සුභ සාධන සහ කන්ද උඩරට උරුමය පිලිබඳ අමාත්‍යාංශය

**පෙනීසිටීම**

අභියාචක - ආචාර්ය මාරියෝ ගෝමස් මහතා

පොදු අධිකාරිය - එස්.ඩී.උඩවත්ත මහතා, අතිරේක ලේකම්, මහජන සවිබලගැන්වීම, සුභ සාධන සහ කන්ද උඩරට උරුමය පිලිබඳ අමාත්‍යාංශය

| | |
|---|---|
| **තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය:** | 2017.07.13 (2018.08.23 සහ 2017.08.29- සිහි කැඳවීම්) |
| **තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | 2017.10.11 |
| **නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.10.25 |

| | |
|---|---|
| **නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | 2017.08.11 |
| RTIC **කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.12.05. |

## අභියාචනයට පසුබිම් වූ කරුණු:

අභියාචක, 2017.07.13 දිනැති තොරතුරු ඉල්ලීම මගින් සහ ඉක්බිතව 2018.08.23 සහ 2017.08.29 යන සිහිකැඳවීම් මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.
ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ නීති කෙටුම්පතෙහි නවතම සංස්කරණයෙහි පිටපතක් (සිංහල, දෙමළ, ඉංග්‍රීසි සහ බ්‍රේල්) සහ එම නීති කෙටුම්පතෙහි වර්තමාන තත්ත්වය.
තවද අදාළ නීති කෙටුම්පතට කැබිනට් අනුමැතිය ලැබී පාර්ලිමේන්තුවේ ලැයිස්තුගත වීම කෙදිනක විය හැකිද යන්නද අභියාචක විමසා ඇත.

තොරතුරු නිලධාරියා 2017.11.10 දිනැති ලිපිය මගින් අභියාචක වෙත පවසා ඇත්තේ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ නීති කෙටුම්පත රජයේ නීති සම්පාදක විසින් අමාත්‍යංශයේ නිරීක්ෂණ සඳහා යොමු කර ඇති බවත් අදාළ නිරීක්ෂණ සැපයීම සඳහා අවශ්‍ය පියවර රැගෙන ඇති බවත්ය. එමෙන්ම අදාළ නීති කෙටුම්පත ගැසට් කරන තුරු එය අභියාචක ලෙස සැපයීමට නොහැකි බවද තොරතුරු නිලධාරීවරයා වැඩි දුරටත් දන්වා ඇත.

ඉක්බිතිව අභියාචක 2017.10.25 දිනැතිව නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කරන ලදී. අභියාචක තොරතුරු නිලධාරියාගේ ප්‍රතිචාරයම දක්වමින් 2017.08.11 දිනැතිව පිළිතුරු සපයන ලදී. නම් කළ නිලධාරී වැඩි දුරටත් පවසා ඇත්තේ අදාළ සංශෝධනයන් පිළිබඳව වාර්තාවක් දැනටමත් සකස් කොට අවසන්ව ඇති බවද එය සමාජ සංවර්ධන ආයතනයේ ජාතික පාලක සභාවෙහි (Governing Council of National Institute of Social Development) අනුමැතිය ලබාගැනීම සඳහා 2017.11.15 වන දිනට ප්‍රථමව යොමු කර ඉනික්බිතව 2017.11.30 දිනට ප්‍රථමව නීති සම්පාදක වෙත දැන්වීමට පොදු අධිකාරිය කටයුතු කරනු ඇති බවය.

2017.11.30 දිනට අනතුරු පොදු අධිකාරිය තොරතුරු ඉල්ලීම පිළිබඳව ප්‍රතිචාරයක් නොදැක්වූ හෙයින් අභියාචක 2017.12.15 දිනැතිව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට අභියාචනයක් යොමු කරන ලදී.





## අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කාරණා:

නම් කළ නිලධාරි විසින් ඔහුගේ ප්‍රතිචාරයෙහි සඳහන් කළ දින වකවානු ඉකුත් වී ඇති හෙයින්, කෙටුම්පතේ දැනට පවත්නා තත්ත්වය පිළිබඳව කොමිෂන් සභාව විමසූ අවස්ථාවේදී, පොදු අධිකාරිය නියෝජනය කරමින් පැමිණ සිටි මහජන සවිබලගැන්වීම, සුභ සාධන සහ කන්ද උඩරට උරුමය පිලිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එස්.ඩී.උඩවත්ත මහතා විසින් පැහැදිළි කර සිටියේ ජාතික නීති සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කළ අමාත්‍යංශයේ නිරීක්ෂණ සඳහා යොමු කර ඇති කෙටුම්පත පාලක සභාවේ රැස්වීම් වල කිහිපවතාවක් ලැයිස්තුගත කර තිබුනද එය මේදක්වා සමාලෝචනය කිරීමට නොහැකි වී ඇති බවයි. එම නිසාවෙන් අභියාචකහට පනත් කෙටුම්පතේ පිටපතක් ලබා දීමට නොහැකි වූ බව පොදු අධිකාරිය වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම පවත්නා ක්‍රියාවලියේ අනිශ්චිතභාවය තුල කෙදිනකදී පනත් කෙටුම්පතට කැබිනෙට් අනුමැතිය ලැබී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද යන්න සම්බන්ධව පොදු අධිකාරියට නිශ්චිතවම ප්‍රකාශ කිරීමට නොහැකි බව උඩවත්ත මහතා දන්වන ලදී.

මෙම තොරතුරු ඉල්ලීම පොදු මහජන සුභසිද්ධිය උදෙසා මහත්සේ බලපාන අතර කෙටුම්පතේ අන්තර්ගතය විශේෂයෙන් ගත් කළ අබාධිත පාර්ශවයන්ට ප්‍රයෝජනවත් බව අභියාචක ප්‍රකාශ කරන ලදී.

## නියෝගය:

අදාළ පාලක සභාව තොරතුරු ඉල්ලීමෙන් විමසා ඇති නීති කෙටුම්පත සළකා නොතිබීම 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 වන වගන්තිය යටතේ දක්වා ඇති තොරතුරු වලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා වලට අයත් නොවේ. එමෙන්ම 43 වගන්තිය යටතේ දක්වා ඇති 'තොරතුරු' අර්ථනිරූපණය යටතේ 'නීති කෙටුම්පත්' යන්නද එහි විෂයසීමාව යටතේ විශේෂයෙන්ම දක්වා ඇති බවද සඳහන් කිරීම සුදුසුය. දකුණු ආසියාවේ මෙන්ම ලෝකයේ බොහෝ රටවල් වල නීති කෙටුම්පත් ගැසට් කිරීමට ප්‍රථමව මහජනයාට ඉදිරිපත් කළ යුතුව ඇත්තේ කෙටුම්පතෙහි අන්තර්ගතය පිළිබඳව මහජන ප්‍රතිචාර ලබා ගැනීම මාර්ගයෙන් අදාළ කෙටුම්පත සකස් කිරීම සම්බන්ධයෙන් ජන සම්මතියකට එළඹගැනීම උදෙසා එය ඵලදායී ක්‍රියාමාර්ගයක් ලෙස සැළකෙන බැවිනි.

ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ නීති කෙටුම්පත ඉදිරියේදී සංශෝධනයන්හට යටත් වීමට ඉඩ ප්‍රස්තාව තිබුනද, එහි දැනට පවත්නා

කෙටුම්පතෙහි පිටපතක් අභියාචකහට ලබාදීමට පොදු අධිකාරිය බැඳී සිටින අතර අදාළ කෙටුම්පත ගැසට් කරනතෙක් සිටීමට අවශ්‍යතාවයක් නොමැත.

ඒඅනුව, ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ නීති කෙටුම්පතෙහි පිටපතක් අභියාචක සහ පොදු අධිකාරියෙහි නියෝජිත එකඟ වූ පරිදි සිංහල, දමිළ සහ ඉංග්‍රීසි යන ත්‍රිවිධ භාෂාවෙන්ම අභියාචක වෙත 16.03.2018 වන දිනට ප්‍රථමව ලබාදීමට පොදු අධිකාරියට නියෝග කර සිටී.

අභියාචනය මෙසේ අවසන් කරන ලදී.





## ජී. දිලීප් අමුදන් එ. ආරක්ෂක අමාත්‍යාංශය

RTC Appeal (පෞද්ගලික විභාග කිරීම) / 70/ 2018 (23.03.2018 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස කරන ලද නියෝගය)

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය

**සභාපති** : මහින්ද ගම්මන්පිල

**කොමිෂන් සභා සාමාජිකයින්** : ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ-ජයවර්ධන

: ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා

: ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්

: විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල්** : පියතිස්ස රණසිංහ

**අභියාචක** : ජී. දිලීප් අමුදන්

**නොතිසි ලත් පාර්ශව** : නම්කළ නිලධාරී, ආරක්ෂක අමාත්‍යාංශය

පෙනී සිටීම

**අභියාචක** : ජී. දිලීප් අමුදන්

**පොදු අධිකාරිය** :උපාලි වීරසිංහ, නීති උපදේශක, ආරක්ෂක අමාත්‍යාංශය

:මේජර් ගුණවර්ධන, නීති උපදේශක, ආරක්ෂක අමාත්‍යාංශය

: ඒ. එම්. එස්. බී. අතපත්තු, තොරතුරු නිලධාරී, ශ්‍රී ලංකා යුධ හමුදාව

| | |
|---|---|
| **තොරතුරු ඉල්ලීම ගොනු කළ දිනය** | 2017.09.27 |
| **තොරතුරු නිලධාරී ප්‍රතිචාර දැක්වූ දිනය** | 2017.10.16 (ජාතික හැඳුනුම් පතෙහි පිටපතක් ඉල්ලා සිටිමින්) |
| **නම් කළ නිලධාරී වෙත පළමු අභියාචනය** | 2017.10.22 |
| **නම් කළ නිලධාරී ප්‍රතිචාර දැක්වූ දිනය** | 2017.11.23 |

| | |
|---|---|
| තොරතුරු කොමිෂන් සභාව වෙත අභියාචනය ගොනු කළ දිනය | 2017.12.04 |

**<u>අභියාචනයට පසුබිම් වූ කරුණු:</u>**

අභියාචක විසින් 2017.09.28 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත අයිතම තුනෙහි තොරතුරු ඉල්ලා සිටින ලදී:

I.

1. ශ්‍රී ලංකා යුධ හමුදාව සහ/හෝ ශ්‍රී ලංකා නාවික හමුදාව සහ/හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් හෝ ඒවාට වගකිව යුත්තන් විසින් හෝ ඔවුන් යටතේ, වෙනත් කරුණු අතර, මහජනතාව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන වෙළඳසැල්, ආපනශාලා, වෙළඳසල් සහ/හෝ භෝජනාගාරවල අංගසම්පූර්ණ ලැයිස්තුවක්
2. ඉහත 1 හි සඳහන් කරුණ හැරුණු විට, වෙනත් කරුණු අතර, ශ්‍රී ලංකා යුධ හමුදාව සහ/හෝ ශ්‍රී ලංකා නාවික හමුදාව සහ/හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මහජනතාව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන සහ/හෝ වගකිවයුතු සියලු ව්‍යාපාරවල අංගසම්පූර්ණ ලැයිස්තුවක්

II. 1.යුධ හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ රීති, කාර්යයපටිපාටි සහ/හෝ ප්‍රතිපත්ති;

2. පසුගිය වසර දහයට අදාළ (2006 සිට 2016) ශ්‍රී ලංකා යුධ හමුදාවේ සුභසාධක සංගම් අරමුදලට අදාළ, සමස්ත අදායම, සමස්ත වියදම සහ අනෙකුත් විස්තර දැක්වෙන, වාර්ෂික ගිණුම් වාර්තා;

3. පසුගිය වසර දහයට අදාළ (2006 සිට 2016) ශ්‍රී ලංකා යුධ හමුදාවේ සුභසාධක සංගම් අරමුදලට අදාළ විගණන කාර්යයපටිපාටි සහ සියලු අදාළ විගණන වාර්තා;

4. යුධ හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වාගෙන යන හෝ ඒ යටතේ පවතින හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගකිවයුතු, වෙනනත් කරුණු අතර, මහජනතාව සඳහා පවත්වාගෙන යනු ලබන වෙළඳසැල්, ආපනශාලා, වෙළඳසල් සහ/හෝ භෝජනාගාරවල විස්තරාත්මක ලැයිස්තුවක්

5. ඉහත 4 හි සඳහන් ඒවාට අමතරව, යුධ හමුදා සුභසාධක ඒකකයට වගකිවයුතු, මහජනතාවට සේවා සපයන සියලු ව්‍යාපාරික කටයුතු වල සංක්ෂිප්ත ලැයිස්තුවක්;

6. ඉහත 4 සහ 5 ප්‍රශ්න වලට අදාළ ආයතනයන්හි සේවයෙහි නිරත සහ/හෝ අනුයුක්ත මුළු යුධ හමුදා නිලධාරීන් සංඛ්‍යාව;





7. 2009 සිට 2016 දක්වා 'ලායා' හෝටල් සමූහය යටතේ වන වන 'ලයා බීච්', 'ලායා ලෙෂර්', 'ලායා සෆාරි' සහ 'ලායා වේව්ස්' ආදී හෝටල් වල වාර්ෂික විගණන වාර්තා;

8. 2010 සිට අද දක්වා තල් සෙවණ හෝටලයේ වාර්ෂික වාර්තා;

9. සුභසාධක ඒකකය මගින් පාලනය වන නීති ආධාර අරමුදලේ අර්ථලාභීන්ගේ සංක්ෂිප්ත ලැයිස්තුවක් සහ ඒ යටතේ කරන ලද ගෙවීම් පිළිබඳ සංක්ෂිප්ත ලැයිස්තුවක්;

III. හයිටි රාජ්‍යයේ සේවයේ යොදවා ඇති ශ්‍රී ලංකා සාම සාධක භටයන් විසින් 2007 වසරේදී කළ බව කියන ලිංගික අපයෝජන සම්බන්ධයෙන් අපරාධකරුවන් යැයි නැගෙන චෝදනා සම්බන්ධයෙන්:

1. 2007 වසරේදී එක්සත් ජාතීන්ගේ සාම සාධක කටයුතුවල නියැළී සිටියදී ලිංගික අපරාධවල නියැළුණු බවට චෝදනා ලබා නැවත සිය රට බලා එවූ සාමසාධක නිලධාරීන්ගේ නම්, ජ්‍යෙෂ්ඨ සහ උසස් නිලයන් දරණ නිලධාරීන් ද ඇතුළත්ව;

2. ශ්‍රී ලංකා සාම සාධක හමුදාව හයිටි රාජ්‍යය තුළ සිදුකළ ක්‍රියාකාරකම්වලට සහ ශ්‍රී ලංකා සාම සාධක හමුදාව හයිටි රාජ්‍යයේ සාම සාධක ක්‍රියාන්විතයන්හි යෙදී සිටියදී දිග හැරුණු ලිංගික අපයෝජන සිදුවීම්වලට අදාළ අධිකරණ පරීක්ෂණයේ සොයාගැනීම් හා විමර්ශන සටහන්;

3. හයිටි පුරවැසියන් විසින්, ශ්‍රී ලංකාවෙන් යොදවා තිබූ සාම සාධක භටයන්ට එරෙහිව නැගූ චෝදනාවල ලැයිස්තුවක්, ඔවුන් විසින් සිදුකළ අපරාධයන්ගේ ස්වභාවය, වින්දිතයන්ගේ නම් සහ එබඳු අපරාධ සහ/හෝ ශ්‍රී ලංකාවෙන් යැවූ සාම සාධක හමුදා භටයන්ට එරෙහිව නැගූ චෝදනාවලට අදාළ වෙනත් අදාළ තොරතුරු ;

4. පහත දැක්වෙන ද ඇතුළත්ව සොල්දාදුවන් 11 දෙනෙකුට, එක් ලුතිනන් කර්නල්වරයෙකුට සහ මේජර්වරුන් දෙදෙනෙකුට එරෙහිව ගනු ලැබූ විනය ක්‍රියාමාර්ගයේ සවිස්රාත්මක විස්තර:

- මෙම තැනැත්තන් සාමාන්‍ය හමුදා අධිකරණයකට හෝ වෙනත් ආකාරයක හමුදා අධිකරණ ක්‍රියාමාර්ගයක් සඳහා ඉදිරිපත් කළේද යන්න;
- සාමාන්‍ය හමුදා අධිකරණ සහ/හෝ වෙනත් හමුදා අධිකරණ ක්‍රියාමාර්ගයකදී කළ සොයාගැනීම්
- එම සාමාන්‍ය හමුදා අධිකරණ සහ/හෝ වෙනත් හමුදා අධිකරණයට සහභාගි වූ නිලධාරීන්ගේ නම් සහ ඔවුන්ගේ නිලයන්;

- සාමාන්‍ය හමුදා අධිකරණමය සහ/හෝ වෙනත් හමුදා අධිකරණ ක්‍රියාවලිය විසින් විභාගයට ගනු ලැබූ චෝදනා සහ/හෝ අපරාධ ලැයිස්තුව;
- හයිටි හි දී සිදුකළේ යැයි චෝදනා ලද අපරාධවලට සහභාගි වූ/සම්බන්ධ වූ තැනැත්තන්ට එරෙහිව ගනු ලැබූ විනය ක්‍රියාමාර්ගය (වෙනත් කරුණු අතර අවවාද කිරීම්, සේවය අත්හිටුවීම්, සේවයෙන් නෙරපීම් ඇතුළත්ව);
- සාම සාධක බල ඇණියේ අණ දෙන නිලධාරියා ට එරෙහිව ගනු ලැබූ විනය සහ/හෝ දණ්ඩන ක්‍රියාමාර්ග
- හයිටි හිදී අපරාධ සිදුකරනු ලැබූ බවට සනාථ වූ වරදකරුවන් හට එරෙහිව නඩු පැවරීම සම්බන්ධ තොරතුරු, ශ්‍රී ලංකාවේ අධිකරණ ඉදිරියේ එබඳු අපරාධ ක්‍රියාවන් සම්බන්ධයෙන් පවතින නඩුවල අංක ද සමග;

2017.10.16 දින සිය ජාතික හැඳුනුම්පතෙහි ග්‍රාම සේවක සහ දිසා ලේකම් විසින් සහතික කළ පිටපතක් ඉල්ලා සිටිමින් ඔහුට තොරතුරු ඉල්ලීම සඳහා ප්‍රතිචාර ලැබිණි. මෙම ඉල්ලීම ශ්‍රී ලංකා යුධ හමුදාව වෙනුවෙන් කරනු ලබන්නක් බව ද ඔහුට දැනුම් දෙනු ලැබිණි. අභියාචක සඳහන් කළේ තොරතුරු ඉල්ලීමෙහි ඔහු ඒ වන විටත් සිය ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කර ඇති බව සහ, එකී ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපතක් ඉල්ලා සිටීම, තොරතුරු ලබාදීම ප්‍රමාද කිරීමේ උපක්‍රමයක් හෝ බිය ගැන්වීමේ ක්‍රමයක් ලෙස පෙනී ගිය බව ය. ඒ අනුව 2017.10.22 දින ඔහු නම් කළ නිලධාරියා වෙත අභියාචනය කළේය. නම් කළ නිලධාරියා එයට ප්‍රතිචාර දැක්වූයේ, අයදුම්කරුගේ පුරවැසිභාවය තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් අවශ්‍ය බව සඳහන් කරමිනි. එම ප්‍රතිචාරය, ආරක්ෂක අමාත්‍යාංශයේ ලිපි ශීර්ෂයක අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු සහ ප්‍රතිපත්ති) විසින් යවන ලද්දකි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක, 2017.04.12 දින කොමිෂන් සභාව වෙත අභියාචනය කර සිටියේය.

## අභියාචනය විභාගයේදී උද්ගත වූ කරුණු

ආරක්ෂක අමාත්‍යාංශයේ නීති නිලධාරී වීරසිංහ මහතා තහවුරු කළේ තොරතුරු ඉල්ලීම ලැබුණු විගස අභියාචකගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් පොදු අධිකාරිය විසින් ඉල්ලා සිටි බවයි. කොමිෂන් සභාව පොදු අධිකාරිය වෙත දැනුම් දුන්නේ අභියාචකයෙකු RTI 01පෝර්මය (තොරතුරු ඉල්ලීමේ අයදුම්පත) ගොනු කරන විට ඔහු/ඇය පුරවැසියෙකුදැයි සඳහන් කරන ලෙස පමණක් ඉල්ලා සිටින බවයි. අභියාචකගේ පුරවැසිභාවය පිළිබඳ සැකකිරීමට විෂය මූලික පදනමක් තිබෙන්නේ නම් පමණක් පොදු අධිකාරියට තවදුරටත් ඔහුව ප්‍රශ්න කළ හැකිය. කොමිෂන් සභාව ප්‍රශ්න කර සිටියේ, විශේෂයෙන්ම අයදුම්කරු විසින් ඔහුගේ මුල් තොරතුරු අයදුම්පතේ සිය ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කර තිබියදී





අභියාචකගේ පුරවැසිභාවය සම්බන්ධයෙන් පොදු අධිකාරියට ඇති වූ සැකය කුමක්ද යන්නයි. මෙම ප්‍රශ්නයට පොදු අධිකාරිය විසින් පිළිතුරු ලබාදුන්නේ, එකී ප්‍රශ්නය මීට පෙර සිටි තොරතුරු නිලධාරියා විසින් නගනු ලද්දක් බව ය. තවද, අභියාචකයන්ගෙන් දිගින් දිගටම හැඳුනුම්පත ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටීම අනාගතයේදී පුරුද්දක් වශයෙන් නොකරන බවට ද ඔහු සහතික විය.

I සහ II අයිතමයන් මගින් ඉල්ලා සිටින තොරතුරුවල හරය සම්බන්ධයෙන් පොදු අධිකාරියට කොමිෂන් සභාව විසින් දැනුම් දුන්නේ, අදාළ පාර්ශවයන්ගේ වාර්ෂික වාර්තාවන් හි එකී සවිස්තරාත්මක තොරතුරු තිබිය යුතු බව ය. එයට ප්‍රතිචාර දක්වමින්, තමන් විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට මේ පිළිබඳ දැනුම් දී ඇති බවත්, සිය භාරයේ ඇති ලේඛණ කවරේද ඒවා ලබාදීමේ ස්ථාවරයක එය සිටි බවත් පොදු අධිකාරිය කරුණු ගෙන හැර දක්වමින් කියා සිටියේය. III වන අයිතමයේ ඇති තොරතුරු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තොරතුරු නිලධාරියා සඳහන් කළේ මේවා ශ්‍රී ලංකාවෙන් ලබාදුන් සාම සාධක හමුදාවට එරෙහිව එල්ල වූ චෝදනා සම්බන්ධ යුධ හමුදාවේ අභ්‍යන්තර විනය කාර්යපටිපාටීන්ට සම්බන්ධ බවත්, මේ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් විසින් ජාත්‍යන්තරය හමුවේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එරෙහිව චෝදනා ගණනාවක් නගා ඇති බවත්, එසේ හෙයින් තොරතුරු ලබාදීමට තමන් මැලි වූ බවත් ය.

III වන අයිතමය මගින් ඉල්ලා සිටි තොරතුරු ලබා නොදී සිටීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් උපුටා දක්වන්නේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1) උප වගන්තියේ කිනම් නිශ්චිත ව්‍යාතිරේඛයදැයි කොමිෂන් සභාව විසින් අසනු ලදුව, තොරතුරු නිලධාරියා නැවත නැවතත් කියා සිටියේ එල්ල වූ චෝදනාවලට සම්බන්ධිත සිදුවීම් 2007 වසරේදී සිදුවූ බවත්, දැන් 2018 වසර බවත්, මේ නිසා මෙම ගැටළුව පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු නැවත ප්‍රකාශයට පත් කිරීම මගින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කීර්තිනාමය, ජාත්‍යන්තරය හමුවේ හානියට පත්වන බවත්, ඒවා මේ පිළිබඳ උනන්දු පාර්ශවයන් විසින් ප්‍රචාරණ අරමුණු භාවිතා කළ හැකි බවත් ය. ඔහු තවදුරටත් කරුණු කියා පෑවේ, දළ වශයෙන් සාම සාධඛ හටයන් 100 දෙනෙකුගෙන් සමන්විත සම්පූර්ණ සාම සාධක බලඇණියම වාගේ නැවත එවූ නමුත් සිදුවීම්වලට සම්බන්ධ වී සිටියේ 3 දෙනෙකු පමණක් බවත්, විධානාත්මක වගකීමේ රීති උල්ලංඝනය කිරීම හේතුවෙන් එක් නිලධාරියෙකු නැවත කැඳවූ බවත්, මේ අනුව ආපසු එවූ අයගේ සංඛ්‍යාව චෝදනා ලත් සංඛ්‍යාවට අවශ්‍යයෙන්ම අනුරූප නොවන බවත් ය. ඔහු තවදුරටත් කියා සිටියේ මෙකී චෝදනා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගයන් මේ වනවිටත් ප්‍රසිද්ධ අවකාශයේ පවතින බවත් ය.

තොරතුරු නිලධාරියා තවදුරටත් කියා සිටියේ, සිද්ධි පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු පරීක්ෂණ අධිකරණය සතුව තිබූ නමුත්, පරීක්ෂණඅධිකරණය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු හෙළිකිරීම මගින් තොරතුරු පනතේ 5(1)(අ) වගන්තිය මගින් දක්වන පුද්ගලිකත්වය උල්ලංඝණය වීමක් සිදුවිය හැකි බවත්, තවද එමගින් රටේ ප්‍රතිරූපයට බලපෑමක් විය හැකි බවත් ය. පරීක්ෂණ අධිකරණයක් විසින්

සිදුකළ සොයාගැනීම් ප්‍රසිද්ධ නොකළ යුතුය යන්නෙහි ඇති යෝග්‍යතාවය පිළිබඳ කොමිෂන් සභාව විසින් තවදුරටත් ප්‍රශ්න කිරීමේදී ඔහු කියා සිටියේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට කොමිෂන් සභාවේ නියමයන්ට යටත්ව එහි සාරාංශයක් ලබාදිය හැකි බව ය.

**නියෝගය**

2017.02.03 දින පළ කළ අංක 2004/66 දරණ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කළ රීති ප්‍රකාරව RTI 01 පෝර්මය මගින් අභියාචකගෙන් ඉල්ලා සිටිනුයේ ඔහු/ඇය පුරවැසියෙකුද නැත්ද යන්න සඳහන් කිරීම පමණක් බව නැවත නැවතත් අවධාරණය කළ යුතුය. අභියාචක පුරවැසියෙකු නොවන්නේ යැයි විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුවක් නොමැතිව පොදු අධිකාරියට ඒ බව දිගින් දිගටම ප්‍රශ්න කළ නොහැක. තවද, පුරවැසිභාවය තහවුරු කිරීමේ සාක්ෂි ඉල්ලා සිටීම කළ හැක්කේ විෂයමූලික (වාස්තවික) පසුබිම් යටතේ පමණි. උදාහරණ වශයෙන් විදේශයක සිට තොරතුරු ඉල්ලීමක් සිදුකිරීම, තොරතුරු ඉල්ලා සිටින්නාගේ පුරවැසිභාවය පිළිබඳ සැක කිරීමට හේතුවක් විය හැකිය.

මෙම කොමිෂන් සභාව විසින් *ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් එ. අග්‍රාමාත්‍ය කාර්යාලය/ජනාධිපති ලේකම් කාර්යාලය* (RTICඅභියාචන/05/2017 සහ RTICඅභියාචන/06/201, 23.02.2018 RTIC වාර්තා) හිදී කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කළ පරිදි තොරතුරු ඉල්ලන්නාගෙන් පුරවැසිභාවය පිළිබඳ සාක්ෂි ඉල්ලා සිටිය හැක්කේ ‘අතිශය දුර්ලභ අවස්ථාවලදී පමණක් (ශ්‍රී කේ. බාලක්‍රිෂ්ණා පිල්ලයි එ. ජාතික මානව හිමිකම් කොමිසම (අංක; CIC/OK/C/2008/00016, ඉන්දියාවේ මධ්‍යම තොරතුරු කොමිෂන් සභා වාර්තා, 2008 මැයි 26) වන අතර, තොරතුරු ඉල්ලා සිටින්නා පුරවැසියෙකුදැයි පොදු අධිකාරියේ පාර්ශවයෙන් සද්භාවී සැකයක් ඇතිවන අවස්ථාවලදී පමණි.

මෙම ගැටළුවේදී අභියාචක විසින් සිය තොරතුරු ඉල්ලීමෙහි දැනටමත් ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කර ඇත. මේ අනුව හැඳුනුම්පතෙහි සහ/හෝ විදෙස් ගමන් බලපත්‍රයේ පිටපත් ඉල්ලා සිටීම පොදු අධිකාරියට යෝග්‍ය නොවේ. තොරතුරු ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ හැක්කේ පනතේ 5(1) වගන්තියෙහි දක්වා ඇති ව්‍යාතිරේඛ අතරින් එකක් දැක්වීමෙන් පමණක් බවත්, චක්‍රාකාර ක්‍රමවලින් එය අවහිර කළ නොහැකි බවත් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත තුළ ඉතා පැහැදිලි ය. මේ අනුව කොමිෂන් සභාව වාර්තාවලට ඇතුළත් කරමින් නිරීක්ෂණය කරන්නේ, මෙය පොදු අධිකාරිය සම්බන්ධයෙන් මේ වන විට නියත වශයෙන්ම පවතින පූර්ව කාර්යපටිපාටික ප්‍රතිපත්තියක් බව ය.

මෙම තොරතුරු ඉල්ලීමේදී ශ්‍රී ලංකා සාම සාධක හටයන්ට එරෙහිව චෝදනා එල්ල වී ඇති සහ, ඒ සම්බන්ධ පරීක්ෂණයක් අවසන් කර ඇති අවස්ථාවක එම පරීක්ෂණයේ සවිස්තරාත්මක තොරතුරු මහජනයා වෙතත





ලබාදිය නොහැකි ය යන තර්කය පොදු අධිකාරියට (ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට) උත්තම්භනය කිරීම දුෂ්කර ය. එසේ කිරීමට නම් පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුද්ධ හමුදාව) තමන්ට විශේෂිත වූ වරප්‍රසාදයක් කියා පෑ යුතුය. මෙවැනි වරප්‍රසාද තොරතුරු පනත මගින් සපයනු ලබන්නේ නැත.

තවද, මෙවැනි ගැටළුවලදී මහජන අර්ථසිද්ධිය (පොදු යහපත) තක්සේරු කිරීමේදී පරීක්ෂණ කාර්යපටිපාටියක් තිබිණි නම්, චෝදනා සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග සංස්ථාපනය කිරීම පොදු අධිකාරිය (ශ්‍රී.යු.හ.)ට ද ප්‍රතිලාභ ගෙන දෙනු ඇත. මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා එකී පරීක්ෂණ අධිකරණයේ සොයාගැනීම් පිළිබඳ සම්පූර්ණ සාරාංශයක් පිළියෙළ කරන ලෙසට කොමිෂන් සභාව විසින් පොදු අධිකාරියට නියම කරනු ලබයි. එය පරීක්ෂාවෙන් කියවා, අරමුණ සාධනය කරනු ලැබේ යැයි තක්සේරු කිරීම සඳහා, සාරාංශය විසින් ස්වාධීන වාර්තාවක අන්තර්ගතය නිවැරදිව පිළිබිඹු කරන්නේදැයි නිසැක වශයෙන් දැන ගැනීම පිණිස පරීක්ෂණ අධිකරණයේ වාර්තාව සපයන ලෙස නියම කිරීමට මෙම කොමිෂන් සභාවට හැකිය. එසේම, තොරතුරු ඉල්ලීමෙහි I අයිතමය මගින් ඉල්ලා ඇති තොරතුරු ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් කැඳවන ලෙසට ද පොදු අධිකාරියට නියම කෙරේ.

අභියාචනය කල් තබන ලදී.

මීළඟ විභාග දිනය: 2018/05/15

............................................................................................................................................

RTC Appeal (පෞද්ගලික විභාග කිරීම) / 70/ 2018 (15.05.2018 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස කරන ලද නියෝගය)

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය

| | |
|---|---|
| **සභාපති** | : මහින්ද ගම්මන්පිල |
| **කොමිෂන් සභා සාමාජිකයින්** | : ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ-ජයවර්ධන |
| | : ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| | : ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් |
| | : විනිසුරු රෝහිණී වල්ගම |

**අධ්‍යක්ෂ ජනරාල්** : පියතිස්ස රණසිංහ

**අභියාචක** : ජී. දිලීප් අමුදන්

**නොතිසි ලත් පාර්ශව** : නම්කළ නිලධාරී, ආරක්ෂක අමාත්‍යාංශය

පෙනී සිටීම/නියෝජනය:

**අභියාචක** : ජී. දිලීප් අමුදන්

**පොදු අධිකාරිය** :උපාලි වීරසිංහ, නීති උපදේශක, ආරක්ෂක අමාත්‍යාංශය

: ඒ. එම්. එස්. බී. අතපත්තු, තොරතුරු නිලධාරී, ශ්‍රී ලංකා යුධ හමුදාව

: කපිතාන් ඩබ්.එච්.එස්. සොයිසා, විෂයභාර නිලධාරී, ශ්‍රී ලංකා යුධ හමුදාව

## අභියාචනය විභාගයේදී උද්ගත වූ කරුණු:

ඉල්ලා සිටින තොරතුරු අයිතමයන් සවිස්තරාත්මක ව සලකා බැලීමේදී, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව II (1) අයිතමය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති මාර්ගෝපදේශන ප්‍රගාමී ලෙස අන්තර්ජාලයේ පළ කළ යුතු බව පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුධ හමුදාව) වෙත කොමිෂන් සභාව විසින් දැනුම් දී ඇත. ශ්‍රී ලංකා යුධ හමුදාව, සිය වෙබ් අඩවියේ යම් ප්‍රතිපත්ති ප්‍රකාශන කිහිපයක් පළකර ඇති බව (http://www.army.lk/welfare/) ට කරුණු පැහැදිලි කර දුන්නේය.

II (2) අයිතමය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුද හමුදාව වෙත කොමිෂන් සභාව විසින් දැනුම් දුන්නේ, මේවා මහජනයා හට නිදහසේ ලබාගත හැකි ප්‍රසිද්ධ ලේඛන වන බව ය. තොරතුරු ඉල්ලීම තුළ සවිස්තරාත්මක තොරතුරු ලබාදීම පිළිබඳ අවබෝධය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ කාරණය වූයේ එම සවිස්තරාත්මක තොරතුරු විදේශයන් හි සිටින ඇතැම් උනන්දුසහගත පාර්ශවයන් විසින් ඍණාත්මක අරමුණු සඳහා පාවිච්චි කළ හැකි බව වූ අතර, ශ්‍රී ලංකා යුධ හමුදාව එකී ලේඛන කොමිෂන් සභාව වෙත පරීක්ෂා කර බැලීම සඳහා ලගබාදීමට එකඟ විය. ඉන්පසු එකී ලේඛන අභියාචක වෙත සැපයිය යුතුදැයි කොමිෂන් සභාවට තීරණය කළ හැකිය.

II (8) අයිතමය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුධ හමුදාව කරුණු කියා සිටියේ 'තල්සෙවණ' 2011 වසර වන තෙක් ව්‍යාපාරික කටයුත්තක් වශයෙන් පවත්වා නොගත් බව සහ, ඒ අනුව ඊට පෙර වියදම් විගණනය කර නොමැති බව ය. නමුත් 2011 වසරේ පටන් ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් එය හෝටලයක් වශයෙන්





පවත්වාගෙන යනු ලබයි. 2011 වසරේ සිට ඉදිරියට වන විගණන වාර්තා කොමිෂන් නභාව වෙත ඉදිරිපත් කරන බව ද ශ්‍රී ලංකා යුධ හමුදාව කියා සිටියේය. II (7) අයිතමය සම්බන්ධයෙන් ද එසේම කටයුතු කිරීමට ශ්‍රී.යු.හ. එකඟ විය. II (4) අයිතමය සම්බන්ධයෙන් ශ්‍රී.යු.හ. කියා සිටියේ සෑම කඳවුරකම පාහේ තමන්ට භෝජනාගාර/ආපනශාලා තිබෙන බව සහ, මහජනයාට ද ඒවා භාවිතා කිරීමට අවසර ඇති බවත්, ඒ අනුව සැලකිය යුතු තොරතුරු ප්‍රමාණයක් මේ සම්බන්ධව අදාළ වන බවත් ය. ඒ අනුව හමුදාව විසින් අභ්‍යන්තරිකව පවත්වාගෙන යනු ලබන සහ, මහජනයාට ද පරිහරණය කිරීමට අවසර ඇති හා පැහැදිලිවම මහජනයා වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන වශයෙන් අවශ්‍ය වුවහොත් කොටස් දෙකකට බෙදා එකී වැඩිදුර තොරතුරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට ශ්‍රී.යු.හ. එකඟ විය. II (5) සහ (6) අයිතමයන් සම්බන්ධයෙන් ද එසේම කටයුතු කිරීමට ශ්‍රී.යු.හ. එකඟ විය. ශ්‍රී ලංකා යුද හමුදාව තවදුරටත් එකඟතාවය පළ කළේ II (9) අයිතමය මගින් ඉල්ලා සිටින තොරතුරු ද කොමිෂන් සභාවේ පරීක්ෂාකාරී කියවීම සහ අනතුරුව ඒ පිළිබඳ තීරණයක් ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන්නට ය.

I වන අයිතමය සම්බන්ධයෙන්, එනම්, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවසායන් පිළිබඳ තොරතුරු ඉල්ලා සිටීම සම්බන්ධයෙන් පොදු අධිකාරිය කරුණු පැහැදිලි කර දුන්නේ එකී විස්තර නාවික හමුදාවෙන් සහ ගුවන් හමුදාවෙන් තමන් විසින් ඉල්ලා තිබනෙ බව සහ, දෙපාර්ශවයම එම තොරතුරු ලබාදීමට එකඟ වී ඇති නමුත්, තොරතුරු එක්රැස් කිරීම සඳහා වැඩි කාලයක් ඉල්ලා ඇති බවත් ය.

III වන අයිතමය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුධ හමුදාව කරුණු කියා පෑවේ තමන් ඒ පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන ඇති බවයි. එහිදී ඉල්ලා සිටි තොරතුරු සම්බන්ධයෙන් තොරතුරු පනතේ 5 (1) (b) (ii) ව්‍යාතිරේඛය අදාළ වන බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති බවයි.

එසේම ශ්‍රී ලංකා යුධ හමුදාව තවදුරටත් කියා සිටියේ කොමිෂන් සභාව විසින් අවසන් විභාග වාරයේදී නියම කළ පරිදි පරීක්ෂණ අධිකරණයේ සොයාගැනීම්වල සාරාංශයක් තමන් විසින් මේ වන විටත් පිළියෙළ කර ඇති නමුත්, නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලැබුණු උපදෙස් ප්‍රකාරව මෙම විභාග කිරීමේදී එකී තොරතුරු ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටීමට තමන් වෙත බල කෙරෙන බවයි.

## නියෝගය

අප ඉදිරියේ එකඟ වූ පරිදි, I සහ II අයිතමයන්ට අදාළ, ප්‍රසිද්ධ සහ කිසිදු ව්‍යාතිරේකයකට අයත් නොවන ලේඛන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුධ හමුදාව) ට නියම කර තිබේ. අදාළ අවස්ථාවන්හිදී හමුදාවේ කළමනාකරණය යටතේ පවතින අදාළ සත්කාරක ව්‍යාපාරයන්ට අදාළ තොරතුරු ඒවා පොදු/ව්‍යාපාරික ස්ථානයන් බවට පරිවර්තනය වූ දිනයේ පටන් ලබාදීමට යුධ හමුදාවට පුළුවන.

II (4) අයිතමයට අදාළව ඉල්ලා සිටින තොරතුරු සම්බන්ධයෙන් අවශ්‍ය නම්, අභ්‍යන්තරික වශයෙන් හමුදාව විසින් පවත්වාගෙන යනු ලබන, එහෙත් මහජනයාට ද භාවිතා කිරීමට අවසර ඇති සහ, පැහැදිලි ලෙසම මහජනයා වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන වශයෙන් දෙකකට බෙදා තොරතුරු ලබාදීමට පොදු අධිකාරියට (ශ්‍රී ලංකා යුධ හමුදාවට) පුළුවන. II (9) තොරතුරු අයිතමය සම්බන්ධයෙන් අපගේ පරීක්ෂාකාරී කියවීම සඳහා එම තොරතුරු ඉදිරිපත්කරන ලෙසට මෙයින් නියම කරන අතර, ඉන්පසු ඒවා මහජනයා වෙත මුදා හැරීම සම්බන්ධයෙන් තීරණයක් ගනු ඇත.

III වන අයිතමය සහ, පොදු අධිකාරිය (ශ්‍රී.යු.හ.) විසින් අයැද සිටින 5 (1) (b) (ii) ව්‍යාතිරේකය සම්බන්ධයෙන් (නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් උපදෙස් ප්‍රකාරව) තොරතුරු ප්‍රතික්ෂේප කිරීම ඌනනය කළ හැක්කේ පහත තත්වයේදී බවට එකී වගන්තියේ දැක්වෙන කරුණු වෙත පොදු අධිකාරියේ අවධානය යොමු කරවනු ලැබේ. එනම්,

‘‘එම තොරතුරු යම් රජයක් විසින් හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තර්ජාතික ගිවිසුම් හෝ බැඳීම් විසින් **රහසිගතව ලබාදුන් හෝ රහසිගතව ලබාගත් අවස්ථාවක,** එම තොරතුරු හෙළිදරව් කිරීම එම රජය හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තර්ජාතික ගිවිසුම් හෝ බැඳීම් සමග ශ්‍රී ලංකාවේ ඇති සබඳතාවලට අගතිගාමී වන හෝ අගතිගාමී විය හැකි අවස්ථාවක..‘‘ (අවධාරණය අපගේ ය)

අන්තර්ජාතික එකඟතාවයක් මත තොරතුරු ප්‍රතික්ෂේප කළ යුතු බවට විශ්වාස කිරීම දැඩි සේම අදාළ වන්නේ, ඉල්ලා සිටින තොරතුරු ලබාදී තිබෙන්නේ හෝ ලබාගෙන තිබෙන්නේ රහසිගතව සහ, එකී තොරතුරු හෙළිදරව් කිරීම ‘*යම් රාජ්‍යයක්, හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තර්ජාතික ගිවිසුම් හෝ බැඳීම් සමග ලංකාවේ ඇති සබඳතාවලට බරපතළ අගතියක් සිදුකරන්නේ නම් හෝ සිදුකළ හැක්කේ නම්*‘ යන අවස්ථාවන්ට පමණක් බව නිරීක්ෂණය කිරීම වැදගත් ය. මේ අනුව ඕනෑම අන්තර්ජාතික එකඟතාවයකට අදාළව නොපැහැදිලි හෝ සාමාන්‍යකරණය වූ ස්වභාවයකින් මෙම ව්‍යාතිරේකය අදාළ කර ගත නොහැකි බව ප්‍රත්‍යක්ෂ ය.

මෙහිදී ගැටළුවට අදාළ වන්නේ කුමන අන්තර්ජාතික එකඟතා හෝ බැඳීම්දැයි මුලින් පැහැදිලි කරගන්නා ලෙසට පොදු අධිකාරිය වෙත මාර්ගෝපදේශනය කරනු ලැබේ. දෙවැනුව, ඒ අනුව බරපතළ අගතියක්





සිදුවිය හැකි සුවිශේෂී තත්වයන් හඳුනාගන්නා ලෙසද, තෙවැනුව, රහසිගතව ලබාදුන් හෝ ලබාගත් තොරතුරු මොනවාද යන්න පැහැදිලි කරන ලෙසට ද උපදෙස් දෙනු ලැබේ. මෙය, මුල් අවස්ථාවේදී උපුටා දැක්වූ ව්‍යාතිරේකයේ යෙදීමේ නීත්‍යානුකූලභාවය මෙන්ම, පහත සඳහන් පරිදි පනතේ 5(4) වගන්තියේ සඳහන් වන පරිදි මහජන සුබ සිද්ධිය, එම තොරතුරු හෙළිදරව් කිරීම නිසා සිදුවන හානියට වඩා වැඩි ද යන්න කොමිෂන් සභාව විසින් තක්සේරු කිරීම සඳහා ය.

5(4) උප වගන්තිය මෙසේ සඳහන් කරයි; *ඉහත (1) උප වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, මහජන සුබසිද්ධිය එම තොරතුරු හෙළිදරව් කිරීමෙන් වන හානියට වඩා වැඩි නම්, එවැනි තොරතුරු සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප නොකළ යුතුය.*

එසේම මෙම කොමිෂන් සභාව විසින් තවදුරටත් සඳහන් කරන්නේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව මෙම කොමිෂන් සභාව වෙත පවරා ඇති ව්‍යවස්ථාපිත කාර්යය සහ කර්තව්‍යය ප්‍රකාරව එබඳු තක්සේරුවක් කිරීමට කොමිෂන් සභාවට සිය විෂය පථය තුළ බලය ලබා දී ඇති බවත්, එසේ කිරීමට අසමත්වීම මගින් පනතේ පූර්විකාව මගින් අවධාරණය කරන ‘තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය බලාත්මක කිරීම මගින් පොදු අධිකාරිවල විනිවිදභාවය සහ වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීම‘ සඳහා වූ ව්‍යවස්ථාපිත යුතුකම සහ කාර්යය උල්ලංඝනය කිරීමක් සිදුවන බව ය.

ශ්‍රී ලංකා යුධ හමුදාවට සිය කැමැත්ත පරිදි ඉහත සුවිශේෂී ගැටළු ආමන්ත්‍රණය කරන ලිඛිත කරුණු කියාපෑම් (අභියාචක හට පිටපත් සහිතව) 2018 ජූනි 26 දින හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කළ හැකිය.

මීළඟ අභියාචන විභාග දිනයේදී ඉහත කී පරිදි I සහ II අයිතමයන් සම්බන්ධයෙන් ලබාදීමට එකඟ වූ තොරතුරු සපයන ලෙසට පොදු අධිකාරිය (ආරක්ෂක අමාත්‍යාංශය) වෙත උපදෙස් සපයනු ලැබේ.

අභියාචනය කල් තබන ලදී.

මීළඟ අභියාචන දිනය : 2018/07/03

........................................................................................................................................

RTC Appeal (පෞද්ගලික විභාග කිරීම) / 70/ 2018 (2018.07.03 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස කරන ලද නියෝගය)

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ශාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය

| | |
|---|---|
| **සභාපති** | : මහින්ද ගම්මන්පිල |
| **කොමිෂන් සභා සාමාජිකයින්** | : ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ-ජයවර්ධන |
| | : ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| | : ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් |
| | : විනිසුරු රෝහිණී වල්ගම |
| **අධ්‍යක්ෂ ජනරාල්** | : පියතිස්ස රණසිංහ |
| **අභියාචක** | : ජී. දිලීප් අමුදන් |
| **නොතිසි ලත් පාර්ශව** | : නම්කළ නිලධාරී, ආරක්ෂක අමාත්‍යාංශය |

පෙනී සිටීම/නියෝජනය:

| | |
|---|---|
| **අභියාචක** | : ජී. දිලීප් අමුදන් |
| **පොදු අධිකාරිය** | : ඒ. ජයසේකර, නීති නිලධාරී, ආරක්ෂක අමාත්‍යාංශය |
| | : බ්‍රිගේඩියර් ඊ.එස්. ජයසිංහ, නීති අංශය, ශ්‍රී ලංකා යුධ හමුදාව |
| | :කර්නල් ඩබ්.ඒ.සී.එන්. වරකාගොඩ, කර්නල් - මාධ්‍ය, ශ්‍රී.ල. යුධ හමුදාව |
| | : ඒ.එම්.එස්.බී.අතපත්තු, තොරතුරු නිලධාරී, ශ්‍රී ලංකා යුධ හමුදාව |

## අභියාචනය විභාගයේදී උද්ගත වූ කරුණු:

මෙම අභියාචනයේ අවසන් විභාග දිනයේදී (2018.05.15 දිනැති නියෝගය) පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුධ හමුදාව) විසින් ලබාදීමට එකඟ වූ (I) සහ (II) අයිතමවලින් ඉල්ලා සිටි, උතුරු පළාතේ පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුධ හමුදාව) විසින් පවත්වාගෙන යනු ලබන හෝටල්, වෙළඳසැල්, ආපනශාලා, වෙළඳසල් සහ හෝ භෝජනාගාරවල ලැයිස්තු සහ ලායා හෝටල් දාමය යටතේ ඇති එක් එක් හෝටලයක එනම්, ලායා බීච්, ලායා ලෙෂර්, ලායා සෆාරි සහ ලායා වේව්ස් හෝටල්වල 2009 සිට 2016 දක්වා විගණනය කළ ගිණුම් ප්‍රකාශ ඇතුළත් තොරතුරු අභියාචක වෙත ලබාදීමේ තත්වය සම්බන්ධයෙන් විමසීමේදී පොදු අධිකාරිය (ශ්‍රී





ලංකා යුධ හමුදාව) පිළිතුරු වශයෙන් පැවසුවේ, ශ්‍රී ලාංකික ප්‍රජාව අතර සට්ටනයක් ඇති කිරීමට සහ ඩයස්පෝරා කණ්ඩායම් විසින් සෘණාත්මක වාසි ලබාගැනීම සඳහා ඒවා භාවිතා කළ හැකි හෙයින් අදාළ තොරතුරු සැපයීමට තමන් මැලි වූ බවයි.

පොදු අධිකාරිය තවදුරටත් කියා සිටියේ තොරතුරු ඉල්ලීමට අදාළ වන හෝටල්, වෙළඳසැල්, වෙළඳසැල්, ආපනශාලා සහ/හෝ භෝජනාගාර සත්කාරක ව්‍යාපාරයන්ට අරමුදල් සැපයෙන්නේ ශ්‍රී ලංකා යුධ හමුදාවේ සුබසාධක අරමුදලෙන් මිස ආණ්ඩුවෙන්/පොදු අරමුදල්වලින් නොවන බවයි. ශ්‍රී ලංකා යුධ හමුදාවේ සුබ සාධක අරමුදල විසින් නඩත්තු කරන හෝටල්/සත්කාරක ව්‍යාපාරයන් ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් සිදුකරනු ලබන සාමාන්‍ය විගණනයට විෂය වන බව ද සඳහන් කෙරිණි.

එකී සත්කාරක ව්‍යාපාරයන් පවත්වාගෙන යනු ලබන්නේ රජයේ අරමුදල්වලින් නඩත්තු වන පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුධ හමුදාව) හි සාමාජිකයන් විසින් බවත්, සුවිශේෂී කාරණයක් අරමුණු කරගෙන මිස සාමාන්‍ය වශයෙන් එකී කරුණ කියාපෑම කළ නොහැකි බව මෙහිදී කොමිෂන් සභාව අවධාරණය කළේය.

පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුධ හමුදාව) කියාසිටියේ, අභියාචක පිළිබඳ යුධ හමුදා බුද්ධි අංශ වාර්තාවක් සන්තකයේ ඇති බවත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් තමන් එම තොරතුරු මුදා හැරීමට මැලි වන බවත් ය.

එයට පිළිතුරු දෙමින් අභියාචක සඳහන් කළේ පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුධ හමුදාව) විසින්, තමන් හුදෙක් තොරතුරු පනත යටතේ සහ තොරතුරු පනත ප්‍රකාරව තොරතුරු අයදුම්පත් ඉදිරිපත් කළ හෙයින්ම, තමන් පිළිබඳ පසුබිම් විපරමක් සිදුකර ඇති බවත්, එනයින් තොරතුරු පනතේ අරමුණ පරාජය වන බවත් ය. පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුධ හමුදාව) එයට ප්‍රතිචාර ලෙස කියා සිටියේ අභියාචක තොරතුරු පනත භාවිතා කරන්නට පෙර පටන්ම එම වාර්තාව බුද්ධි අංශය සන්තකයේ පැවති බවයි.

අභියාචකයෙකුගේ පසුබිම හෝ තොරතුරු ඉල්ලීමක අරමුණ, පනත යටතේ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් නොවන බවට මෙවිට කොමිෂන් සභාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවධානයට යොමු කළේය. ශ්‍රී ලංකා යුධ හමුදාව කියා සිටියේ අභියාචක මාධ්‍යවේදියෙකු වන හෙයින්, ඔහු විසින් මෙම තොරතුරු, ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් මෙබඳු ව්‍යාපාරික ස්ථාන පවත්වාගෙන යන බව පෙන්වමින් යුධ හමුදාව පිළිබඳ සෘණාත්මක ප්‍රතිරූපයක් මවා පෑම සඳහා භාවිතා කළ හැකි හෙයින්, තමන් විසින් 5 (b) (i) උප වගන්තිය හෙවත්, ''එබඳු තොරතුරක් හෙළිදරව් කිරීම රාජ්‍ය ආරක්ෂාවට, හෝ එහි භෞමික අඛණ්ඩතාවයට හෝ ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැක' යන ව්‍යාතිරේඛය මත තමන් රැඳී සිටි බවයි. එසේම එයින් නියත වශයෙන්ම  තොරතුරු පනත මගින් දක්වන පරිදි 'රාජ්‍යයේ ආරක්ෂාව'ට සහ/හෝ 'ජාතික ආරක්ෂාව'ට බලපෑමක් විය හැකි වන පරිදි අවසානයේ උතුරු සහ නැගෙනහිර පළාතේ ව්‍යාපාරික ප්‍රජාව සහ ශ්‍රී ලංකා යුධ හමුදාව අතර, අනවශ්‍ය ගැටුමක් ඇතිවිය හැකි බවත් කියා සිටියේය.

ශ්‍රී ලංකා යුධ හමුදාවේ ඉහත කරුණු කියා පෑමට අදාළව කොමිෂන් සභාව අනතුරුව පොදු අධිකාරිය (ආරක්ෂක අමාත්‍යාංශය) ප්‍රශ්න කළේ, මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ ස්ථාවරය දැන ගැනීම පිණිස ය. පොදු අධිකාරිය (ආරක්ෂක අමාත්‍යාංශය) කියා සිටියේ I වන අයිතමය හෙවත් ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ගුවන් හමුදාව විසින් පවත්වාගෙන යනු ලබන සත්කාරක ව්‍යාපාර/ස්ථානයන් පිළිබඳ අංග සම්පූර්ණ ලැයිස්තුවට අදාළ තොරතුරු 2018.06.05 සහ 2018.06.14 දිනැති ලිපි මගින් පිළිවෙළින් නිකුත් කර ඇති බවයි.

ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා යුධ හමුදාව, තමන් විසින් පවත්වාගෙන යනු ලබන සත්කාරක/ව්‍යාපාරික ස්ථාන පිළිබඳ ලැයිස්තු නිකුත් කර තිබීම කරණකොටගෙන, ශ්‍රී ලංකා යුධ හමුදාව ද එය නිකුත් කිරීමට එකඟ විය.

III වන අයිතමය සම්බන්ධයෙන් 2018.05.15 දින පැවසූ පරිදි තොරතුරු පනතේ 5 (1) (b) (ii) උප වගන්තිය ප්‍රකාරව දැක්වෙන ව්‍යාතිරේකය (2018.04.22 දිනැති නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් සහිත ලිපිය) අනුව ශ්‍රී ලංකා යුධ හමුදාව 2018.07.03 දිනැති ලිඛිත කරුණු කියාපෑම ඉදිරිපත් කළ අතර, හයිටි හි සාමසාධක මෙහෙයුම් අතරතුරදී බාලවයස්කාර දැරියන්ට අතවර කිරීමේ චෝදනාව පිළිබඳ විමර්ශන වාර්තාව ඉදිරිපත් කළේය.

2018.07.03 දිනැති ලිඛිත කරුණු කියාපෑමේ (ලිඛිත දේශනයේ) අන්තර්ගතය අවධාරණය කරමින් ශ්‍රී ලංකා යුධ හමුදාව පහත කරුණු කියා සිටියේය.

1. අභියාචක විසින් ශ්‍රී ලංකා යුධ හමුදාවට අයත් තැනැත්තන් හයිටි රාජ්‍යයේ ජගත් සංවිධාන සාම සාධක මෙහෙයුම්වල යෙදී සිටියදී හයිටි පුරවැසියන් ලිංගික අපයෝජනයට ලක් කිරීම පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලා තිබේ. ඉල්ලා ඇති තොරතුරුවලට පරීක්ෂණ අධිකරණයේ නඩුකාර්ය වාර්තා, සිවිල් වැසියන් විසින් හමුදා සාමාජිකයන්ට එරෙහිව සිදුකරනු ලැබූ චෝදනා, වින්දිතයන්ගේ නම්, ඔවුන්ට එරෙහිව පැවැත්වූ හමුදා අධිකරණය පිළිබඳ වැඩි විස්තර, චෝදනා, ලබාදුන් දඬුවම් හා සෙසු හමුදා විනය කාර්යපටිපාටීන් අයත් වේ.

2. යුධ හමුදා විනය රෙගුලාසි විසින් නියම කරනු ලබන අන්දමින් මෙකී හමුදා සාමාජිකයන්ට එරෙහිව නගන ලද සියලු චෝදනා නිසි පරිදි විමර්ශනය කර ඇති අතර, හමුදා පනතේ විධිවිධාන යටතේ හමුදා කාර්යපටිපාටියට අනුව දඬුවම් කර තිබේ.

3. ශ්‍රී ලංකා යුධ හමුදා භටයන්ගේ ලිංගික අපචාර සිදුවීම සම්බන්ධයෙන් 'හයිටි හි එක්සත් ජාතීන්ගේ සාමසාධක ක්ෂේත්‍ර මෙහෙයුම් අතරතුර බාලවයස්කාර දැරියන් අපයෝජනයට සහ ලිංගික සූරාකෑමට ලක්කිරීමේ චෝදනා පිළිබඳ විමර්ශන වාර්තාව' ('Investigation Report on Alleged Sexual Exploitation and Abuse of Minor Girls at the United Nations Stabilization Mission in Haiti') යන මැයෙන් එකී තොරතුරු 'අතිශයින්ම රහසිගතයි' යන ආරක්ෂක වර්ගීකරණය යටතේ ජගත් සංවිධානය විසින් ශ්‍රී





ලංකා යුධ හමුදාවට ඉදිරිපත් කර ඇති අතර, ශ්‍රී ලංකා යුධ හමුදාව එබඳු තොරතුරු තෙවන පාර්ශවයක් වෙත හෙළිදරව් කිරීමෙන් වැළකී සිටීමේ බැඳීමට යටත් වේ.

4. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 (1) (b) (ii) උප වගන්ති මගින් විධිවිධාන සලසා ඇති අන්දමට, 'එම තොරතුරු යම් රජයක් හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තර්ජාතික ගිවිසුම් හෝ බැඳීම් විසින් රහසිගතව ලබාදුන් හෝ රහසිගතව ලබාගත් අවස්ථාවක එම තොරතුරු හෙළිදරව් කිරීම එම රජය හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තර්ජාතික ගිවිසුම් හෝ බැඳීම් සමග ශ්‍රී ලංකාවේ ඇති සබඳතාවලට අගතිගාමී වන හෝ අගතිගාමී විය හැකි අවස්ථාවක' අදාළ පොදු අධිකාරිය විසින් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ යුත්තේය.

5. මෙම තොරතුර තෙවන පාර්ශවයක් වෙත හෙළිදරව් කරන ලද්දේ නම්, ශ්‍රී ලංකා යුධ හමුදාවේ ප්‍රතිරූපයට එයින් හානි විය හැකි අතර, අවසානයේ ශ්‍රී ලංකාව සහ මිත්‍ර රාජ්‍යයන් අතර පවතින සබඳතාවලට බරපතළ ලෙස එයින් හානියක් විය හැකි පරිදි මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ පුළුල් ප්‍රචාරයක් ලබාදීමට හැකියාව තිබේ.

6. ආශ්‍රිත කරුණු සැලකිල්ලට ගැනීමෙන් ගරු නීතිපතිවරයා රැඳී සිටින මතය වන්නේ ඉල්ලා සිටින තොරතුරු තොරතුරු පනතේ 5 (1) (b) (ii) උප වගන්තියේ විස්තරය යටතට ගැනෙන බව සහ, එය ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකි බව ය. මේ අනුව, මෙබඳු තොරතුරක් තෙවන පාර්ශවයක් වෙත ලබාදීම ශ්‍රී ලංකා හමුදාව විසින් ප්‍රතික්ෂේප කෙරේ.

## නියෝගය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කළ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ පුරවැසියන් නීත්‍යානුකූල සහ නෛතික කාර්යපටිපාටිය ඔස්සේ තොරතුරු ඉල්ලීම් ගොනු කිරීම නිසාම යම් පොදු අධිකාරියක් හුදෙක් එම පුරවැසියන් පිළිබඳ හමුදා බුද්ධි අංශ වාර්තා ලබාගනියි නම්, එවිට පනතේ මූලික අරමුණු නිශේධනය වන බව සෛද්ධාන්තික වශයෙන් දැඩි සේ අවධාරණය කළ යුතුය.

අප ඉදිරියේ ඇති කරුණුවලට අනුව මෙම සිද්ධියේදී මෙය සැබවින්ම සිදුවී තිබේදැයි තක්සේරු කිරීමට යෝග්‍ය තත්වයක කොමිෂන් සභාව මෙම මට්ටමේදී නොසිටින නමුත්, සෛද්ධාන්තිකව, තොරතුරු අයදුම්කරුවන් කිසියම් හෝ ආකාරයකින් බිය ගැන්වීමකට ලක් කළහොත් එය කොමිෂන් සභාවේ විශේෂ මැදිහත්වීමක් අවශ්‍ය වන බරපතළ කාරණයක් බව සඳහන් කළ යුතුය.

අභියාචකයෙකුගේ පසුබිම හෝ තොරතුරු ඉල්ලීමක අරමුණ, තොරතුරු ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම සඳහා පනත යටතේ හෝ පනත ප්‍රකාරව සලකා බැලිය යුතු අදාළ කාරණයක් නොවේ. පනතේ 24(5)(ඇ) මෙසේ සඳහන් කරයි;

'පුරවැසියෙකු විසින් තොරතුරු ඉල්ලීමක් සිදුකිරීමේදී... ඔහු හෝ ඇය සම්බන්ධ කර ගත හැකි අවශ්‍ය විස්තර හැර, තොරතුරු ඉල්ලා සිටීමට හේතු කිසිවක් හෝ වෙනත් පුද්ගලික විස්තර ලබාදීම අවශ්‍ය නොවන්නේය."

කොමිෂන් සභාවේ කාර්යය වන්නේ ඉල්ලා සිටි තොරතුරු, පනතේ 5(1) වගන්තිය මගින් සවිස්තරාත්මක ව දක්වා ඇති නිශ්චිත ව්‍යාතිරේඛවල විෂය පථය යටතට නොවැටෙන්නේ නම්, 5(4) උප වගන්තියේ දක්වන මහජන සුබසිද්ධිය අභිබවා යන්නේද සහ තොරතුරු ඉල්ලීම නීත්‍යානුකූල සහ නීතිය තුළ පිහිටන්නේ නම්, ඒවා අභියාචක වෙත ලැබෙන්නේද යන්න නිශ්චය කිරීමයි. අප ඉදිරියේ තිබෙන තොරතුරු ඉල්ලීමේ I වන අයිතමය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ගුවන් හමුදාව විසින් ලබාදුන් තොරතුරු මෙන්, අදාළ තොරතුරු, 2018.08.07 දින හෝ ඊට ප්‍රථම අභියාචක වෙත ලබාදෙන ලෙසට පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුද්ධ හමුදාව) වෙතට උපදෙස් දෙනු ලැබේ.

තොරතුරු ඉල්ලීමෙහි II (7) අයිතමය සම්බන්ධයෙන්, එනම්, ලායා හෝටල් දාමය යටතේ තිබෙන ලායා බීච්, ලායා ලෙෂර්, ලායා සෆාරි සහ ලායා වේව්ස් යන හෝටල් එක එකක 2009 සිට 2016 වසර දක්වා වන විගණනය කළ ගිණුම් වාර්තාවන් පිළිබඳ ඉල්ලීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් පවත්වාගෙන යන මෙකී සත්කාරක ව්‍යාපාරයන්ට මුදල් ලැබෙනුයේ පුද්ගලික හෝ පොදු අරමුදල් (ශ්‍රී ලංකා යුධ හමුදාවේ සුබසාධන සංගමය) වලින් ද යන්න උද්ගත විය. මෙකී සත්කාරක ව්‍යාපාරයන් පාලනය, ක්‍රියාත්මක වීම සහ පවත්වාගෙන යාම සිදුකරන්නේ රජයේ අරමුදල්වලින් වැටුප් ලබන පොදු අධිකාරියේ සාමාජිකයන් විසිනි. මේ බව සැලකිල්ලට නොගනිමින් පොදු අධිකාරියේ මේ සම්බන්ධ කරුණු කියා පෑම පිළිගැනීම, තොරතුරු පනත යටතේ සහ පනත ප්‍රකාරව ලබා දී නැති වරප්‍රසාදයක් වන අතර, එය කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත කාර්යයන් සම්බන්ධයෙන් සලකා බලන විට තොරතුරු පනතට පටහැණි වීමකි.

මීළඟ විභාග දිනයේදී මෙම තොරතුරු අයිතමය (II (7) අයිතමය) සම්බන්ධයෙන් අංග සම්පූර්ණ ලෙස සිය ස්ථාවරය කියා පාන ලෙසට ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත උපදෙස් දෙනු ලැබේ. පොදු අධිකාරිය වෙත තවදුරටත් උපදෙස් ලබාදෙනුයේ II අයිතමය යටතේ එන තොරතුරු ඉල්ලීමෙහි සෙසු අයිතමයන් සම්බන්ධයෙන් ද තොරතුරු පනත ප්‍රකාරව අංග සම්පූර්ණ වශයෙන් සිය ස්ථාවරය පැහැදිලි කරන ලෙස ය.

III වන අයිතමයට අදාළව, එනම් 'හයිටි හි ජගත් සංවිධාන සාමසාධක මෙහෙයුම්වලදී සිදුකළ බව කියන බාලවයස්කාර දැරියන් ලිංගික සූරාකෑම් සහ අපයෝජනයට ලක් කිරීම පිළිබඳ විමර්ශන වාර්තාව' සම්බන්ධයෙන්, අපගේ පරීක්ෂාකාරී කියවීම සඳහා මෙම විභාගයේදී අප ඉදිරියේ තබා ඇති එම වාර්තාව විමසා බැලීමෙන් පසු උපදෙස් දෙනු ලැබේ.

අභියාචනය කල් තබන ලදී.





මීළඟ විභාග දිනය: 2018.08.07

..............................................................................................................................................

RTC Appeal (පෞද්ගලික විභාග කිරීම) / 70/ 2018 (2018.08.07 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස කරන ලද නියෝගය)

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය

| | |
|---|---|
| **සභාපති** | : මහින්ද ගම්මන්පිල |
| **කොමිෂන් සභා සාමාජිකයින්** | : ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ-ජයවර්ධන |
| | : ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| | : ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් |
| | : විනිසුරු රෝහිණී වල්ගම |
| **අධ්‍යක්ෂ ජනරාල්** | : පියතිස්ස රණසිංහ |
| **අභියාචක** | : ජී. දිලීප් අමුදන් |
| **නොතිසි ලත් පාර්ශව** | : නම්කළ නිලධාරී, ආරක්ෂක අමාත්‍යාංශය |

පෙනී සිටීම/නියෝජනය:

| | |
|---|---|
| **අභියාචක** | : ජී. දිලීප් අමුදන් |
| **පොදු අධිකාරිය** | : මේජර් පී. පෙරේරා, කාර්ය මණ්ඩල නිලධාරී, ශ්‍රී ලංකා යුධ හමුදාව (අපැහැදිලි) |
| | : බ්‍රිගේඩියර් ඊ.එස්. ජයසිංහ, නීති අංශය, ශ්‍රී ලංකා යුධ හමුදාව |
| | :මේජර් ඒ.අමරසිංහ, නීති නිලධාරී, ශ්‍රී.ල. යුධ හමුදාව |

### අභියාචනය විභාගයේදී උද්ගත වූ කරුණු:

අභියාචක විසින් 2018.07.31 දින ඉදිරිපත් කළ ලිඛිත කරුණු කියාපෑමෙහි වූ පහත අන්තර්ගතයන් වෙත ශ්‍රී ලංකා යුධ හමුදාවේ අවධානය කොමිෂන් සභාව විසින් යොමු කරවයි.

1. *'මෙම සිද්ධියට අදාළ නොවන්නේ වුවද, අභියාචක සඳහන් කරන්නේ තමන් යාපනය ප්‍රදේශයේ කටයුතු කරන මාධ්‍යවේදියෙකු වන බව සහ, එම වෘත්තියට අදාළව තමන් විසින් තොරතුරු අයදුම්පත් ගණනාවක් ගොනු කර ඇති බව' ය.*
2. *'අවසාන විභාග දිනයෙන් පසු අභියාචක සමාජ ජාල ඔස්සේ දැනුවත් වූයේ, රටෙන් පිට සිටින ඇතැම් කණ්ඩායම් විසින්* ***අවස්ථාවාදී ලෙස තම විභාගයට අදාළ කොමිෂන් සභා පටිපාටීන් ග්‍රහණය කරගෙන*** *අභියාචකගේ විභාගය සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත ලිවීමට අදහස් කරන බවයි'.*
3. ***'සිය විභාගයේදී තෙවන පාර්ශවයන්ගේ මැදිහත් වීම සාදරයෙන් නොපිළිගන්නා බව වෙන් වෙන් වශයෙන් සඳහන් කිරීමට අභියාචක බලාපොරොත්තු වෙයි.*** *මෙහිදී තමන් විසින්ම තම විභාගයේදී තර්ක කිරීමට අභියාචක බලාපොරොත්තු වෙයි.*
4. *'සාරාංශයක් ලෙස, 2007 වසරේදී හයිටි පුරවැසියන්ට සිදුකළ ලිංගික අපයෝජනයන් සඳහා චෝදනා ලැබූ හයිටි හි සේවයේ යොදවා තිබූ ශ්‍රී ලංකා සාම සාධක භටයන් ට අදාළ චෝදනා පිළිබඳ තොරතුරු ඉල්ලා තිබේ.'*
5. *'ඉල්ලා සිටි තොරතුර මගින් පුද්ගලිකත්වය පිළිබඳ ගැටළු මතුවන බවට පොදු අධිකාරිය සිදුකරන කරුණු කියාපෑම අභියාචක විසින් ප්‍රතික්ෂේප කරයි. තොරතුරු පනතේ අදාළ ව්‍යාතිරේඛයෙන් පවසනු ලබන්නේ,*

   *'පුද්ගලික තොරතුරුවලට අදාළ තොරතුරු සම්බන්ධයෙන් වන විට, තොරතුරු හෙළිදරව් කිරීම යම් පොදු කටයුත්තක් හෝ සම්බන්ධතාවක් සඳහා කිසිදු සම්බන්ධයක් නොමැති අවස්ථාවකදී හෝ, යම් තනි පුද්ගලයෙකුගේ පුද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය කිරීමක් සිදු වේ නම්, එම තොරතුරු හෙළිදරව් කිරීම විශාල වශයෙන් මහජන සුබසිද්ධිය විසින් සාධාරණීකරණය කරයි නම් හෝ, අදාළ තැනැත්තා විසින් එම හෙළිදරව් කිරීම සඳහා ලිඛිතව කැමැත්ත ලබා දී ඇත්නම් මිස' යනුවෙනි.*
6. *'පැහැදිලිවම, තොරතුරු ඉල්ලීම අදාළ වන්නේ 'පොදු ක්‍රියාකාරකමක්' සඳහා එනම් නම් වශයෙන් කියන්නේ නම් ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිලධාරීන් විසින් එම නිල තත්වය තුළ සිදුකළ සාම සාධක ක්‍රියාකාරකම් සම්බන්ධයෙනි. මෙම ක්‍රියාකාරකම් පැහැදිලිවම පුද්ගලික ස්වභාවයේ ඒවා නොවිණි.''*





7. *'තවදුරටත්, තොරතුරු පැහැදිලිවම මහජන සුබසිද්ධිය සඳහා ය. නිල රාජකාරිවල සිටියදී රජයේ නිලධාරීන්ගේ හැසිරීම්, රජයේ නිලධාරීන් විසින් ස්වකීය නිලය යටතේ කටයුතු කිරීමේදී සිදුකරනු ලැබූ බරපතළ උල්ලංඝනයන් සඳහා ගනු ලැබූ විනය ක්‍රියාමාර්ග ප්‍රත්‍යක්ෂ වශයෙන්ම මහජන සුබසිද්ධියට අදාළ කාරණයක් වේ.'*
8. *'තවද, හමුදාව ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ මුලපිරීම්, සංහිඳියා මුලපිරීම්වලට ද අදාළ වේ. එහිදී ප්‍රත්‍යක්ෂ වශයෙන්ම මහජන සුබසිද්ධියක් පවතියි.'*
9. *'ඉල්ලා සිටි තොරතුරු කිසිදු පුද්ගලයෙකුගේ පුද්ගලික ජීවිතයට අදාළ නොවේ. ඒ වෙනුවට ඒවා මගින් ශුද්ධ වශයෙන්ම ප්‍රශ්න කර සිටින්නේ නිලයේ සිටියදී නිලධාරීන් විසින් සිදුකළ හැසිරීම් සහ එකී හැසිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනවල නිල ප්‍රතිචාරයයි.'*
10. *'ප්‍රතිසමතාවක් දක්වන්නේ නම්, අපරාධ නඩු වාර්තා ප්‍රසිද්ධ ලේඛන වේ. තමන්ට සම්බන්ධිත අපරාධ නඩු පටිපාටියකදී පුද්ගලිකත්වය සැලකිල්ලට ගනු ඇතැයි චූදිතයෙකුට හෝ වරදකරුවෙකු වූ තැනැත්තෙකු හට නීත්‍යානුකූල අපේක්ෂාවක් නැත.'*
11. *'ඉල්ලා සිටි තොරතුරු මුදා හැරීම පනතේ 5(1) (ආ) (ii) යටතට වැටෙන බවට කරුණු කීම සම්බන්ධයෙන් අභියාචක සඳහන් කරන්නේ මෙකී විධිවිධාන පැහැදිලිවම අදාළ වන බවයි.'*
12. *'...කරන ලද චෝදනා සහ වෙනත් රාජ්‍යයන් සමග පවතින සබඳතාවලට හානිවිය හැකි ප්‍රතිචාර පළ කිරීම පොදු අධිකාරියේ පාර්ශවයෙන් අසමත්කමකි. තවද, දිගින් දිගටම අවහැසිරීම් පිළිබඳ සහ යම් ප්‍රතිකර්මීය ක්‍රියාවක් (හෝ එසේ නොකර සිටීමක්) පිළිබඳ විස්තර සඟවාගෙන සිටීම තහවුරු කිරීම නියත වශයෙන්ම ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රතිරූපයට හානි කිරීමකි. එසේම,''*
13. *'බරතළ අගතියක් සඳහා' 'ක්‍රියාමාර්ගයක් ගත යුතු ඕනෑම අවස්ථාවක' එසේ සිදුකර නැත. එසේම රහසිගතව ලබාගත් හෝ ලබාදුන් කිසිදු තොරතුරක් ඉල්ලා නොමැත'.*

2018.07.09 දින එකඟ වූ පරිදි I වන අයිතමය මගින් ඉල්ලා සිටින තොරතුරුවල තත්වය සම්බන්ධයෙන්, එනම්, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ගුවන් හමුදාව විසින් පවත්වාගෙන යනු ලබන සත්කාරක ව්‍යාපාරයන්/ස්ථානයන් පිළිබඳ විමසීමේදී පොදු අධිකාරිය විසින් 2018.07.09 දිනැති, කොමිෂන් සභාව වෙත එවනු ලැබූ, තොරතුරු ඉල්ලීමෙහි II (4) අයිතමයට අදාළ තොරතුරු සහිත ලිපිය ඉදිරිපත් කළේය.

**නියෝගය**

එකී තොරතුරු ඉල්ලීමෙහි III වන අයිතමය සම්බන්ධයෙන් පෙනී යන්නේ ‘අතිශයින් රහසිගතයි‘ යන ආරක්ෂණ වර්ගීකරණය යටතේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුධ හමුදාව) වෙත ලබාදුන් ‘හයිටි හි ජගත් සාම සාධක මෙහෙයුම්වල නිරත වී සිටියදී සිදුකළ බව කියන බාලවයස්කාර දැරියන් ලිංගික සූරාකෑමට සහ අපයෝජනයට ලක්කිරීම පිළිබඳ විමර්ශන වාර්තාව‘, අභියාචක විසින් 2017.09.28 දිනැති සිය තොරතුරු ඉල්ලීමේ III වන අයිතමය මගින් ඉල්ලා සිටින තොරතුරු ගණයෙහිලා නොසැලකිය හැකි බවයි.

එයට පටහැණිව අභියාචක විසින් ඉල්ලා තිබෙන්නේ විශේෂිත වශයෙන් දක්වන සොල්දාදුවන්ට එරෙහිව එකී චෝදනා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් සිදුකළ විමර්ශනවලට අදාළව පවතින තොරතුරු ය. මේ අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පොදු අධිකාරිය වෙත ලබාදුන් එකී වාර්තාවේ ‘අතිශයින් රහසිගතයි‘ යන අයැදුම සහ තොරතුරු පනතේ 5 (1) (ආ) (ii) යටතේ ව්‍යාතිරේකයක් උපුටා දැක්වීම, III (1), III (2) සහ III (4) යන අයිතම මගින් ඉල්ලා සිටින තොරතුරු සම්බන්ධයෙන් මෙම සිදුවීමේ ආශ්‍රිත කරුණුවලට අදාළ නොවේ.

එපමණක් නොව, මේ සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගනු ලැබුවේ කිනම් සොල්දාදුවන් සංඛ්‍යාවකට එරෙහිව ද යන තොරතුර මේ වන විටත් පොදු අවකාශයේ පවතිනුයේ, අනුයාත අවස්ථාවලදී ජගත් සංවිධානයේ ආයතන වෙත ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඉදිරිපත්කර ඇති බවට වාර්තාගත හෙයිනි.

මෙකී චෝදනාවලට අදාළ සොල්දාදුවන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග සහ විනය ක්‍රියාමාර්ග පිළිබඳ සම්පූර්ණ සංඛ්‍යාලේඛණ සහිත සාරාංශයක් පිළියෙළ කරන ලෙසට පොදු අධිකාරිය වෙත උපදෙස් දෙනු ලැබේ. මෙම සංඛ්‍යාලේඛණ සහිත සාරාංශය විසින් III (1), III (2) සහ III (4) යන අයිතමයන්ගෙන් ඉල්ලා සිටින තොරතුරු තෘප්ත කරනු ඇත.

III (3) අයිතමයට අදාළව පවතින තොරතුරු පහත පරිදි වේ.

> 3. ශ්‍රී ලංකාවෙන් සාම සාධක කටයුතු සඳහා යොදවා තිබූ සාම සාධක භටයන් විසින් සිදුකළ බව කියන අපරාධවල ස්වභාවය, වින්දිතයන්ගේ නම් සහ/හෝ වෙනත් චෝදනාවලට අදාළ තොරතුරු ඇතුළත්ව හයිටි පුරවැසියන් විසින් ශ්‍රී ලංකාවෙන් සාම සාධක කටයුතු සඳහා යොදවා තිබූ සාම සාධක භටයන්ට එරෙහිව සිදුකළ චෝදනාවල ලැයිස්තුවක්

අප මේ පිළිබඳ දරන මතය වන්නේ ‘ශ්‍රී ලංකාවෙන් සාම සාධක කටයුතු සඳහා යොදවා තිබූ සාම සාධක භටයන් විසින් සිදුකළ බව කියන අපරාධවල ස්වභාවය, වින්දිතයන්ගේ නම් සහ/හෝ වෙනත්





චෝදනාවලට අදාළ තොරතුරු ඇතුළත්ව හයිටි පුරවැසියන් විසින් ශ්‍රී ලංකාවෙන් සාම සාධක කටයුතු සඳහා යොදවා තිබූ සාම සාධක භටයන්ට එරෙහිව සිදුකළ චෝදනාවල ලැයිස්තුවක්‘ යන්න මගින් එකී සිදුවීම්වලට අදාළ වින්දිතයන්ගේ තොරතුරු සම්බන්ධයෙන් තොරතුරු පනතේ 5 (1)(a) උපවගන්තිය අදාළ වන බවයි. මෙය, ‘අතිශයින් රහසිගතයි‘ තත්වය යටතේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පොදු අධිකාරිය වෙත ලබාදුන් වාර්තාව කෙරෙහි ද බලපෑමක් ඇති කරනුයේ, මෙම කොමිෂන් සභාව විසින් පරීක්ෂාවෙන් කියවා බැලූ එම වාර්තාවේ එකී පුද්ගලික තොරතුරු අන්තර්ගත වන හෙයිනි.

මෙම සියලු අදාළ සාධක සැලකිල්ලට ගනිමින් III (3) අයිතමය මගින් ඉල්ලා සිටින තොරතුර, III (1), III (2) සහ III (4) අයිතමවල තොරතුරු හෙළිදරව් කිරීමේ සන්දර්භය තුළ හෙළිදරව් කිරීම අප විසින් ප්‍රතික්ෂේප කරනුයේ, එකී හෙළිදරව් කිරීම 5(4) වගන්තියේ අරමුණු සහ අන්තර්ගතය අනුව මහජන සුබ සිද්ධිය තෘප්ත කිරීමට අසමත් වන බව පෙනී යන හෙයිනි.

I වන අයිතමයෙන් ඉල්ලා සිටින තොරතුරට අදාළව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2018.06.05 දිනැති ලිපිය මගින් පහත සඳහන් තොරතුරු අභියාචක වෙත ලබා දී ඇත.

*1. ‘මාලිමා සත්කාරක සේවය‘ (Malima Hospitality Services (MHS)) යනු 2011 වසරේ පටන් පොදු නොවන අරමුදල්වලින්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයන් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන, මූලික වශයෙන් සුබසාධන සේවාවකි. මේ වන විට MHS යටතේ පහත දක්වා ඇති පරිදි හෝටල්/රිසෝට් ලෙස හඳුනාගන්නා සත්කාරක ව්‍යාපාර 3 ක් පවත්වාගෙන යනු ලබයි.*

*a) සොබර් අයිලන්ඩ් රිසෝට්, ත්‍රිකුණාමලය (Sober Island Resort, Trincomalee)*

*b) ගෝල්ඩ් ලින්ක් හොටෙල්, ත්‍රිකුණාමලය (Gold Link Hotel, Trincomalee)*

*c) වැලිගම්බේ විලාස්, මිරිස්ස (Weligambay Villas, Mirissa)*

*d) ලැගූන් කබානාස්, පානම (Lagoon Cabanas, Panama)*

*e) ෆෝට් හැමන්හිල්, යාපනය (Fort Hammenhiel Resort, Jaffna)*

*f) ලේක් ෆ්‍රොන් රිසෝට්, කන්තලේ (Lake Fron Resort, Kanthale)*

*g) දඹකොළපටුන පිල්ග්‍රිම්ස් රෙස්ට්, යාපනය (Dambakolapatuna Pilgrims Rest-Jaffna)*

*2. තානායම්/ භෝජනාගාර (Restaurants)*

*a) ලයිට් හවුස් ගැලරි, කොළඹ කොටුව (Light House Galley, Colombo Fort)*

*b) ක්ලබ් හවුස්, උස්වැටකෙයියාව (Club House, Uswatakeiyawa)*

*3. උත්සව ශාලා*

*a) පූනෑව උත්සව ශාලාව*

*b) රන්මිණිතැන්න උත්සව ශාලාව*

*c) තංගල්ල උත්සව ශාලාව*

*4. කිරින්ද කිමිදුම් මධ්‍යස්ථානය (Diving center, Kirinda)*

*b. මෙකී ව්‍යාපාරික ස්ථානයන් ස්ථාපිත කිරීමේ අරමුණු පහත පරිදි වේ.*

*(1). අවම හා සහනදායී මිල ගණනන් යටතේ ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවය කරන නිලධාරීන්ට සහ ඔවුන්ගේ ඥාතීන්ට නිවාඩු ගත කිරීමට, විනෝද ගමන් යාමට සහ වෙනත් අවශ්‍යතා සඳහා සුවපහසු නවාතැන් පහසුකම් සැපයීම*

*(2). අවම හා සහනදායී මිල ගණන් යටතේ නාවික හමුදා නිලධාරීන්ට, සේලරුවන්ට, ඔවුන්ගේ පවුල්වල අයට සහ ඥාතීන්ට ආහාර, විවිධ රසයන්ගෙන් යුත් හා නිතර දක්නට නොලැබෙන ප්‍රණීත ආහාරපාන සහ රස මසවුළු භුක්ති විඳීමට හැකි වීම*

*(3). ශ්‍රී ලංකා නාවික හමුදා සාමාජිකයන් හට සුබසාධන වැඩපිළිවෙළක් වශයෙන් මංගල උත්සව, පවුලේ උත්සව, මිතුරු හමු, සම්මන්ත්‍රණ, රැස්වීම් සහ නිල හෝ පුද්ගලික ස්වභාවයේ ඕනෑම කණ්ඩායම් ක්‍රියාකාරකමක් සාධාරණ මිල ගණන් යටතේ පැවැත්වීට.*

*(4). ඉහත ඡේදයේ a, b සහ c හි සඳහන් කළ සියලු පහසුකම් විශ්‍රාමික නාවික හමුදා සාමාජිකයන් සඳහා සැපයීම.*





*(5). මාලිමා සත්කාරක සේවාවේ ව්‍යාපාරික ස්ථානයන් අනේවාසික සහ වෙනස් පරිසරයක් යටතේ භෝජනාගාර සහායක (ස්ටුවඩ්) සහ කේටරින් සහායක (කෝකීන්) වෙත ඔවුන්ගේ මූලික පුහුණුවෙන් අනතුරුව රැකියාවේ ප්‍රායෝගික අත්දැකීම් ලබාගැනීම සඳහා භාවිතා කරනු ලැබේ.*

*(6). නාවික හමුදා සාමාජිකයන්ට ඔවුන් විශ්‍රාම ගැනීමෙන් පසු ප්‍රයෝජනවත් විය හැකි හෝටල් ක්ෂේත්‍රය පිළිබඳ විවිධ කුසලතා වර්ධනය කර ගැනීමට සහාය වීම*

*(7). ශ්‍රී ලංකා නාවික හමුදාවේ මාලිමා සත්කාරක සේවාව විසින් උත්පාදනය කරන මුදල් ශුද්ධ වශයෙන්ම යොදවන්නේ විශේෂයෙන්ම යුද්ධයේදී මිය ගිය, අතුරුදහන් වූ සහ ආබාධිත තත්වයට පත් වීම නිසා සේවයෙන් මුදා හරින ලද නාවික හමුදා සාමාජිකයන්ගේ සුබසාධන ක්‍රියාකාරකම් සහ පවත්නා ව්‍යාපාරික ස්ථානවල නඩත්තුව හා අලුත්වැඩියා කටයුතු සඳහා ය. මේ නිසා අවසන් ගිණුමක් හෝ මූල්‍ය වාර්තාවක් පිළියෙළ නොකෙරේ.*

*(8). එසේම, මෙම සේවාව මගින් සේවයේ නිරත නාවික හමුදා සාමාජිකයන් අභිප්‍රේරණය කිරීම සහ දිරිමත් කිරීම මෙන්ම විශ්‍රාමලත් නාවික හමුදා සාමාජිකයන් රැක බලාගැනීම ඉලක්ක කෙරේ.*

*(9). කෙසේ නමුත් මෙවැනි පහසුකම් ලබාගත හැක්කේ සේවයේ නියුතු සහ සේවයෙන් විශ්‍රාමගිය නාවික හමුදා සාමාජිකයන්ට, ඔවුන්ගේ පවුල්වල අයට, සමීප ඥාතීන්ට පමණක් වන අතර, මහජනතාව වෙත ඒවාට ප්‍රවේශවීම සීමා කර තිබේ"*

2018.06.16 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව පහත දැක්වෙන තොරතුරු අභියාචක වෙත සපයා ඇත.

a) "......ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පවත්වාගෙන යන වෙළඳසැල්, ආපනශාලා, වෙළඳසල් සහ භෝජනාගාර(තානායම්) වල ලැයිස්තුව,

| ව්‍යාපෘතියේ නම | ස්ථානය | ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථාපිතය |
|---|---|---|
| ඊගල්'ස් ලේක්සයිඩ් බැන්ක්වෙට් ඇන්ඩ් කන්වෙන්ෂන් හෝල් (Eagles' Lakeside Banquet & Convention Hall) | අත්තිඩිය-රත්මලාන | රත්මලාන ගුවන් හමුදා කඳවුර |
| ඊගල්'ස් ලැගුන් වීව් බැන්ක්වෙට් හෝල් (Eagles' Lagoon View Banquet Hall) | කටුනායක | කටුනායක ගුවන් හමුදා කඳවුර |

| | | |
|---|---|---|
| මාබල් බීච් එයා ෆෝස් රිසෝට් (Marble Beach Air Force Resort) | වැල්ලමනල්- චයිනා බේ | චයිනා බේ ගුවන් හමුදා පාසල |
| ඊගල්'ස් ගොල්ෆ් ලින්ක්ස් (Eagles' Golf Links) | ක්ලැප්හැන්බර්ග් - චයිනා බේ | චයිනා බේ ගුවන් හමුදා පාසල |
| ඊගල්'ස් හෙරිටේජ් ගොල්ෆ් ක්ලබ් (Eagles' Heritage Golf Club) | අනුරාධපුර | අනුරාධපුර ගුවන් හමුදා කඳවුර |
| ඊග්ල්'ස් කැෆේ (Eagles' café) | වීරවිල | වීරවිල ගුවන් හමුදා කඳවුර |
| කැටලිනා ග්‍රිල් රෙස්ටොරන්ට් (Catalina Grill Restaurant) | කොග්ගල | කොග්ගල ගුවන් හමුදා කඳවුර |
| ඊගල්'ස් කැටලිනා ගෝල්ෆ් ක්ලබ් (Eagles' Catalina Golf Club) | කොග්ගල | කොග්ගල ගුවන් හමුදා කඳවුර |

b)

| ව්‍යාපෘතියේ නම | ස්ථානය | ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථාපිතය |
|---|---|---|
| හෙලිටුවර්ස් (Helitours) | කොළඹ/රත්මලාන | රත්මලාන ගුවන් හමුදා කඳවුර |
| ස්කයි පෙට් ඇනිමල් හොස්පිටල් (Sky Pet Animal Hospital) | බොරැල්ල | කොළඹ ගුවන් හමුදා සේවාස්ථානය |
| සිපර්'ස් හෙයා ඇන්ඩ් බියුටි සැලෝන් (Cippers' Hair & Beauty Salon) | බොරැල්ල | කොළඹ ගුවන් හමුදා සේවාස්ථානය |

මූලික විභාගය අවස්ථාවේදී අභියාචකගේ තොරතුරු ඉල්ලීමේ අයිතම අංක II (4) ට අදාළ තොරතුරු ඇතුළත් 2018.07.09 දිනැති ලිපිය පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුධ හමුදාව) විසින් කොමිෂන් සභාව වෙත ලබාදෙනු ලැබිණි. එම තොරතුරු නම්,





4. ශ්‍රී ලංකා යුධ හමුදාවේ සුබසාධන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ ඒවාට වගකිව යුත්තන් විසින් හෝ ඔවුන් යටතේ, වෙනත් කරුණු අතර, මහජනතාව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන වෙළඳසැල්, ආපනශාලා, වෙළඳසල් සහ/හෝ භෝජනාගාරවල අංගසම්පූර්ණ ලැයිස්තුවක්

මෙම ලැයිස්තුව පහත පරිදි වේ. (2018.07.09 දිනැති ලිපිය බලන්න);

''ශ්‍රී ලංකා යුධ හමුදාවේ සුබසාධන අධ්‍යක්ෂ මණ්ඩලය සුබසාධන වෙළඳසැල් 08 ක් පාලනය කරන අතර, ඒවායේ නම් සහ පිහිටා තිබෙන ස්ථාන පහත පරිදි වේ.''

| අංකය | වෙළඳසැල | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|
| 01. | කොළඹ සුබසාධන වෙළඳසැල | සුබසාධන වෙළඳසැල, බුටානි කැපිටල් ගොඩනැගිල්ල, අංක 149, පොල්හේන්ගොඩ, කොළඹ 05. | 011 2514983 |
| 02. | පනාගොඩ සුබසාධන වෙළඳසැල | සුබසාධන වෙළඳසැල, හමුදා කොලනිය, පනාගොඩ, හෝමාගම | 011 2892212 |
| 03. | දියතලාව සුබසාධන වෙළඳසැල | සුබසාධන වෙළඳසැල, ආසෙමු (ප්‍රධාන හමුදා කඳවුර), දියතලාව | 057 2227100 |
| 04. | පල්ලෙකැලේ සුබසාධන වෙළඳසැල | සුබසාධන වෙළඳසැල, දිගන පාර, පල්ලෙකැලේ, කුණ්ඩසාලේ | 081 2424151 |
| 05. | බූස්ස සුබසාධන වෙළඳසැල | සුබසාධන වෙළඳසැල, 58 වැනි බලකා මූලස්ථානය, හමුදා කඳවුර, බූස්ස | 091 2267786 |
| 06. | අනුරාධපුර සුබසාධන වෙළඳසැල | සුබසාධන වෙළඳසැල, 21 වන බලකා මූලස්ථානය, හමුදා කඳවුර, රණසේවාපුර, අනුරාධපුරය | 025 2226203 |
| 07. | මින්නේරිය සුබසාධන වෙළඳසැල | සුබසාධන වෙළඳසැල, මිනාපේ (නැ) මූලස්ථානය, හමුදා කඳවුර, මින්නේරිය | 027 2245411 |
| 08. | අම්පාර සුබසාධන වෙළඳසැල | සුබසාධන වෙළඳසැල, සටන් පුහුණු පාසල, හමුදා කඳවුර, අම්පාර | 063 2224148 |

ඉහත තොරතුරු ඇතුළත් 2018.07.09 දිනැති මෙකී ලිපිය අභියාචක වෙත භාරදෙනු ලැබිණි.

තොරතුරු ඉල්ලීමෙහි I වන අයිතමය සැලකිල්ලට ගැනීමේදී පෙනී යන්නේ සහ නිරීක්ෂණය කරන්නේ, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් එකී තොරතුරු පිළිවෙළින් 2018.06.05 සහ 2018.06.14 දිනැති ලිපි මගින් මුදා හැර ඇති බවත්, පොදු අධිකාරිය (ශ්‍රී ලංකා යුධ හමුදාව) ද ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදුකළ පිළිවෙළට සමානව, පොදු අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන සත්කාරක ව්‍යාපාරය/ව්‍යාපාරික ස්ථාන I වන අයිතමය මගින් ඉල්ලා සිටින තොරතුරු අභියාචක වෙත ලබාදීමට අනුමැතිය පළ කරන බවයි.

වැඩිදුර විභාගය සඳහා අභියාචනය 2018.10.09 දිනට කල් තැබේ.

*****





***තිලක් රංජිත් සිල්වා එ. ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය***

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/142/2018 -2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්ය පටිපාටිය - *මෙම අභියාචන විභාගය 2018.05.09 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.*

**සභාපති** : මහින්ද ගම්මන්පිල
**කොමිෂන් සභා සාමාජික** : ජ්‍යේෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ- ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික** : ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** : ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික** : විනිසුරු රෝහිණී වල්ගම
**අධ්‍යක්ෂ-ජනරාල්** : පියතිස්ස රණසිංහ
**අභියාචක** : තිලක් රංජිත් සිල්වා
**නොතීසි ලත් පාර්ශවය** : නම් කළ නිලධාරී, ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය

**පෙනීසිටීම**

**අභියාචක** : තිලක් රංජිත් සිල්වා මහතා
**පොදු අධිකාරිය** : පැමිණ සිටියේ නැත.

| | |
|---|---|
| **තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය:** | 2017.11.21 (2017.11.27 දිනැතිව පොදු අධිකාරියට යොමු කර ඇත) |
| **තොරතුරු නිලධාරියා ප්‍රතිචාරය ලබා දුන් දිනය:** | ප්‍රතිචාරයක් නොමැත |
| **නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.12.30 |
| **නම්කළ නිලධාරියා ප්‍රතිචාරය ලබා දුන් දිනය:** | ප්‍රතිචාරයක් නොමැත |
| **තොරතුරු කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2018.01.08 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක, 2017.11.21 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් 2017.02.13 දින මඩකළපුව පොළොන්නරුව මාර්ගයේ වැලිකන්ද පොලිස් වසමේ රුහුණුකෙත මංසන්ධියේ සිදුවූ රිය අනතුර පිළිබඳව පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. අනතුර සිදුවූ ස්ථානය සහ අනතුර සිදුවූ ආකාරය වාර්තා කළ දළ සටහන්වල හා විමර්ශන වාර්තාවේ සහතික කළ පිටපත්.
2. ලොරි රථ රියැදුරා සහ/හෝ ඔහුගේ සහායකයා අත්අඩංගුවට ගත් දිනය සහ වේලාව දක්වන උධෘතවල සහතික කළ පිටපත්
3. වෛද්‍ය වාර්තාව ලබාගැනීම සඳහා ලොරි රථ රියැදුරා දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් කළ වේලාව සටහන් කළ උධෘතයන්ගේ සහතික කළ පිටපත්
4. ලොරි රථ රියැදුරාගේ වෛද්‍ය වාර්තාව ඇතුළත් ජී.එච්.ටී. පිටපතේ සහතික කළ පිටපත්
5. චූදිත ලොරි රථ රියැදුරා අධිකරණයට ඉදිරිපත් කිරීමට සහ වෙනත් ඉදිරිපත් කිරීම්වලට අදාළ උධෘත සටහන්වල සහතික කළ පිටපත්
6. පොළොන්නරුව රෝහලේ 2017.02.14 දින සිදුකළ පශ්චාත් මරණ පරීක්ෂණයේ අදාළ වාර්තාවේ උධෘතවල සහතික කළ පිටපත්
7. යතුරුපැදිය සහ ලොරිය සම්බන්ධයෙන් නඩු භාණ්ඩ පොතෙහි යෙදූ සටහන්වල සහතික කළ පිටපත්
8. මෝටර් රථ පරීක්ෂකතුමා විසින් විමර්ශනයට අදාළව කරන ලද විමර්ශනයේ වාර්තාව.
9. එදින විමර්ශනය පැවැත්වූ පොලිස් නිලධාරීන් සිය සාක්කු සටහන් පොත්වල යොදන ලද සටහන්වල සහතික කළ පිටපත්
10. විමර්ශනය අවසන් කිරීමෙන් පසු එම පොලිස් නිලධාරීන් එදින සේවයෙන් බැහැර වූ වේලාවන්
11. රියැදුරා හට නිකුත් කර තිබූ තාවකාලික රියැදුරු බලපත්‍රයේ අංකය සහ නිකුත් කළ දිනය ඇතුළත්ව එම බලපත්‍රයේ සහතික කළ පිටපතක්
12. රිය අනතුර සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් විසින් ලබාගත් ඡායාරූපවල පිටපත්

තොරතුරු නිලධාරියාගෙන් ප්‍රතිචාරයක් නොවූ හෙයින් අභියාචක විසින් 2017.12.30 දින නම් කළ නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබිණි. නම් කළ නිලධාරියාගෙන් ප්‍රතිචාරයක් නොවූ හෙයින් අභියාචක විසින් 2018.01.09 දිනැති ලිපියක් මඟින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් සිදුකර තිබිණි.





**විභාගයේදී උද්ගත වූ කරුණු**

2017 පෙබරවාරි 3 වැනිදා කොමිෂන් සභාව විසින් ගැසට් කළ 20 වන රීතිය යටතේ (ගැසට් අංක 2004/66) පොදු අධිකාරියට මෙම විභාගය සඳහා පෙනී සිටින ලෙස නොතීසි කර තිබුණ ද පොදු අධිකාරිය පැමිණ සිටියේ නැත.

අභියාචක කොමිෂන් සභාව වෙත දැනුම් දුන්නේ, තමන් විසින් කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීමෙන් පසු 2017.11.21 දිනැති සිය තොරතුරු ඉල්ලීමට පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා විසින් 2018.01.17 දින ප්‍රතිචාරයක් ලබාදුන් බවයි. අයිතම 1, 2, 4, 6 , 7, 8 සහ 11 සම්බන්ධයෙන් ලද තොරතුරු පිළිබඳ තමන් සෑහීමකට පත් වන බව අභියාචක කියා සිටියේය. තොරතුරු ඉල්ලීමේ 3, 5 සහ 11 අයිතම සම්බන්ධයෙන් අභියාචක කියා සිටියේ පොදු අධිකාරිය විසින් සපයන ලද තොරතුරු අසම්පූර්ණ සහ නොමග යවනසුලු බවත්, 9 සහ 12 අයිතම යටතේ තොරතුරු සැපයීමට පොදු අධිකාරිය අසමත් වී ඇති බවටත් ය.

පොදු අධිකාරිය 2018.05.08 දිනැති ලිපියක් ෆැක්ස් මාර්ගයෙන් කොමිෂන් සභාව වෙත එවමින්, අභියාචක වෙත පිටපත් කරමින් කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත්තේ අභියාචක විසින් කරනු ලැබූ තොරතුරු ඉල්ලීම 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1) (ඒ) යටතේ ප්‍රතික්ෂේප කරනු ලැබූ බවයි. පොදු අධිකාරිය තවදුරටත් කියා සිටියේ ඉල්ලා සිටි තොරතුරුවලට අදාළව පැවැත්වෙන විමර්ශනය තුළ මනම්පිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ චූදිත රියැදුරාට එරෙහිව නඩු කටයුත්තක් ආරම්භ කර ඇති බවත්, පොදු අධිකාරිය විසින් විමර්ශනයේදී පවත්වාගෙන ගිය ලිපි ගොනු 3 ම, ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලෙසට 2018.04.23 දින මහේස්ත්‍රාත්තුමා නියම කර ඇති බවත් ය. මේ අනුව, අභියාචක විසින් ඉල්ලා සිටි තොරතුරු ලබාදීම අධිකරණයේ අපක්ෂපාතී නඩු කටයුතුවලට අගතියක් සහ හානිකර බලපෑමක් විය හැකි බවට පොදු අධිකාරිය කරුණු දක්වා සිටියේය.

පසුව අභියාචක විසින් අධිකරණයේ සැලකිල්ලට යොමු කළේ, 2017.12.29, 2018.03.05 සහ 2018.04.16 යන දිනයන් සහිතව තමන් විසින් පොදු අධිකාරිය වෙත එම විමර්ශනය සම්බන්ධයෙන්ම ගොනු කළ තොරතුරු ඉල්ලීම් 3 ද, කොමිෂන් සභාව ඉදිරියේ ඇති මෙම අභියාචනයට සමානව පිළිතුරු නොලද බවට වන කාරණයයි.

**නියෝගය**

මෙම අවස්ථාවේ උද්ගතව ඇති ගැටළුව තුළ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සහ 2017 පෙබරවාරි 3 වැනිදා ගැසට් කළ (ගැසට් අංක 2004/66) තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ රෙගුලාසි විසින් විධාන කර තිබෙන නිසි කාර්යපටිපාටියට අනුකූල වීමට සමත් වී නැති බව, පොදු අධිකාරියේ පාර්ශවයෙන් ප්‍රකට වන්නකි.

තොරුතුරු පනත සහ 2017 පෙබරවාරි 3 දින ගැසට් කළ කොමිෂන් සභා රීති ප්‍රකාරව (ගැසට් අංක 2004/66) පළමු අවස්ථාවේදී නම් කළ නිලධරයා මෙම කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට හෝ තමන් වෙනුවෙන් නියෝජිතයෙකු එවීමට අසමත් වී ඇත. එසේ කිරීමට අසමත් වීම සම්බන්ධයෙන් පොදු අධිකාරිය කිසිදු පැහැදිලි කිරීමක් ද සපයා නැත. මෙයින් පනතේ 39 (1) (ඇ) වගන්තිය අනුව වරදක් ස්ථාපනය වන අතර, එම වගන්තිය යටතේ විශේෂිත නෛතික විපාකවලට යටත් කරවයි.

එවැනි අවස්ථාවකදී පනතේ 39(4) වගන්තිය යටතේ නිසි අධිකරණයේ අපරාධ නඩු කටයුත්තක් ආරම්භ කිරීමට කොමිෂන් සභාවට බලය ඇත. 39 වගන්තිය මගින් තවදුරටත් විශේෂිතව සඳහන් කරන්නේ එවැනි වරදකට වරදකරු වීම මගින් දඩයක් සහ/හෝ දෙවසරකට නොඅඩු සිරගත කිරීමක් දඬුවම් වශයෙන් නියම වනු ඇති බවයි.

පොදු අධිකාරිය පහත දැක්වෙන පරිදි කියැවෙන, තොරතුරු පනතේ 5 (1) (ඒ) වගන්තිය යටතේ අභියාචක විසින් කරන ලද තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත:

> *එම තොරතුරු හෙළිදරව් කිරීම අධිකරණයට අපහාසයක් හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතී බව පවත්වාගෙන යාමට අගතියක් සිදුවන අවස්ථාවකදී*

*ලංකා බැංකු සේවක සංගමය එ. මහජන බැංකුව* (2018.01.30 දිනැති තොරතුරු කොමිෂන් සභා සටහන්) හිදී මෙම කොමිෂන් සභාව නිරීක්ෂණය කරන්නේ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ හැක්කේ 5(1) වගන්තියේ සිව් කොණ තුළ, එම ප්‍රතික්ෂේප කිරීම අවසානාත්මක වශයෙන් පනතේ 5(4) වගන්තියේ දැක්වෙන මහජන සුබසිද්ධිය ප්‍රමුඛ වීමට විෂය වන අතර, 'තොරතුරු හෙළිදරව් කිරීම මගින් සැලසෙන මහජන සුබසිද්ධිය, එය තොරතුරු හෙළිදරව් කිරීමෙන් විය හැකි හානියට වඩා බරෙන් වැඩි වනවිට තොරතුරු ප්‍රතික්ෂේප කළ නොහැකි බව' ය.





පනතේ 5(1) (ඒ) වගන්තියේ ව්‍යාතිරේඛය තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම සඳහා අයැද සිටින්නේ නම්, 'අධිකරණයට අපහාස කිරීම' තුළ හෝ 'අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතී බව පවත්වාගෙන යාමට අගතියක් සිදුවීම' යනුවෙන් බාධා කිරීමක් හෝ අගතියක් ප්‍රතිඵල විය හැකි යැයි දුරස්ථ වියහැකියාවක් දක්වමින් විරුද්ධ වීමේදී සැබෑ අවදානමක් (අවධාරණය අපගේ ය) තිබිය යුතුය.

පනතේ 5(1) (ඒ) මගින් දක්වන ව්‍යාතිරේඛ කට්ටලයේ අදාළත්වය කෙරෙහි අප දැඩි සේ සැලකිලිමත් වන අතර, පනත මගින් සාධ්‍ය කරනු ලබන උපරිම ලෙස හෙළිදරව් කිරීමේ මූලධර්මය ප්‍රකාරව, 5(1) වගන්තිය මගින් දක්වා ඇති - පටු ලෙස අර්ථනිරූපණය කළ යුතු ව්‍යාතිරේඛවලට එරෙහිව තොරතුරු දැනගැනීමේ අයිතියේ මූලික මූලධර්මය යොදාගැනීමට මෙම කොමිෂන් සභාව කටයුතු කරයි.

මේ සම්බන්ධයෙන් පොදු අධිකාරියේ කරුණු කියාපෑම, මෙකී ඉල්ලා සිටින තොරතුරු සහ එයින් 'අධිකරණයේ අධිකාරී බලයට සහ අපක්ෂපාතිත්වයට' 'සැබෑ අවදානමක්' ජනිත වීම අතර සම්බන්ධතාවයක් ස්ථාපිත කිරීමට පැහැදිලි ලෙසම අප්‍රමාණවත් ය.

ඉල්ලා සිටි තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සනාථ කිරීමට වඩාත් පූර්ණ වශයෙන් කටයුතු කරන ලෙසට ඉහත සඳහන් කළ වාතාවරණය තුළ පොදු අධිකාරියට නියම කරනු ලබන අතර, කොමිෂන් සභාවේ පරීක්ෂාකාරී කියවීම සඳහා මීළඟ විභාග දිනයේදී අවශ්‍ය ලිපි ලේඛන ද සමග කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙසට දැඩි සේ ඉල්ලා සිටියි.

අභියාචනය මේ අනුව කල් තබන ලදී.
මීළඟ විභාග දිනය : 2018.05.30

..........................................................................................................................................

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/142/2018 -2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්ය පටිපාටිය - මෙම අභියාචන විභාගය 2018.05.30 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

| | | |
|---|---|---|
| **සභාපති** | : | මහින්ද ගම්මන්පිල |
| **කොමිෂන් සභා සාමාජික** | : | ජෝෂ්ය නීතීඥ කිශාලි පින්ටෝ- ජයවර්ධන |

| | | |
|---|---|---|
| **කොමිෂන් සභා සාමාජික** | : | ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| **කොමිෂන් සභා සාමාජික** | : | ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් |
| **කොමිෂන් සභා සාමාජික** | : | විනිසුරු රෝහිණී වල්ගම |
| **අධ්‍යක්ෂ-ජනරාල්** | : | පියතිස්ස රණසිංහ |
| **අභියාචක** | : | තිලක් රංජිත් සිල්වා |
| **නොතීසි ලත් පාර්ශවය** | : | නම් කළ නිලධාරී, ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය |

**පෙනීසිටීම**

| | | |
|---|---|---|
| **අභියාචක** | **:** | තිලක් රංජිත් සිල්වා මහතා |
| **පොදු අධිකාරිය** | **:** | කේ.ඒ.එස්.ඩබ්. කුමාරජීව (පොලිස් ස්ථානාධිපති -නීති) |

## විභාගයේදී උද්ගත වූ කරුණු:

ප්‍රශ්න කරනු ලදුව, පොදු අධිකාරියේ ස්ථානාධිපති-නීති තහවුරු කර සිටියේ, අභියාචක විසින් ඉල්ලා සිටි තොරතුරු, 2018.05.09 දිනැති නියෝගය ප්‍රකාරව මේ වන විටත් අභියාචක වෙත ලබා දී ඇති බවයි.

කෙසේ නමුත් අභියාචක සඳහන් කළේ, තොරතුරු ඉල්ලීමේ අංක 5, 9, 10 සහ 12 ට අදාළ තොරතුරු තමන් වෙත නොලැබුණු බවයි. එම ඉල්ලා සිටි තොරතුරු පොදු අධිකාරියේ වාර්තාවල ඇති බවත්, අභියාචක වෙත ලබාදිය හැකි බවත්, ඒ සම්බන්ධයෙන් ගැටළුවක් ඇති නොවනු ඇතැයි පොදු අධිකාරිය කල්පනා කරන බවත්, එයට පැහැදිලි කිරීමක් එක් කරමින් පොදු අධිකාරිය ප්‍රතිචාර ලබාදුන්නේය.

චූදිත ලොරි රථ රියැදුරා අධිකරණයට ඉදිරිපත් කිරීම සහ වෙනත් ඉදිරිපත් කිරීම්වලට අදාළ උධෘත සටහන්වල සහතික කළ පිටපත්, එදින විමර්ශනය පැවැත්වූ පොලිස් නිලධාරීන් විසින් සිය සාක්කු සටහන් පොත්වල යෙදූ සටහන්වල සහතික කළ පිටපත්, විමර්ශනය පැවැත්වූ පොලිස් නිලධාරීන් විමර්ශනයෙන් පසු එදින සේවයෙන් බැහැරව ගිය වේලාවන් සහ රිය අනතුර සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් විසින් ගත් ඡායාරූපවල පිටපත් ඇතුළු අභියාචක විසින් ඉල්ලා සිටි තොරතුරු සම්බන්ධයෙන් ප්‍රතිචාර ලබාදීමට පොදු අධිකාරියට උපදෙස් දෙන ලදී.





## නියෝගය

ඉහත කී තොරතුරු මෙදින පටන් සති 2 ක් ඇතුළත කොමිෂන් සභාව වෙත ආවරණ ලිපියේ පිටපතක් ද සහිතව සපයන ලෙසට පොදු අධිකාරිය වෙත නියම කරන ලදී.

මෙම ගැටළුව, නියම කරන ලද පරිදි තොරතුරු සැපයීමේ තත්වය සොයාබැලීම පිණිස 2018.07.17 දිනට නැවත සඳහන් කිරීමට නියමිත ය.

මේ අනුව ඉහත කාරණයට විෂය වන පරිදි අභියාචනය අවසන් කරනු ලැබේ.

********

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත

---

[සහතිකය සටහන් කළේ 2016 අගෝස්තු මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2016 අගෝස්තු මස 05 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 21.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 20.00 යි.

## 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 2016 අගෝස්තු මස 04 වන දින]

එල්.ඩී.-ඕ.4/2015.

**තොරතුරුවලට ප්‍රවේශවීමට ඇති අයිතිවාසිකම සම්බන්ධයෙන් විධිවිධාන සැළසීම සඳහා ද, තොරතුරු වෙත ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කළ හැකි හේතු නිශ්චිතව දැක්වීම සඳහා ද, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ද, තොරතුරු නිලධරයන් පත් කිරීම සඳහා ද; තොරතුරු ලබා ගැනීම සඳහා වන ක්‍රියාපටිපාටිය නිශ්චිතව දැක්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැළසීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ ව්‍යවස්ථාව මගින් තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කර ඇති බැවින්, සහ තොරතුරු ලබා ගැනීමේ අයිතිවාසිකම බලාත්මක කිරීම මගින් පොදු අධිකාරිවල විනිවිදභාවය සහ වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමේ අවශ්‍යතාවක් පැන නැගී ඇති බැවින් ද, එමගින් ශ්‍රී ලංකාවේ මහජනතාවට යහපාලනය සඳහා වැඩි වශයෙන් සහභාගි විය හැකි සහ රටේ පොදු ජන ජීවිතයේ දී සක්‍රීය ලෙස සහභාගි විය හැකි සමාජයක් ප්‍රවර්ධනය වන බැවින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. (1) මේ පනත 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ විධිවිධාන, IV වන කොටසේ, සහ 23, 36, 40, 41, 42, 43 සහ 44 වන වගන්තිවල විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම පනත සම්බන්ධයෙන් සහතිකය පිටසන් කරනු ලබන දිනයේ සිට බලාත්මක විය යුතු ය.

2– PL 009843-3,061 (2016/03)





(3) මේ පනතේ වෙනත් සියලු වගන්තිවල සඳහන් විධිවිධාන පොදු අධිකාරීන් හෝ පොදු අධිකාරීන් හි ප්‍රභේද සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි දිනවල දී බලාත්මක වන්නේ ය.

එසේ වුව ද, එසේ නියම කරනු ලබන දිනය ඉහත (2) උපවගන්තියේ සඳහන් සහතිකය සටහන් කිරීමේ දිනයෙන් පසුව අවම වශයෙන් මාස හයක් ඇතුළත විය යුතු අතර, එම සහතිකය සටහන් කිරීමේ දින සිට එක් අවුරුද්දකට වඩා වැඩි නොවන කාලයක දී මේ පනතේ විධිවිධාන සියලු පොදු අධිකාරීන් සඳහා අදාළ වන්නේ ය.

සක්‍රීය ලෙස බලාත්මක වීම සහතික කිරීමේ වගකීම.

2. මේ පනතේ විධිවිධාන සක්‍රීය ලෙස බලාත්මක වීම සහතික කිරීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය විෂය පවරා ඇත්තා වූ අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ වගකීම විය යුතු ය.

### I වන කොටස

### පනතේ විධිවිධාන අදාළ වීම

තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම.

3. (1) මේ පනතේ 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පොදු අධිකාරියක සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම සෑම පුරවැසියකුට ම තිබිය යුතු ය.

(2) මෙම පනතේ විධිවිධාන පාර්ලිමේන්තු බලතල, වරප්‍රසාද සහ පරිචයන් හීන කරනු නොලබන්නේ ය.

මේ පනතේ විධිවිධාන වෙනත් ලිඛිත නීතියක් අභිබවා බලපැවැත්විය යුතු බව.

4. වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර අනනුකූලතාවයක් හෝ ගැටීමක් ඇති අවස්ථාවක, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

### II වන කොටස

### තොරතුරුවලට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කිරීම

ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා.

5. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව –

(අ) පුද්ගලික තොරතුරුවලට අදාළ තොරතුරු සම්බන්ධයෙන් වන විට, තොරතුරු හෙළිදරව් කිරීම යම් පොදු කටයුත්තක් හෝ සම්බන්ධතාවක් සඳහා කිසිදු සම්බන්ධයක් නොමැති අවස්ථාවක දී හෝ යම් තනි පුද්ගලයකුගේ පුද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය කිරීමක් සිදුවේ නම්, එම තොරතුරු හෙළිදරව් කිරීම විශාල වශයෙන් මහජන සුහසිද්ධිය විසින් සාධාරණීකරණය කරයි නම්, හෝ අදාළ තැනැත්තා විසින් එම හෙළිදරව් කිරීම සඳහා ලිඛිතව කැමැත්ත ලබා දී ඇත්නම් මිස;

(ආ) එම තොරතුරු හෙළිදරව් කිරීම -

(i) රාජ්‍ය ආරක්ෂාවට හෝ එහි භෞමික අඛණ්ඩතාවයට හෝ ජාතික ආරක්ෂාවට බරපතල ලෙස අගතිදායක වන අවස්ථාවක;

(ii) එම තොරතුරු යම් රජයක් හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තර්ජාතික ගිවිසුම් හෝ බැඳීම් විසින් රහසිගතව ලබා දුන් හෝ රහසිගතව ලබාගත් අවස්ථාවක, එම තොරතුරු හෙළිදරව් කිරීම එම රජය හෝ ජාත්‍යන්තර නීතිය යටතේ වූ අන්තර්ජාතික ගිවිසුම් හෝ බැඳීම් සමග ශ්‍රී ලංකාවේ ඇති සබඳතාවලට අගතිගාමී වන හෝ අගතිගාමී විය හැකි අවස්ථාවක;

(ඇ) එම තොරතුරු හෙළිදරව් කිරීම -

(i) විනිමය අනුප්‍රමාණ හෝ විදේශ හුවමාරු ගනුදෙනු පාලනය කිරීමට;

(ii) බැංකු කටයුතු හෝ ණය කටයුතු විධිමත් කිරීමට;

(iii) බදු පැනවීමට;

(iv) භාණ්ඩ සහ සේවාවල මිල ස්ථාවරව පවත්වා ගැනීම, පාලනය සහ ගැලපීමට, කුලී සහ අනෙකුත් පිරිවැය සහ වේතන අනුප්‍රමාණ, වැටුප් සහ අනෙකුත් ආදායම්; හෝ

(v) විදේශ වෙළඳ ගිවිසුම්වලට ඇතුළත් වීමට,





අදාළ ආණ්ඩුවේ ආර්ථික හෝ මුල්‍යමය ප්‍රතිපත්ති වෙනස් කිරීමට හෝ නොකඩවා පවත්වාගෙන යෑම සම්බන්ධ තීරණ නිසිකලට පෙර හෙළිදරව් වීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට බරපතල අගතියක් සිදුවිය හැකි අවස්ථාවක;

(ඈ) එම තොරතුරු හෙළිදරව් කිරීම විශාල වශයෙන් මහජන සුහසිද්ධිය සඳහා හේතුවන බවට පොදු අධිකාරිය විසින් සෑහීමට පත්වේ නම් මිස, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ ආරක්ෂා කර ඇති වාණිජ රහස්, වෙළඳ රහස් හෝ බුද්ධිමය දේපළ ඇතුළු තොරතුරු හෙළිදරව් කිරීම යම් තුන්වන පාර්ශවයක තරගකාරී තත්ත්වයට අහිතකර ලෙස බලපානු ලබන්නේ නම්;

(ඉ) එම තොරතුරු, යම් තැනැත්තකුගේ වෛද්‍ය වාර්තා හෙළිදරව් කිරීමට මඟ පාදන අවස්ථාවක, එම තැනැත්තා විසින් සිය වෛද්‍ය වාර්තා පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම සඳහා ලිඛිතව අනුමතය ලබා දී ඇත්නම් මිස;

(ඊ) ඔවුන්ගේ සේවා සැපයීමේ දී නීතිපතිවරයා හෝ නීතිපතිවරයාට සහාය දක්වන යම් නිලධරයකු සහ පොදු අධිකාරීන් අතර පවතින යම් සන්නිවේදනයක් ඇතුළුව, යම් ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දී නොමැති වූ, වෘත්තිකයන් සහ එම වෘත්තිකයන් විසින් සේවා සපයනු ලබන යම් පොදු අධිකාරියක් අතර පවතින යම් සන්නිවේදනයක සංයුක්ත වන්නා වූ තොරතුරක් වන අවස්ථාවක දී;

(උ) භාරකාර සම්බන්ධතාවයක් පැවතීම හේතුවෙන් එම තොරතුරු රහසිගතව තබා ගැනීම අවශ්‍ය වන අවස්ථාවක දී;

(ඌ) එම තොරතුරු හෙළිදරව් කිරීම මගින් -

(i) යම් අපරාධයක් වැළැක්වීම හෝ ඒ පිළිබඳව සොයාගැනීම හෝ වරදකරුවන් අල්ලා ගැනීම හෝ ඔවුනට එරෙහිව නඩු පැවරීම සම්බන්ධයෙන් බලවත් අගතියක් සිදුවන අවස්ථාවක; හෝ

(ii) නීතිය බලාත්මක කිරීම හෝ ජාතික ආරක්ෂාවට අදාළ තොරතුරු පිළිබඳ රහසිගත මූලාශ්‍රයක අනන්‍යතාවය හෙළිවන අවස්ථාවක දී;

(එ) 29 (2) (ඇ) වගන්තියේ විධිවිධානවලට යටත්ව, එම තොරතුරු තෙවන පාර්ශවයක් විසින් අදාළ පොදු අධිකාරිය වෙත රහසිගතව සපයා ඇති අවස්ථාවක දී, එම තොරතුරු හෙළිදරව් කිරීම සඳහා එම පාර්ශවය විසින් අනුමතය ලබා දී නොමැති අවස්ථාවක;

(ඒ) එම තොරතුරු හෙළිදරව් කිරීම අධිකරණයට අපහාස කිරීමක් හෝ අධිකරණයේ අධිකාරි බලය හා අපක්ෂපාතීබව පවත්වාගෙන යාමට අගතියක් සිදු වන අවස්ථාවක දී;

(ඔ) එම තොරතුරු හෙළිදරව් කිරීම පාර්ලිමේන්තු වරප්‍රසාද හෝ නීතිය මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට පළාත් සභා වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් වන අවස්ථාවක දී;

(ඕ) විභාග දෙපාර්තමේන්තුව හෝ උසස් අධ්‍යාපන ආයතනයක් විසින් පවත්වනු ලබන යම් විභාගයකට අදාළ තොරතුරු රහසිගතව තබා ගැනීමට නියමිත වන්නා වූ අවස්ථාවක දී;

(ක) එම තොරතුරු තීරණයක් ගෙන නොමැති අමාත්‍ය මණ්ඩල සංදේශයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී ; හෝ

(ග) එම තොරතුරු අදළ මැතිවරණ නීති මගින් රහසිගතව තැබීමට නියමිත වන්නා වූ මැතිවරණ කොමසාරිස්වරයා විසින් පවත්වනු ලබන මැතිවරණයකට සම්බන්ධ තොරතුරු වන අවස්ථාවක දී,

මේ පනත යටතේ ඒ තොරතුරුවලට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඉල්ලා සිටිනු ලබන තොරතුරු අවුරුදු දහයකට වඩා පැරණි නම්, එම උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඉ), (ඊ), (උ), (ඌ) සහ (ඒ) ඡේදවල දක්වා ඇති හේතු මත හැර එහි දක්වා ඇති කිසිදු හේතුවක් මත, තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(3) මේ වගන්තියේ (1) (ඇ) (v) උපවගන්තියේ සඳහන් විදේශ ගිවිසුම් අවුරුදු දහයක් ඉකුත් වීමෙන් පසුව වුව ද අවසන් වී නොමැති අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් වූ තොරතුරු හෙළි නොකළ යුතු ය.





(4) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, මහජන සුභසිද්ධිය එම තොරතුරු හෙළිදරව් කිරීමෙන් වන හානියට වඩා වැඩි නම් එවැනි තොරතුරු සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ හෙළිදරව් කිරීමෙන් මුක්ත කර ඇති යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීම ප්‍රදානය කිරීමට අදාළ යම් ගැටලුවක් පිළිබඳව තොරතුරු නිලධරයකු විසින්, කොමිෂන් සභාවෙන් උපදෙස් ලබාගත හැකි අතර, කොමිෂන් සභාව විසින් හැකි ඉක්මනින් සහ එවැනි සෑම අවස්ථාවක දී ම දින දහතරක් ඇතුළත ස්වකීය උපදෙස් ලබා දිය යුතු ය.

ඇතැම් අවස්ථානුගත තත්ත්ව යටතේ වෙන් කිරීමේ හැකියාව.

**6.** 5 වන වගන්තියේ දක්වා ඇති කවර හෝ හේතු මත තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක, එම වගන්තිය යටතේ හෙළිදරව් කිරීමෙන් මුක්ත කොට නැති යම් තොරතුරු ඇතුළත් වූ ද, හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති තොරතුරු ඇතුළත් වන යම් කොටසකින් සාධාරණ ලෙස වෙන් කළහැකි වූ ද, යම් වාර්තාවක හෝ ලේඛනයක කොටසකට ප්‍රවේශය ලබා දිය හැකි ය.

## III වන කොටස

### අමාත්‍යවරුන්ගේ සහ පොදු අධිකාරිවල යුතුකම්

පොදු අධිකාරි විසින් එහි වාර්තා පවත්වාගෙන යා යුතු සහ ආරක්ෂා කළ යුතු බව.

**7.** (1) මේ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයට තොරතුරුවලට ප්‍රවේශවීමට ඇති අයිතිවාසිකම සුසාධනය කිරීම සඳහා නිසි අයුරින් සාදනු ලබන නාමාවලි සහ සුචියක් අනුව එහි ක්‍රියාත්මකවීමේ අවශ්‍යතා සමග අනුකූල වන ආකාරයට සහ ආකෘතියකට අනුව සෑම පොදු අධිකාරියක් විසින්ම සිය වාර්තා පවත්වාගෙන යෑම ඒ සෑම පොදු අධිකාරියකම වගකීම වන්නේ ය.

(2) සෑම පොදු අධිකාරියක් විසින්ම (1) වන උපවගන්තිය යටතේ සිය වගකීම් ක්‍රියාත්මක කිරීමේ දී, 14 (ඌ) වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් දෙන ලද නියමයන්ට අනුකූලව ඉටු කළ යුතු ය.

(3) සෑම පොදු අධිකාරියක් විසින් ම පවත්වාගෙන යනු ලබන සියලු වාර්තා -

(අ) මේ පනත ක්‍රියාත්මකවීමේ දිනයේ දී එවකටත් පවතින වාර්තා සම්බන්ධයෙන් වන විට, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට අවුරුදු දහයකට නොඅඩු කාලසීමාවක් සඳහා; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මකවීමෙන් පසුව සකසනු ලබන අලුත් වාර්තා සම්බන්ධයෙන් වන විට, එම වාර්තාව සකස් කළ දින සිට අවුරුදු දොළහකට නොඅඩු කාලසීමාවක් සඳහා,

ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක විෂය වස්තුව වන්නා වූ කිසිදු වාර්තාවක් හෝ තොරතුරක්, එම ඉල්ලීම හෝ එම ඉල්ලීමට අදාළ යම් අභියාචනයක් විභාග වන අතරතුර දී හෝ අධිකරණ කටයුත්තක් පවතින කාලය තුළ දී විනාශ නොකළ යුතු ය.

(5) 2 වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එය නොසලකමින්, සෑම පොදු අධිකාරියක් විසින් ම සම්පත්වල පැවතීමට යටත්ව, සාධාරණ කාලයක් ඇතුළත ස්වකීය සියලු වාර්තා විද්‍යුත් ලේඛනාකෘතියෙන් ආරක්ෂා කර තැබීම සඳහා උත්සුක විය යුතු ය.

වාර්තාවක් පළ කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ කාර්යභාරය.

**8.** (1) අර්ධ වාර්ෂිකව පිළිවෙළින් එක් එක් වර්ෂයේ ජූනි මස තිස් වන දිනට සහ දෙසැම්බර් මස තිස් එක් වන දිනට ප්‍රථම, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ආකෘතියකට යම් පුරවැසියකුට මේ පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රදානය කොට ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමට ඇති අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමට හැකි වනු පිණිස වාර්තාවක් පළකිරීම එම අමාත්‍යවරයාගේ කාර්යය වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සඳහන් වාර්තාවේ පහත විස්තර අඩංගු විය යුතු යඃ-

(අ) එම අමාත්‍යවරයාට පවරා ඇති අමාත්‍යාංශයේ සංවිධානය, කර්තව්‍ය, ක්‍රියාකාරකම් සහ කාර්යට සම්බන්ධ විස්තර සහ එසේ පවරා ඇති කර්තව්‍ය තුළට වැටෙන සියලු පොදු අධිකාරිවල විස්තර;





(ආ) (අ) ඡේදයේ දක්වා ඇති අමාත්‍යාංශය සහ පොදු අධිකාරීන්වල -

(i) නිලධරයන් සහ සේවානියුක්තිකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ ඔවුන් විසින් සිය තීරණ ගැනීමේ දී අනුගමනය කරනු ලබන අදාළ ක්‍රියාපටිපාටි;

(ii) කර්තව්‍ය ඉටුකිරීමේ දී, කාර්ය කිරීමේ දී සහ බලතල ක්‍රියාත්මක කිරීමේ දී එහි නියමිත සම්මතයන්;

(iii) නිලධරයන් සහ සේවානියුක්තිකයන් සිය කාර්ය කිරීමේ දී, කර්තව්‍ය ඉටුකිරීමේ දී සහ බලතල ක්‍රියාත්මක කිරීමේ දී භාවිත කරනු ලබන රීති, නියෝග, උපදේශ, අත්පොත් සහ වෙනත් යම් ප්‍රභේදවල වාර්තා;

(iv) තොරතුරු ලබා ගැනීම සඳහා පුරවැසියන්ට ලබා ගත හැකි පහසුකම් පිළිබඳ විස්තර;

(v) මුදල් ප්‍රතිපූරණය කිරීමේ දී සියලු සැළසුම්, යෝජිත වියදම් හා වාර්තා පෙන්නුම් කරමින් එක් එක් නියෝජිත ආයතන වෙත වෙන් කරන ලද අයවැය;

(vi) පත්කොට ඇති තොරතුරු නිලධරයා හෝ නිලධරයන්ගේ නම, තනතුර සහ අනෙකුත් විස්තර.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට මාස හයක් ඇතුළත සෑම අමාත්‍යවරයකු විසින් ම නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියකින් (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල දක්වා ඇති තොරතුරු අඩංගු වාර්තාවක් පළ කිරීම, එම අමාත්‍යවරයාගේ කාර්යය වන්නේ ය.

(4) (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල දක්වා ඇති වාර්තා -

(අ) රාජ්‍ය භාෂාවලින් පළ කරනු ලැබිය යුතු අතර, විද්‍යුත් ලේඛනාකෘතියකින් ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය; සහ

(ආ) මහජන පරීක්ෂාව සඳහා ලබා ගැනීමට සැලැස්විය යුතු අතර, ඒවායේ පිටපත් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ගාස්තුවක් ගෙවීම මත යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

සැක දුරු කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා යන යෙදුම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවා ඇති පළාත් සභාවක අමාත්‍යවරයකු ද ඇතුළත් වන බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ව්‍යාපෘතියකට මුලපිරීම සම්බන්ධයෙන් මහජනයාට දැනුම් දීමට අමාත්‍යවරුන්ට ඇති කාර්යභාරය.

**9.** (1) (අ) යම් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට මාස තුනකට පෙරාතුව, එම ව්‍යාපෘතියට අදාළ විෂයය පවරා ඇත්තේ යම් අමාත්‍යවරයෙකු වෙත ද, එකී සන්නිවේදනය කරන දිනය වන විට තමා සතු එම ව්‍යාපෘතියට අදාළ සියලු තොරතුරු පොදුවේ මහජනයාට සහ එම ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වීමට ඉඩ ඇති නිශ්චිත තැනැත්තන්ට සන්නිවේදනය කිරීම, එම අමාත්‍යාවරයාගේ කාර්යය වන්නේ යඃ

එසේ වුව ද, හදිසි ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වන විට, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සතියකට පෙරාතුව තොරතුරු ලබාදිය යුතු අතර, එම හදිසි තත්වය සඳහා වූ හේතු, කොමිෂන් සභාව වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(ආ) කොමිෂන් සභාව විසින් (අ) ඡේදයේ සඳහන් සන්නිවේදනය සිදු කළ යුතු ආකාරය නිශ්චිතව දක්වමින් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (අ) අමාත්‍යවරයකු විසින්, එම ව්‍යාපෘතිය සංවර්ධනය සහ ක්‍රියාත්මක කරන කාලසීමාව පුරා (1) වන උපවගන්තියේ දක්වා ඇති ව්‍යාපෘතියක් සම්බන්ධ යාවත්කාලීන තොරතුරු පුරවැසියකු විසින් තත් කාර්යය සඳහා ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත එම පුරවැසියාට ලැබීමට සැලැස්විය යුතු ය.

(ආ) එම තොරතුරු, කොමිෂන් සභාව විසින් තොරතුරු ලබාදීමේ කාර්යය සඳහා නියම කරනු ලැබිය යුතු යම් ගාස්තුවක් මත ලබා දිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "ව්‍යාපෘතිය" යන්නෙන් -

(අ) විදේශ ආධාර ලබන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වන විට, එක්සත් ජනපද ඩොලර් ලක්ෂයක් ඉක්මවන; සහ





(ආ) දේශීය වශයෙන් ආධාර ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් වන විට, රුපියල් ලක්ෂ පහක් ඉක්මවන,

යම් ව්‍යාපෘතියක් අදහස් වේ.

සැක දුරු කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා යන යෙදුම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවා ඇති පළාත් සභාවක අමාත්‍යවරයකු ද ඇතුළත් වන බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වාර්තා ආදිය ඉදිරිපත් කිරීමට පොදු අධිකාරී සතු කාර්යභාරය.

**10.** සෑම පොදු අධිකාරියක් විසින්ම පහත දැක්වෙන තොරතුරු සපයමින් එහි කාර්යාලයේ දී සහ ස්වකීය නිල වෙබ් අඩවියෙහි මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා තැබිය යුතු වාර්ෂික වාර්තා, එකී වාර්තා අදළ වන වර්ෂයට ඉක්බිතිවම එළඹෙන වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනයට පෙරාතුව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු යඃ-

(අ) වර්ෂය තුළදී ලැබුණු මුළු ඉල්ලීම් ගණන සහ සපයන ලද සහ ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු ප්‍රමාණය;

(ආ) වර්ෂය තුළදී එකතු කරනු ලැබූ ගාස්තු මුදල;

(ඇ) 5 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් ගණන;

(ඈ) කොමිෂන් සභාවේ විධානය පරිදි තොරතුරු සපයන ලද වාර ගණන;

(ඉ) විනිවිදභාවය පිළිබඳ පවත්නා ක්‍රමයේ ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යම් යෝජනා;

(ඊ) තොරතුරු සන්නිවේදනය කිරීම, ප්‍රතික්ෂේප කිරීම මගින් පැන නගින අභියාචන සංඛ්‍යාව;

(උ) වාර්තා පවත්වාගෙන යෑම, කළමනාකරණය සහ විනාශ කිරීමට අදළ පරිචයන්; සහ

(ඌ) 8 වන වගන්තිය යටතේ ස්වකීය කර්තව්‍යයන්.

IV වන කොටස

**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම.

**11** (1) මේ පනතේ කාර්යය සඳහා, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන (මේ පනතේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය මගින් එයට දෙන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් වන අතර, ඒ නාමයෙන් එය විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි විය යුතු ය.

කොමිෂන් සභාවේ සංයුතිය.

**12.** (1) කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන තැනැත්තන් පස්දෙනකුගෙන් සමන්විත විය යුතු ය. එම නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පහත සඳහන් එක් එක් සංවිධාන හෝ සංවිධාන ප්‍රභේද විසින් නම් කරනු ලබන එක් තැනැත්තකු නිර්දේශ කරනු ලැබිය යුතු යː-

(අ) නීතිඥවරයන් සහ නීති ක්ෂේත්‍රයේ විද්වත් ප්‍රජාව විමසා නීතිඥ වෘත්තියේ ප්‍රවීණත්වයක් ඇති නීතිඥවරයෙක් හෝ නීති විශාරදයෙක් නම් කළ යුතු ශ්‍රී ලංකා නීතිඥ සංගමය;

(ආ) ප්‍රකාශකවරුන්ගේ, කර්තෘවරුන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ සංවිධාන; සහ

(ඇ) වෙනත් සිවිල් සමාජ සංවිධාන.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී, නිර්දේශ කරනු ලබන තැනැත්තන් –

(i) නීතිය, පාලනය, රාජ්‍ය පරිපාලනය, සමාජ සේවා, පුවත්පත් කලාවේදී, විද්‍යා හා තාක්ෂණ හෝ කළමනාකරණ යන ක්ෂේත්‍රවල සාධනය කළ දැනීමක්, අත්දැකීම් හා ප්‍රවීනත්වය සහිත පොදු සමාජ ජීවිතයේදී සුවිශේෂී තැනැත්තන් බවට;

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හෝ, යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු නොවන බවට;





(iii) යම් රාජ්‍ය හෝ අධිකරණ ධූරයක් හෝ වෙනත් ලාභදායී ධූරයක් දරන තැනැත්තන් නොවන බවට;

(iv) යම් දේශපාලන පක්ෂයකට සම්බන්ධ නොවන බවට;

(v) යම් ව්‍යාපාරයක් කරගෙන යනු නොලබන හෝ යම් වෘත්තියක නොයෙදෙන බවට,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සහතික විය යුතු ය.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීරණය සඳහා තැනැත්තන් නම් කිරීමේ දී, එහි නිශ්චිතව දක්වා ඇති නිර්ණායක සපුරාලනු ලබන බවට (1) වන උපවගන්තියේ සඳහන් සංවිධාන විසින් සහතික විය යුතු ය. නාමිකයන් එහි සඳහන් නිර්ණායක සපුරාලනු නොලබන බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අදහස වන අවස්ථාවක දී, අලුත් නාම යෝජනා කැඳවනු ලැබිය යුතු ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්, මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට එක් මාසයක් ඇතුළත හෝ කොමිෂන් සභාවේ පුරප්පාඩුව ඇතිවීමේ දින සිට එක් මාසයක් ඇතුළත (1) වන උපවගන්තිය යටතේ ස්වකීය නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම කාලසීමාව ඇතුළත අදාළ යම් හෝ සියලුම සංවිධාන විසින් නාම යෝජනා ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අවස්ථාවක දී, එකී කාලසීමාව අවසන් වීමෙන් පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ස්වකීය නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. නාම යෝජනා ප්‍රතික්ෂේප වී ඇති අවස්ථාවක දී, එම ප්‍රතික්ෂේප වීමේ දින සිට සති දෙකක් ඇතුළත පිළිගත හැකි නාම යෝජනා නැවත ඉදිරිපත් කර නොමැති අවස්ථාවක දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ස්වකීය නාම යෝජනා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු එම ධූරය දරනු ලබන අතරතුර දී, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත්පාලන ආයතනයක සභිකයකු වශයෙන් පත් වුවහොත් හෝ යම් රාජ්‍ය හෝ අධිකරණ ධූරයක් සඳහා හෝ යම් දේශපාලන පක්ෂයක නිලධරයකු වශයෙන් තෝරා පත් කරනු ලැබුවහොත්, එවැනි සාමාජිකයකු එම පත්කිරීමෙහි සිට කොමිෂන් සභාවේ සාමාජිකයකු වීම අවසන් වන්නේ ය.

(5) ජනාධිපතිවරයා විසින්, කොමිෂන් සභාව වෙත පත් කරනු ලබන සාමාජිකයන් අතරින් එක් අයකු එහි සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයන් අවුරුදු පහක කාලසීමාවක් සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

(7) කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින් මේ පනතේ විධිවිධාන යටතේ හෙළිදරව් කළ නොහැකි තොරතුරු, හෙළිදරව් නොකළ යුතු ය.

(8) මේ පනතේ උපලේඛනයේ සඳහන් විධිවිධාන කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ එහි රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවා නියුක්තිකයන් පත් කිරීම.

**13.** (1) කොමිෂන් සභාව විසින්-

(අ) කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අධ්‍යක්ෂ ජනරාල්වරයකු;

(ආ) අවශ්‍ය බවට තීරණය කරනු ලබන යම් නිලධරයන් හා සේවා නියුක්තිකයන් සංඛ්‍යාවක්,

පත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවේ පොදු අධීක්ෂණය, විධානය හා කළමනාකරණය සම්බන්ධයෙන් හා කොමිෂන් සභාවේ නිලධරයන්ගේ සහ සේවා නියුක්තිකයන්ගේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකියනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයා හා වෙනත් නිලධරයන් සහ සේවා නියුක්තිකයන්, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන යම් නියම හා සේවා කොන්දේසිවලට යටත් විය යුතු අතර, එම අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ වෙනත් නිලධරයන් හා සේවා නියුක්තිකයන් සඳහා මුදල් විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගෙන් විමසා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.





කොමිෂන් සභාවේ කාර්ය සහ කර්තව්‍යය.

**14.** කොමිෂන් සභාවේ කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු යː-

(අ) මෙම පනත යටතේ පොදු අධිකාරීන් වෙත පවරා ඇති කාර්ය නිසි පරිදි ඉටු කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීම සහ ඒවාට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න සහතික වීම;

(ආ) ප්‍රතිසංස්කරණය සමාලෝචනය කිරීම සඳහා අවශ්‍ය පොදු නිර්දේශ ස්වභාවයකින් යුක්ත වූ සහ විශේෂයෙන් ම යම් පොදු අධිකාරියක් වෙත යොමු කරන ලද යන දෙවර්ගයේ ම නිර්දේශ සෑදීම;

(ඇ) මේ පනත යටතේ යම් තොරතුරක් නිදහස් කරනු ලැබීම පිණිස පොදු අධිකාරි විසින් අය කරනු ලබන ගාස්තු නිශ්චය කිරීම සඳහා සාධාරණත්වය පදනම් කොට ගෙන මාර්ගෝපදේශ නිකුත් කිරීම;

(ඈ) තොරතුරු නිලධරයකු විසින්, ගාස්තුවක් අය කිරීමෙන් තොරව, තොරතුරු ලබාදිය හැක්කේ කවර අවස්ථාවල දී ද යන්න නියම කිරීම;

(ඉ) තොරතුරු සැපයීම සම්බන්ධයෙන් ප්‍රගාමී හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය මත පදනම් ව, ගාස්තු උපලේඛනය නියම කිරීම;

(ඊ) මෙම පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධරයන් සමඟ සාමූහිකව කටයුතු කිරීම හෝ එම නිලධරයන් සඳහා පුහුණු කටයුතු භාර ගැනීම;

(උ) මේ පනතේ අවශ්‍යතා සහ ඒ යටතේ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ප්‍රසිද්ධියට පත් කිරීම; සහ

(ඌ) පොදු අධිකාරීන් සඳහා වාර්තා නිසි පරිදි පවත්වා ගැනීමේ මාර්ගෝපදේශ නිකුත් කිරීම.

කොමිෂන් සභාවේ බලතල.

**15.** මේ පනත යටතේ කොමිෂන් සභාවේ කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව වෙත පහත දැක්වෙන බලතල ඇත්තේ යඃ-

(අ) පරීක්ෂණ පැවැත්වීම හා එම පරීක්ෂණ සඳහා පෙනීසිටින ලෙස යම් තැනැත්තකු වෙත නියම කිරීම;

(ආ) දිව්රුම්දීම හෝ ප්‍රතිඥාදීම යටතේ එම තැනැත්තා විභාග කිරීම හා අවශ්‍ය අවස්ථාවල දී එම තැනැත්තාගේ සන්තකයේ පවතින යම් තොරතුරු සපයන ලෙස එම තැනැත්තා වෙත නියම කිරීම, එසේ වුව ද 5 වන වගන්තිය යටතේ හෙළිදරව් කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරු රහසිගතව පරික්ෂා කළ යුතු ය;

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ වූ යම් පොදු අධිකාරියක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන තොරතුරු ඇතුළුව පොදු අධිකාරියක් විසින් දරනු ලබන තොරතුරු පරීක්ෂා කිරීම;

(ඈ) යම් නිශ්චිත ආකෘතියකින් තොරතුරු සපයන ලෙස පොදු අධිකාරියක් වෙත විධාන කිරීම;

(ඉ) 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මහජනතාවගෙන් යම් පොදු අධිකාරියක් විසින් රඳවාගෙන සිටිනු ලබන තොරතුරු ප්‍රසිද්ධ කරන ලෙස එම පොදු අධිකාරිය වෙත විධාන කිරීම;

(ඊ) 32 වන වගන්තිය යටතේ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා විභාග කිරීම සහ තීරණය කිරීම; සහ

(උ) ඉල්ලා සිටිනු ලැබූ තොරතුරු නියමිත වේලාවට නොලැබීම හේතුවෙන් පුරවැසියෙකුගෙන් අය කරනු ලැබූ ගාස්තු ප්‍රතිපූර්ණය කරන ලෙස පොදු අධිකාරියක් හෝ අදාළ තොරතුරු සැපයීමේ නිලධරයකු වෙත විධාන කිරීම.

කොමිෂන් සභාවේ අරමුදල.

**16.** (1) කොමිෂන් සභාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර එම අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු යඃ-





(අ) කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල්;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ඕනෑම මූලාශ්‍රයකින් ලැබෙන පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් යම් මුදල් ලැබෙන අවස්ථාවක දී, එම පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදානවල මූලාශ්‍ර සහ ඒවා ප්‍රදානය කරනු ලබන අරමුණ ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් දරනු ලබන වියදම් පියවා ගැනීමට අවශ්‍ය වන සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**17.** (1) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, සිය ආදායම් සහ වියදම් සහ කොමිෂන් සභාවේ අනෙකුත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යා යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සඳහා අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටස අදාළ විය යුතු බව.

**18.** 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් ආදීන් රජයේ සේවකයන් විය යුතු බව.

**19.** (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා, කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ නිලධරයන් සහ අනෙකුත් සියලු සේවා නියුක්තිකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන සෑම පරීක්ෂණයක් ම, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව අධිකරණ ක්‍රියාපටිපාටියක් සේ සලකනු ලැබිය යුතු ය.

**20.** කොමිෂන් සභාව, (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය.

අල්ලස් පනත අදාළ වීම.

**21.** මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවා නියුක්තිකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහු විසින් හෝ ඔහුට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, එම ක්‍රියාව හෝ නොකර හැරීම සද්භාවයෙන් කරන ලද්දක් බවට අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ නඩුවේ දී ඔහු විසින් දරන ලද යම් වියදමක් එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කරගනු ලැබුවේ නම් මිස, කොමිෂන් සභාවේ අරමුදලින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී දරනු ලබන වියදම්.

**22.** කොමිෂන් සභාව විසින්, එය පිහිටුවීමෙන් මාස හයක් ඇතුළත, 32 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සකස්කර, ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ලබා දිය යුතු ය.

කාර්යපටිපාටික අවශ්‍යතා ප්‍රසිද්ධියට පත් කළ යුතු බව.

V වන කොටස

## තොරතුරු නිලධරයන් පත් කිරීම සහ තොරතුරුවලට ප්‍රවේශය ලබාගැනීම සඳහා වන ක්‍රියාපටිපාටිය

**23.** (1) (අ) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා, සෑම පොදු අධිකාරියක් විසින් ම, මේ පනත ක්‍රියාත්මක වීමෙන් මාස තුනක් ඇතුළත, එම පොදු අධිකාරියේ තොරතුරු නිලධරයන් වශයෙන් නිලධරයන් එක් අයෙකු හෝ ඊට වැඩි ගණනක් සහ අභියාචනා විභාග කිරීම සඳහා නම් කළ නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය.

තොරතුරු නිලධරයන් සහ නම් කළ නිලධරයන් පත් කිරීම සහ ඔවුන්ගේ කාර්ය.

(ආ) (අ) ඡේදය යටතේ තොරතුරු නිලධරයකු පත් කරනු ලබන තෙක්, පොදු අධිකාරියක ප්‍රධානියා හෝ ප්‍රධාන විධායක නිලධරයා, මේ පනතේ කාර්ය සඳහා එම පොදු අධිකාරියේ තොරතුරු නිලධරයා ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සෑම තොරතුරු නිලධරයකු විසින් ම, ඔහු හෝ ඇය තොරතුරු නිලධරයකු ලෙස පත් කරනු ලැබ ඇත්තේ යම් පොදු අධිකාරියක්





වෙනුවෙන් ද, ඒ අධිකාරිය වෙත ඉදිරිපත් කළ තොරතුරු සඳහා වන ඉල්ලීමක දී, ඒ තොරතුරු ලැබෙන්නට සැලැස්විය යුතු අතර, එවැනි ඉල්ලීමක් සිදු කරන යම් පුරවැසියකුට අවශ්‍ය සියලු සහාය ලබා දිය යුතු ය.

(3) තොරතුරු නිලධරයා විසින්, මෙම පනත යටතේ ඔහු හෝ ඇය වෙත පවරන ලද කාර්යය නිසි පරිදි ඉටු කිරීම සඳහා ඔහු හෝ ඇය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් යම් නිලධරයකුගේ සහාය ලබා ගත හැකි අතර, එසේ එවැනි නිලධරයකුගෙන් සහාය ඉල්ලා සිටි විට, එම සහාය ලබා දීම ඒ නිලධරයාගේ කාර්යය වන්නේ ය.

තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය.

**24.** (1) මේ පනත යටතේ තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන යම් පුරවැසියකු විසින්, ඉල්ලා සිටින තොරතුරු පිළිබඳ විස්තර නිශ්චිතව දක්වමින් උචිත තොරතුරු නිලධරයාට ලිඛිතව ඉල්ලීමක් කළ යුතු යඃ

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලබන යම් පුරවැසියකුට යම් හේතුවක් මත එම ඉල්ලීම ලිඛිතව කිරීමට නොහැකි අවස්ථාවක, එම ඉල්ලීම වාචිකව කිරීමට එම පුරවැසියාට හිමිකමක් ඇති අතර, ඉල්ලීම කරනු ලබන පුරවැසියා වෙනුවෙන් එම ඉල්ලීම ලිඛිතව සටහන් කර ගැනීම උචිත තොරතුරු නිලධරයාගේ කාර්යය වන්නේ ය.

(2) යම් පුරවැසියකු විසින් -

(අ) පොදු අධිකාරියක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබන අවස්ථාවක දී; හෝ

(ආ) මේ පනතේ නියමයන්ට අනුකූල නොවන ආකාරයට යම් පොදු අධිකාරියක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී,

තොරතුරු නිලධරයා විසින් මේ පනතේ විධිවිධානවලට අනුකූලවන ආකාරයට එම ඉල්ලීම ඉදිරිපත් කිරීම සඳහා ගාස්තු අයකිරීමකින් තොරව එම පුරවැසියා වෙත සහාය ලබා දීමට අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය.

(3) ඉල්ලීමක් ලැබීමේ දී, එම ඉල්ලීම ඉදිරිපත් කළ පුරවැසියා වෙත තොරතුරු නිලධරයකු විසින් වහාම එම ඉල්ලීම ලැබීම පිළිබඳ ලිඛිත දැනුම්දීමක් යොමුකරනු ලැබිය යුතු ය.

(4) ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන යම් පුරවැසියකු වෙත කඩිනම් ප්‍රතිඋත්තරයක් ලබා දීමට යම් තොරතුරු නිලධරයකුට හැකිවේ නම්, සහ එම ප්‍රතිඋත්තරය මගින් ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ පුරවැසියා සෑහීමට පත්වේ නම්, එම ඉල්ලීම හා ඒ සඳහා ලබා දුන් ප්‍රතිඋත්තරය පිළිබඳ තොරතුරු නිලධරයා විසින් වාර්තාවක් සකස් කර තබා ගත යුතු වේ.

(5) තොරතුරු සඳහා යම් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන පුරවැසියකු විසින්:-

(අ) තොරතුරු හඳුනාගැනීම සඳහා තොරතුරු නිලධරයා වෙත හැකියාව ලැබෙන පරිදි, සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි, ඉල්ලා සිටිනු ලබන තොරතුරුවලට අදාළ විස්තර සපයනු ලැබිය යුතු ය;

(ආ) එම පුරවැසියා තොරතුරුවලට ප්‍රවේශ වීමට අපේක්ෂා කරනු ලබන ආකෘතියේ ස්වභාවය හා භාෂාව හඳුනා ගනු ලැබිය යුතු ය;

(ඇ) යම් තැනැත්තකුගේ ජීවිතය ආරක්ෂා කර ගැනීම හෝ නිදහස ආරක්ෂා කර ගැනීම සඳහා තොරතුරු අවශ්‍ය බවට විශ්වාස කරනු ලබන අවස්ථාවක දී, එම විශ්වාස කිරීම පිළිබඳ පදනම ඇතුළුව ඒ සඳහා වූ ප්‍රකාශයක් ඇතුළත් කළ යුතු ය; සහ

(ඈ) ඔහු හෝ ඇය සම්බන්ධ කරගත හැකි අවශ්‍ය විස්තර හැර, තොරතුරු ඉල්ලා සිටීමට හේතු කිසිවක් හෝ වෙනත් පුද්ගලික විස්තර ලබා දීම අවශ්‍ය නොවන්නේ ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා -

"ලිඛිතව" යන්නට විද්‍යුත් මාර්ගයෙන් කරනු ලබන ලිඛිතව වූ කරුණු ද ඇතුළත් වේ; සහ

"උචිත තොරතුරු නිලධරයා" යන්නෙන් තොරතුරු ඉල්ලා සිටින පොදු අධිකාරියට පත් කරනු ලැබ සිටින තොරතුරු නිලධරයා අදහස් වේ.





24 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සඳහා තීරණය.

**25.** (1) තොරතුරු නිලධරයකු විසින්, හැකි ඉක්මණින් සහ කෙසේ වුව ද 24 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ලැබී වැඩ කරන දින දාහතරක් ඇතුළත 14 (ඉ) වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු උපලේඛනය ප්‍රකාරව නිශ්චය කරනු ලබන ගාස්තුවක් ගෙවීම මත ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීමට හෝ මේ පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති හේතුවලින් යම් එක් හේතුවක් හෝ ඊට වැඩි ගණනක් මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හෝ තීරණය කළ යුතු අතර, එම තීරණය, ඉල්ලීම කළ පුරවැසියා හට වහාම සන්නිවේදනය කළ යුතු ය.

(2) ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීම සඳහා තීරණයක් ගනු ලබන අවස්ථාවක, එම තොරතුරුවලට ප්‍රවේශ වීම, එම තීරණයට එළඹීමෙන් දින දාහතරක් ඇතුළත ප්‍රදානය කළ යුතු ය.

(3) තොරතුරු ලබාගැනීම සඳහා වන ඉල්ලීම, යම් පුරවැසියකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වන අවස්ථාවක, එම ඉල්ලීම සඳහා ප්‍රතිචාර දැක්වීම, ඉල්ලීම ලැබීමෙන් පැය හතලිස් අටක් ඇතුළත කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් ගාස්තුවක් ගෙවීමට ඇති අවශ්‍යතාවය නොතකා, ගාස්තුවක් ගෙවීමෙන් තොරව තොරතුරු නිලධරයකු විසින් තොරතුරු සපයනු ලැබිය හැකි අවස්ථාවන් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(5) තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා ලබා දී ඇති (2) වන උපවගන්තියේ සඳහන් දින දාහතරක කාලසීමාව-

(අ) ඉල්ලීම කරනුයේ විශාල වාර්තා ප්‍රමාණයක් සඳහා වේ නම් සහ දින දාහතරක කාලසීමාවක් ඇතුළත තොරතුරු සැපයීම අදාළ පොදු අධිකාරියේ කටයුතු සමග අසාධාරණ ලෙස මැදිහත්වීමක් සිදුවේ නම්; හෝ

(ආ) ඉල්ලීම මගින් ඉල්ලා ඇති තොරතුරු ලබාගත යුතු පොදු අධිකාරියේ කාර්යාලය එම තොරතුරු නිලධරයාගේ මහා නගරයේ, නගරයේ නොවන හෝ වෙනත් ස්ථානයක පිහිටා ඇති විට, වාර්තා සොයා බැලීම හෝ එම කාර්යාලයෙන් වාර්තා ලබා ගැනීම තොරතුරු නිලධරයාට සාධාරණව දින දාහතරක් තුළ සම්පූර්ණ කළ නොහැකි අවස්ථාවක දී,

දින විසි එකකට වැඩි නොවන තවදුරටත් වූ කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තියේ සඳහන් යම් අවස්ථානුගත කරුණක් හේතුවෙන් තොරතුරු සැපයීමේ කාලසීමාව දීර්ඝ කිරීමට සිදුවන අවස්ථාවක දී, තොරතුරු නිලධරයා විසින්, හැකි සාධාරණ ඉක්මණින් සහ එහෙත් ඕනෑම අවස්ථාවක දී දින දාහතරක් ඇතුළත, අදාළ පුරවැසියා වෙත පහත සඳහන් කරුණු ඉදිරිපත් කරමින් එම කරුණ දැනුම් දිය යුතු වේ:-

(අ) දීර්ඝ කිරීමේ කාලසීමාව; සහ

(ආ) දීර්ඝ කිරීමේ හේතු.

(7) (6) වන උපවගන්තිය යටතේ ලබා දී ඇති හේතුවලින් අතෘප්තියට පත්වන යම් පුරවැසියකු විසින් නම් කළ නිලධරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

පොදු අධිකාරීන් විසින් තොරතුරු නිලධරයන් පිළිබඳ සහ අයකරනු ලබන ගාස්තු පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කළ යුතු බව.

**26.** (1) සෑම පොදු අධිකාරියක් විසින් ම පහත දැක්වෙන කරුණු නිශ්චිතව දක්වමින් කාර්යාල පරිශ්‍රය තුළ ප්‍රකටව පෙනෙන ස්ථානයක සහ එම පොදු අධිකාරියේ වෙබ් අඩවියක් ඇත්නම් එම වෙබ් අඩවියේ නිවේදනයක් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය:-

(අ) කොමිෂන් සභාව හා සම්බන්ධ වීමේ විස්තර සහ කොමිෂන් සභාවේ සාමාජිකයන් පිළිබඳව;

(ආ) තොරතුරු නිලධරයාගේ සම්බන්ධ වීමේ විස්තර;

(ඇ) නම් කළ නිලධරයාගේ සම්බන්ධ වීමේ විස්තර; සහ

(ඈ) එම පොදු අධිකාරියෙන් ඕනෑම තොරතුරක් ලබා ගැනීම සඳහා අයකරනු ලබන ගාස්තු පිළිබඳව.

(2) (1) (ඈ) උපවගන්තියේ සඳහන් ගාස්තුව 14 (ඉ) වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් සකස්කර ඇති ගාස්තු උපලේඛනය ප්‍රකාරව නිශ්චය කරනු ලැබිය යුතු ය.





තොරතුරු සපයන ආකාරය.

**27.** (1) තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීමකට ඉඩ දීමට තීරණයක් ගෙන ඇති අවස්ථාවක, එම තොරතුරු, ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙහි සැපයීම අදාළ ලේඛනයේ හෝ වාර්තාවේ සුරක්ෂිතභාවයට හෝ ආරක්ෂාවට අගතිදායක නොවන බව තොරතුරු නිලධරයාගේ මතය වන්නේ නම් මිස, එම තොරතුරු ඉල්ලා සිටින ලද ආකෘතියෙහි සපයනු ලැබිය යුතු ය.

(2) ඉල්ලා සිටිනු ලබන ආකාරයට තොරතුරු සැපයීම සඳහා තොරතුරු නිලධරයකු අපොහොසත් වන අවස්ථාවක දී, තොරතුරු වෙත ප්‍රවේශ වීමේ උචිත විකල්ප ක්‍රමයක් තීරණය කිරීම සඳහා පුරවැසියාගෙන් උපදෙස් ලබා ගැනීම සහ හැකි සියලු සහාය එම පුරවැසියාට ලබාදීම මෙන්ම එම ඉල්ලීම ප්‍රකාරව ක්‍රියා කිරීම සඳහා පහසුකම් සැලැස්වීම එකී නිලධරයාගේ කාර්යය වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, තොරතුරු ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමකට ඉඩ ලබා දී ඇත්තා වූ යම් පුරවැසියකු හට -

(අ) අදාළ වැඩ, ලේඛන, වාර්තා අධීක්ෂණය කිරීම සඳහා;

(ආ) අදාළ ලේඛනයෙන් හෝ වාර්තාවලින් සටහන්, උද්ධෘත හෝ සහතික පිටපත් ලබා ගැනීම සඳහා;

(ඇ) අදාළ ද්‍රව්‍යයන්ගේ සහතික කළ නිදර්ශන ලබා ගැනීම සඳහා;

(ඈ) එම තොරතුරු පරිගණකයක හෝ වෙනත් යම් උපාංගයක ගබඩා කර ඇති අවස්ථාවක දී, ඩිස්කට්, ප්ලොපි, පටි, දෘෂ්‍ය කැසට්පට හෝ වෙනත් යම් විද්‍යුත් ක්‍රමයකින් හෝ මුද්‍රිත පිටපත් වශයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා,

හිමිකමක් ඇත්තේ ය.

ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ සන්නිවේදනය කිරීම.

**28.** තොරතුරු නිලධරයකු විසින්, තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ අවස්ථාවක දී, එම නිලධරයා විසින් එම ඉල්ලීම කළ පුරවැසියා වෙත 25 (1) වගන්තිය යටතේ යවනු

ලැබීමට නියමිත සන්නිවේදනයේ පහත දැක්වෙන තොරතුරු නිශ්චිතව දන්වා යැවිය යුතු යː-

(අ) එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු; සහ

(ආ) මෙම පනතේ 32 වන වගන්තිය යටතේ එම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචනයක් යොමු කළ හැක්කේ කවර කාලසීමාවක් ඇතුළත ද යන්න සහ එම අභියාචනය යොමු කළ හැක්කේ කවර තැනැත්තකු වෙත ද යන්න.

ඉල්ලා සිටින තොරතුරු තුන්වන පාර්ශවයක් විසින් සපයා ඇති අවස්ථාවක.

**29.** (1) යම් පුරවැසියකු විසින් තොරතුරු නිලධරයකුගෙන් ඉල්ලා ඇති තොරතුරු, තුන්වන පාර්ශවයකට අදාළ හෝ තුන්වන පාර්ශවයක් විසින් සපයන ලද අවස්ථාවක දී සහ එම තොරතුරු සපයනු ලබන අවස්ථාවේ දී එය රහසිගත තොරතුරක් වශයෙන් සලකනු ලැබූ අවස්ථාවක, තොරතුරු සැපයීමේ නිලධරයා විසින් එම ඉල්ලීම ලැබීමෙන් දින හතක් ඇතුළත දී, එම තොරතුරු හෙළිදරව් කිරීමට පක්ෂව හෝ විරුද්ධව එකී තුන්වන පාර්ශවය විසින් නිවේදන ලැබී දින හතක කාලයක් ඇතුළත නියෝජන ඉදිරිපත් කරන ලෙස ලිඛිත නිවේදනයක් නිකුත් කිරීම මගින් එකී තුන්වන පාර්ශවය වෙත ආරාධනා කරනු ලැබිය යුතු ය.

(2) තොරතුරු නිලධරයකු විසින්, තුන්වන පාර්ශවයකට අදාළ හෝ තුන්වන පාර්ශවයක් විසින් සපයා ඇති තොරතුරක් හෙළිදරව් කිරීම සඳහා වන ඉල්ලීමක් සම්බන්ධයෙන් තීරණයක් ගනු ලැබීමේ දී, (1) වන උපවගන්තිය යටතේ එම තුන්වන පාර්ශවය විසින් කරන ලද නියෝජනය සැලකිල්ලට ගත යුතු අතර, තුන්වන පාර්ශවය විසින් -

(අ) එම නිවේදනයට ප්‍රතිචාර දක්වනු නොලබන අවස්ථාවක දී, ඒ ඉල්ලා සිටිනු ලබන තොරතුරු හෙළිදරව් කළ යුතු ය;

(ආ) එම නිවේදනයට ප්‍රතිචාර දක්වා ඒ ඉල්ලා ඇති තොරතුරු හෙළිදරව් කිරීමට එකඟ වී ඇති අවස්ථාවක දී, එම තොරතුරු හෙළිදරව් කළ යුතු ය;

(ඇ) එම නිවේදනයට ප්‍රතිචාර දක්වා, ඒ ඉල්ලා ඇති තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, ඉල්ලා සිටිනු ලබන තොරතුරු වෙත ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු යː





එසේ වුව ද, අදාළ තොරතුරු මුදා හැරීම, එම තොරතුරු හෙළිදරව් නොකිරීමේ පුද්ගලික බැඳියාවට, වඩා වැදගත්කමින් වැඩිවන අවස්ථාවක දී ඉල්ලීම කරනු ලබන පුරවැසියා විසින් තත්කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, කොමිෂන් සභාව විසින්, තෙවන පාර්ශවයක් විසින් එම අනාවරණය කිරීමට එරෙහිව ඉදිරිපත් කරනු ලබන යම් විරෝධතා නොතකා ප්‍රශ්නගත තොරතුරු අනාවරණය කරන ලෙස විධාන කරනු ලැබිය හැකි ය.

සිවිල් හෝ අපරාධ නඩුකරවලට එරෙහිව ආරක්ෂාව.

**30.** මේ පනත යටතේ තොරතුරු නිලධරයකුට නියම කරනු ලැබූ හෝ පවරනු ලැබූ කර්තව්‍යයක් හෝ බලයක් ඉටු කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී, එම නිලධරයා සද්භාවයෙන් කරන ලද කවර වූ ක්‍රියාවක් හේතුකොටගෙන ඒ පොදු අධිකාරිය හෝ ඒ පොදු අධිකාරියේ තොරතුරු නිලධරයා හෝ වෙනත් යම් නිලධරයකු හෝ කිසිදු සිවිල් හෝ අපරාධ වගකීමකට යටත් නොවිය යුතු ය.

## VI වන කොටස

### ප්‍රතික්ෂේප කිරීම්වලට එරෙහි වූ අභියාචනා

ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමට එරෙහි අභියාචනා.

**31.** (1) (අ) තොරතුරු ඉල්ලීම සඳහා කරන ලද යම් ඉල්ලීමක් භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම -

(ආ) 5 වන වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරු හේතුවෙන් යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීම සඳහා අවස්ථාව ලබා දීම ප්‍රතික්ෂේප කිරීම;

(ඇ) මේ පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාලසීමාවන්ට අනුකූල නොවීම;

(ඈ) සම්පූර්ණ නොවූ, නොමග යවන හෝ සාවද්‍ය තොරතුරු ප්‍රදානය කිරීම;

(ඉ) වැඩිපුර ගාස්තු අයකිරීම;

(ඊ) ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙන් තොරතුරු සැපයීමට තොරතුරු නිලධරයා විසින් ප්‍රතික්ෂේප කිරීම;

(උ) එම තොරතුරු වෙත එම පුරවැසියා ප්‍රවේශවීම වැළැක්වීම ඳහා එම තොරතුරු විකෘතිකර, විනාශකර හෝ අස්ථානගතකර ැති බවට එම තොරතුරු ඉල්ලා සිටිනු ලබන පුරවැසියා හට ාධාරණ හේතු පැවතීම,

ත අතෘප්තියට පත්වන යම් පුරවැසියකු විසින්, අවස්ථාවෝචිත රිදි එම ප්‍රතික්ෂේප කිරීම, ක්‍රියාව හෝ අභියාචනයක් කිරීම සඳහා ේතු පවතින බව දැනගත් දින සිට දින දාහතරක කාලයක් ඇතුළත ම් කළ නිලධරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය ැකි යඃ

එසේ වුව ද අභියාචකට පාලනය කළ නොහැකි හේතුවක් නිසා භියාචනය ගොනු කිරීමෙන් අභියාචක වළක්වා ඇති බවට නම් ළ නිලධරයා සෑහීමට පත් වේ නම් පමණක් දින දහතරක ාලසීමාව අවසන්වීමෙන් පසුව ඔහු හෝ ඇය විසින් එම අභියාචනය ිළිගනු ලැබිය හැකි ය.

(2) නම් කළ නිලධරයා විසින්, ඕනෑම අවස්ථාවක දී, එසේ වුවත් ැඩකරන දින තුනක කාලයක් ඇතුළත, අභියාචනය කරනු ලබන ුරවැසියා වෙත එම අභියාචනය භාර ගැනීමේ දී, කුවිතාන්සියක් ිකුත් කළ යුතු ය.

(3) නම් කළ නිලධරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සඳහන් ර ඇති යම් අභියාචනයක් පිළිබඳ තීරණය, එම අභියාචනය ලැබී ති තුනක කාලයක් ඇතුළත ලබාදිය යුතු අතර, ඒ සඳහා වූ නිශ්චිත දනම ඇතුළුව එම තීරණය සඳහා වූ හේතු ද දැක්විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කිරීම ඳහා වූ යම් පුරවැසියකුගේ අයිතිවාසිකම, කොමිෂන් සභාව වෙත හු හෝ ඇය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකමට ගතිගාමී නොවිය යුතු ය.

(5) අභියාචනය ඉදිරිපත් කරනු ලබන පුරවැසියා විසින් (1) වන පවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත එම අභියාචනය ඉදිරිපත් ිරීමට අපොහොසත් වීම පිළිබඳ සාධාරණ හේතු ඉදිරිපත් කර ැති අවස්ථාවක දී, නම් කළ නිලධරයා විසින් ස්වකීය අභිමතය රිදි එම ප්‍රමාදය නොසලකමින් අභියාචනය විභාග කරනු ලැබිය ැකි ය.





කොමිෂන් සභාවට කරනු ලබන අභියාචන.

**32.** (1) (අ) 31(1) වගන්තිය යටතේ වන අභියාචනයක් සම්බන්ධයෙන් කරන ලද තීරණයෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින්, එම තීරණය සන්නිවේදනය කිරීමෙන් මාස දෙකක් ඇතුළත දී; හෝ

(ආ) 31 (3) වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාලය ඇතුළත තීරණයක් ලබා දිය යුතු යම් අභියාචනයකට තීරණය ලබා ගැනීමට නොහැකි වීමෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින්, එසේ නිශ්චිතව දක්වා ඇති කාලය ඉකුත් වීමෙන් මාස දෙකක් ඇතුළත දී,

එම තීරණයට හෝ තීරණය ලබා ගැනීමට නොහැකි වීමට එරෙහිව කොමිෂන් සභාවට අභියාචනා කළ හැකි අතර, කොමිෂන් සභාව විසින්, එම අභියාචනය ලැබීමෙන් දින තිහක් ඇතුළත අභියාචනා කොට ඇත්තේ කවර තීන්දුවකට එරෙහිව ද එම තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම, හෝ ප්‍රතිවර්තනය කිරීම කළ හැකි අතර, එම ඉල්ලීම අවශ්‍ය කටයුතු සඳහා අදාළ තොරතුරු නිලධරයාට නැවතත් යැවිය හැකි ය.

(2) අභියාචකට පාලනය කළ නොහැකි හේතුවක් නිසා නියමිත කාලයේ දී අභියාචන ගොනු කිරීමෙන් අභියාචක වළක්වා ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වේ නම්, එම මාස දෙකක කාලය අවසන් වීමෙන් පසුව කොමිෂන් සභාව විසින් අභියාචනය භාරගනු ලැබිය හැකිය.

(3) කොමිෂන් සභාව විසින් අභියාචක වෙත, තොරතුරු නිලධරයා වෙත සහ අදාළ අධිකාරිය වෙත ස්වකීය තීරණ සඳහා වූ හේතු ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) අභියාචනයක් ඉදිරිපත්කර ඇති අවස්ථාවක දී, ඉල්ලීමක් සකස් කිරීමේ දී පනතට එකඟව ක්‍රියාකර ඇති බව පෙන්වාදීම සඳහා වූ ඔප්පු කිරීමේ භාරය පොදු අධිකාරිය වෙත පැවරී ඇත්තේ ය.

අගතියට පත් පාර්ශවයක් වෙනුවෙන් අභියාචනය කළ හැකි බව.

**33.** අතෘප්තියට පත් පාර්ශවය විසින් අවස්ථාවෝචිත පරිදි, 31 වන වගන්තිය හෝ 32 වන වගන්තිය යටතේ යම් හේතුවක් මත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අගතියට පත් පාර්ශවය විසින් ලිඛිතව නිසි පරිදි බලය පවරනු ලබන වෙනත් යම් තැනැත්තකු මාර්ගයෙන් එම අභියාචනය යොමු කළ හැකි ය.

අභියාචනාධිකරණය වෙත අභියාචන ඉදිරිපත් කිරීම.

**34.** (1) 32 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් දෙන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් පුරවැසියකු හෝ පොදු අධිකාරියක් විසින්, ඒ තීරණයට එරෙහිව, එම තීරණය එකී පුරවැසියාට හෝ පොදු අධිකාරිය වෙත දැනුම් දෙනු ලැබූ දිනයේ සිට මාසයක් ඇතුළත අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ යම් අභියාචනයකට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තෙක්, අභියාචනාධිකරණයට ප්‍රතිශෝධන මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමකට අදාළව එම ව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම අභියාචනයක් සම්බන්ධයෙන් ම අදාළ කර ගනු ලැබිය යුතු ය.

## VII වන කොටස

### සාමාන්‍ය

තීරණයක් සම්බන්ධයෙන් හේතු හෙළිදරව් කිරීමේ යුතුකම.

**35.** යම් තැනැත්තකුට කවර හෝ ආකාරයකින් බලපාන තීරණයක් ලබා දෙන යම් පොදු අධිකාරියක සෑම නිලධරයකුම, අදාළ තැනැත්තා විසින් තත්කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක දී, එම තීරණයට එළඹීම සඳහා වූ හේතු එම තැනැත්තාට ලිඛිතව හෙළිදරව් කළ යුතු ය.

මේ පනතේ කිසිවක් මගින් තොරතුරු ප්‍රසිද්ධ කිරීමෙන් අධෛර්යමත් කිරීම හෝ වැළැක්වීමක් සිදු නොවන බව.

**36.** මේ පනතේ කිසිවක් මගින්, නීතියට එකඟව යථා පරිදි ක්‍රියා කිරීමේ දී යම් තොරතුරු දරන්නන් විසින් තොරතුරු ප්‍රසිද්ධ කිරීමෙන් හෝ තොරතුරු වෙත ප්‍රවේශය ලබා දීමෙන් හෝ යම් තැනැත්තකු විසින් තොරතුරු සෙවීමෙන් සහ තොරතුරු ලබාගැනීමෙන්, වැළැක්වීමක් හෝ අධෛර්යමත් කිරීමක් සිදුවන බව අදහස් නොවිය යුතු ය.

කොමිෂන් සභාව විසින් ස්වකීය කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කළ යුතු බව.

**37.** (1) අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන පරිදි නොයෙක් විට, එහෙත් එක් ලිත් වර්ෂයකට යටත් පිරිසෙයින් එක් වාර්තාවක් පිළියෙල වන සේ, කොමිෂන් සභාව විසින් එහි කටයුතු පිළිබඳ වාර්තා පිළියෙල කළ යුතු ය. එසේ පිළියෙල කරනු ලබන සෑම වාර්තාවක ම පිටපතක් කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට පාර්ලිමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු අතර, එක් එක් වාර්තාවේ පිටපතක් ජනාධිපතිවරයාට ද යැවිය යුතු ය.





(2) (1) වන උපවගන්තිය යටතේ සකස් කරන ලද වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් සති දෙකක් ඇතුළත දී, කොමිෂන් සභා කාර්යාලයේ දී මහජන පරීක්ෂාව සඳහා තැබීමට සැලැස්විය යුතු අතර, හැකි සෑම අවස්ථාවක දී ම එහි පිටපතක් කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

කොමිෂන් සභාව විසින් නිසි විනය බලධරයා වෙත දැනුම්දීම.

**38.** (1) (අ) යම් තොරතුරු නිලධරයකු විසින් සිතාමතාම -

(i) යම් පුරවැසියකුගේ තොරතුරු ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක් ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී;

(ii) ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ හේතු දැන්වීමකින් තොරව තොරතුරු සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී;

(iii) 14 (ඉ) වගන්තියේ ගාස්තු උපලේඛනය උල්ලංඝනය කරමින් ඉහළ ගාස්තු නිර්දිෂ්ඨ කරනු ලබන අවස්ථාවක දී;

(iv) මෙම පනතේ විධිවිධානවලට අනුකූලව ඉල්ලීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී; හෝ

(ආ) යම් නම් කළ නිලධරයකු විසින් සිතාමතාම -

(i) මේ පනතේ 5 වන වගන්තියේ සඳහන් හේතුවක් මත හැර, වෙනත් යම් හේතුවක් නිසා 31 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී; හෝ

(ii) 31 (3) වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත, සිදුකරන ලද අභියාචනයක් පිළිබඳ තීරණයක් ලබා දීමට කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හැරීම සිදුකරනු ලබන අවස්ථාවක දී,

කොමිෂන් සභාව විසින් එම කරුණ පිළිබඳව නිසි විනය බලධරයාගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(2) අදාළ විනය බලධරයා විසින් එම අධිකාරිය වෙත යොමු කරන ලද යම් කරුණක් සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව මාසයක කාලයක් ඇතුළත කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු ය.

වැරදි.

**39.** (1) (අ) තොරතුරු සැපයීම සිතාමතා අවහිර කරනු ලබන හෝ චේතනාන්විතව වැරදි සහගත, අසම්පූර්ණ හෝ නිවැරදි නොවන තොරතුරු සපයනු ලබන;

(ආ) එම පොදු අධිකාරියේ ඔහු හෝ ඇයගේ සේවා නියුක්තිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ලබා ගත් දැනුම හෝ තමා වෙත ප්‍රවේශයක් ඇති, තොරතුරු චේතනාන්විතව විනාශ කරනු ලබන, අවලංගු කරනු ලබන, වෙනස් කරනු ලබන හෝ පූර්ණ හෝ අර්ධ වශයෙන් වසන් කරනු ලබන; හෝ

(ඇ) කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටීමේ දී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන;

(ඈ) කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිට කොමිෂන් සභාව විසින් කරනු ලබන පරීක්ෂණ පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන හෝ ඔහුගේ භුක්තියේ හෝ බලය යටතේ පවතින යම් තොරතුරු ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන හෝ දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම යටතේ චේතනාන්විතව සාවද්‍ය තොරතුරු සපයනු ලබන;

(ඉ) කොමිෂන් සභාවේ තීරණයකට අනුකූලවීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන;

(ඊ) මේ පනත මගින් කොමිෂන් සභාව වෙත පැවරී ඇති හෝ එම කොමිෂන් සභාවේ යම් නිලධරයකු හෝ සේවානියුක්තිකයකු වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කොමිෂන් සභාව හෝ එහි යම් නිලධරයකු හෝ සේවානියුක්තිකයකු වළක්වන හෝ අවහිර කරනු ලබන;

(උ) මෙම පනතේ 12 (7) වගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන ආකාරයට යම් තොරතුරක් හෙළිකරනු ලබන,

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු





විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩ මුදලකට හෝ අවුරුදු දෙකක කාලයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම එම තැනැත්තා යටත් විය යුතු ය.

(2) 23 (3) වගන්තිය යටතේ තොරතුරු නිලධරයකු විසින් සහාය ඉල්ලා සිටියේ යම් නිලධරයකුගෙන් ද ඒ නිලධරයා විසින් සාධාරණ හේතුවක් නොමැතිව ඒ සහාය ලබා දීම පැහැර හරින විට, ඒ නිලධරයා මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයා විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්තිවල සඳහන් කරන ලද යම් වරදක් සිදු කිරීම වෙනුවෙන් පනවන ලද දඩය, මේ පනත යටතේ පනවන ලද කාර්යයක් කරගෙන යාම පැහැර හැරීම වෙනුවෙන්, විනය ක්‍රියා මාර්ගයක් ගැනීමට බලය පවරා ඇති අදාළ අධිකාරිය විසින් ඒ නිලධරයාට එරෙහිව ගනු ලැබිය හැකි යම් විනය ක්‍රියා මාර්ගයකට හානියක් නොවන අමතර දඩයක් විය යුතු ය.

(4) මෙම පනත යටතේ අපරාධ නඩු පැවරීමක් කොමිෂන් සභාව විසින් ආරම්භ කළ යුතු ය.

පොදු අධිකාරියක නිලධරයකු විසින් තොරතුරු නිදහස් කිරීම හෝ හෙළිදරව් කිරීම.

**40.** යම් පොදු අධිකාරියක කිසිදු නිලධරයකු හෝ සේවා නියුක්තිකයකු වීම හේතුවෙන්, යම් නීතිමය හෝ වෙනත් බැඳීමකට යටත් වන යම් තැනැත්තකු, එම නීතිමය හෝ බැඳීම කුමක් වුවත් මේ පනත යටතේ නිදහස් කිරීමට හෝ හෙළිදරව් කිරීමට අවසර දෙනු ලබන යම් තොරතුරු, නිදහස් කිරීම හෝ හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් විනයානුකූල හෝ අන්‍යාකාර වූ යම් දඬුවමකට යටත් නොවිය යුතු ය.

නියෝග.

**41.** (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව විමසා මේ පනත යටතේ නියම කිරීම අවශ්‍ය වන සියලු කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනතේ මූලධර්ම සහ විධිවිධාන බලාත්මක කිරීම සඳහා නියෝග සෑදීමට අවශ්‍ය විය හැකි සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ නියෝග එසේ පළ

කරනු ලබන දිනයෙහි හෝ ඒ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කළ පසු නොපමාව අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කළ සේ සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**42.** (1) කොමිෂන් සභාව විසින් පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි යඃ- රීති.

(අ) කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු ආකෘතිය සහ ආකාරය;

(ආ) පරීක්ෂණයක් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඇ) තොරතුරු සැපයීම සම්බන්ධයෙන් වූ ගාස්තු උපලේඛනය;

(ඈ) 10 වන වගන්තිය යටතේ සකස් කළ යුතු වාර්තාවල ආකෘතිය.

(2) මේ වගන්තිය යටතේ සාදන ලද කිසිදු රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කර, ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

**43.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස- අර්ථ නිරූපණය.

"පුරවැසියා" යන්නට, යම් ව්‍යවස්ථාපිත වූ හෝ ව්‍යවස්ථාපිත නොවූ මණ්ඩලයක සාමාජිකයන්ගෙන් හතරෙන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් පුරවැසියන් වන්නේ නම්, එවැනි මණ්ඩලයක් ඇතුළත් වේ;





"නම් කළ නිලධරයා" යන්නෙන්, මෙම පනතේ 23 වන වගන්තිය යටතේ පත් කරනු ලැබ ඇති අභියාචන විභාග කිරීමේ නිලධරයකු අදහස් වේ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත මගින් පිහිටුවන ලද හෝ පිහිටුවන ලදැයි සලකන හෝ ඇති කරන ලද හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ හෝ වෙනත් යම් පනතක විධිවිධාන යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක්, මණ්ඩපයක් හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් අදහස් වේ;

"තොරතුරු" යන්නට, පහත සඳහන් ඒවායේ භෞතික ස්වරූපය හෝ ස්වභාවය නොසලකා, සටහන්, ලේඛන, සංදේශ, විද්‍යුත් තැපැල්, මත, උපදේශ, මාධ්‍ය නිවේදන, චක්‍රලේඛ, නියම, ලොග් පොත්, ගිවිසුම්, වාර්තා, ප්‍රවෘත්ති පත්‍ර, සාම්පල්, ආදර්ශක, හුවමාරු වන ලිපි, සංදේශ, නීති කෙටුම්පත්, පොත්, පිඹුරු, සිතියම්, චිත්‍ර, රූපසටහන්, රූපමය හෝ ප්‍රස්තාරමය වැඩ හෝ ඡායාරූප, සේයාපට, ක්ෂුද්‍ර සේයාපට, ශබ්ද පටිගත කිරීම්, වීඩියෝ පට, යන්ත්‍ර මගින් කියවිය හැකි වාර්තා, පරිගණක වාර්තා සහ වෙනත් ලේඛනගත ද්‍රව්‍ය, ඇතුළු යම් ආකාරයකින් ලේඛනගත කරන ද්‍රව්‍ය සහ ඒවායේ යම් පිටපත් ඇතුළත් වේ;

"තොරතුරු නිලධරයා" යන්නෙන්, මේ පනතේ 23 වන වගන්තිය යටතේ පත් කරනු ලබන තොරතුරු සපයන නිලධරයකු අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහා නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් මගින් ක්‍රියාත්මක කරනු ලබන, කරනු ලබන සහ ඉටු කරනු ලබන බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අනුරූපි හෝ සමාන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා යම් නීතියක් යටතේ ඇති කරනු ලබන හෝ පිහිටුවනු ලබන යම් අධිකාරියක් ද අදහස් වේ;

"රාජ්‍ය නොවන සංවිධාන" යන්නෙන්, ස්වේච්ඡා පදනම මත පුද්ගල කණ්ඩායමක් විසින් ඇතිකරන ලද, රජයෙන් හෝ ජාත්‍යන්තර සංවිධානවලින් සෘජුව හෝ වක්‍රව අරමුදල් ලැබෙන, රාජ්‍ය නොවන ආකාරයේ සංවිධාන අදහස් වේ;

"පොදු අධිකාරිය"යන්නෙන් -

(අ) ආණ්ඩුවේ අමාත්‍යාංශයක්;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ (ඉ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට හැර 2007 අංක 7 දරන සමාගම් පනත හැර යම් ලිඛිත නීතියක්, හෝ පළාත් සභාවක ප්‍රඥප්තියක් මගින් හෝ යටතේ පිහිටුවන ලද යම් මණ්ඩලයක් හෝ කාර්යාලයක්;

(ඇ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්;

(ඈ) රාජ්‍ය සංස්ථාවක්;

(ඉ) සිය කොටස්වලින් සියයට විසිපහක් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් හෝ අන්‍යාකාරයකින් පාලන අයිතියක් ඇති රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ රජය සහ රාජ්‍ය සංස්ථාවක් එකතුව දරනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක්;

(ඊ) පළාත් පාලන ආයතනයක්;

(උ) ආණ්ඩුව හෝ එහි නියෝජ්‍යායතනයක හෝ පළාත් පාලන ආයතනයක කොන්ත්‍රාත්තුවක්, හවුල් ව්‍යාපාරයක්, ගිවිසුමක් හෝ බලපත්‍රයක් යටතේ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයක් ඉටුකරන එහෙත් ඒ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයන්ගෙන් හෝ පොදු සේවාවන්ගෙන් ආවරණය වූ ක්‍රියාකාරකම් ප්‍රමාණයකට පමණක් සීමා වූ පෞද්ගලික හිමිකාරීත්වයක් හෝ සංවිධානයක්;

(ඌ) පළාත් සභාවක් විසින් පිහිටුවන ලද හෝ ඇති කරන ලද යම් දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් අධිකාරියක් හෝ ආයතනයක්;





(එ) මහජනතාව වෙත සේවයක් ලබාදෙනු ලබන සහ ඉල්ලා සිටින ලද තොරතුරු මහජනතාව වෙත ලබාදෙනු ලබන සේවයට අදාළ වනතාක් දුරට ආණ්ඩුව හෝ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක් මගින් පිහිටුවන ලද හෝ ඇතිකරන ලද වෙනත් අධිකාරියක් හෝ විදේශීය ආණ්ඩුවක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් මගින් සැලකිය යුතු ප්‍රමාණයේ අරමුදල් සපයනු ලබන රාජ්‍ය නොවන සංවිධාන;

(ඒ) යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලබන, හඳුනාගනු ලබන හෝ බලපත්‍රයක් ලබා දෙනු ලබන හෝ රජය මගින් හෝ රාජ්‍ය සංස්ථාවක් මගින් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇති කරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මූල්‍යාධාර සපයන පෞද්ගලික විශ්වවිද්‍යාල සහ වෘත්තීය ආයතන ඇතුළු උසස් අධ්‍යාපන ආයතන;

(ඔ) යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලබන, පිළිගනු ලබන හෝ බලපත්‍රයක් ලබා දෙනු ලබන හෝ රජය මගින් හෝ රාජ්‍ය සංස්ථාවක් මගින් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇති කරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මූල්‍යාධාර සපයන වෘත්තීය හෝ කාර්මික අධ්‍යාපනය ලබා දෙන ආයතන ඇතුළු පුද්ගලික අධ්‍යාපන ආයතන;

(ඕ) යුක්තිය පසිඳලීම සඳහා ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකරණ හා ආයතන,

අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**44.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය

12 (8) වන වගන්තිය

**කොමිෂන් සභාවේ සාමාජිකයන්ට අදාළ වන විධිවිධාන**

(1) කොමිෂන් සභාවේ සාමාජිකයකු -

(අ) ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියකින් ඔහුගේ හෝ ඇයගේ ධුරයෙන් කලින් ඉල්ලා අස්වූ අවස්ථාවක දී;

(ආ) ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරන අවස්ථාවක දී;

(ඇ) අධිකරණය විසින් වරදකරුවකු කරනු ලැබ ඇති අවස්ථාවක දී;

(ඈ) කොමිෂන් සභාවෙන් කලින් නිවාඩු ලබා ගැනීමකින් තොරව කොමිෂන් සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට ඔහු හෝ ඇය නොපැමිණ සිටීමෙන් ධුරය හැරගියා සේ සලකන අවස්ථාවක දී; හෝ

(ඉ) ධුරය දරන කාල සීමාව තුළදී ඔහුගේ ධුරයේ කාර්යට පරිබාහිරව යම් රැකියාවක නිරත වන අවස්ථාවක දී,

ඔහුගේ සාමාජිකත්වය අවසන් විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයකු -

(අ) යම් කායික දුබලතාවයක් හෝ සිහිවිකලභාවයක් හේතුවෙන් ඔහුගේ හෝ ඇයගේ කාර්යයන් ඉටු කිරීමට ස්ථිර වශයෙන් නොහැකි අවස්ථාවක දී;

(ආ) චරිත දූෂණය මත ඔහු හෝ ඇයගේ රාජකාරි ඉටුකිරීමට සුදුසු තත්වයක නොමැති අවස්ථාවක දී; හෝ

(ඇ) නිසි බලය ඇති අධිකරණයක් විසින් යම් වරදකට වරදකරු කර ඇති අවස්ථාවක දී,

ඒ සාමාජිකයා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විමසා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු විසින් ජනාධිපතිවරයා අමතා තත්කාර්ය සඳහා යවනු ලබන ලිපියක් මගින් ඒ ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලිඛිතව පිළිගන්නා දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුගේ ධුරය හිස්වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් 12 (1) වගන්තියේ සඳහන් කාර්ය පටිපාටිය අනුගමනය කළ යුතු අතර, වෙනත් තැනැත්තකු ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරීමට පත්කරනු ලැබිය යුතු ය.





(5) (අ) කොමිෂන් සභාවේ සාමාජිකයකු අසනීපයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුගේ හෝ ඇයගේ කාර්යයන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියාකිරීමට ඔහු හෝ ඇය නොපැමිණි කාලය සඳහා වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය හැකි ය;

(ආ) කොමිෂන් සභාවේ සභාපතිවරයා අසනීපයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුගේ හෝ ඇයගේ කාර්යයන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් ඒ සභාපතිවරයා නැති විට, සභාපතිවරයා වෙනුවෙන් ක්‍රියාකිරීමට කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකු පත්කරනු ලැබිය යුතු ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයන්ට මුදල් විෂයයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු පරිදි යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු ය.

(7) (අ) කොමිෂන් සභාව සෑම මසක දී ම යටත් පිරිසෙයින් එක් වරක් හෝ අවශ්‍ය පරිදි වාර ගණනක් රැස්විය යුතු ය.

(ආ) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තුන් දෙනෙකු විය යුතු ය.

(ඇ) කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන කොමිෂන් සභාවේ සභාපතිවරයා දැරිය යුතු අතර, එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා ගත යුතු ය.

(ඈ) කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී සභාපතිවරයාට හෝ මුලසුන දරන යම් තැනැත්තකුට තමාගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් හිමි විය යුතු ය.

(ඉ) කොමිෂන් සභාව විසින් එහි රැස්වීම් පැවැත්වීම සහ රැස්වීමේ කටයුතු සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය යුතු ය.

(8) කොමිෂන් සභාවේ මුද්‍රාව -

(අ) කොමිෂන් සභාව විසින් කලින් කලට නිශ්චය කරනු ලබන ආකාරයට විය යුතු ය;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය;

(ඇ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ඈ) කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ වෙනත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඒ දෙදෙනා විසින් තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් එකී සාධන පත්‍රයෙහි අත්සන් කළ යුතු ය.

ඇමුණුම 01

අභියාචන ආකෘතිය

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත කරනු ලබන අභියාචනය

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------------

අභියාචන පෝරමය

01. අභියාචකගේ නම - ------------------------------------------------------------------------------------

02. ලිපිනය - --------------------------------------------------------------------------------------------

03. දුරකථන අංකය ( තිබේ නම්) - ------------------------------------------------------------------------

04. විද්‍යුත් ලිපිනය (තිබේ නම්) - --------------------------------------------------------------------------

05. බලය ලත් නියෝජිතයාගේ (සිටියි නම්) නම ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ විස්තර -------------------------------------------------------------------------------------------

06. අදාළ පොදු අධිකාරයේ නම - ---------------------------------------------------------------------

07. අදාළ තොරතුරු නිළිධාරියාගේ නමල ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ විස්තර - -------------------------------------------------------------------------------------------

08. තොරතුරු නිළධාරියාට තොරතුරු ඉල්ලීම් කළ දිනය සහ ලියාපදිංචි අංකය - ------------------------------

(තොරතුරු ඉල්ලීමේ පිටපතක් අමුණන්න)

09. තොරතුරු නිළධාරියාගේ ඔබට පිළිතුරක් ය ප්රලතිචාරයක් ලැබුණා ද ? ඔව් / නැත --------------------------
(තොරතුරු ඉල්ලීමේ පිටපතක් අමුණන්න )

10. තොරතුරු නිළධාරියාගේ තීරණය ලැබුණ දිනය - ------------------------------------------------------------------

11. එම තීරණයට විරුද්ධව අභියාචනය කළ නිළධාරියාගේ නමල ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ විස්තර - ---------------------------------------------------------------------------

12. නම් කළ නිළධාරියාට අභියාචනය සිදුකළ දිනය සහ අභියාචන අංකය - ------------------------------------

13. නම් කළ නිළධාරියාගෙන් ඔබට තීරණයක් ලැබුණේද ? ඔව්/ නැත -----------------------------------------

14. නම් කළ නිළධාරියාගෙන් ඔබට තිරණය ලැබුණ දිනය - -----------------------------------------------------

15. අභියාචනය කිරීමේ පදනම

------------------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------------------------------------------------------
--------------------------------------------------------------------------------------------------------------------------------
--------------------------------------------------------------------------------------------------------------------------------
--------------------------------------------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------------------------------------

16. අභියාචනයේ දී ඉල්ලා සිටි තොරතුරු (වැඩිදුර විස්තර, කාලසීමාව සහ විෂය) ------------------------------

17. තීරණය ඉල්ලා සිටි දිනය - ---------------------------------------------------------------------------------

18. විශේෂිත කාල පරිච්ඡේදය තුළ අභියාචනය ඉදිරිපත් කර නැති නම් එම ප්‍රමාදය සඳහා හේතුව (32 (2)- වගන්තිය) ------------------------------------------------------------------------------------------------

19. මෙකී ගැටලුව සම්පන්ධයෙන් මීට පෙර කොමිෂන් සභාව වෙත අභියාචනයක් කර තිබේ ද ?

--------------------------------------------------------------------------------------------------------------------------

20. වෙනත් ඕනෑම විස්තරයක් (තොරතුරු ඉල්ලීම පුරවැසියකුගේ ජීවිතය සහ නිදහස සම්බන්ධයෙන්ද යන්න ඇතුළත්ව ) ------------------------------------------------------------------------------------------------------------

21. අමුණා ඇති ලියකිවිලිවල ලැයිස්තුවක් - ---------------------------------------------------------------------

දිනය - --------------------------------

අත්සන



**RTI 01**

## තොරතුරු ලබා ගැනීමේ අයදුම් පත්‍රය

**මෙම අයදුම්පත්‍රය පිරවීම අතවශ්‍ය නොවේ.මෙය පැහැදිලිව තොරතුරු ඉල්ලීමට ඔබගේ පහසුව සඳහා පිළියෙල කර ඇත.අතවශ්‍ය තොරතුරු පැහැදිලිව සඳහන් කරමින් ලිපියක්, විද්‍යුත් තැපැල් පණිවිඩයක් හෝ වාචික ඉල්ලීමක් ඔබට කල හැක.**

**තොරතුරු නිලධාරි,**

**...........................................................**

01. **අයදුම් කරුගේ නම** ..................................................................

02. **ලිපිනය** ..................................................................

03. **දුරකථන අංකය (තිබේනම්)** ..................................................................

04. **විද්‍යුත් ලිපිනය(**තිබේනම්**)** ..................................................................

05. **ඉල්ලා සිටින තොරතුරු පිළිබද විස්තර,**
(ඉඩමදි නම් වෙනම ලියාඅමුණන්න)
   I. **අදාළ ආයතනය** ..................................................................
   II. **ඉල්ලා සිටින තොරතුරු** ..................................................................
   III. තොරතුරුවලටඅදාල කාල පරිච්ඡේදය ..................................................................

06. **තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන ආකාරය** ..................................................................
**(අනවශ්‍ය කොටස් කපාහරින්න)**

(අ)අදාළවැඩ, ලේඛන,වාර්තා අධීක්ෂණය කිරීම සඳහා,

(ආ)අදාළ**ලේඛන** හෝ වාර්තාවලින් සටහන්, උද්ධෘත හෝ සහතික පිටපත් ලබාගැනීම,

(ඇ)අදාළ ද්‍රව්‍යයන්ගෙ'සහතික කළ නිදර්ශන ලබා ගැනීම,

(ඈ)එම තොරතුරු පරිගණකයක හෝ වෙන**ත්** යම් උපාංගයක ගබඩාකර ඇති අවස්ථාවකදී, ඩිස්කට්, ප්ලොපි, පටි, දෘෂ්‍ය කැසට්පට හෝ වෙන**ත්** යම් විද්‍යුත් **ක්‍ර**මයකින් හෝ මුද්‍රිත පිටපත් වශයෙන් තොරතුරු ලබා ගැනීම

07. **ඉල්ලුම්කරු වඩාත් කැමති භාෂා මාධ්‍යය** ..................................................................

08. ඉල්ලා සිටිනු ලබන තොරතුරු ජීවිතය සහ පුද්ගලිකත්වය ආරක්ෂාකර ගැනීමට අදාල බවට විශ්වාස කරන්නේනම් එය තහවුරු කරන කරුණු ..................................................................

09. වෙනත් විස්තර ..................................................................

10. **පහත දැක්වෙන ලියවිලි පිටපත් අමුණා ඇත.(තිබේ නම් පමණි)**
   I. ..................................................................................................
   II. ..................................................................................................
   III. ..................................................................................................

11. **ඔබ ශ්‍රී ලාංකික පුරවසියෙක්ද?** **ඔව් / නැත**

**RTI 02**

## තොරතුරු ඉල්ලීම ලැබුණු බව දැන්වීම

ලි.ප.අංකය.......................

දිනය:....................................

......................................................මයා/මිය

ඔබ විසින් ............................දින එවන ලද පහත දැක්වෙන තොරතුරු ඉල්ලීම ලැබුණු බව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 24(3) වගන්තිය පරිදි මෙයින් දන්වා සිටිමි.

................................................................................................................................
....

................................................................................................................................
....

මෙම අයදුම්පත්‍රය ගැන ගනු ලබන ඉදිරි පියවර දින 14 ක් තුළ ඔබට දන්වා එවනු ලැබේ.

මේ පිළිබඳ වැඩි විස්තර ලබාගැනීම උදෙසා පහත අත්සන් තබා ඇති අය කාර්යාල වේලාවන් තුලදී ඔබට ඇමතිය හැකිය.විමසීම් කරන සෑම අවස්ථාවකදීම ඉහත ලියාපදිංචි අංකය සඳහන් කිරීමට කටයුතු කරන්නේ නම් මැනවි.

.........................................

දිනය:- තොරතුරු නිලධාරි,

(අත්සන)

කාර්යාලය:- නම :-

දුරකථන අංකය:- තනතුර :-

තනතුර:-



**RTI 03**

## තොරතුරු ඉල්ලීම් ලියාපදිංචි ලේඛනය

| 01. ලි.ප අංකය | 02. අයදුම්පත ලද දිනය | 03. අයදුම්කරුගේ නම හා ලිපිනය | 04. දුරකතන අංකය | 05, ඉල්ලා සිටින තොරතුරු කෙටියෙන් | 06. ඉල්ලීමේ ස්වභාවය (පනතේ 27(3)අනුව) | 07. ලැබුණු බව දනවන ලිපිය යැවූ දිනය | 08. ඉල්ලීම පිළිගත් බව /ප්‍රතික්ෂේප කලබව දැන්වූ දිනය | 09. ගාස්තුව | 10. තොරතුරු ඉල්ලීම සම්පූර්ණ කල දිනය | 11.ඉල්ලීම ප්‍රතික්ෂේප කළේනම් RTI යොමුව පිටුව අනු අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

**RTI 04**

**තොරතුරු ඉල්ලීම භාරගත් බව දැන්වීම**

ලි.ප. අංකය- .................................

දිනය- ...........................................

**01.** .........................දින ඉදිරිපත් කරන ලද ලි.ප.අංක.................................දරණ ඉල්ලීම පරිදි එකී තොරතුරු */ 02 වන ඡේදයේ සඳහන් තොරතුරු හැර ඉතිරි කොටස්, සැපයීමට තීරණය කරන කරන ලද බව පනතේ 25(1) වගන්තිය අනුව මෙයින් දන්වමි.

**02.** ඔබගේ ඉල්ලීමෙහි ඇතුලත් පහත සඳහන් තොරතුරු පනතේ 05 වන වගන්තියට අනුව ලබාදිය නොහැකිබව දන්වමි.

....................................................................................................................................................................
....

....................................................................................................................................................................
....

....................................................................................................................................................................
....

**03.** මෙම ඉල්ලීම සපුරාලීම සඳහා රු.............ක ගාස්තුවක් මෙම කාර්යාලය වෙත මුදලින් හෝ බැංකු අනකර මගින් ගෙවා මා වෙත දන්වන මෙන් ඉල්ලා සිටිමි.

04. අදාළ ගාස්තු ගෙවා දින 14 ක් තුළ අදාළ තොරතුරු සැපයීමට සලස්වනු ලැබේ.අමතර කාලයක් ඒ සඳහා ගත වන්නේ නම් ඊට හේතු හා එසේ ගතවන කාලයදින 14 ක් තුල ඔබට දන්වනු ලැබේ.

**05.** 04 වන ඡේදයේ සඳහන් කාලය තුළ අවශ්‍ය කරන තොරතුරු ඔබට නොලැබුණහොත් එකී කාලය ඉක්ම ගොස් සති 02 ක් තුළ ඔබට මේ සම්බන්ධව පහත නම හා ලිපිනය සඳහන් නම්කල නිලධාරියාට **RTI** 10 ආකෘතිය මගින් හෝ ලිපියක් මගින් අභියාචනා කළ හැකි බවද දන්වමි.

නම්කල නිලධාරියාගේ (අභියාචනා බලධාරියා) නම හා ලිපිනය -

- නම
- තනතුර
- ලිපිනය

මෙයට,

විශ්වාසී,

දිනය -..................................

තොරතුරු නිලධාරී(අත්සන)

නම හා තනතුර.



**RTI 05**

ලි.ප.අංකය-

.......................

දිනය-

................................

**තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම**

ඔබ විසින් ........................දින ඉදිරිපත් කරන ලද ලියාපදිංචි අංක ........................... දරණ තොරතුරු ඉල්ලීම පනතේ **5** වන උපවගන්තියේ විධිවිධාන අනුව පහත සඳහන් කර ඇති හේතු මත / ඉල්ලා ඇති තොරතුරු දැනටමත් පහත පරිදි ප්‍රසිද්ධියට පත් කර ඇති හේතුව මත / ඉල්ලා ඇති තොරතුරු අප අධිකාරියෙහි පාලනය හෝ භාරයෙහි නොමැති වීමේ හේතුව මත ප්‍රතික්ෂේප කරන ලද බව දන්වමි.

I. ........................................................................................................................
........................

II. ........................................................................................................................
.......................

මේ සම්බන්ධයෙන් පනතේ 31 වගන්තිය යටතේ ඔබට පහත සඳහන් නම් කල නිලධාරියාට දින 14 ක් තුල **RTI** 10 ආකෘතිපත්‍රය හෝ ලිපියක් මගින් අභියාචනා කළ හැකි බවද දන්වමි.

නම් කල නිලධාරියාගේ නම හා ලිපිනය

- නම
- තනතුර
- ලිපිනය

මෙයට,
විශ්වාසී,

..........................................

තොරතුරු

නිලධාරී(අත්සන)

නම හා තනතුර.

දිනය -

**RTI 06**

ලි.ප.අංකය
.......................

දිනය:-

...............................

........................................................මයා/මිය

**තොරතුරු ලබා දීමේ කාලය දීර්ඝ කිරීම**

01.ඔබ වෙත ...........................දින එවන ලද විසින් **RTI 04** නිවේදනය හා බැදේ.

02.ඔබ විසින් ...............................දින ඉදිරිපත් කරන ලද ලියාපදිංචි අංක ...............හා ......................දින දරණ ඉල්ලීම පරිදි, එකී තොරතුරු සැපයීම දින 14 ක් තුළ සපුරාලීමට පහත සදහන් හේතු මත අපහසු හෙයින් ඒ සදහා දින 14 ට අමතරව තවත් දින ........... කාලයක් ගතවන බව දන්වා සිටිමි.

කාලය දීර්ඝ කිරීමට හේතු-

..............................................................................................................................
.........................

03.ඉල්ලා සිටින වැඩිපුර කාලය ගැන ඔබ එකග නොවන්නේ නම් පහතසදහන්නම් කළ නිලධාරියාට අභියාචනයක් කල හැක.

නම් කල නිලධාරියාගේ නම හා ලිපිනය

- නම
- තනතුර
- ලිපිනය

මෙයට,
විශ්වාසී,

.........................................

තොරතුරු

නිලධාරී(අත්සන)

නම හා තනතුර.



**RTI 07**

ලි. ප.අංකය
...........................

දිනය
.....................................

........................................................ මයා/මිය

..........................................................................................

..........................................................................................

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබද පනත**

**01.** ඔබ විසින් රහසිගත තොරතුරක් ලෙස සලකනු ලැබීමට යටත්ව මා වෙත ..........................දින /දිනයන්හි සපයා ඇති පහත දැක්වෙන තොරතුරු හෝ එහි කොටසක් වන පහත සදහන් තොරතුරු ඉහත කී පනතේ විධිවිධාන යටතේ තමන්ට ලබාදෙන ලෙස පුරවැසියෙකු විසින් කරන ලද ඉල්ලීමක් .....................දින මා වෙත ලැබී ඇත.

ඉල්ලා සිටිනු ලබන තොරතුරු

..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..................

**02.** මෙකී තොරතුරු හෙලිදරව් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු මෙම ලිපිය ලැබී දින 07ක් තුල මා වෙත එවන මෙන් ඉහත කී පනතේ 29(1) උපවගන්තිය පරිදි මෙයින් ඉල්ලා සිටිමි. මෙම තොරතුරු වලින් කොටසක් පමණක් හෙළිදරව් කිරීමට ඔබ එකහ වන්නේ නම් හෙළිදරව් නොකරන කොටස විස්තරාත්මකව හා හේතු සහගතව දන්වා එවන්න.

**03.** එකී තොරතුරු හෙලිදරව් කිරීම සම්බන්ධයෙන් ඔබේ ප්‍රතිචාර දින 07ක් තුල නොලදහොත් 29(2) අ යටතේ අදාළ තොරතුරු හෙලිදරව් කරනු ලබන බවද මෙයින් දන්වා සිටිමි.

**04.** ඔබගේ ප්‍රතිචාරය කුමක් උවත් තොරතුරු ඉල්ලා සිටින පුද්ගලයා තොරතුරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් මත මහජන යහපත උදෙසා එම තොරතුරු හෙළිදරව් කරන ලෙස තොරතුරු කොමිෂන් සභාව විසින් මාවෙත නියෝග කල හැකි බවද සලකනු මැනවි.

.......................................

අත්සන

තොරතුරු නිලධාරී,නම/තනතුර

**RTI 08**

අභියාචනා අංකය..............................

දිනය..................................................

..........................................................මයා/මිය

## 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිලිබද පනත

තොරතුරු ඉල්ලා සිටීම පිලිබද අභියාචනය ලද බව දැන්වීම

**01.** ඔබ විසින් උක්ත පනතේ විධිවිධාන පරිදි තොරතුරු ඉල්ලීම පිලිබද ලි.ප. අංක ............................යටතේ තොරතුරු නිලධාරීන් වෙත ඉදිරිපත් කල අයදුම්පතට අදාළව ,පනතේ 31(1) වගන්තිය පරිදි මා වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය ලැබුණු බව මෙයින් දන්වමි.

**02.** මෙම අභියාචනය අභියාචනා අංක ................................................යටතේ .....................................දින ලේඛනගත කරඇත. මේ සම්බන්ධව පනතේ 31 (3 ) කෙරෙහි අවධානය යොමු කරවමි.

**03.** මෙම කරුණ සම්බන්ධයෙන් ඔබ මෙම කාර්යාලයට පැමිණ කරුණු ඉදිරිපත් කලයුතු වේනම් ඒ සඳහා නියමිත දිනය හා වෙලාව ඔබට දන්වා එවමි.

**04.** මින් ඉදිරියට මේ සම්බන්ධයෙන් විස්තර ඉල්ලීමකදී ඉහත සදහන් අභියාචනා අංකය සදහන් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලමි.

මෙයට ,

විශ්වාසී

.........................................

අත්සන

නම් කල නිලධාරී,නම/තනතුර



**RTI 09**

## 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිලිබද පනත

අභියාචනා ලේඛණය

| අභියාචනා අංකය | අභියාචනා ලද දිනය | අභියාචක ගේ නම ලිපිනය | දුරකථන අංකය | අභියාචන ය ලද බව දන්වා යැවූ දිනය | තොරතුරු අයදුම්ප තේ ලි.ප අංකය | තීරණය | තීරණය දන්වා යැවූ දිනය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**RTI 10**

**නම් කළ නිලධාරියා වෙත යවනඅභියාචනා අයදුම් පත්‍රය**

**...................................................................................................නම් කළ නිලධාරී**

**01** **අයදුම්කරුගේ නම** ..................................................................................

**02** **ලිපිනය** ..................................................................................

**03** **දුරකථන අංකය** ..................................................................................

**04** **විද්‍යුත් ලිපිනය(තිබේනම්)** ..................................................................................

**05** **තොරතුරු ලබා ගැනීමට තොරතුරු නිලධාරියා වෙත යැවූ ඉල්ලුම්පතේ දිනය හා ලි.ප.අංකය** ..................................................................................

**06** **තොරතුරු නිලධාරියාගෙන් පිළිතුරු ලැබුණේද?ඔව්/නැත (ඔව් නම් ලැබුණු පිළිතුරු පිටපත අමුණන්න.)** ..................................................................................

**07** **අභියාචනය පදනම් කරගත් හේතු** ..................................................................................

(අ) තොරතුරු ඉල්ලීම සඳහා කරන ලද යම් ඉල්ලීමක් භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම-

(ආ) 5 වන වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරක් වෙත ප්‍රවේශ වීම සඳහා අවස්ථාව ලබාදීම ප්‍රතික්ෂේප කිරීම,

**(ඇ) මේ පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාලසසීමාවන්ට අනුකූල නොවීම.**

**(ඈ) සම්පූර්ණ නොවූ, නොමග යවන හෝ සාවද්‍ය තොරතුරු ප්‍රදානය කිරීම.**

(ඉ) වැඩිපුර ගාස්තු අයකිරීම,

(ඊ) ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙන් තොරතුරු සැපයීමට තොරතුරු නිලධාරියා විසින් **ප්‍රතික්ෂේප කිරීම.**

**(උ) එම තොරතුරු වෙත ප්‍රවේශවීම වැළක්වීම සඳහා එම තොරතුරු විකෘතිකර, විනාශකර හෝ** අස්ථානගත කර ඇති **බවට එම තොරතුරු** ඉල්ලා සිටිනු ලබන පුරවැසියා හට සාධාරණ හේතු පැවතීම,

**(ඌ) දින 14 කාලය ඉක්මවා අමතර කාලයක් ඉල්ලීමේ හේතු සාධාරණ නොවීම.**

(අදාල නොවන **කරුණු** කපා හරින්න)

**08** අවශ්‍ය කරන තොරතුරු **(එහි විස්තර,අදාළ කාලය හා විෂයන්)** ..................................................................................

**09** අභියාචනය දින 14 තුල ඉදිරිපත් නොකිරීමට හේතු **(තිබේනම්)** ..................................................................................

**10** වෙනත් කරුණු ........................................................................

**දිනය-** ............................

අත්සන



## ප්‍රතික්ෂේප කිරීම් විස්තර ලේඛණය

| අයදුම්පතේ ලි.ප. අංකය | අයදුම්කරුගේ නම හා ලිපිනය | RTI 05 යැවූ දිනය | අභියාචනය ගැන නම්කල නිලධාරී තීරණ | ඒ අනුව ගත් පියවර හා දිනය | දෙවන අභියාචනය ගැන කොමිෂමේ තීරණ | ඒ අනුව ගත් පියවර හා දිනය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**RTI 12**

# නම්කළ නිලධාරීන් හා තොරතුරු නිලධාරීන් සම්බන්ධ විස්තර වාර්තාව

| ආයතනයේ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ නම | **නම් කල නිලධාරියාද තොරතුරු නිලධාරියාද යන වග** | **නම මයා / මිය** | තනතුර | රාජකාරි ලිපිනය | දුරකථන අංකය | **ෆැක්ස් / ඊමේල්** |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

..................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන,නම සහ තනතුර

නිලමුද්‍රාව/දිනය

# பிரஜைகளின் இணையதளம்

## பிரஜைகளின் வாழ்க்கைக்கு ஏற்புடைய,

- அரசியலமைப்பு உட்பட சகல சட்டங்களும், விதிகளும், ஒழுங்கு விதிகளும்
- பிரஜைக்கு ஏற்புடைய உச்ச நீதிமன்றத் தீர்ப்புக்கள் மற்றும் ஏனைய முக்கிய வழக்குத் தீர்ப்புக்கள்
- அரச மற்றும் பொது நிறுவனங்களின் படிவங்கள்
- பிரஜைகள் செயற்பாட்டின் நவீனத் தகவல்கள்
- அடிப்படை உரிமைகளும் கடமைகளும் பொறுப்புக்களும்
- பிரஜைகள் செயற்பாட்டின்மூலம் பெற்றுக்கொண்ட வெற்றிகள் பற்றிய விபரங்கள்
- பிரஜைகள் சபைகள் பற்றிய தகவல்கள்

பிரஜைகளின் சார்பில்
அரசகரும மொழிக்கொள்கைகளுக்கு அமைய மும்மொழிகளிலும்
**மாற்றுக்கொள்கைகளுக்கான நிலையத்தின்**
மூலம்
www.citizenslanka.org



තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සම්බන්ධයෙන් ඔබට අවශ්‍ය ඕනෑම තොරතුරක් පිළිබඳව සහය වීමට අප සූදානම්!

ක්ෂණික ඇමතුම්

## තොරතුරු සහය මධ්‍යස්ථානය

**011-30 30 463**

(සතියේ දිනයන්හි පෙ.ව. **9.00** සිට ප.ව. **5.00** දක්වා)




**தகவல் அறியும் உரிமை பற்றி உங்களுக்குத் தேவையான அனைத்து தகவல்கள் தொடர்பாகவும் ஒத்துழைப்பு வழங்குவதற்கு நாங்கள் தயார் !**

உடனடித் தொடர்புகளுக்கு

## தகவலுக்கான உதவிப் பணியகம்

**011-30 30 463**

(வாரநாட்களில் மு.ப. 9.00 மணி தொடக்கம் பி.ப. 5.00 மணி வரை)

ISBN 978-955-4746-93-0
9 789554 746930